# MANY MANSIONS

## THE EDGAR CAYCE STORY ON REINCARNATION

by Gina Cerminara

# සංසාර මන්දිර

නොහොත්

ඇමරිකානු දිවැසින් දුටු කර්මය හා පුනර්භවය

**කන්නිමහර සුමංගල හිමි**

First print: 1970
18th print: 2013

ISBN : 955-569-185-1



එඩ්ගා කේසි

1877 මාර්තු 18 - 1945 ජනවාරි 3

## පිළිගැන්වීම

මගේ ආචාර්ය

මහෝපාධ්‍යාය

**ගොඩගම සිරි පඤ්ඤානන්ද**

මාහිමියන්ට ය.

පිංවත් පාඨකය,

සංසාර මන්දිර ග්‍රන්ථයෙහි මෙම ඉලෙක්ට්‍රොනික සංස්කරණය ඔබ වෙත ගෙන එන්නේ කිසිදු හෝ වාණිජ අරමුණකින් හෝ ග්‍රන්ථ ප්‍රකාශකයන්ට මූල්‍යමය අලාභයක් කිරීමේ ද්වේශසහගත සිතකින්වත් නොව හුදෙක්ම කලකදී පොත්හලකින්වත් සොයාගනීමට තරම් දුර්ලභවන මෙම ග්‍රන්ථයෙහි අන්තර්ගතය පාඨක ඔබ කියවා අවබෝධකරගෙන මෙම ඝෝරතර කටුක සංසාරයෙන් මිදෙම්වා යන උතුම් අරමුණ පෙරදැරිවය.

ඉතා දැඩිවෙහෙසක් සහ කාලයක් මිඩංගුකොට මෙම පොත ස්කෑන් කිරීමටත් ඉන් අනතුරුව සංස්කරණය කිරීමටත් මා කල උත්සාහය පළදරන්නේ ඔබ මේ පොත හැකිතරම් බෙදා හැරීමෙනි.

ඒ පින් බලය මෙම ග්‍රන්ථය රචනා කළ එඩ්ගාර් කේසි මහතාටත් ජිනා සෙර්මිනාරා මෙනෙවියටත් පරිවර්තනය කළ කන්නිමහර සුමංගල හිමියන්ටත් ග්‍රන්ථ ප්‍රකාශකයන්ටත් මා මෙන්ම මෙය කියවන පාඨක ඔබටත් බෙදා හරින ඔබටත් නිර්වාණාවබෝධය කරගැනීමට හේතුවේවා!! වාසනා වේවා!!

සක්වල වසන්නාවූ දෙවිබඹුන් ඇතුලු සියලු සත්ත්වයෝටම නිර්වාණාවබෝධය කරගැනීමට හේතුවේවා!! වාසනා වේවා!!

සාධු..!!! සාධු..!!! සාධු..!!!

## පරිච්ඡේද


| | | |
|---|---|---|
| | දෙවන සංස්කරණයට වචනයෙක් | 9 - 14 |
| | තෙවන මුද්‍රණයට වචනයක් | 15 - 23 |
| | සිව්වන මුද්‍රණය පිළිබඳ වචනයක් | 24 - 26 |
| 1. | අසිරිමත් හැකියාව | 27 - 41 |
| 2. | එඩ්ගා කේසිගේ වෙදකම් දිවැස | 42 - 61 |
| 3. | ජීවිතයේ ප්‍රහේලිකාවලට පිළිතුරෙක් | 62 - 93 |
| 4. | කායික කර්ම විපාක වර්ග සමහරෙක් | 94 - 113 |
| 5. | පරවම්භන කර්මය | 114 - 120 |
| 6. | අමතර විවරණයෙක් | 121 - 130 |
| 7. | පසු වී විපාක දෙන කර්ම | 131 - 143 |
| 8. | කර්මය හා සෞඛ්‍ය ප්‍රශ්න | 144 - 164 |
| 9. | මනෝවිද්‍යාවේ නව මානයෙක් | 165 - 181 |
| 10. | මනුෂ්‍ය චරිත වර්ග | 182 - 197 |
| 11. | මානසික කර්ම විපාක නිදර්ශන | 198 - 211 |
| 12. | මානසික විකෘතීන්ගේ අතීත ජන්ම සම්භවය | 212 - 227 |
| 13. | විවාහය හා ස්ත්‍රී දෛවය | 228 - 240 |
| 14. | හුදෙකලා වූවෝ | 241 - 258 |
| 15. | විවාහයේ ඇතැම් ගැටලු | 259 - 276 |
| 16. | මිථ්‍යාචාරය හා දික්කසාදය | 277 - 283 |
| 17. | මාපියෝ සහ දරුවෝ | 284 - 296 |
| 18. | කර්ම විපාක වශයෙන් ඇති වන පවුල් අවුල් | 297 - 307 |
| 19. | වෘත්තීය දක්ෂතාවේ අතීත ජන්ම සම්භවය | 308 - 324 |
| 20. | වෘත්ති තෝරා ගැනීම පිළිබඳ දර්ශනය | 325 - 344 |
| 21. | මනුෂ්‍ය දක්ෂතා පිළිබඳ තොරතුරුවල ගැබ් ව ඇති කරුණු | 345 - 356 |
| 22. | චරිත - ගති - වේග | 357 - 376 |
| 23. | කර්මයේ විවිධ අංග | 377 - 398 |
| 24. | ජීවිත දර්ශනයෙක් | 399 - 421 |
| 25. | නිගමනය | 422 - 428 |

# දෙවන සංස්කරණයට වචනයෙක්

ජිනා සෙර්මිනාරා මෙනෙවියගේ "Many Mansions" නමැති පොත මවිසින් සිංහලට නඟා ප්‍රසිද්ධ කොට දෙවසරකුත් මාස කිපයෙක් ගත විය. දැන් දෙවන මුද්‍රණයෙක් අවශ්‍ය වී තිබේ. පාඨකයන් බොහෝ දෙනෙකුන්ගේ ඉල්ලීම පිට මෙය දෙවන සංස්කරණයක් බවට පත් කෙළෙමි.

මුල් පොතට "Many Mansions" යන නම දෙන ලද්දේ කවර හෙයින් ද යනු 24 වන පරිච්ඡේදයෙන් හෙළි වෙයි. මෙහි මන්දිර යන අරුත ඇති "Mansions"යන වචනය යොදා ඇත්තේ ඉඟියෙන් ශරීරයන් අදහස් කොට ගෙන ය. "Many Mansions" යන නාමයෙන් එක ම පුද්ගලයා නොයෙක් ජන්මයන්හි දී නොයෙක් සිරුරු ඇති ව උපදින බව අදහස් කෙරේ. මෙය බයිබල් පාඨයකට අනුව යොදන ලද නාමයෙකි. මේ නමෙි සිංහල පරිවර්තනය "අනේක මන්දිර" යයි ගත හැකි ය. මේ නම සිංහල පාඨකයනට අනුචිත යයි හැඟී ගිය හෙයින් "සංසාර මන්දිර" යන නම යෝජනා කරන ලද්දේ මේ පොත වර්ණනා කොට එය කියවන්නට මා පෙළැඹවූ මා හිතවත් පණ්ඩිත බලන්ගොඩ පඤ්ඤාවංස ,ස්ථවිරයන් විසිනි. සිළුමිණෙහි පළ වූ විවේචනයක දී අනුරාධපුර ධර්මපීඨාධිපති පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද මාහිමියන් විසින් ද සිංහල බෞද්ධ පාඨකයන් හමුවෙහි මේ නමෙහි ඇති යෝග්‍යත්වය අනුමත කරන ලදී.

මේ පොතේ කතුවරිය විස්කොන්සින් විශ්වවිද්‍යාලයෙන් මනෝවිද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය (Ph.D) ලබා පුනර්ජන්මය පිළිබඳ පරීක්ෂණ කටයුතුවල යෙදුණු ජීනා සෙර්මිනාරා මෙනෙවියයි. මේ පොත සකස් කර ඇත්තේ එඩ්ගා කේසි නම් ඇමරිකානුවා විසින් යෝගී ඥානයක් බඳු ඥානයෙකින් රෝගීන් හා වෙනත් දුඃඛිතයන් දහස් ගණනක් පිළිබඳ ව කර ඇති ප්‍රකාශන පරීක්ෂා කොට බලා ඒවා විවරණය කිරීම වශයෙනි. කේසිගේ කාර්යය පිළිබඳ තවත් තොරතුරු මේ පොතින් ම විශේෂයෙන් ම 2, 3 යන පරිච්ඡේදවලින් ලබාගත හැකි ය.

මුල් සංස්කරණයෙහි සඳහන් කරන ලද පරිදි මෙතරම් තදින් මා සිත්ගත් වෙනත් තනි ග්‍රන්ථයක් මට කියවන්නට ලැබී නැත. බෙහෙවින් ම මා සිත් ගත්තේ මෙහි දක්වා ඇති කර්ම විපාක විස්තරයයි. මෙහි ඇතැම් කොටස් කියවන කල ධම්මපදය, භගවත් ගීතාව වැනි පොත් කියවන විට ඇති වන සන්සුන්කම වැනි සන්සුන්කමෙක් ඇති වෙයි. ජීවිතයේ ඕනෑ ම ප්‍රශ්නයකට සැලකිය යුතු පිළිතුරෙක් මෙයින් ලබා ගත හැකි ය. මෙහි දක්වා ඇති චින්තන ක්‍රම භාවිත කිරීමෙන් මිනිසුනට ඇති වන මානසික දුක්වේදනා විශාල ප්‍රමාණයක් අඩු කර ගත හැකි බව නිසැක ය. මෙහි දැක්වෙන අදහස් ලොව පුරා පතළ ව මිනිසුන්ගේ සිත්වල තහවුරු වුවහොත් ලෝකයේ ඇති මිනිස් දුක්වල හා පසුතැවිලිවල ප්‍රමාණය විශාල වශයෙන් අඩු වනු ඇත.

වර්තමාන බෞද්ධයකුට එකඟ විය නොහැකි අදහස් ද මේ පොතෙහි දක්නට ලැබෙනු ඇත. කතුවරිය විසින් ම පෙන්වා දී ඇති පරිදි (152 - 153 පිටු) ක්‍රිස්තියානි පරිසරයෙක හැදී වැඩී සිටි එඩ්ගා කේසි තම තොරතුරු දී ඇත්තේ ක්‍රිස්තියානියට හුරු වචනවලිනි. ඔහු බෞද්ධ රටෙක වැඩුණා නම් මේ අදහස් ම මීට වෙනස් අයුරකින් පවසනු ඇත. මේ නිසා කේසිගේ "දෙවියන් වහන්සේ" වෙනුවට බෞද්ධයනට "ධර්මය" යනු යොදා ගත හැකි ය. බෞද්ධයාගේ "ධර්මය" දේව ආගම්වල එන 'දෙවියන් වහන්සේ' ලෙසින් ධර්මචාරී පුද්ගලයා ආරක්ෂා කරයි. ධර්මය බෞද්ධයාගේ සරණයෙකි. (මෙහි 397 - 403) කේසි "ආත්මයක්" ගැන ද කියයි.

මෙහි දී බෞද්ධයකු විසින් කළ යුත්තේ ඒ වෙනුවට "චිත්ත සන්තානය" යනු යොදා ගැනීමයි. මෙහි එන අදහස්වලට පාඨකයාට එකඟ විය නොහැකි තැන්වල දී පවා එක් වර ම ඒවා ඉවත නොදමා ඒ ගැන සිතා බැලීම වටී. කේසීම පිළිගෙන ඇති පරිදි (54 පිට) ඔහුගේ තොරතුරු වැරදී ගොස් තිබෙන්නට ද ඉඩ තිබේ. මෙහි දී පාඨකයාට මජ්ඣිම නිකායෙහි එන මහාකම්ම විභඞ්ග සූත්‍රය ගැන මතක් කර දීම සුදුසු ය. එහි දී බුදුරජාණන් වහන්සේ ඇතැම් මහණ බමුණන් තමනට පෙනෙන කරුණු ස්වල්පයක් පමණක් පදනම් කොට ගෙන කර්ම විපාක පිළිබඳ වැරදි නිගමනවලට බසින බවත් තථාගතයන් වහන්සේගේ කර්ම විභඞ්ග ඥානය ඉතා ගැඹුරු බවත් වදාරති. කේසීගේ මතයට අනුව මිනිස්සු තිරිසන් සතුන් ලෙසත් තිරිසන් සත්තු මිනිසුන් ලෙසත් නූපදිති. (64 පිට) ජාතක කථාවලට හා සූත්‍රාන්ත දේශනාවලට අනුව මෙය වැරදි මතයෙකි. සමහර විට මෙතැන දී කේසීට තම විඥානය අවශ්‍ය තරමට සියුම් කර ගැනීමට නො හැකි වූවා විය හැකි ය.

එක්තරා අදහසෙකින් කියන විට නූගත් ගම්බද උපාසිකාවකට පවා අමුතුවෙන් උගත යුතු අදහසෙක් මේ පොතෙහි නැතැයි කිව හැකි ය. තවත් අදහසෙකින් කියන විට මහා පණ්ඩිතයන් විසින් පවා සිතා බැලිය යුතු මත රාශියෙක් මෙහි ඇතැයි කිව හැකි ය. පරිවර්තකයන්ගේ දැනීමට අනුව මෙහි එන කර්ම විපාක විස්තරය බෞද්ධ කර්ම විපාක විස්තරයට තරමක් වෙනස් ය. සාමාන්‍ය බෞද්ධ විස්තරයට අනුව කර්මයකට විපාකයක් ලැබීමේ එක්තරා යාන්ත්‍රික ගතියෙක් තිබේ. මේ පොතෙහි එන විස්තරයට අනුව කර්මයකට විපාකයක් ලැබෙන්නේ එයින් පාඨකයා හොඳ අතට හරවනු සඳහා ය. කෙසේ වුවත් මේ අදහස මිනිසුන්ගේ ධෛර්යයට හේතු වන්නෙකැයි කිව යුතු ය. මේ පොතින් ලැබෙන පණිවිඩය අත්තනගලු වංසයෙහි ගාථාවෙකින් මෙසේ දක්වා තිබේ.

ඛෙදෝ විපත්තීසු පටික්‍රියා න - තස්මා න දීනප්පකතිං භජෙය්‍ය
ඡන්දානුයාතං විරියං වදන්ති - සබ්බත්ථ සිද්ධිග්ගහණග්ග හත්ථං

(විපත්තීන්හි දී ඛේදයට පත්වීම ඒ විපත් පිළිබඳ පිළියමෙක් නොවේ. එහෙයින් ඒ පහත් තත්ත්වයට නොවැටෙන්න. සියලු

ශ්‍රේෂ්ඨ දේ ලබා ගැනීමේ අත වශයෙන් (පණ්ඩිතයන් විසින්) හඳුන්වනු ලබන්නේ ප්‍රඥාව අනුව ගිය වීර්යයයි.)

භෞතික විද්‍යාවත් ගුරු කොට ගන්නා නවීන මිනිසා පැරණි ආගම්වල එන කර්ම විපාක විස්තර ඒ අයුරින් ම පිළිගැනීමට මැලි වෙයි. අද සිටින බෞද්ධ දරුවන් පවා ඔවුන්ගේ ගුරු දෙමාපියන් පිළිගත්තා තරමට පරලොවත් කර්ම විපාකත් පිළිගැනීමට සූදානම් නැත. මේ පොතෙහි වටිනාකම ඇත්තේ ඔවුනට පවා බොහෝ දුරට ඒත්තු යන අයුරින් පුනර්ජන්මවාදයත් කර්මවාදයත් ඉදිරිපත් කොට තිබීමෙහි ය. මගේ විශ්වාසයට අනුව මේ වාද දෙක මහජනයාට ඒත්තු යන අයුරින් ඉදිරිපත් කිරීම මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි කරුණාව ඇත්තකුගෙන් ඉටුවිය යුතු සේවයෙකි. හැකි නම් සත්ත්වයකුට මෙලොව දී පැමිණෙන දුක් පමණක් නොව පරලොව දී පැමිණෙන්නට ඇති දුක් ද ඉවත් කළ යුතු ය. මිථ්‍යාදෘෂ්ටි ඇත්තෝ දෘෂ්ටි නිසා ම වැඩියෙන් පව් කොට වැඩියෙන් දුක් ලබති. මේ පොතෙන් විද්‍යාව ගුරු කොට ගත් නවීන ලෝකයට ගැළපෙන අයුරින් පවට හේතු වන මිථ්‍යා දෘෂ්ටි රාශියකට පහර වදී. දැනට විද්‍යාව ඒක පාක්ෂික වී ඇති බව පෙනේ. මේ පොතින් නවීන විද්‍යාව සම්පූර්ණ කරගත හැකි අයුරු පෙන්වා දෙනු ලැබේ. (162 - 164 පිටු) මෙය මේ පොතේ ඇති විශේෂ අගයෙකි.

මා සිංහල පරිවර්තනයෙන් බලාපොරොත්තු වූයේ මට පුළුවන් තරමින් මුල් පොතේ අදහස් නිවැරැදි ව සිංහල පාඨකයන් වෙත ඉදිරිපත් කිරීම ය. පාඨකයන් බොහෝ දෙනෙක් ඒ සිංහල පරිවර්තනයේ ඇතැම් කොටස් තේරුම් ගැනීම දුෂ්කර බව කීහ. එහෙයින් මේ දෙවන සංස්කරණයේ දී දුෂ්කරත්වය ඉවත් කිරීමට යත්න දැරීමි. අවශ්‍ය ද වේ නම්, දෛවයෙන් ඉඩ ද ලැබේ නම්, මතු මත්තෙහිත් ඒ ප්‍රයත්නය දැරෙනු ඇත. මුල් පොතේ එන ක්‍රමයට වෙනස් ව සංඥා නාම හා ඇතැම් අදහස් කළු අකුරින් යොදා ඇති බව ද සඳහන් කළ යුතු ය. තරු ලකුණින් දැක්වෙන අධෝලිපි මුල් පොතේ තුබූ ඒවා ය. ඉලක්කම්වලින් දැක්වෙන අධෝලිපි යොදන ලද්දේ පරිවර්තකයන් විසිනි.

මුල් පොත තේරුම් ගැනීමේ දී ඇලෝසියස් පීරිස් පියතුමා ද බුද්ධදාස බෝධිනායක දොස්තර මහතා ද ඇමරිකානු පුරවැසි ස්ටීවන් කෙම්පර් මහතා ද මට උදවු කළහ. මේ දෙවන සංස්කරණයේ දී ඇතැම් තැන් වඩාත් පැහැදිලි කර ගැනීමට ඇම්. ඩී. ඒ. ගුණතිලක මහතා උපකාර විය.

පොත පරිවර්තනය කිරීමට මට දිරි දුන් ශ්‍රී ලංකා විද්‍යාලයාධ්‍යක්‍ෂ පණ්ඩිත බද්දේගම විමලවංස හිමියන් ද පණ්ඩිත පැණිහෙළ සිරිසම්බෝධි හිමියන් ද පණ්ඩිත බලන්ගොඩ පඤ්ඤාවංස ස්ථවිරයන් ද, පණ්ඩිත කොත්මලේ චන්දසිරි ස්ථවිරයන් ද අත් කොපි පිටපත් කර දුන් ශාස්ත්‍රාචාර්ය අටබාගේ පඤ්ඤාසේකර යතිවරයන් ද ඇස්. පරණවිතාන ශිෂ්‍යයා ද මම අදත් සිහිපත් කරමි. පණ්ඩිත වරකාගොඩ සීලරතන හිමියන්ගේ නම වෙන් කොට විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත. මුල් සංස්කරණයේ දී මෙන් මේ දෙවන සංස්කරණයේ දීත් සකස් කළ යුතු තැන් රාශියක් පෙන්වා දුන්නේ උන්වහන්සේ ය. ඉමහත් සැලකිල්ලෙකින් මේ පොත කියවූ උන්වහන්සේට මා ණය ගැති ය. මතු මත්තෙහිත් උන්වහන්සේට ණය වන අදහස මගේ තිබේ.

මේ සිංහල පරිවර්තනය ඉංග්‍රීසි සිංහල පුවත්පත් කීපයකින් ද ගුවන් විදුලියෙන් ද විවේචනය විය. ඒ ආයතනවලටත් ඒ විවේචනයනටත් මගේ ස්තුතිය හිමි වෙයි. ඇතැම් ධර්ම දේශකයෝත් ලේඛකයෝත් මේ සිංහල පරිවර්තනය ගැන සඳහන් කොට ඊට ප්‍රසිද්ධියක් ලබා දුන්හ. ඒ අතර මුල් තැන ගන්නේ මගේ ආචාර්ය පණ්ඩිත හේන්පිටගෙදර ඤාණසීහ මාහිමියෝ ය. මගේ ආචාර්ය දෙපොළක් වූ මහාචාර්ය පණ්ඩිත හේන්පිටගෙදර ඤාණාවාස හිමියෝත් අභාවප්‍රාප්ත මහාචාර්ය කේ. ඇන්. ජයතිලක මහතාත් මගේ පරිවර්තනය අගයා මට ධෛර්යය දුන්හ. ජයතිලක මහතා අන්තිමට රෝහලේ සිටිය දී මේ සිංහල පරිවර්තනය එතුමාගේ ඇඳ මත තිබෙනු මට දක්නට ලැබිණි.

මේ පොත අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කිරීම ද මට ලැබුණු ධෛර්යයෙකි.

පොත ඇතුළේ ඇති සටහන් කිපය ඇඳ දුන්නේ එවකට ශ්‍රී ලංකා විද්‍යාලයෙහි සේවය කළ ඩැනී වේරගොඩ මහතා ය. මුල් සංස්කරණයේ දී ඒ නම අමතක වීම ගැන මම කනගාටු වෙමි.

මහාචාර්ය කේ. ඇන්. ජයතිලක මහතාගේ ඉල්ලීම පිට කිසි ම මුදලක් අය නො කරන්නට ඉංග්‍රීසි පොතේ ප්‍රකාශකයන් පොළඹවා ගත් කතුවරිය පොත මුද්‍රණය කිරීම සඳහා ඇමරිකන් ඩොලර් 40 ක් පරිත්‍යාග කළ බව සඳහන් කරන්නේ කෘතඥතා පූර්වක ය. දුෂ්කර නම් කිසි ම ගෙවීමක් නො කොට සිංහලයෙන් පොත ප්‍රසිද්ධ කිරීමට ඉඩ දුන් "William Morrow and Company INC" ආයතනයටත් ඒ ආයතනය සඳහා කළ නාම මාත්‍ර ගෙවීම මා වෙනුවෙන් කළ හියුලින් කේසි මහතා ට හා "Association for Research and Enlightenment INC" ආයතනයටත් මගේ කෘතඥතාව පළ කළ යුතු ය. (හියුලින් කේසි, එඩ්ගා කේසිගේ පුතෙකි. ඒ ආයතනය, එඩ්ගා කේසිගේ තොරතුරු වැනි දේ පරීක්ෂා කිරීමට පිහිටුවා ගන්නා ලද්දෙකි.)

මේ දෙවන මුද්‍රණයේ දී ශුද්ධි පත්‍ර බලා දීමෙන් ශාස්ත්‍රාචාර්ය දොඹවල විජයඥාණ ස්ථවිරයන් වහන්සේ ද ශාස්ත්‍රාචාර්ය අකුරුවල සෝමානන්ද ස්ථවිරයන් වහන්සේ ද ශාස්ත්‍රාචාර්ය එච්. පී. පියදාස මහතා ද මට උපකාර කළහ.

මා හදා වඩා ගත් සියලු ගුරුවරු දෙමාපිය වැඩිහිටියනට ද පින් දෙමින් මේ පොත මගේ ප්‍රව්‍රජ්‍යාචාර්ය මහෝපාධ්‍යාය ගොඩගම සිරි පඤ්ඤානන්ද මාහිමියනට ද පිළිගන්වමි.

"සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා"

සියලු සත්ත්වයෝ සැපවත් වෙත්වා.

පරිවර්තක

**පණ්ඩිත කන්නිමහර සුමංගල හිමි (B.A.)**

සිරිසුමන පිරිවෙන,
රත්නපුර.
1972.10.01

# තෙවන මුද්‍රණයට වචනයක්

"සංසාර මන්දිර" නමින් මවිසින් සිංහලයට නගා පළ කරන ලද ජිනා සේර්මිනාරා මෙනෙවියගේ "Many Mansions" නමැති පොත දැන් සිංහල පාඨකයන් අතර ඉතා ප්‍රසිද්ධ ය. එහි දෙවන සංස්කරණයේ පිටපත් සියල්ල ඉවර වී වසර හතරක් පමණ ගත විය. පාඨකයන් බොහෝ දෙනෙකුන් පොත ගැන විමසීම් කළ නමුත් මට ඔවුන්ගේ ඉල්ලීම් සපුරාලිය නොහැකිව තිබිණි. මේ අතර මරදානේ රත්න පොත් ප්‍රකාශකයෝ පොත ප්‍රකාශනය කිරීමට ඉදිරිපත් වූහ. මම ඔවුනට මේ පොත පිළිබඳව මට තිබුණු සියලු හිමිකම් පවරා දුනිමි.

මුල් පොතට "Many Mansions" යන නම යෙදුවේ කවර හෙයින් ද යනු මෙහි 24 වන පරිච්ඡේදයෙන් හෙළි වෙයි. මන්දිර යන අරුත ඇති "Mansions"යන වචනය යොදා ඇත්තේ ඉඟියෙන් ශරීරයන් අදහස් කර ගෙන ය "Many Mansions" යන නාමයෙන් එක ම පුද්ගලයා නොයෙක් ජන්මයන්හි දී විවිධ ශරීර ඇති ව උපදින බව අදහස් කෙරෙයි. මේ නාමය බයිබල් පාඨයක් අනුව යොදන ලද්දකි. මේ නාමයේ සිංහල පරිවර්තනය "අනේක මන්දිර" යයි ගත හැකි ය. එහෙත් මේ නාමය සිංහල පාඨකයනට අනුචිත යයි සිතා "සංසාර මන්දිර" යන නම යෝජනා කරන ලද්දේ මුල් පොත වර්ණනා කොට එය කියවීමට මා පෙළඹ වූ මා හිතවත් පණ්ඩිත බලන්ගොඩ පඤ්ඤාවංස ස්ථවිරයන් විසිනි. සිළුමිණ පුවත් පතෙහි පළ කළ විවේචනයක දී එකල අනුරාධපුර ධර්මවිද්‍යාධිපති ව වැඩ සිටි අති පූජ්‍ය පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද මහා නායක ස්වාමීන් වහන්සේ ද සිංහල බෞද්ධ පාඨකයන් උදෙසා ඒ නාමයේ ඇති යෝග්‍යත්වය අනුමත කළහ.

මේ පොතේ කතුවරිය විස්කොන්සින් විශ්ව විද්‍යාලයෙන් මනෝවිද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය (Ph.D) ලබා පුනර්ජන්මය පිළිබඳ පරීක්‍ෂණ කටයුතුවල යෙදුණු ජිනා සෙර්මිනාරා මෙනෙවියයි. මේ පොත සකස් කර ඇත්තේ එඩ්ගා කේසි නම් ඇමරිකානුවා විසින් යෝගීඥානයක් බඳු ඥානයෙකින් රෝගීන් හා වෙනත් දුඃඛිතයන් දහස් ගණනක් පිළිබඳ ව කර ඇති ප්‍රකාශනයන් පරීක්ෂා කොට බලා ඒවා විවරණය කිරීම් වශයෙනි. එඩ්ගා කේසිගේ කාර්යය පිළිබඳ තවත් තොරතුරු මේ පොතින් ම විශේෂයෙන් ම 2, 3 යන පරිච්ඡේදවලින් බලාගත හැකි ය.

මුල් සංස්කරණයෙහි දී සඳහන් කරන ලද පරිදි මෙතරම් තදින් මා සිත් ගත් වෙනත් තනි පොතක් මට කියවන්නට ලැබී නොතිබිණි. බෙහෙවින් ම මා සිත් ගත්තේ මෙහි දක්වා ඇති කර්ම විපාක විස්තරය. මෙහි ඇතැම් කොටස් කියවන විට ධම්මපදය, භගවත් ගීතාව වැනි පොත් කියවන විට ඇති වන සන්සුන්කම වැනි සන්සුන්කමක් සිතේ ඇති වෙයි. ජීවිතයේ ඕනෑ ම ප්‍රශ්නයකට සැලකිය යුතු පිළිතුරක් මේ පොතින් ලබා ගත හැකි ය. මෙහි දක්වා ඇති චින්තන ක්‍රමය අනුගමනය කිරීමෙන් මිනිසුනට ඇති වන චෛතසික දුක්වේදනා බෙහෙවින් අඩුකර ගත හැකි ය. ස්ත්‍රී පුරුෂ, ගිහි පැවිදි හැම දෙනා විසින් ම කර්මය ස්වකීය කොට ඇති බව නිතර මෙනෙහි කළ යුතු යයි බුදුරජාණන් වහන්සේ ද වදාරා තිබේ. මේ බෞද්ධ චින්තන ක්‍රමය ලොව පුරා මිනිසුන්ගේ සිත් වල තහවුරු වුවහොත් ලෝකයේ ඇති චෛතසික දුක්වල ප්‍රමාණය විශාල වශයෙන් අඩු වනු ඇත.

බෞද්ධයකුට එකඟ විය නොහැකි අදහස් ද මේ පොතෙහි දක්නට ලැබෙනු ඇත. කතුවරිය විසින් ම පෙන්වා ඇති අයුරු ක්‍රිස්තියානි පරිසරයක හැදී වැඩී සිටි එඩ්ගා කේසි තම තොරතුරු දී ඇත්තේ ක්‍රිස්තියානි ධර්මයට හුරු වචනවලිනි. ඔහු බෞද්ධ පරිසරයක හැදී වැඩී සිටියා නම් මේ අදහස් මීට වඩා වෙනස් අයුරකින් පවසනු ඇත. මේ නිසා කේසිගේ "දෙවියන් වහන්සේ" වෙනුවට බෞද්ධයනට "ධර්මය" යනු යොදාගත හැකිය බෞද්ධයාගේ ධර්මය දේව ආගම්වල එන දෙවියන් වහන්සේ ලෙසින් ධර්මචාරී පුද්ගලයා ආරක්ෂා කරයි.

සත්‍ය වශයෙන් ම බෞද්ධයාගේ ධර්ම සංකල්පය දේව ආගම් වල එන දේව සංකල්පයට වඩා බෙහෙවින් උසස් බව පෙන්වා දිය යුතු ය. ඇතැම් කිතුනුවෝ බුදු දහම වැරැදි ලෙස තේරුම් ගෙන බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා ඇති නිසා උන්වහන්සේගෙන් වත්, නිර්වාණය හුදු තත්වයක් නිසා එයින් වත් බෞද්ධයන්ට පිහිටක් නැතැයි කියති.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවාට උන්වහන්සේ වදාළ ධර්මය පිරිනිවන් පා නැත.

අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ අග්ගප්පසාද සූත්‍රයෙහි දක්වා ඇති පරිදි අග්‍ර ධර්ම දෙකක් ඇත. ඒ දෙක නම් නිර්වාණය හා ආර්ය මාර්ගයයි. නිත්‍ය වූ පරම සුවය නිර්වාණයයි. ආර්ය මාර්ගය නම් නිර්වාණය මතු කර ගැනීමට අනුගමනය කළ යුතු මාර්ගයයි. ආර්ය මාර්ගයේ මුල සම්මා දිට්ඨියයි. සම්මා දිට්ඨිය නිසා ආර්ය මාර්ගයේ සෙසු අංග ඇති වන බව මජ්ඣිම නිකායේ මහා චත්තාරීසක සූත්‍රයේ කියා තිබේ.

විදර්ශනා සම්‍යක් දෘෂ්ටිය යයි කියා ඇත්තේ මේ ආර්ය මාර්ගයේ මුලට ඇති සම්මා දිට්ඨියයි. විදර්ශනා සම්‍යක් දෘෂ්ටිය නම් පඤ්චස්කන්ධය කවදා හෝ විනාශ වන නිසා අනිත්‍ය යයි ද අනිත්‍ය වන සැපත පවා නිත්‍ය වූ පරම සුවය වන නිර්වාණයට පහත් නිසා ද උපාදාන නම් වන බලගතු තෘෂ්ණාවට අරමුණු වන පඤ්චස්කන්ධ සුවය නොලැබෙන විටත් ලැබී තිබී විනාශ වන විටත් ශෝකයට හේතු වන නිසාත් දුක් යයි ද මිනිසාට අසාරාර්ථයෙන් අනාත්ම යයි ද සාරය වන්නේ නිත්‍ය වූ පරම සුවය වන නිර්වාණය යයි ද දැකීම ය.

මේ සම්මා දිට්ඨිය ඇති කරගත් පුද්ගලයාට ආර්ය මාර්ගයේ සෙසු අංග ඇති වීම ධර්මතා වශයෙන් සිදුවන්නකි. කොතෙක් අංග කවදා ඇති වනවා ද යන්න තීරණය වන්නේ ඒ ඒ පුද්ගලයාගේ ඥාන ශක්තිය අනුව ය.

එක ම දේශනාවකට කන් දී සිටින ඇතැම් පුද්ගලයෝ රහත් වෙති. සමහරු අනාගාමී වෙති. සමහරු සකෘදාගාමී හෝ

සෝතාපන්න හෝ වෙති. තවත් සමහරු පෘථග්ජන භාවයේ ම රැඳී සිටිති. මේ වෙනසට හේතුව ඒ ඒ පුද්ගලයන්ගේ ඥාන ශක්තියේ ඇති වෙනසයි.

රෝහිතස්ස සූත්‍රයෙහි කියා ඇති පරිදි දුකට ඇතුළත් වන කාමලෝක රූප ලෝක අරූප ලෝක යන තුනත් ඒ ලෝක ඇති වීමේ හේතු වන තෘෂ්ණාව හා අවිද්‍යාවත් ලෝක උත්තර වූ නිර්වාණයත් මේ නිර්වාණයට යන මාර්ගයත් යන මේ සියල්ල බඹයක් පමණ වූ මේ කලේබරය තුළ ම ඇත. එහෙත් බුදු බණ තේරුම් නොගත් පෘථග්ජනයා මේ බව නොදනී. ඔහුට නිර්වාණය අවිද්‍යා නිවරණයෙන් වැසී තිබේ. ඒ නිසා ඔහු ඊට පිටින් ඇති කවදා හෝ විනාශ වන පඤ්චස්කන්ධය සාර යයි සිතා ගෙන ඒවාට ඇලී සිටී. ඒවා නොලැබී යන විටත් ලැබී තිබී විනාශ වන විටත් ශෝක කරයි. ශෝකයේ හෙවත් චෛතසික දුකේ හේතුව තෘෂ්ණාවයි. තෘෂ්ණාවේ හේතුව අවිද්‍යාවයි. මේ කියන අවිද්‍යාව නම් දූනට ම තමා තුළ නිර්වාණය ඇති බව නොදැනීමයි. චෛතසික දුක නැති කර ගැනීමට නම් තෘෂ්ණාව නැති කළ යුතු ය. තෘෂ්ණාව නැති කිරීමට නම් අවිද්‍යාව නැති කළ යුතු ය. පටිච්චසමුප්පාදයෙන් ඉගැන්වෙන්නේ මේ කරුණයි. චෛතසික දුක නැති කර ගැනීමට අවිද්‍යාව පහ කර ගත යුතු ය.

නුවණ මඳ පුද්ගලයන්ට මේ විද්‍යාව මුලින් පහළ වන්නේ විශ්වාසයක ස්වරූපයෙනි. ධර්ම ප්‍රසාද, විදර්ශන සම්‍යක් දෘෂ්ටි යන නම්වලින් හැඳින්වෙන්නේ මේ විශ්වාසයයි. ප්‍රසාදය සැලෙන්නට වුවහොත් ප්‍රඥාව නො වැඩෙයි.

"පරිප්ලව පසාදස්ස පඤ්ඤා න පරිපූරති"

යන්නෙන් කියැවෙන්නේ එයයි. ඒ නිසා ප්‍රසාදය සැලෙන්නට නොදී නිතර නිතර මෙනෙහි කරමින් වැඩිය යුතු ය. මෙසේ මේ ධර්ම ප්‍රසාදය වැඩීම නිසා ප්‍රඥාව සම්පූර්ණ වෙයි.

මේ අයුරින් බෞද්ධයාගේ උත්තම ධර්මය වන නිර්වාණය, බාහිර ධර්මයක් නො වන බව තේරුම් ගත යුතු ය. අන්තිමට බලන

විට බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීමට අනුව තමාත් ධර්මයත් දෙකක් නො වන බව පෙනී යයි. එහෙත් දේව ආගම්වල එන දෙවියන් වහන්සේ තමාගෙන් අන්‍ය වූ පුද්ගලයෙකි. මිනිසා හොඳ කළ යුත්තේ දෙවියන් වහන්සේගෙන් තෑගි ලබා ගැනීමට ය. නරක නොකළ යුත්තේ දඬුවමින් බේරීමට ය. දේව ආගම්වල දී හොඳ නරක නිශ්චය කළ යුතු වන්නේ දෙවියන්ගේ කියමනට අනුව ය. එහි දී මිනිසාගේ බුද්ධියට තැනක් නැත. දේව ආගම්වල දී මිනිසුන් හික්මවන්නේ තිරිසනුන් හික්ම වන්නාක් මෙන් දඬුවම හා ත්‍යාගය මුල් කර ගෙන ය. බුදුසමය මිනියා හික්මවන්නේ ඔහුට සම්‍යක් දෘෂ්ටිය ඇති කරලීමෙනි. නියම බෞද්ධයා පවින් වැළකිය යුත්තේ භය නිසා නොවේ. පාපය සිත අපවිත්‍ර කර ගැනීමකි. සිත රෝගී කර ගැනීමකි.

කේසි ආත්මයක් ගැන ද කියයි. බෞද්ධ අනාත්මවාදය වරදවා තේරුම් ගෙන සිටින ඇතැම් බෞද්ධයෝ ආත්මය යන වචනය දුටු පමණින්ම බිය වෙති. පොට්ඨපාද නම් පිරිවැජියා ආත්මයත් සංඥාවත් එකක් ද දෙකක් ද යන ප්‍රශ්නය බුදුරජාණන් වහන්සේ ගෙන් ඇසූ බව පොට්ඨපාද සූත්‍රයෙහි සඳහන් වෙයි. එවිට බුදුරජාණන් වහන්සේ 'එකක් හෝ දෙකක් වන්නට ආත්මය කියා දෙයක් තිබිය යුතු ය. ආත්මය කියා දෙයක් නැති කල ඔබේ ප්‍රශ්නය අර්ථවත් වන්නේ කෙසේ දැයි' අසා නැත. උන් වහන්සේ අසා ඇත්තේ පොට්ඨපාද අදහස් කරන ආත්මය කුමක් ද කියා ය. පොට්ඨපාද පිළිවෙළින් 1. ඕලාරික ආත්මය 2. රූපී මනෝමය ආත්මය 3. අරූපී සංඥාමය ආත්මය යන ආත්ම තුන දක්වා තිබේ. ඒ හැම ආත්මයක් සම්බන්ධයෙන් ම ආත්මය තිබිය දී විවිධ සංඥා ඇතිව නැති වන නිසා ආත්මයත් සංඥාවත් දෙකක් වන බව බුදුරජාණන් වහන්සේ වදාරා තිබේ. මේ සූත්‍රයෙහි ම මේ ආත්මවල එකිනෙකට ඇති සම්බන්ධය කිරි, දිකිරි, වෙඬරු, ගිතෙල් ආදියේ සම්බන්ධය බඳු බව දක්වා තිබේ.

නිරෝධ සමාපත්තියට සම වදින රහතන් වහන්සේ කෙනෙකුන් අනුක්‍රමයෙන් පසු කරන අවස්ථාව ගැන සලකා බලන විට ද මේ ආත්මයන්ගේ එකිනෙකට ඇති සම්බන්ධතාව පිහිටා ගත

හැකි ය. ඇස ආදී වූ ඉඳුරන්ගෙන් රූපාදී අරමුණු ගන්නා විට ක්‍රියාත්මක වන්නේ කාම ලෝකයට හිමි ඖලාරික ආත්මයයි. රූපධ්‍යානවල දී ක්‍රියාත්මක වන්නේ රූප ලෝකයට හිමි රූපී මනෝමය ආත්මයයි. අරූප ධ්‍යානවල දි ක්‍රියාත්මක වන්නේ අරූපී සංඥාමය ආත්මයයි.

ආත්මය යන වචනයේ මූලික අර්ථය හුස්ම යනු ය. එහි දාර්ශනික අර්ථය සාරය යනු ය. මේ දාර්ශනික අර්ථයේ දි ආත්ම ශබ්දය ගුණවාචක වචනයක් මිස නිශ්චිත වස්තු වාචක වචනයක් නොවේ. එය යොදන්නාගේ දෘෂ්ටියට අනුව ඔහු වටිනවා යයි සිතන ඕනෑ ම දෙයකට යෙදිය හැකි ය. භෞතිකවාදියා සාරය වශයෙන් සැලකුවේ දේහයයි. ඔහුට දේහාත්මවාදියා යයි කියා ඇත්තේ මිනිසා ය. ආත්මය නිත්‍ය විය යුතු ය යන්න හැම ආත්මවාදියකු ම පිළිගත් මතයක් නොවී ය. සියලු උච්ඡේදවාදීන් ද ආත්මවාදීන් බව බ්‍රහ්මජාල සූත්‍රයෙන් පෙනී යයි. ආත්ම දෘෂ්ටිය සක්කාය දෘෂ්ටියේ ම ප්‍රභේදයක් බව තේරුම් ගත් විට ඇතැම් බෞද්ධයන් ආත්මවාදය සම්බන්ධයෙන් ඇති කර ගෙන තිබෙන මිථ්‍යා මත ඉවත් කර ගත හැකි ය. බුදුරජාණන් වහන්සේ යමකුට අනාත්ම යයි කීමෙන් අදහස් කළේ එය නැති බව නොව එය අසාර බව ය. බෞද්ධ ඉගැන්වීම අනුව සාරය වන්නේ නිර්වාණය පමණි. එය ද මේ කල්ප වරයෙහි ම ඇත.

බොහෝ ආගම්වල ආත්මය වශයෙන් සලකා ඇත්තේ රූපී මනෝමය ආත්මයයි. කිතුනු සමයෙහි ද ශුද්ධාත්මයා යන්නෙන් අදහස් කොට ඇත්තේ මෙය බව පෙනේ. පාලි සූත්‍ර දේශනාවල දී ගර්භාවක්‍රාන්තිය ද විඤ්ඤාණය සහිත වූ මේ ආත්මයයි. මෙය මරණයෙන් පසුව ද පූර්ව ආත්ම භාවයේ ස්වරූපය ඇතිව හැසිරෙන බව සිතන්නට කරුණු තිබේ. සාමාන්‍යයෙන් මනැසට නො පෙනෙන මෙය දිව්‍යසට පෙනෙන බව සිතන්ට කරුණු තිබේ. චතූප්පාත ඥාණ ලාභීන්ට මෙය විෂය වන බව සූත්‍ර දේශනාවලින් පෙනී යයි. ඇතැම් විශේෂ අවස්ථාවල දී මේ මනෝමය ගන්ධබ්බයා මිනැසට ගොදුරු වීම පිළිබඳ පුවත් ද විවිධ සංස්කෘතිවලට අයත් මිනිසුන් අතර පවතී. සාමාන්‍ය මිනිසුන් අවතාර යයි හඳුන්වන්නේ

මේ ආත්මය යයි සිතිය හැකි ය. මනස නමින් හැඳින්වෙන්නේ පසු කල අභිධර්ම පොත්වල හෘදය වස්තුව යයි වරදවා ගෙන ඇති සියුම් රූපයකි. විඤ්ඤාණය පවතින්නේ මෙය ආශ්‍රය කර ගෙන ය. අලුත් ආත්මභාවයක දී එහි හෘදය වෙනස් වෙයි. මෙය ද අනාත්ම යයි කීමෙන් බුදුරජාණන් වහන්සේ අදහස් කෙළේ එය නැති බව නොව එය ද අසාර බව ය.

සංසාර මන්දිරයෙහි එන අදහස්වලට පාඨකයාට එකඟ විය නොහැකි අවස්ථාවල දී පවා ඒවා එක් වර ම ඉවත නොදමා ඒ ගැන සිතා බැලීම වටී. කේසි ම පිළිගෙන ඇති පරිදි ඔහුගේ තොරතුරු වැරදී ගොස් තිබෙන්නට ද ඉඩ තිබේ. මෙහි දී පාඨකයාට මජ්ඣිම නිකායේ මහා කම්ම විභංග සූත්‍රය ගැන මතක් කර දීම සුදුසු ය. ඇතැම් මහණ බමුණන් තමනට පෙනෙන කරුණු ස්වල්පයක් පදනම් කොට ගෙන කර්ම විපාක පිළිබඳව වැරදි නිගමනවලට බයින බවත් තථාගතයන් වහන්සේගේ කර්ම විභංග ඥානය ඉතා ගැඹුරු බවත් ඒ සූත්‍රයෙහි කියා තිබේ.

කේසිගේ දැකීමට අනුව මිනිස්සු තිරිසන් සතුන් ලෙසත් තිරිසන් සත්තු මිනිසුන් ලෙසත් නූපදිති. ඇතැම් සූත්‍ර දේශනාවලට අනුව මෙය වැරැදි මතයක් බව කිව යුතු ය. සමහර විට මෙබඳු කරුණුවල දි කේසිට තම විඤ්ඤාණය අවශ්‍ය තරමට සියුම් කර ගත නොහැකි වුවා විය හැකි ය.

එක් අතෙකින් බලන විට නූගත් ගම්බද උපාසිකාවකට පවා අමුතුවෙන් උගත යුතු දෙයක් මේ පොතෙහි නැතැයි කිව හැකි ය. තවත් අතෙකින් බලන විට මහා පණ්ඩිතයන් විසින් පවා ගැඹුරින් සිතා බැලිය යුතු මත රාශියක් මේ පොතෙහි ඇතැයි කිව හැකි ය. සාමාන්‍ය බෞද්ධ මතයට අනුව කර්මයකට විපාකයක් ලැබීමේ එක්තරා යාන්ත්‍රික ගතියක් තිබේ. මේ පොතෙහි එන විස්තරයට අනුව කර්මයකට විපාකයක් ලැබෙන්නේ එමගින් කාරකයා හොඳ අතට හරවනු සඳහා ය. දැන් මම මුල දී සිටියාට වඩා මේ අදහසට පක්ෂ වෙමි. මේ පොතෙන් ලැබෙන පණිවිඩය අත්තනගලු වංසයෙහි මෙසේ ගාථාවකින් දක්වා තිබේ.

"ඛෙදො විපත්තීසු පටික්‍රියා න
තස්මා න දිනප්ප කතිං භජෙය්‍ය
පඤ්ඤානු ධ්‍යානං විරියං වදන්ති
සම්බන්ථ සිද්ධි ගහණග්ග හත්තවං"

(විපත්තීන්හි දී ඛේදයට පැමිණීම ඒ විපත් පිළිබඳ පිළියමක් නොවේ. එහෙයින් ඒ පහත් තත්ත්වයට නොවැටෙන්න. සියලු යහපත් දේ ලබා ගැනීමේ උතුම් අත වශයෙන් (පණ්ඩිතයන් විසින්) හඳුන්වා දෙනු ලබන්නේ ප්‍රඥාව අනුව ගිය වීර්යයයි.)

භෞතික විද්‍යාවන් ගුරු කොට ගන්නා වූ නවීන මිනිසා පැරණි ආගම්වල එන කර්ම විපාක විස්තර ඒ අයුරින් ම පිළිගැනීමට මැලි වෙයි. අද සිටින බෞද්ධ දරුවන් පවා ඔවුන්ගේ ගුරු දෙමාපියන් පිළිගන්නා තරමට පරලොවත් කර්ම විපාකත් පිළිගැනීමට සූදානම් නැත. මේ පොතෙහි වටිනාකම ඇත්තේ ඔවුනට පවා බොහෝ දුරට ඒත්තු යන අයුරින් පුනර්ජන්මවාදයත් කර්මවාදයත් ඉදිරිපත් කොට තිබීමෙහි ය. මගේ පිළිගැනීමට අනුව මේ වාද දෙක මහජනයාට ඒත්තු යන අයුරින් ඉදිරිපත් කිරීම මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි කරුණාව ඇත්තවුන්ගෙන් ඉටුවිය යුතු සේවයකි.

බෞද්ධ කර්මවාදය වරදවා වටහාගත් ඇතැම් අය ඒ නිසා මිනිසුන් උදාසීන වනවා යයි සිතති. මෙය මිථ්‍යා දෘෂ්ටියකි. බෞද්ධ කර්මවාදයෙන් වර්තමාන කර්ම අතීත කර්මවල විපාක වශයෙන් නො ඉගැන්වෙයි. වර්තමාන කුශල කර්ම නිසා අතීත අකුශල කර්ම විපාක ද මඳ වශයෙන් හෝ අඩුකර ගත හැකි බවත් අනාගතයෙහි යහපත් විපාක ලබා ගත හැකි බවත් බෞද්ධ කර්මවාදයෙන් ඉගැන්වෙයි. මේ නිසා එයින් මිනිසා ධෛර්යවත් කොට සමාජයට හිතකාරී පුද්ගලයකු බවට පත් කරන බව අවධාරණයෙන් කිව යුතු ය.

පරහිතකාමී පුද්ගලයා මිනිසුන්ට මෙලොව දී පැමිණෙන දුක් පමණක් නොව පරලොව දී පැමිණෙන්නට ඇති දුක් ද ඉවත් කරන්නට උත්සාහ ගත යුතු ය. මිථ්‍යා දෘෂ්ටි ඇත්තෝ මිථ්‍යා දෘෂ්ටි නිසා ම වැඩියෙන් පව් කොට වැඩියෙන් දුක් ලබති. මේ පොතෙන්

නවීන විද්‍යාව ගුරුකොට ගත් නවීන ලෝකයට ගැළපෙන අයුරින් පවට හේතුවන මිථ්‍යා දෘෂ්ටි රාශියකට පහර වදී. දැනට නවීන විද්‍යාව ඒක පාක්ෂික වී ඇති බව පෙනේ. මේ පොතෙහි නවීන විද්‍යාව සම්පූර්ණ කර ගත හැකි අයුරු පෙන්වා දෙනු ලැබේ. මෙය මේ පොතේ ඇති විශේෂ අගයෙකි.

මා මේ සිංහල පරිවර්තනයෙන් බලාපොරොත්තු වූයේ මට පුළුවන් තරමින් මුල් පොතේ අදහස් නිවැරදිව සිංහල පාඨකයන් හමුවෙහි තැබීමයි. පාඨකයන් බොහෝ දෙනෙක් ඒ සිංහල පරිවර්තනයේ ඇතැම් කොටස් තේරුම් ගැනීම දුෂ්කර බව කීහ. එහෙයින් දෙවන සංස්කරණයෙහි දී ඒ දුෂ්කරතාව මග හැර වීමට යත්න දැරීමි. ඒ ප්‍රයත්නය සාර්ථක වූ බව පෙනී ගිය හෙයින් මේ තෙවන මුද්‍රණයේ දී අමුතු සංස්කරණයක් නො කෙළෙමි.

මේ පොතෙහි තරු ලකුණින් දැක්වෙන අධෝලිපි මුල් පොතේ ම තිබුණු ඒවා ය. ඉලක්කම්වලින් දැක්වෙන අධෝලිපි යොදන ලද්දේ පරිවර්තකයන් විසිනි.

"සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා"

**පණ්ඩිත කන්නිමහර සුමංගල හිමි**

වේළුවනාරාමය,
කන්නිමහර,
වතුරුගම.

# සිව් වන මුද්‍රණයට වචනයක්

පෙර අපර දෙදිග භාෂා ශාස්ත්‍ර විෂයයෙහිත් සමය සමයාන්තර විෂයයෙහිත් තුලනාත්මක දැනුමක් තිබූ අතිපූජ්‍ය පණ්ඩිත කන්නිමහර සුමංගල හිමිපාණෝ අධිගමලාභී බෝධිසත්ව ගුණෝපේත බුද්ධානුමත ප්‍රවීණ පඬිරුවනකි. එතුමාණෝ අතිවිශිෂ්ට ගණයේ බුද්ධිමත් චින්තකයෙකි. දාර්ශනිකයෙකි. බුදුරජාණන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට ලබා දුන් සිතීමේ විමසීමේ නිදහසින් උපරිම ප්‍රයෝජනය ගෙන අතිශයින් ම සතුටට පත් වූ ආර්ය පුත්‍රයෙකි. රාජකීය පණ්ඩිත අතිපූජ්‍ය හේන්පිටගෙදර ඥාණසීහ හිමිපාණෝ මෑත ඉතිහාසයේ බුදුදහම ගැන මනා අවබෝධයකින් යුතුව සිතා විමසා අන්ධගාමී නොවී අභීතව සත්‍ය එළි කළ අති දුර්ලභ ගණයේ පඬිරුවනකි. අස්මදාචාර්ය අතිපූජ්‍ය කන්නිමහර සුමංගල පඬිවරයාණෝ උන්වහන්සේගේ අතිජාත පුත්‍රයෙකි. සිය පුත්‍ර සුමංගල හිමියන් විමර්ශනයෙන් හා විචක්‍ෂණයෙන් තමන්ටත් වඩා ඉදිරියෙන් සිටින බව ගරු හේන්පිටගෙදර පඬිහිමිපාණන් පවා නිහතමානීව පිළිගත් බව ප්‍රකට ය.

පූජ්‍ය පණ්ඩිත සුමංගල ස්වාමීන් වහන්සේගේ විමර්ශනය තුළින් මතු වූ ඇතැම් බුද්ධ දේශිත ධර්ම කරුණු සමහරක් සම්ප්‍රදාය ම සත්‍යය යයි පිළිගෙන සිටින ධර්මධරයන් තුළ ද සැලෙන ආන්දෝලනයක් ඇති කළේ ය.

පූජ්‍ය කන්නිමහර සුමංගල ස්වාමීන් වහන්සේ ප්‍රවීණ පඬිවරයෙකි. පේරාදෙණියේ ලංකා විශ්ව විද්‍යාලයේ දර්ශනය පිළිබඳ

උපාධි ලත් උන් වහන්සේ විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයකු වශයෙන් කලක් සේවය කළහ. කොළඹ මරදානේ ශ්‍රී ලංකා විද්‍යාලයේ ආචාර්යවරයකු හැටියටත් මුද්දුව ශ්‍රී සුමන පිරිවෙනේ පරිවෙණාධිපතීන් වහන්සේ හැටියටත් කලක් ම අධ්‍යාපන සේවයෙහි ද නිරත ව සිටියහ.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල පරිවර්තන කාර්යයන්ට සහාය වූ උන්වහන්සේ සම්භාවනීය දාර්ශනික කෘති කිහිපයක් ම සිංහලයට පරිවර්තනය කළහ. මුද්‍රණයෙන් පළ නොවූ උන්වහන්සේ ගේ පරිවර්තන කෘති රාශියක් ම ඇත. ඒ අතර විල්හෙල්ම් ගයිගර් පඬිවරයාගේ පාලි සාහිත්‍යය සහ ව්‍යාකරණය නම් වූ අගනා කෘතිය ද වේ.

පාලි භාෂා විමර්ශනය සහ අමුල් දිව්විය නමින් පළ ව ඇති කෘති මුන්වහන්සේගේ විශිෂ්ට පර්යේෂණ ඥානයත් ප්‍රබල විචාර ශක්තියත් මැනැවින් හෙළි කරයි.

මරණයෙන් පසු කුමක් සිදුවේ ද යන ප්‍රශ්නයට මෝරි බර්න්ස්ටයින්ගේ The Search for Bridey Murphy නම් කෘතියෙහි සිංහල පරිවර්තනය වන බ්‍රයිඩේ මෑර්ෆි සහ අන්තරාභවය නමැති පොතින් ඇතැම් නවීන පරීක්ෂණ අනුවත් බෞද්ධ සූත්‍රාන්ත දේශනා අනුවත් සලකා බලා පිළිතුරු දීමට උත්සාහ දරා ඇත. ඒ පොත ද නව මුද්‍රණයකින් පාඨක ඔබ අතට ළඟ දී ම පත් වනු ඇත.

මේ ග්‍රන්ථ අතර දැනට පාඨකයා අතට පත් වී ඇති කෘතීන්ගෙන් ජනප්‍රිය ම කෘතිය බවට පත් වී ඇත්තේ ඇමරිකානු දිවැසින් දුටු කර්මය හා පුනර්භවය හෙවත් ඇමරිකානු ගත් කතුවරියක වන ජිනා සර්මිනාරා මෙනෙවියගේ "Many Mansions" නම් කෘතියෙහි සිංහල පරිවර්තනය වන සංසාර මන්දිර යයි. "Many Mansions" යන්නෙහි තේරුම අනේක මන්දිර නම්. සත්ත්වයා අනේක වාරයක් අනේක දුක් විඳිමින් පසුවන සසරට පැමිණීමට හේතුවන කර්ම සංකල්පය ගැන සලකා පණ්ඩිත සුමංගල හිමියන් මෙම ග්‍රන්ථයට සංසාර මන්දිර යයි නම් කරන්නට ඇත. එය ඉතා ම අර්ථාන්විත නාමයක් බව පෙනේ.

මේ පොත නව මුද්‍රණද්වාරයකින් එළි දක්වා ඔබ අතට පත් කිරිමට මූලික වූ රත්න පොත් ප්‍රකාශකයෝ හි අධිපති ව සිටි දිවංගත එල්. ගුණරත්න මැතිතුමාටත් මේ පොතෙහි කර්තෘවරයාණන් වූ මාගේ ගුරු දෙවි පූජ්‍ය පණ්ඩිත කන්නිමහර සුමංගල හිමිපාණන්ටත් නිවන් සුව අත්වේවා !

කන්නිමහර සුමංගල හිමිපාණන් වහන්සේගේ ධර්මශිෂ්‍ය
රාජකීය පණ්ඩිත,
කන්නිමහර වේළුවනාරාමාධිපති, ත්‍රිපිටකවේදී
**පූජ්‍ය වතුරුගම නන්දසිරි ස්ථවිර**

# 1

# අසිරිමත් හැකියාව

මිනිස්සු උපදිති, දුක් විඳිති, මැරෙති, මේ වචන කීපයෙන් වරක් එක් නැණවත් මිනිසකු මුළු මනුෂ්‍ය වර්ගයාගේ ම ඉතිහාසය සැකෙවින් දක් වූ බව ඇනටෝල් ෆ්‍රාන්ස් [1] විසින් කියා ඇති කථාන්තරයෙක සඳහන් වෙයි.

මිනිසුන්ගේ දුක් විඳීම පිළිබඳව කියන ලද වෙනත් කථාන්තරයෙක් ද ඇත. එය මීට වඩා පැරණි ය. මීට වඩා අර්ථවත් ය. එය නම් තරුණ සිදුහත් කුමරා පිළිබඳ කථාන්තරයයි. සමෘද්ධිමත් භාරතීය නරපතියකු වූ මෙතුමාගේ පියා තම පුතුට ලොව ඇති දුක් ගැන දැන ගන්නට නොලැබෙන සේ ඔහු හදාවඩා ගත යුතු යයි සනිටුහන් කොට ගෙන සිටියේ ය. ඒ නිසා තුරුණු වියට පත්වන තුරු ම සිදුහත් කුමරා ජීවත් වූයේ සෙසු ලොවින් වෙන් කරන ලද පියකරු පරිසරයෙක ය. මාලිගයේ පවුරුවලින් ඔබ්බට පා නොතැබූ ඔහුට රූමත් කුමරියක් ආවාහ කොට දෙනු ලැබුවා ය. තම බිසොවුන් සමග අතිශය ප්‍රීතියෙන් වුවත් බාහිර ලෝකය පිළිබඳව කුහුලින් කල්

1. ප්‍රංශ ජාතික ලේඛකයෙකි.

ගෙවූ තරුණ සිදුහත් කුමරාට දිගු කලක් යන තුරු ම මාලිගයේ මුරකරුවන් මග හරවා ජනාකීර්ණ නගරය පසු කොට ගමන් කිරීමට ඉඩක් නොලැබිණි.

දෛවයෝගයකින් මෙන් සිදු වූ මේ ගමනෙහි දී දක්නට ලැබුණු අරමුණු තුනෙක් ඔහු තුළ තදින් කා වැදී ගියේ ය. මහලු මිනිසකු ද රෝගියකු ද මෘත ශරීරයක් ද දැක කම්පාවට පත්, හැඟීම් බහුල මේ කුමරා ඒ බියකරු විපතේ තේරුම කිමෙක් දැයි තම රියැදුරාගෙන් ඇසුවේ ය. මේ විපත් තුන මුළු මනුෂ්‍ය වර්ගයා වෙත ම පැමිණෙන බව දැන ගත් කුමරා එයින් අතිශයින් කම්පිත විය. මින් පසු ඔහුට කලින් ගත කළ ප්‍රීතිමත් පහසු ජීවිතය අප්‍රසන්න විය. තමා සතු ලෞකික වූ හැම සැප සම්පතක් ම අත්හළ එතුමා මිනිසුනට විඳීමට සිදු වී ඇති දුක්වලින් ඔවුන් මුදවා ගැනීමේ මාර්ගය සෙවීමට කැප විය. අවසානයේ දී ඒ උත්තමයාණෝ අවුරුදු ගණනකට පසුව බුදු වී වදාළහ. තම ප්‍රඥාලෝකය වටහා ගත් උන්වහන්සේ මිනිසුනට මෝක්ෂ මාර්ගය ඉගැන්වීමට පටන් ගත්හ.

ජීවිතයේ තේරුම කිමෙක් ද යනු පැහැදිලි කරුණෙක් නොවේ. එතරම් නොපැහැදිලි දෙයක් සෙවීම සඳහා සිදුහත් කුමරුනට මෙන් අප සියලු දෙනාට ම ප්‍රේමය, බලය, ධනය, සුවපහසුව හා ගෘහ බන්ධන සුඛය වැනි දේ අත්හළ නොහැකි ය. එහෙත් අන්තිමේ දී අප සියලු දෙනා විසින් ම නැඟිය යුතු වන ප්‍රශ්න සමහරෙක් ඇත. මිනිසුන් දුක් විඳින්නේ කවර හෙයින් ද ? දුකින් නිදහස් වීමට ඔවුන් විසින් කළ හැකිව ඇත්තේ කිමෙක් ද ?

සිදුහත් කුමරුන් එතරම් තද කම්පාවකට පත් කළ පීඩාවන්ගෙන් දෙකක් වන ජරාව හා ව්‍යාධිය නැති කරන ලද අනාගත යුගයක් ගැන අපේ මනෝරාජ්‍ය - නවකථාකාරයෝ බලාපොරොත්තු වෙති. එහෙත් ඉතා දක්ෂ ලෙසින් නවීන භෞතික

විද්‍යාව භාවිත කිරීමෙන් පවා මිනිසාට තම අන්තිම සතුරා වන මරණය පිටු දැකිය හැකි බවෙක් තව ම ඒ ගත්කරුවනට පෙනී ගොස් නැත. ලෝවැස්සා කැමැති නම් ලෝකයත් එහි ඇති ධන සම්පත්තින් වඩා සිහිකල්පනාවෙන් සංවිධානය කිරීමෙන් සියලු දෙනාට ම ආරක්ෂාවත්, සෞඛ්‍යයත්, සාමයත්, සෞන්දර්යයත්, තාරුණ්‍යයත් ලබා දිය හැකි ය. එහෙත් අපට දහසක් අනාරක්ෂා වලටත් දහසක් අන්තරායවලටත් සැපතට හා අභ්‍යන්තර සාමයට හා ඇති දසදහසක් තර්ජනවලටත් මුහුණපාන්නට සිදු වී තිබේ. ගින්න හා ජලගැල්ම, වසංගත හා භූමිකම්පා, රෝග හා ව්‍යසන, යුද්ධ හා මනුෂ්‍ය ඝාතන යන මේවා අපට ඇති බාහිර තර්ජන වලින් සමහරෙකි. මිනිසාගේ අධ්‍යාත්ම ලෝකයෙහි ඇති දුර්වලතා හා අසම්පූර්ණතා ද රාශියෙකි. ආත්මාර්ථකාමය, මෝහය, ඊර්ෂ්‍යාව, ද්වේශය හා තෘෂ්ණාව යන දුර්ගුණ, ඒ දුර්ගුණ ඇති පුද්ගලයාටත් ඔහු සමග ජීවත් වන සෙස්සන්ටත් දුක දනවන උල්පත් ය.

සංගීතයේ නැතහොත් සූර්යෝදයෙක සෞන්දර්යයෙන් නැගැවී ගිය විටෙක දී විශ්වයේ හදවතෙහි ආනන්දයකුත් ගැඹුරු අර්ථයකුත් තිබිය යුතු යයි අපට සිතෙයි. එහෙත් අපට කිසියම් පෙනීමක්, කිසියම් දයාවක්, කිසියම් දාර්ශනික විස්මයක් යන්තමෙකින් හෝ ඇති නම් කෲරතාවන්ගෙන් ද නො ඉවැසිය හැකි ප්‍රාර්ථනා බිඳීම්වලින් ද පිරී ඇති ජීවිතයේ සත්‍ය සිද්ධිවලට පෙරළා පැමිණි විට නො අසා සිටිය නොහැකි දාර්ශනික ප්‍රශ්න කොටසෙක් ඇත. හුදු ජීවත්වීමේ පැහැදිලි ලෞකිකාර්ථය හැරුණු විට එයින් ඔබ්බෙහි වූ ජීවිතයේ තේරුම හා ප්‍රයෝජනය කිමෙක් දැයි සිහිබුද්ධියේ නාමයෙන් ඇසිය යුතු ය. මම කවරෙක් වෙම් ද? මා මෙලොව සිටින්නේ කවර හෙයින් ද ? මා යන්නේ කොහි ද? මා දුක් විඳින්නේ ඇයි ද ? අනෙක් මිනිසුනට මගේත් මට ඔවුන්ගේත් ඇති නියම සම්බන්ධතාව කිමෙක් ද ? විශ්වයේ බලවේගයන්ගේ මවුනොවුන් කෙරෙහි වූ මහා ව්‍යාපාරයට අපේ

ඇති පොදු සම්බන්ධතාව කවරේ ද ? අපෙන් ඔබ්බෙහිත් අප අවටත් ඇති මහා බලයට අපේ පොදු සම්බන්ධතාවක් තිබේ නම් ඒ කවරේ ද ?

බොහෝ කලෙක සිට මිනිසුන් නැවත නැවතත් මතු කරන්නේ මේ මූලික ප්‍රශ්න ම ය. මේවාට උත්තරයක් නැතිව කායික වූ හෝ මානසික වූ හෝ දුක් වේදනා අඩු කිරීම පිණිස යොදනු ලබන හැම තාවකාලික පිළියමෙක් ම අන්තිමේ දී අර්ථ විරහිත වෙයි. දුක් ඇති විය හැකි බව ම විවරණය වන තාක් කිසිවක් විවරණය වී නැත. ඉතාමත් නොවැදගත් වූ කුඩා සතුන්ගේ පවා දුකට ඇති හේතු දක්වන තාක් කිසි ම දෙයකට ඇති හේතු දක්වූවා නොවේ. එතෙක් ජීවිතය පිළිබඳව අපගේ ඇති දාර්ශනිකාවබෝධය ද අසම්පූර්ණ ය.

ආදිතම කාලවල පටන් ඉතාමත් ප්‍රාථමික මනුෂ්‍යයන් විසින් පවා මේ දාර්ශනික ප්‍රශ්න නගා තිබේ. අහසේ ශ්‍රී විභූතිය දෙස බැලූ ඔවුනට මිනිසාගේ සටන් හා දුක් විඳීම් පෙනෙන තරම් පහත් හෝ නිරර්ථක හෝ නොවන බව හැඟී යන්නට ඇත. මිනිසා හා තාරකා අතර වූ විශාල ලෝක සම්බන්ධතාවෙක මාර්ගයෙන් ඔව්හු ජීවිතාර්ථයක් පිළිගත්හ. නැතහොත් වනයෙහිදී නොපෙනෙන ශක්තීන් ඇති බව දුටු ගිය ඔව්හු මිනිසාත් ඇතුළත් කොට ඇති සෑම ජීවී වස්තුවකට ම ආත්මයක් ඇතැයිද, මේ ආත්මය සුළු කාලයක් පමණක් පොළෝ තලයෙහි දුක් විඳිමින් පැවැත මරණින් මතු වඩා සැපවත් වූ සහනදායක ස්ථානයකට යතැයි ද කියා සිටියහ. නැතහොත් තමන් තුළ වූ හරි වැරැද්ද පිළිබඳ හැඟීම දුටු ඔව්හු විශ්වයේ හෘදය සාක්ෂ්‍යයෙහි අති විශාල හොඳක් හා නරකක් ද අන්‍ය කිසියම් දුරස්ථ භූමියෙක දඬුවම හා තෑගි දීමට කැප වූ මහා රාජ්‍යයෙක් ද තිබිය යුතු යයි සිතූහ.

මෙබඳු විශ්වාස හා විවරණ දහසෙක් පැවැති ඇත.

මෙවායින් සමහරෙක් දළ ය. සමහරෙක් සියුම් ද සහේතුක ද වේ. ලෝකයේ හැම තැන ම අද මිනිසුන් ජීවත් වන්නේත් දුෂ්කරතාවලට නිර්භීතව මුහුණ දෙන්නේත් එබඳු කිසියම් විවරණයක් සත්‍ය යයි සිතා ගෙන ය. සමහරු මහම්මද්ගේ වචනය පිළිගෙන එකක් විශ්වාස කරති. තවත් සමහරු බුදුරද, ගුරුනානක්[1], මෝසෙස්[2], යේසුස් නැතහොත් කෘෂ්ණ[3] යන ශාස්තෘවරුන්ගෙන් කෙනෙකුන්ගේ දහමක් පිළිගෙන අනෙකක් අදහති. පැවැත්මේ අවශ්‍යතාව හැරුණු විට මනුෂ්‍ය ජීවිතය පිළිබඳ වෙනත් විවරණයක් නැති බව විශ්වාස කරන්නෝ දහස් ගණනෙකි. තවත් සමහරුන් මේ මොහොතේ සුව පහසුවෙහි ඇලී ගැලී ජීවිත විවරණය ගැන සිතීම පවා නතර කොට ඇත.

ක්‍රිස්තියානි සම්ප්‍රදායයෙහි වැඩුණු අපට මිනිස් දිවියත් දුක් විඳීමත් පිළිබඳ වූ අපගේ ම විවරණයෙක් ඇත. ඒ මෙයයි; "මිනිසාට අමරණීය වූ ආත්මයෙක් ඇත. දුක් විඳීම දෙවියන් වහන්සේ විසින් අපට දී ඇති පරීක්ෂණයෙකි. අපට ලැබෙන්නට ඇති තෑග්ග ස්වර්ගයයි; දඬුවම නරකයයි, මෙයින් කුමක් ලැබෙනවා ද යන්න රැඳී ඇත්තේ අප මේ ජීවිතයේ ගැටලුවලට මුහුණ දෙන ආකාරය මත ය." අප මේ විවරණය විශ්වාස කරන්නේ ඒ සඳහා කිසියම් සාධකයක් ඇති නිසා නොව අපේ මාපියවරුන් හා ගුරුවරුන් අපට එය උගන්වා ඇති නිසා ය. ඔවුන් ද එය ලබා ගෙන ඇත්තේ ඔවුන්ගේ මාපියවරුන්ගෙන් හා ගුරුවරුන්ගෙනි. මෙසේ අපි බයිබලය නම් වූ ග්‍රන්ථයෙක ද යේසුස් නම් මිනිසකුගේ ද වචනය තෙක් දිගින් දිගට ආපසු යමු.

1. Guru Nanak ලාහෝරයේ උපන් මෙතෙම ජීවත් වූයේ ක්‍රි. ව. 1469 - 1538 අතර ය. මෙතෙම නව ආගමෙක ප්‍රතිෂ්ඨාපකයා ය. එය හින්දු මුස්ලිම් යන ආගම් දෙකේ මිශ්‍රණයෙකැයි කිව හැකි ය.
2. "Moses" පුරාතන ඊශ්‍රායල්වරුන්ගේ නීති සම්පාදකයා ය. බයිබලයේ පරණ තෙස්තමේන්තුවේ මොහු ගැන සඳහන් වේ.
3. භගවද් ගීතාවේ එන ශාස්තෘවරයා ය.

බයිබලය සම්භාවනීය ග්‍රන්ථයක් බවත් යේසුස්තුමා මනුෂ්‍යයකු වුවත් එසේ නැතිව දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වුවත් විශේෂ පුද්ගලයකු බවත් වැඩි දෙනා පිළිගන්නවා ඇත. කෙසේ හෝ බටහිර මිනිසා විද්‍යා පුනරුත්ථානයේ[1] සිට පොතක හෝ වේවා පුද්ගලයකුගේ හෝ වේවා වචනයට ගරු කොට පවත්වා ගෙන එන ලද විශ්වාස වැඩි වැඩියෙන් සැක කරන්නට පටන් ගෙන සිටී. විද්‍යාවේ නිර්දය පරීක්ෂණාගාරයේ දී ඔප්පු කළ නොහැකි හැම විශ්වාසයක් පිළිබඳව ම මේ සැකය පවතී.

ටොලමි[2] නම් පුරාතන ශාස්ත්‍රඥයා කියා තිබුණේ සූර්යයා පොළොව වටා යන බව ය. ඔහුගේ කියමන පිළිගත් කිතුසමුන එය ම ඉගැන්වී ය. එහෙත් කොප(ර්)නික්ස්[3] විසින් නිපදවා භාවිත කරන ලද උපකරණවලින් සූර්යයා පෘථිවිය වටා නොව පෘථිවිය සූර්යයා වටා යන බව පෙන්වන ලදී. ඇරිස්ටෝටල්[4] නම් ග්‍රීක දාර්ශනිකයාගේ මනෝ විද්‍යාව හා සෙසු විද්‍යා කිතු සමුනෙහි තදින් මුල් බැස ගෙන පැවැත්තේ ය. බරින් වෙනස් වන වස්තු දෙකක් එකවර අත්හළ විට බරින් වැඩි වස්තුව පළමු පොළොවට ළඟාවෙතැයි ඇරිස්ටෝටල් ලියා තිබුණේ ය. එහෙත් පිසාහි කුලුන මුදුනේ සිට ගැලිලියෝ[5] විසින් කරන ලද සුළු පරීක්ෂණයෙකින් බරින් වෙනස් වන නමුදු පරිමාවෙන්[6] සමාන වන වස්තු දෙකක් එකවර අත්හළ විට ඒ දෙක ම එකවර පොළවට ළඟා වන බව පෙන්වා දෙන ලදී. බයිබලයේ එන

1. මෙයින් අදහස් කරන්නේ 14, 15, 16 යන ශත වර්ෂවල යුරෝපයේ ඇති වූ ඉගෙනීමේ, කලාවේ, සාහිත්‍යයේ හා විද්‍යාවේ නැවත නැඟී සිටීමයි.
2. ගණිත ශාස්ත්‍රය, තාරකා ශාස්ත්‍රය හා භූමි ශාස්ත්‍රය පිළිබඳ ව ප්‍රසිද්ධියක් ඉසිලූ මෙනෙම ක්‍රි. ව. 2 වන ශත වර්ෂයෙහි ඇලෙක්සැන්ඩ්‍රියාවෙහි ජීවත් වූවෙකි. මොහුගේ මතයට අනුව විශ්වයේ කේන්ද්‍රය පෘථිවියයි.
3. ක්‍රි. ව. 1473 - 1543 අතර ජීවත් වූ පෝලන්ත තාරකා ශාස්ත්‍රඥයෙකි. පෘථිවිය සූර්යයා වටා යන බව මුලින් ම කීවේ මොහු ය.
4. ක්‍රි. පූ. 384 - 322
5. ක්‍රි. ව. 1564 - 1642 අතර ජීවත් වූ ඉතාලි ජාතික තාරකා ශාස්ත්‍රඥයෙකි.
6. Volume

නොයෙක් පායවලින් ද පොදු ජනයාගේ කියමන්වලින් ද ඉතා පැහැදිලි ව දක්වෙන්නේ පෘථිවිය සමතලා බව ය. එහෙත් කොලොම්බස්[1] හා මැගලන්[2] ද පසලොස් වැනි සියවසේ අන්‍ය දේශගවේෂකයෝ ද බටහිරට යාත්‍රා කොට නැගෙනහිරින් මතු වී උත්තර නැති වන සේ මේ පැරණි විශ්වාසය බිඳ දැමූහ.

මේවායින් හා තවත් මෙබඳු ඔප්පු කිරීම් සිය ගණනෙකින් මිනිස්සු පුරාතන පණ්ඩිතයනටත් වැරදී තිබිය හැකි බව දකින්නට පටන් ගත්හ. විද්‍යා ආකල්පය[3] හට ගත්තේ මෙසේ ය; නවීන මිනිසා හැම දෙයක් ම සැක කරන්නට පටන් ගත්තේ මේ අයුරිනි. නව සොයා ගැනීමෙන් සොයා ගැනීමට මිනිසුන් විසින් විශ්වාස කරන ලද පැරැණි පැහැදිලි ලෝකචිත්‍රය අවුල්ව ගියේ ය. ජීවය ? කිසි ම තැනෙක දී කවුරුත් වත් ඒ ජීවය දක නැත. ආත්මය ? ප්‍රාක්ප්ලාස්මයේ[4] සැඟැවී හෝ කේතුග්‍රන්ථියේ[5] හිඳ ගෙන හෝ සිටින ආත්මයක් කාටවත් අසු වී නැත. ඩෙකාට්[6] නම් දාර්ශනිකයා කියා තිබුණේ ආත්මය කේතුග්‍රන්ථියෙහි තිබිය යුතු ය කියා ය. අමරණීයත්වය ? අපට ඒ ගැන කීමට පරලොවින් කවදා හෝ ආපසු ආ තැනැත්තා කවරෙක් ද ? ස්වර්ගය ? අපගේ දූරදර්ශකවලින් ඒ ගැන කිසි ම සාක්කියක් ලැබී නැත. දෙවියන් වහන්සේ? මහා පිළිගැනීමෙකි. මෙය නම් පිය හිලව්වක්[7] ඕනෑ වූ මිනිසකුගේ නිර්මාණයෙකි. ඔහුට තම පියා

---

1. ක්‍රි. ව. 1446 - 1506 අතර ජීවත් වූ ඉතාලි ජාතික නැවියෙකි. 1492 දී අමෙරිකාව සොයා ගත්තේ මොහු ය.
2. ක්‍රි. ව. 1470 - 1521 අතර ජීවත් වූ පෘතුගීසි නැවියෙකි.
3. The Attitude of Science.
4. Protoplasm ප්‍රාක් - ප්ලාස්මය නම් සතුන්ගේ හා වෘක්ෂ ලතාවන්ගේ ජීවයේ භෞතික වූ පදනම ය. පැහැයක් නැති ජල්ලියක් බඳු වූ මෙය තැනී ඇත්තේ ඔක්සිජන්, හයිඩ්‍රජන්, කාබන් හා නයිට්‍රජන් යන මූල ද්‍රව්‍යවලිනි.
5. කේතු - ග්‍රන්ථිය නම් මොළයේ තුන්වන කෝෂිකාවට පිටුපසින් පිහිටා ඇති, වැලි වැනි කුඩා කැබලිවලින් පිරුණු කේතුවෙක හැඩරුව ඇති ග්‍රන්ථියෙකි.
6. ක්‍රි. ව. 1596 - 1650 අතර ජීවත් වූ ප්‍රසිද්ධ ප්‍රංශ දාර්ශනිකයා ය.
7. පිය හිලව්ව නම් පියා වෙනුවට යොදා ගනු ලබන යමෙකි.

වෙනුවට මහ පියකු අවශ්‍ය වූවා විය හැකි ය. විශ්වය මහා යන්ත්‍රයෙකි. මිනිසා වනාහි පරමාණුවල අහඹුවෙන් වූ පිළිියෙළ වීමෙකින් හා ස්වාභාවික පරිණාම ක්‍රියා මාර්ගයෙකින් හට ගත් කුඩා යන්ත්‍රයෙකි. දුක වනාහී ජීවත්වීමට දඟලන මිනිසාට ලැබෙන නොවැළැක්විය හැකි උරුමයයි. ඊට වැඩි අර්ථයෙක් හෝ ප්‍රයෝජනයෙක් එහි නැත. මරණය නම් රසායනික මූල ද්‍රව්‍යයන්ගේ දියැවී යෑමෙකි. මරණින් මතු අන් කිසිවක් ඉතිරි නො වේ.

මෙසේ මහා පුරුෂයාගේ මහා ග්‍රන්ථයේ නැතහොත් මහා ශාස්තෘවරයාගේ වචනය වෙනුවට අපගේ පසිඳුරන්ගේ සාක්කිය ම යොදා ගෙන තිබේ. සූක්ෂ්ම දර්ශකයෙන් හා දූර දර්ශකයෙනුත් එක්ස් කිරණයෙන්[1] හා රේඩාවෙනුත් [2] විද්‍යාව ඉන්ද්‍රියයන්ගේ ගෝචර සීමාව විශාල කොට ගෙන ඇති බව නිසැකය. තර්කනයෙන් ද නැවත නැවතත් යෙදිය හැකි පරීක්ෂණ විධිවලින් ද[3] අපගේ පඤ්චේන්ද්‍රිය නිරීක්ෂණය ක්‍රමානුකූල කොට ගෙන තිබේ. එහෙත් අන්තිමට බලන විට විද්‍යාවේ හා විචාරයේ සාක්කිය පසිඳුරන්ගේ ම සාක්කියයි. විද්‍යාව ගොඩනංවනු ලබා ඇත්තේ මිනිසාගේ ඇස, කන, නැහැය, දිව හා කය යන මේවා පදනම් කොට ගත් ගොඩනැගිල්ල මත ය.

කෙසේ හෝ ඉකුත් දශක කීපය තුළ දී අපි වඩාත් අතිපණ්ඩිත වී සිටිමු. අපි දන්නා දේ ගැන නැතහොත් දන්නවා යයි සිතා ගෙන සිටින දේ ගැන වැඩි වැඩියෙන් සැක කරන්නට පටන් ගෙන සිටිමු. කිසිවකට ගරු සරු නොදක්වා ඉඳුරන් වහල් කොට ගෙන අප විසින් තනා ගන්නා ලද උපකරණ ම

1. X - ray
2. Radar රේඩාව නම් ඇසට නොපෙනෙන වස්තූන් පිහිටි දෙස හා තැන සොයා ගැනීමට ඉවහල් වන විදුලි උපකරණයෙකි.
3. Repeatable Techniques of Exeperiment

සරදමකට මෙන් අනෙක් අතට හැරී ඇත. එසේ නිපදවා ගන්නා ලද උපකරණවලින් ම අපගේ ඉන්ද්‍රිය නමැති ආයුධය අසම්පූර්ණ බවත් ඇති සැටියෙන් වූ ලෝකය පිළිබඳව අපට දැනීමක් ලබා දීම සඳහා ප්‍රමාණවත් නොවන බවත් පෙන්වා දී ඇත. මෙහි දී අපගේ කාලයෙහි මතු ව ඇති අමුතු දේවලින් කීපයක් ගැන වත් සඳහන් කිරීම සුදුසු ය. රේඩියෝ තරංග,[1] විකිරණශීලතාව[2] හා පරමාණුක ශක්තිය[3] යන මේවා ඉඳුරනට අසු නොවන තරංගවලින් හා ශක්ති ස්පන්දනයන්ගෙන්[4] අප වට වී ඇති බවත් ඉතා කුඩා ද්‍රව්‍ය කැබැල්ලක පවා අපගේ සිහිමට වත් අසු කර ගත නොහැකි තරම් විශාල වූ ශක්තීන් අඩංගුව ඇති බවත් සැකයේ සේයාවකුදු ඉතිරි නො කොට ඔප්පු කරයි.

දැන් අපි තරමක් නිහතමානී වී සිටිමු. අපගේ ශරීරය, ඇස් හා කන් නමැති කුඩා සිදුරුවලින් යුත් වැසුණු කුටියක් බඳුය. අපට බාහිර ලෝකය පිළිබඳව තොරතුරු එන්නේ මේ සිදුරු මගිනි. දැන් අපි ඒ බව දැන සිටිමු. අප ආසන්නයෙහි පවා නොයෙක් තරාතිරම්වල ආලෝක හා ශබ්ද විශාල ප්‍රමාණයක් ඇති නමුදු අපට ඒවායින් හසුකර ගත හැකිවන්නේ ඉතා ස්වල්ප වූ ප්‍රමාණයෙකි. කඩයෙන් ගත පනහකට මිලට ගත් බලු නළාවෙන් නැගෙන හඬ අපේ බල්ලාට ඇසෙයි. එහෙත් ඒ හඬ අපගේ ඇසීමේ ඉහළ ම සීමාවත් ඉක්මවා ඇති හෙයින් අපට නො ඇසෙයි. දැකීම ඇසීම හා ගඳ සුවඳ දැනීම පිළිබඳ වූ අපගේ සීමාවලට වෙනස් වූ සීමා ඇති බොහෝ මෘගයෝත් පක්ෂීහුත් ඇත්තාහ. ඉඳුරන් වහල් කොට ගෙන අපට අසු කර ගත නොහැකි බොහෝ දේවල් ඔවුන්ගේ ලෝකයේ ඇත.

බුද්ධිමත් මිනිසා උඩඟු වී සිටින මනුෂ්‍ය වර්ගයා ගැන ම සිතා මවින වෙයි. ඇති සැටිය දැකීමේ දී මෘගයෝත් පක්ෂීහුත් කෘමීහුත් මිනිසාගේ ම නිපැදවීම් වන සියුම් උපකරණත් ඔහු

1. Radio Waves
2. Radio Activity
3. Atomic Energy
4. Pulsations of Energy

ඉක්මවා ගොස් සිටිති. බුද්ධිමත් මිනිසා ඉඳුරනට අසු නොවන මෙ නන් වැදෑරුම් වූ වස්තූන්ගෙන් කොටසක්වත් තමාට ම අසු කර ගත හැකි දැයි සිතන්නට පටන් ගෙන තිබේ. නිදසුනක් වශයෙන් කිසියම් විදියෙකින් ආලෝකය හා ශබ්දය දැන ගැනීමට මිනිසාට ඇති ශක්තිය ටිකෙකින් හෝ වැඩි වන සේ අපගේ ඉන්ද්‍රියයන් පුහුණු කර ගන්නට හෝ දියුණු කර ගන්නට හෝ හැකි වූවා යයි සිතමු. එවිට අපට කලින් ගොදුරු කොට ගත නොහැකි වූ බොහෝ වස්තූන් ගැන දැන ගන්නට නොලැබේ ද? නැතහොත් ටිකක් විශාල වූ දැනීමේ සීමාවක් ඇති පුද්ගලයෝ කීප දෙනෙක් අප අතර උපන්නාහයි සිතමු. සෙස්සන් දකින්නේ හෝ අසන්නේ හෝ නැති දේ ඔවුන් දකින්නේත් අසන්නේත් නැති ද ? මා තුළ පිහිටි රේඩියෝවෙකින් මෙන් ඔව්හු දුර සිට ශබ්ද නාසත් ද ? තමා තුළ පිහිටි ටෙලිවිෂනයෙකින් මෙන් ඔව්හු දුර සිට රූප නොදකිත් ද ?

මෙබඳු හැකියාවක් ගැන සිතන්නට අපට බල කර සිටින්නේ විසි වැනි සියවසේ උපකරණවලින් හෙළි කරන ලද ලෝකයයි. මේ ලෝකයෙහි පියෙවි ඇසට නොපෙනෙන, නොඇදහිය හැකි තරමේ වස්තූන් හා ශක්තීන් ඇති බව හෙළි වී තිබේ. විස්මය ජනක දීර්ඝ මනුෂ්‍ය ඉතිහාසය විමසා බලන විට ද ගෝචර සීමාව පළල් කොට ගන්නා ලද එබඳු දැන ගැනීම්, සත්‍ය වශයෙන් ම පැවැති ඇති බව පෙන්වන නිදර්ශන රාශියක් වාර්තා ගත ඉතිහාසයෙන් සොයා ගත හැකි වෙයි. දහඅට වැනි සියවසේ ජීවත් වූ මහා ගණිතඥයකු හා විද්‍යාඥයකු වූ ස්වේඩෙන්බොර්ග්[1] තම ජීවිතයේ පසු කාලයෙක දී සාමාන්‍ය තත්ත්වය ඉක්මවා ගිය දැනීම් ශක්තියක් දියුණු කර ගෙන සිටි බව ඔහු ගැන ලියැවී ඇති ජීවිත කථාවලින් හෙළි වෙයි. ටෙලිවිෂනයෙකින් මෙන් දුර ඇති දේ දැකීමට ඔහුට තිබුණු ශක්තිය පිළිබඳ එක් නිදසුනක් දාර්ශනික එමානුවෙල් කාන්ට්

1. Swedenborg

සහ වෙනත් විශිෂ්ට පුද්ගලයන් බොහෝ දෙනෙකුන් විසින් ද සහතික කොට ඇති නිසා විශේෂයෙන් ප්‍රසිද්ධ ව ඇත.

එක්තරා සන්ධ්‍යාවෙක සවස හයට ගොතෙන්බුර්ග්[1] නගරයේ දී යහළුවන් සමග ආහාර ගනිමින් සිටි ස්වේඩෙන්බොර්ග් හදිසියේ කැලඹීමට පත් ව තම උපන් නගරය වන ස්ටොක්හෝල්ම්හි භයානක ගින්නක් හට ගෙන ඇති බව පැවැසී ය. ඒ නගරය පිහිටියේ ඔහු සිටි තැනින් සැතැපුම් තුන්සීයක් පමණ දුරිනි. ටික වේලාවකට පසු ඒ ගින්න තම අසල්වැසියකුගේ ගෙය දවා ඇති බවත් තමාගේ ම ගෙය දැවීමට තර්ජනය කරමින් පවත්නා බවත් හේ කියා සිටියේ ය. එදින ම රාත්‍රි අටට ඔහුගේ ගෙයින් තුන් වන ගෙය ළඟ දී ගින්න නතර කරන ලද බව ඔහු කීවේ තරමෙක සැනැසිල්ලෙකිනි. දවස් දෙකකට පසුව ගින්න පිළිබඳ සත්‍ය වාර්තාවලින් ස්වේඩෙන්බොර්ග් ගේ හැම කියමනක් සත්‍ය බව ස්ථිර කරන ලදි. ගින්න ඇවිලෙන්නට පටන් ගෙන ඇත්තේ හරියට ම ඔහුට ඒ සංඥාව ඇති වූ අවස්ථාවේ දී ය.

ප්‍රසිද්ධියෙන් නොයෙක් තරාතිරමේ පුද්ගලයන් පිළිබඳ වාර්තා ගත ඉතිහාසයෙහි මෙබඳු සිද්ධි සිය ගණනක් සඳහන් ව ඇත. ස්වේඩෙන්බොර්ග්ගේ සිද්ධිය එයින් එකක් පමණි. තවත් කීප දෙනකුන්ගේ නම් මෙහි දී සඳහන් කළ මනා ය. මාක් ට්වෙන්[2], ඒබ්‍රහම් ලින්කන්[3], සේං සයෙං[4] යන මොවුන් පිළිබඳව අන්‍යයන් විසින් ලියා ඇති චරිත කථාවලටත් ඇතැම් තන්හි දී ඔවුන් විසින් ම කර ඇති විස්තරවලටත් අනුව ජීවිතයේ කිසියම් අවස්ථාවෙක දී මොවුන් ඉහත සඳහන් විදියේ සිදුවීම් දැක ගැනීමට සමත් වූ බව හෙළි වෙයි. මොවුනට ඈත ස්ථානයක හෝ මොවුන්ගේ ම ජීවිත වල ඉදිරි අවස්ථාවෙක හෝ සිදුවන සිදුවීම් ඉතා කුඩා විස්තරත් සහිතව දැක ගත හැකි වූ බව දැන

1.Gothenburg
2. Mark Twain
3. Abraham Lincoln
4. Saint-Saens

ගන්නට තිබේ. විස්මය ජනක ලෙසින් මේ සිදුවීම් පෙනී ඇත්තේ හදිසියේ ම ය. දුර පිහිටි සිදුවීම් දැනීමේ ස්වේඩෙන්බෝර්ග්ට තිබුණු හැකියාව පසු කලෙක දී හොඳින් තහවුරුව ගිය ඉන්ද්‍රිය ශක්තියක් බවට දියුණු විය. අනෙක් බොහෝ දෙනෙකුට ඒ දියුණු දැනීම් ශක්තිය ඇති වූ බව පෙනෙන්නේ කිසියම් වැදගත් තීරණාත්මක වූ අවස්ථාවෙක පමණි.

බටහිර ලෝකයේ සිටින අප එබඳු සිදුවීම් දෙස බලන්නට පුරුදු වී සිටින්නේ තරමෙක සැකයෙකින් යුතුව නුහුරට ය. මේ සිදුවීම් කොතරම් සුලබව සිදු වුවත් කොතරම් හොඳින් ඔප්පු වුවත් අවංක බුද්ධිමතුන් විසින් කොතරම් ස්ථිරව සහතික කරනු ලැබුවත් අප පුරුදු වී සිටින්නේ ඇහිබැම එසවීමෙකින්, උරහිස සෙලවීමෙකින් නැතහොත් "අහඹුවෙකි" "මනහර" ය යනාදියක් කීමෙකින් ඒවා ඉවත ලීමට ය. අප කරන්නේ එතෙකින් නතර වීම ය.

කෙසේ හෝ මේ සිද්ධි, තව දුරටත් අප විසින් පහසුවෙන් ඉවත නො දැමිය හැකි කාලය දැන් අවුත් තිබේ. ලෝකයේ ඇති විද්‍යානුකූල මත ප්‍රවාහයන් හා අවශ්‍යතාවන් ගැන දන්නා වූ බුද්ධිමත් මිනිසා මෙතෙක් විවරණය නොවූ සිද්ධියෙකින් අගනා දෙයක් මතුවනු ඇතැයි බලා සිටී. එබඳු මිනිසකුට මිනිසාගේ දියුණු කළ හැකි අසිරිමත් වූ ඉන්ද්‍රිය ශක්ති පිළිබඳ සමස්ත විෂය ම බෙහෙවින් සිත් අලවන්නා වූ ක්ෂේත්‍රයෙක් වෙයි. එය ඉතා වැදගත් ක්ෂේත්‍රයෙකි.

ඩියුක් විශ්ව විද්‍යාලයේ ආචාර්ය ජේ. බී. රයින් ඉදුරනට අසු නොවන අද්භූත සිද්ධි, පරීක්ෂණාගාරයේ දී ක්‍රමානුකූල ව විමසා බැලිය යුතු යයි සිතූ දූරදර්ශී විද්‍යාඥයන්ගෙන් කෙනෙකි. ආචාර්ය රයින්, 1930 සිට තම අනුගාමිකයන් සමග කරගෙන යන පරීක්ෂණයෙක් ඇත. පරසිත් දැනීමටත් දිවැසින් දැකීමටත් මිනිසාට ඇති ශක්තීන් පිළිබඳ පළල් අධ්‍යයනයෙක් ඔහු විසින්

පටන් ගෙන තිබේ. විද්‍යානුකූල ක්‍රමය තදින් අනුගමනය කරමින්, හොඳින් පාලනය කරන ලද්දා වූ ද නැවත නැවතත් අත්හදා බැලිය හැක්කා වූ ද පරීක්ෂණ භාවිත කරමින් ආචාර්ය රයින් විසින් සොයා ගන්නා ලද කරුණක් වෙයි. එනම් බොහෝ දෙනා පරීක්ෂණාගාරික තත්ත්වයන් යටතේ සාමාන්‍ය ඉන්ද්‍රිය ඥානයට අසු නොවන දේවල් දැන ගැනීමට සමත් වන බවයි. ආචාර්ය රයින්ගේ පරීක්ෂණවල අගය විමසීමට සුපරීක්ෂිත සංඛ්‍යා ලේඛනාත්මක විධි යොදා තිබේ. ගණිත ශාස්ත්‍රානුකූලව බලන විට ඔහුට සොයා ගත හැකි වී ඇති ප්‍රතිඵල "ඉබේට" බාර දිය නොහැකි බව පෙනී ගොස් තිබේ. (ආචාර්ය රයින්ගේ ක්‍රමවල හා ප්‍රතිඵලවල විස්තර සඳහා 1947 දී පළ කරන ලද ඔහුගේ "The Reach of The Mind" නමැති පොත බලන්න.) ප්‍රංශයේ වාකොලියේ[1] රුසියාවේ කොටික්[2] හා ජර්මනියේ ටිච්නර්[3] වැනි වූ අන්‍ය විද්‍යාගවේෂකයන් ද පරීක්ෂණාගාරික ක්‍රම ම භාවිත කරමින් රයින්ගේ නිගමනවලට ම ස්වාධීන ව බැස ගෙන ඇත. අනුක්‍රමයෙන් වැඩෙන විද්‍යානුකූල සාක්ෂ්‍ය සමූහය, පරසිත් දැනීමට හා දිවැසින් දැකීමට මිනිසාට ඇති ශක්තිය පිළිබඳව බටහිර ලෝකයේ පවතින අවිශ්වාසයන් සෙමින් බිඳ දමමින් පවතී.

මෙසේ මිනිසාගේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයේ පටු විවරය පළල් කළ හැකි බව තුන් පැත්තෙකින් ම දක්නට ලැබේ.

(i) අනුමාන වශයෙන් සලකා බලන විට එබඳු පළල් කිරීමක් සිදුවිය හැකි යයි ඇදහීම යුක්ති සහගත ය.

(ii) ඓතිහාසික වශයෙන් බලන විට බොහෝ අවස්ථාවල දී එබඳු පළල් කිරීම සිදු වී ඇති බව සත්‍ය වූ කථාන්තර රාශියකින් පෙන්වනු ලැබේ.

1. Warcollier 2. Kotik 3. Tichner

(iii) විද්‍යානුකූල වශයෙන් සලකන විට ඉන්ද්‍රියයන්ගේ සාමාන්‍ය ගෝචර සීමාවෙන් ඔබ්බෙහි වූ දේ දැන ගත හැකි බව නැවත නැවතත් කළ හැකි පරීක්ෂණ වලින් සහතික කරනු ලබන බව පෙනේ.

ක්‍රමයෙන් වැඩී ගෙන යන මෙබඳු පරීක්ෂණාගාරික සාක්ෂ්‍ය රාශියෙක් ඇත.

කෙසේ හෝ දැනට පරීක්ෂණාගාරවලින් දිවැස ඔප්පු කොට ඇත්තේ, තිබිය හැකි ප්‍රත්‍යක්ෂ කිරීමේ මාර්ගයක් වශයෙන් පමණි. දිවැස් නුවණේ වැඩට යොදා ගත හැකි ප්‍රයෝජන අපමණ වුවත් තව ම ඒවාට අත තබාවත් නැත. මිනිසකුට තම ඇස් හා කන් වහල් කොට නොගත් දැනීම් මාර්ගයක් තිබේ නම්, මසැස භාවිතයට නොගෙන වෙනත් තැනෙක සිදුවන දෙයක් කය තුළ සවි කරන ලද ටෙලිවිෂන් යන්ත්‍රයෙකින් මෙන් කිසිදු පරිසරයෙක දී "දැකිය හැකි" නම් මිනිසාට තමා ගැනත් තමා ජීවත් වන ලෝකය ගැනත් දැනීම ලබා ගැනීම සඳහා වැදගත් නව මාර්ගයක් විවෘත ව ඇති බව පැහැදිලි ය.

ගත වර්ෂ ගණනාවක් තිස්සේ මිනිසා ඉටු කර ගෙන ඇති දේ අති විශාල ය. ඔහුට තම ශක්තියෙන් හා ඥානයෙන් අවකාශය ජය ගැනීමටත් භෞතික ලෝකය තම අධිෂ්ඨානයට අවනත කර ගැනීමටත් හැකි වී තිබේ. ඔහුගේ ශක්තිය හා දක්ෂතාව කොතෙක් වුවත් තව ම මිනිසා සිටින්නේ හානි කළ හැකි දුර්වල තත්ත්වයෙක ය. බාහිර දේවල් කොතෙක් යටත් කර ගෙන සිටියත් තව ම මිනිසාට තමා පෙනෙන්නේ හීන වූ බල ඇති මංමුළා වූ එකකු ලෙස ය. කලාවෙන්, සංස්කෘතියෙන් හා සභ්‍යත්වයෙන් ලබා ඇති ජය කොතෙක් වුවත් උපතේ සිට මරණය තෙක් තමා ද තම ප්‍රියයන් ද, පසු පස ලුහුබඳනා දුකෙහි තේරුම හා ප්‍රයෝජනය කිමෙක් දැයි තව ම වටහා ගෙන නැත.

මෑතෙක දී මිනිසා පරමාණුවේ ඇතුළත ගැබට විනිවිද ගියේ ය. සාමාන්‍ය ඉන්ද්‍රියයන්ගේ වහලක් නැති ව දැනීම ලබා ගත හැකි මාර්ග ඇති බව ද උඩු සිත හා යටි සිත අතර ආශ්චර්යවත් සම්බන්ධතාවක් ඇති බව ද අලුතින් සොයා ගෙන තිබේ. දැන් ඔහු තමාගේ ම ඇතුළත ගැබට විනිවිද යන තැනට පැමිණ සිටිනවා විය හැකි ය. අඳුරේ ගත කළ ශත වර්ෂ බොහෝ ගණනකට පසුව අවසානයේ දී මිනිසාට තමාගේ පැවැත්ම පිළිබඳ මහා මූලික ප්‍රහේලිකාවකට විද්‍යානුකූල වූ තෘප්තිදායක විසඳුමක් ලැබෙනවා විය හැකි ය. මිනිසා උපන්නේත් දුක් විඳින්නේත් කවර හෙයින් ද යනු ඔහුට ඇති මහා ප්‍රහේලිකාවයි.

# 2

# එඩ්ගා කේසිගේ වෙදකම් දිවැස

දිවැසේ ශක්තියෙන් කළ හැකි දේ ගැන සිතන විට සිත සැලෙයි. තමාට ඇති ඒ ශක්තිය ප්‍රයෝග පක්ෂයෙන් ද ඥාන පක්ෂයෙන් ද අර්ථවත් වූ කාර්යවලට යෙදීමට සමත් වූ මිනිසකු හමු වුවහොත් ඊටත් වැඩියෙන් සිත සැලෙනු ඇත. එඩ්ගා කේසි[1] එබඳු මිනිසෙකි.

කේසිගේ ජීවිතයේ අවසාන කාලයේ දී ඔහු ගැන සඳහන් කරනු ලැබුවේ "වර්ජිනියා වෙරළේ ප්‍රාතිහාර්යකාරයා"[2] කියා ය. මේ හැඳින්වීම නො මඟ යවන්නෙකි. සිය ගණන් මිනිසුන් ඔහුගේ උදව්වෙන් පුදුම ලෙස සුවය ලැබූ නමුත්, කේසි, කිසිසේත් වචනයේ සාමාන්‍ය අර්ථයෙන් ප්‍රාතිහාර්යකාරයෙක් නො වී ය. රෝගීන් මත අත තැබීමෙක් හෝ රහස් මන්තර ගුරුකම් ශක්තියෙක් හෝ වස්ත්‍රයක් සිඹින්නට දීම පමණෙකින් කොරුන්ගේ කිහිලිකරු ඉවතලීමෙක් හෝ එහි නො තිබිණි. එඩ්ගා කේසි විසින් ඊනියා ප්‍රාතිහාර්ය කරන ලද්දේ බොහෝ විට රෝගියා සිටි තැනින් සැතපුම් දහස් ගණනකට ඈත සිට දිවැසින් කරන ලද විස්මය ජනක ලෙසින් නිවැරැදි වූ රෝග

---

1. Edgar Cayce 2. The Miracle Man of Virginia Beach

විනිශ්චය මාර්ගයෙන් පමණි. තව ද ඔහුගේ දිවැස් ශක්තිය මතු කර ගෙන ඇත්තේ සම්පූර්ණයෙන් ම සම්මෝහ නිද්‍රාව තුළ සිටිය දී ය. සම්මෝහ නිද්‍රාව නමින් හැඳින්වෙන්නේ තමාගේ ම හෝ අනිකකුගේ හෝ යෝජනාවක් නිසා ඇති වූ කෘත්‍රිම නින්දෙකි. මෙය එක්තරා වර්ගයෙක සමවතෙකි. රෝගවලට ප්‍රතිකාර කිරීමේ ක්‍රමයක් හෝ යටි සිත පරීක්ෂා කිරීමේ උපාය මාර්ගයක් වශයෙන් හෝ වැඩි වැඩියෙන් සම්මෝහ නිද්‍රාව භාවිත කරන මානසික ප්‍රතිකාර කරන්නවුනට [1] මේ සිද්ධිය විශේෂයෙන් වැදගත් විය යුතු ය.

කේසිගේ සම්මෝහ නිද්‍රා දිවැස පහළ වන ආකාරය පිළිබඳ හොඳ අවබෝධයක් අලබාමාවේ සෙල්මාහි [2] කුඩා දැරිය පිළිබඳ සිද්ධියෙන් ඇති කර ගත හැකි ය. හේතුවක් දක්විය නො හැකි ලෙසින් මේ දැරියගේ සිහිය නැති විණි. ඕ උමතු රෝහලකට ඇතුළු කරනු ලැබුවා ය. ඈ ගැන තද උනන්දුවක් දක් වූ ඇගේ සහෝදරයා කේසිගේ පිහිට ඉල්ලා සිටියේ ය.

කේසි තම කවිච්චිය මත දිගා විය. කීපවරක් දීර්ඝ ව ආශ්වාස කළ හේ නින්දට වැටිණි. ඊළඟට ඔහුට ඒ දැරියගේ සිරුර පරීක්ෂා කර බලා රෝග නිදානය සොයා ගත හැකි ය යන කෙටි සම්මෝහ නිද්‍රා යෝජනාව ලැබුණේ ය. සම්මෝහ නිද්‍රා යෝජනාව නම් මෙබඳු නින්දෙක සිටින්නකුට කෙරෙන යෝජනාවයි. කේසි සුළු වෙලාවක් නිසොල්මනේ සිට කථා කරන්නට විය. සම්මෝහ නිද්‍රාවට වැටුණු හැම දෙනා ම එබඳු යෝජනාවක් ලැබුණු විට ක්‍රියා කරන්නේ ඒ අයුරිනි. එහෙත් බොහෝ සම්මෝහ නිද්‍රෝපගතයනට වෙනස්ව, කේසි, ඇක්ස්-රේ පෙනීමක් [3] ඇතුවාක් මෙන් උමතු දැරියගේ කායික තත්ත්වය කෙටියෙන් විස්තර කරන්නට පටන් ගත්තේ ය. මේ දැරියගේ හක්ක මුල දතක් තද වී මොළයේ නහරයෙක ගෑවෙන

1. Psychotherapists 2. Selma, Alabama 3. X-ray vision

බවත්, දත ගලවා දැමූ විට තදය ඉවත් වී ඇ නීරෝගී වන බවත් හේ කීවේය. ඔහු විසින් විස්තර කරන ලද මුඛ ප්‍රදේශය පරීක්ෂා කළ විට කලින් සැකයට පාත්‍ර නොවූ තදය හමු විය. දත ගලවා දැමීමෙන් පසුව ඕ සම්පූර්ණයෙන් සුවපත් වූවා ය.

තවත් සිත් කාවදින නිදසුනෙක් නම්, අඩු මසින් දරුවකු ප්‍රසූත කළ තරුණ කෙන්ටකි [1] ස්ත්‍රිය පිළිබඳ සිද්ධියයි. උපතේ සිට රෝගයෙන් පෙළුණු දරුවාට සිව්මස් වයසේ දී භයානක වෙව්ලීමෙක් ඇති විය. එය කොතරම් භයානක වූවා ද යතහොත් දරුවාගේ පියාත් ඇතුළු කොට, වෙදකම් කළ වෛද්‍යවරුන් තිදෙනෙක් ම බිළිඳා දවසක් වත් ජීවත් නොවේතැයි සිතූහ. බලාපොරොත්තු නැති තත්වයෙක සිටි මව රෝග නිදානය සොයන්නට යයි කේසිගෙන් ඉල්ලා සිටියා ය. සම්මෝහ නිද්‍රාවේ සිටි කේසි බෙලඩෝනා [2] විස වේලක් දී, පසුව අවශ්‍ය නම් විෂ නාශකයක් ද දෙන්නට නියම කෙළේ ය. වෛද්‍යවරුන්ගේ බලවත් විරෝධයට පටහැනිව විස වේල දිය යුතු බව මව තරයේ කියා සිටියා ය. එය දෙනවාත් සමග ම වෙව්ලිල්ල නතර විය. විෂ නාශකය දුන් පසු ළදරුවා දිග ඇරී සන්සුන් වී නින්දට වැටුණේ ය. එයින් ඒ ළදරු ජීවිතය බේරිණි.

මේ නිදසුනුත් තවත් මෙබඳු සිය ගණනක් නිදසුනුත් කිසි ම අයුරෙකින් ඇදහීම මුල් කොට ගත් සුව වීම් [3] ගණයට දැමිය නො හැකි ය. මෙහි සඳහන් කරන ලද නිදසුන් දෙකේ දී තරම් ඉක්මනින් සුවය ලැබුණේ අවස්ථා කීපයෙක දී පමණි. හැම අවස්ථාවෙක දී ම ඉතා පැහැදිලි වූ ද ඇතැම් විට ඉතා දීර්ඝ වූ ද ප්‍රතිකාර ක්‍රමයෙක් නියම විය. ප්‍රතිකාරය ඖෂධවලින්, ශල්‍ය කර්මයෙන්, ආහාරයෙන්, විටැමින්වලින්, ජලචිකිත්සාවෙන් [4],

1. Kentucky
2. Belladonna
3. Faith Cures
4. Hydrotherapy (- ජලය යොදා කෙරෙන වෙදකමක්)

අස්ථි චිකිත්සාවෙන් [1], විද්‍යුත් චිකිත්සාවෙන් [2], සම්බාහනයෙන්[3], ස්වයං-යෝජනාවෙන් [4] යනාදී කොයි ක්‍රමයෙකින් වුවත්, එය ඉතා පැහැදිලි ක්‍රමයෙක් ම විය. තව ද ඒවා අතිශයෝක්ති යයි හෝ ලෙහෙසියෙන් රැවටෙන මිනිසුන්ගේ බොරු ගෙතීම් යයි හෝ සැලැකිය නො හැකි ය. කේසිගෙන් පිළියම් ලැබූ තිස් දහසකට වැඩි වූ හැම රෝගියකු පිළිබඳ වූ ම වාර්තා වර්ජිනියා බීච්හි ආරක්ෂා සහිත ව, ලිපිගොනුවල තැන්පත් කොට තිබේ. මේ වාර්තා පරීක්ෂා කිරීමට කැමැති ඕනෑ ම සුදුසුකම් ඇති අයකුට ඒවා පරීක්ෂා කළ හැකි ය. මේවා අතර විමැසීම්, ඉල්ලීම් හා ලෝකයේ නොයෙක් පෙදෙස්වල දුක් විඳින මිනිසුන්ගේ කළ ගුණ පැවැසීම් පිළිබඳ දාතම යෙදූ ලිපි ද වෛද්‍යවරුන්ගේ ලිපි, වාර්තා හා සහතික පත්‍ර ද සම්මෝහ නිද්‍රාවේ සිටි කේසි විසින් කියන ලද හැම වචනයෙක ම, ලඝුලේඛක පිටපත් ද ඇත. මේ සියල්ල ම මේ අද්භූත සිද්ධියේ සත්‍යතාව පිළිබඳ ලේඛනගත ව ඇති සිත් කාවදින සාක්කි ය.

1877 දී කේසි, මෙලොව එළිය දුටුවේ කෙන්ටකිහි හොප්කින්ස්විල් [5] නම් ස්ථානයට නුදුරිනි. ඔහුගේ මාපියෝ නූගත් ගොවියෝ ය. නව වැනි පන්තිය තෙක් ඔහු ගියේ පිටිසර පාසැලකට ය. දේශකයකු වීමේ ආශාව තිබුණු නමුත් ඔහුට තවදුරටත් ඉගෙනීම කරගෙන යන්නට කවදාවත් ඉඩ ලැබුණේ නැත. ගොවිපලේ ජීවිතයට ප්‍රිය නොකළ තරුණ කේසි, නගරයට ගියේ ය. එහි දී ඔහු පොත් සාප්පුවෙක ලියන්නකු ලෙස ද ඊළඟට රක්ෂණ සමාගමෙක වෙළඳ නියෝජිතයකු ලෙස ද සේවය කෙළේ ය.

1. Osteopathy (- ඇට පිළිබඳ වෙදකම)
2. Electric Treatments (- විද්‍යුතය [විදුලිය] යෙන් කැරෙන වෙදකම)
3. මසාජ් කිරීම
4. Autosuggestion (- තමා විසින් ම අදහස් ඇතුළු කරගැනීම)
5. Hopkinsvill

වයස විසි එකේ දී ඔහුගේ ජීවිතයේ අමුතු වෙනසක් ඇති විය. මෙයින් ඔහුගේ ඉලක්කය වෙනස් විය. බැරුණ්ඩ්[1] රෝගයෙන් පහර ලත් ඔහුගේ කටහඬ නැති විය. සියලු ප්‍රතිකාර නිශ්ඵල විය. ඔහු උපදෙස් ලැබූ සියලු වෛද්‍යවරු ඔහුට උපකාර කිරීමට අසමර්ථ වූහ. වෙළඳ නියෝජිතයකු ලෙස තම කාර්යය දිගට කර ගෙන යෑමට අසමත් වූ තරුණ කේසි, සුව කළ නොහැකි ලෙස පෙනෙන තම රෝගය ගැන සිතමින් බලාපොරොත්තු සුන්කර ගෙන ගෙදර අවුත් අවුරුද්දක් පමණ නිකම් සිටියේ ය.

අවසානයේ දී ඔහු ඡායාරූප කලාවට බසින්නට ඉටා ගත්තේ මේ වෘත්තියට තම කටහඬ එතරම් අවශ්‍ය නොවූ හෙයිනි. ඔහු ඡායාරූප ශිල්පියකුගේ අතැවැසියකු මෙන් කටයුතු කරන කාලයෙහි සංචාරක විනෝද ක්‍රීඩකයකු ද සම්මෝහ නිද්‍රාකාරයකු ද වූ හාට්[2] නම් මිනිසෙක් ඒ නගරයට පැමිණ, හොප්කින්ස්විල් ගීත නෘත්‍යාගාරයෙහි රාත්‍රී සන්දර්ශනයක් පැවැත්විය. කේසිගේ තත්ත්වය ගැන ඇසූ හාට් සම්මෝහ නිද්‍රා මාර්ගයෙන් ප්‍රතිකාරයක් කිරීමට ඉදිරිපත් විය. කේසි මේ පරීක්ෂණයට ඉදිරිපත් වූයේ සොම්නසිනි. සම්මෝහ නිද්‍රාව තුළ දී හේ හාට්ගේ යෝජනාවට තෙපුල් දී ප්‍රකෘති කටහඬින් කථා කළේ ය. එහෙත් පිබිදීමෙන් පසු කටහඬේ විකෘතිය නැවත පැමිණියේ ය. ඒ ප්‍රතිකාරය සාර්ථක වූයේ එපමණකට පමණි. ඊළඟට පිබිදීමෙන් පසු වත් ඔහුට ස්වාභාවික ලෙස කථා කළ හැකි ය. යන යෝජනාව, සම්මෝහ නිද්‍රාවේ දී ම දෙන ලදී. පශ්චාත් සම්මෝහ නිද්‍රා යෝජනාව[3] නමින් හැඳින්වෙන මේ ක්‍රමය, බොහෝ දෙනෙකුට අධික ධූම පානයෙන් හා වෙනත් පුරුදුවලින් මිදීමට උපකාර වී ඇත. එහෙත් බොහෝ විට සාර්ථක වන මේ ක්‍රමය කේසිගේ රෝගයේ දී අසාර්ථක විය.

---

1. Laryngitis 2. Hart 3. Post - Hypnotic Suggestion

වෙනත් නගරවල නළු ගිවිසුම් බාර ගෙන තිබුණු නිසා හාට්ට පරීක්ෂණය දිගට කර ගෙන යෑමට ඉඩ නොලැබිණි. එහෙත් ඒ පෙදෙසෙහි ම වුසු ලේන් [1] නම් වූ මිනිසෙක් ද මේ සිද්ධිය තරමෙක සැලකිල්ලෙකින් බලා සිටියේ ය. ඔහු යෝජක චිකිත්සාවන් [2] අස්ථි චිකිත්සාවන් [3] හදාරමින් සිටි අයෙකි. සම්මෝහ නිද්‍රා කාරයකු වශයෙන් ද ඔහුට දක්ෂතාවක් තිබිණි. නව ම සුව වී නො තිබූ කණ්ඨ රෝගයට තම දක්ෂතාව යොදා බලන්නට දැයි ලේන් ඇසී ය. කේසි සිටියේ සුවය ලබා ගැනීමට ඉවහල් වන ඕනෑ ම දෙයකට එකඟ වන තත්ත්වයක ය.

ලේන්ගේ අදහස වූයේ සම්මෝහ නිද්‍රාව තුළ සිටි කේසිට ම ඔහුගේ රෝග ස්වභාවය විස්තර කිරීමට යයි යෝජනා කිරීමට ය. කියන්නට පුදුමයි ! යෝජනා කළ ආකාරයෙන් ම කේසි ක්‍රියා කෙළේ ය. ප්‍රකෘති හඬින් කථා කරමින් (මෙය ද ලේන්ගේ යෝජනාවට පිළිතුරු වශයෙන්) කේසි තමාගේ ම ස්වර රජ්ජුන්ගේ[4] ස්වභාවය විස්තර කරන්නට පටන් ගත්තේ ය. "ඔව්" යෙහි කතාව ආරම්භ කළේ ය. "අපට සිරුර බැලිය හැකි ය. (කේසි මෙහි දීත් මින් පසු හැම විටෙක දීත් නින්දේ සිටින විට උත්තම පුරුෂ බහු වචනය භාවිත කෙළේ ය.) සාමාන්‍ය තත්ත්වයේ දී මේ ශරීරය කථා කිරීමට අසමර්ථ ය. එසේ වී ඇත්තේ ස්නායු ශ්‍රමය නිසා ස්වර රජ්ජුන්ගේ අධර පේශී, අඩක් නිෂ්ක්‍රීය ව ඇති හෙයිනි. මෙය කායික ප්‍රතිඵලයක් ඇති කරන මානසික තත්ත්වයෙකි. අසංඥ තත්ත්වයේ සිටිය දී රෝගය වැළඳී ඇති කොටස්වලට ලේ ගමන් කරනු ඇතැයි යෝජනා කොට ඒ කොටස්වලට ලේ ගමන වැඩි කිරීමෙන් මෙය ඉවත් කළ හැකි ය."

1. Layne
2. Suggestive Therapeutics (මෙයින් අදහස් කෙරෙන්නේ රෝගියාට යම් යම් අදහස් ඇතුළු කිරීමෙන් රෝග සුව කිරීමේ ක්‍රමයයි.)
3. ඇට පිළිබඳ වෙදකම
4. Vocal Cords

ලේන් වහා ම, රෝගය වැළැඳී ඇති කොටස්වලට ලේ ගමන වැඩි වනු ඇතැයි ද තත්ත්වය ලිහිල් වනු ඇතැයි ද, කේසිට යෝජනා කෙළේ ය. ක්‍රමයෙන් කේසිගේ පපුවෙහි උඩ කොටසත් ඊළඟට ඔහුගේ ගෙළත් සුදු රත් පැහැයට හැරෙන්නට විය. ඊළඟට රෝස පැහැයට ද තද රතට ද හැරිණි. විනාඩි විස්සකට පමණ පසු ව නිද ගෙන සිටි මිනිසා උගුර පාදා මෙසේ කීවේ ය. "දැන් ඔක්කොම හරි, තත්ත්වය ඉවත් වුණා. ලේ ගමන ප්‍රකෘති තත්ත්වයට පත් වන්නටත් ඊට පසුව ශරීරය නැගිටින්නටත් යෝජනා කරන්න." උපදෙස් ලැබුණු පරිදි ලේන් යෝජනාව කෙළේ ය. පිබිදුණු කේසි අවුරුද්දකටත් වැඩි කාලයකට පසුව, පළමු වරට ප්‍රකෘති කට හඬින් කථා කරන්නට පටන් ගත්තේ ය. ඊට පසුවත් ඔහුට ඉඳහිට රෝගය වැළැඳුණු නමුදු ඒ හැම අවස්ථාවෙක දී ම, ලේන්, ලේ ගමන පිළිබඳ යෝජනාව කළ විට ඒ තත්ත්වය ඉවත් විය.

කේසි සම්බන්ධයෙන් පමණක් නම්, සිද්ධිය මෙතෙකින් අවසන් වීමට ඉඩ තිබිණි. එහෙත් ලේන්, ඒ සිද්ධියෙහි ගැබ් වී ඇති දේ ගැන පරීක්ෂාවෙන් සිටියේ ය. සම්මෝහ නිද්‍රාවේ ඉතිහාසය හුරුව සිටි හේ, ප්‍රංශයේ සිටි මෙස්මර්ගේ අනුගාමිකයකු වූ ඩී. පුයුස්ගුර්ගේ [1] මුල් කාලයේ අත්දැකීම්වල තිබූ ඊට සමාන නිදර්ශන ද දැන සිටියේ ය. කේසි ට සම්මෝහ නිද්‍රාවේ දී තමාගේ ම ශරීරයේ තත්ත්වයන් සොයා දැන ගත හැකි වී නම්, අන්‍යයන්ගේ තත්ත්වයන් ද සොයා දැන ගත හැකි වනු ඇත යන අදහස ලේන්ට ඇති විය. ලේන් සිටියේ කලෙක සිට උදර රෝගයකින් පෙළෙමිනි. ඔව්හු ලේන් ගැන ම පරීක්ෂණ කළහ. එය සාර්ථක විය. සම්මෝහ නිද්‍රාවේ දී ලේන්ගේ ශරීර තත්ත්වය විස්තර කළ කේසි, පිළියම් ක්‍රමයක් ද යෝජනා කෙළේ ය. ලේන් ප්‍රීතියට පත් විය. ඔහු දැන සිටි රෝග ලක්ෂණවලට මේ විස්තර හොඳින් ගැළපුණේ ය. ඒ වන විටත්

1. De Puysegur

වෛද්‍යවරුන් කිප දෙනකුන් විසින් සොයා දැන ගෙන තිබුණේ ද, ඒ ලක්ෂණමය. එහෙත් මේ අවස්ථාවේ දී නියම කරන ලද ප්‍රතිකාර ක්‍රමයට, කලින් නියම නො කරන ලද බෙහෙත්, ආහාර හා ව්‍යායාම ද ඇතුළත් විය. යෝජනා කරන ලද ප්‍රතිකාර ක්‍රමය ලේන් අත්හදා බැලුවේ ය. සති තුනකට පසුව ඔහුගේ තත්ත්වය දැනෙන තරමට හොඳ අතට හැරී ඇති බව ඔහුට වැටහිණි.

මුළු සිද්ධිය ගැන ම, කේසි සිටියේ සැකයෙනි. එහෙත් ලේන්, රෝගයෙන් පෙළෙන අන්‍යයනටත් උපකාර කළ හැකි දෝයි ඉතා ආශාවෙන් හා උනන්දුවෙන් සිටියේ ය. කේසි, බයිබලය කියවන්නට පටන් ගෙන තිබුණේ අවුරුදු දහයෙක ළමයකු වශයෙනි. එතැන් සිට හේ, අවුරුද්දකට වරක්, පිට කොළයේ සිට පිට කොළයට කියෙව්වේ ය. කේසි ඒ කාලයේ සිට ක්‍රිස්තුස් වහන්සේගේ ශිෂ්‍යයකු මෙන්, අන්‍ය මනුෂ්‍යයනට උපකාර කිරීමටත් අන්‍යයන් සුවපත් කිරීමටත් ආශාවෙන් සිටියේය. පසුව ඔහු, දේශකයකු වීමට සිතා සිටි නමුත් ඒ ප්‍රාර්ථනාව, පරිසරය නිසා බිඳී ගියේ ය. දැන් ඔහුට පුදුමයකට මෙන්, අන්‍යයන් සුවපත් කරන්නට අවස්ථාවක් ලැබෙන්නට යයි. එහෙත් කේසි එය පිළිගැනීමට බිය විය. නින්දෙන් සිටින අතර අහිතකර දෙයක් කියැවුණොත් කුමක් කරන්න ද ? මරණයට හේතුවන දෙයක් පවා නියම විය නොහැකි ද ? අන්තරාය කර දෙයක් නියම කළහොත් එය වළක්වා ලන්නට තරම් වෛද්‍ය-ශාස්ත්‍රය ගැන ලේන් දැන සිටි නිසා, එහි අනතුරක් නැතැයි ලේන් ඔහුට සහතික කර කියා සිටියේ ය. කේසි, මාර්ගෝපදේශකත්වය ලබා ගැනීම සඳහා ධර්ම ග්‍රන්ථ පරීක්ෂා කෙළේ ය. අන්තිමේ දී හේ එතරම් නුහුරු ක්‍රමයෙකින් වුව ද උදවු ලැබීමට බලාපොරොත්තු වූ අයට උදවු කිරීමට එකඟ විය. එය පරීක්ෂණයක් වශයෙන් පමණක් සැලැකිය යුතු බව කියා සිටි හෙතෙම තමාගේ සේවය සඳහා මුදලක් ගැනීමට මුළුමනින් ම අකැමැති විය.

සම්මෝහ-නිද්‍රාවෙන් කේසි කී දේවල්, ලේන් ලඝු ලේඛනයෙන් සටහන් කර ගන්නට පටන් ගත්තේ ය. ඔවුහු මේ ලියූ පිටපත්වලට "කියැවීම්" යන නම යොදන්නට ද වූහ. ඒ නම දෙන ලද්දේ ඊට වඩා සුදුසු නමක් සිතට නා නිසා මිස, එය විශේෂ වශයෙන් නිවැරැදි නමක් වන නිසා නොවේ.

ඡායාරූප ශාලාවෙන් ඉතිරි කර ගත් කාලය, කේසි රෝගී නගරවාසීන්ගේ රෝග නිදාන සෙවීමට කැප කළේ ය. මෙහි දී දක්නට ලැබුණු බෙහෙවින් ම ආශ්චර්යවත් අංගයෙක් විය. එනම් සාමාන්‍ය ජීවිතයේ දී වෛද්‍ය ශාස්ත්‍රය ගැන කිසිත් නො දැන සිටි නමුත්, ඒ පිළිබඳ පොතක් පවා කිසි දිනෙකවත් කියවා නොසිටි නමුත්, කේසි තම රෝග විනිශ්චයවල දී ව්‍යුහවේදයට[1] හා කායික විද්‍යාවට [2] අයත් නියම වචනවලින් රෝග තත්ත්වයන් විස්තර කිරීමයි. එහෙත් කේසිට සියල්ලට ම වඩා ආශ්චර්යවත් වූයේ තමා මිනිසුන්ට කරන්නට කී දේවල් කිරීමෙන් ඔවුන් සුවපත් වීම ය. ලේන්ගේ සිද්ධිය ප්‍රශ්න කළ හැක්කක් ලෙසින් ඔහුට පෙනිණි. සමහර විට "සනීපය" යන ලේන්ගේ හැඟීම, ඔහුගේ ම මනඃකල්පිතයක් විය හැකි ය. එහෙත් තමා ම නැවත කටහඬ ලබා ගැනීම, කිසිසේත් මනඃකල්පිතයක් නොවේ. එහෙත් එය, භාග්‍ය සම්පන්න අහඹු සිද්ධියක් වීමට ඉඩ ඇත. සමහර විට, මේ ශක්තිය ඇදැහිය හැක්කේ තමා සම්බන්ධයෙන් පමණක් වන්නට ද ඉඩ තිබේ. අසාධ්‍ය යයි හඳුන්වා තිබුණු රෝග පවා, සුව කිරීමේ "නැතැයි" කිව නො හැකි සත්‍ය සිද්ධිය නිසා, කේසිගේ "කියැවීම්වල" මුල් අවුරුදුවල දී ඔහු සමග දිගට ම පොර බදමින් පැවැති මේ සියලු සැක, ක්‍රමයෙන් දියැවී ගියේ ය.

කේසිගේ ශක්තිය පිළිබඳ ආරංචිය ක්‍රමයෙන් පැතිරිණි. දිනක් කේසිට හොප්කින්ස්විල්හි මහජන පාසැල්වල කලින් සිටි පරීක්ෂකවරයාගෙන් බොහෝ දුර සිට පණිවිඩයක් ලැබුණේ ය.

1. Anatomy 2. Physiology

ඔහුගේ පස් හැවිරිදි දුව තුන් අවුරුද්දෙක සිට සිටියේ අසනීපයෙනි. අවුරුදු දෙකේ දී, ඇට තද ප්‍රතිශ්‍යාවක් වැළැඳිණි. ඉන් පසු ව ඇගේ මනස ස්වාභාවික ලෙස වැඩුණේ නැත. මාපියෝ විශේෂඥයන් එකකුට පසු ව එකකුගෙන් උපදෙස් සෙවූහ. එහෙත් ඒ එකකුට වත් දැරියට කිසි ම උපකාරයක් කළ නො හැකි විය. පසුව මේ දැරිය වැඩි වැඩියෙන් නිතර වෙව්ලීමෙකින් පෙළෙන්නට වූවා ය. අන්තිමට උපදෙස් ගත් විශේෂඥයා කීවේ ඈ හැම විට ම වාගේ මාරක බව ඔප්පු වී ඇති දුර්ලභ වර්ගයෙක, මොළයේ රෝගයකින් පෙළෙන බව ය. දුකින් බර වූ හදවතින් යුතු දෙමාපියෝ දැරිය මැරෙන්නට ගෙදර ගෙන ආහ. ඔවුනට මිත්‍රයකුගෙන් එඩ්ගා කේසිගේ පුදුම ශක්තිය ගැන දැන ගන්නට ලැබුණේ මේ අවස්ථාවේ දී ය.

තොරතුරුවලින් කම්පිත වූ කේසි, 'කියැවීමක්' දීම සඳහා' නගරයෙන් පිට යන විශේෂ ගමනකට කැමැත්ත දුන්නේ ය. ආර්ථික වශයෙන් පහත් තත්ත්වයෙක සිටි නිසා ඔහුට දුම්රිය ගාස්තුව පිළිගන්නට සිදු විය. දැරියගේ පියා එය ගෙව්වේ ය. ඔහු කළ සේවයක් සඳහා පැහැදිලි ව යමක් ගත් ප්‍රථම අවස්ථාව මෙය විය.

කෙසේ හෝ ඔහු මේ ගමන පිළිගත්තේ සැකයෙන් බර හදවතෙකින් යුතුවයි. අස්වාභාවික කුඩා දැරිය දුටු පසු තමා බාර ගෙන ඇති වගකීමේ මහත්කම ඔහුට වඩාත් දැනී ගියේ ය. වෛද්‍ය ශාස්ත්‍රය ගැන කිසිත් නොදත්, නූගත් ගොවියකුගේ පුතෙක් රටේ ම සිටි දක්ෂතම විශේෂඥයනටවත් පිහිටක් විය නො හැකි ව සිටි දැරියකට උපකාර කිරීමට යයි. කේසි ඒ ගෙදර සාලයේ සෝපාව මත නින්දට වැටුණේ භයින් කම්පා වෙමිනි. කෙසේ හෝ සම්මෝහ නිද්‍රාවේ දී, තමා පිළිබඳ ඒ සියලු සැක පහව ගියේ ය. ළඟ සිටි ලේන්, යෝජනාව කොට පුරුදු පරිදි කේසි කියන දේ පිටපත් කෙළේ ය. පෙර කරන ලද සියලු

1. අපට හුරුපුරුදු ලෙසින් කිවහොත් සාස්තරයක් කීම සඳහා.

කියැවීම්වල තුබූ නිශ්චල ප්‍රවාහී ස්ථිරතාවෙන් යුතු ව, නිදහ ඡායාරූප ශිල්පියා දූරියගේ තත්ත්වය විස්තර කරන්නට පටන් ගත්තේ ය. ප්‍රතිශ්‍යාව රෝගය වැළැඳෙන්නට ටික කලකට පෙර දූරිය වාහනයෙකින් වැටී ඇති බවත්, එයින් තැළුණු පෙගෙදසේ ප්‍රතිශ්‍යාව විෂ බීජ තැන්පත් ව ඇති නිසා වෙව්ලීම සිදුවන බවත් හෙ කීවේ ය. සුදුසු ගස් වෙදකමෙකින් තැළීම ඉවත් කළ කල, සුවය ලැබෙනැයි දැන ගන්නට ලැබිණි.

මව, දූරිය වාහනයෙකින් වැටුණු බව ස්ථිර කළා ය. එහෙත් පෙනෙන තුවාලයක් නො තුබූ නිසා මේ සිද්ධිය හා රෝගය අතර මොන ම සම්බන්ධයක්වත් ඇතැයි ඇට කිසි දිනෙකවත් සිතී තිබුණේ නැත.

උපදෙස් ලැබුණු ලෙසින් සුදුසු පිළියම් ලේන් විසින් කරන ලදී. සති තුනක් ඇතුළත දී වෙව්ලීම් රෝගයෙන් දූරිය සම්පූර්ණයෙන් ම මිදුණා ය. ඇගේ මනස ප්‍රකෘතිමත් වීමේ ලකුණු, නිශ්චිත ලෙස ම පෙනෙන්නට විය. රෝගයට පෙර ඇගේ ප්‍රියතම කෙළි බඩුව ලෙසින් පැවැති බෝනික්කකුගේ නම කියා ඕ කථා කළා ය. ඉන්පසු ඕ අවුරුදු තුනකට පසු ව, ප්‍රථම වරට තම මාපියන් ඇමතුවා ය. මාස තුනකට පසු ව, කෘතවේදී මාපියෝ හැම අතෙකින් ම දූරිය ස්වාභාවික තත්ත්වයට පත්ව ඇති බවත්, උමතුව සිටි අවුරුදු තුනේ දී අතපසු වූ දේවල් වේගයෙන් ඉගෙන ගන්නා බවත්, වාර්තා කළහ.

මෙබඳු නිදර්ශන නිසා. කේසිට එතරම් අසිරිමත් වූත්, විවරණය නො කළ හැක්කා වූත්, ශක්තියක් ප්‍රයෝජනයට ගැනීම නිවැරැදිය යන විශ්වාසය ඇති විය. මෙබඳු සිදුවීම් නිසා ඔහුගේ කීර්තිය ද පැතිරිණි. හදිසියෙන් කේසි සොයා ගත් පුවත්පත්කරුවෝ ඔහු ප්‍රසිද්ධියට පත් කළහ. බලාපොරොත්තු සුන් කර ගෙන සිටි මිනිසුන්ගෙන් ඔහුට බොහෝ දුර සිට පණිවිඩ ලැබෙන්නට විය. ඔවුනට ඔහුගේ උපකාරය අවශ්‍ය

විය. ආතුරයාගේ නියම නමත් කියැවීම කරන අවස්ථාවේ දී ඔහු සිටින ස්ථානය හෙවත් විදිය, නගරය හා රාජ්‍යයත් යෝජනාව තුළ දී තමාට ලැබුණොත්, ඈතෙක සිට ගෙන පවා කියැවීම කළ හැකි බව කේසි දැන ගත්තේ මේ අවස්ථාවේ දී ය. බොහෝ විට ඔහු මේ දුර සිට කළ කියැවීම් ආරම්භ කළේ ආතුරයා සිටි පරිසරය පිළිබඳ ව හීන් හඬකින් කරන විස්තරයෙකිනි. "මේ උදෑසන, හොඳ සුළඟක්" "වින්ඩ් හූ" "ස්විට්සර්ලන්තය, මෙය ලස්සනයි නේ ද ? කදිම ලස්සන දිය පාරක්" දැන් සිරුර ගමන් කරනවා, ඕන් දැන් ලිෆ්ට් එකේ යනවා" "ලස්සන පිජාමා" "ඔව්, යාච්ඤා කරන මව මට පේනවා" මේ විස්තර හැම විට ම නිවැරැදි බව ඔප්පු වී තිබේ. ඔහුගේ දිවැසේ සත්‍යතාව පිළිබඳ තවත් සාක්කියක් මෙයින් සැපයේ.

කියැවීමේ ආතුරයා ඈත සිටියකු වුවත් කාමරයේ ම සිටියකු වුවත් ක්‍රියා මාර්ගය හැම විට ම එක ම විය. ඔහුට උවමනා කෙළේ සපත්තු ගලවා කර පටිය හා ගෙළ ගැටය බුරුල් කොට කවිච්චියෙක නැතහොත් ඇඳෙක දිගා වී සම්පූර්ණයෙන් ම සන්සුන් වීමට ය. දකුණට හිසත් උතුරට පාදත් දමා නිදා ගැනීම වඩා හොඳ බව ඔහුට දැන ගත හැකි විය. කවිච්චියකුත් හිසට කොට්ටයකුත් හැර අන්‍ය උපකරණයක් අනවශ්‍ය විය. පහසුව සඳහා මිස, මේවාත් නැති ව බැරිවා නොවේ. රාත්‍රි කාලයේත් මහා දවාලෙත් 'කියැවීම්' කළ හැකි විය. අන්ධකාරය හෝ ආලෝකය, ක්‍රියා මාර්ගය කෙරෙහි කිසි ම වෙනසක් ඇති කළේ නැත. දිගාවීමෙන් විනාඩි කීපයකට පසු ව, කේසි නින්දට වැටේ. එවිට ලේන් නැතහොත් කේසිගේ බිරිය, නැතහොත් පසු කාලයෙහි දී ඔහු පුත් හ්‍යූලින්[1] ඒත් නැතහොත් කේසි විසින් ඒ කාර්යය බාර දෙන ලද ඕනෑ ම වග කිව· යුතු පුද්ගලයකු කරන්නේ, සුදුසු යෝජනාව ඔහුට ඉදිරිපත් කිරීම ය. සාමාන්‍ය යෝජනා පාඨය මෙසේ ය.

1. Hugh Lynn

"දැන් ඔබ ඉදිරියේ අසවල් රටේ අසවල් නගරයේ සිටින අසවලා ඉන්නවා. (සුදුසු පරිදි නම් ගම් ආදිය යොදා ගත යුතු ය.) ඔබ මේ සිරුර වටා පරිස්සමින් ගොස් එය හොඳින් පරීක්ෂා කර මේ අවස්ථාවේ එහි ඇති තත්ත්වයත් ඒ තත්ත්වයට හේතුවත් මට කියන්න. මේ ශරීරයේ නිදහසට හා උපකාරයට අවශ්‍ය යෝජනාත් කරන්න. මා ප්‍රශ්න අසන විට ඔබ ඒවාට උත්තර දෙනවා ඇති."

විනාඩි කීපයකට පසු ව, කේසි කථා කරන්නට පටන් ගනී. ලේන් නැතහොත් පසු කලෙක දී ග්ලැඩිස් ඩේවිස්[1] මෙනෙවිය කෙළේ ඔහු කී දේ ලඝු ලේඛනයෙන් වාර්තා කිරීමයි. පසුව මෙසේ සටහන් කර ගන්නා ලද වාර්තා යතුරු ලියනයෙන් පිටපත් කරන ලදී. බොහෝ විට එක් කොපියක් "කියැවීමේ" ආතුරයාට, ඔහුගේ මාපියන්ට, බාරකාරයාට නැතහොත් වෛද්‍යවරයාට දී ඇත. කහ පැහැති කාබන් කොපිය කේසිගේ ස්ථිර ලිපි ගොනුවල තබා ඇත.

පුවත්පත් ප්‍රසිද්ධියත් වැඩී ගෙන යන කට වචන කීර්තියත් නිසා කෑදර මුදල් වැද්දන්ගේ අවධානය කේසි වෙතට ඇදෙන්නට විය. සති දෙකක් තිස්සේ කපු වෙළඳ පොළ ගැන දිනපතා කියැවීම් ලබා ගැනීම සඳහා දිනකට ඩොලර් සියය ගණනේ කේසිට දීමට එක් කපු වෙළෙන්දෙක් ඉදිරිපත් විය. ඒ වන විට කේසිට තදින් මුදල් අවශ්‍ය වී තිබූ නමුත් යෝජනාව ඉවත දමන ලදී. තවත් අයට අවශ්‍ය වූයේ නිදන් වස්තු සොයා ගැනීමටය. තවත් කොටසකට රේස් අශ්වයන් ගැන දැන ගැනීමට අවශ්‍ය විය. අවස්ථා කීපයෙක දී පරීක්ෂණයක් වශයෙන් මේ වර්ගයේ කියැවීම් අත්හදා බැලීමට කේසි එකඟ විය. කීපවතාවක්ම හේ තුරඟ තරඟ වල ප්‍රතිඵල කීමට සමත් විය. අසමත් වූ අවස්ථා ද තිබිණි. එහෙත් ඒ හැම අස්ථාවෙක දීම

1. Miss Gladys Davis

උබිද් විට තම ශක්තිය පිරිහී ඇති බවත් තමා තමා සමග ම අමනාපයෙන් සිටින බවත් කේසිට හැඟී ගියේ ය. වරක් හේ ටෙක්සාස්හි [1] දී බිම් තෙල් ළිං ඇති තැන් සොයා ගැනීම සඳහා තම දිවැස් ශක්තිය යෙදවීමෙ අවදානම බාර ගත්තේ ය. එහි ප්‍රතිඵල තෘප්තිදායක නො විය. අන්තිමේ දී කේසි, තම ශක්තිය රෝගීන්ට උපකාර කිරීමේ දී පමණක් ඇදහිය යුත්තක් ය යන විශ්වාසය ඇති කර ගත්තේ ය. එය යෙදිය යුත්තේ පීඩිතයන් සඳහා පමණි. හුදු උපකාරයට - ඔහුත් ඇතුළු වූ ඕනෑ ම කෙනකුට මුදල් ලබා දීමට එය යෙදිය යුතු නොවේ ය යන නිගමනය හේ ඇතිකර ගත්තේ ය.

කවර වර්ගයෙක හෝ ප්‍රසිද්ධියක් ලැබීමට ද ඔහු ආශා කෙළේ නැත. 1922 දී "ඩෙන්වර් පෝස්ට්"[2] පුවත්පත් කතුවරයා කේසි ගැන අසා ඔහු ඩෙන්වරයට කැඳැවී ය. ඒත්තු යන කියැවීම් ප්‍රදර්ශනයක් නැරැඹීමෙන් පසු, කතුවරයා දිනකට ඩොලර් දහසක් ගෙවිය හැකි වැඩ පිළිවෙළක් යෝජනා කෙළේය. කේසිගේ ජයග්‍රාහී වූ මතුවීම සඳහා සම්පූර්ණ වැඩ පිළිවෙළ ඔහු යෝජනා කළේ මේ කොන්දේසි පිට ය; කේසි තලප්පාවක් බැඳ ගෙන පෙරදිග නාමයක් භාවිත කළ යුතු ය; කියැවීම් කළ යුත්තේ පාරභාසක [3] ජවනිකාවෙකින් අසන්නන්ගෙන් සැඟ වී සිට ගෙනය. කේසි එක වරට ම මේ යෝජනාව ඉවත දැමීමේ ය.

බ්‍රන්ස්වික් රේඩියෝ හා ටෙලිවිෂන් සංයුක්ත මණ්ඩලයේ සභාපති වූ ද කේසිගේ ජීවිත මිත්‍රයා වූ ද ඩේවිඩ් කාන්, පෞද්ගලික සාකච්ඡාවල දී තම විශාල වූ මිත්‍ර මණ්ඩලය තුළ ද ව්‍යාපාරික ආශ්‍රිතයන් අතර ද කේසිගේ සේවය පතළ කර හැරීමට

1. Texas
2. Denver post
3. Translucent (පාරභාසක ජවනිකාවෙක් නම් ඵනෙල් විදුරුමෙන් ආලෝකයට පසා කරගෙන යාම් ඉඩ දෙන ඔබ්බෙහි වූ වස්තූන් පැහැදිලිව පෙනීමට ඉඩ නොදෙන තිරයෙකි.)

බොහෝ වෙහෙස දැරී ය. එහෙත් ප්‍රචාරය වීමේ වඩා විශිෂ්ට ක්‍රමයක් ඔහු යෝජනා කළ විට, කේසි වජ්‍රයක් සේ ස්ථිර ව සිට ඊට විරුද්ධ විය. අලබාමාවේ බර්මින්හැම්හි පුවත් පතෙක පළ වූ එක් දේශනා දැන්වීමක් හැරුණු විට, මුළු කාලය තුළ දී ම කේසි තම කියැවීම් ගැන හෝ ප්‍රසිද්ධ දේශනා ගැන හෝ කිසිම දැන්වීමකට ඉඩ දුන්නේ නැත. තමා ගැන වැඩිපුර නොදත් අය සමඟ කළ සාකච්ඡාවල දී තම විශේෂ ශක්තිය ගැන ඒ අය ඇසුවේ නැති නම්, කේසි කිසි දිනෙක කථා කෙළේ නැත. නගරයේ සිටි බොහෝ මිනිසුන් කේසි, ඉරිදා පාසැල් පන්තියෙක ඉගැන්වූ බවට වැඩියෙන් ඔහු ගැන දැන සිටියේ අල්පයෙකි. හේ සමාජ සංවිධානයෙක හෝ සහෝදර සංගමයෙක හෝ නාගරික සංවිධානයෙක හෝ සාමාජිකයෙක් නොවී ය. තමා දුක් විඳින මිනිසුන් සුවපත් කිරීම හා ඔවුනට උපකාර කිරීම සඳහා වූ උපකරණයක් පමණක් ය යන විශ්වාසයෙන් යුතුව ය කේසි ජීවත් වූයේ. කිසි දිනෙක අවධානය තමා කෙරෙහි යොමු නොවිය යුතුය යනුත් තමාගෙන් උපකාර ලැබිය හැකි අය අලංකාර මාතෘකා පාඨවලින් නොව පුද්ගල රෙකමදාරු මගින් ම තමා ගැන දත යුතු ය යනුත් ඔහු තුළ නොසැලී පැවැති විශ්වාසයයි.

මුල් කාලයේ දී කේසි, ප්‍රතිපත්තියක් වශයෙන් ම තම කියැවීම් සඳහා මුදල් අය කිරීම ප්‍රතික්ෂේප කෙළේ ය. ඔහු දිගට ම ඡායාරූප ශිල්පයෙහි ම නිරත විය. පසුකාලයේ දී ඔහුගේ සේවයේ අවශ්‍යතාව කොතරම් තද වූවා ද යතහොත්, ඔහුට තම රැකියාව කර ගෙන යා නො හැකි විය. තමාගේ පවුල නඩත්තු කර ගැනීම සඳහා, කළ සේවයට යමක් අය කිරීම යුක්ති සහගතය යන හැඟීම ඔහුට ඇති වූයේ මෙවිට ය. ඒ අවස්ථාවේ දී පවා මුදල් නැති අයට නොමිලයේ කියැවීම් රාශියක් කර දුන්නේ ය. දිගට ම ඔහුගේ ආකල්පය ව්‍යාපාරික ස්වරූපයෙන් තොර විය. වර්ජිනියා බීච්හි ලිපි ගොනුවල ඇති

ඔහුගේ කාබන් කොපි, ලිපි, මේ ගැන හොඳින් සාක්කි දරයි. (කියැවීම්වල ම යෝජනාවට අනුව, ඔහු 1927 දී වර්ජිනියාබීච් ප්‍රදේශයට ගියේ ය.) මේ ලිපි, ව්‍යාකරණ වැරැදිවලින්, නොමනා ලකුණුවලින් හා අක්ෂර ශුද්ධි හීනතාවෙන් පිරී ඇත. එහෙත් සහෝදර ජනතාවට උපකාර කිරීමෙත් ඉගැන්වීමෙත් තද කැමැත්ත ඒවායින් හෙළි වෙයි.

මුළු කාලය තුළ දී ඔහු සිටියේ තමා කරන්නේ කිමෙක් ද යන සැකයට මැදිව ය. කියැවීමක් කරන්නට යයි කියන ලද ඇතැම් අස්ථාවල දී නිදන කේසි නිශ්ශබ්ද ව සිටියේ ය. කේසිගේ සෞඛ්‍යය හා මානසික තත්ත්වය, ඔහුගේ ශක්තිය කෙරෙහි බල පෑ බව පෙනේ. සාමාන්‍යයෙන් මෘදු ගති ඇත්තකු නමුත් කේසි කෝප වූ අවස්ථා ද නැත්තේ නොවේ. බොහෝ විට මුදල් කරදර ඔහු වෙළා සිටියේ ය. මේ මානසික කැළඹීම් ඔහුගේ ශක්තියට බාධා කරන්නට ඇත. මුල දී සාර්ථක වූ කියැවීම් ලබා ගැනීමට අසමත් වූ බොහෝ රෝගීන් පිළිබඳ ව, කේසිගේ කායික හා මානසික සෞඛ්‍යය දියුණු වූ කල්හි, නැවත ඇසූ විට සාර්ථක වූ කියැවීම් ලබාගත හැකි වී තිබේ.

කෙසේ හෝ ඔහුට, වැඩියෙන් සිත් තැවුල් ඇති වූයේ කියැවීමෙන් තමන්ගේ තත්ත්වය හරි හැටි විස්තර වුණේ නැතැයි කියා හෝ යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් තමාට ඵලයක් සිදු වූයේ නැතැයි කියා හෝ මිනිසුන් අමනාපයෙන් වාර්තා කරන විට ය. මේ අවස්ථාවල දී කේසි නිහතමානී ව, ඔවුනට දිග ලියුම් ලිවේ ය. නොවරදින සුල්ලෙකැයි බොරුවට ඇඟැවීමට තමා අදහස් නොකරන බවත් සම්පූර්ණයෙන් තේරුම් ගත නො හැකි බොහෝ කරුණු තම කියැවීම් කෙරෙහි බලපාන්නා සේ පෙනෙන බවත්, ඇතැම් විට රේඩියෝ යන්ත්‍රයකට මෙන් තමාටත් පැහැදිලි පණිවිඩ නොලැබෙන බවත් හේ ලියුම්වලින් පැහැදිලි කෙළේ ය. ඔහු මේ ලිපි අවසන් කරන්නේ මෙසේ ය.

"අපේ එක ම බලාපොරොත්තුව ඔබට උපකාර කිරීමයි. ඔබට උපකාරයක් සිදු වී නැති නම් මුදල් ආපසු බාර ගන්න ඕනෑ." ඔහු මුළු ගෙවීම සඳහා ම චෙක්-පතක් ඇතුළු කරයි.

ඇතැම් විටෙක, කේසී මුල දී කළ රෝග විනිශ්චය ඔවුන් අවිශ්වාස කළ නමුත් පසුව කරන ලද වෛද්‍ය විනිශ්චයවලින් ස්ථිර වී ඇති බව, කලකට පසුව නැවත ඒ මිනිසුන්ගෙන් ම අසන්නට ලැබේ. ඇතැම් විටෙක ප්‍රතිකාරය අසාර්ථක වී යයි පැමිණිලි කළ අය, නියම කරන ලද අවශ්‍ය ආහාරයක් හෝ ඖෂධයක් හෝ සංස්කරණයක් හෝ මානසික ශික්ෂණයක් හෝ නොසැලකිල්ලෙන් අත හැර ඇති බව දැන ගන්නට ලැබේ.

කෙසේ වුවත්, කියැවීම් වැරදී ගිය හැකි බව කේසී දැන සිටියේ ය. එහෙත් කල්යාමේ දී, කේසී තම ශක්තිය ප්‍රයෝජනයට ගන්නේ කෙසේ දැයි වැඩි වැඩියෙන් තේරුම් ගත් විට, කියැවීම්වල පැහැදිලිකම හා නිවැරදිකම දියුණු විය. ඉදහිට සිදු වූ වැරදීම් ලෙස පෙනුණු දේවල බරට ඕනෑවටත් වැඩියෙන් සරිලන්නට, පසු කාලයෙක දී පුදුම සුවපත් කිරීම් සිදු කරන ලදී. කැනඩාවේ කතෝලික පූජකයකුගේ අපස්මාරය සුව කරන ලදී. ඔහායෝවේ ඩේටන්හි උපාධිධාරී තරුණයෙක් දරුණු සන්ධි ඉදිමීමේ රෝගයකින් [1] මුදා ගන්නා ලදී. නිව්යෝර්ක්හි දන්ත වෛද්‍යවරයකුට අවුරුදු දෙකක් තිස්සේ පීඩා ගෙන දුන් ඉරුවාරදය සති දෙකෙකින් සුව කැරිණි. ප්‍රසිද්ධ ටෙනසී [2] රෝහලෙකින් බලාපොරොත්තු තබා ගත නො හැකි රෝගියකු ලෙසින් ඉවත ලන ලද, කෙන්ටකිහි තරුණ සංගීත කාරියකගේ ස්ක්ලෙරොඩෙර්මා [3] නම් දුර්ලභ රෝගය අවුරුද්දකින් සුව විය. සාමාන්‍යයෙන් අසාධ්‍ය යයි සලකනු ලබන කුමර ග්ලෞකෝමා[4] නම් ඇස් රෝගය ඇතිව ෆිලෙඩෙල්ෆියාවේ උපන් දරුවෙක් කේසීගේ උපදෙස් අනුගමනය කළ වෛද්‍යවරයකුගෙන් ප්‍රතිකාර

1. Arthritis
2. Tennessee
3. Scleroderma
4. Infant Glaucoma

ලබා ප්‍රකෘති දෘෂ්ටි ශක්තිය ලබා ගත්තේ ය. සුළු වැරැදීම් හා දුෂ්කරතා තිබුණත්, ඒවා මැඩ ගෙන, හැම දා නිහතමානී, හැමදා සැක කරන, හැමදා ප්‍රතිපත්තිකාමී වූ කේසිට තම ශක්තිය ඇදහිය යුතුය යන විශ්වාසය ක්‍රමයෙන් ඇති වී, අන්තිමේ දී තහවුරු ව ගියේ මෙබඳු සිද්ධි නිසා ය. සත්‍ය වශයෙන් ම, ඒ ශක්තිය යක්ෂයාගෙන් ලැබුණු ආයුධයක් නොව, දෙවියන් වහන්සේගෙන් ලැබුණු ත්‍යාගයෙකි.

අවස්ථා කීපයෙක දී ම කේසි තමා ගැන සැක කරන තරමට ම, කේසි ගැන සැක කරන පරීක්ෂකයෝ ද ඔහුට මුණ ගැසුණාහ. හාර්වර්ඩ් විශ්ව විද්‍යාලයෙන් පැමිණි මනෝවිද්‍යාඥයකු වන හියුගෝ මුන්ස්ටර්බෙර්ග් මොවුන්ගෙන් එකෙකි. ඔහු පැමිණියේ රහස් කාමරයක්, අඳුරු කාමරයක් හා බොරුකාර යකැදුරන්ගේ වෙනත් සාමාන්‍ය මෙවලම් ද දකීමේ බලාපොරොත්තුවෙනි. මේ කිසිවක් අවශ්‍ය නොකළ කේසි, මහ දවල් කට්ටිලියක් මත නිකම් ම දිගා වී සරල සම්මෝහ නිද්‍රා යෝජනාවක් ලැබීමෙන් පසුව, හොඳ ගැළපීමක් ඇතිව නින්දෙන් කථා කරනු දුටු මුන්ස්ටර්බෙර්ග් මවිත විය.

කේසි කියැවීමක් කරන විට, මුන්ස්ටර්බෙර්ග් හොඳින් පරීක්ෂා කෙළේ ය. පූර්ව කියැවීම්වල වාර්තා විමසුවේ ය. දක්ෂ වංචාවක් හෙළි කිරීමේ අදහසින් ඔහුට පෙරත් පසුවත් පැමිණි අන් සියලු දෙනා මෙන්, මුන්ස්ටර්බෙර්ග් ද ආපසු ගියේ කේසි කවරකු වුවත් බොරු-වෙදකු නම් නොවන බව විශ්වාස කරමිනි. රෝගීන්ගේ ම සාක්කියත් පුද්ගලයාගේ අව්‍යාජ අවංක භාවයත් යන දෙක නිසා ම මුන්ස්ටර්බෙර්ග්ට විශ්වාසය ඇති විය.

අනෙක් අතට කේසිගේ සේවයෙහි කාරුණික වූ ද විද්‍යානුකූල වූ ද වැදගත්කම අවබෝධ කර ගත් කරුණු තේරෙන හිතවත් මනුෂ්‍යයෝ ද ජීවිතයේ විවිධ අවස්ථාවල දී කේසිට හමු වූහ. ඔව්හු කේසිගේ පුදුම ජීවිතයේ විවිධ පෙරළීම්වල දී,

ධනයෙන් හා උපදේශයෙන් ඔහුට උපකාර කළහ. මොවුන්ගෙන් සමහරෙක් කේසි ආරෝග්‍යශාලාවක් ඇති කිරීමේ අදහස දැරූහ. හොඳින් කියැවීම් ලබා ගැනීමත් ඒ කියැවීම්වලින් ලැබුණු ටිකක් අස්වාභාවික නියමයන් සමාන අදහස් ඇති කාර්ය මණ්ඩලයක් මගින් ක්‍රියාවට නැංවීමත් ඒ ආරෝග්‍ය ශාලාව පිහිටුවීමේ පරමාර්ථයයි. කියැවීම් වලින් ප්‍රයෝජන ලබා සිටි මෝර්ටන් බ්ලුමැන්තල් [1] නම් ධනවතෙක්, මේ සිහිනය ක්‍රියාවට නැඟී ය. 1929 වර්ජිනියාවේ වර්ජිනියා බීච්හි කේසි ආරෝග්‍ය ශාලාව පිහිටුවන ලදී. අවුරුදු දෙකක් පැවැති ආරෝග්‍යශාලාව, ව්‍යාපාර වස්තු වෙළඳ පොළේ පරිහානියෙන් [2], එහි අනුග්‍රාහකයාට සිදු වූ අලාභ නිසා වසා දමන්නට සිදුවිය.

1942 දී කේසිගේ ජීවිත කථාව [3] ප්‍රසිද්ධ කිරීමෙනුත් ඊට පසුව 1943, සැප්තැම්බර් කොරනට් [4] සඟරා ප්‍රකාශනයේ *"Miracle Man of Virginia Beach"* යන ශීර්ෂ පාඨයෙන් යුතු ලිපිය පළ වීමෙනුත් කේසිගේ අද්භූත ශක්තිය, මුළු ජාතිය පුරාම පැතිර ගියේ ය. මේ නිසා රටේ හැම තැනින් ම ඔහු කරා ලියුම් ගංවතුරක් මෙන් ගලා ආවේ ය.

මෙයින් සමහරෙක තිබූ ශෝචනීය වූ හදිසි ගතිය, හද දෙදරවන තරම් ය. එකකු හෝ ආපසු යැවීම කේසිට දැරිය නොහැක්කෙක් විය. අවුරුදු එකහමාරක් පමණ ඉදිරියට තබාද, හමුවීම් නියම කර ගන්නා ලදී. දවසකට කියැවීම් එකක් දෙකක් නොව අටක් පමණ කරන ලදී. පෙරවරු සතරෙකි. පස්වරු සතරෙකි. නින්දෙන් වැඩ කිරීම පහසු ජීවිත මාර්ගයක් ලෙස පෙනෙනවා ඇත. එහෙත් එයින් ඔහුගේ ස්නායු ශක්තියට විශාල හානියෙක් විය. මේ නිතර සේවය කිරීමේ වෙහෙස ඔහුට පීඩාකර වන්නට ඇත. 1945 ජනවාරි 3 වැනි දා හැටහත් වැනි වියේ සිටි කේසි පරලෝ සැපත් විය.

1. Morton Blumenthel
2. Stock Market Crash
3. There is a River by Thomas Sugrue
4. Coronet

එඩ්ගා කේසි නම් මිනිසාගේ ජීවිත කථාව අවසන් වූයේ මේ අයුරිනි. එහෙත් ඔහුගේ වැදගත්කම ඔහු සමග වැළලුණේ නැත. මනුෂ්‍යයකුගේ අමරණීයත්වය, මනුෂ්‍ය ජීවිත හොඳ අතට හැසිරවීමේ සේවය නිසා ඇති වේ යයි කිව හැකි නම් අමරණීයත්වයට කේසිගේ ඇති අයිතිවාසිකම සුරක්ෂිත ය. එහෙත් මීටත් වඩා වැදගත් වන්නේ මිනිසා තුළ දිවැස් ශක්තිය ඇති බව සහතික කරන, අනුක්‍රමයෙන් වැඩී ගෙන යන සාක්ෂි සමූහයට කේසිගෙන් සිදු වී ඇති මහා පරිත්‍යාගයයි. එසේ කීවේ කේසිගේ දිවැස් ශක්තිය, දුෂ්කර ප්‍රායෝගික පරීක්ෂණයෙකින් සමත් වූ නිසා ය. ඔහු අනෙක් මිනිසුනට දැකිය නොහැකි දේ දුටුවා පමණක් නොවේ. ඔහුගේ දැකීම්වල ඇත්ත නැත්ත සොයා ගැනීමට ද හැකි විය. එපමණක් ද නොවේ. එය වැඩ ගත හැකි ශක්තියෙක් ද විය. එසේ ම එයින් වැඩ ද සිදු විය.

# 3

# ජීවිතයේ ප්‍රහේලිකාවලට පිළිතුරෙක්

මිනිසුන් කෙරෙහි දයාවෙන් කටයුතු කළ අවුරුදු විස්ස තුළ දී නිදසුන් දහස් ගණනෙක දී ම කේසිගේ දිව්‍ය ඥානය ඇඳූහිය හැකි බව පෙනී ගියේ ය. ඔහුගේ පුදුම ජීවිතයේ දෙවන දියුණුව කරා යන්නකු විසින් මෙ කරුණ සිහියේ තබා ගත යුතු ය.

මුල දී ඔහුගේ දැකීම් ශක්තිය යොමු වූයේ මිනිස් සිරුරේ සැඟවුණු තැන්වලට හෙවත් අභ්‍යන්තරයට ය. අවුරුදු බොහෝ ගණනක් ඉකුත් ව යන තාක් මේ ශක්තිය, බැහැරටත් යොමු කළ හැකි යයි කාටවත් සිතුණේ නැත. මුළු විශ්වයට ම ඒ කියන්නේ මනුෂ්‍යයා හා විශ්වාස අතර වූ සම්බන්ධතාවට හා මනුෂ්‍ය ස්වභාවයේ ප්‍රශ්නවලට මේ ශක්තිය යෙදිය හැකි යයි කවුරුන්වත් මුල දී සිතුවේ නැත. එය සිදු වූයේ මතු දැක්වෙන අයුරිනි.

ඔහායෝවේ ඩේටන්හි ධනවත් මුද්‍රණ ශිල්පියකු වූ ආතර් ලැමර්ස්ට[1] මිත්‍ර ව්‍යාපාරිකයකුගෙන් කේසි ගැන අසන්නට ලැබුණේය. ඔහුගේ උනන්දුව තදින් ඇවිස්සිණි. කේසිගේ

1. Arthur Lammers

කාර්යය බැලීම සඳහා ඔහු අලබාමාවේ සෙල්මාවට විශේෂ ගමනක් ගියේ එහෙයිනි. කේසි වාසය කළේ එහි ය. ලැමර්ස්ට තමාගේ ම සෞඛ්‍ය ප්‍රශ්නයෙක් නො වී ය. එහෙත් දින කීපයක් කියැවීම් දෙනු බලා සිටි ඔහුට කේසිගේ දිව්‍ය ඥානය සත්‍යය යැයි ඒත්තු ගියේ ය. සාමාන්‍ය පෙනීමට අසු නොවන්නා වූ සත්‍යයන් දැකීමට සමත් වූ මනසකට රෝගී මිනිසකුගේ අක්මාවේ ක්‍රියාකාරිත්වයට හා ජීර්ණ මාර්ගයේ පැටලැවිලිවලට වඩා පොදු වූ වටිනා කමක් ඇති ප්‍රශ්නවලටත් එළියක් හෙළන හැකි විය යුතු ය. එසේ සිතුවේ බුද්ධියෙන් ප්‍රබුද්ධ වූ බහුශ්‍රැතයකු වූ ලැමර්ස් ය. කවර දර්ශනවාදය වැඩියෙන් ම සත්‍යයට ළඟා වේද ? මිනිසාගේ පැවැත්මේ අර්ථයක් ඇති නම්, ඒ කිමෙක් ද? අමරණීයත්වය පිළිබඳ ඉගැන්වීමෙහි කිසියම් සත්‍යයක් තිබේද? එසේ නම්, මරණින් මතු මිනිසාට කිමෙක් වේ ද ? කේසිගේ දිව්‍ය ඥානය මෙබඳු ප්‍රශ්නවලට උත්තර දීමට සමර්ථ ද ?

කේසි මේවා දැන සිටියේ නැත. පරමාර්ථයන් පිළිබඳ වූ ගැඹුරු ප්‍රශ්න කිසි දිනෙක ඔහුගේ මනසට ඇතුළු වී නො තිබිණි. පල්ලියේ දී ඔහුට උගන්වන ලද ආගම, ඔහු ප්‍රශ්නයක් නැතිව ම පිළිගත්තේ ය. දර්ශනය, විද්‍යාව හා අන්‍යාගමික මත යන මේවා සමඟ සසඳා තම ආගමේ සත්‍යතාව ගැන කල්පනා කිරීම ඔහුගේ චින්තන ක්‍රමයට හුරු දෙයෙක් නො වීය. දිගින් දිගට ම ආගම විරෝධී වූ ඒ නින්දට ඔහු වැටුණේ දුකින් පෙළෙන මිනිසුනට උපකාර කිරීමට තිබූ කාරුණික ආශාව නිසා ම ය. මේ ශක්තියෙන් රෝග සුව කිරීම හැරුණු විට වෙනත් ප්‍රයෝජන ගත හැකි බව දුටු පළමුවැන්නා ලැමර්ස්ය. මින් පසු කේසිගේ උනන්දුව ද ඇවිස්සී ගියේ ය. කියැවීම්වලින්, අසන ලද ප්‍රශ්නයකට උත්තරයක් නො ලැබී ගියේ ඉතා කලාතුරකිනි. ලැමර්ස්ගේ ප්‍රශ්නවලට ද උත්තර නො ලැබෙන්නට කරුණෙක් නැත.

තමාගේ ව්‍යාපාරික කටයුතු නිසා ලැමර්ස්ට සෙල්මාවේ නතර වන්නට නො හැකි වූ හෙයින් ඩේටනයට අවුත් සතියක් දෙකක් තම ආගන්තුකයකු වශයෙන් ගත කරන්නට යයි ලැමර්ස්, කේසිට ආරාධනා කෙළේ ය. දෙවියන් වහන්සේ තමාට නව සේවා මාර්ග පාදා දීමට කැමැති වෙනවා විය හැකි යයි සිතූ කේසි ගමනට එකඟ විය.

ලැමර්ස් මෑත කාලයෙක සිට ජ්‍යෝතිශ්ශාස්ත්‍රය කෙරෙහි උනන්දුවෙකින් සිටියේ ය. ජ්‍යෝතිශ්ශාස්ත්‍රය සත්‍ය නම් තේරුම් ගත හැකි ලෙසෙකින් මනුෂ්‍යයා සෙසු විශ්වයට සම්බන්ධ කරන ශාස්ත්‍රයක් එයින් අපට සැපැයෙනු ඇතැයි හේ සිතුවේ ය. මේ නිසා ඔහුට ජ්‍යෝතිශ්ශාස්ත්‍රය, දිව්‍ය-ඥාන පරීක්ෂණයට හොඳ ආරම්භක ස්ථානයෙකැයි පෙනී ගියේ ය. මෙසේ 1923 ඔක්තෝබර් මාසයේ එක් සන්ධ්‍යාවෙක ඩේටන්හි පැරණි ෆිලිප්ස් හෝටලයේ දී කේසි දිගා වූ විට ඔහුට යෝජනා කෙළේ ලැමර්ස්ගේ කේන්ද්‍රය කියන්නට මිස ඔහුගේ ශරීරයේ ඇතුළත බලන්නට නොවේ.

හැම විට ම තමාට ලැබෙන යෝජනාවට එකඟ වන සම්මෝහ-නිද්‍රාවෙන් සිටින කේසි සංක්ෂේපයෙන්, කෙටි වාක්‍ය වලින්, කේන්ද්‍රයක් දුන්නේ ය. කියැවීමේ අවසානය හරියේ දී, ඉක්මන් පැහැදිලි අව්‍යාජ ශෛලියෙන් මේ පුදුම වාක්‍යය එළියට ආවේ ය.

"මොහු වරක් පැවිද්දෙක් ව සිටියා"

ඒ වාක්‍යයේ තිබුණේ, කෙටි වචන කීපයෙක් පමණි. එහෙත් බොහෝ පොත්පත් කියවා මනුෂ්‍ය ගතිය පිළිබඳ ප්‍රධාන වාද ගැන දැන සිටි ලැමර්ස්ට මේ වචන සමූහය විදුලිබල කවන්නෙක් විය. කේසිගේ මේ අති විශේෂ[1] දර්ශනයෙන් පුරාතන

1. Beyond Normal

පුනර්ජන්මවාදය සත්‍ය සිද්ධියක් ලෙසින් දුටු බව මෙයින් අදහස් කෙරේ ද ?

ලැමර්ස්ගේ කුතුහල සන්සිඳෙනු වෙනුවට මෙයින් සිදු වූයේ ඇවිලෙන ගින්නට පිදුරු වැටීමෙකි. තින්දෙන් පිබිදි කේසිට, කැළැඹී සිටි ලැමර්ස් තම ලඝුලේඛකයාත් ලින්ඩන් ශ්‍රොයර්[1] නම් තම ලේකම්වරයාත් සමඟ, මේ දැන් කියැවුණු දෙයෙහි ගැබ්ව ඇති අදහස් ගැන සාකච්ඡා කරනු දක්නට ලැබිණ. පුනර්ජන්මවාදය සත්‍යයෙකැයි ඔප්පු කළ හැකි නම් එයින් දර්ශනයත් ආගමත් මනෝවිද්‍යාවත් පිළිබඳ ව දැනට පවත්නා මත වෙනස් කෙරෙනු ඇතැයි ලැමර්ස් කියා සිටියේ ය. මේ කරුණ ගැන කේසිගෙන් තවත් කියැවීම් ලැබුණහොත් පුනර්ජන්මයේ නියාම ධර්මයන් ක්‍රියා කරන ආකාරය නිශ්චිත ලෙසින් සොයා ගත හැකි වනු ඇත. පුනර්ජන්මය ජ්‍යොතිශ්ශාස්ත්‍රයට සම්බන්ධ වන්නේ කෙසේ ද ? ඒ දෙක එකතු ව මනුෂ්‍ය ජීවිතයත් චරිත ලක්ෂණ හා තිෂ්ඨාවත් විවරණය කරන්නේ කෙසේ ද? මෙවැනි ප්‍රශ්නවලට එයින් පිළිතුරු ලැබෙනු ඇත.

මේ විෂය ගැන තවත් කියැවීම් කරන්නට යයි ලැමර්ස් උනන්දුවෙන් ඉල්ලා සිටියේ ය. කැළැඹීමට පත් ව සිටි කේසි තරමක් අකැමැත්තෙන් ඉල්ලීමට එකඟ විය. ලැමර්ස් ආගමවෙත් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් දැන් ලැබෙන කියැවීම් ඔහුගේ අතීත ජීවිත අත්දැකීම් පිළිබඳවත් ඔහු පරීක්ෂා කරන්නට පටන් ගෙන සිටි ගැඹුරු ප්‍රශ්න පිළිබඳවත් වඩා නිශ්චිත විස්තරාත්මකද විය. කියැවීම්වලට අනුව ජ්‍යොතිශ්ශාස්ත්‍රයෙහි එක්තරා සත්‍යයෙක් තිබේ. පරිණත වන්නා වූ ආත්මයට සෞර්යග්‍රහ මණ්ඩලයෙන් අත්දැකීම් චක්‍රයක් සපයා දෙනු ලැබේ. මිනිසාට මේ පොළොවෙහින් අන්‍ය විඥ්ඥාණ මානයන්හිත්[2]

1. Linden Shroyer 2. Dimensions of Consciousness

(විසුද්ධඥාණට්ඨිති) මාරුවෙන් මාරුවට අත්දැකීම් ලැබේ. ආදි කාලයේ සිට ආචාර්ය සම්ප්‍රදායවලින් මේ මානයටත් ග්‍රහයන්ගේ නම් දී තිබේ. ග්‍රහයෝ, මේ මානයන්ගේ ලක්ෂ්‍යයෝ ය. එසේ වුවත් දැනට භාවිත වන ජ්‍යෝතිශ්ශාස්ත්‍රය සත්‍යයට ළඟා වීමෙක් පමණි. එය සම්පූර්ණයෙන් නිවැරැදි නොවීමේ පළමු වන හේතුව නම් පුනර්ජන්මය ගණනට නොගැනීමයි. දෙවන හේතුව 'ජ්‍යෝතිශ්ශාස්ත්‍රීය' යයි කියනු ලබන බලපෑම, ග්‍රන්ථි පද්ධතියේ මාර්ගයෙන් ද වෙනත් ලෝකවල දී මිනිසා ලැබූ අතීත අත්දැකීම්වල මාර්ගයෙන් ද මිනිසා කෙරෙහි පල දනවන්නේ කෙසේ දැයි සම්පූර්ණයෙන් තේරුම් ගෙන නො තිබීම ය. ලැමර්ස් ජ්‍යෝතිශ්ශාස්ත්‍රය ගැනත් පුනර්ජන්මවාදය ගැනත් දැන සිටියේය. එහෙත් මෙබඳු අන්‍යෝන්‍ය සම්බන්ධයක් ඇතැයි ඔහුට කවදාවත් සිතී තිබුණේ නැත.[1]

මේ සියල්ල ම කේසීට පෙනුණේ මහා විකාරයක් ලෙසටය. එහෙත් ලැමර්ස්ට අවශ්‍ය වූ කියැවීම් දිගට ම කරන්නට යයි කුහුල ඔහුට බල කොට සිටියේ ය. කේන්ද්‍රය ගැන ඇසීම නතර කොට වඩා සුදුසු සම්මෝහ නිද්‍රා යෝජනාවක් දුන්නොත් අතීත ජීවිත ගැන වඩා හොඳ තොරතුරු ලැබෙනු ඇතැයි ඔවුනට සිත් විය. මෙසේ ඔව්හු නිදා සිටින කේසීගෙන් එබඳු පාඨයක් ඉල්ලා සිටියහ. මතු දක්වෙන්නේ ඔහු දුන් යෝජනා පාඨයයි.

"දැන් ඔබ ඉදිරියේ අසවල් තැන අසවල් දින උපන් අසවලා සිටිනවා. (සුදුසු පරිදි නම් ගම් ආදිය යොදා ගත යුතු ය.) දැන් ඔබ මේ පුද්ගලයා හා විශ්වය අතර ඇති සම්බන්ධතාවත් මොහු කෙරෙහි බල පාන විශ්වයේ ශක්තීන් මේ ජීවිතයේ දී ප්‍රකට ව හා අප්‍රකට ව ඇති මේ පුද්ගලයාගේ විශේෂ ගතිගුණත් කියන්න ඕනෑ. ස්ථාන නාම ආදියත් සමග මේ ලෝකයේ සිදු වූ පූර්ව ජන්මයන් ද කියා දෙන්න ඕනෑ. එක් එක් ජීවිතයේ දී පුද්ගලයාගේ

1. 20 පරිච්ඡේදයේ දිග අධෝලිපිය බලන්න.

දියුණුවට ඉවහල් වූත් බාධා කළා වූත් කරුණු ද දැන ගන්න ඕනෑ."

මින් පසු පූර්ව ජන්ම පිළිබඳ කියැවීම් වඩා නිශ්චිත ද පැහැදිලි ද විය. සෞඛ්‍යය සඳහා කරන ලද කියැවීම්වලින් වෙනස් කොට ගැනීම සඳහා මේවාට 'ජීවිත කියැවීම'[1] යන නම ද යෝජනා විය. මෙතැන් සිට සෞඛ්‍යය සඳහා වූ කියැවීම් 'කායික කියැවීම්'[2] යයි නම් කරන ලදී. එක් විස්තරයෙක දී හැරුණු විට මේ කියැවීම් දෙවර්ගය ම සඳහා වූ ක්‍රියා මාර්ගය එක ම ය. දිගට ම ජීවිත කියැවීම් කිපයක් කළ විට තද ක්ලාන්ත ගතියක් ඇති වන බව කේසිට දැනී ගියේ ය. මෙහි හේතුව සොයා ගැනීමට කේසි, තමා ගැන ම කායික කියැවීමක් කෙළේය. එහි දී ජීවිත කියැවීම් සඳහා හිස උතුරටත් පා දකුණටත් සිටින සේ දිගා වන්නට නියම කරන ලදී 'ධ්‍රැවතාව'[3] පිළිබඳ කරුණෙක්ය, යන්නට වැඩියෙන් මේ වෙනස පිළිබඳ විවරණයක් ලැබුණේ නැත.

කේසි පිළිබඳව ම කරන ලද ජීවිත කියැවීම්වලින් ඔහු ශත වර්ෂ ගණනකට පෙර ඊජිප්තුවෙහි මහා පූජකයකු ව සිටි බව හෙළි කරන ලදී. ඔහුට මහත් ගුඪ ශක්ති තිබුණේය. එහෙත් හිතුවක්කාර කමත් කාමුකත්වයත් නිසා හෙ විනාශ විය. ඊට පසුව පර්සියාවේ සිදු වූ ජන්මයෙක දී හෙතෙම වෛද්‍යවරයෙක් විය. කාන්තාර යුද්ධයෙක දී තුවාල ලත් හෙතෙම වැල්ලේ මැරෙන්නට දමා යන ලදී. කන්නට අහරක් බොන්නට වතුරක් සෙවණට වහලක් නැති ව, හේ එහි තනි ව දිවා රාත්‍රී තුනක් ගත කෙළේය.

කායික වේදනාව බලගතු නිසා හෙතෙම විඤ්ඤාණය ශරීරයෙන් මුදා ගැනීමට මහත් පරිශ්‍රමයක් ගත්තේ ය.[4] (මිදීමට

1. Life Readings. 2. Physical Readings. 3. A Matter of Polarity

4. මෙය කයින් කෙතරන උපක්‍රමයක් නැතිව සිතින් පමණක් සිදු කරගත් මරණයෙකි. ආයුසංස්කාරය අත්හැරීමෙකි.

ගත් මේ උත්සාහයට සමාන සිත් ගන්නා නිදසුනෙක් ප්‍රබන්ධ සාහිත්‍යයෙහි ඇත. එය එන්නේ ජැක්ලන්ඩන්ගේ "The Star Rover" නම් ග්‍රන්ථයෙහි මාඤ්චුසැට්ට ලූ හිරකරුගේ අත්දැකීම්වලය.) ඔහුගේ උත්සාහය සාර්ථක විය. මේ ආත්මභාවයේ දී ශරීරයේ සීමාවන්ගෙන් සිත නිදහස් කොට හැරීමට ඔහු ලැබූ ශක්තියට ද මෙය එක්තරා ප්‍රමාණයෙකින් හේතු වී ඇත. වර්තමානයේ ඔහුගේ ඇති සියලු ගුණ දෝෂ අවංක ව තක්සේරු කොට කිසියම් අතීත අත්දැකීමකට සම්බන්ධ කරන ලදී. වර්තමාන ජීවිතය ඔහුගේ ආත්මයට ලැබී ඇති පරීක්ෂණයෙකි. ඔහුට පරාර්ථකාමී ව මනුෂ්‍ය ප්‍රජාවට සේවය කිරීමට අවස්ථාවක් ලැබී තිබේ. මෙසේ අතීතයෙන් ආ ආඩම්බරයත් භෞතිකවාදීත්වයත් කාමුකත්වයත් නැති කර ගත හැකි ය.

කියැවීම් ගමන් කළ මේ නව මඟ තවදුරටත් පරීක්ෂණයට පත් කළ යුතු තරම් වැදගත් එකක් බව ලැමර්ස්ට හැඟී ගියේ ය. ඔහු කේසිගේ පවුල සෙල්මාවෙන් ඩේටනයට කැඳවා ගත යුතු යයි බල කොට සිටියේ ය. එහි නතර වී සිටින කාලයේ ඔවුන්ගේ සියලු සැප පහසුකම් සලසා දීමට හේ පොරොන්දු විය. කේසි නෝනාත් පුතුන් දෙදෙනාත් එකලට පවුලේ ම කෙනකු සේ සිටි ග්ලැඩිස් ඩේවිස් නම් ලේකම්වරියත් ඒ ගමනට එකඟ වූහ. එහි ගිය ඔවුනට සිදු වී ඇති දේ දැන ගන්නට ලැබිණි. ඔවුන්ගේ ප්‍රතික්‍රියාව ද කේසිගේ ප්‍රතික්‍රියාවට සමාන විය. මුලින් ඇති වූයේ විස්මය හා අවිශ්වාස යයි. අනුක්‍රමයෙන් කුහුලත් තද උනන්දුවත් ඇති විය. මේ සියලු දෙනා ගැන ම ජීවිත කියැවීම් කරන ලදී. හැම අවස්ථාවෙක දී ම ඒ ඒ පුද්ගලයාගේ ගති ගුණවල ආරම්භය කිසියම් අතීත ජීවිත අත්දැකීමෙක ඇති බව පෙන්වමින් අවංක ලෙස තක්සේරු කොට තිබේ. ඔහුගේ ප්‍රශ්නකුට කී දෙයෙහි සාරාංශය මෙයයි; "ජීවිත සතරක් ම ඔබ ගවේෂක විද්‍යාඥයකු ලෙස කල් ගෙවා තිබෙනවා. ඔබ භෞතිකවාදී වූයේත්

තමා තුළ ම ගිලී ගත්තේත් මේ නිසා ය." අනෙක් දරුවාට කීවේ මෙසේ ය, "ඔබ බෙහෙවින් කෝපයට පත් වෙනවා. ඔබ ඊජිප්තුවේ දින් එංගලන්තයේ දීත් විනාශයට පත් වූයේ ඒ නිසා ය. ඒ නිසා දැන්වත් එය පාලනය කර ගන්නට උගත යුතුයි."

කේසි හොඳින් දැන සිටි අයගේ පමණක් නොව, ලැමර්ස්, ලින්ඩන් ශ්‍රෝයර් හා ලැමර්ස්ගේ අන්‍ය මිත්‍රයන් බඳු වූ තරමක් නුපුරුදු අයගේ පවා චරිත ලක්ෂණ දැක්වීම්වල තුබූ සිත් කාවදින නිවැරදිකමත් තද අවංක භාවයත් නිසා ලැමර්ස්ගේ උනන්දුව තවත් වැඩි ගියේ ය. එහෙත් මෙයින් මතු වී ගෙන යන මත ගැන දැන ගන්නට දැන ගන්නට කේසිගේ අසහනය වැඩි විය. ඔහුට උදා වූයේ තමා පිළිබඳ වූ ම සැකයට හා පරීක්ෂාවට කැප වූ තවත් පීඩාකාරී කාලපරිච්ඡේදයෙකි. ඔහු අවසානයට සිතා සිටියේ රෝග නිදාන සොයා බෙහෙත් නියම කරන තමාගේ දිව්‍යඥානය යක්ෂයාගේ නො ව, දෙවියන් වහන්සේගේ කාර්යය කරනවා කියා ය. එහෙත් දැන් ඒ දිවැසින් ආගම විරෝධී මේ මිථ්‍යා ලබ්ධිය මතු කර තිබේ. මින් එහාට මොන ම දෙයක් ගැනවත් විශ්වාසය තබන්නේ කෙසේ ද ?

කේසිගේ සිත තුළ වූ කැළැඹීම තේරුම් ගැනීම අපහසු නොවේ. ඔහු හැදී වැඩී ඇත්තේ පැරණි තද ක්‍රිස්තියානි පරිසරයෙක ය. ඔහුගේ ආගම හැරුණු විට ඇති වෙනත් ආගම්වල ඉගැන්වීම් ගැන දැනීමෙක් ඔහුට නොවී ය. එනිසා ඔහු ඒ කාලයේ දී ඔහුගේ ආගම හා අන්‍ය ආගම් අතර ඇති ප්‍රධාන සමානකම් බොහොමයක් ගැන දැන සිටියේ නැත. ඔහු ඇදැහූ ක්‍රිස්තියානි නිකායේ පහනේ හැර වෙනත් ආගම්වල ඇති පහන්වල ඇති ආචාර ධර්මමය වූත් ආධ්‍යාත්මික වූත් ආලෝකය අගය කිරීමට ඔහුට ඉඩක් ලැබී තිබුණේ නැත. විශේෂයෙන් ම ඔහු හින්දු ධර්මයේත් බුදු සමයේත් ප්‍රධාන ඉගැන්වීමක් වන පුනර්ජන්මය ගැන දැන සිටියේ නැත.

සත්තෙකින් ම ඔහු පුනර්ජන්මය යන වචනය නිසා ම පසු බැස්සේ ය. එසේ වූයේ ඔහු වෙනත් සමහරුන් මෙන් පුනර්ජන්ම වාදයත් ආත්ම සංක්‍රමණ වාදයත්' පටලවා ගෙන සිටි නිසා ය. ආත්ම සංක්‍රමණවාදයෙන් කියැවෙන්නේ මිනිසා මරණින් පසු සතුන්ගේ රූපයෙන් මෙලොවට එන බවයි. නැවත ඉපැදුණු තම මුතුන් මිත්තන් යයි සිතා ගවයන් නො මරන හින්දූන් ගැන කොතැනක දී හෝ කියැවූවා සේ ඔහුට මතක ය. මියගිය මුත්තකුගේ ආත්මය ඇතැයි සිතා එක්කෝ කුරුමිණියන් නොමරන, නැතහොත් බෝංචි නොකන, මිනිසුන් ගැන කොතැනෙක දී හෝ අසා ඇති බව ඔහුට මතක ඇති සේ ය.

# පුනර්ජන්මවාදය

ඉක්මනින් ම කේසිගේ මේ පැටැලිල්ල කියවීම් නිසා ම පහව ගියේ ය. පුනර්ජන්මය යන්නෙන් සතුන්ගේ රූපවලට මනුෂ්‍යයන්ගේ නැවත පැමිණීම අදහස් නො කෙරෙන බව කියැවීමෙන් තෝරා දෙන ලදී. පුනර්ජන්මවාදය නූගතුන්ගේ මිථ්‍යාලබ්ධි මාත්‍රයෙක් නොවේ. එය ආගම හා දර්ශනය යන දෙකේ දෘෂ්ටියෙන් සම්භාවනීය වූ ඉගැන්වීමෙකි. භාරතයේත් බෞද්ධ රටවලත් සිටින ලක්ෂ සංඛ්‍යාත උගත් ජනයා එය බුද්ධිමත්ව අදහති. ඔවුන් ජීවිත ගෙන යන්නේ එයින් මතුවන සදාචාර මූල ධර්මවලට අනුව ය. භාරතයේත්, පෙරදිග වෙනත් රටවලත්, මනුෂ්‍ය ආත්මය සත්ත්ව රූපවලට සංක්‍රමණය වන බව උගන්වන නිකාය ඇති බව සත්‍යය. එහෙත් මෙය සත්‍ය වූ පුනර්ජන්මවාදය වරදවා තේරුම් කිරීමෙකි. ක්‍රිස්තියානියේ විකෘත කරන ලද, වරදවා ගන්නා ලද, ආකෘති තිබේ. කවුරුන් වූවත් විකෘති කරන ලද සංකීර්ණය පිළිබඳ සුළු දැනීමක් නිසා

1. The Doctrine of Transmigration of Souls (කේසීත් මේ පොතේ කතුවරිය වන ඒනා පේර්මිනාරා මෙනෙවියත් සතුන් මිනිසුන් වීත් මිනිසුන් සතුන් වීත් උපදනා බව නො අදහති. බෞද්ධ මතයට අනුව මෙතැන දී කේසිගේ අභිඥා ඥානය නො ගැඹුරු යයි කිව යුතු වේ.)

මුල් ඉගැන්වීමේ සත්‍යය දැකීමට බැරි වන තරමට ඇස් පියවා ගැනීම හොඳ නැත.

කියැවීම්වලින් කරන ලද පැහැදිලි කිරීමට තවත් කරුණු එකතු කිරීමට ලැමර්ස් සමත් විය. පුනර්ජන්මය යයි කියන්නේ පරිණාමයකට යයි ඔහු තේරුම් කර දුන්නේ ය. "ජීවිත ගණනක් දිගට මෙලොව ඉපදීමෙන් මිනිසාගේ ආත්මයේ ඇති වන පරිණාමයයි මේ. එක ම තැනැත්තා වරෙක පුරුෂයකු ලෙසත් වරෙක ස්ත්‍රියක ලෙසත් වරෙක දුගියකු ලෙසත් වරෙක රජකුමරකු ලෙසත් උපදී. මෙහි එක් ජාතියෙක උපන් තැනැත්තා අන් තැනෙක දී වෙනත් ජාතියෙක උපදී. මෙය ක්‍රිස්තුස් වහන්සේ විසින් අපට නියම කොට ඇති ආත්ම පාරිශුද්ධිය ලබන තාක් දිගින් දිගට යයි. ආත්මය, වෙනස් රාත්‍රීන්හි වෙනස් ඇඳුම් ඇඳින්නා වූ ද වෙනස් කොටස් රඟ පාන්නා වූ ද නළුවකුට සම කළ හැකි ය. නැතහොත් එය ටික කාලයකට භෞතික ශරීරය නමැති අත්වැස්ම ලා ගෙන සිට එය ඉරී ගිය විට නැවත වෙනත් අත්වැස්මක් ලා ගන්නා වූ අතකට සමාන ය. අප ජීවත් වන මේ අපරදිග ම නැණවත් මිනිසුන් බොහෝ දෙනකුන් එය පිළිගෙන ඒ ගැන ලියා ඇත. ශෝපෙන් හෝවර් එය තරයේ ඇදහී ය. එමර්සන්, වෝල්ට් විට්මාන්, ගොතේ, ජෝර්දානෝ, බ්‍රූනෝ ප්ලොටිනුස්, පයිතගොරෝස් හා ප්ලේටෝ ද පුනර්ජන්මවාදය විශ්වාස කළහ."

"ඒක බොහොම හොඳා" යනු කේසිගේ පිළිතුර විය. "එහෙත් ක්‍රිස්තියානිය ගැන කෙසේ ද ? මා පුනර්ජන්මවාදය පිළිගත හොත් එයින් ම ක්‍රිස්තුස් වහන්සේත් උන් වහන්සේගේ ධර්මයත් ප්‍රතික්ෂේප වෙනවා නේද ?"

"කොහෙත් ම නැත" යි ලැමර්ස් පිළිතුරු දුන්නේ ය. "අන්තිම වශයෙන් ක්‍රිස්තු ධර්මයේ සාරය කිමෙක් ද ? ෆැරිසින්[1]

---

1. ෆැරිසිහු නම් පැරණි යුදෙව් නිකායෙක සාමාජිකයෝ ය. ඔව්හු බොරු සිල් කාරයන් වශයෙන් ප්‍රසිද්ධ ය.

අතර සිටි නීතිධරයෙක් වරක් ක්‍රිස්තුස් වහන්සේගෙන් මේ ප්‍රශ්නය ඇසුවේ ය. උන්වහන්සේගේ පිළිතුර මෙයයි; "ඔබේ ස්වාමියා වූ දෙවියන් වහන්සේට ඔබේ මුළු හෘදයෙන් ම මුළු ආත්මයෙන් ම මුළු සිතින් ම ආදරය කරන්න....... ඔබගේ අසල් වැසියාට ඔබට මෙන් ම ආදරය කරන්න. මුළු ධර්මයත් සියලු අනාගත වක්තෘවරයෝත් මේ විධාන දෙකෙහි එල්ලී සිටිති. (මැතිව් 22:35.40)

මේ සරල ගැඹුරු ධර්මය, පුනර්ජන්මවාදයෙන් යෝජනා කෙරෙන ජීවිත පරිණාමවාදය සමග ගැටෙන්නේ කෙසේ ද ? සත්තෙකින් ම මේ මෛත්‍රී ධර්මය ලෝකයේ ඇති ශ්‍රේෂ්ඨ ආගම්වල ඉගැන්වීම් සමග ගැටෙන්නේ කෙසේ ද ? "ඔබට රිදෙන බව පෙනී ගිය ක්‍රමවලින් ඔබ අන්‍යයනටත් නො රිදවිය යුතු ය" යි බුදුහු වදාළහ. "ධර්ම සාරාංශය මෙයයි. ඔබට කළ විට වේදනා සිදුවන කිසිවක් අන්‍යයන්ට නො කරන්න"යනු හින්දු ධර්මයේ එන ඉගැන්වීමෙකි. හින්දු ධර්මය හා බුදු සමය දෙකට ම මෛත්‍රී ධර්මයත් පුනර්ජන්මයයි කියනු ලබන අධ්‍යාත්ම පරිණාම ධර්මයත් අතර ගැටීමක් තිබෙන බව පෙනී නැත. මේවායින් පුනර්ජන්මයට වැඩි අවධාරණයක් ලැබී ඇති බව සත්‍ය ය. එහෙත් ගැටීමක් ඇති බවක් නම්, ඒ ආගම්වලට පෙනී ගොස් නැත.

තවමත් කේසිට ඒත්තු ගියේ නැත. වයස අවුරුදු දහයේදී ඔහුට බයිබලයක් ලැබී තිබුණේ ය. ඔහු එයින් වශීකෘත විය. එදා පටන් හෙතෙම වසරකට වරක් පොත සම්පූර්ණයෙන් ම කියැවීමට අධිෂ්ඨාන කර ගත්තේ ය. මෙසේ ඔහු උත්පත්තිකථාවේ සිට එළිදරව් පොත ඔස්සේ හැම අවුරුද්දකට ම වරක් ඒ පොත ක්‍රමානුකූල ව කියවන්නට පටන් ගත්තේ ය. එහෙත් වැඩි හිටි වියට පත් වූ පසු ඔහුට එය ඒ අයුරින් ම කර ගත නොහැකි විය. ඔහුගේ ඒ ආදරණීය පොත කියැ වූ කිසි ම අවුරුද්දෙක දී ඔහුට පුනර්ජන්මය යන වචනය එහි දක්නට ලැබුණේ නැත.

බයිබලයවත් ක්‍රිස්තුස් වහන්සේ වත් පුනර්ජන්මය ගැන නො කීවේ මන් ද ? වඩාත් වැදගත් වන්නේ ක්‍රිස්තුස් වහන්සේ ඒ ගැන නො කීමයි.

ලැමර්ස් දුන් පිළිතුර මෙසේ යː "හොඳා, සමහර විට ක්‍රිස්තුස් වහන්සේ කියන්නට ඇත. අප හැමදෙනා විසින් ම මුල දී ම මතක තබා ගත යුතු කරුණෙක් ඇත. එනම් ක්‍රිස්තුස් වහන්සේ සාමාන්‍ය මහජනයාට නො ඉගැන්වූ බොහෝ දේවල් තම ශිෂ්‍යයනට ඉගැන්වූ බව ය. තව ද උන්වහන්සේගේ ඉගැන්වීම්වලට කරන ලද ව්‍යාඛ්‍යාන නිසාත් භාෂා කීපයකට පරිවර්තනය කිරීම නිසාත් ඒ මුල් ඉගැන්වීම, ශත වර්ෂ ගණනාවක් තිස්සේ වෙනස් වී ගොස් ඇති බව ද සිහියට ගත යුතු ය. මේ නිසා ක්‍රිස්තුස් වහන්සේගේ සත්‍ය ඉගැන්වීම් රාශියක් නැති වී ගොස් තිබෙනවා විය හැකියි. අඩු තරමින් එක් ඡේදයක් ඉතිරිව ඇති බව පෙනේ. මෙහි දී ක්‍රිස්තුස් වහන්සේ බැප්ටිස්ට් ජෝන්, එලියෙස්ගේ පුනරාවතාරයෙකැයි තම ශිෂ්‍යයනට කියා ඇත. (මැතිව් 17:12-13) උන්වහන්සේ පුනර්ජන්මය යන වචනය නොයෙදූ නමුත් නිශ්චිත ලෙස ම එය දැක්වූ සේක. "එලියෙස් දැනට ම අවුත් ඇත....එවිට ශිෂ්‍යයෝ උන්වහන්සේ බැප්ටිස්ට් ජෝන් ගැන තමනට කියන බව තේරුම් ගත්හ."

ක්‍රිස්තුස් වහන්සේගේ ශිෂ්‍යයෝ අන්ධ මනුෂ්‍යයා පිළිබඳව උන් වහන්සේගෙන් මෙසේ ඇසූහ; මේ මිනිසා අන්ධ ව උපන්නේ ඔහු කළ පාපයක් නිසා ද ? මෙසේ අසා තිබීම ම වැදගත් ය. පුනර්ජන්මය ගැන ඉඟි කරන නැතහොත් පැහැදිලි ලෙස කියන වෙනත් ඡේද ද ඇත. එළිදරව් පොතේ 13 වැනි පරිච්ඡේදයේ 10 වැනි පද්‍යය මෙසේ යː "හිරේ දමන්නෝ හිරේ වැටෙතිː කඩුවෙන් මරන්නා කඩුවෙන් මැරුම් කෑ යුතු ය. සාන්තුවරයන්ගේ ඉවසීමත් විශ්වාසයත් මෙය පදනම් කොට ඇත. ජීවිතයෙන් ජීවිතයට කර්ම විපාක නියාමයක් ක්‍රියාත්මක වන බව මේ ඡේදයෙන් දැක්වෙයි.

පරම්පරාගත ක්‍රිස්තියානි ධර්මය පුනර්ජන්මය ගැන සඳහන් නො කරන බව පෙනෙන ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් තහවුරු කර ගෙන ඇත. තෝරා ගැනීම්වල දීත් ඉවතලීම්වල දීත් තේරුම් කිරීම්වල දීත් මේ පරම්පරාගත ආගම නිවැරදි ම යයි අප සහතික වන්නේ කෙසේ ද ?" ලැමර්ස් තම දේශනය දිගට ගෙන ගියේ ය. "තව ද ආදිකාලීන ක්‍රිස්තියානි පියවරුන්ගේ ඉතිහාසය හදාරන්නකුට ඒ බොහෝ දෙනකුන් තමන්, පුනර්ජන්මය පිළිගත් බව ලියා ඇති බවත් එළිපිට ම එය උගන්වා ඇති බවත් දැන ගන්නට ලැබේ. තම ජීවිතයේ මුල් කාලයේ දී ඔරිගන්[1] එසේ කළේ ය. ජස්ටින් මාටර්[2], සාන්ත ජෙරොම්[3], ක්ලේමන්ස් ඇලෙක්සැන්ඩ්‍රිනුස්[4], ප්ලොටිනුස්[5] හා තවත් බොහෝ අය නිදසුන් වශයෙන් දිය හැකි ය. මේ අය ජීවත් වූයේ ක්‍රිස්තු ධර්මයේ මූලස්ථානය වූ ක්‍රිස්තුස් වහන්සේගේ ජීවමාන කාලයට ඉතා ආසන්න කාලවල ය. මුන්වහන්සේලා අතීතයේ සිට රහස් සම්ප්‍රදාය මගින් පවත්වා ගෙන එන ලද ධර්ම කෙසේ හෝ ඉගෙන තහවුරු කොට දුන්නා විය නොහැකිද? ක්‍රිස්තුස් වහන්සේ තම ශිෂ්‍යයන් දොළොස් දෙනාට යම් යම් රහස් ඉගැන්වීම් කරන්නට ඇත. ඔරිගන් ආදීන් විසින් උගන්වන්නට ඇත්තේ මේ ධර්මය විය හැකි ය."

"කතෝලික නායක පූජකයකු වන කාඩිනල් මෙසියර් තමා ම පුනර්ජන්මවාදය නො පිළිගන්නා නමුත් එය කතෝලික ශාසනයේ අවශ්‍ය ධර්ම සමග නො ගැටෙන බව කියා තිබීම ද වැදගත් බව" ලැමර්ස් කීවේ ය. "ශාන්ත පෝල්ගේ දේවස්ථානයේ ඩීන් ඉංගේ ද පුනර්ජන්මවාදය හා නවීන බිෂොප්වරුන්ගේ ධර්මය අතර තමාට පෙනෙන ගැටීමක් නැතැයි කියා තිබේ. මේ නිසා ප්‍රොතෙස්තන්තයන් වත් කතෝලිකයන්වත් ඇතැම් ආගම්වල එන පුනර්ජන්මවාදය විද්‍යාවට අසුවන සත්‍යයෙක්

1. Origen
2. Justin Martyr
3. St. Jerome
4. Clemens Alexandrinus
5. Plotinus

විය හැකි යයි සැලැකීමේ දී තමන් නාහනම් බිමකට පා තබතැයි සිතීම අවශ්‍ය නොවේ.

පුනර්ජන්මවාදය සමග ගැටෙන බව පෙනෙන ඇතැම් අදහස් ක්‍රිස්තියානි දේව ධර්මයෙහි තිබූ බව නම්, සත්‍යය. මළවුන්ගෙන් නැගිටීම පිළිබඳ ඉගැන්වීමත් අවසාන විනිශ්චය දිනය පිළිබඳ ඉගැන්වීමත් සම්ප්‍රදාය ගරුක බොහෝ ක්‍රිස්තියානින් විසින් පුනර්ජන්මවාදය සමග තදින් ම ගැටෙතැයි සලකනවා විය හැකියි. එහෙත් "මළවුන්ගෙන් නැගිටීම" හා අවසාන විනිශ්චය දිනය යන කියමන් වාච්‍යාර්ථවත් කියමන් වශයෙන් නො ව ව්‍යංගාර්ථවත් කියමන් වශයෙන් තේරුම් ගත යුතු වන්නට බැරි ද ? නව ද ක්‍රිස්තුස් වහන්සේ විසින් හා නව තෙස්තමේන්තු ලේඛකයන් විසින් තමන් දුටු ආධ්‍යාත්මික සත්‍යය පණ ගන්වනු සඳහා යොදන ලද උපමා කථා "නිරාගින්න" යන්න වැනි වූ රූපක හුදු වාච්‍යාර්ථ වත් උග්‍ර ධර්ම බවට හරවා ගත්තා විය නො හැකි ද ?"

ලැමර්ස්ගේ මේ පිළිතුරු තමාගේ සිතුවිලි පුබුදු කර වන බව කේසිට හැඟී ගියේ ය. නව ද මේ පිළිතුරු නිසා ඔහුගේ සිතේ පැවැති බිය මුසු මුළාව ද පහව ගියේ ය. මේ විශේෂ ශක්තිය තමා කුඩා කල සිට ඉගෙන ගෙන තිබූ ආගමට විරුද්ධව යෙදෙන්නේ ය යන හැඟීම ඇති වූ අවස්ථාවේ සිට කේසිගේ සිතෙහි එබඳු බිය මුසු මං මුළා ගතියක් පැවතුණේ ය. එහෙත් ඔහුගේ සිතෙහි වෙනත් විරෝධ පහළ විය. මෙවර පහළ වූයේ විද්‍යාවේ විරෝධයයි. නිදසුනක් වශයෙන් ලෝකයේ විශාල ලෙසින් ජනගහනය වැඩි වීම ගැන කුමක් කියන්නටද? මේ වැඩිවීම සියලු ආත්ම කලින් මේ මිහිපිට සිටියා ය යන මතය සමග ගළපා ලන්නේ කෙසේද? වැඩි හරිය ආවේ කොහෙන් ද?

ග්ලැඩිස් ඩේවිස් සහිත වූ මුළු කේසි පවුල ද ලැමර්ස් හා ලින්ඩන් ශ්‍රෝයර් ද යන මේ සියලු දෙනා ම ප්‍රමාණවත් ව මේ

ප්‍රශ්න සාකච්ඡා කරන එක ම සාකච්ඡා මණ්ඩලයෙක් වූහ. විවාදයේ ඇන හිටින තැනකට පත් වූ විට ඔව්හු කියැවීම්වලින්ම උපදෙස් ගත්හ. කියැවීම් ඇදහිය නො හැකි තරමට අද්භූත වූ කල, ඔවුහු මහජන පුස්තකාලයෙන් පොත් ගෙන බැලූහ.

වැඩි අමාරුවක් නැති ව ඔවුහු ජනගහන ප්‍රශ්නයට උත්තරයක් සොයා ගත්හ. අන්තිමට නියම වැඩි වීමක් සිදු වී තිබේ යයි අප හරියට ම දන්නේ කෙසේ දැයි එකෙක් තර්ක කෙළේ ය. මෙතෙක් ලබා ඇති කියැවීම් බොහොමයෙකින් ඊජිප්තුවේ හා අත්ලන්තිසයේ වැනැසී ගිය සභ්‍යත්වයන් ගැන සඳහන් කර ඇත. කාම්බෝජය, මැක්සිකෝව, ඊජිප්තුව යනාදී රටවල පුරා විද්‍යා නෂ්ටාවශිෂ්ටවලින් දූන් මුඩු බිම් ඇති ප්‍රදේශවල වරක් මහා සභ්‍යත්වයන් පැවැති බව ඔප්පු වෙයි. ඉතිහාසයේ ඕනෑ ම අවස්ථාවෙක දී විශ්වයේ ඇති ආත්ම සංඛ්‍යාවේ වෙනසක් ඇති වෙන්නේ නැති ව පොළොවේ ජනගහනය අඩු වැඩි වන්නට ඉඩ ඇති බව සිතා ගත හැකි ය. ලක්ෂ ගණන් ආත්මවල වාසයට පෘථිවිය අයෝග්‍ය ස්ථානයක් වූ කල අපට නොපෙනෙන ලෝකය ඒ ආත්මවලට නිවාස වෙනවා ඇත.

හිතුවක්කාර තරමට සැක කරන කේසීට පවා මේ විවරණය හොඳට ම යුක්ති සහගත බව හැඟී ගියේ ය. කියැවීම් ගණනෙක දී ම පෙර පැවැතිණැයි සඳහන් කරන ලද අත්ලන්තිසය තවත් බාධකයෙක් විය. සත්‍ය වශයෙන් ම එබඳු ස්ථානයෙක් තිබිණැයි අප දැන ගන්නේ කෙසේ ද ? මේ ප්‍රශ්නයට කියැවීම්වලින් ම විස්තර සහිත දිග උත්තරයක් ලැබිණි.

අත්ලන්තික් සාගරයේ ජලය යට පුරාතන අත්ලන්තිසයේ පැවැත්ම ගැන සඳහන් කළ බටහිර ලෝකයේ සිටි ප්‍රථම ලේඛකයා ප්ලේටෝ බව කියැවීම්වලින් ම හෙළි කරන ලදී. ඔහු ඒ ගැන සඳහන් කර ඇත්තේ වෙනත් දෙයක් කියන අතර අහම්බෙනි. අද සිටින සාමාන්‍ය මහජනයා මේ කරුණු ගැන

බරපතල ලෙසින් නො සිතන නමුදු කලෙක සිට භූගර්භ විද්‍යාඥයන් විසින් ඒ ගැන තම විද්‍යාවේ අවධානය යොමු කොට ඇත. ඔවුන් අතර මතභේදයක් තිබේ. සමහරුන් නැතැයි කියන අතර තවත් සමහරු අත්ලන්තිසය පැවැති බැව් තරයේ ම කියා සිටිති. කෙසේ වෙතත් මේ කරුණ ගැන ලියැ වී ඇති ශාස්ත්‍රීය වූ පොත් ගණනාවෙකින් ම එකිනෙක ඔප්පු වන්නා වූ සාක්ෂි රාශියක් ඉදිරිපත් කොට තිබේ. මේවා අතර ඓතිහාසික වූ ද සංස්කෘතික වූ ද භූගර්භ විද්‍යාත්මක වූ ද සාක්ෂි ඇත. කේසි ට එබඳු පොතක් හමු විය. එනම් ඉග්නේෂස් ඩොනලිගේ [1] "Atlantis, The Antediluvian World" නමැති පොතයි. තමාගේ කියැවීමවලින් ප්‍රධාන සාක්ෂ්‍ය මාර්ගයන් පිළිබඳ ව නිවැරැදි විස්තරයක් කර තිබීම ගැන ඔහු පුදුමයට පත් විය.

මේ සාකච්ඡා හා විමර්ශන නිසාත්, ඉතිහාසය, විද්‍යාව, තුලනාත්මක ආගම, පුරාතන රහස් ධර්ම, අත්ලන්තිසය හා සම්මෝහ නිද්‍රාව, මනෝ විද්‍යාව යන විෂයන් පිළිබඳ පොත් කියැවීම නිසාත්, කේසිට ඉතිහාසය හා සංස්කෘතිය පිළිබඳ කලින් නො පැවැති පළල් දැනීමෙක් ඇති විය. මේ හැම විෂයයක් ගැන ම කියැවීම් වලින් ද සංක්ෂේපයෙන් කරුණු දැක්විණි. සම්මෝහ නිද්‍රාවේ දී තමා කී දේ ගැන තුබූ බය කේසි ක්‍රමයෙන් අඩු කර ගත්තේ ය. ඒවායේ සත්‍යයක් ඇතැයි පිළිගැනීමට ද ඔහු සූදානම් විය. අභ්‍යන්තර හා බාහිර වශයෙන් කියැවීම්වල ඇති ගැළැපීම සොයා ගැනීමට ඔහු ඒවා විවේචනාත්මක කුතුහලයෙකින් යුතු ව පරීක්ෂා කර ගන්නට පටන් ගත්තේ ය.

ඔහුට සොයා ගත හැකි වූ එක් කරුණෙක් නම් නිතර ම කියැවීම එකිනෙකට ගැළැපුණු බවයි. කියැවීම් දෙකක් අතර කාලය කොතරම් දික් වුවත් එක් කියැවීමක් තවත් කියැවීමක් සමඟ ගැටුණේ නැත. නිදසුනක් ගනිමු. පුද්ගලයකු පිළිබඳ එක්

1. Ignatious Donnelly

කියැවීමක් ලබා ගන්නට මාස ගණනකට නැතිනම් අවුරුදු ගණනකට පසු ව වෙනත් කියැවීමක් ලබා ගත හැකි ය. එහෙත් දෙවන කියැවීමේ තොරතුරු පළමු කියැවීම සමඟ ගැළපෙයි. දෙවන කියැවීම පටන් ගන්නේ ලකුණක් ලබා නතර කළ පොතක් නැවත එතැන් සිට කියවා ගෙන යන පාඨකයකු ලෙසය. බොහෝ කියැවීම්වල ඉතිහාසයේ ඉකුත් යුග ගැන පසුබිම් තොරතුරු ඇතුළත් ව තිබිණි. පැරණි ඊජිප්තුවේ හා අත්ලාන්තිසයේ තොරතුරු එබඳු ය. මෙබඳු කියැවීම් සමූහයක් එක් කොට සැසැඳූ විට මේ විස්තර කැබැලි එකිනෙකට ගැළපුණු බව පෙනී ගියේ ය. එක් කියැවීමෙකින් තවත් තැනෙක කී දෙය ම නැවත කියැවෙනවාත්, කලින් කී දෙයට යමක් අලුතින් එකතු වනවාත් දක්නට ලැබිණි.

එක් කියැවීමක් තවත් කියැවීමක් සමග පමණක් නොව ඉතා අප්‍රකට ව නමුදු, වාර්තාගත ව ඇති ඉතිහාස සිද්ධි සමගද බොහෝ කරුණුවලින් ගැළැපුණේ ය. නිදසුනෙක් මෙසේ ය. මුල් කාලයේ දී ම ගන්නා ලද එක් කියැවීමෙක් එක් මිනිසකුගේ පුටු ගිල්ලන්නකු[1] ලෙසින් වූ පූර්ව ජන්මයක් ගැන සඳහන් කෙළේ ය. පුටුගිල්ලන්නා කවරෙක් ද යන්න ගැන කේසිට හැඟීමක් තිබුණේ නැත. එහෙත් විශ්ව කෝෂයක් බැලීමේ දී මේ වචනයෙන් පූර්වකාලීන ඇමෙරිකානු චාරිත්‍රයක් ගැන සඳහන් කරන බව දැන ගන්නට ලැබිණි. මන්තරකාරියන් වශයෙන් සැකයට පාත්‍ර වූ අය පුටුවෙක බැඳ සිහිල් දිය පොකුණෙක ගිල්වීම එකල පැවැති චාරිත්‍රයෙකි. "පුටු ගිල්ලන්නා" නම් වරදකරුවන් පුටුවෙක බැඳ දියේ ගිල්ලන නැනැත්තා ය.

කියැවීම්වල තිබූ ඓතිහාසික නිරවද්‍යතාව පිළිබඳ තවත් සිත් අලවනසුලු නිදසුනෙක් නම් ජාන් පෝක්ලෑං[2] නැතහොත් මොලියේ[3] පිළිබඳ ව කර ඇති සඳහනෙකි. මොලියේගේ මව ඔහු කුඩා කාලයේ දී ම මිය ගියා ය. ශ්‍රේෂ්ඨ ප්‍රංශ නාට්‍ය

1. Stool - Dipper 2.Gean Poquelin 3. Molière

ලේඛකයකු වන මොලියේගේ නම කේසි දැන සිටියේ නැත. මොලියේ යන නම බොරු නමක් බව වඩාත් අප්‍රකට විය. ඔහුගේ නියම නම පෝක්ලෑං යනු ය. පොත් පත් බැලීමේ දී ඔහුගේ නියම නම සම්බන්ධයෙන් ද මවගේ මරණය සම්බන්ධයෙන් ද කේසි නින්දෙහි සිටිමින් නිවැරැදි තොරතුරු දී ඇති බව සොයා ගත හැකි විය. තරුණයකු සම්බන්ධ වී ඇති තවත් නිදසුනෙක් ඇත. පූර්ව ජන්මයෙක දී ඔහු ප්‍රංශයේ ජීවත් වූ බව කියා තිබේ. එහි දී ඔහු රොබට් ෆුල්ටන් හා මිත්‍ර වී බොහෝ නිෂ්පාදනයන්හි දී ඔහුට උදවු කොට තිබේ. කේසි රොබට් ෆුල්ටන් කවරෙක් දැයි දන්නා නමුත් ඔහු එක්සත් රාජ්‍යවලින් පිටත විසුවා දැයි සැක කෙළේ ය. එහෙත් ජීවිත කථා ශබ්දකෝෂයක් බලන විට ෆුල්ටන් අවුරුදු කීපයක් ප්‍රංශයේ ගත කොට ඇති බව දැන ගත හැකි විය. එහි දී ඔහුට ඔහුගේ චරිතය කෙරෙහි බල පෑ ප්‍රබෝධක පුද්ගලයන් කීපදෙනකු හමු වූ බව දැන ගන්නට ලැබිණි.

සිරිතක් වශයෙන් මේ කියැවීම්වලින්, අතීත ජන්මයන්හි ව්‍යවහාර වූ නම් ඉදිරිපත් කරනු ලැබේ. නිදසුන් කීපයෙක දී පමණක් ඒ ඒ පුද්ගලයනට තමාගේ පූර්ව ජන්ම වාර්තා සොයා ගත හැකි තැන් ද කියා තිබේ. පොතෙහි නැති නම් පැරැණි රෙජිස්ටරයෙක, ඒත් නැති නම්, සොහොන් ගලෙක ඒවා සොයා ගත හැකි වනු ඇත. පූර්වජන්ම නාමය බාර්නට් සේ[1] යයි කියා ඇති මිනිසාගේ නිදසුන මේ වර්ගයේ හොඳ ම නිදසුන විය හැකි ය. ඔහු සිවිල් යුද්ධයේ දී දක්ෂිණ දේශයේ සොල්දාදුවකු වී සිටි බව ද කියා තිබේ. ඔහු වර්ජිනියාවේ හෙන්රිකෝ කෝරළයේ විසූ බව ද සොයනවා නම්, ඒ පූර්ව ජීවිතයේ වාර්තා තව ම සොයා ගත හැකි බව ද තවදුරටත් .කියා ඇත. ඉඩ ලැබුණු හැටියේ ම මේ මිනිසා හෙන්රිකෝ කෝරළයට ගියේය. ඔහු සෙවූ වාර්තා එහි නො තිබුණු නමුත් උසාවියේ ලේකම්වරයා

1. Barnett Seay

පැරණි රෙජිස්ටර් වර්ජිනියා රාජ්‍යයේ ඓතිහාසික පුස්තකාලයේ පැරණි වාර්තා දෙපාර්තමේන්තුවට ළඟ දී ගෙන ගිය බව ඔහුට දැන්වී ය. අවසානයේ දී ඔහුට ඒ පුස්තකාලයේ රාජ්‍ය ලේඛනාගාරයෙහි බාර්නාට් සේගේ වාර්තා හමු විය. මෙතෙම 1862 දී වයස විසි එකේ දී ජනුධරයකු[1] ලෙස හමුදාවට බැඳී සිටියේ ය.

අතීත ජීවිත තොරතුරු පිළිබඳ මේ පුදුම ඓතිහාසික ස්ථිර වීම් හැරුණු විට වර්තමාන ජීවිත කරුණු පිළිබඳ අප්‍රමාණ ස්ථිර වීම් ද ඇත. කියැවීම්වලින් කරන ලද කේසිගේ හා ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ පමණක් නොව සම්පූර්ණ අමුත්තන් වූ පුද්ගලයන්ගේ පවා චරිත පිළිබඳ මනෝවිද්‍යාත්මක විග්‍රහ නිවැරැදි බව කේසිට ඉක්මනින් ම දැන ගන්නට ලැබිණි. කේසි පිළිබඳවත් ඔහුගේ පවුලේ අය පිළිබඳවත් කියැවීම්වල තුබූ නිවැරැදිකම ඔහුගේ උඩු සිතේ තුබූ දැනීම නිසා වූවෙකැයි තෝරා දී ඉවත දැමිය හැකි බව සත්‍ය ය. නින්දේ සිටිමින් කේසි තමාගේ ඥානයෙන් තොරතුරු ඇද කීවා යයි තර්ක කළ හැකි ය. එහෙත් වැඩිකල් යන්නට පෙර කායික කියැවිම්වල දී මෙන් ම ජීවිත කියැවීම්වල දීත් කියැවීම් ලබන්නා ගැන කේසි දන්නවා ද නැද්ද යන්න කරුණක් නොවන බව දැන ගන්නට ලැබිණි. කියැවීම් ලබන්නන් මිහිපිට ඕනෑ ම තැනෙක සිටින සම්පූර්ණ අමුත්තන් වූවාට කමක් නැත. ඔවුන්ගේ සම්පූර්ණ නමත් උපන් දිනය හා තැනත් ලැබුණොත් ඔවුන්ගේ පරිසරය හා අභ්‍යන්තර චරිතය නිවැරැදිව විස්තර කිරීමට කේසි සමත් විය. පුද්ගලයන්ගේ දක්ෂතා හා දුර්වලතා ද දක්වන කේසි ඒ ගුණ ආරම්භ වූ බව පෙනෙන පිළිගත හැකි පූර්ව ජන්ම විස්තර ද දෙයි.

දුර සිටින අමුත්තකුගේ චරිතය නිවැරැදිව දැක්වූයේ වරක්

1. Color - Bearer (කොඩි දරන්නා)

නම්, එය අහඹු සිදුවීමෙකැයි ඉවත ලිය හැකි ය. එහෙත් අනන්ත වූ මනුෂ්‍ය දක්ෂතා අනන්ත වූ මනුෂ්‍ය පරිසර විවිධතාත් ගැන සලකා බලන විට ඒ අහඹුව පුදුම අහඹුවක් විය යුතු ය. නිවැරැදි කියැවීම් සංඛ්‍යාව වැඩි වන තරමට මෙය අහම්බෙන් සිදුවන්නෙකැයි සැලකීම දුෂ්කර වෙයි.

අවුරුදු ගණනාවක් තිස්සේ ම කේසිට දැන ගන්නට ලැබුණු ජීවිත කියැවීම්වල නිවැරැදිකමේ තුබූ තවත් පක්ෂයක් නම්, ළදරුවන්ගේ මානසික ගතිගුණ හා වෘත්තීය දක්ෂතා පිළිබඳ නිවැරැදි කමයි. නෝෆෝක් ළදැරියක් උපන් දිනයෙහි කරන ලද ජීවිත කියැවීමෙකින් ඈ පාලනය කිරීමට දුෂ්කර මුරණ්ඩු හිතුවක්කාර තැනැත්තියක බව කියන ලදී. ඈ වැඩෙන විට මේ ගතිගුණ පැහැදිලි ව ම දක්නට ලැබිණි. මෙහි දී මාපියන් විසින් සිතා මතා එසේ වන්නට ඈ පොළොඹ වන්නට ඇතැයි සිතීම දුෂ්කර ය.

ඉපදී සති තුනෙකින් ජීවිත කියැවීමක් ලබා ගන්නා ලද දරුවාගේ නිදසුන මීටත් වඩා සිත් ගන්නාසුලු ය. ඔහු දක්ෂ වෛද්‍යවරයකු වනු ඇතැයි කියන ලදී. ඔහුගේ චරිතයෙහි ඇතැයි කියන ලද සියලු දුර්ගුණත් වෛද්‍ය ශාස්ත්‍රය කෙරෙහි වූ තද උනන්දුවත් අඩු වයසේ දීම දක්නා ලදී. වයස අටේ දී හේ සතුන් සෑදී ඇති ආකාරය බැලීම පිණිස මළ සතුන් කපන්නට පටන් ගත්තේ ය. වයස දහතුන ලබන්නටත් පෙර වෛද්‍ය ශාස්ත්‍රීය විශ්ව කෝෂ, ආශාවෙන් කියවන්නට පටන් ගත්තේ ය. වයස දොළහේ දී හෙතෙම වෛද්‍යවරයකු වීම සඳහා තමා ජෝන් හොප්කින්ස් විද්‍යායතනයට යනු කැමැති බව තම පියාට කීවේ ය. පියා නිව්යෝක්හි ව්‍යාපාරිකයෙකි. මව නිළියකි. දරුවා වෛද්‍ය වෘත්තියට බසිනවාට මුල දී අකැමැති වූ මා පියෝ ඔහු පසු බස්සන්නට උත්සාහ ගත්හ. එහෙත් අධිෂ්ඨානය සියලු බාධා මැඩ පවත්වා නැඟී සිටියේ ය. දැන් මෙතෙම විශ්ව

විද්‍යාලයෙක පූර්ව වෛද්‍ය පාඨමාලාව හදාරමින් සිටී. මෙහි දීත් අනාගත වාක්‍යය ඉටු කරන්නට මාපියන් රුකුල් නුදුන් බව හොඳට ම පැහැදිලි ය. මෙයින් ද ළදරුවාගේ උපතේ දී ම ඔහුගේ අතීත ජන්ම කර්ම පදනම් කර ගත්තා වූ සමර්ථතා පිළිබඳ නියම දිව්‍ය ඥානයක් කේසිට තුබූ බව පෙනී යයි.

මෙබඳු නිදසුන්වලින් කියැවීම්වල තුබූ මහා අනාවැකි අගය හෙළි කරනු ලැබේ. අනාවැකි යන්න මෙහි යොදා ඇත්තේ සාස්තරකාරයන් පිළිබඳව එය යොදනු ලබන අර්ථයෙන් නොව මනෝවිද්‍යාඥයන් විසින් මනෝවිද්‍යා පරීක්ෂණවල අනාවැකි අගය ගැන කියන විට ඒ වචනය භාවිත කරන අර්ථයෙනි. නිදසුනක් ගනිමු. ඉතා ප්‍රසිද්ධ රෝශශ් තීන්ත බින්දු - පරීක්‍ෂණය[1] ගගන යාත්‍රික අධුනිකයනට ඔවුන්ගේ අභ්‍යාස මාලාවේ ආරම්භයේ දී යොදා තිබේ. පරීක්‍ෂණයේ ප්‍රතිඵලවලට අනුව ශිෂ්‍යයන් දෙසීයෙක පමණ කණ්ඩායමෙකින් හය දෙනකු ඔවුන්ගේ මානසික ගතිගුණවලට අනුව ගගන යාත්‍රික වෘත්තියට නො සුදුසු බව පෙනී ගිය නමුදු ශිෂ්‍යයන් සියලු දෙනා ම පන්තියට ඇතුළු කර ගන්නා ලදහ. එහෙත් අවුරුද්දක් ගත වන්නට පෙර නුසුදුසු යයි කල්තියා නම් කරන ලද හය දෙනාම මානසික හේතු නිසා අස්ව ගියහ. මෙබඳු නිදසුන් පදනම් කර ගෙන "රෝශශ් පරීක්ෂණයට" මහා "අනාවැකි" අගයක් ඇතැයි සලකනු ලැබේ.

මේ අර්ථයෙන් කේසිගේ ජීවිත කියැවීම්වල මහා අනාවැකි අගයෙක් ඇත. මෙය ළදරුවන් සම්බන්ධයෙන් පමණක් නොව වැඩිහිටියන් සම්බන්ධයෙන් ද දක්නට ලැබිණි. නිව්යෝක් නගරයේ සිට ටැලිග්‍රාෆ් ක්‍රියාකරවන්නියක වූ තරුණියකට අවස්ථා කීපයක දී ම වර්ජිනියා බීච්යට යවන්නට සිදු වූ ටැලිග්‍රෑම් ගැන කුහුලෙක් ඇති විය. ඕ කේසි කවරෙක් දැයි සොයා

1. Rorschach Ink - Blot Test

බැලුවාය. ඇගේ කුතුහල තවත් වැඩි විය. ඕ ජීවිත කියැවීමක් ලබා ගැනීමට තීරණය කළා ය. ජීවිත කියැවීමේ දී ඈ ටැලිග්‍රාෆ් ක්‍රියාකරවන්නියක වශයෙන් නිකරුණේ කාලය කා දමන බව කියන ලදි. අතීත ජන්ම කීපයෙක දී ඈ දක්ෂ චිත්‍ර කලාකාරියක වී සිටි නිසා ඇට වාණිජ චිත්‍ර කලාව උගන්නට යයි නියම කරන ලදි. වාණිජ චිත්‍ර කලාවට තබා මොන ම චිත්‍ර කලාවකටවත් බැසීමේ අදහස ඇට කවදවත් ඇති වී නො තිබිණි. ඕනෑ ම දෙයක් වරක් අත්හදා බැලීමේ ධෛර්යය ඇට තිබිණි. ඕ චිත්‍රකලා විද්‍යාලයකට ඇතුළු වූවා ය. තමාට නියම දක්ෂතා ඇති බව දුටු ඕ මවිත වූවා ය. නොබෝ කලෙකින් ම මෝ නොමෝ ඉතා සාර්ථක වාණිජ චිත්‍ර කලාකාරියක් වූවා ය. මෙයින් ඇගේ තත්ත්වය වෙනස් විය.

කල්යාමේ දී, මේ තොරතුරු මිනිසුන්ගේ ජීවිතයෙහි ක්‍රියාත්මක වනු දුටු කේසීට, ඒවා සත්‍ය බවත් ඒවායින් හොඳක් සිදු වූ නිසා හොඳ බවත් ඒත්තු ගියේ ය. කියැවීම්වල ඔප්පු නොකළ හැකි බොහෝ කොටස් ද තිබිණි. එහෙත් ඔප්පු කළ හැකි කොටස් නිසා, ඔප්පු නො කළ හැකි කොටස් ගැන ද විශ්වාසයෙක් ඇති විය. බොහෝ මිනිසුනට යෝග්‍ය වෘත්තියට මග පෙන්වන ලදි. තවත් සමහරුන්ට ඔවුන්ගේ විවාහ දුෂ්කරතා තේරුම් ගැනීමට උදව් ලැබිණි. තවත් කොටසකට වඩා හොඳින් සාමාජික හා මානසික සංස්කරණ ඇති කර ගැනීමට අවශ්‍ය තමා පිළිබඳ දැනීමෙක් ලබා දෙන ලදි.

මුල දී ම කේසී සිතුවේ, තමා මේ තොරතුරු දෙන්නේ පුනර්ජන්මය විශ්වාස කළ ලැමර්ස්, කිසියම් ක්‍රමයකින් ඒ විශ්වාසය තමාගේ හිතේ තැන්පත් කළ නිසා බව ය. එහෙත් සිදුවීම් නිසා ම මේ සැකය බිඳී ගියේ ය. පළමු කොට ම පළමු කියැවීම සඳහා කළ යෝජනාවේ දී ලැමර්ස් පුනර්ජන්මය යන වචනය යෙදුවේ නැත. අඩු වැඩි නැති ව ඔහු ඉල්ලා සිටියේ

කේන්ද්‍රයෙකි. කේසිගේ යටි සිත නැතහොත් අතිසංඥ චිත්තය[1] පූර්වජන්මයක් ගැන තොරතුරු දුන්නේ සිය කැමැත්තෙනි.

තවද, පසු කාලයෙක දී දුර අමුත්තන් පිළිබඳ ව ලැබී ඇති සාක්කි වශයෙන් ගත හැකි, සියලු තොරතුරු කේසිගේ හා ලැමර්ස්ගේ දැනුම් සීමාවෙන් සම්පූර්ණයෙන් ම ඔබ්බෙහි විය. කේසිගේ යටි සිත ලැමර්ස්ගේ යෝජනාව ම හිතුමතයේ විස්තර කළා නම්, කලින් නොදත් නමුත් පසුව සත්‍ය බව සොයා ගත හැකි වූ සිදුවීම් සමග එතරම් හොඳින් ගැළපෙන්නට ඉඩෙක් නැත.

මේ කරුණු සියල්ල එක්කොට ගත් විට ජීවිත කියැවීම් වලින් ලැබුණු තොරතුරුවලත් මනුෂ්‍ය දෛවය පිළිබඳව ඒවායින් ලැබුණු විවරණයේත් සත්‍යතාව පිළිබඳ විශ්වාසයෙක් කේසිට ඇති විය. මේ සියල්ලට ම වැඩියෙන් ඔහුගේ ඒත්තු යෑමට හේතු වූයේ කියැවීම්වල පැතිර පැවැති ක්‍රිස්තුස් වහන්සේගේ ජීවය බඳු ජීවයයි. කියැවීම්වල තුබූ සහෝදර ප්‍රේමාන්විත උපකාරක ස්වභාවයෙහි ද පුනර්ජන්ම මතය සමඟ ආදර්ශවත් ක්‍රිස්තියානි ගුණධර්මයන්ගේ මනා ගැළැපීමෙහි ද යන දෙකෙහිම ඒ ජීවය තිබිණි. බයිබල් පාඨයක් හෝ ක්‍රිස්තුස් වහන්සේගේ අවවාදයක් හෝ ඇතුළත් නො කරගත් කියැවීමක් ලැබුණේ ඉතා කලාතුරෙකිනි. වැඩියෙන් උද්ධෘත කොට ඇති බව පෙනෙන්නේ පහත එන ක්‍රිස්තුස් වහන්සේගේ වදන් ය. "ඔබ වපුළ අන්දමින් ඔබට පල නෙළා ගන්නට වෙනවා." "අන්‍යයන් ඔබට ක්‍රියා කරනවාට කැමැති අන්දමින් ඔබත් අන්‍යයනට ක්‍රියා කළ යුතු ය." ඇතැම් විට ඒවා ඍජු උද්ධෘත පිළිබඳ විවරණය; "රැවටෙන්න එපා, වරදවා තේරුම් ගන්න එපා, දෙවියන් වහන්සේ රවටන්න බෑ" එසේ කියන්නේ මිනිසාට වපුළ දෙය නෙළා ගන්නට වන නිසයි. මිනිසාට නිතර කමා ම

1. Super Conscious Mind

හමු වෙනවා. ඒ නිසා උන්වහන්සේ කියා ඇති පරිදි ද්‍රෝහී ව ඔබෙන් ප්‍රයෝජන ගත් අයටත් යහපත ම කරන්න. එවිට ඔබ ඔබේ සගයනට කර ඇති වරද එමගින් නිවරද කර ගත හැකිවනු ඇත."

අතීත ජීවිතයෙක කරන ලද පාපයෙකින් ඇති වූවා යයි සිතිය හැකි ආබාධ පිළිබඳ ව කරනු ලබන විවරණවල දී ඉහත දැක්වූවාක් බඳු අදහස් පවසා ඇත. මේවා මහත් උනන්දුවෙකින්ද හැම විටම ගැළපෙන සේ ද අර්ථවත් ලෙස ද කියා ඇති නිසා ඒත්තු යනසුලු විය. ක්‍රිස්තියානි ආකල්පය සමග පුනර්ජන්ම මතයේ ඇති මේ ගැළපීමේ විද්‍යානුකූල වූ බලයෙක් නැත. කෙළින් ම ඉන්ද්‍රිය ඥානයට අසුවන දේවලට ඔබ්බෙහි වූ දේ ගැන අපට දැනීමක් ලබා ගත නොහැකි යයි සිතන අඥෙයවාදියකුට නම්, එය කිසිසේත් වැදගත් නො වේ. එහෙත් කේසිගේ වැනෙමින් තුබූ විශ්වාසය නම් තහවුරු වූයේ මේ ගැළපීම නිසා ය.

මුල් කලබලය යටපත් වූ විට, කේසි ඇතුළු කණ්ඩායම එකතුව ඒ තොරතුරුවල ස්වභාවය ගැන ම ප්‍රශ්න කරන්නට වූහ. ඔවුනට කුහුලක් ඇති කළ එක් කරුණෙක් නම් කියවීම්වල දී ඇතැම් ඉතිහාස යුග නැවත නැවතත් පැමිණෙනු දක්නට ලැබීම ය. බොහෝ මිනිසුනට සමාන වූ ම ඉතිහාස පසුබිමක් දී තිබේ. සත්තෙකින් ම මිනිසුන්ගේ අතීත ජීවිත මාර්ගය කිසියම් සැලැස්මකට වැටෙන්නාක් බඳු විය. නිතර දක්නට ලැබුණේ එක් සැලැස්මකට අනුව මිනිසුන් නිතර නිතර පිළිවෙළින් අත්ලන්තිසය, ඉජිප්තුව, රෝමය කුරුස යුද්ධ පැවැති ප්‍රදේශ හා ආදි කාලීන යටත් විජිත යන ස්ථානවල මෙලොව ඉපැදී ඇත. තවත් අනුක්‍රමයෙක් මෙසේ ය. අත්ලන්තිසය, ඉජිප්තුව, රෝමය, xiv, xv, xvi වැනි ලුවී රජවරුන්ගේ කාලයේ ප්‍රංශය හා සිවිල් යුද්ධකාලීන ඇමෙරිකාව, චීනය, ඉන්දියාව, කාම්බෝජය, පීරුව,

නෝර්ස්ලන්තය, අප්‍රිකාව, මධ්‍යම ඇමෙරිකාව, සිසිලිය, ස්පාඤ්ඤය, ජපානය හා අනික් ස්ථාන ද ඇතුළත් වූ වෙනස් නිදසුන් ද තුබූ බව සත්‍යය, එහෙත් කියැවීම් වැඩි හරියක් එකම ඓතිහාසික මාර්ගයෙක ගමන් ගති.

කේසිගේ කියැවීම්වලට අනුව මෙසේ වන්නේ කිසියම් කාලයකට අයත් ආත්ම සාමාන්‍යයෙන් පසු කාලයෙක දී ද එකට උපදින නිසා ය. අතරතුර වූ ශත වර්ෂවල දී මිහිපිට සිටින්නේ තම වාරය ලබා ගත් වෙනත් ආත්ම යයි කිව හැකි ය. මේ ක්‍රියා මාර්ගය දිගින් දිගට ම මාරු වෙමින් යන්නේ කර්මාන්ත ශාලාවකට කම්කරු කණ්ඩායම් යන්නාක් මෙනි. මේ නිසා අද මෙලොව සිටින ආත්ම වැඩි හරියක්, පූර්ව ඉතිහාස යුගවලත් එකට සිට ඇත. අද පවුලේ බැඳුම්වලින් හෝ මිතුරුදම් බැඳුම් වලින් හෝ ඔවුනොවුන් කෙරෙහි වූ ඇලීම් වලින් හෝ බැඳී සිටින අය පෙර යුගවල දී ද සමාන වූ බන්ධනවලින් බැඳී සිටියහ. මේ නිසා කේසිගෙන් කියැවීම් ලැබූ බොහෝ දෙනෙක් එබඳු කිසියම් බැඳීමෙකින් පෙර දීත් බැඳී සිටි අයයි.[1]

අසන ලද තවත් ප්‍රශ්නයෙක් නම්, මේ තොරතුරු ලැබෙන්නේ කොහෙන් ද යනු ය. තොරතුරු ලැබෙන මූලාශ්‍ර දෙකක් ඇති බව පිළිතුරු වශයෙන් කියා ඇත. සම්මෝහ නිද්‍රාවේ සිටින කේසිට මේවායින් තොරතුරු ඇද ගත හැකි ය.

එක් මූලාශ්‍රයෙක් නම් ජීවිත කියැවීම අයිති පුද්ගලයාගේ යටිසිතයි.[2] කියැවීම්වලින් විස්තර කරන ලද පරිදි පුද්ගලයකුගේ අද්දැකීම් හැම එකක් ම ඔහුගේ යටි සිතෙහි තැන්පත් ව ඇත. මේ ජන්මයේ පමණක් නොවන පූර්ව ජන්මවල ද අද්දැකීම් එහි තැන්පත් ව තිබේ. මේ පෙර ආත්ම භාවයන් පිළිබඳ මතකය ඇත්තේ භවය වසා පවත්නා මහා මෝහයකට යට යයි කිව

1. ජාතක කථා ද මෙය ස්ථිර කරයි.
2. මේ අනුව හැම මිනිසකුගේ ම යටි සිතෙහි කර්ම විපාක පිළිබඳ දැනීමෙක් ඇති බව සිතා ගත හැක.

හැකි ය. මේ ස්මරණය පවතින්නේ නවීන මනෝචිකිත්සකයන්[1] විසින් අසු කර ගනු ලබන ස්මරණ පවතින යටි සිතේ ඊටත් යට තට්ටුවලට ය. එහෙත් ඒවා එහි පවතින බව සත්‍යය. යටි සිතකට උඩුසිතකට ළඟා වනවාට වඩා පහසුවෙන් තවත් යටි සිතකට ළඟා විය හැකි ය. මෙය හරියට ම නිව්යෝක් නගරයේ එක් තැනෙක සිට තවත් තැනකට බිම මතු පිටින් යනවාට වඩා යටි බිම මඟෙකින් යෑම පහසු වන්නාක් මෙනි. සම්මෝහ නිද්‍රාවේ දී කේසිගේ සිත වෙනත් සිත්වල යටි තට්ටු සමඟ කෙළින් ම සම්බන්ධ වෙයි.

මේ විවරණය පිළිගැනීම අපහසු නො වේ. මෙය, අඩු ගණනේ එක්තරා ප්‍රමාණයකට හෝ යටි සිතේ පැවැත්ම පිළිබඳ වත් එහි ඇති දේවල් පිළිබඳ වත් මනෝවිග්‍රහයෙන් [2] සොයා ගෙන ඇති කරුණු සමග ගැළපෙයි. එසේ වුවත් තොරතුරු ලැබෙන අනෙක් මූලාශ්‍රය පිළිබඳ විවරණය නම්, මහා විකාරයක් ලෙසින් පෙනිණ. එයට කියැවීම්වලින් ලැබුණු නම "ආකාශික වාර්තා" [3] යනුයි. හැම විට ම නුහුරු වචනවල දී කරන්නාක් මෙන් මෙහි දී ද නිදන කේසි ආකාශය යන නාම පදයේත් ආකාශික යන විශේෂණ පදයේත් අකුරු කියෙව්වේ ය. කේසිගේ විවරණය කෙටියෙන් මෙසේ ය.

ආකාශ යනු සංස්කෘත වචනයෙකි. මෙයින් විශ්වයේ ඊදරික (etheric) මූල ද්‍රව්‍යය අදහස් කෙරේ. මෙය විශ්වයේ හැම තැන ම පැතිර ඇතැයි ද ශබ්දයට හා ආලෝකයට ආශ්‍රය වශයෙන් පවතිනැයි ද විදුලි ශක්තියෙන් හා විඥාන ශක්තිය වැන්නෙකින් තැනී ඇතැයි ද සලකනු ලැබේ. ව්‍යක්ත විශ්වයේ ආරම්භයේ සිට වූ හැම ශබ්දයෙකත්, ආලෝකයෙකත්, චලනයෙකත්, චින්තනයෙකත්, නොමැකෙන වාර්තාවෙක් මේ ආකාශයෙහි කා වැදී ඇත. දිවැස් ඇත්තනට හා සෘෂිවරුනට

1. Psychotherapists 2. Psycho-analysis 3. Akashic Records

අතීතය දකින්නට පුළුවන් වන්නේ මේ වාර්තාව ඇති නිසා ය. ඒ අතීතය කොතරම් ඈත වුවත්, සාමාන්‍ය මනුෂ්‍ය ඥානයට ළඟා විය නොහැකි වූවත් එය කරුණෙක් නොවේ. ආකාශය සංවේදී තහඩුවක් [1] මෙන් සියලු කාවැදීම් වාර්තා කරයි. එය විශ්වයේ නිවැරදි කැමරාවෙකැයි සැලකිය හැකි ය. මේ කම්පන වාර්තා[2] කියැවීමෙ ශක්තිය අප හැම දෙනා තුළ ම සහජ ව ඇත.[3] එහෙත් එය, අපේ විඥානයේ සංවේදිතාව[4] මත රැඳී ඇත. රේඩියෝවක් සුදුසු තරංගවලට පදම් කර ගන්නාක් මෙන් විඥානය යෝග්‍ය ප්‍රමාණයට පදම් කර ගැනීමෙන් එය ලබා ගත හැකි ය. පිබිදී සිටින සාමාන්‍ය අවස්ථාවල එඩ්ගා කේසීට මේ යෝග්‍ය පදමට සරිලන්නට ඔහුගේ රූපාදී විඥානය යට පත් කර ගත නොහැකි ය. එහෙත් සම්මෝහ නිද්‍රාවේ දී ඔහුට එය කළ හැකි ය.

නිදා සිටින තම මුවින් පිට වූ හැම පුදුම කියමනකට ම වැඩියෙන් ආශ්චර්යවත් ලෙස කේසීට පෙනුණේ මේ විස්තරයයි. එහෙත් එය නො අදහා, කොතෙක් ඇසුවත් ලැබුණේ ඒ පිළිතුර ම ය. වරෙක ඒ වචනවලින්මත් වරෙක විස්තර සහිතවත් ලැබුණේ ඒ විවරණය ම ය. ආකාශික වාර්තාවලට ප්‍රකෘතියේ පොදු ස්මරණය[5] කියා ද ජීවිත පොත[6] කියා ද නම් කළ හැකි බව කියැවීම්වලින් නිතර දක්වා තිබේ. ආකාශයේ පැවැත්ම ගැන ගත වර්ෂ බොහෝ ගණනකට පෙර උගන්වන ලද බව ද කියැවීම්වලින් හෙළි කැරිණි. භෞතික ද්‍රව්‍යයේ අඝන[7] මායාවී ස්වභාවය, ද්‍රව්‍යයේ හා ශක්තියේ මාරුවීම හා සිතෙකින් සිතකට අදහස් සංක්‍රමණය වීම[8] යනාදී වූ හින්දු මත මැතෙක දී බටහිර විද්‍යාවලින් ස්ථිර කොට ඇත. ඒ නිසා තවත් හින්දු සංකල්පයක්

1. Sensitive Plate
2. Vibratory Records
3. මෙය ඇතැම් භාරතීය දර්ශනයන්හි ද එන මතයෙකි.
4. Sensitivity
5. The Universal Memory of Nature
6. The Book of Life
7. Non-solid
8. Thought Transference

වන ආකාශය පිළිබඳවත් අඩු තරමින් විවෘත මනසක් වත් තබා ගැනීම සුදුසු නො වේ ද ?

කේසි දිගු කලක් යන තාක් මේ ගැන විනිශ්චයක් කෙළේ නැත. පුද්ගලයන්ගේ අතීත ජන්ම ඉතිහාස පිළිබඳ ව නම් යටි සිතේ විවරණය ගැළපෙන බව සිතා ගත හැකි ය. එහෙත් අත්ලන්තිසය, ඊජිප්තුව හා ජේසුස්ගේ කාලය වැනි අතීත ඉතිහාස යුගයන් පිළිබඳ ව පරීක්ෂණ කියැවීම්වලින් නිතර ලැබුණු විස්තරාත්මක තොරතුරු ආවේ කෙසේ ද? මේ තොරතුරු කියැවීමට එළිපිට ලක් නො වූ එකල ජීවත් වූ කිසියම් පුද්ගලයකුගේ යටි සිතෙන් ඇද ගනු ලැබුවා ද ? එසේ නැතිනම් කේසි විශ්වයේ කිසියම් තුනී වූ තහඩුවෙක ආරක්ෂා වී ඇති ඉතිහාස වාර්තාවක් කියැවූවා ද ?

අන්තිමේ දී කේසි ආකාශයත් පිළිගත්තේ ය. එසේ පිළිගත්තේ එය ඔප්පු කරන නිශ්චිත සාධකයක් තුබූ නිසා නොව, ඔප්පු කළ හැකි හැම කරුණෙක දී ම සත්‍ය වූ කියැවීම්වලින් නිතර නිතර ඒ ගැන කියන ලද නිසා ය.

ඇතැම් විට, අතීන්ද්‍රය ප්‍රත්‍යක්ෂයේ[1] පිළිබඳ ව පරීක්ෂා කරන්නන් විසින් අනාගතයේ දී මේ කරුණෙහි දී කේසිගේ තොරතුරු වැරැදී ගොස් ඇති බව පෙන්වනවා ඇත. සමහර විට ඔහු ගේ අතීත සිද්ධි ඥානය පිළිබඳ වෙනත් විවරණයක් ද ලැබෙන්නට ඉඩ තිබේ. අනික් අතට අපේ කාලයේ ම කිසියම් විද්‍යාඥයකු විසින් ආකාශය සත්‍ය වශයෙන් ම පවතී යයි පෙන්වා දෙනු ඇත. රේඩියෝ තරංග[2] රේඩියම්[3] පරමාණුක ශක්ති[4] හා මනුෂ්‍ය ස්නායු පද්ධතියේ ස්මෘති කාවැදවීම්[5] යන අදහස් අද

1. Extrasensory Perception
2. Radio waves
3. Radium
4. Atomic energy
5. The memory engraves of the human nervous system

අපට අරුම නොවේ. එසේ නම් ආකාශය පිළිබඳ අදහස ද අරුමයක් නොවිය යුතු ය.

කේසි විසින් කරන ලද ජීවිත කියැවීම්වල අන්තිම මූලාශ්‍රය කුමක් වූවත් ඔහු ඒ කියැවීම් කළ බවත් ඒවා සත්‍ය වී ඇති බවත් සත්‍ය වූම සිද්ධිය වශයෙන් ජීවිත කියැවීම් ගැන දැන ගන්නට ලැබුණු 1923 වර්ෂය හා කේසිගේ මරණය සිදු වූ 1945 වර්ෂය අතර වූ විසි අවුරුද්ද තුළ කේසි ජීවිත කියැවීම් 25,000 ක් පමණ කර තිබේ. කායික, කියැවීම්, මෙන් මේවාත් විස්තරත් සහිත ව හොඳින් ආරක්ෂා කොට ඇත. මෙබඳු කියැවීම්වල සත්‍යතාව, දත හැක්කේ යම් පමණකට නම්, එපමණකට ම මේ කියැවීම් බොහොමයෙක සත්‍යතාවට සාක්කි කියන ලියුම් හා වෙනත් ලේඛන ද ඇත. කැමැති ගවේෂකයකුට කියවීම් ලැබූවන්ගෙන් බොහෝ දෙනකු තවමත් හමු වී සාකච්ඡා කළ හැකි ය.

අපටත් කේසිට මෙන් අන්තිමේ දී මේ පුදුම ලේඛනවල සත්‍යතාවත් ඒවායින් ඉදිරිපත් කෙරෙන මනුෂ්‍ය ගතිය පිළිබඳ විවරණයත් ඇදහිය හැකි නම්, අසාමාන්‍ය තොරතුරු රාශියෙක් අප සතු ව ඇත. පළමු කොට ම පුනර්ජන්මය යයි කියනු ලබන විප්ලවකාරී මතයට පක්ෂ වූ වැදගත් සාක්කි සමූහයෙක් අපට ඇත. අපට මේ සාක්කි සම්පූර්ණයෙන් තීරණාත්මක යයි පිළිගත නොහැකි වූවත්, අඩු ගණනේ ඒවායින් පෙන්වනු ලබන කල්පනා ක්ෂේත්‍රයට, විද්‍යා ප්‍රබුද්ධත්වයේ නාමයෙන් අවධානය වත් යොමු කිරීම සුදුසු ය. සිතන්නට වත් බැරි තැන් පරීක්ෂා කිරීමෙන් විශාල සොයා ගැනීම් කර තිබේ. අයින්ස්ටයින්ගෙන් සාපේක්ෂතාව සොයා ගත්තේ කෙසේ දැයි ඇසූ විට ඔහු දුන් උත්තරය, "සිද්ධාන්තයකට අභියෝග කිරීමෙන් ය." යනු ය. දෙවැනි ව අපට මේ කියැවීම්වලින් මනෝවිද්‍යාත්මක වූ ද වෛද්‍ය ශාස්ත්‍රීය වූ ද දාර්ශනික වූ ද ස්වභාවයක් ඇති තොරතුරු රාශියක් ලැබී තිබේ. මේවා වර්ග කොට, විග්‍රහ කළ කල්හි,

මනුෂ්‍යයාගේ ස්වභාවය හා නිශ්ඨාව පිළිබඳ ව, අමුතු ම සිතුවමෙක් ලැබේ.

ඒ අවුරුදු විසි දෙක තිස්සේ ම සම්මෝහ නිද්‍රෝපගත කේසිගේ ගැඹුරු දිව්‍යඥාන දර්ශනය ඉදිරි පිටින් දුක් විඳින, වල්මත් වූ, මිනිස් පෙරහරෙක් ගමන් කෙළේ ය. මේ මිනිස්සු කායික වූ ද, මානසික වූ ද නන් වැදෑරුම් දුක්වලින් පෙළෙමින් සිටියහ. නො වැටැහීමේ දුක් වේදනාවෙන් කෑගැසූ ස්තෝත්‍රකාරයාට [1] මෙන් ඔවුනට ද දැන ගන්නට අවශ්‍ය වූයේ "මට මෙය සිදු වූයේ කවර හෙයින් ද ?" යනු ය.

මේ හැම දෙන ම එක සේ බලාපොරොත්තු රහිත දුඃඛිත තත්ත්වයෙන් සිටියේ නැත. මේ බොහෝ දෙනකුන්ගේ අතීත ජීවිත අද ඔවුන් ගත කරන සාමාන්‍ය ජීවිතවලට වඩා විසිතුරු වී නැත. ඔවුන්ගේ තත්ත්වය මෘදු වුවත් උග්‍ර වුවත් හැම තැනෙක දී ම මේ වර්තමාන තත්ත්වය ගත වර්ෂ ගණනාවකට පෙර දී ආරම්භ වූ සිද්ධි පරම්පරාවෙක පුරුකක් බව පෙන්වන ලදී. හැම සිද්ධියෙක දී ම මිනිසුන්ගේ රෝගවලත් ප්‍රාර්ථනා බිඳීම්වලත් තුබූ ලෝක සම්බන්ධතා පෙන්වා දී ඇත. මේ ඥානයේ ප්‍රතිඵල වශයෙන් ඔවුන් ගේ ජීවිත වෙනස් විය. මේ ජීවිතයට පමණක් සීමා නොවී අතීත ජීවිත දෙස බැලූ විට ඔවුනට යම් යම් දේ සිදු වී ඇත්තේ ඔවුන් ඒවාට සුදුසු නිසා ම බව ඔවුනට දත හැකි විය. මේ ගැඹුරු දැනීම නිසා ඔවුන්ගේ විෂය හැසිරීම සම කර ගත හැකි විය.

මේ කියැවීම්වල සත්‍යතාව පිළිගත හැකි නම්, ඒවායේ ගැබ්ව ඇති මත ගැන ද සලකා බැලිය යුතු වේ. සත්තෙකින් ම ඒවායේ වටිනාකම රැඳී ඇත්තේ, ඒවායින් ලෝකයට නව වාදයක් ඉදිරිපත් කිරීමෙහි නො වේ. මේ වාදය මත් පුරාතන වූවෙකි. ලෝකයේ හැම මහාද්වීපයෙක ම සිටින, බෙහෙවින් වෙන් ව

1. Psalmist

වාසය කරන, මනුෂ්‍යයන් අතර මේ මතය දක්නට ලැබේ. කේසි කියැවීම්වල වටිනාකම රැඳී ඇත්තේ කරුණු දෙකක් මත ය. මින් පළමු වැන්න බටහිර ලෝකයේ පළමු වරට සිදු වූවෙකි. එනම්, මේ කියැවීම් වලින් බොහෝ පුද්ගලයන්ගේ පිළිගත හැකි අතීත ජීවිත පිළිබඳ ව නිශ්චිත වූ ද, ගැළපෙන්නා වූ ද, මනෝවිද්‍යාත්මක වශයෙන් ඇදහිය හැක්කා වූ ද විස්තර දී තිබීමයි. දෙවැන්න නම්, දැන ගන්නට ඇති මුළු ලෝක ඉතිහාසයෙහි ම, පළමු වරට සාමාන්‍ය මහජනයාට ප්‍රයෝජන ගත හැකි පරිදි වාර්තා ස්වරූපයෙන් මේ විස්තර ආරක්ෂා කොට තිබීමයි.

තවද කේසි කියැවීම්වලින්, පෙරදිග දර්ශනය, ක්‍රියාකාරී ක්‍රිස්තියානි ජීවිතය සමග ගළපාලනු ලැබේ. මෙයින් මේ දෙකටම නව ප්‍රාණයෙක් ලැබේ. මෙසේ අතිශයින් අවශ්‍ය ව තුබූ අන්තර්නත (ඇතුළට නැමුණු) හා බහිර්නත (පිටතට නැමුණු) යන ආකල්ප දෙකේ එක් කිරීමක් සිදුකර තිබේ. දීර්ඝ කාලයක් තිස්සේ පෙරදිග අන්තර්නත ද බටහිර බහිර්නත ද වී තිබිණි.

මේ හැමට ම වැඩියෙන් කේසි කියැවීම්වලින්, විද්‍යාව හා ආගම ගළපා ලීම ඉතා වැදගත් ය. මේ කියැවීම්වලින් එය කෙරෙන්නේ, ආචාර ලෝකය ද භෞතික ලෝකය පාලනය කරන්නා වූ හේතුඵලනියාමවලට ම සමාන වූ නියාමවලින් පාලනය වන බව දැක්වීමෙනි. මිනිසුන්ගේ දුක් ඇති වන්නේ අහේතුක භෞතික සිදුවීම් නිසා නො ව චරිතයේ හා සිතීමේ වැරැදි නිසා බව මෙවායින් පැහැදිලි කෙරෙයි. මනුෂ්‍යයන්ගේ උප්පත්තියේ හා දක්ෂතාවේ වෙනස් කම් ඇති වන්නේ හිතුවක්කාර මැවුම්කරුවකු නිසා හෝ පාරම්පර්යයේ අන්ධ යාන්ත්‍රිකත්වය[1] නිසා හෝ නොව අතීත ජන්මයන්හි කරන ලද

1. Blind mechanism of heredity

පින් පව් නිසා ය [1] හැම දුකෙකත් බාධාවෙකත් ඉගැන්වීමේ පරමාර්ථයෙක් ඇත. විකෘති හා පීඩා ඇති වන්නේ දුරාචාරය නිසා ය. මිනිසුන්ගේ සියලු දුක් වේදනා ප්‍රඥාව හා පාරිශුද්ධිය සඳහා වූ දීර්ඝ කාලීන පාඨමාලාවක් ඇති පාඨශාලාවෙක උගන්වනු ලබන පාඩම් ය. [2]

1. කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතාය (= කර්මය සත්ත්වයන් උසස් පහත් වශයෙන් බෙදයි.)
2. ධූමිය අභිගෙදයය.

# 4

# කායික කර්ම විපාක වර්ග සමහරෙක්

**කො**රා, බිහිරා, විකෘතයා, අන්ධයා හා අසාධ්‍ය රෝගියා යන මොවුන්, මිනිස් දුක් ඉතා හොඳින් පැහැදිලි කරන නිදසුන් විය හැකි ය. අනෙකකුගේ එබඳු ආබාධයක් දුටු විට අපි, හද පතුලින් ම අනුකම්පා කරමු. අපට ම එබඳු දුකක් විඳින්නට වූ විටත් එහි ඇති දුර්විපාක දැනී ගිය විටත් දෙවියන් වහන්සේ මිනිසාට සලකන ආකාරය ගැන, අපි ඉතා දරුණු ලෙස ප්‍රශ්න කරන්නට පටන් ගනිමු. මෙය මට සිදු වූයේ කවර හෙයින් දැයි පැමිණිලි කරන ස්වභාවයෙන් අපි අසමු. මට එය සිදු වූයේ කුමක් නිසා ද ?

ජොබ්[1] බෙහෙවින් ම සදාචාර සම්පන්න ඉවසිලිමත් මිනිසුන්ගෙන් එකකු ලෙස ප්‍රසිද්ධ ය. ඔහුගේ සියලු ලෞකික සම්පත් නැති වී ගියේ ය. ඔහුගේ දරුවෝ ද නැති වී ගියහ. එහෙත් හේ ඒ සියලු දුක් වේදනා කිසි ම පැමිණිල්ලක් නැති ව විඳ දරා ගත්තේ ය. එහෙත් අවසාන පරීක්ෂණයක් වශයෙන්,

1. පුරාතන යුදෙව් කුලදෙටුවෙකි. බයිබලයේ එක් පරිච්ඡේදයක් මොහු පිළිබඳ කථාන්තරයට කැප වෙයි.

යක්ෂයා ඔහුගේ සිරුරේ පිළිකුල් කටයුතු ගෙඩි වගයක් මතු කළ විට, ජොබ් ප්‍රථම වරට දෙවියන් වහන්සේට ශාප කෙළේ ය. ප්‍රථම වරට බලාපොරොත්තු සුන් කර ගෙන ඔහුගේ ආබාධයේ හේතුව කෑ ගසා ඇසුවේ ය. "මට උගන්වන්න. මම නිශ්ශබ්ද වන්නම්, මා වැරැදි කර ඇති තැන මට තේරුම් කර දෙන්න" යනුවෙන් ඔහු කෑ ගසා ඇසුවේ ය.

දුක් විඳීමට සිදු වන්නේ කිසියම් වැරැදි ක්‍රියාවක් නිසා ය යන මතය කාලයට නො ගැළපෙන ආගම්වල ඇති මිථ්‍යා ලබ්ධියෙකැයි සලකා නවීන මිනිසා විසින් ඉවත දමා තිබේ. දුක් විඳීම ගැන "පාපයට" සම්බන්ධ කර සිතන්නට කැමැති අය අද සිටින්නේ ඉතා ටික දෙනෙකි.

එහෙත් පාපයේ ආරම්භය අපට නො පෙනී තිබිය හැකි නමුත් කේසි කියැවීම්වල මතයට අනුව පාපයත් දුකත් නියම හේතුඵල සම්බන්ධතාවෙකින් බැඳී පවතී.

කේසිගේ කියැවීම්වලට පදනම් වී ඇති මේ අදහස තේරුම් ගැනීමට කර්ම යන වචනයේ අදහස වටහා ගත යුතු ය. එසේ කියන්නේ පවේ හා දුකේ ඇති හේතුඵල සම්බන්ධතාව ප්‍රකාශ කරන එක ම වචනය එය නිසා ය. කර්ම යනු සංස්කෘත වචනයෙකි. එහි හුදු වාච්‍යාර්ථය 'කිරීම' යනු ය. එහෙත් එය දාර්ශනික චින්තනයෙහි දී හේතුඵල දෙක, නැතහොත් 'ක්‍රියා ප්‍රතික්‍රියා', දෙක පිළිබඳ නියාම ධර්මය, අදහස් කරන්නට වී තිබේ. සියලු මිනිස් හැසිරීම් මේ නියාම ධර්මයට යටත් ය. භාරතීය බ්‍රාහ්මණ දර්ශනයේ ගැඹුරට ගිය එමර්සන්, මේ සංකල්පය ගැන සඳහන් කෙළේ වන්දි ගෙවීමේ නියාම ධර්මය කියා ය. "මිනිසා තමා වපුළ ලෙසින් ම පල ද නෙළා ගන්නේය."[1] යි කී ක්‍රිස්තුස් වහන්සේ ද එය හරියට ම සංග්‍රහ කළහ. "හැම ක්‍රියාවකට ම සම වූ ද ප්‍රතියෝගී වූ ද ප්‍රතික්‍රියාවෙක්

1. යාදිසං වපතෙ බීජං තාදිසං හරතේ ඵලං

ඇත්තේ ය." යන නිව්ටන්ගේ තුන්වන චලන නියාම ධර්මය භෞතික ලෝකයට අදාළ වන තරමට ම සදාචාර ලෝකයට ද අදාළ වේ.

කේසිගේ ජීවිත කියැවීම් සිත් ඇලවනසුලු වන්නේ ඒවායින් මිනිසුන්ගේ වර්තමාන ජීවිතයේ ඇති පීඩා හා බාධක අතීතයේ සිදු වූ නිශ්චිත ක්‍රියාවකට සම්බන්ධ කොට, දුරවබෝධ වූ සාමාන්‍ය කර්ම නියාමය පහසුවෙන් තේරුම් ගත හැක්කක් කෙරෙන නිසාය. මේ නිදසුන්, සියුම් ව පරීක්ෂා කිරීමේ දී, විවිධ කර්ම වර්ග ඇති බව පෙනී යයි. එක් කර්ම වර්ගයක් "බූමරංග කර්ම" යයි නම් කළ හැකි ය. එසේ කියන්නේ, මේ කර්ම වර්ගය, විසි කළ තැනැත්තා ළඟට ම කරකැවී එන බූමරංගය මෙන් වන හෙයිනි. බූමරංග නම් ඕස්ට්‍රේලියානු ජාතිකයන් විසින් ආයුධයක් වශයෙන් භාවිත කරනු ලබන වක්‍ර දණ්ඩෙකි. අනෙකකු දෙසට එල්ල කරන ලද හිංසාකාරී කර්මය ද කරකැවී එය කළ තැනැත්තා දෙසට ම එයි.[1]

මේ කර්ම වර්ගයේ බොහෝ නිදසුන්, කේසි ලිපි ගොනුවල ඇත. එක් නිදසුනෙක් මෙසේ ය. සම්පූර්ණයෙන් ම අන්ධව උපන් එක් විද්‍යාලයීය ශිල්පියකුට 'මනසේ ප්‍රාතිහාර්ය' නම් වූ ගුවන් විදුලි වැඩ සටහනෙකින් කේසි ගැන අසන්නට ලැබුණේය. ඔහු කායික කියැවීමක් ඉල්ලා සිටියේ ය. කේසිගේ උපදෙස් අනුගමනය කිරීමෙන් තමාගේ සෞඛ්‍යයේත්, පෙනීමේත් පැහැදිලි දියුණුවක් ඇති වූ බව දැනී ගියේ ය. ඒ උපදෙස්වලට අස්ථි චිකිත්සනය[2], විද්‍යුත් චිකිත්සනය[3] හා ආහාර පරිවර්තනයෙක් ද ඇතුළත් විය. තුන් මසක් ඇතුළත දී ඔහුගේ වම් ඇසේ සියේට දහයෙක පමණ පෙනීමෙක් ඇති විය.

1. "අනුන්ට කළ දේ තමන්ට පල දේ"
2. Osteopathy (= ඇට වෙදකම, ගස් වෙදකම, උරුක්කු ඇදීම ආදිය)
3. Electrical treatments

අක්ෂිවිශේෂඥයන් විසින් මේ ඇස බලාපොරොත්තු රහිත යයි සලකා තිබිණ. ඔහුගේ ජීවිත කියැවීමේ දී අතීත ජන්ම සතරෙක් දක්වන ලදි. එකෙක් සිවිල් යුද්ධ කාලයේ ඇමෙරිකාවේ ය. එකෙක් කුරුස යුද්ධ[1] කාලයේ ප්‍රංශයේ ය. එකෙක් ක්‍රි. පූ. 1000 දී පමණ පර්සියාවේ ය. අනෙක අන්තිම වරට ගිලෙන්නට කලින් අත්ලාන්තිසයේ ය.

ඔහුගේ වර්තමාන අන්ධ භාවයට හේතු වූ කර්මය කරන ලද්දේ පර්සියාවේ දී ය. හේ එක් වනචාරී ගෝත්‍රයෙක සාමාජිකයෙක් විය. රත් කළ යකඩ කූරුවලින් සතුරන්ගේ ඇස් අන්ධ කිරීම ඒ ගෝත්‍රයේ චාරිත්‍රයයි. මොහුගේ රාජකාරිය වූයේ සතුරන් අන්ධ කිරීමයි.

මෙහි දී අනිවාර්යයෙන් පැන නගින ප්‍රශ්නයෙක් ඇත. එනම් පුද්ගලයකු ජීවත් වන සමාජයේ චාරිත්‍රවලින් ඔහුට නියම කරන ලද යුතු කමක් ඉටු කරන ලද තැනැත්තා කර්ම නියාමයට අනුව එකී කර්මයට වගකිව යුතු වන්නේ කෙසේ ද යනු ය. මෙය හොඳට ම ගැළැපෙන ප්‍රශ්නයෙකි. 23 වැනි පරිච්ඡේදයේ දී ඒ ගැන සවිස්තර ව විමසනු ලැබේ.

සැලකිල්ලට ගත යුතු දෙවන නිදර්ශනය ජීවිත වෘත්තිය වශයෙන් කර ප්‍රසාධනය (අත් හා නිය අලංකාර කිරීම) කළ තරුණියක[2] පිළිබඳ කථාවෙකි. වයස අවුරුද්දේ දී ඇට බාලක පක්ෂඝාත රෝගය වැළැඳිණි. ඇගේ කකුල් දෙක ම කොර විය. පතුල් දෙක ම ප්‍රමාණයෙන් කුඩා ව සිටියේ ය. මේ නිසා ඇට කිහිලිකරුත් උරහිස් බන්ධනත් [3] භාවිත කරන්නට සිදු විය.

ඇගේ වර්තමාන තත්ත්වයේ කර්ම හේතුව අත්ලන්තියානු පූර්ව ජන්මයකට සම්බන්ධ කොට තිබේ. මෙහි දී ඕ කිසියම්

1. කුරුස යුද්ධ නම් ක්‍රිස්තුස් වහන්සේගේ ජන්ම භූමිය මහම්මදිකයන්ගෙන් බේරා ගැනීමට කරන ලද යුද්ධය
2. Manicurist
3. Braces

ක්‍රමයකින් - ඖෂධයෙන්, සම්මෝහ නිද්‍රාවෙන් නැතහොත් පරචිත්ත ඥානයෙන් දූයි කියැවීම්වලින් නිශ්චය කර තැන මිනිසුන් "අංග දුර්වලයන් කළා ය; අනුගමනය කරනවාට වැඩි දෙයක් කරන්නට බැරියවුන් කළා ය. මෙසේ මේ තැනැත්තිට ඇ අන්‍යයනට කළ දේ ම සිදු වී තිබෙන බව අපට පේනවා." (මෙහි තැනැත්තී යයි යෙදූ තැන කේසි යොදා ඇත්තේ 'Entity' යන වචනයයි. කේසි කියැවීම්වල 'එන්ටිටි' යන්න යොදා ඇත්තේ අමරණීය ආත්මයට ය. පාරිශුද්ධියට යන මාර්ගයේ දී අත්දැකීම් ලැබීම සඳහා මේ ආත්මය නැවත ශරීර සහිතව උපදී.)

බූමරංග කර්මය පිළිබඳ සිත් ගන්නා තුන්වන නිදර්ශනය හතළිස් හැවිරිදි ස්ත්‍රියක පිළිබඳ සිද්ධියෙකි. ඇට තුබූ රෝග ලක්ෂණ කොටසක් ඉතා මෑතෙක දී ඇලර්ජීස් (අපථ්‍යතාව)[1] නම් රෝගයේ ලක්ෂණ වශයෙන් හඳුනා ගෙන තිබේ. මේ රෝගයේ දී යම් යම් දේ නුරුස්නා ගතිය ඇති වේ. ඇතැම් ආහාර ප්‍රධාන වශයෙන් පාන් හා සියලු ධාන්‍ය වර්ග කෑ විට ශරත් පීනස් රෝගියකුට [2] මෙන් ඇට නිතර කිවිසුම් යයි. සමහර ද්‍රව්‍යය ප්‍රධාන වශයෙන් සපත්තු හම් හා වීදුරුවල ප්ලාස්ටික් ගැටී ස්පර්ශ වූ විට ඇගේ වම් පැත්තේ තද නහර රුජාවෙක් ඇති වෙයි. ඕ අවුරුදු ගණනාවක් වෛද්‍යවරුන් රාශියකගෙන් උපදෙස් ගත්තා ය. ඈ කී අන්දමට ඇට ලැබුණු එකම සහනය වූයේ වයස විසිපහේ දී සම්මෝහ නිද්‍රා වේදකමෙකිනි. සුවය පැවැතුණේ අවුරුදු හයෙකි. නැවත ක්‍රමයෙන් රෝග ලක්ෂණ පෙරළා පැමිණියේ ය.

මේ ස්ත්‍රිය කියැවීමක් ලබා ගත්තේ සුවයක් ලබා ගැනීම සඳහා ය. එහෙත් කේසි කියැවීමෙහි, ඒ රෝගයේ කර්ම හේතුව ද ඇතුළත් විය. "වෙනත් ජන්මයෙක දී මේ ආත්මය රස බෙහෙත් කාරයෙක්. [3] මේ ද්‍රව්‍ය අන්‍යයනට කැසීම් ඇති කිරීමට යොදා

1. Allergies 2. A Victim of Hay Fever
3. Chemist

තිබෙනවා. ඒ නිසා දැන්, ඒක ඇට ම සිදු වී තිබෙනවා. මේ ආත්මය අන්‍යයනට ආශ්වාසය ම විස වන්නට ඇතැම් ද්‍රව්‍ය යොදා තිබෙනවා. ඒ විදියට ම දැන් මේ ආත්මයට ඇතැම් ලෝහ, ප්ලාස්ටික්, ගන්ධ වර්ග හා සම් ආදී ඇතැම් ද්‍රව්‍ය ළංවන විට ම ආශ්වාසය විස වෙනවා. ගම් සම් ඕක් ලීයෙන් පදම් කළොත් ශරීරයට හානියක් වන්නේ නෑ. ඒවා මේ ආත්මය කලින් අන්‍යයනට හිංසා කිරීමට යෙදූ දේවලින් පදම් කළොත් ශරීරයට හානි වනවා."

කායික විපාක දෙන කර්ම ගණයට අයත් වන දෙවන කර්ම වර්ගයක් ඓන්ද්‍රිය කර්මය යයි නම් කළ හැකි ය. මේ කර්ම සිදු වන්නේ ඉන්ද්‍රිය පද්ධතිය නො මනා ව භාවිත කිරීමෙනි.[1] මෙහි ආදීනවය වන්නේ පසු ජන්මයෙක දී ඉන්ද්‍රිය පද්ධතියෙන් හට ගන්නා වූ දුර්විපාකයක් ඇතිවීමයි. කුඩා කාලයේ සිට කෑම නො දිරවීමේ දුර්වලතාවෙන් පෙළුණු වයස තිස් පහෙක මිනිසාගේ රෝගය මීට හොඳ නිදසුනෙකි. ඔහුට ආහාර සංයෝග කීපයකට සීමා වීමට සිදු විය. මෙතරම් ආරක්ෂා වීත් කෑම වේලක් දිරවා ගැනීමට පැය බොහෝ ගණනෙක් අවශ්‍ය විය. රෝගය පිළිබඳ හැඟීම් නිසා ඔහුට අපහසුකම් හා සමාජ දුෂ්කරතා ද ඇති විය.

කේසි කියැවීම්වලින්, මේ ශක්ති හීනත්වයේ මුල, ප්‍රංශයේ xiii වැනි ලුවී රජුගේ මාලිගයේ වූ පූර්ව ජන්මයකට පවරා දී ඇත. එහි දී හේ රජුගේ ආරක්ෂක පරිවාරකයෙක් විය. සළු වඩන නිලමේ ද ඔහු ය. හේ භක්තිමත් ව හොඳින් තම යුතුකම් ඉටු කළේ ය. එහෙත් ඔහුට එක් මහත් දුර්වලතාවෙක් විය. මේ දුර්වලතාව නම් කෑදර කමයි. පර්සියාවේ රාජ වෛද්‍යවරයකු වූ පූර්ව ජන්මයෙක දී ද ඔහු ආහාර තෘෂ්ණාවට ගැති වී සිටියේය. මෙසේ ආත්ම දෙකක දී පමණ ඉක්මවීමේ පාපය කර තිබුණේය.

1. මෙයින් ද ඉන්ද්‍රිය සංවර සීලය අවශ්‍ය බව පෙනේ.

මේ අසමබර බව කෙසේ හෝ සම කළ යුතු විය. මෙසේ කලින් ඇති වූ අසංවරයක් නිසා ඔහුට මේ ආත්මභාවයේ දී අල්ප වූ ආහාරයක් ගන්නට සිදු විය.

කේසි කියැවීම්වල නිතර හමුවන කායික විපාක ඇති තුන්වන කර්ම වර්ගයට "සංකේත කර්මය" යන නම දිය හැකි ය. කායික විපාක දෙන කර්ම අතරත් මේ කර්ම වර්ගය බොහෙවින් ම සිත් ගන්නාසුලු, විස්මය ජනක කර්ම වර්ගය විය හැකි ය.[1]

මුල් කාලයේ ම කරන ලද එක් ජීවිත කියැවීමෙක් කුඩා කල සිට ලේ අඩුකමින් පෙළුණු තරුණයකු පිළිබඳව ය. ඔහුගේ පියා වෛද්‍යවරයෙකි. ළමයාට දන්නා හැම ප්‍රතිකාරයක් ම කරන ලදි. කිසි ම පලක් වූයේ නැත. කොහෙත් ම බෙහෙත් අහන්නේ නැති නම්, එය මුල් බැස ගත් කර්ම හේතුවක් ඇති බවට හොඳ ම සලකුණෙකි. ජීවිත කියැවීමෙන් මේ තත්ත්වයේ හේතුව, පීරු රටේ සිදු වූ අතීත ජන්මයකට ගෙන යන ලදී. ආත්මභාව පහකට පෙර මේ පුද්ගලයා කෲර ලෙස ඒ රටේ බලය අල්ලා ගෙන එහි පාලකයා විය. "බොහෝ ලේ හලන ලදී. මේ ආත්මයේ ලේ අඩුකම ඒ නිසා ය."

මේ පාඨයේ වැදගත්කම අපට සම්පූර්ණයෙන් පැහැදිලි වන්නේ කායික විපාක ඇති අනෙක් කර්ම නිදසුන් සමග මේ නිදසුන සැසඳූ විට ය. එය පැහැදිලි ලෙස ම ඓන්ද්‍රිය කර්ම පිළිබඳ නිදසුනෙක් නොවේ. එසේ කියන්නේ මෙහි දී පමණ ඉක්මවීමෙකින් මිනිසාගේ ශරීරය තරකට යොදවා නැති නිසාය. හරියට ම කියනවා නම් එය බූමරංග කර්ම පිළිබඳ නිදසුනෙක් නොවේ. එසේ වූවා නම් මේ තරුණයා යුද්ධයෙක දී කිසියම් කෲර ජයග්‍රාහකයකුගේ මනුෂ්‍ය සංහාරයකට ගොදුරක් විය

1. මේ කර්ම වර්ගය "සරික්ඛතා කම්ම" යනුවෙන් හඳුන්වා දිය හැකි ය. ලක්ඛණසුත්ත වණ්ණනාවෙහි ඒ කර්ම වර්ගය ගැන විස්තර ඇත.

යුතුය. හිට්ලර්ගේ සේනාවන් විසින් ලේ හෙළන ලද පෝලන්ත කොල්ලකු වූවා නම් අන්න හරි.

ඒ වෙනුවට ඔහුගේ ශරීරය ම වධක භූමිය වී ඇති බව අපට පෙනේ. අපරාධයට යෝග්‍ය විපාක විඳීම සඳහා ඔහුගේ ශරීරය ම භූමිය විය. මේ යාවජීවක කායික දුර්වලතාව, දිගු කලක් තිස්සේ ඉගැන්වීම පරමාර්ථ කොට ගත්, යුක්තිය ඉටු කර දීමේ කර්ම විපාකයෙකි.[1] යුද බිමෙක දී ලේ හැලී මැරෙන්නට සිදු වූවා නම් වැඩි කාලයක් ඉගෙන ගන්නට දෙයෙක් නැත. වරක් මේ පුද්ගලයා මනුෂ්‍ය වර්ගයෙක ලේ හැලුවේ ය. ඔවුනට මොහු දක්වූයේ ජයග්‍රාහකයකුගේ අවඥාවයි. දැන් ඔහු ඔහුගේම ලේ නහර දුර්වලතාවෙන් දුර්වලයකු වී ඇත. මෙසේ ඔහුගේ ශරීරයේ එක් කොටසක් ඒ කර්මය සංකේත වශයෙන් පවරා ගෙන ඇත.

චිත්ත කායික වෛද්‍ය ක්‍රමයේ සොයා ගැනීම්[2] අප මේ සඳහා පිළියෙළ කොට නොතැබුවා නම් මෙය පෙනෙන්නට තිබුණේ මහ විකාර අදහසක් ලෙස ය. සියලු රෝග කායික හේතු නිසා ඇති වෙතැයි ඇදහූ කාලය ඉතා ඈත නොවේ. අඩු ගණනේ කායික තත්ත්වයන්ගෙන් සමහරක්වත් මානසික හා භාවික (= හැඟීම් පිළිබඳ) කැලඹිලි නිසා ඇති වන බව මානසික වෛද්‍ය විද්‍යාවේ[3] දියුණුව නිසා අපට දැන ගත හැකි වී තිබේ. චිත්ත කායික වෛද්‍ය ක්‍රමය වෙන් වී ගියේ මේ සොයා ගැනීම් නිසා ය. අලුත් නමුත්, මේ වෙදකම් ක්‍රමය, වෛද්‍ය ශාස්ත්‍ර විෂයෙහි සම්පූර්ණයෙන් පිළිගන්නා ලද සංවර්ධනයක් වී තිබේ. (චිත්ත කායික වෛද්‍යක්‍රමය සඳහා භාවිත වන්නේ 'Psychosomatic medicine' යන්නය. Psychosomatic' යන්න හැනී ඇත්තේ

1. පව්කම්වලට දුක් විපාක ලැබෙන්නේ ඉගැන්වීම සඳහා ය. යන අදහස කෝසි නොයෙක් වර කියා ඇත. දේවදූත සූත්‍රයෙන් මේ අදහස හඟාගත හැකි ය.
2. The Clinical Findings of the Psychosomatic Medicine.
3. Psychiatry.

ග්‍රීක වචන දෙකෙක එකතුවෙනි. 'Psyche' නම් ආත්මයයි. 'soma' නම් ශරීරයයි.)

භාවිකෝත්පත්තියක් ඇති [1] ආතති [2], වචනයෙන් හෝ ක්‍රියාවෙන් පිට වීමට ඉඩ නො ලැබූ කල්හි 'ඉන්ද්‍රිය භාෂා' වර්ගයෙක මාර්ගයෙන් පිටවන බව රෝහල්වල කෙරෙන චිත්ත කායික වෛද්‍ය ක්‍රමයෙන් පෙන්වා දී ඇත. මේ විෂයය පිළිබඳ ප්‍රාමාණික පාඨ ග්‍රන්ථය වන 'Psychosomatic Medicine' නම් ග්‍රන්ථයේ කතුවරුන් වන වෛස් [3] හා එංගලිෂ් [4] මෙසේ කියති. "නිදසුනක් වශයෙන් ආතුරයකුට හොඳින් ගිලින්නට බැරි නම්, එසේ ඉන්ද්‍රියවල දෝෂයකුත් සොයා ගත නො හැකි නම් ආතුරයාගේ ජීවිත තත්ත්වයෙහි ගිල ගන්නට බැරි යම් කිසිවෙක් ඇත. ඉන්ද්‍රිය රෝගයක් නැති කල්හි, ඇතිවන බඩ දූගලීමෙන් ඇතැම් විටෙක අදහස් කෙරෙන්නේ ආතුරයාට කිසි යම් පරිසරගත තත්ත්වයක් 'දිරවා ගත නොහැකි බවය....' බඩගින්න නැති වී යෑමේ ප්‍රතිඵල වශයෙන් මන්ද පෝෂණයෙන් යුක්ත ආතුරයා බොහෝ විට කායික වශයෙන් මෙන්ම මානසික වශයෙන් ද හාමතේ සිටියෙකි. පරිසරගත තත්වය නරක් වූ කල්හි යම් ඉන්ද්‍රියයෙක කාර්යය උත්සන්න වී සිතෙහි වේදනාවක් (ආකාංක්ෂාවක්) ඉපද වූවා ද, බොහෝ විට 'කථා කරන්නේ' ඒ ඉන්ද්‍රියය. එහෙත් කලින් රෝගී වී තිබීම, මාපියන්ගේ ආරයට යෑම හා වෙනත් සාධක ද ඉන්ද්‍රියය 'තෝරාගැනීම කෙරෙහි බලපායි.'

චිත්ත කායික වෛද්‍ය ක්‍රමයේ එන ඉන්ද්‍රිය භාෂාවත් අප මෙහි දී සංකේත කර්මය යයි නම් කළ දෙයත් අතර ලොකු සමාන කමක් ඇති බව පෙනේ. සංකේත කර්මයේ දී පාපය පිළිබඳ තද හැඟීමක් පුද්ගලයාගේ සිතෙහි තිබූ නිසා ඒ පාප

---

1. තද හැඟීම් නිසා හටගත්.
2. සිතේ ඇදුම් කෑම.
3. Weiss
4. English

සංඥාව ශරීරයට තල්ලු වූවා සේ පෙනේ. ශරීරාංගය තෝරා ගැනීම කිසියම් සංකේත යෝග්‍යතාවක් මත රැඳී ඇත.

කේසි - ලිපි ගොනුවල සංකේත කර්මය පිළිබඳ බොහෝ නිදසුන් තිබේ. ඒවා අතර, වර්ග නියෝජක වූ හොඳ නිදසුන් කීපයෙක් ඇත. දරුණු ඇදුම රෝගයෙක දී රෝගියාට මෙසේ කියා තිබේ. "ඉදහිට තමාගේ ප්‍රාණයත් තමාගෙන් බැහැරට තෙරපා ගන්නේ නැති ව ඔබට අන්‍යයන්ගේ ප්‍රාණය ඔවුන්ගෙන් බැහැරට තෙරපන්නට බැහැ."[1] බීරකුට මෙසේ අවවාද කර ඇත: "ඒ නිසා උදවු ඉල්ලා ගෙන එන අයට නැවත ඔබේ කන් වසා ගන්න එපා" (මේ තැනැත්තා ප්‍රංශ විප්ලව කාලයේ දී රදළයකුව සිටියේ ය.) කොඳු ඇටයේ කාස රෝගයෙන් පෙළෙන්නකුට කියා ඇත්තේ මෙසේ ය; "මේ තැනැත්තා අන්‍යයනට බාධා කළා, දැන් ඔහුට ම එය වී තිබෙනවා' ප්‍රගාමී පේශ්‍යාඝාත රෝගියකුට[2] දැන ගන්නට ලැබුණේ මෙසේයි; "මෙය යටි අඟ පසඟවල ස්නායු හා පේශී දිරායෑමක් පමණක් නොවේ. මෙය ඔබ අන්‍ය ජන්මයන්හි දී ඔබගේ ශරීරයෙන් අන්‍යයන්ගේ ශරීරවලත් ගොඩනඟා ඇති දෙයෙක ඵලයෙකි."

ලිපි ගොනුවල ඇති සංකේත කර්මය පිළිබඳ බෙහෙවින් සිත් ගන්නා නිදසුන අවුරුදු දෙකේ සිට අසාධ්‍ය ලෙස ඇඳත් හෙමන්නකු බවට පත් වූ එකොළොස් හැවිරිදි ළමයාගේ නිදසුන විය හැකි ය. මොහුගේ පුවපත් වීමේ තුබූ බෙහෙවින් අස්වාභාවික වූ ගතිය නිසා මේ නිදසුන තරමක් දුරට විමසිය යුතුව ඇත.

බිළිඳකු වශයෙන් හේ නිශ්ශබ්ද දරුවෙක් විය. ඊළඟ දුරිය උපදින තාක් ඔහුගෙන් මාපියනට කිසිම කරදරයක් තිබුණේ නැත. ඔහු ඇඳත් හෙමන්නට පටන් ගත්තේ එතැන් සිට ය.

1. මේ කියමන්වලට අනුව මේවා බූමරංග කර්ම නිදසුන් වශයෙන් ගතහැකි බව පෙනේ.
2. A vicitim of progressive muscular atrophy (අනුක්‍රමයෙන් පේශී දිරා යන රෝගියෙක්.)

මෙය සාමාන්‍ය රාත්‍රි සිද්ධියක් බවට පත්විය. දෙවන දරුවකු උපන් අවස්ථාවේ දී පළමු දරුවාට තමා අනාරක්ෂිතය යන හැඟීම ඇති වී අන්‍යයන්ගේ අවධානයත් තමාගේ ලොකුකමත් නැවත ඇති කර ගැනීම සඳහා බිළිඳු පුරුදුවලට ආපසු යන බව මාපිය දෙදෙනා ම දැන සිටියහ. මාපියන්ගේ ආදරයෙහි ඔහුගේ ස්ථානය බිළිඳු සොහොයුරිය විසින් ගෙන නැති බව ඔහුට පෙන්වීම සඳහා හැම උත්සාහයෙන් ම ගන්නා ලදි. එහෙත් ඇඳත් තෙමීම දිගට ගියේ ය.

අවසානයේ දී මාපියෝ ළමයාට වයස අවුරුදු තුනේ දී මානසික වෛද්‍ය විද්‍යාඥයකුගෙන් [1] උපදෙස් ගන්නට සිතූහ. මෙසේ මේ දරුවා අවුරුද්දක් මානසික වෛද්‍ය විද්‍යාඥයකුගේ සැලකිල්ලට පාත්‍ර කොට තබන ලදී. එයත් නිශ්ඵල බව දැනගත් මා පියෝ ඒ වෙදකම අත හළහ. ඉන් පසු අවුරුදු පහක් ම මේ ළමයා ඇඳත් තෙමීම දිගටම කරගෙන ගියේ ය. දැන සිටි හැම විශේෂඥයකුගෙන් ම උපදෙස් ගත් මාපියෝ නොයෙක් ක්‍රම අත්හදා බැලූහ. ඒ සියල්ල නිෂ්ඵල විය. වයස අටේ දීත් පුරුද්ද දිගට ම ගියේ ය. නැවත මානසික වෛද්‍ය විද්‍යාඥයකුගේ උදවු සෙවූ මාපියෝ තවත් අවුරුදු දෙකක් ඒ ප්‍රතිකාරය ගත්හ. එය ඔහුගේ සාමාන්‍ය චරිත සංවර්ධනයට හේතු විය. එහෙත් අර පුරුද්ද නතර වූයේ නැත. මේ නිෂ්ඵල ප්‍රයත්නයෙන් පසු ව ළදරුවාගේ දසවන අවුරුද්දේ දී මානසික වෛද්‍ය විද්‍යාව අත් හරින ලදී.

ළමයාගේ වයස එකොළොසෙහි දී මාපියනට එඩ්ගා කේසි ගැන අසන්නට ලැබිණි. දරුවාගේ මේ විශේෂ ආබාධය ගැන කියැවීමක් ලබා ගන්නට පියා ඉටා ගත්තේ ය. ළමයාගේ ජීවිත කියැවීමට අනුව, වර්තමාන ජීවිතයට පූර්ව ජීවිතයේ දී හේ, ආදි පියුරිටානු[2] යුගයේ ක්‍රිස්තියානි දේව ගැතියෙක් විය. කට්ටම්

1. Psychiatrist
2. පියුරිටානුවෝ නම් ඕාහිර පුදපූජා විධි ඉවත දැමූ ප්‍රොතෙස්තන්ත නිකායේ සාමාජිකයෝ ය.

නඩු විභාගවලටට ඉදිරිපත් වූ හේ, කට්ටඩින් වශයෙන් සැකයට පාත්‍ර වූවන් පුටුවෙක බැඳ, පොකුණුවලට දමා දියේ ගිල්වීමෙන් දඬුවම් කිරීමට උනන්දු විය.[1]

මේ කර්ම විස්තරය දූන් කියැවීමෙන් රෝගය නිසැකයෙන් සුවපත් කළ හැකි බව ද කියැවිණි. දරුවා රාත්‍රියේ නින්දට යන්නට කලින් ඔහුට යෝජනාවක් කරන්නට යයි නියම කරන ලදී. යෝජනාව කය පිළිබඳ වූවකට වැඩියෙන් ආධ්‍යාත්මික වූවෙකි.

කියැවීම ලබා ගැනීමෙන් පසු ව දිනක් රාත්‍රි ළමයාගේ ඇඳ ළඟ හිඳ ගත් මව ඔහු නින්දට වැටෙන්නට ඔන්න මෙන්න කියන තරම් වන තුරු බලා සිටියා ය. එතැන් සිට ඕ, හෙමින් ඒකාකාර හඬකින් මෙසේ කියන්නට වූවා ය. "ඔබ හොඳයි, කරුණාවන්තයි, ඔබ සිටින්නේ බොහෝ මිනිසුන් සුවපත් කරන්නටයි. ඔබට හමු වන හැමදෙනාට ම ඔබ උපකාර කරනවා....ඔබ හොඳයි, කරුණාවන්තයි....." දූන් නිදා සිටින ළමයාට මේ අදහස් ම නොයෙක් ක්‍රමවලින් විනාඩි පහක් දහයක් පමණ කියන ලදී.

අවුරුදු නවයකින් පමණ පළමු වරට, එදා රාත්‍රි, ළමයා ඇඳ තෙත් කෙළේ නැත. මාස කීපයක් ඒ ආකාරයෙන් ම මව ළමයාට ඒ යෝජනාව කරගෙන ගියා ය. ඒ කාලය තුළ එක් වරක් වත් ඒ සිද්ධිය වුණේ නැත. කල් යෑමේ දී සතියකට වරක් පමණක් යෝජනාව කළ හැකි බව සොයා ගත හැකි විය. අවසානයේ දී එයත් අනවශ්‍ය විය. දරුවා සම්පූර්ණයෙන් සුවපත් විය.

මේ සිද්ධියේ සිත් ගන්නා ලක්ෂණ කීපයෙක් ඇත. නව අවුරුද්දක් පැවැති පුරුද්ද යෝජනාව අත්හදා බැලූ ප්‍රථම රාත්‍රියේ දී ම බිඳී යෑම ම විශේෂයෙන් සැලකිය යුත්තෙකි. මේ මව,

1. 78 වන පිට ද බලන්න.

ශික්ෂිත බුද්ධියක් ඇති, ප්‍රශ්න නොකළ හැකි අවංක භාවයෙකින් යුතු තැනැත්තියක නොවූවා නම් මේ සිද්ධිය අතිශයෝක්තියක් යයි ඕනෑ ම කෙනෙකුට සැක සිතෙනවා ඇත. නීතිඥවරියක වූ ඕ දිස්ත්‍රික්ක නීතිපතියකුගේ නීතිඥ මණ්ඩලයේ විශ්වස්ත සාමාජිකාවක් වූවාය. ඕ ලේසියෙන් රැවටෙන්නියක් හෝ මිථ්‍යා ලබ්ධි ඇත්තියක් හෝ වංක තැනැත්තියක් හෝ නොවූවා ය.

මේ සිද්ධියේ ඇති දෙවන විශේෂ ලක්‍ෂණය නම්, එතරම් ප්‍රතිඵල සහිත බව පෙනී ගිය ඒ යෝජනාවේ ඇඳුත් නොතෙමීම ගැන කිසිවක් සඳහන් නොවීම ය. එය දරුවාගේ කාය සංඥාවට නොව සම්පූර්ණයෙන් ම අධ්‍යාත්ම සංඥාවට එල්ල කළ එකෙකැයි කිව හැකි ය. ඒ කියන්නේ ඒ යෝජනාව දරුවාගේ සාලෙම්හි වූ පූර්ව ජන්මයෙන් ගෙනෙන ලද අපරාධ සංඥාවටම යොමු කරන ලද බව ය. ඒ අපරාධ සංඥාව, මේ ආත්ම භාවයෙහි ඊට සුදුසු වකුගඩු වෙනස් වීමකින් යුතුව සංකේතාත්මක වශයෙන් ඔහුගේ ශරීරයෙහි ම ප්‍රකාශයට පත් ව තිබිණි. වරෙක හේ අන්‍යයන් ගිල්ලෙව්වේ ය. නැතහොත් ගිල්ලීමේ වශකීව යුත්තා විය. දැන් තමා විසින් ම විපාක විඳිය යුතු බව නො පැහැදිලි ව නමුත් ඔහුට හැඟී ගොස් තිබේ.[1]

ළමයා මේ ජීවිතයේ දී කිසිවකුට හානියක් කර නැති නමුත් වරෙක ඔහු විසින් අන්‍යයනට කරන ලද ක්‍රෑර දඬුවම් පිළිබඳ ස්මරණය පැවැති නිසා, ඔහුගේ සිතේ එක් තට්ටුවෙක් ඔහුගේ කරුණාව ගැනත් සමාජය ඔහු පිළිගනී ද යන්න ගැනත් සැක කළේය. මවගේ යෝජනාව සිතේ ඒ තට්ටුවට ළඟා වී සමාජ සේවයෙන් හා කරුණාවෙන් ඒ වරදට වන්දි ගෙවිය හැකි බව සහතික කළේය. මේ නිසා තව දුරටත් සංකේත විපාක විඳීම අනවශ්‍ය විය.

1. හැම මිනිසකුගේ ම යටි සිතේ කර්ම නියාමය පිළිබඳ හැඟීමක් ඇති බව පෙනේ. ඇතැම් විට එය උඩු සිතේ පවත්නා ආගමට අනුකූල නොවන බව ද සිතා ගත හැකි ය.

එතැන් සිට ළමයා හොඳින් සකස් විය. බොහෝ දෙනා ඔහුට කැමැති ය. හේ ජනප්‍රිය, හොඳ ශිෂ්‍යයෙක් ද නායකයෙක් ද විය. ඔහුගේ ස්වභාවයේ මුල දී තුබූ ඇතුළට නැමුණු ගතිය කොතරම් හොඳට සකස් වී තිබේ ද යත හොත් 'ජොන්සන් ඕ' කොනෝර් හියුමන් එන්ජිනියරිං ලැබොරටරි පරීක්ෂණයෙක දී[1] හේ හොඳින් සකස් වූ බහිර්නතයකු (පිටතට නැමුණකු) සේ ගණන් ගන්නා ලදී. මවගේ හැඟීමේ හැටියට, ඔහුගේ මේ චරිතය වෙනස් කිරීමේ ගෞරවය මානසික වෛද්‍ය-විද්‍යාවටත් කේසි කියැවීමටත් යන දෙකට ම යා යුතු ය.

මාපිය දෙදෙනාගේ ම දැකීමට අනුව වයස දහසයේ දී මොහුගේ දක්නට ලැබුණු විශේෂ චරිත ලක්ෂණයෙක් නම් අනුන් ගැන අතිශයින් ඉවැසීමයි. අන් මිනිසුන්ගේ ඇති ඕනෑම චරිත දුර්වලතාවකට ඔහු, කිසියම් මනෝවිද්‍යාත්මක විවරණයක්, යුක්තියක් සොයා ගනී. ඔහුගේ මේ ජන්මයේ ඇති ශාරීරික දුර්වලතාව පූර්ව ජන්මයේ තුබූ අසහනයේ සංකේතාත්මක විපාකයක් බවත් ඒ අසහනය දැන් ක්‍රියාත්මක ඉවැසීමක් බවට හැරී ඇති බවත් සැලකිය හැකි ය. සමබර බව කොතරම් හොඳින් නැවත ඇති කර ගෙන තිබේ ද යතහොත් ශාරීරික කර්ම විපාකය ඉවත් කර ගත හැකි විය.

කර්මයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මේ නිදර්ශන පරීක්ෂා කර බලන විට ඒ පිළිබඳ සාමාන්‍ය නීති කොටසක් සකස් කර ගත හැකි බව පෙනී යයි. ක්‍රියා ප්‍රතික්‍රියාවෙකැයි බොහෝ විට කර්ම නියාමය හඳුන්වා දී තිබේ. කේසි කියැවීම්වලින් මේ හඳුන්වාදීම තහවුරු වී තිබේ. එහෙත් කර්මයේ ලක්ෂණයක් වන විපාක ප්‍රතික්‍රියාව සාමාන්‍යයෙන් සමාන වන්නේ වත් වචනයේ සිදු සාමාන්‍ය අර්ථයෙන් ප්‍රතික්‍රියාවක් වන්නේ වත් නැත. වරේක යකඩ කූරුවලින් තම සතුරන් අන්ධ කළ ශිල්පියා මෙවර උපන්නේ වනචාරි ගෝත්‍රයක නොවේ. ඔහු මේ ආත්මයේ දී

1. Johnson O'Connor Human Engineering Laboratory Test.

තරුණ වයසේ දී වනචාරී ගෝත්‍රයකට අසු වීමෙන් දරුණු ලෙස ඔහුගේ ඇස් පුච්චා දමා නැත. ඒ වෙනුවට ඔහු මේ විසිවැනි ශත වර්ෂයේ සමාජයෙක අන්ධ ව උපන්නේ ය. ඔහුගේ වර්තමාන සිද්ධි මොන ම අයුරෙකින්වත් අතීත ජන්මයේ සිද්ධීන්ගේ නියම පිළිබිඹු නොවී ය.

මෙයත් තවත් මීට සමාන නිදර්ශනත් නිසා අපට පහත දැක්වෙන සාමාන්‍ය නීතිය සකස් කර ගත හැකි ය. කර්මය මූලික වශයෙන් මනසෙහි ක්‍රියාත්මක වන මනෝවිද්‍යාත්මක නියාමයෙකි.[1] භෞතික පරිසරය මානසික අර්ථය ඉටු කර ගැනීමට ඇති උපකරණයෙක් පමණි. ඒ නිසා ප්‍රතික්‍රියාව භෞතික පක්ෂයෙන් ආසන්න වනවා පමණක් මිස සමාන වන්නේ නැත. මානසික පක්ෂයෙන් නම් ප්‍රතික්‍රියාව බොහෝ දුරට සමාන වෙයි.

ප්‍රතික්‍රියාවේ කාරකත්වය පිළිබඳ ව තවත් සාමාන්‍ය නීතියක් ඇති කර ගත හැකි බව පෙනේ. කේසි ලිපි ගොනුවල ඇති කිසි ම නිදර්ශනයෙකින් වර්තමාන වධය, එය විඳිනු ලබන පුද්ගලයාගේ පූර්ව ජන්මයේ වධයට ගොදුරු වූ තැනැත්තා විසින් ම කරන ලද බවෙක් නොපෙනේ. ඒ කියන්නේ ඒ ශිල්පියා අන්ධ ව උපන්නා මිස කිසිවකුගේ වධයට පාත්‍ර නො වූ බව ය. ඔහුගේ මාපියන්වත් පූර්ව ජන්මයේ දී ඔහු අතින් වධයට ලක් වූවන් ලෙස දක්වා නැත. නිශ්චය කර ගත හැකි තරමින් බාලකපක්ෂඝාතයට ගොදුරු වූ, ඉහත සඳහන් කරන ලද කරප්‍රසාධිකාව (= අත් හා නිය අලංකාර කරන්නී.) අත්ලන්තිසයේ සිටි පෙර ජන්මයේ දී ඇ අතින් වධයට පත් වූවන්ගෙන් රෝගය බෝ කර ගෙන නැත. අජීර්ණ දෝෂයෙන් පෙළුණු පුද්ගලයාගේ ඒ රෝගය වැළැඳුණු උදරය ඔහු පූර්ව ජන්මයේ දී නරකට පාවිච්චි කළ උදරය ම නොවේ. කොටින් කියනහොත් ප්‍රතික්‍රියාව

1. චේතනාහං භික්ඛවේ, කම්මං වදාමි, චේතයිත්වා කම්මං කරෝති කායේන, වාචාය මනසා

පහළ වන බව පෙනෙන්නේ, කර්මය මුලින් සිද්ධ කෙළේ යම් පුද්ගලයකු හෝ ඉන්ද්‍රියයක් හෝ කෙරෙහි නම් ඔහුගෙන් හෝ නොවේ. ඒ කර්මයට උපදෙස් දුන්නේ යම් තැනෙකින් නම් එතැනින්ය. සටහන් කීපයෙකින් මේ සාමාන්‍ය නීතිය පැහැදිලි වනවා ඇත.


අපි ජෝන් ඩෝයට ලියූ ලිපියෙක

"John Doe,
614 Birch Street,
Madison,
Wisconsin"

කියා ලිපිනය ලීවා යයි සිතමු. මෙහි දී අපි, ජෝන් ඩෝය නම් පුද්ගලයා වට කොට ඇති අනුක්‍රමයෙන් මහත් වූ පරිසර සතරක් නිශ්චය කොට දක්වමු. භෞතික ලෝකයෙක උපදින්නා වූ ආත්මය ජෝන් ඩෝය බඳු ය. ඔහු වට කොට ඒක - කේන්ද්‍රික පරිසර කීපයෙක් ඇත. මේ පරිසර නිකම් ම ඔහු වට කොට සිටිනවා නොවේ. ඔහුගේ ක්‍රියාකාරීත්වයේ ක්ෂේත්‍රයන් වන්නේ ද ඒවා ය. ආත්මයේ ක්‍රියාකාරීත්වයේ ක්ෂේත්‍රයන් අඩු වැඩි වශයෙන් සියුම් වූ ක්‍රම කීපයෙකින් ම බෙදා දැක්විය හැකි ය.

එහෙත් ප්‍රධාන වශයෙන්, ආත්මය තම චේතනාව ක්‍රියාත්මක කරන ප්‍රධාන ක්ෂේත්‍ර තුනෙක් ඇත. පුද්ගලයාගේ ම ශරීරය එහි පළමුවැන්නයි. (මෙය නොයෙක් ක්‍රමවලට කොටස් කළ හැකි ය. එවිට එය ඉන්ද්‍රියවලට ද සමහර විට වඩා සියුම් වඩා ආකාශික වූත් අංශවලට ද බෙදිය හැකි ය.) ස්වාභාවික පරිසරය දෙවැන්නයි. එනම් බාහිර භෞතික පරිසරයයි.) තුන් වැන්න සමාජ පරිසරයයි. (කාරකයාට සම්බන්ධකම් ඇති සියලු පුද්ගලයෝ මෙහි ඇතුළත් වෙති.) මේ ඒ ක්ෂේත්‍ර තුන ය.


1 වැනි සටහනින් මේ ඒක - කේන්ද්‍රික ක්ෂේත්‍ර පැහැදිලි කෙරේ.




1 වැනි සටහන

'ක' ලකුණින් අමරණීය ආත්මය දක්වේ. මේ ආත්මය 'කා' නමැති ස්ථානයේ දී ශරීර සහිත ජන්මයක් ලබා ඇත. 'කකා' නම් වූ ආත්මයට ක්‍රියා කිරීමට ප්‍රධාන ක්ෂේත්‍ර තුනෙක් ඇත. 'අ' නම් කාරකයාගේ ම ශරීරයයි. 'ඉ' නම් ස්වභාව ලෝකයයි. 'උ' නම් අනෙක් මනුෂ්‍යයෝ ය. ඊ - ලකුණුවලින් ඒ ක්ෂේත්‍රයන් කෙරෙහි බලපාන සචේතන කර්ම දක්වෙයි.

දෙවන සටහනින් 'කකා' නමැති පුද්ගලයාගේ මූල කර්ම නිසා, ඒ ක්ෂේත්‍රයන්ගෙන් හට ගන්නා වූ, ඔහු කෙරෙහි බලපාන්නා වූ ප්‍රතික්‍රියා පැහැදිලි කෙරේ. මෙසේ 'කකා' නම් වූ පුද්ගලයා අධික ව කෑමෙන් තමාගේ ශරීරය (අ) නරකට පාවිච්චි කළහොත් මේ ජන්මයේ දී ම නැතිනම් අනාගත ජන්මයෙක දී ඒ ක්ෂේත්‍රයෙන් ම ප්‍රතික්‍රියාවෙක් මතුවෙයි. දැන් ඔහුට වෙනත් ශරීරයක් ඇත්තේය යන කරුණ මෙහි ලා වැදගත් නොවේ. කර්ම ක්ෂේත්‍රය එක ම ය. සම්බර බව නැති වීම කොතැනෙක දී වුව ද හඳා ගත හැකි ය.





2 වැනි සටහන

සාමාන්‍ය ටෙනිස් ක්‍රීඩා උපමාවෙක එළියෙන් බැලුවොත් මේ අදහස එතරම් අමුතු ලෙස නො පෙනෙනු ඇත. දෙදෙනකු විනෝදයට ටෙනිස් ක්‍රීඩාවේ යෙදුණාහයි සිතමු. දෙදෙන ම 5-5 ලකුණු ලබා ඇති තීරණාත්මක අවස්ථාවේ දී ක්‍රීඩාංගණ බල පත්‍රයේ කාලය ඉකුත් වීම නිසා ක්‍රීඩාව නතර කරන්නට සිදු විය. තරඟයේ උනන්දුව නිසා අනෙක් පිට්ටනියෙක වෙනත් අංගණයකට ගොස් ක්‍රීඩා කරන්නට ඔවුනට සිතේ. ඔව්හු එසේ ගොස් පැය බාගයකට පසුව නැවත ක්‍රීඩාව අරඹති. දැන් ඔවුන්ගේ කර්ම ක්ෂේත්‍රය වෙනස් ය. එහෙත් ලකුණු සංඛ්‍යාව එසේ ම ය. ඔවුන්ගේ මිත්‍ර තරඟ ක්‍රීඩාවට බාධා පැමිණි අවස්ථාවේ තිබුණු සම සම ලකුණුවලින් ම යළි ඇරැඹීම අවශ්‍ය වේ. ඔවුන්ගේ ප්‍රධාන අර්ථය වී ඇති මේ ලකුණු සංඛ්‍යාව දැකිය නොහැකි ය යන අර්ථයෙන් නම් අප්‍රකට ය. එහෙත් එය ඔවුන් සෙල්ලම් කරනු දැකිය හැකි අංගණය තරමට ම සත්‍යය. මෙහි දී ලකුණු සංඛ්‍යාව ආත්මයේ තරඟවල ලකුණු සංඛ්‍යාව ය. එනම් අප කර ඇති කර්මය, ශරීරය අංගණයයි. තරඟය සිදු වන්නේ මේ අංගණයේ ය.

දැන් දෙවැනි සටහන් විස්තරය දිගට ගෙන යමු. 'කකා' නම් පුද්ගලයා නිකරුණේ කැලෑ විනාශ කරයි නම්, ලෝභ ප්‍රයෝජනවත් දෙයට යොදයි නම්, ('ඉ' ක්ෂේත්‍රය) පසු අවස්ථාවෙක දී කැලෑ හෝ ලෝභ සම්බන්ධයෙන් ඔහුට දුර්භාග්‍යය හෝ භාග්‍යය ඇති වන අයුරින් එම ක්ෂේත්‍රයෙන් ම විපාකය මතු වෙයි. මේ වර්ගයේ විපාක පිළිබඳ බොහෝ නිදසුන් කේසි-ලිපිගොනුවල ඇත.

එසේ ම 'කකා' නමැති පුද්ගලයා ම තම සමාජයේ මිනිසුනට ('උ' ක්ෂේත්‍රය) ක්‍රෑරකමින් හා නොසැලකිල්ලෙන් ක්‍රියා කළොත් ක්‍රෑරකමත් නොසැලකිල්ලත් ඔහු කරා එයි.




3 වැනි සටහන

මේවා සාමාන්‍යයෙන් ඒ ක්ෂේත්‍රයෙන්ම මිස ඒ පුද්ගලයන් ගෙන්ම ඊම අවශ්‍ය නොවේ. කෙසේ හෝ මේ විපාක පමා වී ලැබෙන්නට ද ඉඩ ඇත. කර්මය කළ හැටියේ ම නොව පසුව විපාකය විඳින්නට සිදු විය හැකි ය.

තුන්වැනි සටහනින් තම සගයන් අතර "ඔලාෆ් ඔල්සන්" යයි ප්‍රසිද්ධ 'කකා' නම් පුද්ගලයා කෙරෙහි, පෙර 'කකා' වශයෙන් නොහොත් මයිකල් ගුයොන් නමින් සිටි ඔහුගේ පූර්ව චරිතයෙන්

ඇති වූ බලපෑමේ ශක්ති මාර්ග දක්වෙයි. තමාගේ අතීත කර්මවල ප්‍රතික්‍රියාවලට ගොදුරු වන ගමන් ම ඕලාෆ් ඔල්සන් අනාගත ප්‍රතික්‍රියාවලට හේතු වන අලුත් කර්ම ද සිදු කර ගනී.

මෙසේ කේසි කියැවීම් මිනිසා කායික පීඩා විඳින්නේ කවර හෙයින් ද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රබෝධකර වූ අනේක චින්තන මාර්ගවලට අප ගෙන යයි. අපගේ සාමාන්‍ය පංචේන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් අපට දැකිය හැක්කේ පැටැලුම් සහිත විශාල විචිත්‍ර ජවනිකාවෙක සීමා සහිත කොටසක් පමණක් බව ඒ කියැවීම් වලින් දක්වනු ලැබේ. අපට පෙනෙන මෘදු මතු පිටට යටින් අපමණ යටිපැති නූල් ද අප්‍රමාණ වූ නොපෙනෙන පැටැලිලි ද ඇත. තව ද මේ විචිත්‍ර ජවනිකාව දෙපැත්තට ම ඉතා දිගට විහිදී ඇත. එක ම නූලක්වත් උපත යයි නම් කරනු ලබන මායාකාර සීමාවෙන් පටන් ගනිතැයි හෝ මරණය යයි කියනු ලබන එතරම්ම මායාකාර සීමාවෙන් කෙළවර වෙතැයි හෝ කිව නොහැකි ය.

# 5

# පරවම්භන කර්මය

ආඩම්බරය (මානය) ක්‍රිස්තියානි දේව ධර්මයේ ඇති ප්‍රධාන පව් සතෙන් එකෙකි. අනෙක් බොහෝ දේව ධර්ම පනත් මෙන් මෙය ද බුද්ධි පක්ෂයෙන් සිත් ගන්නාසුලු නමුත් මනුෂ්‍ය පීඩාව පිළිබඳ ප්‍රායෝගික වූ ද වෛද්‍ය ශාස්ත්‍රීය වූ ද දර්ශනයන්ගෙන් දුරස්ථ බව පෙනේ. එහෙත් කේසිගේ කියැවීම් වලින් ලැබෙන සාක්කි අප පිළිගන්නවා නම්, ආඩම්බර වීමේ පාපය පැහැදිලි කායික දුක්වලට හේතුවන බව පෙනේ. පරවම්භන ස්වරූපයෙන් මේ මානය ප්‍රකාශනයට පත් වූ කල්හි විශේෂයෙන් විපාක දායක වන බව දක්නට ලැබේ. කෲර සිනහවත් හෙළා දක කථා කිරීමත් කායික ආක්‍රමණයකට සමාන බව පෙනේ. මෙයින් බූමරංග කර්ම ඇති වන්නා සේ ය. මෙයින් වම්භනයට පාත්‍ර වූ පුද්ගලයාට විඳින්නට සිදු ව තුබූ කායික පීඩාවට සමාන පීඩාවක් විඳින්නට සිදු වේ. පරවම්භනය නම් අනුන් හෙළා දකීම ය.

මේ වර්ගයේ කර්මයක් නිසා ඇති වූ බව කියන ලද දරුණු ශාරීරික පීඩා පිළිබඳ නිදසුන් සතෙක් කේසි ලිපි ගොනුවල

ඇත. මේවායින් සයෙක් ම රෝමයේ දී ක්‍රිස්තියානීන්ට වධ දුන් කාලයට අයත් යයි කියා තිබීම විස්මය ජනක ය. මෙහි දී ද අපට ඉතිහාසයේ එක් යුගයෙක ආත්ම සමූහයක් තවත් ඉතිහාස යුගයෙක දී සමකාලීනයන් ලෙසින් මෙලොවට එන බව පෙනේ.[1]

මෙයින් තුනෙක් බාලකපක්ෂඝාත නිදසුන් ය. පළමු වැන්න වයස සතළිස් පසෙක ස්ත්‍රියක පිළිබඳව ය. ශිල්පියකුගේ භාර්යාව වූ මේ තැනැත්තියට දරුවෝ තිදෙනෙකි. අවුරුදු තිස්හයේ දී මැයට බාලකපක්ෂඝාතය වැළැඳිණි. එතැන් සිට මැයට ඇවිදින්නට නොහැකි විය. ඈ අද ජීවිතය ගෙවන්නේ රෝද පුටුවෙක ය. ඇයට ගෙයින් පිටව යත හැක්කේ අන්‍යයන්ගේ උදව්වෙනි. මෙහි කර්ම හේතුව වශයෙන් කියා ඇත්තේ මේ තැනැත්තියගේ පැරණි රෝමයේ චරිතයයි. ඒ කාලයේ දී රජ පවුලට අයත් වූ ඕ නීරෝගේ ක්‍රිස්තියානි සංහාරයේ දී ඔහු ළඟින් ඇසුරු කළ කෙනෙකි. "මේ ආත්මය එකල වධක භූමියේ දී කොර කරන ලද්දනට සිනාසුණා. අනේ, බලන්න, එය ම ඔබටත් වෙනවා."

දෙවැන්න සමහර විට කේසි ලිපිගොනුවල ඇති ඉතාමත් අනුකම්පා කටයුතු නිදසුන වයස තිස්හතරෙක ස්ත්‍රියක පිළිබඳවය. මැට බාලකපක්ෂඝාතය සෑදුණේ වයස මාස හයේ දී ය. මේ නිසා ඕ කොන්ද කුදු වී කොර ගසන්නට වූවා ය. මොට්‍ යකු වූ ඇගේ පියා මේ ගැන උපේක්ෂක විය. ඔහු වෙහෙසුණේ තමාටම මුදල් උපදවා ගැනීමට ය. ඇට ඉතා මහන්සියෙන් කුකුළන් ඇති කර ජීවත් වීමට සිදු විය. අභාග්‍ය සම්පන්න වූ ප්‍රේම සම්බන්ධතා දෙකක දී ද නැවත දෛවය ඇට විරුද්ධ විය. ඇගේ පළමු පෙම්වතා පළමු වැනි ලෝක මහා යුද්ධයේ දී මිය ගියේ ය. පසුව ඕ අනෙකකුට බහ දුන්නාය. ඔහු දරුණු ලෙස රෝගාතුර විය. යුවපත් වූ ගෙහෙමම තමාට

1. 120 පිට බලන්න.

සාත්තු කළ හෙදිය විවාහ කර ගත්තේ ය. මේ කායික හා මානසික විපත් මදිවාට දඹර කර ගන්නා මාපියන් නිසා ද ගෙවී පළේ හුදෙකලා ජීවිතය නිසා ද ඇ වින්දේ තද දුක් ය. සිමෙන්ති පඩි පෙළෙකින් වැටුණු මේ තරුණියගේ කොඳු ඇටයේ තුවාලයක් නිසා ඕ ඇඳට ම සීමා වූවා ය. මේ නම්, සීමාන්තික දුඃඛ චිත්‍රයෙකි.

මෙහි දී ද අඩු ගණනේ කායික තත්ත්වයට වග කිවයුතු කර්ම හේතුව, ජීවිත දෙකකට පෙර රෝමයේ දී සිදු වූවෙකි. කියැවීම මෙසේ ය. "මේ ආත්මය එකල පලාතියුස්ගේ ගෘහයේ සාමාජිකයෙකි. බොහෝ විට මේ ආත්මය මිනිස් පොරත් මිනිස් තිරිසන් පොරත් නැරැඹුවේ ය. දැන් මේ කායික විපත්වලින් වැඩි හරියක් ඇති වී තිබෙන්නේ මේ ආත්මය ඒ කාලයේ දී අර්ථයක් ඇති ව සටන් කළ අයගේ දුර්වල කම ගැන අවඥා සහගත ව හිනැහුණු නිසයි."

තුන්වැන්න චිත්‍රපට නිෂ්පාදකයකු පිළිබඳව ය. ඔහුට බාලකපක්ෂාඝාතය වැළැඳුණේ වයස දාහතේ දී ය. තවමත් ටිකක් කොර ගසන නමුත් ඔහුට අසුන් පිට යෑමටත් ඇතැම් ක්‍රියාශීලී ක්‍රීඩාවල යෙදීමටත් පුළුවන. මේ නිදසුනෙහි දී ද පාපය කර ඇති ස්ථානය ක්‍රිස්තු යුගයේ මුල් කාලයේ රෝමයයි. "හමුදාවේ සිටි මේ ආත්මය බියට පත් අයටත් විරුද්ධත්වයක් නැති ව යටත් වූ අයටත් අපහාස කෙළේ ය. මෙයින් මේ ආත්මයට සිදු වූයේ පාඩුවෙකි. එය ප්‍රතිපත්තියක එල්ලී සිටි අයට සිනාසීම නිසා ඇති වූවක් මිස යුතුකම් ඉටු කිරීමෙන් ඇති වූවෙක් නොවේ. මේ වනාවේ සිරුර බිඳීම අභ්‍යන්තර ආත්මයේ ප්‍රබෝධය සඳහාත් ආධ්‍යාත්මික ශක්තීන්ගේ දියුණුව සඳහාත් අවශ්‍ය වූ අත්දැකීමෙකි."

බාලකපක්ෂාඝාතය නොවූ සිත් ගන්නාසුලු නිදසුන් සතරෙක ද කර්ම හේතුව වශයෙන් දක්වා ඇත්තේ

පරවම්හනයයි. පරවම්හනය නම් අනුන් පහත් කොට තැකීම ය. එකෙක් තුනටියේ කාශ රෝගය නිසා කොර වූ කෙල්ලක පිළිබඳ නිදසුනෙකි. මීට ප්‍රථම ජීවිතයේ දී ඕ මුල් ඇමෙරිකානු පදිංචිකාරියක් වූවා ය. එහෙත් කර්ම හේතුව ඇති වූයේ දෙවන පූර්ව ජීවිතයේ දී ය. මෙහි දී මේ ආත්මය නීරෝගේ මාලිගයේ රදළ ස්ත්‍රියක් වූවාය. එහිදී ඕ වධක භූමියෙහි ක්‍රිස්තියානීනට වද දෙනු දක ප්‍රීති වූවා ය. විශේෂයෙන් ම සිංහයකුගේ නිය පහරින් පළන ලද අංග ඇති දූරියකට සිනාසුණා ය.

දහඅට හැවිරිදි තරුණියක පිළිබඳ තවත් නිදසුනක් ඇත. ඇගේ බර වැඩි ශරීරය නොතිබෙන්නට ඇය ලස්සන වන්නට තිබිණි. වෛද්‍යවරු මේ තත්ත්වය පිටියුටරි ග්‍රන්ථියේ අධික ක්‍රියාකාරීත්වය නිසා ඇති වූවෙකැයි හැඳින ගත්හ. කේසිගේ කායික කියැවීමෙන් ද එය ග්‍රන්ථි සම්බන්ධ තත්ත්වයක් බව කියන ලදී. එහෙත් කියැවීම්වල අන් තැනෙක දී මේ ග්‍රන්ථි, ආත්ම දායාදයේ හෙවත් කර්මයේ ප්‍රකාශන මධ්‍යස්ථානය වන බව දක්වෙයි. මේ නිසා මේ තැනැත්තියගේ ග්‍රන්ථි තත්ත්වයත් එහි ප්‍රතිඵල වශයෙන් වූ අධික මහතත් කර්මය නිසා ඇති වී යයි අපට සිතිය හැකි ය. ජීවිත කියැවීමෙන් මේ සිතිවිල්ලට රුකුල් ලැබේ.

ජීවිත කාල දෙකකට පෙර ඕ රෝමයේ ක්‍රීඩිකාවක් වූවාය. සෞන්දර්යයෙන් ද ක්‍රීඩා ශක්තියෙන් ද ඕ ඉතා උසස් වූවා ය. එහෙත් ඕ තොමෝ එතරම් කඩිසර නැති බර අයට උපහාස කළා ය.

මේ වර්ගයට අයත් තුන්වන නිදසුන වයස විසි එකෙක තරුණයකු පිළිබඳව ය. හේ කතෝලිකයෙකි. ඔහුගේ මාපියනට අවශ්‍යව තිබුණේ ඔහු පූජකයකු කිරීමට ය. එහෙත් ඒ වෘත්තියට අකැමැති වූ ඔහු මාපියන්ගේ කැමැත්තට එකඟ වූයේ නැත. ඔහුගේ ජීවිතයේ තුබූ ප්‍රධාන ගැටලුව නම් සමලිංගික සේවන

ආශාවයි. මොහුගේ ඔහැකමින් ම ලබා ගන්නා ලද ජීවිත කියැවීමෙන් ඔහු පූර්ව ආත්මයක දී ප්‍රංශ රාජ මාලිගයේ ඕපාදූපයට ඇලුණු උපහාසකාරයකු ව සිටි බවත් තම කාටුන් ඇඳීමේ ශක්තියෙන් මාලිගයේ සිදු වූ සමලිංගික සේවන සිද්ධි හෙළි කොට ප්‍රීති වූ බවත් කියන ලදී. කියැවීමේ නිගමනය මෙසේ ය; "ඔබට දොස් නොලබන්නට නම් අනුනට දොස් කියන්න එපා. ඔබ අනුනට බෙදන හැන්දෙන් ම ඔබටත් බෙදෙනවා. ඔබ අනෙක් කෙනකුගේ හෙළා දකින දෙය ඔබ කෙරෙහි ඇති වනවා."

සතර වන නිදසුනේ එන තරුණයාගේ සොළොස් වන අවුරුද්දේ දී රිය අනතුරකට අසු වී කොන්ද කැඩුණේ ය. විශේෂඥයෝ ඔහුගේ ජීවිතය ගැන පවා සැක කළහ. එහෙත් හේ ජීවත් විය. පස්වැනි ඉල ඇටයෙන් පහළ සම්පූර්ණයෙන් පණ නැති විණි. එතැන් සිට ඔහුගේ ජීවිතය රෝද පුටුවකට සීමා විය. රිය අනතුරින් අවුරුදු හතකට පසුව, ඔහුට අවුරුදු විසිතුනේ දී ඔහුගේ මව ඔහු සඳහා කියැවීමක් ලබා ගත්තා ය. මේ ජීවිත කියැවීමෙන් ඔහුගේ ජන්ම දෙකක් හෙළි කොට ඇත. එකෙක් ඇමෙරිකානු විප්ලව කාලයේ දී ය. එකල හෙතෙම තද අධිෂ්ඨානයක් හා ධෛර්යයක් ඇති යුද්ධ නිලධාරියෙක් විය. ඒ ජීවිතයෙන් ඔහු මේ ජීවිතයට ගෙනා දායාද නම්, ක්‍රමානුකූලතාව, ප්‍රීතිමත් ගතිය, ඕනෑ ම නරක අවස්ථාවක් හොඳට හරවා ගත හැකි බව හා ලැබී ඇති දේ ප්‍රයෝජනයට ගැනීමේ හැකියාවයි.

ඔහුගේ ආබාධය සම්බන්ධයෙන් නම්, තීරණාත්මක ජීවිතය ඊට පෙර එක ය. ක්‍රිස්තියානි යුගයේ මුල් කාලයේ දී ඔහු රෝම සොල්දාදුවෙක් විය. හේ කාමසුඛල්ලිකානුයෝගයට කැප වී සිටියේ ය. නසරේනුන් වහන්සේගේ[1] ප්‍රතිපත්තිවලට ඇලී

1. ක්‍රිස්තුස් වහන්සේ

සුවියවුන් දුක් විඳිනවා දැක ඔහු ආඩම්බර විය. හේ රණබිමෙහි දී තමා සමග සටන් කළවුන් පසුව මෘගයන් සමග සටන් කරනු දුටුවේ ය. බොහෝ දුක් විඳිනු දුටු හෙතෙම ඒවා සැහැල්ලු කොට සිතුවේ ය. ඒ නිසා මේ ආත්මය දැන් තමා කෙරෙහි දකින දුක් ද සැහැල්ලු කර ගත යුතුව ඇත. එහෙත් ඒ වෙනත් අර්ථයක් සඳහා ය. ඔහු අර්ථවත්ව ඇති වූ යම් කරුණක් නිසා ඔවුනට සිනාසුණා නම් ඔහු කළ ඒ කර්මයට විපාක දීම සඳහා, දැන් ඒ කරුණ ඔහු කෙරෙහි ඇති විය යුතු ය.

මේ ආබාධ සතෙහි එනම් බාලකපක්ෂාඝාත රෝග තුන, තුනට්යේ කාශය, බර වැඩි කම, සමලිංගික සේවනය හා කැඩීමෙන් කොඳු ඇට පේශි පණ නැතිවීම යන මේවායේ එක් පුද්ගලයකුවත් ඒ ආබාධයෙන් යුතුව ඉපැදී නැත. මේ හැම ආපදාවක් ම සිදු වී ඇත්තේ උත්පත්තියෙන් පසු මාස හයේ සිට අවුරුදු තිස් හය තෙක් අතරතුර කිසියම් කාලයෙක දී ය. එකෙක් සිදු වූයේ රිය අනතුරෙකිනි. කෙසේ හෝ පැහැදිලි හේතුවේ තිරයට ඔබ්බෙන් නවත් ගැඹුරු හේතුවක් ඇති බව පෙනේ. එකකු මැරී යන, තව එකකු ඉතිරි වන, එකකු සීරීමක්වත් නැතිව බේරී යන, අනිකකු කෲර ලෙස විරූප වන අනතුරු පිළිබඳ පුදුම දෛවය මිනිසුන්ට පෙනෙන්නේ අහඹු සිද්ධි ලෙස ය. එහෙත් මේ දැන් සඳහන් කළ නිදසුන් වැනි සිද්ධි වලින් එබඳු හදිසි අනතුරුවල දී පවා ඇසට නොපෙනෙන කිසියම් නියාම කොටසක් ක්‍රියාත්මක වන බව පෙනේ. එහි දී කර්ම ණය සුදුසු පරිදි ගෙවනු ලැබේ. බාලකපක්ෂාඝාත රෝග බීජයට යටත් වීම පවා කර්මයෙන් සිදු වන බව පෙනේ.

බැලූ බැල්මට සිනහව වැනි සුළු දේකට ලැබී ඇති දඬුවම පමණට වැඩි යයි පෙනෙනු ඇත. එහෙත් හැඟුරින් සලකා බැලීමේ දී යුක්තිය පැහැදිලි වෙයි. අනෙකකුගේ ආබාධයක් ගැන සිනාසෙන තැනැත්තා සිනාසෙන්නේ කුමක් සඳහා ඇති

වූයේ දූයි තමා නො දන්නා දෙයක් ගැන ය. පහත් ම මෝඩකමෙකින් පවා පාඩමක් ඉගෙන දියුණු වීමට හැම මිනිසකුට ම අයිතියෙක් ඇත. ඔහු සිනාසෙන්නේ ඒ අයිතියට ය. හෙතෙම හැම ආත්මයකට ම ඇති උසස්කම, වටිනාකම, දිව්‍යත්වය හෙළා දකියි. පුද්ගලයකු කොතරම් නීච වූ විකෘත තත්ත්වයකට පත්ව සිටියත් එය හිනාවට කරුණක් නොවේ. තව ද උපහාස කරන්නා තම සිනහවට ලක් වන පුද්ගලයනට වඩා තමා උසස් කොට සිතයි. හේ පරවම්භනයත් අත්තුක්කංසනයත් යන දෙක ම කරයි. පරවම්භනය වචනයේ පහත් ම අර්ථයෙන් වූ අත්තුක්කංසනයක් ද වේ. අත්තුක්කංසනය නම් තමා උසස් කොට සැලකීමයි. පරවම්භනය නම් අනුන් හෙළා දැකීමයි.

මේ අදහස්, අපට නැණවත් කියමන් ඇති පැරණි පොතෙක එන පාඨ කීපයක් ගැන සිහිපත් කරයි. නිග්‍රාහකයාගේ අසුන නොගන්නා තැනැත්තා සත්‍ය වශයෙන් ම භාග්‍යවන්තයකු බවත් "කටින් සිදු වන පවින් වළකිනු සඳහා මම මගේ කටට මුඛවාඩමක් දමා ගනිමැ" යි නිශ්චය කළ ස්තෝත්‍රකාරයාගේ[1] ඉව හරි බවත් අපට වැටැහෙන්නට පටන් ගනී. "ඔබ දෙන විනිශ්චය ඔබට ම ලැබෙන නිසා විනිශ්චය නොවනු සඳහා විනිශ්චය නොකරන්න." යනු පැහැදිලි ව ලියන ලද බයිබල් පාඨයක් ලෙසින් හදිසියෙන් මතු වී සිටී. ශෝචනීය ලෙස විපාක විඳින්නට සිදු වූ මේ පරවම්භන කර්මය පිළිබඳ නිදසුන්වල එළියෙන් බලන විට "නුඹ මෝඩයෙකැයි කියන්නා නිරා ගින්නේ අනතුරේ සිටී." යන යේසුතුමාගේ අනෙක් වදන් ද හදිසියෙන්ම අලුත්, ගැඹුරු මනෝවිද්‍යාත්මක අර්ථයක් ලබා ගන්නා බව පෙනී යයි.

---

1. Psalmist

## 6

# අමතර විවරණයෙක්

කේසිගේ ලිපිගොනු හොඳින් පරීක්ෂා කිරීම නිසා මිනිස් දුක පිළිබඳ ව අපට ලැබෙන දෘෂ්ටිය ඉතා විශාල ය. ඒ දෘෂ්ටිය වෛද්‍යවරුන්, මානසික වෛද්‍ය විද්‍යාඥයන්, මනෝ විද්‍යාඥයන් හා සමාජ සේවකයන් විසින්, පිහිට පතා තමන් වෙත පැමිණෙන පුද්ගලයන් පිළිබඳව තබා ගනු ලබන සිද්ධි ඉතිහාස ලිපිගොනු සියල්ල එකට ගත් විට ලැබෙන දෘෂ්ටියට ද වඩා විවිධත්වයෙන් හා ප්‍රමාණයෙන් විශාල ය. මෙය අතිශයෝක්තියක් ලෙස පෙනෙතත් එසේ නොවේ. පිළියම් යෙදීම සඳහා සැලකිල්ලට ගනු ලබන මේ සියලු ක්ෂේත්‍ර පමණක් නොව අමතක ව ගිය අතීත ශත වර්ෂ සිය ගණනෙක දුෂ්ටකම්, වැරැදි, මෝඩකම් හා වේදනා ද කේසි ලිපි-ගොනුවලින් දක්වෙන මිනිස් දුකට ඇතුළත් වේ.

වැඩි වශයෙන් කේසිගේ උදව් සොයා ගියේ රෝගීන් හා පීඩා විඳින්නන් නිසා, කේසි ලිපි ගොනුවල කර්මයේ නරක පැත්ත වඩා පැහැදිලිව ඇත. සනීපයෙන් සිටින මිනිසාට වෛද්‍යවරයකු ගෙන් උපදෙස් අසන්නට කරුණක් නැත. පරිසරය හොඳින් ගැළපෙන මිනිසකුට ජීවිතයේ පරමාර්ථය

කිමෙක් දැයි ඇසිය යුතු යයි සිතෙන්නේ ඉතා කලාතුරකිනි. මෙසේ කේසි කියැවීම්වලින් වැඩි හරියක් කර ඇත්තේ වෛද්‍යවරුන්, මනෝවිද්‍යාඥයන් හා ආගමික ගුරුවරුන් විසින් නො විසඳන ලද බෙහෙවින් නිශ්චිත වූ ද ඇතැම් විට භයානක වූ ද පෞද්ගලික වූ ගැටලු තුබූ පුද්ගලයන් සඳහා ය.

වෛද්‍යවරුන්ගේ හා මානසික වෛද්‍ය විද්‍යාඥයන්ගේ පුද්ගල ඉතිහාසවල සාමාන්‍යයෙන් නැති, විශේෂ ලක්‍ෂණයෙක් කේසි කියැවීම්වල තිබේ. එනම්, දුකෙහි ඇති වැදගත්කම ආචාර ධර්ම වශයෙන් හා ආධ්‍යාත්මික වශයෙන් පැහැදිලි කර දීම ය. කේසි කියැවීම්වල මෙය නො තිබුණා නම්, මේ කියැවීම් හැදෑරීම අතිශයින් ශෝක ජනක වන්නට ඉඩ තිබිණි. මේ නිසා කේසි කියැවීම් කියවන විට කෙනකුට ඇති වන්නේ දන්තේගේ[1] නරකයේ හා ශුද්ධාග්නිස්ථානයේ [2] විස්තරය කියවන විට, ලෝකයේ උත්කෘෂ්ටත්වය පිළිබඳව ඇති වන හැඟීම බඳු හැඟීමෙකි. වෙනස නම්, එහි දී දන්තේගේ මධ්‍ය කාලීන දේවධර්ම සීමා නිසා අවශ්‍ය වන බුද්ධිය හකුළුවා ගැනීම මෙහි දී අවශ්‍ය නො වීම ය. කේසිගේ කියැවීම්, ආචාර ධර්මමය වූ ද සර්ව සාධාරණ වූ ද සුබෝධ වූ ද ආකාරයෙකින් දුක දිගට ම අගය කරයි. ඒවා හැදෑරීම ඉවැසිය හැක්කක් වන්නේ ඒ නිසා ය. මේ, කියැවීම්වලට බොහෝ විට, හේතු වී ඇත්තේ කිසියම් රෝගයක් හෝ විකෘතියක් හෝ වන නමුදු ඒවා ඉවැසිය හැකිවා පමණක් නොව මනෝහර ද සමුත්තේජක ද අභිප්‍රාය සාධක ද වේ.

කෙසේ හෝ, කේසිගේ ලිපි ගොනුවල ඇති සියලු කර්ම විපාක නිදර්ශන, ප්‍රාර්ථනා භංගයේ හා අස්වාභාවිකත්වයේ නිදසුන් නොවේ. මනුෂ්‍ය ශක්තිය, කෞශල්‍යය, විශිෂ්ට සාමාර්ථ්‍ය හා කවර වර්ගයෙක හෝ විශිෂ්ටත්වය, ඒ පිළිබඳ වූ

1. දන්තේ නම් 13 - 14 ශත වර්ෂවල ජීවත් වූ ඉතාලි කවියෙකි. ඔහුගේ ප්‍රසිද්ධ කෘතිය "The Divine Comedy"
2. Purgatory

ම හොඳින් ගත කරන ලද අතීත ජීවිතවල කර්ම දායාද බව වෘත්තිය උපදේශ පිළිබඳ නිදසුන්වලට පැමිණි විට අපට පසු ව දක්නට ලැබේ.

හිතවත් වූ පරිසරයත්, සුවපත් ශරීරයත් පුණ්‍ය කර්මයන්ගේ ප්‍රතිඵල ය. එහෙත් බොහෝ විට කියැවීම්වලින් මේවායේ කර්ම හේතුව දක්වා නැත. සමහර විට මෙසේ වන්නට ඇත්තේ, මේ තොරතුරුවල මූලාශ්‍රය, හොඳ ප්‍රවෘත්ති පත්‍ර වාර්තාකරුවකු මෙන් ක්‍රියා කළ නිසා විය හැකි ය. හොඳ වාර්තාකරුවකු ක්‍රියා කරන්නේ ආරංචියේ වටිනාකම ඇත්තේ සම්පත්තිවල නොව විපත්තිවල යයි සිතා ගෙන ය. කියැවීම් ලබා ගත් අයට ද භාග්‍යයට විවරණයක් අනවශ්‍යය යන පොදු මිනිස් හැඟීම තිබිණි. මනුෂ්‍යයා සහජ වශයෙන් ම හිතන්නේ භාග්‍යය තම උරුමය බවයි. එය සිදු වූයේ කුමක් නිසා ද යි අසන්නේ විපතක් සිදු වූ විට පමණි.

එසේ ම රූප සෞන්දර්යය ද පුණ්‍ය විපාකයෙකි. වර්තමාන රූප සම්පන්න ශරීරය, ආත්මයේ දේවාලය වන ශරීරයට අතීතයෙහි දී මනා කොට සැලකීම නිසා ලැබෙන ප්‍රතිඵලයක් බව සාමාන්‍ය වශයෙන් මේ කියැවීම්වලින් දක්වා තිබේ. රූප සම්පත්තියේ හේතුව වශයෙන් වෙනත් කර්මයක් ගැන කියන නිදසුනෙක් ද තිබේ. එනම් නිව්යෝක් ආදර්ශිකාව[1] පිළිබඳ සිත් කාවදින නිදසුනයි. මේ තැනැත්තියගේ අත් අතිශයින් සුරූපී නිසා තම දූන්විම්වල අත්වල රූප පළ කරවන තිය ආලේපන වෙළෙන්දෝ ද අත් දෙවුන් වෙළෙන්දෝ ද ආභරණ වෙළෙන්දෝ ද ඇගේ පිහිට සොයති. ඇගේ මේ අත්වල සුන්දරත්වයේ කර්ම හේතුව සිදු වී ඇත්තේ මීට පෙර ආත්මයේ දී ය. එකල ඕ ඉංග්‍රීසි මඩමෙක තවුසියක් වූවා ය. ඇගේ කාලය

1. Model (මෙහි දී මේ වචනයෙන් අදහස් කෙරෙන්නේ වෙළඳුන්ගේ වස්ත්‍රාභරණවල අගය දක්වීමට ඒවා පැළඳ සිටින්නට යොදා ගනු ලබන ස්ත්‍රියකි.)

ගත වූයේ කැළිකසළ අතපත ගෑමේ අප්‍රිය වූ කාර්යය කිරීමෙනි. ඈ මේ කටයුතු කොතරම් පරාර්ථකාමයේ හා සේවයේ හැඟීමෙකින් කළා ද යතහොත් ඇගේ ආත්මය ශුද්ධත්වයට පත්ව අත්වල හා ශරීරයේ අතිවිශේෂ සුන්දරත්වයෙක් ඇති වී තිබේ.

රූප සම්පත්තිය කැමැත්තවුනට මෙහි ඇත්තේ දිරිගන්වන සුලු නිදසුනෙකි. මෙයින් කර්ම විපාක සියල්ල ම ලැබෙන්නේ අපට පාඩම් ඉගැන්වීමට හා බාධා පැමිණ වීමට පමණක් නොවන බව ද දක්වෙයි. බොහෝ විට කර්මයේ දඬුවම් දෙන අංශයේ නිදසුන්, එහි හිතකර පක්ෂයේ නිදසුන්වලට වඩා කාවදිනසුලු ය. සාමාන්‍යයෙන් වල්මත් ව සිටින, ආචාරයෙන් බංකොළොත් ලබා ඇති, මේ කාලයේ ආකල්පයට වැඩියෙන් අවශ්‍ය වන්නේ ද එයයි. බුද්ධිමත් මිනිසුනට ජීවිතය සඳහා බුද්ධි ගෝචර සදාචාර ප්‍රතිෂ්ඨාවක් තිබිය යුතු ය. විවේචක ශික්ෂණයෙන් යුත් විද්‍යා ප්‍රිය නවීන මිනිසා ආගමේ පුරාතන ලබ්ධි පිළිගන්නේ නැත. මේ නිසා පරම්පරාගත අනුදැනීම් හා ආදර්ශ, බිඳී ගොස් තිබේ. එහෙත් ඒවායේ ස්ථානය ගැනීම සඳහා විද්‍යානුකූල ව පිළිගත හැකි අලුත් මත පහළ වී නැත.

දෙවියන් වහන්සේගේ පුත්‍ර වූ ක්‍රිස්තුස් වහන්සේ අන්‍යයන් වෙනුවෙන් දඬුවම් විඳි බව ක්‍රිස්තියානි දේව ධර්මයෙන් ඉගැන්වෙයි. මේ දේව ධර්මයෙන් බටහිර ලෝකයේ සදාචාර සංඥාව ගත වර්ෂ විස්සක් විතර ම මොට කොට ඇත. මිනිසකු වූ ක්‍රිස්තුස් වහන්සේ නිසා ඇති වූ අතිවිශාල බලපෑම් හා පුදුම සිදුවීම් හමුවෙහි දී සංශයවාදීන් පවා එක්තරා අර්ථයෙකින්, ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බවත් ඒ උදාර මහා කාරුණිකයා මනුෂ්‍යයාගේ මුක්තිය සඳහා ජීවත් ව අපවත් වූ බවත් විශ්වාස කරනු ඇත. ඉතා කුඩා පරමාණුව තෙක් වූ විශ්වයේ පවත්නා හැම දෙයක් ම දෙවියන් වහන්සේ නම් වූ

එක් ප්‍රධාන ශක්තියක් තුළ වූ පොදු මූලාශ්‍රයෙක මාර්ගයෙන්, විශ්වයේ ඇති අන් හැම ජීවිතයකට ම සම්බන්ධව ඇතැයි වැඩි වැඩියෙන් සිතීමට මිනිසුන් පටන් ගෙන ඇත. මෙය සිදු වී ඇත්තේ නවීන භෞතික විද්‍යාවේ දියුණු වීම්වල ආලෝකය නිසා ය. මේ මතයට අනුව සියලු ජීවි වස්තූනුත් සියලු ස්ත්‍රී පුරුෂයනුත් එක් මධ්‍යගත සූර්යයකුගෙන් නික්මෙන කිරණ මෙන්, දෙවියන් වහන්සේගේ දරුවන් යයි නිගමනය කිරීමට සිදුවන බව පෙනේ. මෙසේ යේසුස් නමැති පුද්ගලයා අපෙන් වෙනස් වෙන්නේ එතුමා, අපට වැඩියෙන් මේ මධ්‍යගත ආලෝකයට ආසන්න නිසා යයි සිතන්නට සිදු වේ.

තව ද මිනිසුන් නිදහස් කරනු සඳහා ක්‍රිස්තුස් වහන්සේ කළ ජීවිත පරිත්‍යාගය, ඉතිහාසයේ ඇති ඒ වර්ගයේ එක ම නිදර්ශනය නොවේ. අන්‍ය මනුෂ්‍ය වර්ගයන් අතර ද මිනිසාගේ මුක්තිය සඳහා දුක් වින්දා වූ ද මරණයට කැප වූ ද වෙනත් ගැළවුම්කාරයන් ඇති බව තුලනාත්මකව අන්‍ය ආගම් හැදෑරීමේ දී අපට දැන ගන්න ලැබේ. අපේ බටහිර සංස්කෘතියේ ම විඥානවාදීන් [1] බොහෝ දෙනකුන් මනුෂ්‍ය වර්ගයා සඳහා සිය කැමැත්තෙන් ම ජීවිත පරිත්‍යාග කර ඇත. අනෙක් මිනිසුන්ගේ මුක්තිය තකා ජීවත් ව මිය ගිය ස්ත්‍රී පුරුෂයන් වන මැසිනි [2], බොලිවාර් [3], ලින්කන් [4], සාන්ත ප්‍රැන්සිස් [5], තුසේන් ලුවෙර්ච [6], සෙමෙල්වෛස් [7] හා සාන්ත තෙරේසා [8] හා තවත් සිය ගණනකට වැඩි දෙනෙක් ඇත්තාහ. එහෙත් ඔවුන්ගේ උත්සාහය නිසා අප උත්සාහ නො කළ යුතු යයි හෝ ඔවුන්ගේ පරිත්‍යාගය නිසා අපගේ අපරාධවලින් අප නිදහස් වෙනැයි හෝ සිතන කෙනෙක් නැත.

1. Idealist
2. Mazzini
3. Bolivar
4. Lincoln
5. St. Francis
6. Tousaint L'Ouverture
7. Semmelweiss
8. St. Teresa

ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා ය යන්නත් උන්වහන්සේ මනුෂ්‍යයාගේ මෝක්ෂය තකා අපවත් වූහ යන්නත් ලබ්ධියක් බවට හරවා ගෙන මෝක්ෂය ලැබීම ඒ ලබ්ධිය විශ්වාස කිරීම මත රැඳුනක් කර ගැනීම මහා මානසික අපරාධයක් වී ඇත. මේ අපරාධය දේව ධර්මකාරයන් විසින් කරන ලද්දක් මිස ක්‍රිස්තියානියේ අපරාධයෙක් නොවේ. මෙයින් මෝක්ෂය සඳහා ඇති වගකීම, අපෙන් බාහිර වූ යම් කිසිවක් මත තබනු ලැබේ. මෝක්ෂය, අපේ ම ස්වාභාවික දිව්‍යත්වය කෙරෙහි වූ විශ්වාසයෙක මාර්ගයෙන් ඇති වන ආත්ම සංස්කරණයක් මත නොව අන්‍ය පුද්ගලයකුගේ දිව්‍යත්වය පිළිබඳ විශ්වාසය මත තබනු ලැබේ. ඒ නිසා එය මානසික අපරාධයක් වී තිබේ. අනුන් වෙනුවෙන් දුක් විඳි බව පිළිබඳ විශ්වාසය අවශ්‍යය කියන නිසාත්, එය විශ්වාස නො කිරීමට ඇති දඬුවම, සදාකාලිකව නරකයට කැපවීම යයි කියන නිසාත්, එය යුක්ති ධර්ම සංඥාවත් මනෝවිද්‍යාත්මක සත්‍ය සංඥාවත් විනාශ කර දමයි. භෞතික හා මානසික විද්‍යාවන් හි තද ශික්ෂණයෙකින් යුක්ත වූ විසි වැනි ගත වර්ෂයේ සිත්වලට එබඳු ඉගැන්වීමෙක් සත්‍ය යයි පහසුවෙන් ඒත්තු නො යයි.

කිතු සමයේ උග්‍ර දේව ධර්මය බාධකයක් වී තිබුණත්, කිතු සමය ලෝකයේ යහපත සඳහා වූ විශාල බලයක් වී ඇති බව විවාද රහිත ය. තව ද අද ඇති වඩා ප්‍රබුද්ධ වූ ක්‍රිස්තියානි නිකාය මේ ලබ්ධිය නො පලල් ව ඒ ආකාරයෙන් ම උගන්වන්නේ නැත. එසේ ම ඒ විශ්වාසය ස්වර්ගයට ඇතුළු වීම සඳහා අවශ්‍ය වූ කොන්දේසියක් ලෙස පොදුවේ සලකන්නේ ද නැත. එහෙත් මුල දී පැවැති කිසි ම ලිහිල්කමක් නැති දේව ධර්ම ස්වරූපයෙන් මේ ආකල්පය නො පවත්නා තැන්වල පවා එහි සලකුණු තවම දක්නට ලැබේ. වගකීම අපගේ චරිතයේ සීමාවෙන් ඉවතට ගෙන, අන්ධ විශ්වාසය මත තබන ගතියෙක් තව ම ක්‍රිස්තියානි ලෝකයේ ඇත.

පුද්ගලයාගේ මෝක්ෂය සඳහා චරිතයේ ඇති අති විශාල වැදගත්කම, කර්මයේ හා පුනර්භවයේ නියාම ධර්ම හදාරන විට, ඉතා හොඳින් පැහැදිලි වෙයි. මේ නිසා බොහෝ ක්‍රිස්තියානි නිකාය වලට වැළැඳී ඇති පාණ්ඩු රෝගයට හොඳ පිළියමක් පුරාතන ප්‍රඥාවෙන් සපයා දී ඇත. කේසීගේ කියැවීම් අනුව, අප මෙහි දී කියා ඇති කර්ම නියාම ධර්මයේ ඇති, දරුණු ශික්ෂක අංශය, පුනර්ජන්මය ගැන අදහන්නට පටන් ගන්නවුන්ගේ ඛේදයට හේතු විය යුතු නොවේ. එය හේතු වන්නේ බලාපොරොත්තුවට, සර්ව ශුභවාදයට හා සියලු මනුෂ්‍ය ව්‍යාපාරයන් හි ඇති ලෝක යුක්තිය පිළිබඳ විශ්වාසය පදනම් කර ගත් නව ආගමික භක්තියකට ය.

විද්‍යාව, ආගමේ පදනම බිඳ දැමූ කල්හි, සදාචාරය සඳහා තිබූ යුක්තිය අතුරුදහන් වී යැයි ද මේ නිසා අපට, ආගමේ සිකපද වලින් බාධාවක් නැතිව, නිදහස් විය හැකි යයි ද සිතන්නවුනට මෙබඳු නිදසුන් බාධක විය යුතු ය. කෲරත්වයේ කර්ම විපාක වශයෙන් අන්ධත්වය, ලේ අඩුකම, ඇදුම හෝ පක්ෂාඝාතය ඇති විය හැකිය. පමණ ඉක්මවා කාම සේවනය කිරීම නිසා අපස්මාරය ඇති විය හැකි ය. ආත්මාර්ථකාමී ලෙස අන්‍යයනට බාධා කිරීම නිසා ශරීරාංග පණ නැති වීමට ඉඩ තිබේ. කර්ම නියාමයේ ඇති සංවේදී වූ ද විද්‍යානුකූල වූ ද අපාක්ෂික වූ ද උචිත වූ ද ක්‍රියාකාරීත්වය විදහා දක්වන මෙබඳු සිද්ධි නිසා අනෙකක් සිදු නොවූවත් මිනිසුන් සුචරිත වලට පෙළඹවීමවත් සිදුවනු ඇත.

තව ද අපට දක්නට ලැබුණාක් බඳු වූ නිදසුන්වලින්, මේ මිහිපිට වාසය කරන පීඩා විඳින පුද්ගලයන් ලක්ෂ ගණනෙකගේ දුඃඛිත තත්ත්වය සඳහා විවරණයෙක් ඉදිරිපත් කෙරෙයි. අපට අඳ ගොළු බිහිරන් ද විකෘත වූ ශරීරාංග ඇත්තන් ද නන් වැදෑරුම් රෝගවලින් පෙළෙන්නන් ද දක්නට ලැබෙන්නේ

කලාතුරෙකිනි. ඔවුහු තම දුඃඛිත නිවාසයන්හි හෝ ලෙඩුන්ගෙන් පිරුණු රෝහල් වල හෝ සාමාන්‍ය මිනිසාට නො පෙනෙන සේ සැඟැවී සිටිති. ජනාකීර්ණ වීථිවල දී අපට අඩු පාඩු ඇත්තන් දකින්නට ලැබෙන්නේ ඉතා කලාතුරෙකිනි. ඔවුන්ගේ සංඛ්‍යාව කොපමණ දැයි අපට දැන ගන්නට ලැබෙන්නේ ඒ ගැන ලියැවුණු සඟරා ලිපි කලාතුරෙකින් කියවන විට එබඳු වූ මාර්ගයෙකිනි.

එහෙත් ඔවුන්ගේ සංඛ්‍යාව අති විශාල ය. තත්ත්වය ඉතා දුඃඛිත ය. අප බොහෝ දෙනා අපට ඇතැයි පිළිගන්නා වූ සාමාන්‍ය දේවලට අහිමි වූ විට මිනිසාගේ තත්ත්වය කොතෙක් දුඃඛිත දැයි තේරුම් ගැනීමට ඔවුන් ඇති බව අපට මතක් කර දිය යුතු ව ඇත. එබඳු දුඃඛිත තත්ත්වයන් පිළිබඳව ඇති සාමාන්‍ය ක්‍රිස්තියානි විවරණය කිමෙක් ද? "දෙවියන් වහන්සේගේ කැමැත්ත" යන්නෙන් දක්වෙන්නේ එයයි. එහෙත් අහිංසක පුද්ගලයනට, අනුකම්පනීය වූ පීඩා ඇති කරන කැමැත්තත් සර්ව සත්ත්ව හිතකාමී වූ පියාණන් වහන්සේ යන අදහසත් එකට ගළපා ලීම දුෂ්කර ය. මේ නිසා දේව කැමැත්ත "අචින්ත්‍ය" යයි සලකනු ලැබේ. එහෙත් මේ විශ්ලේෂණයෙන් මේ සත්‍ය වූ විරෝධය ඉවත් වන්නේ නැත.

"දෙවියන් වහන්සේගේ කැමැත්ත" ලෝකයේ සත්‍ය සිද්ධියක් වශයෙන් තිබිය හැකි නමුත් ලෝකයේ දුක අචින්ත්‍ය වූ අර්ථයක් හෝ හිතුවක්කාරකමක් හෝ නොවන බව පෙන්වමින් පුනර්ජන්ම වාදය මේ උභතෝකෝටික ප්‍රශ්න විසඳාලයි. එය ආධ්‍යාත්මික අභිප්‍රායයක් ඇති නියාම ධර්මයෙකි. ඊට අනුව දුක් විඳින්නේ දුක් විඳිය යුතු අය පමණි. කවර පුද්ගලයකුට වුවද තම අතීත ජන්මයෙහි දී රැස් කර ගෙන ඇතිවාට වැඩි වූ හෝ අඩු වූ හෝ දුඃඛ විපාකයක් විඳ ගන්නට නො ලැබේ.

බටහිර දායාදයට හුරු වූ මිනිසුනට පුනර්ජන්මය ගැන පළමු වරට අසන්නට ලැබුණු අවස්ථාවේ දී එය පිළිගැනීම

දුෂ්කර වෙයි. එය ඇදහිය නො හැක්කක් සේ පෙනෙන්නට වෙයි. එය දූනට නිරීක්ෂණය කර ඇත්තා වූ ද අනාගතයට නිරීක්ෂණය කළ හැක්කා වූ ද සීමාවන්ගෙන් ඔබ්බෙහි වූවක් සේ පෙනෙයි. එහෙත් අප නැවත වරක් වත් සිතා බලන්නේ නැති ව පිළිගෙන ඇති, විශ්වාස කළ නොහැකි වෙනත් කොතෙක් දේ අප ජීවිතවල තිබෙනවා ද? බිත්තරයෙක් ඉස්ගෙඩියකු සේ බිඳී පළමු ව මාළුවකු වී ඊළඟට ගෙම්බෙක් වෙයි. දළඹුවා තමා වටා පට කෝෂයක් ගොතා ගෙන ටික කලෙකින් ලස්සන සමනළයකු වී පිට වෙයි. මේවා එක ම ජීවිතයක් තම ඒකත්වය නසා නො ගෙන අනුක්‍රමයෙන් වෙනස් වූ භෞතික රූපයන්හි වාසය කිරීම පිළිබඳ පුදුම නිදසුන් ය. එහෙත් අපි, මේවා ප්‍රශ්නයක් නැති ව පිළිගනිමු. ගැඹුරින් සලකා බැලුව හොත් මනුෂ්‍ය ආත්මය තම ඒකත්වය නසා නො ගෙන වෙනස් වූ රූපයන්ගෙන් යුතුව උපදින්නේ ය යන්නට වඩා ඉහත සඳහන් සිද්ධි ස්වාභාවික නොවන බව පෙනෙනු ඇත. දාරකෝත්පත්තියේ සිද්ධි පවා අපේ අනුදැක්නවලින් අපට නො පෙනුණා නම් අප එකට එකතු වී සෛල රචනයේ දී ගණිත නියාමවලට අනුව ගුණිත වී අවසානයේ දී තම ජාතියේ අන්දෑකිම්ද උකහා ගැනීමෙන් පසුව ඇස්, කන්, අත්, පා යනාදී අංගයන්ගෙන් හා ඒවායේ මාර්ග දේශකත්වය සඳහා වූ මොළයෙකින් ද යුතු වූ මිනිස් සතකු නිපදවන්නේ ය යනු විට්මාන්ගේ විසිතුරු වචනවලින් කියන හොත්, ඒ ගැන සිතන විමසන්නවුන් දහස් ගණනෙකගේ විස්මයට හේතුවනු ඇත. ඒ නිසා ජීවිත පරම්පරාව එක් ජීවිතයකට වැඩියෙන් පුදුම ඵලවන්නෙක් නො වේ. වෝල්ටෙයාර් කී අයුරින් "අන්තිමට බලන විට දෙවරක් ඉපදීම එක් වරක් ඉපදීමට වඩා පුදුමයෙක් නො වේ."

මනෝවිද්‍යාත්මක වශයෙන් ද ආචාර ධර්ම වශයෙන් ද පිළිගත හැකි ස්වභාවයක් ඇති කේසිගේ ජීවිත කියැවීම්, අපගේ

නො අදහන ගතිය ටිකක් අඩු කරයි. ඉතා පුදුම ලෙසින් ඇති වූ ද පුදුම ලෙසින් දී ඇත්තා වූ ද මේ ලේඛන, අපගේ ප්‍රත්‍යක්ෂ කිරීමේ සීමාවෙන් අප ඔසවා අනෙකකට ගෙන යන වාහන වශයෙන් සැලකිය හැකි ය. මුහුදු පතුලේ සිටින මාළුවෝ වායුව යයි දෙයක් ඇති බව නො දනිති. අපිත් මාළුවන් වැනි වෙමු. ඇතැම් විට මේ ලේඛන කොතෙක් අරුම පුදුම වුවත්, ජීවාට ජීවත් වන ලෝකයට වඩා විශාල වූ ලෝකයකුත් අප මෙතෙක් අනුමාන කර ඇති බව අපට ඉගැන්විය හැකි වනු ඇත.

# 7

# පසු වී විපාක දෙන කර්ම

දැනට ම විමසිල්ලට ලක් කොට ඇති, කායික විපාක දෙන කර්මවල දක්නට ලැබෙන පුදුම ගතියෙක් නම් එක් ජීවිත කාලයක් හෝ වැඩි ගණනක් ගෙවී යෑමෙන් පසු ව විපාක දීමයි[1] එක්වර ම විපාක නොදී මෙසේ පසු ව විපාක දීම අවශ්‍ය වන්නේ කවර හෙයින් ද යන ප්‍රශ්නය මතු වෙයි. කර්මයෙක විපාකය, බිත්තියකට ගැසූ බෝලයක් ආපසු එන ඉක්මනින් නො ලැබිය යුත්තේ කවර හෙයින් ද ?

මේ ප්‍රශ්නයට උත්තර කීපයක් ඇති බව පෙනේ. තමා විසින් රැස් කරන ලද කර්මයේ විපාක විඳීමට සුදුසු කාලයක් හා දේශයක් පැමිණෙන තුරු ආත්මය බලා සිටිය යුතු ය යනු එක් පිළිතුරෙකි. ඇතැම් විට එබඳු සුදුසු කාලයක් එන්නට ශත වර්ෂ ගණනාවක් ඉකුත් වන්නට ඉඩ තිබේ. එසේ වුවහොත් අතරතුර වූ කාලය චරිතයේ වෙනත් ගැටලු විසඳා ගැනීම සඳහා යෙදිය යුතු වෙයි. මෙසේ පසු වී විපාක දෙන කර්ම පිළිබඳ නිදසුනෙක්, දැනට විනාශ වී ගොස් ඇති අත්ලන්තිස මහාද්වීපයේ කලින්

1. න හි පාපං කතං කම්මං - සජ්ජු ඛීරංව මුච්චති
ඩහන්තං බාලමන් වෙති - භස්මච්ඡන්නෝ'ව පාපකෝ

ජීවත් වූ පුද්ගලයන් පිළිබඳ ව කේසි කියා ඇති තොරතුරුවල දක්නට ලැබේ.

අත්ලන්තික් සාගර පතුලෙහි මේ පැරණි විශාල මහාද්වීපය ඇද්ද නැද්ද කියා තව ම හරි හැටි විද්‍යාවෙන් ඔප්පු වී නැත. එහෙත් ඓතිහාසික වූ ද, භූවිද්‍යාත්මක වූ ද සංස්කෘතික වූ ද සාධක පදනම් කොට ගෙන එහි පැවැත්ම පිළිබඳ ව කරනු ලබන තර්කය තරමක් ප්‍රබලය. ඓතිහාසික වශයෙන් ඒ ගැන තොරතුරු ලබා ගැනීමට ඇති ප්‍රධාන මූලාශ්‍රය ප්ලේටෝ ය. ප්ලේටෝ, ක්‍රිටියස් [1] හා තිමේවුස් [2] නම් වූ තම සංවාදවල දී ඒ ගැන විශ්වාසයෙන් යුතු ව සඳහන් කරයි. අත්ලන්තික් සාගරය හරහා කම්බියක් අදින විට එය එක්වර ම අඩි දස දහසෙක පමණ ප්‍රපාතයකට ගියේ ය. එය මතු පිටට ගත් විට, ලෝදිය ගල්කුඩු වගයක් එහි රැඳී තිබෙනු දක්නට ලැබිණි. සියුම් ව පරීක්ෂා කළ විට මේ ගල් කුඩු, ජලයෙන් මතුපිට ගොඩ බිමෙහි දී ඝන වූ ඒවා බව පෙනී ගියේ ය. භූ විද්‍යාත්මක සාක්කිවලින් නිතර සඳහන් කරනු ලබන්නේ මෙයයි. සිත් ගන්නාසුලු සංස්කෘතික සාධකයන් අතර මුල් තැන ගන්නේ සර්ව සාධාරණ වූ ජල ගැල්මේ කථාන්තරයයි. (එය බයිබලයෙහි පමණක් නොව ලෝකයේ ප්‍රාථමික මනුෂ්‍ය වර්ගයන් සියලු දෙනාගේ ම වාගේ ඇති පුරාවෘත්තවල හා ආගම්වල දක්නට ලැබේ.) දෙවන තැන ගන්නේ ඊජිප්තුව හා මධ්‍යම අමෙරිකාව අතර සම්බන්ධයක් පැවැති බව දැන ගන්නට නැති කාලයෙක දී ඒ දෙරට අතර භාෂාවෙන් හා ගෘහ නිර්මාණ ශිල්පයෙන් ආසන්න සමානත්වයක් තිබීමයි. සියලු සාධක එක් කොට ගත් විට කිසිසේත් තීරණාත්මක නොවන නමුදු, ඉහත කී මතය ඒත්තු ගන්වනසුලු ය.

ඒ කෙසේ වුවත්, කේසි කියැවීම් පිළිගන්නවා නම් අත්ලන්තිසය පැවැති බව සහතික ය, කේසි කියැවීම්වලට අනුව

1. Critias 2. Timaeus

කිසියම් දිනයෙක දී, මහා පිරමිඩයේ විවෘත නොකරන ලද කාමර කොටසෙකින් අත්ලන්තිසයේ ඉතිහාසයේ හා සභ්‍යත්වයේ සම්පූර්ණ වාර්තා හෙළි කෙරෙනු ඇත. තුන්වැනි වූත් අන්තිම වූත් විපත්ති සමයෙහි දී හෙවත් ක්‍රි. පූ. 9500 දී පමණ විපතට නියම වූ ඒ මහාද්වීපයේ පදිංචිකරුවන් කොටසක් ඊජිප්තුවට පැන යන විට මේ වාර්තා එහි ගෙන යන ලදැයි කේසි කීවේ ය. ෆ්ලොරිඩාවේ මියැමි නගරය ආසන්නයේ ඇති බිමිනි දිවයින අත්ලන්තියානු කඳු මුදුනෙකැයි ද කේසි කියා ඇත. මෙහි මුහුදු පතුලෙහි අත්ලන්තියානු දේවස්ථානයෙක කදිම නිදසුනක් ඇතැයි ද කියන ලදී. එහි ශිඛරගෝලාර්ධය, විශේෂයෙන් පිළියෙළ කරන ලද පළිඟු මාර්ගයෙන් සූර්යයාගේ ශක්තිය අල්ලා ගන්නා ලෙස තනන ලද්දෙකි. කියැවීම්වලට අනුව අත්ලන්තියානීහු විද්‍යා කාර්යක්ෂමතාවෙන් අපට වඩා දියුණු ව සිටියහ. විදුලි බලය, රේඩියෝව, ටෙලිවිෂනය, අහස් ගමන, සබ්මැරීන හා සෞර්ය බලයත් පරමාණු බලයත් මෙහෙයට ගැනීම යන මේවා ඔවුනතර ඉතා දියුණුව පැවැත්තේ ය. ඔදුනට තුබූ, උණුසුම් කිරීමේ, එළිය කිරීමේ හා බර ගෙන යැමේ මාර්ග අපට දැනට ඇති ඒ මාර්ගවලට වැඩියෙන් කාර්යක්‍ෂම විය.

මේ සියල්ල ම ඇත්තට බාර ගත්තත් නැතත්, මේ තොරතුරු අතිශයින් සිත් ගන්නා බව නම් සත්‍ය ය. මේවා සත්‍ය ලෙස බාරගනු ලැබේ නම් සඳහන් කළ යුතු වැදගත් කරුණෙක් ඇත. එනම් අත්ලන්තියානුන් විසින් දියුණු කරන ලද ශක්තීන් වරදවා යෙදීම නිසා ඔවුන් දූෂිත වූ බව කියැවීම්වලින් නැවත නැවතත් අවධාරණය කර තිබීමයි. ඔව්හු විද්‍යුත් හා චෛතසික බල යොදා මහා දුසිරිත් කොටසක් කළහ. විශේෂයෙන් ම ඔව්හු, බලයෙන් වැඩ ගැනීමට නැතිනම් ලිංගික සන්තර්පණය සඳහා අන්‍යයන් වහලුන් කරගැනීමට කිසියම් වර්ගයෙක වශීකරණයක් භාවිත කළහ.

මේ විස්තරය සත්‍ය ලෙස පිළිගතහොත් විදුලි බලයත් රහස් ඥානය හා මනෝවිද්‍යා-ඥානයත් නො පැවැති කාලවල දී මේ දුශ්චරිතවලට සම්පූර්ණ විපාක ලැබීමට ඉඩක් නැති බව තේරුම් ගත හැකි වෙයි. මිනිසා කෑදරකම ජය ගෙන ඇද්දැයි දැන ගැනීමට ඇති අවසාන පරීක්ෂණය නම් ඔහු නැවත ඔහුගේ ප්‍රියතම ආහාරයන්ගෙන් වට කොට තබා කෑමේ දී පමණ ඉක්මවනවා දැයි බැලීම ය. කමනීය වූ වනිතාවන් අතරත සිටින මිනිසකු සාන්ත අන්තෝනිගේ දැඩි අධිෂ්ඨානය බඳු අධිෂ්ඨානයෙකින්, තමාට ඇති වන කාමුක චේතනා යටපත් කර නො ගනී නම් තව ම ඔහු කාමුකත්වය ජය ගෙන ඇතැයි කිව නො හැකි ය. එමෙන් ම දියුණුවේ මුදුනට ම නැඟ තුබූ අත්ලන්තියානු විද්‍යාවෙන් තමන් සතු කොට දෙන ලද මහා බල වරදවා යෙදූ පුද්ගලයනට, යහපත් කටයුතුවලටත් යෙදවිය හැකි එබඳු ම අවස්ථාවක් ලැබෙන තාක් ඔවුන්ගේ ආත්මාර්ථකාමයත් බලකාමයත් වෙනස් කර ගෙන ඇතැයි කිව නො හැකි ය.

ඉතිහාසයේ චක්‍රාකාර ප්‍රගතිය නිසා වියි වැනි සියවස එබඳු ම කාලයක් වී තිබේ. මේ නිසා විශාල සංඛ්‍යා වශයෙන් අත්ලන්තියානුන් මේ කාලයෙහි උපදින බව කේසි කියැවීම්වලින් අපට දක්නට ලැබේ. මීට අනුව, විස්මය ජනක වර්තමාන කාර්මික විද්‍යාව, අංශ දෙකෙකින් තේරුම් ගත හැකි වෙයි. පළමු කොට ම එය අත්ලන්තියානු දක්ෂකම් පිළිබඳ මතකක් ඇති පුද්ගලයන්ගේ නිෂ්පාදන කුශලතාවේ ප්‍රතිඵලයක් ලෙස තේරුම් ගත හැකි අලුත් පෙළැඹීම්වලට ඔරොත්තු දෙන ගුණ ඒ පුද්ගලයන් විසින් අතරතුර වූ ශත වර්ෂවල දී ලබා ඇද්දැයි විනිශ්චය කිරීමට සුදුසු පරීක්ෂණ ක්ෂේත්‍රයක් ලෙසින්, එය තේරුම් ගත හැකි ය.

මේ නිසා සුදුසු සංස්කෘතික යුගයක් පැමිණෙන තාක් බලා සිටීමේ අවශ්‍යකම, කර්මවලට පසු වී විපාක දෙන්නට

සලස්සන ප්‍රධාන සාධකයක් වන බව පෙනේ. කාලයක් තිස්සේ විපාක නොදී කර්ම මෙමයේ නතර වී තිබීම, එක් අතෙකින් ඉතිහාසයේ චක්‍රාකාර සංවර්ධනයටත් අනෙක් අතින් ආත්ම සමූහයන් මේ මිහිපිට ශරීරවත් වීමේ හා නො වීමේ යුග පිළිබඳ රිද්මයානුකූල මාරු වීමටත් සම්බන්ධ බව පෙනේ.මනුෂ්‍ය ජාතීන්ගේ මහා ප්‍රවාහවල නැවත මෙලොවට පැමිණීම පිළිබඳ රිද්මයානුකූල අනුක්‍රමයක් අනුගමනය කරන්නට හැකි වීම යුක්ති සහගත ය. මහා තරංගයන් තුළ කුඩා සමූහයන්ගේ ඉපැදීමත් කුඩා සමූහයන් තුළ පුද්ගලයන්ගේ ඉපැදීමත් යන දෙක ම තනි කර යාන්ත්‍රික වූ රිද්මයක් ඇති පූර්ව නියතියෙකින් නිශ්චිත ව නැති බව කේසි කියැවීම්වල ඇති නොයෙක් ඡේදවලින් පෙන්වනු ලැබේ. ආත්මත්, ආත්ම සමූහත් කැරකෙන දොරෙක ඇති ස්වයංකාරී ක්‍රමිකත්වයෙන් යුතු ව, පෙරළා පැමිණෙන්නේ නැත. ලෝකයේ හැම තැනෙක දී මෙන් මෙහි දී ද නිදහස් කැමැත්ත ක්‍රියාත්මක වෙයි. අවශ්‍ය නම් ආත්මයකටත් ආත්ම සමූහයකටත් මෙලොව ඉපැදීම සඳහා සම් යම් කාල තෝරා ගත හැකි ය.

දැන් මෙය තවත් පැටැලිල්ලකට හේතු වෙයි. කිසියම් ආත්මයකට වෙනත් ආත්මයක් හෝ ආත්ම සමූහයක් හෝ සම්බන්ධ කොට ගෙන ගුණ ධර්ම පක්ෂයෙන් කිසියම් ගනුදෙනුවක් කර ගත යුතු ව ඇති නම් ඒ ආත්මයට තම ඉපැදීම පමා කරන්නට සිදු වනු ඇත. එසේ කළ යුතු වන්නේ අනෙක් ආත්මයන් විසින් ඉපැදීම සඳහා තෝරා ගන්නා වූ කාලය සමග ගැළැපෙනු සඳහා ය. ඒ පමාව ඉතා දික් වේ නම් අතරතුර වූ කාලයේ දී තම දියුණුවේ අනෙක් අංග පිළිබඳ ව කටයුතු කිරීමට යොමුවීම නුවණට හුරු බව පෙනෙනු ඇත. කර්ම පසු වී විපාක දීම නමැති තත්ත්වය ඇති වන්නේ මේ නිසා ය.

මේ සාමාන්‍ය නියාම, විද්‍යානුකූල වූ නිශ්චිතත්වයෙකින් යුතු ව තනා ගත නොහැකි බව සත්‍ය ය. එහෙත් මේවා යෝජනා කරන ලද්දේ කේසි කියැවීම්වල නොයෙක් තැන විසිරී ඇති කරුණු පදනම් කර ගෙන ම ය.

ඉහත සඳහන් කරන ලද සාධකවලින් දැක්වෙන්නේ කර්ම විපාකය පමා කරන බාහිර කරුණු පමණි. එහෙත් අභ්‍යන්තර කරුණු නිසා ද එය නිශ්චය වන බව පෙනේ. විපාක විඳින්නාට ඊට මුහුණ දීමට තරම් ශක්තියක් තිබිය යුතු ය යන සිද්ධාන්තය ද ඉහත කී කරුණුවලට වැඩියෙන් නැති නම් එපමණකට වත් වැදගත් වන බව පෙනේ. අවශ්‍ය වී ඇති ප්‍රතිපාක්ෂික ගුණ ඇති කර ගැනීමට ආත්මයට සුදුසු අවස්ථාවක් දිය යුතු ය.[1] එසේ නැතහොත් කර්මය පිළිබඳ වගකීම දියුණුවට නොව පරිහානියට හේතු වන තරමට බරපතල වනු ඇත.

තම ආබාධයේ මුල ජීවිත කීපයකට පෙර ඇති වූවක් බව කේසිගේ කියැවීම්වලින් දැන ගත් කීප දෙනෙක් කර්ම විපාකය එසේ නතර වී තිබීමේ හේතුව ගැන කුතුහලයක් දැක්වූහ. පසුව කරන ලද කියැවීමෙක දී මේ ගැන ප්‍රශ්න කළ සියලු දෙනාටම ලැබුණේ සාරාංශ වශයෙන් පස්වන පරිච්ඡේදයෙහි සඳහන් කරන ලද ශකාර තරුණියට ලැබුණු පිළිතුර ම ය. ඇය ඇසුවේ "රෝමන් යුගයේ දී සිදු කරන ලද කර්මයකට විපාක විඳීම සඳහා ආත්මය මේ ජන්මය වන තෙක් සිටියේ කවර හෙයින්ද?" යනු ය. "ඊට කලින් එය කර ගත නො හැකි වූ නිසා ය" යනු ලැබුණු පිළිතුරයි. තැනට අනුව මේ නොහැකි වීම බාහිර බාධකයක් නිසා නොව අභ්‍යන්තර කාරණයක් නිසා වූ බව පැහැදිලි ය. පීඩා විඳින්නන් පිළිබඳ මේ නිදසුන්, හොඳින් පරීක්ෂා කර බලන විට, හොඳ ගති ගුණ කොටසක් ඇති කර ගැනීමට

1. පරිවර්තකයන්ගේ දැනීමට අනුව මේ කරුණු බෞද්ධ කර්ම විස්තරයට අනුකූල නැත. බෞද්ධ මතයට අනුව කර්මයෙහි තරුණමක යාන්ත්‍රික ගතියෙක් තිබේ. මේ විස්තරයෙහි දේවවාදී ස්වරූපයෙක් ඇත.

අවශ්‍ය අත්දැකීම් ලබා ගනු පිණිස අනතුරුව වූ ජීවිත අවශ්‍ය බව පෙනී යයි.

නිදසුන් වශයෙන්, රිය අනතුරෙකින් තුවාල ලත් ඉහත සඳහන් කළ දාසය හැවිරිදි තරුණයාගේ සිද්ධිය ගත හොත් ඔහුගේ කර්ම බීජය වපුරන ලද්දේ පැරණි රෝමයේ දී බව අපට දක්නට ලැබේ. කෙසේ හෝ ඇමෙරිකානු විප්ලව යුගයේ දී ලැබුණු අත්දැකීමෙන් ධෛර්යයේ, සන්තුෂ්ටියේ හා අත්පත් හැම දෙයක් ම හොඳට හරවා ගැනීමේ සද්ගුණ දියුණු කර ගැනීමට ඔහුට අවස්ථාව ලැබිණි. මේ ගුණ වර්තමානයේ දී පල දුන් කර්ම විපාක විඳ දරා ගැනීමට අවශ්‍ය ඒවා ය.

මුදල් ණය පිළිබඳ වූ ලෝක ව්‍යවහාර ක්‍රමයෙහි, මෙහි ලා උපදෙස් ලැබිය හැකි නිදසුනෙක් ඇත. බැංකුවෙකින් ඩොලර් පන්දහසක් ණයට ගන්නා මිනිසා ඊළඟ දිනයේ, සතියේ නැති නම් මාසයේ, එය ගෙවිය හැකි තත්ත්වයෙක නැත. ඇතැම් විට ඊළඟ අවුරුද්දේ දීත් ඔහුට එය ගෙවිය නොහැකි වනු ඇත. මේ නිසා ණයට ගත් තැනැත්තාට සෑහෙන තරම් ධන සම්පත් රැස් කර ගැනීමට කාලයක් දෙනු ලැබේ. ඊළඟ සතියේ දී ණය ඉල්ලීමේ තේරුමෙක් නැත. ඔහුට ගෙවන්නට මුදල් නැති බව පැහැදිලිය. කර්ම පිළිබඳව සිදු වන ණය අවලංගු කිරීම ගැන ද කරුණු දැක්විය යුත්තේ මෙබඳු මාර්ගයෙකින් විය හැකි ය.[1]

කිසියම් දිනෙක බටහිර මිනිසා පුනර්ජන්මවාදයත් පිළිගෙන, පෙරදිග මිනිසුන් තේරුම් ගෙන ඇති අයුරින් කර්මවාදයත් තේරුම් ගත හොත්, කර්ම පසු වී විපාක දීම ගැනද බොහෝ දෙනකුන් සිතා බලනු ඇත. අතීතයේ සිදු කරන ලද අපරාධයකට මේ ජන්මයේ දී නැති නම් කිසියම් අනාගත ජන්මයෙක දී අන්ධ වී විපාක විඳිය යුතුය යන කල්පනාව අප්‍රසන්න එකක් බව පිළිගත හැකි ය. හැඟීම් බහුල පුද්ගලයකුට මේ නොපෙනෙන කර්ම විපාකය, ඩමොක්ලිස්ගේ

1. බෞද්ධ කර්ම විස්තරවල ද කර්ම අවලංගු වන ක්‍රම කිහිපයක් ඇත.

කඩුව මෙන් හිස මත එල්ලෙතැයි ද මාර්ගයේ වංගුවෙන් එහා සිටින විශාල මෘගයකු සේ සැඟ වී සිටිතැයි ද සිතෙනු ඇත. අතීත යුගයෙක දී යක්ෂයා හා නිරා ගින්න බොරු බයකට හේතුවෙක් විය. එමෙන් ම පුනර්ජන්මවාදය පිළිගනු ලබන යුගයේ මුල දී පසු වී විපාක දෙන කර්මය ද බොරු බයකට හේතු වනු ඇත.

මේ බිය දනවන ගතියට පිළියම් කරනු සඳහා නව චින්තන ගුරුකුලවල නායකයන් පසු වී විපාක දෙන කර්ම කියා දෙයක් ඇත්තේ ම නැතැයි කීමට ද ඉඩ ඇත. "ක්‍රිස්තියානි විද්‍යා ව්‍යාපාරය" පාපය, රෝගය, මරණය, වරද හා ද්‍රව්‍යය ද නැතැයි කීවේ මේ අයුරිනි. එබඳු නැතැයි කීම්වල අදහස් කාවැද්දීමේ මහා බලයක්[1] ඇති බව සත්‍ය ය. "ක්‍රිස්තියානි විද්‍යාව[2]" මෙන් නව චින්තනය ද මේ නැතැයි කීමෙන් චිත්ත ශක්තියක් ඇති කිරීමෙන් හිතකර ප්‍රතිඵල ද ලබනු ඇත. එහෙත් ද්‍රව්‍යයත් පාපයත් කර්මයත් නැතැයි වචනයෙන් කී පමණට, ඒවා නැති වන්නේ නැත. ජීවිතයෙහි අපට ඇති කාර්යය ප්‍රීතියෙන් නමුත් මුළාවෙන් යුතුව ඔළුව පමණක් වැල්ලේ ගසා ගෙන සැඟවෙන පැස්බරකු මෙන් භෞතික ද්‍රව්‍යය පිළිබඳ සත්‍යතාවෙන් සැඟවීම නො වේ. අපගේ කාර්යය එය පාලනය කිරීමයි. ක්‍රමානුකූල කිරීමයි. ජීවයේ වඩා උසස් තලයන්ගෙන් භෞතික ද්‍රව්‍යය තනා ගැනීමද අප විසින් කළ යුත්තෙකි. සත්‍ය වශයෙන් නම් භෞතික ද්‍රව්‍යය, ජීවය යයි කිව හැක්කා වූ ශක්තියක ඝන වීමෙක් පමණි: නැති නම් භෞතික ද්‍රව්‍යය, ස්පන්දනයේ පහත් ප්‍රමාණයෙක පිහිටි ජීවය ම ය.[3]

1. Suggestive Power
2. Christian Science මෙනමින් හැඳින්වෙන්නේ 19 වැනි සියවසේ සිටි මේරි බේකර් එඩි මැතිනිය විසින් අරඹන ලද ක්‍රිස්තියානි නිකායෙකි. ආගමික පිළිවෙත්වලින් ම රෝග සුව කරගත හැකි ය යනු මෙහි ප්‍රධාන ඉගැන්වීමෙකි.
3. මෙයින් කුමක් අදහස් කෙරේදැයි ස්ථිරව කිව නොහැකි ය. එහෙත් බුදු සමයේ එන විඤ්ඤාණය ප්‍රත්‍යය කොට ගෙන නාම රූප දෙකත් නාම රූප දෙක ප්‍රත්‍යය කොට ගෙන විඤ්ඤාණයත් පහළ වේ යන්නට අනුව මේ ගැන යමක් සිතාගත හැකි ය.

පාප කර්මය පිළිබඳ ව ද මෙසේ ය. පුනර්ජන්මවාදීනට අනුව දුන් විපාක දෙන්නා වූ හෝ මතුවට විපාක දෙන්නට ඇත්තා වූ හෝ කර්ම නැතැයි කීම ගෙවීමට ඇති ණය ද ඉගෙනීමට ඇති පාඩම් ද නැතැයි කීමට සමාන ය. එය ඇත්ත වශයෙන් ම, වංක ගතියෙකි. තම යුතුකම් පිළිබඳ ව රැවැටිලි කරන ප්‍රයෝගකාරී මනුෂ්‍යයා ගෞරවයට පාත්‍ර නො වේ. ඒ යුතුකම, ස්වභාවයෙන් භෞතික වූවත්, ආධ්‍යාත්මික වූවත්, එය කරුණෙක් නො වේ. කරන්නට උත්සාහ ගත් වංචාව, නැතැයි කීමේ මානසික කරණමක් වූ පමණින්, එහි ඇති වගකීම් මග හැරීමේ ලක්‍ෂණ වෙනස් නො වේ.

අදහස් යෝජනා කිරීම භාවිත නො කළ යුතු යයි මෙයින් අදහස් නො කෙරේ. යෝජනාවෙන් මානසික විකාරත් අන්තානුවාද භයත් යම් යම් ගති තහවුරු වීමත් වළක්වා ගත හැකි ය. කේසි කියැවීම්වලින් ම එක් සැලැකිය යුතු නිදසුනක් අපට දක්නට ලැබී ඇත. එනම් ඇඳුන් තෙම්ම සුවපත් කර ගත් ළමයාගේ නිදසුනයි. මෙහි දී යෝජනාව යොමු කරන ලද්දේ යටි සිතේ පැවැති අන්තානුවාදයට ය. අන්තානුවාදය නම් තමාම තමාට දෝෂාරෝපණය කිරීමයි. ඒ දරුවාගේ අන්තානුවාද භය උඩු සිතට පැහැදිලි නො වූවක් හෙයින් අසංඥ වූවෙකි. ඒ දරුවාට සංකේතාත්මක දඬුවම දුන්නේ ඔහු තුළ තුබූ තමා නො වටිනවාය යන හැඟීමයි. යෝජනාවෙන් මේ අපරාධ සංඥා ඉවත් කිරීමෙන් ද ඒ මාර්ගයෙන් මනුෂ්‍ය වර්ගයාට තමාගේ ප්‍රයෝජනවත් භාවය හෙළි කිරීම සඳහා ඔහු නිදහස් කිරීමෙන්ද ඔහුගේ ශාරීරික තත්වයත් චරිතයත් යන දෙක ම වෙනස් කරන ලදී.

තොරිස්ගිමේ රෝගයේ දී[1] ගැඹුරු යෝජනාවත්[2] සම්මෝහ නිද්‍රාවත් හොඳ යයි කියා, කියැවීම්වලින් උපදෙස් දී ඇත. එහෙත්

1. 98 පිට  2. Deep Suggestion

මේ එකෙක දී වත් පිළියම් වශයෙන් කරන ලද යෝජනාව, නැතැයි කීමෙක් නො විය. නැතැයි කීමකට හාත්පසින් ම වෙනස් වූ ඒ ප්‍රතිකාරය "සද්ගුණ පිළිගැනීමෙන්" ද සම්පජානව ආධ්‍යාත්මික වූ දඬුවම විඳීමෙන්" ද යුතු විය. කර්ම විපාකවලට හෝ පසු වී විපාක දීමට ඇති කර්ම පිළිබඳ පීඩාකාරී වූ හැඟීමට හෝ පිළියම් යොදන්නට මානසික ප්‍රතිකාර කරන්නන් කැමැති නම් ඒ ප්‍රතිකාරයට කරුණු කීපයක් ඇතුළත් කර ගත යුතු ය.

(i) පළමු කොට ම අතීත යුතුකමක් ඉටු කිරීමට ඇති බව අවංක ව පිළිගත යුතු ය.

(ii) ඊළඟට ඒ යුතුකම ඉටු කිරීමට කැමැති බව අවංක ව ප්‍රකාශ විය යුතු ය.

(iii) අවසාන වශයෙන් ඒ පාප කර්මය කිරීමට යම් විශේෂ ශක්තියෙක අඩුකම හේතු වී නම් ඒ ශක්තිය ඇති කර ගත යුතු ය.

පුනර්ජන්මවාදය පිළිගන්නවා නම් මනුෂ්‍ය වර්ගයා තවම ආධ්‍යාත්මික වශයෙන් පැසී සම්පූර්ණ නැති බවත් ඒ නිසා ම මිනිසුන් විසින් මතු ජීවිතවල දී විඳිය යුතු අප්‍රිය කර කර්ම විපාක ඇති බවත් පිළිගැනීමට සිද්ධ වේ. කරුණු දෙකක් නිසා මෙය බයට හෝ නැවුලට හෝ හේතුවිය යුතු නොවේ. "දවසේ දුර්විපාකය දවසට ප්‍රමාණවත් ය" යන ආප්තෝපදේශය අදාළ කර ගත හැක්කේ කරදර නො වී නිසන්සලේ එක් දවසක් ජීවත් වීමට පමණක් නො වේ. ජීවිතයේ මොන අමාරුකම් තිබුණත්, එක් පුද්ගලයකුගේ කොටස ඔහුට සරිලන්නක් ය යන ස්ථිර විශ්වාසයෙන් යුතුව ජීවත් වීම සඳහා ද ඒ උපදේශය හැම ජීවිතයකට ම අදාළ කර ගත යුතු වේ. අපට දරන්නට බැරි තරමේ මහත් වූ කරුම විපාකයක් කවදාවත් අපට විඳින්නට සිදු නොවේ. දෙවැනි ව අප කර්මවාදය ඇදහුවත් නැතත් අනාගතය පිළිබඳ අස්ථිරත්වය හැම විට ම අප සමග ඇත.

අපට අනාගතයේ දී සිදු වන්නට ඇති විපත්, අහඹු ලෙසින් නොව්, කර්ම නියාමයට අනුව සිදුවීම බය වැඩි කරන්නට නොව, අඩු කරන්නට හේතු විය යුතු ය. කර්ම නියාමය යුක්තිය පසිඳලන පෙස් සකස් වූ නියාමයක් වීම නිසාම අපේ බය අඩු විය යුතු ය.

අනාගත කරදරවලට මිනිසා බය වීම තේරුම් ගත හැකිය. එහෙත් මිනිසා කරා, ඔහුට ඉගැන්වීම සඳහාත්, ඔහුගේ දූනීම පළල් කරනු සඳහාත්[1] යුක්ති සහගත ලෙස එන්නා වූ කරදරවලට බිය වීම මිනිස්කමට ගැළපෙන්නේ නො වේ. ණයක් ගෙන ඇති අවංක මිනිසා කල් ගෙවන්නේ එය ගෙවීමට කැමැත්තෙනි. මේ නිසා ඔහු ගෙවීමට ඇති බිල්පත් ලැබෙන, මාසයේ පළවෙනිදාට, ඒවා ගෙවිය හැකි තත්ත්වයෙක සිටිනු සඳහා, දිනපතා ම විය පැහැදම් ගැන සැලකිලිමත් වෙයි. ඔහු බිල් ලැබෙන දිනය ගැන සිතමින් මුළු මාසය තුළ ම බියෙන් සිටින්නේ නැත. ඒ වෙනුවට ඔහු කරන්නේ තම යුතුකම් ඉටු කිරීමට හැකි වන පරිදි තම ශක්ති භාවිත කිරීමයි.

නො දත් අතීතයෙක දී අප ගෙන ඇති කර්ම ණයේ ස්වභාවය ගැන අපේ සීමාසහිත සිත්වලින් දත නො හැකි ය. එහෙත් සියලු අවංක මනුෂ්‍යයන්ගේ ලක්ෂණ වන සිතේ අවංක කමත් ආත්මයේ නිශ්ශබ්දතාවත් අපට තිබිය යුතු ය. එසේ නම් අපි කිසි කතාවක් නැතිව ණය ගෙවීමේ කැමැත්තෙන් ඉදිරියට යමු.

සමහර විට ණය යන වචනය නොමඟ යවනසුලු වන්නට ඉඩ ඇත. ඌනතාව නැතහොත් අඩුපාඩුව යන වඩා හොඳ වචනය විය හැකි ය. ඌනතා රෝගයකට[2] පිළියම් කළ යුත්තේ

1. මේ අදහස බෞද්ධ ධර්ම විස්තරවල එන බවක් මේ පරිවර්තකයා නොදනී. එසේ ද වුවත් මේ අදහස මිනිසුනට හිත සුව සඳහා පවතින්නෙකැයි කිව යුතු ය.
2. A Deficiency Disease.

ශරීරයට අඩු වී ඇති විටැමින් හා ලෝහ වර්ග සපයා දීමෙනි. ඒ අඩුපාඩුව සපුරාලන තෙක් ශරීරයේ රෝගය සුව නො වේ. එසේ ම එක් වැදගත් මූලික අර්ථයෙකින් පාප කර්මයක් කළ හැකි වන්නේ ආධ්‍යාත්මික වූ ගුණ නැති කම නිසා ම ය. තමාගේ ආධ්‍යාත්මික ස්වභාවය හරි හැටි ඇඳින ගෙන නැති නිසා ම ය. පව් කෙරෙන ගතියට නියම ලෙසින් පිළියම් යෙදිය හැක්කේ, පාපයට හේතු වන ආධ්‍යාත්මික වූ අඩුපාඩුකම් සපුරාලීමෙන් හා තමාගේ නියම ස්වභාවය පිළිබඳ දැනීම පුබුදු කිරීමෙනුත් ය.

පාප කර්මය ණයෙකැයි ද අඩුපාඩුවෙකැයි ද ආධ්‍යාත්මික ඌනතාවෙකැයි' ද සැලකිය හැකි ය. ඒ කවර ලෙසින් සැලකුවත් එහි විපාකය කරා ළඟා විය යුත්තේ කැරලිකාර ගතියෙකින් නොව කැමැත්තෙකිනි. විඳිය යුතු කර්ම විපාක නැතැයි කීම, නිශ්ශබ්ද වීමකට වැඩියෙන් කැරලි ගැසීමෙක් වෙයි. එබඳු නැතැයි කීමෙකින් ප්‍රකාශ වන්නේ, නිත්‍ය ඒකත්වය පිළිබඳ සනාතන ප්‍රඥාව නොව මුරණ්ඩුකම හා මේ මොහොතේ ජීවිත පහසුවට ඇති ආශාව ය.

කර්ම විපාක සම්බන්ධයෙන් ඇති කරගත යුතු වූ සුදුසු ආකල්පය පිළිබඳව කේසී කියැවීම්වලින් නිතර උපදෙස් දෙනු ලැබේ. පහත එන ඡේදයෙන් විශේෂයෙන් නිශ්චිත වූ යෝජනාවෙක් කරනු ලැබේ.

"ජීවිතය කාම සුඛල්ලිකානුයෝගය සඳහා හෝ අත්තුක්කංසනාය සඳහා හෝ ආත්ම ප්‍රීණනාය සඳහා හෝ යෙදුව හොත් තමා සිදු කර ගන්නේ තමාගේ ම විනාශයෙකි. එයින් සිදු වන්නේ තමා විසින් ම විපාක විඳිය යුතු පාප කර්මයක් රැස් කර ගැනීමයි. කායික අත්දැකීම්, මානසික අත්දැකීම් යන කොයි එකෙහි දීත් හැම වැරැදීමකට ම හැම පරීක්ෂණයකට ම හැම පෙළැඹවීමකටම මුහුණ දිය යුත්තේ මතු දැක්වෙන

ආකල්පයෙනිඃ "දෙවියන් වහන්ස,[1] මා තුළ ද, මා මගින් ද මගේ කැමැත්ත නොව ඔබ වහන්සේගේ කැමැත්ත ම ක්‍රියාවට නැඟේවා."

"ඔබ වහන්සේගේ කැමැත්ත" යන්න අර්ථ දෙකෙකින් තේරුම් ගත හැකි බව සත්‍ය ය. එය විශ්වයේ ස්වභාව ධර්ම නියාමවල මාර්ගයෙන් ප්‍රකාශයට පත්වන දෙවියන් වහන්සේගේ කැමැත්ත ලෙස ද, නිත්‍ය අනන්‍යතාවේ හෙවත් උත්තර ආත්මයේ කැමැත්ත ලෙස ද තේරුම් ගත හැකි ය. යෝගී සම්ප්‍රදායවල දී පියාණන් වහන්සේ ලෙස ගනු ලබන්නේ මේ උත්තරාත්මයයි. අපේ යාච්ඤාවල දී අප අමතන්නේ උන්වහන්සේට ය. මේ වචනයට දෙනු ලබන අර්ථය කුමක් වුවත් අපට විඳීමට සිදුවන හැම කර්ම විපාකයට ම අපගේ ආකල්ප විය යුත්තේ අනුමතිය හා විශ්වාසයි.

පුනර්ජන්ම සිද්ධාන්තයෙන් හෙළි කරනු ලබන, ක්‍රමිකත්වයකුත් යුක්තියකුත් පරහිතකාමයකුත් ඇති මේ විශ්වයෙහි, බිය වීමට කරුණෙක් නැත.

1. මෙතැන දී බෞද්ධයන් විසින් "ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරිං" යනු සිහිකරමින් "දම් රජාණන් වහන්ස" යනු යොදා ගත යුතු ය.

## 8

# කර්මය හා සෞඛ්‍ය ප්‍රශ්න

අභාග්‍යයකට මෙන් බොහෝ දෙනකුන් සිතන්නට පුරුදු වී ඇත්තේ කර්මවාදය සමඟ නිෂ්ක්‍රීයත්වය, උදාසීනත්වය හා නියතිවාදය එකට බැඳී ඇතැයි කියා ය. මීට ප්‍රධාන හේතුව කර්මවාදය පොදු විශ්වාසයක් කොට ගත් භාරතීය ජනතාව බෙහෙවින් ම නිෂ්ක්‍රීය, උදාසීන, නියතිවාදී පිරිසක් ලෙස පෙනීමයි.

භාරතයේ සමාජ තත්ත්ව ශෝචනීය බව ද නිෂ්ක්‍රීය ව කර්මය පිළිගන්නා වූ හින්දූනට එක්තරා ප්‍රමාණයකට දොස් කිව යුතු බව ද සත්‍ය ය. එහෙත් භාරතයේ ආගමික මුනිවරුන්ගේ ඉගැන්වීම, දිගු කලක් මුල් බැස ගත් මිථ්‍යා ලබ්ධි අතරින් රිංගා මහජනයාගේ සිත් තුළට යෑමේ දී, ඒ ඉගැන්වීම්වල ස්වභාවය හොඳට ම වෙනස් වී තිබිය හැකි ය. ඒ නිසා නූගත් සාමාන්‍ය ජනතාව කෙරෙහි දක්නට ලැබෙන, ඒ ඉගැන්වීම් ඇසුරු කොට හට ගත ඇති, මානසික ප්‍රතිඵලය, පුනර්ජන්මය විශ්වාස කිරීම පිළිබඳ හොඳ ම නිදසුන් ලෙස සැලකිය හැකි නො වේ. තවද භාරතයේ දේශ ගුණයේ ඇති බලහීන කර ගතිය ද එහි

මනුෂ්‍යයන්ගේ මානසික තත්ත්වය පිළිබඳ වැදගත් සාධකයෙක් වෙයි. ආගමික විශ්වාසය කුමක් වුවත් දේශ ගුණය මිනිසුන්ගේ මානසික ආකල්පය හා ස්වභාවය කෙරෙහි බල පායි.

සත්‍ය වශයෙන් ම ක්‍රිස්තියානිය හා කුහකත්වය අතර අනිවාර්ය සම්බන්ධයක් නැත්තා සේ ම කර්මවාද විශ්වාසය හා උදාසීනත්වය අතර ද අනිවාර්ය මනෝවිද්‍යාත්මක සම්බන්ධයෙක් නැත. පෙර දී මෙන් ම අද ද ක්‍රිස්තියානිය කුහකයන් රාශියක් ඇති කොට තිබේ. එහෙත් කුහකත්වය ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම්වලට ආරෝපණය කළ නො හැකි ය.

යමෙක් කර්ම වාදය පිළිගනී නම් ඒ පිළිබඳ ඔහුගේ මානසික ආකල්පයෙහි ලක්ෂණය විය යුත්තේ අනුමතිය හා විශ්වාසයයි. විශ්වයේ කවර නියාමයක් කෙරෙහි වුව ද ඔහුගේ මානසික ආකල්පය විය යුත්තේ එය ම ය. එහෙත් ඔහු කොපමණකට එය අනුමත කළ යුතු ද, කොතෙක් දුරට තමා වෙත එන බාධක පිළිගත යුතු ද කියා ඔහුට නො සිතා බැරි වෙයි. කායික කර්ම විපාක ඇති වන අවස්ථාවල දී මේ ප්‍රශ්නය විශේෂයෙන් ම පැහැදිලි වෙයි.

අන් තැන්වල දී මෙන් මෙහි දී ද පුනර්ජන්මවාදයෙහි ගැබ්ව ඇති සදාචාරාත්මක වූත් ප්‍රායෝගික වූත් කරුණු පිළිබඳ බුද්ධිගෝචර ප්‍රශ්නවලට නිශ්චිත පැහැදිලි පිළිතුරු දෙන නිසා, කේසි කියැවීම් වැදගත් වෙයි. කේසි කියැවීම්වලින් පහත එන ප්‍රශ්නවලට කවර පිළිතුරු ලැබේ දැයි සලකා බලමු. කායික කර්ම විපාකයෙකින් පෙළෙන අයට කිසියම් ප්‍රතිකාරයක් නියම කොට ඇති නම් ඒ කිමෙක් ද ? ඔවුන්ගේ සුවපත් වීම පිළිබඳ ව කවර බලාපොරොත්තුවක් තබා ගත හැකි ද ?

කේසි ලිපි ගොනුවල ඇති හැම කියැවීමෙකින් ම

නිෂ්ක්‍රිය ව පිළිගැනීම කර්මවාදය පිළිබඳ විශ්වාසය සමග එකට යා යුතුය යන මතයට පහර වදී. හැම තැන ම සංස්ථිත ව ඇති මතය නම් "මේ ඔබගේ කර්මයයි. මේ ඔබ විසින් ඒ ගැන කළ හැකි දෙයයි" යනු ය.

මුල් කියැවීම්වල ඇති සිත් ගන්නාසුලු අංශවලින් එකෙක් නම්, කර්මය පිළිබඳ කියමන්, නො වරදවා ම ප්‍රතිකාර සඳහා වූ යෝජනා බවට හැරීමයි. කායික විපාක දක්නට ඇති නිදසුන් බොහොමයක දී ප්‍රතිකාරය සඳහා නිශ්චිත බලාපොරොත්තුවෙක් ඇති කරනු ලබයි. කර්ම - ණය වඩා බලගතු වූ අන් නිදසුන්වල දී, උත්සාහයෙන් දියුණුවක් ඇති කර ගත හැකි නමුත් සම්පූර්ණ සුවයක් ලබා ගත නො හැකි බව අවංකව පිළිගනු ලැබේ. ඊළඟට කියැවීම, ප්‍රතිකාර ක්‍රමය සැකෙවින් දක්වයි.

තිස් හතර හැවිරිදි විදුලි කාර්මිකයාගේ රෝගය මේ පිළිබඳ හොඳ නිදසුනෙකි. වෛද්‍යවරුන් විසින් ඔහුගේ රෝගය සුව නො කළ හැකි බහු ප්‍රකාර වූ ස්ක්ලේරෝසිස්[1] නම් වූ රෝගය යයි අන්තිමේ දී හඳුනා ගන්නා ලදී. අවුරුදු තුනක් ඔහුට වැඩ කළ නොහැකි විය. කියැවීමට හෝ ලිවීමට බැරි තරමට හේ අන්ධ වී සිටියේ ය. ඇවිදීමට තැත් කළ බොහෝ අවස්ථාවල දී ඇද වැටුණේ ය. පිළිවෙළින් ආරෝග්‍ය ශාලා කීපයකට ම හේ පින් ලෙඩකු ලෙසින් බාර ගන්නා ලදී. මේ අතරතුර ඔහුගේ භාර්යාව තමාත්, තම පස් අවුරුදු දරුවාත් නඩත්තු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු බඩු ගබඩාවෙක ලිපිකාරියක වශයෙන් සේවය කළා ය. ඔහු පිළිබඳ ජීවිත කියැවීමක් ලබා නො ගත් නමුත් කායික කියැවීමේ දී මේ තත්ත්වය කර්මය නිසා ඇති වූවෙකැයි කියා තිබේ. කෙසේ හෝ බලාපොරොත්තු සුන් කර නොගන්නට දිරි ගන්වා ඇත.

1. Multiple Sclerosis

"ඔව්, ශරීරය අප ඉදිරියේ තිබෙනවා" යනුවෙන් සියලු කායික කියැවීම්වල දිවැස් විස්තරය ආරම්භ කිරීමට යොදනු ලබන, සරල වූ නමුත් විශේෂ වූ පාඨයෙන් කියැවීම ආරම්භ විය. "අපට පෙනෙන පරිදි මෙහි තත්ත්වය බොහොම බුරපතලයි. ඒත් බලාපොරොත්තු නැති කර ගන්න එපා. ඔබ පිළිගන්නට සූදානම් නම්, උදව්ව ළඟ ම ඇත."

ඊළඟට එන්නේ ඉතාමත් අලංකාර වූ ද වේගවත් වූ ද පිටු තුනෙක විස්තරයෙකි. පළමුවෙන් ම ඇත්තේ වෛද්‍ය ශාස්ත්‍රීය වචනවලින් කරනු ලබන රෝග විස්තරයයි. ඊළඟට ශරීරයේ ඇති පුනර්ජීවක ශක්ති පිළිබඳ විස්තරයෙක් එයි. ඊළඟට මිනිසාගේ තත්ත්වය කර්මයට සම්බන්ධ බව කියා ඔහුගේ සිතින් සියලු ද්වේශ හා ඊර්ෂ්‍යා ඉවත් කර ගෙන මානසික ආකල්පය වෙනස් කර ගත යුතු යයි අවවාදයකුත් දී ඇත. කියැවීම් කෙළවර වන්නේ සුපරීක්ෂිත ප්‍රතිකාර නියමයෙකිනි.

අවුරුද්දකට පමණ පසු ව මේ මිනිසා තවත් කියැවීමක් ඉල්ලා ලිපියක් එව්වේ ය. ඔහු භක්තිමත් ව නියමයන් අනුගමනය කළ බවත් ඉක්මනින් ම ගුණයක් දැනුණු බවත් එහි කියා තිබිණි. මේ ගුණ ලැබීම දිගට ම මාස හතරක් පමණ පැවැතුණේ ය. ඊට පසුව ශක්තිය පිරිහී රෝගය මුල් තත්ත්වයට පත්වීමක් දක්නට ලැබිණි. දෙවන කියැවීමේ දී ඔහුට පැහැදිලි වචනවලින් ම දෝෂාරෝපණය කර තිබෙන නිසා ඔහු නියමයන්ගේ ආධ්‍යාත්මික පක්ෂයට සැලැකිල්ලක් නො දක්වා භෞතික පක්ෂයට පමණක් සැලැකිල්ල දක් වූ බව පෙනේ.

"ඔව් අප කලින් පරීක්ෂා කළ ශරීරය නැවත දැන් අප ඉදිරියේ තිබෙනවා. ශරීරයේ කායික දියුණු වීම් රාශියක් සිදු වී ඇති බව පේනවා. එහෙත් නව හුයක් බලාපොරොත්තු විය යුතු දේ තිබෙනවා."

"කලිනුත් කියා ඇති විදියට මෙය කරුම විපාකයෙක්. වස්තූන් පිළිබඳවත්, අවස්ථා පිළිබඳවත්, සහෝදර මනුෂ්‍යයන් පිළිබඳවත් තම ආකල්පය වෙනස් කර ගැනීම සඳහා මේ ආත්මය විසින් උපාය යෙදිය යුතුව තිබෙනවා."

"කය හරි ගස්සා ගැනීමට යාන්ත්‍රික උපක්‍රම යෙදූ කාලයේ දී ඒ ගුණ දක්නට ලැබුණා. එහෙත් මේ ආත්මය ආධ්‍යාත්මික ගුණ ධර්ම ඉවත ලන තරමට ආත්ම තෘප්තියටත් ආත්මාර්ථකාමයටත් ගැති වී දිගට ම එසේ ම සිටිනවා නම් ද්වේෂයට, ද්‍රෝහිකමට, අයුක්තියට හා ඊර්ෂ්‍යාවට ඉඩ දී ඉවැසීමට, දිගට දුක් විඳීමට, සහෝදර ප්‍රේමයට, කරුණාවට හා ශාන්ත භාවයට විරුද්ධ ගුණ රඳවා ගෙන සිටි නම් රෝගය සුව වන්නේ නැත."

"මේ ආත්මයට සුවපත් වීමට උවමනා කරන්නේ කුමකටද? තම කායික තෘෂ්ණාවන් මුදුන් පත් කර ගැනීමට ද? ආත්මාර්ථකාමය තවත් වැඩි කර ගැනීමට ද ? එසේ නම් ඔය තිබෙන විදියට ම තිබීම වඩා හොඳයි."

"හිතේත් බලාපොරොත්තුවේත් වෙනසක් තිබේ නම්, මේ ආත්මය ඒ වෙනස වචනයෙන් හා ක්‍රියාවෙන් ප්‍රකාශ කරනවා නම් යෝජනා කරන ලද මේ භෞතික දේවල් භාවිත කරනවා නම්, ගුණ දක්නට ලැබෙනවා ඇත."

"එහෙත් පළමුවෙන් ම ඇති විය යුත්තේ හදවතේ, හිතේ බලාපොරොත්තුවේ, චේතනාවේ වෙනසයි..... ඔබේ ආත්මයත් චේතනාවත් "ශුද්ධ ආත්මයෙන් අභිෂේක කරනු ලබන තාක්"[1] ඔබ අත්පත් ව ඇති යාන්ත්‍රික උපක්‍රම සියල්ල ම යෙදුවත් සම්පූර්ණයෙන් ම සුවයෙක් ඇති නො වේ. ඔබ මෙය බාර ගන්නවා ද ? නැති නම් ඉවත දමනවා ද ? තීන්දුව ඔබට අයත්ය."

1. සිත පිරිසිදු කර ගන්නා තාක් යනු අදහසයි.

"ඔබ සකස් වන්නේ නැති නම්, අපේ උදවු ඉවරයි. මේ කියැවීමෙන් අපේ උදවු ඉවරයි."

මිනිසා විසින් තම අදහසුත් ආධ්‍යාත්මික පරමාර්ථත් වෙනස් කර ගැනීමේ කොන්දේසිය පිට සුවපත් වීමේ බලාපොරොත්තුව පැහැදිලිව ඉදිරිපත් කොට ඇති බව ඉහත සඳහන් වූ ඡේදවලින් දක්නට ලැබේ. "ඔබට සුවපත් වීමට උවමනා කරන්නේ කුමකට ද" යි කේසි අවංකව අසයි. ඔබේ කායික තෘෂ්ණාවන් මුදුන්පත් කර ගැනීමට ද ? එසේ නම් දැන් සිටින සැටියෙන් ම සිටීම වඩා සුදුසු ය."

මේ පැහැදිලි කියැවීමෙන් පුද්ගලයකුගේ තාවකාලික සුව පහසුවට වඩා වැඩි දෙයක් දුටු මහා වෛද්‍යාචාරයකුගේ සදාචාර ආකල්පය දක්වෙයි. 25,000 කට වැඩි වූ කායික කියැවීම් එකෙක දී වත්, ඒ පුද්ගලයාගේ පාපය කොතරම් දූෂිත වුවත්, කොතරම් නිහීන වුවත්, කේසි, ප්‍රතිකාර යෝජනා කිරීමට බෑ කියා නැත. එහෙත් කේසි පරම කාරුණිකයකු වුව ද සදාචාර වශයෙන් හරි ගැස්සීමේ අර්ථයක්, රෝගයෙහි ඇති බව ද රෝගයට මුල් වූ ඒ දුරාචාර හේතුව සකස් කර ගැනීම අවශ්‍ය බව ද පෙන්වා දීමට ඔහුට බොහෝ විට සිදු විය. ඉහත සඳහන් නිදසුන එබඳු එක් අවස්ථාවෙකි. රෝගයෙකින් පෙළෙන පුද්ගලයා තමා සතුව ඇති හැම උපායෙකින් ම එය සුවපත් කර ගැනීමට උත්සාහ ගත යුතු ය. ඒ සමග ම අභ්‍යන්තර දුර්වලතාවක් සකස් කර ගැනීමට ඉඩක් ලැබී ඇත්තේය යන උපදේශය ද ගත යුතු ය. ස්වභාව ධර්මයේ භාණ්ඩාගාරයටත් නවීන විද්‍යාවේ ප්‍රාතිහාර්ය සිදු කරන ඖෂධවලටත් තාවකාලික සුවයක් ඇති කළ හැකි ය. එහෙත් අවසානයේ දී ඒ සියල්ල දුර්වලව සිටී. අන්තිමේ දී නියම සුවය පැමිණිය යුත්තේ ආධ්‍යාත්මික වශයෙන් අභ්‍යන්තරයෙනි. එසේ නැතහොත් සුවය වැඩි කලක් නො පවතී.

කේසී ලිපි ගොනුවල ඇති, මේ මතය පෙළී කරන සිය ගණන් නිදසුන්වලින් පහත එන අන්ධත්වයේ නිදසුන ද එකෙකි.

"ඔව්, මේ තත්ත්වයට බොහෝ දුරට හේතු වී ඇත්තේ කර්මයයි. අන්‍ය පුද්ගලයනට ඇති සම්බන්ධතා පිළිබඳ වූ ආධ්‍යාත්මික සද්ගුණ වඩා හොඳින් ඇති කර ගත හොත් මොහුගේ රෝගයෙහි ලොකු වෙනසක් ඇති වෙනවා.

අභ්‍යන්තර ආත්මයෙහි සකස් වීම ඇති වන විට මුල දී පෙනීමේ ලොකු වෙනසක් ඇති නොවුවත් ශාරීරික සනීපය බෙහෙවින් දියුණුවනවා ඇත.

කොඳු ඇට වැලෙහිත් එමෙන් ම මුවෙහි හා විදුරු මසෙහිත් ඇස්වල තත්ත්වය සමග ලොකු සම්බන්ධයක් තිබේ.

දූන් පළමු කොට ම ආධ්‍යාත්මික ගුණ ප්‍රකට කිරීමටත් දෛනික අත්දැකීම්වල දී "ක්‍රිස්තු සංඥා" යෙදීමටත් උත්සාහ කට යුතු ය.[1] සහෝදර ප්‍රේමයත්, කරුණාවත්, ඉවැසීමත්, දිගට දුක් විඳීමත් ශාන්ත භාවයත් පුරුණ කළ යුතු ය."

අස්ථි චිකිත්සක ප්‍රතිසංස්කරණ[2] ද කළ යුතු ය. විශේෂයෙන්ම 4 වැනි, 3 වැනි 2, වැනි 1 වැනි කොඳු ඇටවලත් 3 වැනි, 1 වැනි, 2 වැනි, 4 වැනි ගෙළ ඇටවලත් සංස්කරණය කළ යුතුය. මේ සංස්කරණය කළ යුත්තේ මෙහි දක්වා ඇති අනුක්‍රමයටය. ඊළගට දත්වලට බලය සපයන ස්නායු කේන්ද්‍රවලට අවධානය යොමු විය යුතු ය. විශේෂයෙන් ම ශීර්ෂ ප්‍රදේශ චූචුකාකාරය[3] සමග සම්බන්ධ කරන කන යට ප්‍රදේශයෙහි වූ ස්නායු කේන්ද්‍රවලට අවධානය යොමු විය යුතු ය."

ඉහත සඳහන් නිදසුන් දෙකේ දී ම කියැවීමෙන් කායික

1. පවිත්‍ර හැඟීම.
2. Osteopathic Adjustments (- ඇට පෙදකමට අයත් සකස් කිරීම)
3. Mastoid (- නළල් ඇටයට සම්බන්ධ තන පුඩුවක් වැනි කොටසකි.)

විපාක තත්ත්වයෙහි වෙනසක් ඇති වීමේ අවශ්‍ය කොන්දේසිය වශයෙන් සිතෙහි හා චරිතයෙහි වෙනසක් ඇති වීම පිළිබඳව අවධාරණය කරන බව දක්නට ලැබේ. කර්ම විපාකවල බලාපොරොත්තුව ගුණදම් ඉගැන්වීමයි. කර්ම විපාකය බෙහෙතක් වැනි ය. ඒ බව මතක තබා ගත් විට, කර්ම විපාක පිළිබඳව මේ ආකල්පය කොතරම් ස්වාභාවික ද, යනු දක්නට ලැබෙනු ඇත. එහෙත් කර්ම විපාකයෙන් නිවැරැදි කර දෙන පාපය ප්‍රාථමික මනුෂ්‍යයන්ගේ මිථ්‍යා ලබ්ධික පාපය නොවේ. පාපය යන්නෙන් මෙහි දියුණු ප්‍රාථමික මනුෂ්‍යයන් අදහස් කෙළේ දෙවිවරුන් හා භූතයන් කෝප කරවා ගැනීමයි. බයිබල් ගරුක දේව ධර්මඥයන් දෙන අර්ථයෙන් ද එය පාපයෙක් නොවේ. වික්ටෝරියානු හෝ පියුරිටානු[1] ආචාර ධර්මවල ඇති අර්ථය ද එහි නැත. එය පාපයක් වනුයේ මනෝවිද්‍යාත්මක අර්ථයෙකිනි. එය පොදුවේ හඳුන්වා දිය හැක්කා වූ ද ලෝක නියාමයකට පොදුවේ යටත් වන්නා වූ ද පාපයෙකි.

මූලික වශයෙන් මේ අර්ථයෙන් පාපය වන්නේ ආත්මාර්ථකාමය හෝ පෞද්ගලිකත්වයයි. ආත්ම - ප්‍රීණනය බොහෝ රූප ගනී. එය අනිකකුගේ චේතනාවට හෝ ශරීරයට විරුද්ධව කෙරෙන අපරාධයක් විය හැකි ය. එසේ ම එය අතිසේවනය නිසා හෝ අසේවනය[2] නිසා හෝ තමාගේ ශරීරයට විරුද්ධව කෙරෙන අපරාධයක් ද විය හැකි ය. එය මානය හෝ අහංකාරය හෝ විය හැකි ය. මේ වැරදි වර්ග සිදුවන්නේ එක් මූලික වරදක් නිසා ය. එක් මූලික මිථ්‍යාවබෝධයක් නිසා ය: එක් ප්‍රධාන අමතක වීමක් නිසා ය. නියම මිනිසා නම්, ආත්මය මිස ශරීරය නොවේ. පාපය ඇති වන්නේ මේ තත්ත්වය අමතක කිරීමෙනි. තමා ශරීරය යයි සිතා ගැනීමෙන් මෙය සිදු වේ.

1. 104 පිට බලන්න
2. මෙය තරමක් දුරට කාමසුඛල්ලිකානුයෝගයට හා අත්තකිලමථානුයෝගයට සමාන යයි කිව හැකි ය.

මිනිසා විසින් සටන් කළ යුත්තේ ශරීරය ආත්මය යයි වරදවා ගැනීමේ මිරිඟුවට විරුද්ධවයි. ඒ මිරිඟුවට විරුද්ධව සටන් කිරීමට ඇති ඒකාන්ත මාර්ගය නැතැයි කීමේ මාර්ගය නොව තමා ආත්මය වශයෙන් අඳුනා ගැනීමේ මාර්ගයයි.

මේ ආත්ම සංඥාව ලබා ගැනීමෙන් ක්‍රිස්තු සංඥාව ඇති වේ. ඉහත සඳහන් කළ නිදසුන්වලින් ද කේසි ලිපි ගොනුවල ඇති කායික කර්ම විපාක පිළිබඳ වෙනත් බොහෝ නිදසුන්වලින්ද සුවය සඳහා පළමුවෙන් ම නියම කර ඇත්තේ ආතුරයා විසින් කිසියම් ප්‍රමාණයෙකින් මේ ක්‍රිස්තු සංඥාව ඇති කර ගැනීම බව පෙනේ.

කෙසේ හෝ ක්‍රිස්තු සංඥාව යන්න තනිකර ක්‍රිස්තියානි ගුණයෙක් නො වේ. ක්‍රිස්තු යන්න යේසුස් නම් වූ මිනිසාගේ නාමය නොවන බව මතක තබා ගත යුතු ය. ක්‍රිස්තුස් යන වචනයේ හුදු වචනාර්ථය ශුද්ධත්වයට පත් වූ තැනැත්තා යනුයි. එහි ගූඪාර්ථය නැතහොත් මනෝවිද්‍යාත්මක අර්ථය මිදුණු නැතහොත් පිරිසිදු වූ සිත යනුයි. ශ්‍රී කෘෂ්ණ හා බුදුරජාණන් වහන්සේ මේ ක්‍රිස්තු සංඥාව ඇත්තේ යයි අපට ඇදහිය හැකිය. ලෝකයේ සෑම තැන ම සිටින මනුෂ්‍යයෝ නො පැහැදිලි අවුල් සහිත ආකාරයෙකින් නමුත් මේ සංඥාව ඇති කර ගැනීමට දඟලති.[1] ඔවුන්ගේ ආචාර්යවරයා, කවරකු වුවත් ඒ සංඥාවේ ප්‍රකට වීමට කවර නමක් දුන්නත් එය කාරණයෙක් නොවේ.

කේසි කියැවීම්වල දී ක්‍රිස්තියානි සම්ප්‍රදායේ වාග් ව්‍යවහාර යෙදී ඇති බව සත්‍ය ය. මෙහි හේතුව විය හැක්කේ කේසි, ක්‍රිස්තියානි ලබ්ධිය තුළ හැදී වැඩී තිබීමයි. ඔහුගේ උඩු සිත

1. ධම්ම පද :

වාරිජෝව ථලෙ ඛිත්තෝ - ඕකමෝකත උබ්භතො
පරිප්ඵන්දතිදං චිත්තං - මාරධෙය්‍යං පහාතවේ

(ස්වකීය ජල නමැති ගෘහයෙන් උඩට ගෙන ගොඩ දමන ලද මාළුවකු මෙන් මේ සිත මාරයාගේ විෂය (සංසාරය) අත හරින්නට දඟලයි.)

ක්‍රිස්තියානි උපමා රූපකවල හා මතවල ගිලී පැවැත්තේ ය. මෙසේ සම්මෝහනිද්‍රාව තුළ වූ කේසිගේ යටි සිතේ හැම කියමනක් ම ඉහත කී තිරය තුළින් රිංගා ආවේ ය. කේසි බෞද්ධ රටෙක උපන්නා නම් ඔහු තම ඥානය ඒ සංස්කෘති පරිසරයට ගැළපෙන්නට සකස් කර ගෙන බොහෝ සෙයින් බෞද්ධ වූ වාග් ව්‍යවහාරයක් භාවිත කරනු ඇතැයි සිතිය හැකිය. එහෙත් කියා ඇති මේ විශේෂ ක්‍රමය, ඔහු කියා ඇති දෙය ප්‍රයෝජනයට ගැනීමට බාධකයක් නොවිය යුතු ය.

නිදසුනක් වශයෙන් කොඳු ඇටයේ කාශයෙන් පෙළුණු මිනිසකුට දුන් උපදේශයෙක් පහත එයි.

"මේ තත්ත්වයෙහි ආරම්භය ඔබගේ ආත්මයෙහි සිදු වූවක් බව මතක තබා ගන්න. මෙය කරුම රෝගයෙකි. මෙයට හොඳම ප්‍රතිකාරය ලබා ගත හැක්කේ නියාමය සම්පූර්ණ කිරීමෙන් හේතු ඵල නියාමය ඉවත් කොට ප්‍රසාද නියාමය පිහිටුවා වූ උන්වහන්සේ ගෙන් ය. මෙසේ මේ ආත්මය, නියාමය ද සත්‍යයද ආලෝකය ද වූ උන්වහන්සේගේ පිහිට ලබා ගත යුතු ය."

මෙහි සඳහන් වන "ප්‍රසාද නියාමය" ක්‍රිස්තියානි ලෝකයේ හෙවත් "යේසුස් ක්‍රිස්තුන් ගැන අදහන්නවුන්ගේ" විශේෂ ගුණයෙක් නොවේ. ක්‍රිස්තියානියකු විසින් මෙන් බෞද්ධයකු විසින් ද හින්දුවකු විසින් ද මහම්මදිකයකු විසින් ද එකසේ ප්‍රසාදය ලැබිය හැකි ය. "නියාමය, සත්‍යය හා ආලෝකය" යන වචන සාමාන්‍යයෙන් ක්‍රිස්තියානීන් විසින් යේසුස්තුමාට යොදන වචන ය. එහෙත් නියාමය හා සත්‍යය යන වචන අන්‍ය ශ්‍රේෂ්ඨ ආගමික ශාස්තෘවරුනට ද උන්වහන්සේලාගේ ධර්මයට ද යෙදිය හැකි ය. ආලෝකය සත්‍යයේත් දෙවියන් වහන්සේගෙන් උන්වහන්සේගේ ශුද්ධ වූ ප්‍රකට වීමෙන් සංකේතය වශයෙන් සර්ව සාධාරණ ය.

එසේ ම "ඔබගේ ආත්මය ශුද්ධාත්මයෙන් අභිෂේක කරනු ලබන තාක්" යන, බහුප්‍රකාර ස්ක්ලෙරෝසිස් [1] රෝගයෙන් පෙළුණු රෝගියා පිළිබඳව යොදා ඇති ව්‍යවහාරය ද නියම ක්‍රිස්තියානි එකෙකි. එහෙත් එහි ඇති අර්ථය එනම් තමාගේ දිව්‍යත්වය අවබෝධ කිරීමෙන් පසුව එන නව ජීව ප්‍රවාහය යන්න ලෝකයේ ඇති, යෝග භාවනා ගැන ඉගැන්වෙන සියලු ආගම්වල දී නානා ප්‍රකාර උපමා රූපකවලින් ප්‍රකාශ කර තිබේ. මෙසේ කේසී කියැවීම්, ක්‍රිස්තු - සංඥා ගැන කියන විට සිදු වන්නේ ක්‍රිස්තියානි සම්ප්‍රදාය යෙහි ඇති වූ අයට හොඳට ම පිළිගත හැකි වචනය යෙදීමයි. කෙසේ හෝ මේ වචනයෙන් අදහස් කෙරෙන්නේ, තවත් නොයෙක් නම් යෙදිය හැකි මානසික තත්ත්වයෙක් හෝ අවස්ථාවෙකි.

අධ්‍යාත්ම සංඥාව හෙවත් ක්‍රිස්තු සංඥාව ලබා ගැනීම ප්‍රසාද නියාමයයි. එයින් කර්ම විපාක විඳීම දිය කර හරිනු ලැබේ.[2] යේසු තුමාගේ වචනවලින් කියනවා නම් අධ්‍යාත්ම සංඥාව "නියාමය සපුරා ලයි" එයින් කියැවෙන්නේ ඒ නිසා මුල් කර්මයේ හේතුව වූ වරද නැති කෙරෙන බවයි. එය යේසුතුමා කියනවා ඇත්තේ මෙසේ යඃ "මා එන්නේ අධ්‍යාත්ම සංඥාවෙන් නියාමය ක්‍රියාවේ යොදවන හැටි ඉගැන්වීමට මිස එය විනාශ කිරීමට නොවේ."

එහෙත් මේ සංඥාව සම්පූර්ණයෙන් ඇති කර ගැනීම දුෂ්කරය. ඒත් කියැවීමෙකින් මෙසේ කියැවේ. "දේව ශක්ති සංඥාවට කෙටි පාරක් නැති බව මතක තබා ගන්න. එය ඔබගේම විඥානයේ කොටසෙකි. එහෙත් එය සරල ප්‍රාර්ථනා මාත්‍රයෙකින් ලබා ගත නො හැකි ය. ඒ පිළිබඳ හුදු උවමනාවෙක් හා බලාපොරොත්තුවෙක්, බොහෝ විට ඇති වේ. එපමණෙකින් එය ලබාගත නොහැකි ය. ඒ සඳහා මානසික ක්‍රියා මාර්ගයෙකින්

1. 146 පිට 2. කර්ම ක්‍ෂයකර ඥානය ගැන සිතන්න.

ආධ්‍යාත්මික සත්‍යයේ ක්‍රියාවට නැඟීමක් තිබිය යුතු ය. දර්ශන දකින්නන් ද සංඛ්‍යා තේරුම් කරන්නන් ද තාරකා පාඨකයන් ද කුමක් කීවත් අධ්‍යාත්ම විද්‍යාවෙහි කෙටි පාරවල් නැත. මිනිසුනට කොතෙක් පෙළඹීම් තිබුණත් මේවායින් පමණක් චේතනාව පාලනය නොවේ. ජීවිතය උගත හැක්කේ ආත්මය තුළිනි. එය කියා පෑ යුත්තෙක් නොවේ. එය උගත යුත්තෙකි."

නෑ බෑ නොකියා සිටීම, භාවනාව, යාච්ඤාව, ආගමික ග්‍රන්ථ ඉගෙනීම සද්ගුණ ප්‍රගුණ කිරීම, සමාජයට සේවය කිරීම යන මේවා අමුතු සංඥාවක් ලබා ගැනීම සඳහා කියැවීම්වලින් නිතර හොඳ යයි නියම කර ඇති දේ ය. එහෙත් නියම අභිවෘද්ධිය යාන්ත්‍රික වශයෙන් ඇති කර ගත නො හැකි ය. හදවත අවශ්‍ය පමණට මෘදු කර ගෙන නැති නම් මේ ප්‍රගුණ කිරීම් නිෂ්ඵල වනු ඇත. නියම පරිත්‍යාග චේතනාවෙන් තොර නම්, ඒවා ඒකාන්තයෙන් ම නිෂ්ඵලය. හික්මවීම් වශයෙන්, ඒවායේ වටිනාකමෙක් ඇත. යෝජනා කිරීම් වශයෙන් ඒවායේ ප්‍රතිඵල ඇත. ඒවා ආත්මය නියම මඟ තබයි. එහෙත් බාලාංශ අවස්ථාවේ සිටින අප්‍රමාණ ආත්ම වහා ම උසස් විද්‍යාලයකට යැවීමට ඒවාට බැරි ය. සියලු මනුෂ්‍යයෙන් එක් ජීවිත කාලයක් තුළ දී සකල සත්ත්වයන් කෙරෙහි පහළ වූ මහා මෛත්‍රිය ඇති කර ගැනීමට තරම් ආධ්‍යාත්මික වශයෙන් දියුණු නැත. ක්‍රිස්තු-සංඥාවේ සාරය එබඳු මෛත්‍රියයි. කර්ම ණයෙන් නිදහස ලබා දෙන්නේ ඒ මෛත්‍රියයි.

සන්ධි ඉදිමීමේ රෝගයෙන් පෙළුණු තරුණයා සම්බන්ධ සිද්ධියේ දී ඔහුට මෙය ඇති කර ගත නොහැකි බව, (කේසිගේ) "තොරතුරු මූලාශ්‍රය" දැන සිටි බව පෙනේ. ඒ නිසා කේසි, ඉන්ද්‍රිය පද්ධතියෙන් සියලු හැකි කම් දන්නා වූ ද බොරු බලාපොරොත්තු වලින් තම රෝගියා නොමඟ නො යවන්නා වූ ද වෛද්‍යවරයකුගේ අවංක භාවයෙන් මෙසේ කියයි.

"සහනයක් ඇති කර ගත හැකි නමුත් සම්පූර්ණ සුවයක් ඇති කර ගත නොහැකි ය."

එහෙත් ඔහු, කරුණු එතෙකින් අත හරින්නේ නැත. මෙහි දීත් තවත් මෙබඳු නිදසුන්වල දීත්, හේ කායික ප්‍රතිකාර ක්‍රම යෝජනා කරයි. මෙසේ සම්පූර්ණ සුවයක් ලබා ගත හැකි වූවත් නැතත් ආතුරයාට ඔහුගේ පීඩාව යටපත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක උත්සාහයක් ගැනීමට උපදෙස් දෙනු ලැබේ. ඒ ක්‍රියා මාර්ගයේ දී උගන්නට ලැබෙන ඉවසීම, ධෛර්යය, ස්ථිරත්වය හා නිහතමානීත්වය ආදී අන් සියලු සද්ගුණත්, කර්ම ණය ගෙවීමට අවශ්‍ය සද්ගුණ දියුණුවට උපනිශ්‍රය වශයෙන් හෝ හේතු වේ. ඒ නිසා කර්ම විපාක කෙරෙහි නිෂ්ක්‍රිය ආකල්පයක් දියුණු කරනු වෙනුවට කියැවීම්වලින් වේගවත් සප්‍රාණ ක්‍රියාකාරිත්වයකට ධෛර්ය ලැබෙන බව පැහැදිලි ය.

මේ ප්‍රතිකාර ක්‍රමයේ ඇති තවත් වැදගත් අංගයෙක් නම් පුද්ගලයනට ඔවුන්ගේ දියුණු වීම් තත්ත්වයට අනුව උපදෙස් දිය යුතු බව කේසි දැන සිටීමයි. මානසික ප්‍රතිකාර තේරුම් ගැනීමට අසමර්ථ වූ ද ඒවාට විරුද්ධ වූ ද පුද්ගලයනට තනි කර මානසික ප්‍රතිකාර ක්‍රම යෝජනා කර නැත. ඇලෙක්සිස් කැරල් නම් විද්‍යාඥයාගේ Man the Unknown හා The Voyage to Lourdes යන පොත්වල ඇති සාක්ෂ්‍යයට අනුව, තද ආගමික භක්තියක් ඇති බොහෝ පුද්ගලයන් ලූර්ඩ් පුරයේ වන්දනා ස්ථානය ළඟ දී පිළිකාවලිනුත් තවත් අසාධ්‍ය සේ පෙනෙන රෝගවලිනුත් සුවය ලබා ඇත. මේ සුවපත් වීම් සත්‍ය යයි පිළිගන්නත් එතරම් ශ්‍රද්ධාවක් නැති, එබඳු මානසික ආකල්පයක් හා කායික පක්ෂයට ශාප කිරීමට තරම් සූදානමක් ද නැති පුද්ගලයන් පිළිබඳව එබඳු සුවපත් වීම් බලාපොරොත්තු වීමට කිසි ම ඉඩෙක් නැත.

කේසිගේ කායික කියැවීම් රාශියක් තුලනාත්මකව හැදෑරීමේ දී ඒ ඒ පුද්ගලයාගේ විශ්වාසවල තරාතිරම කේසි

හැම විට ම පිළිගෙන ඇති බව පැහැදිලිව දක්නට ලැබේ. විශේෂ රෝග බොහොමයෙක දී ඇතැම් පුද්ගලයනට අදහසක් යෝජනා කිරීම් මාත්‍රයෙකින් සුවයක් ලබා ගත හැකි බව පැහැදිලිය. යෝජනාවේ පුදුම බලයත් යටි සිතේ කීකරුකමත් එබඳු ය. එහෙත් ඒ රෝගයේ ම අන් නිදසුන්වල දී ඒ ඒ පුද්ගලයන්ගේ අවිද්‍යාව, සැකය හෝ කිසියම් භෞතික දෘෂ්ටියෙක තදින් ගිලීම යන කරුණු නිසා ඒ ක්‍රමයෙන් ම සුවයක් ලබා ගැනීමට නොහැකි වූ බව පෙනෙන්නට තිබේ. ඔවුනට කායික ප්‍රතිකාර නියම කිරීම වඩා හොඳ බව කේසි පිළිගෙන තිබේ.

මහා යෝගියකුගේ භක්තිමත් ශිෂ්‍යයකු පිළිබඳ ව හින්දු ආචාර්යවරුන් විසින් කියා ඇති පුරාණ කතාන්තරයක් මෙහි දී සිහිපත් කිරීම සුදුසු ය. ප්‍රාතිහාර්ය කිරීම පිළිබඳ මූලික උපදේශ මේ ශිෂ්‍යයාට දෙන ලදි. මේ දක්ෂ ශිෂ්‍යයා විවේකී ව කල් යවා අවුරුදු දහයකට පසු ව තම ආචාර්යවරයා වෙත පෙරළා ආවේය. "ඔබ පසු ගිය අවුරුදුවල දී කුමක් කරමින් සිටියා ද" යි යෝගියා සාදරයෙන් ඇසුවේ ය. "ජලයේ ඇවිදිය හැකි සේ මගේ මනස පාලනය කර ගන්නට උගත්තෙමැ" යි ශිෂ්‍යයා තරමෙක ආඩම්බරයෙකින් යුතුව කීයේ ය. "මා ප්‍රිය දරුව, ඔබ නිකරුණේ කාලය නාස්ති කර තිබේ. ඔරුකාරයාට පැන්ස දෙකක් දී එගොඩට යන්නට පුළුවන් බව දන්නේ නැද්ද" යි යෝගියා කනගාටුවෙන් ඇසුවේ ය.

ශත වර්ෂ ගණනාවක් තිස්සේ මානසික බල වගාවට කැප වූ මනුෂ්‍ය වර්ගයක් විසින් කියා ඇති මේ කථාවෙහි රෝග ප්‍රතිකාරය පිළිබඳ සියලු කායික උපායවලට විරුද්ධ වන අය විසින් ගැඹුරින් සලකා බැලිය යුතු වූ ව්‍යවහාර ඥානයෙක් ඇත. තනිකර මානසික ප්‍රතිකාරයක් ලබා ගැනීමට උත්සාහ ගැනීම ප්‍රශංසා කටයුතු වූ ද දිරි ගන්වනසුලු වූ ද එකක් බව

සහතිකයි. ක්‍රිස්තියානි විද්‍යාව[1], ආගමික විද්‍යාව[2], ඒකතාව[3] හා එබඳු අධ්‍යාත්මවාදී ව්‍යාපාර, මනස බොහෝ රෝගවල මූලය බවත් ඒ නිසා ම බොහෝ ප්‍රතිකාරවල ද මූලය වන බවත් මහජනයාට අවබෝධ කරවීමට බොහෝ කටයුතු කර ඇත. කෙසේ හෝ රෝගය මානසික මූලයෙකින් ඇති නොවන අවස්ථා ද ඇති බවත් රෝග මූලය කුමක් වුවත් කායික ප්‍රතිකාරය මානසික ප්‍රතිකාරයට වඩා යහපත් වන අවස්ථා ද ඇති බවත් චිත්ත කාය චිකිත්සාවේ[4] දී පිළිගෙන ඇති පරිදි අධ්‍යාත්ම විද්‍යාවේ දී පිළිගැනීම සුදුසු ය.

කේසිගේ ප්‍රතිකාර ක්‍රමයේ තුබූ තවත් වැදගත් අංගයෙක් නම්, අන්තිමට බලන විට එක් ප්‍රතිකාර ක්‍රමයක් තවත් ප්‍රතිකාර ක්‍රමයකට වැඩියෙන් ආධ්‍යාත්මික යයි නොපිළිගැනීමයි. සියලු ප්‍රතිකාර ක්‍රමවලට එක් දිව්‍යමය ප්‍රභවයෙක් ඇත.

තද පිට රුජාවක් තුබූ එක් ස්ත්‍රියක් තමා විසින් ලබා ගත යුත්තේ කායික සංස්කරණ ද නැතහොත් ආධ්‍යාත්මික ප්‍රතිකාර දැයි විමසුවා ය. කියැවීමෙන් ඇගේ ප්‍රශ්නයට පිළිතුරු ලැබුණේ මතු දැක්වෙන අයුරිනි;

"මෙයින් වැඩි හරියක් මානසික වශයෙන් යටපත් කර ගත හැකි ය. එහෙත් වෙනස් කම් ඇති වන හැටියට ඒවාට මුහුණ දිය යුතු ය. වේදනාව ඉතා අධික නම් ශාරීරික අවශ්‍යතාවට සරිලන සංස්කරණයක් හෝ ප්‍රතිකාරයක් ලබා ගන්න. ශාරීරික හා මානසික ප්‍රතිකාර අතර නියම වෙනසෙක් නැත. කොයි ප්‍රතිකාර ක්‍රමයේ දීත් යහපත ලැබෙන්නේ එක ම ප්‍රභවයෙනි. සමහර පුද්ගලයන් සිතන්නාක් මෙන් ඒවා පරස්පර විරෝධී නොවේ.

---

1. Christian Science 2. Religious Science
3. Unity (මේ තුන ම භෞතික පක්ෂය ගැන නොසලකන ආගමික ව්‍යාපාරය)
4. 101 පිට බලන්න.

ස්වාමීන් වහන්සේ සියලු මිනිසුන් සුවපත් කෙළේ එක් ආකාරයෙකින් ද ? සමහර අයට උන් වහන්සේ යාන්ත්‍රික උපක්‍රම නොයෙදූ සේක් ද ? අන්‍යයනට දහම් පණිවිඩය යවන්නට යයි නොකී සේක් ද ? තවත් සමහරුනට නිකම් ම කට වචනය නොයෙදූ සේක් ද? මේ ප්‍රථම මූල ධර්මය, මේ ප්‍රතිෂ්ඨාව, මතක තබා ගන්න. ඔබේ දෙවියන් වහන්සේ එක් කෙනෙක් ම ය.

ඒ නිසා කාය මනස් හා ආත්ම යන හැම ක්ෂේත්‍රයෙක ම ඒ ඒකත්වයට සරිලන පදමෙක් ඇත. හැම අංශයෙක ම ඊට අයත් ගුණ හා සීමා ඇත. පූර්ණ ඒකත්වය ඇත්තේ උන්වහන්සේ කෙරෙහි ය.

අවුරුදු 10 ක් තිස්සේ සන්ධි ඉදිමීමෙන් පෙළුණු පුවත්පත් කරුවෙක් පිට්ස්බර්ග්හි වී ය. ඔහු කායික ප්‍රතිකාරවලට වැඩියෙන් ප්‍රිය කෙළේ ආධ්‍යාත්මික ප්‍රතිකාරවලට ය. ඔහුගේ රුධිර ධාවනය හා මල පහවීම අධික කිරීමට ජල චිකිත්සක ක්‍රමත් [1] පාරජම්බුල කිරණ ප්‍රතිකාරත් [2] නියම කරන ලදී. ඔහුට මෙසේ කියා තිබේ.

"ලබා ගත හැකි හැම සුවයෙක් ම ඇත්තේ ඔබ තුළ ය. හැම සුවයෙක් ම එන්නේ දිව්‍යත්වයෙනි. ඔබගේ රෝග සුව කරන්නේ කවරෙක් ද ? ජගත් සම්පාදනයේ මූලයයි.

මේ හැම ප්‍රභවයෙක් ම එන්නේ එක් මහා ප්‍රභවයෙකිනි. යෙදීම්වලින් සිදුවන්නේ ශරීරයේ පරමාණු ප්‍රබුද්ධ කිරීම පමණි. හැම සෛලයක් ම පූර්ණ විශ්වයක් බඳු ය.

ශරීරයක් කෙරෙහි ක්‍රියාත්මක වන බලපෑම් ඖෂධයෙන් හෝ යාන්ත්‍රික උපක්‍රමවලින් හෝ ජල චිකිත්සාවෙන් හෝ වෙන මොන ම දේකින් හෝ ආවත් ඒ එන්නේ එක් මහා ප්‍රභවයෙකිනි. ඒ මහා ප්‍රභවය නම් ජීවයයි.

1. Hydrotherapy treatments (= ජලය භාවිතයෙන් කෙරෙන පිළියම් විශේෂයක්)
2. Ultraviolet ray treatments (= ඇසට නොපෙනෙන කිරණ වර්ගයක් යොදා කරන පිළියම් විශේෂයෙක්.)

කේසිගේ චිකිත්සක දර්ශනවාදය සම්බන්ධයෙන් තවත් එක් කරුණක් සඳහන් කළ යුතුව ඇත. පරම වූ අර්ථයෙකින් බලන විට හැම කාර්ය කාරණ සම්බන්ධයක් ම ඇත්තේ, දෙවියන් වහන්සේ ගේ චේතනාව හා මිනිසාගේ චේතනාව අතර ම ය. එහෙත් අප භෞතික ද්‍රව්‍යයේ බෙහෙවින් ගිලී ගිය ලෝකයෙක වාසය කරන නිසාත්, අනේක ආත්ම සමූහවලත් අනේක ව්‍යාපාර මාර්ගවලත් මැදි වී සිටින නිසාත් අපට විවිධ කාර්ය කාරණ සම්බන්ධතා මට්ටම්වලින් ප්‍රයෝජන ගත හැකි ව ඇත. එසේ ම ඒවා ද අප කෙරෙහි බලපායි.

නිදසුනක් ගනිමු. අපි හෝටලයකට ගොස් පිළුණු කිරි යෙදූ කෑමක් ගත් නිසා කුණු කිරි විෂ වීමෙක් අසනීප වූවා යයි සිතමු. ඇතැම් මනෝ විග්‍රාහකයන්[1] හා ආධ්‍යාත්මික චින්තකයන් මේ රෝග මානසික හේතුවක් නිසා ඇති වූවෙකැයි කියනු ඇත. සමහර විට මේ රෝගය ජීවිතයේ ඇති කිසියම් තත්ත්වයක් සිතින් ඉවත ලීමෙක ප්‍රතිඵලයක් ලෙස ඔවුනට පෙනෙනු ඇත. ඔවුන්ගේ තර්කය දිගට ගෙන ගියහොත් අපට බැස ගන්නට සිදු වන යුක්ති සහගත නිගමනය නම් ඒ හෝටලයේ ඒ කෑම තොගය කෑ 250 කට අධික වූ සෑම දෙන ම ඒ මානසික ප්‍රතික්ෂේපයෙන් යුතු ව සිටි බව ය. ඔවුන් ඒ හෝටලයට ගියේ සමහර විට යටි සිතේ බලපෑම නිසා වමනය ඇති වූයේ ඇයි ද යන්නට නිදහසට කරුණක් ලබනු සඳහා විය හැකි ය.

ජීවිතයේ දී අපට සිදුවන ඉතා කුඩා දේවල් පවා සිදු වන්නේ මානසික හේතු නිසා ම යයි කියනවා නම් අපට සිදු වන්නේ එබඳු නිගමනයකට බැසීමට ය. සමහර විට මේ නිගමනය කොතරම් දුරස්ථ සේ පෙනුණත් හරි යන්නටත් ඉඩ තිබේ. කේසි කියැවීම්වල සාක්කිවලට අනුව, මේ ලෝකයේ බොහෝ සිද්ධි අදෘෂ්ට බලයක් නිසා සිදු වන බව පෙනෙයි. ඒ

1. Analysts.

නිසා ඉහත සඳහන් නිගමනය සත්‍ය වන්නට බැරි යයි අපට කිව නො හැකි ය. ඒ කෙසේ වෙතත්, 250 කට වැඩි දෙනකුට කුණු වූ ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගත් බේකරයකුගේ නො සැලකිල්ල නිසා හෝ මුදල් කෑදර කම නිසා හෝ දුක් විඳින්නට සිදු වූවා යයි සිතිම වඩා සහේතුක ය. කුණු වූ කිරි යොදයේ තිබූ විෂ සහිත වූ රසායනික ද්‍රව්‍ය ඔවුන්ගේ ආමාශය තුළ වූ ද්‍රව්‍ය කෙරෙහි බලපාන්නට ඇත. මේ සිද්ධිය හුදෙක් කායික මට්ටමෙහි දී සිදු වූවකි. මනුෂ්‍යයන් වශයෙන් අද අප ජීවත් වන්නේ භෞතික ලෝකයෙක ය. මේ ලෝකයෙහි දී රසායනික වූ ද ජීව විද්‍යාත්මක වූ ද යාන්ත්‍රික වූ ද සාමාජික වූ ද ගෝත්‍රික හා ආර්ථික වූ ද බොහෝ නියාම ධර්ම අප කෙරෙහි බලපායි. ඒවායින් අපට හානි නො කළ හැකි තත්ත්වයක් ලබා ගැනීමට වැඩියෙන් අපට ඒ පිළිබඳව කළ හැකි යමක් නැති බව පිළිගැනීම වඩා තාත්වික වූ ද වඩා පළල් වූ ද මතය බව පෙනේ. මේ නිසා කේසි, තනිකර කායික වූ තත්ත්වයකට හොඳ යයි කීවේ තනිකර කායික වූ ප්‍රතිකාරයෙකි. විෂයට සාමාන්‍ය විෂ නාශකයෙක් හොඳ ය. නැල්මට නැවීම හොඳ ය. හොඳ දේශගුණයක් ලැබීමට කළ යුත්තේ වෙන ප්‍රදේශයක වාසයට යෑම ය.

වීදියෙක දී වැටී අතක් කැඩෙන්නේ කවර හෙයින් ද ? මානසික වෛද්‍ය විද්‍යාඥයන් විසින් හා චිත්ත කාය චිකිත්සක විශේෂඥයන් විසින් ප්‍රමාණවත් ව පෙන්නා ඇති ලෙසින් 'අන්තරාය ප්‍රවණතා' චිත්ත ගතියක් හෝ ප්‍රමාණ පුද්ගල ගතියක් හෝ නිසා ද?

වැටීමට හේතු වූයේ, කැඩුණු පදික වේදිකාවක් හෝ නොසැලැකිලිමත් කොල්ලකුගේ නෙරා ගිය බයිසිකල් රෝදයක් හෝ විය හැකි ය. ඊට වඩා සංකීර්ණ වූ හේතුවක් එහි නොතිබෙන්නට පුළුවන. එසේ නම් අභ්‍යන්තර හේතුවක්

1. "accident - prone" temperament (අනතුරට නැමුණු ගතිය.)

සෙවීමට ආත්මය පරීක්ෂා කළ යුතු නොවේ. කොයි හැටි වුවත් යෝජනා කිරීම, සහතික කිරීම[1] සිතින් මවා ගැනීම[2] යාච්ඤා කිරීම, ඇදහීම යන මානසික උපක්‍රම, ඇට බිඳීමේ හේතුව කුමක් වුවත් සන්ධි වීම ඉක්මන් කරයි.[3] මෙසේ වීමට ඇති චිත්ත කායික හේතු අප තව ම හරි හැටි දන්නේ නැත. එහෙත් නිදන කේසී විසින් පවසා ඇති සිතුවිල්ලක් සිහියට ගැනීම සුදුසු ය. "නිතර ම ලෝක නිර්මාණයේ දී පවා අහඹු සිදු වේ." මේ ගුඪ වාක්‍යය, සිදු වන හැම දෙයක් ම කිසියම් තනි හේතුඵල වාදයකට පවරා දීමෙන් අප වළක්වා ලීමට සමත් විය යුතු ය.

කේසී කියැවීම්වල එන කායික පිළියම් ක්‍රම, හේතුඵලවාදය පිළිබඳ අදහස්වලින් තොර ව තනිකර ගත්තත් සිත් අලවනසුලුය. කර්ම විපාක රෝගවල දීත් කර්මය ගැන කිසි ම සඳහනක් නොකළ රෝගවල දීත් එක සේ නියම කරන ලද මේ ප්‍රතිකාර ක්‍රම වෙන ම ගෙන හැදෑරීමට සුදුසු ය. වෛද්‍යවරයකු සෙයින් මේ "තොරතුරු මූලාශ්‍රය" ද ප්‍රතිකාර ක්‍රම තෝරා ගැනීමේ දී අතිශයින් සර්ව සංග්‍රාහක වී ඇත. කියැවීම්වලින් නියම කොට ඇති ප්‍රතිකාර ලැයිස්තුවට ආහාරය, ව්‍යායාමය, ඖෂධය, විටැමින් වර්ගය, ශල්‍යකර්මය, පලා වර්ග හා පලා වර්ග මිශ්‍රණය, සම්බාහනය[4], අස්ථිචිකිත්සාව, ජල චිකිත්සාව, විද්‍යුත් චිකිත්සාව හා රේඩියෝ ඇක්ටිව් උපකරණය[5] හා වෙට් සෙල් උපකරණය[6] යයි නම් කරන ලද උපකරණ ද ඇතුළත් ය.

අවසානයට සඳහන් කරන ක්‍රම දෙක[7] එක් විදියෙකින් කේසීගේ ම නිපැදවීම ය. ඒවා තනා ගැනීමට කේසීගෙන් උපදෙස් ලැබුණේ නො ඉල්වන ලදුව ය. පසුව සිය ගණන් රෝගවල දී ඒවා භාවිතයට ගන්නට නියම කරන ලදී.

1. Affirmation
2. Visualisation
3. මැතිරීම ගැන සිතන්න.
4. "මසාජ්" කිරීම
5. Radio-active appliance
6. Wet-cell appliance
7. රේඩියෝ - ඇක්ටිව් උපකරණය හා වෙට්සෙල් උපකරණය යන දෙක.

අශ්වී-චිකිත්සාවේ ඇති රෝග නාශක හා නිවාරක අගයන් නිතර අවධාරණය කර තිබේ. ළදරු ඇස් ගායේ සිට දාරක ප්‍රසූතිය තෙක් වූ විවිධ ආබාධවල දී මේ භාවිතයෙන් පුදුම ප්‍රතිඵල ලැබුණු බව වාර්තා වී තිබේ.

තවත් මෙබඳු අමුතු ප්‍රතිකාර ක්‍රම කේසි කියැවීම්වලින් මතු වී ඇත. උගත් වෛද්‍යවරුන් විසින් බලාපොරොත්තු තබා ගත නො හැකි යයි ඉවත ලන ලද රෝගීන් සම්බන්ධයෙන් ඒ ප්‍රතිකාර ක්‍රමවලින් ලැබුණු ප්‍රතිඵල පිළිබඳ සාක්ෂ්‍ය පරීක්ෂා කොට ඉදිරිපත් කිරීමත් විවිධ රෝගයන්හි දී කරන ලද ප්‍රතිකාරයන්ගේ ප්‍රධාන ලක්ෂණ මතු කර ගැනීමත් වෛද්‍ය විද්‍යා විෂයෙහි ලබන ලද හික්මීමක් ඇති සුදුසු පරීක්ෂකයකු විසින් කළ යුතුව ඇති කාර්යයෙකි.

මෙතෙක් අප විසින් පරීක්ෂණයට පාත්‍ර කළ කරුණුවලින්, යෝජනා කෙරෙන නව මහා චිකිත්සා දර්ශනවාදයෙකත් මිනිසා පිළිබඳ ඒකාබද්ධ නව මහා විද්‍යාවෙකත් දළ සටහනෙක් ඇත. මිනිසා වනාහි කයය, මනසය, ආත්මයය යන මූලික අංග තුනෙකින් තැනුණු ඒකකයක් බව පෙනේ.[1] මිනිසාගේ මේ ත්‍රිවිධාංගය දිව්‍යත්වයේ ත්‍රිත්ව ස්වභාවයෙන් [2] ලැබුණාක් බඳු ය. තව ද ඒ තුන මිනිසා විසින් ගත වර්ෂ ගණනාවක් තිස්සේ දියුණු කරන ලද වෛද්‍ය විද්‍යාව, මනෝ විද්‍යාව හා ආගම යන මහා ඥානකායත්‍රයෙහි පිළිබිඹු ව ඇත. මේ ශාඛාත්‍රය මෙතෙක් ගමන් කොට ඇත්තේ වෙන් වූ ද බොහෝ විට ගැටෙන්නා වූ ද මාර්ගවල ය. එහෙත් මේ වෙන්වීම හා ගැටීම මිනිසාගේ තමා පිළිබඳ වූ අවිද්‍යාව නිසා ම වන්නට හොඳට ම ඉඩ තිබේ.

1. පාලි සූත්‍රයන් හි එන ඕලාරික, මනෝමය හා විඤ්ඤාණමය යන ආත්මභාව තුන ගැන සිතන්න.

2. ත්‍රිත්වය නම් පියා ය, පුත්‍රයා ය, ශුද්ධාත්මය ය යන තුනයි. කොන්ස්තන්තීනු හටනෙහි "පිතු පුත් විදියෙන තෙවක් එක් පුර වදිමි අදරින" යනු කියා ඇත්තේ මේ සඳහා ය.

සමහර විට වෛද්‍යවරයාත් මනෝ විද්‍යාඥයාත් යතිවරයාත් එක ම පරීක්ෂණාගාරයේ එකට වැඩ කරන්නන් විය හැකි ය, එකම මෘදු මැට්ටේ ඇඹුම්කරුවන් තිදෙනකුත් විය හැකි ය, එක ම දෙව් ගිනි මැළයේ මොළවන්නන් විය හැකි ය.

9

# මනෝවිද්‍යාවේ නව මානයෙක්[1]

ප්‍රහේලිකා විසඳීම උපදෙස් ලැබිය හැකි විනෝද ක්‍රීඩාවෙකි. ළමා ප්‍රහේලිකා විසඳීම් බොහොමයෙක වැදගත් තර්ක ශාස්ත්‍රීය මූල ධර්මයක් ගැබ් ව තිබේ. ප්‍රහේලිකාවලින් සියල්ලට ම වඩා වැදගත් වන්නේ මිනිසාගේ ඒකත්වයේ, ප්‍රභවයේ හා නිශ්ඨාවේ ප්‍රහේලිකාවයි. මේ ප්‍රහේලිකාවෙහි දී අපට සාමාන්‍ය ගිනිකූරු ප්‍රහේලිකාවෙකින් ලබා ගත් ඥානයක් ප්‍රයෝජනයට ගත හැකි වනු ඇත.

මේ ගිනිකූරු ප්‍රහේලිකාවේ දී කෙනකුට ගිනිකූරු හයක් දී ඒවායින් සමපාද ත්‍රිකෝණ සතරෙක දළ සටහන තනන්නට යයි කියනු ලැබේ. ඔහු විශ්වාසයෙන් යුතු ව ගිනිකූරු ත්‍රිකෝණාකාර ව හැඩ ගසනවා ඇත. එහෙත් ඔහුගේ ආත්ම විශ්වාසය, ඉක්මනින් ම අතුරුදහන් වෙයි. අන්තිමේ දී ඔහු විසඳුම් සෙවීමේ බලාපොරොත්තුව අත හරිනවා ඇත. ගිනිකූරු මාන දෙකෙකින් නොව තුනෙකින්[2] භාවිත කළ යුතු යයි ඔහුට

---

1. Dimension
2. මාන දෙක නම් දිග හා පළලය. තුනක් වන්නේ උසත් ගත් විටය.

සිතෙන තාක්, ගැටලුව විසඳිය හැකි නොවේ. ඔහු විසින් කළ යුත්තේ නිරර්ථක ව සම තල ත්‍රිකෝණ සෑදීම නොව කෙළින් සිටි පිරමීඩයක් තැනීමයි.

එක්තරා අර්ථයෙකින් මිනිසා පිළිබඳ ප්‍රහේලිකාව ද ගිනිකූරු ගැටලුවට සම කළ හැකි ය. අමුතු මානයක් එක්කර ගන්නේ නැති ව, ඒ කියන්නේ, අතීත ජීවිත පිළිබඳ කාලයේ මානය ප්‍රයෝජනයට නො ගෙන, මිනිසාට තමා තේරුම් ගත හැකි බවෙක් නො පෙනේ.

මිනිස් සිරුරේ උපතත් මරණයත් සාමාන්‍යයෙන් මිනිසාගේ ආරම්භය හා අන්තය ලෙස සලකනු ලැබේ. මිනිසෙකැයි කීමට තනිකර සිරුරක් පමණක් නොව ආත්මයකුත් අවශ්‍ය වන බවත් එසේ ම මේ ආත්මය උපතින් පෙර ද මරණින් මතු ද පවතින බවත්, විද්‍යානුකූල ව පෙන්වා දිය හැකි නම්, මේ සොයා ගැනීමෙන් මනෝ විද්‍යාව සම්පූර්ණයෙන් ම ප්‍රතිසංස්කරණය වනු ඇත. මෙය හරියට ම පොළොවේ මතු පිට සිට බිම ගැබ ගැඹුරු තලයකට මහා පතලයක් බැසීම බඳු වනු ඇත. මේ සොයා ගැනීම සමග සසඳන විට නවීන 'අගාධ' මනෝවිද්‍යාව[1] සැතපුම් දෙකක තෙල් පතලයක් සමග සැසැඳීමේ දී ලූනු ගෙඩියක් සිටුවීමට හාරන ලද අගල් දෙකෙක වළක් මෙන් නො ගැඹුරු වනු ඇත.

පළමු කොට ම එබඳු කාල මානයෙක එක්වීමෙන් චරිත ලක්ෂණ පිළිබඳ මිනිසාගේ අවබෝධය පළල් වෙයි. මනෝ විද්‍යාඥයන් විසින් කාලයක් තිස්සේ චරිතය තැනීමට ඉවහල් වන ගතිගුණ පිළිබඳ සංඛ්‍යා ලේඛනාත්මක වූත්, චිකිත්සාගාරික වූත්, මනා හැදෑරීම් කර ඇත. මේ හැදෑරීම් මිනිස් මනසේ කෞශල්‍යයට ඇති ස්මාරක ය. පුද්ගලයන් වැඩෙහි යෙදීමේ

1. 'Depth' Psychology ගැඹුර මනෝවිද්‍යාව - මෙය යටි සිත ගැන පිරික්සයි.

දීත් වෘත්තිය මාර්ග දේශකත්වයෙහි දී හා චිකිත්සාගාරික මනෝවිද්‍යාවේ දීත්, මේවායින් ලැබී ඇති ප්‍රායෝගික ප්‍රයෝජන අපමණ ය. එහෙත් තව ම ඒවායින් පෙනෙන්නේ මිනිසාගේ නො පලල් ඉදිරි පස පමණි.

පුනර්ජන්මවාදය පිළිගැනීමෙන් මිනිසාගේ නො පෙනෙන පසුබිමට වැටෙන්නේ මහා ආලෝක ධාරාවෙකි. නො පෙනෙන පසු බිම නම් ඉකුත් ව ගිය ආත්මභාවයි. මෙසේ ආලෝක වූ භූමියෙහි ඊට ම අයත් වූ, සිත් අලවනසුලු, අසිරිමත් අලංකාරයෙක් ඇත. එහෙත් එහි ප්‍රධාන ම වැදගත් කම ඇත්තේ වර්තමානයේ ඇති ගති ගුණ, සමර්ථතා හා ආකල්ප යන මේවායින් තැනුණු මහා ගංගාවට එකතු වන හෙමින් යන කුඩා ඇළ දොළ දක්නට ලැබීමෙහි ය.

උපමාව වෙනස් කොට ද දක්විය හැකි ය. පාවෙන අයිස් කන්දෙක දිය මතු පිට ඇත්තේ නවයෙන් එකකි. ඉතිරි නවයෙන් අට ඇත්තේ දිය යට ය. මනෝවිද්‍යාඥයන් විසින් මෙතෙක් දැඩි ආයාසයෙකින් පරීක්ෂා කරමින් සිටියේ මතු වූ නවයෙන් එකය. පුනර්ජන්මවාදයෙන්, යට තුබූ ඉතිරි නවයෙන් අටත් මතු කළාක් බඳුය.

කේසි ලිපි ගොනුවලින් මේ අතිරේක වූ කාල මානය පිළිබඳ අපමණ නිදසුන් සපයනු ලැබේ. චරිතය විවරණය කරන ආකාරය පිළිබඳ නිදසුන්වලින් ද කේසි ලිපි ගොනු පිරී ඇත. එක් කියැවීමෙක දී හනිබල් විසින් සිරකරුවකු ලෙස අල්ලා ගෙන බලයෙන් වෙළඳ යාත්‍රා පැදවීමට යොදන ලද පුරාතන ප්‍රංශ සොල්දාදුවකු ගැන කේසි කියා තිබේ. කළු පැහැති ඕවර්සියර්වරුන් විසින් ඔහුට සලකන ලද්දේ ක්‍රෑර ලෙස ය. අන්තිමේ දී ඔවුන්ගෙන් එකෙක් ඔහුට පහර දී ඔහු මරා දැම්මේය.

මෙය සිදු වූයේ ජීවිත තුනකට[1] ඉහත දී ය. ඒ දැඩි වේදනාකර අත්දැකීමෙන් ඇති වූ කළු මිනිසුන් පිළිබඳ ද්වේෂය ඔහුගේ ගැඹුරු යටි සිතෙහි ශත වර්ෂ විසි දෙකකට වැඩි කාලයක් පැවැත්තේ ය. මොහුගේ මෑත ම ජන්මය සිදු වූයේ අලබාමා ගොවියකු ලෙස ය. මුළු ජීවිත කාලය තුළ දී ම හේ දරුණු වෛරයෙකින් යුතු ව නීග්‍රෝවරුනට ද්වේෂ කෙළේ ය. වරක් හේ සුදු මිනිසුන්ගේ උසස් කම හුවා දැක්වීමට සංගමයක් ද පිහිටුවා ගත්තේ ය.

මෙය එක් ජීවිතයෙකින් තවත් ජීවිතයකට ආකල්පයක් ගමන් කිරීම පිළිබඳ හොඳ නිදසුනෙකි. ජීවිත කියැවීම් ලිපි ගොනුවල මෙබඳු නිදසුන් බොහෝ ගණනෙක් ඇත. එක් පුවත්පත් ලේඛිකාවකට දිගු කලක් තිස්සේ, තද සෙමිටික්[2] විරෝධී ආකල්පයක් තිබුණේ ය. ඇය පිළිබඳ ජීවිත කියවීමේ දී මෙය පලස්තීනයේ දී ලබන ලද අත්දැකීමෙකින් ඇති වූවක් බව දැන ගන්නට ලැබිණි. එකල්හි ඕ තම අසල්වාසී යුදෙව්වන් සමග නිතර බිහිසුණු ගැටුම් වල පැටලැවුණු සැමරිටානුවක්[3] වූවා ය.

තිස් අට හැවිරිදි අවිවාහක ස්ත්‍රියකව ඇගේ ජීවිත කාලය තුළ දී ප්‍රේම සම්බන්ධතා කීපයක් තුබූ නමුත් කිසි දිනෙක දී වත් විවාහයකට ඇතුළු වීමට නො හැකි විය. එසේ වීමට හේතුව පිරිමින් පිළිබඳ ඈ තුළ පැවැති තද අවිශ්වාසයයි. මේ බිය ඇති

---

1. මෙතැන දීත් වෙනත් නොයෙක් තැන්වල දීත් කේසි නියම ආත්මභාව ලෙස සලකා ඇති බව පෙනෙන්නේ මේ ලෝකයෙහි ලබන ආත්ම භාවය. සෙසු ජන්ම අන්තරාභව වශයෙන් සැලකුවා විය හැකි ය. පූර්ව ජන්ම පිළිබඳ වෙනත් වාර්තාවලින් ද අන්තරාභව ස්වභාවයෙක් හෙළි වෙයි. ඇතැම් බෞද්ධ නිකාය ද අන්තරා භවවාදය පිළිගෙන තිබේ. මහාවිහාරික ථෙරවාදය මේ මතයට විරුද්ධ ය.
2. සෙමිටික් යන්න යුදෙව්, අරාබි, පුරාතන ඇසිරියානු ෆිනීෂියානු ආදී ජන ප්‍රවාහයන් රාශියක් සඳහා යෙදෙන විශේෂණයෙකි.
3. සැමරිටානුවෝ නම් පලස්තීනයේ දිස්ත්‍රික්කයක් වන සමේරියාවේ වැසියෝය.

වූ ඇත්තේ අතීත අත්දැකීමෙකිනි. පූර්ව ජන්මයෙක දී ඇගේ ස්වාමියා කුරුස යුද්ධවලට[1] යෑමට ඇය අත හැර ගියේ ය.

එක් ස්ත්‍රියකට ආගමික විශ්වාසයන් පිළිබඳ, කැපී පෙනෙන ඉවැසීමක් තිබුණේ ය. මහම්මදිකයන් අතර කුරුස යුද්ධකරුවකු වශයෙන් සිටි කාලයේ දී ඇය මේ ගුණය ඇති කර ගත් බව ඇයට කියා තිබේ. අන්‍ය ලබ්ධික මනුෂ්‍යයන් හමුවීම නිසා, ඇයට පළමු වරට, විඥානවාදයත් ධෛර්යය හා කරුණාවත්, ක්‍රිස්තියානි නො වූවන් අතර ද පවතින බව දැන ගන්නට ලැබුණේ ය. මේ කාවැදීම කොතරම් බලගතු වූවා ද යත හොත්, කල් පවතින ආගමික ඉවැසීමෙක් ඈ තුළ ඉතිරි විය.

ආගමික කරුණු පිළිබඳ ව බොහෝ සෙයින් සංශයවාදියකු වූ දන්වීම් ලියන්නෙක් ද කුරුස යුද්ධකාරයකු වී සිටියේ ය. ඔහුට ආශ්‍රය කරන්නට ලැබුණු පුද්ගලයන්ගේ පැවැති ආගමික ප්‍රතිඥා හා ප්‍රතිපත්තිය අතර වූ පරස්පර විරෝධයෙන් ඔහු කොතරම් කලකිරී සිටියා ද යතහොත් ඔහු තුළ බාහිර ආගමික ප්‍රතිඥා පිළිබඳ තද අවිශ්වාසයෙක් ඇති විය.

මෙහි දී අපට ජාතිය කෙරෙහි ද, විරුද්ධ ලිංගිකයන් කෙරෙහි ද, ආගම කෙරෙහි ද, කියා ආකල්ප තුන් වර්ගයක් ලැබී ඇත. මේවාට පදනම වැටී ඇති බව පෙනෙන්නේ පූර්ව ජන්මයෙකදී ය. මේ හැම නිදසුනෙක දී ම එබඳු ප්‍රතික්‍රියාවක් ඇතිවීම සඳහා සමකාලීන පරිසරගත හේතු ඇති වීම ද ස්වාභාවිකය. නීග්‍රෝවරුනට ද්වේෂ කළ මිනිසා 1853 දී ජන්මය ලැබුයේ දක්ෂිණ දේශයේ ය. ඔහුගේ පරිසරයේ චාරිත්‍රවලින් හා සම්ප්‍රදායවලින් ජාති ආධිපත්‍ය රසයේ බීජය වැඩීමට ලැබුණේ සාරවත් භූමියෙකි. කියන ලද අනෙක් නිදසුන්වල දීත්, කෝසි

1. කුරුස යුද්ධ නම් ක්‍රිස්තුස් වහන්සේගේ ජාත භූමිය වන ජෙරුසලම මහම්මදිකයන්ගෙන් බේරා ගැනීමට මධ්‍ය කාලයේ දී ක්‍රිස්තියානීන් විසින් කරන ලද යුද්ධ ය.

ලිපි ගොනුවල ඇති වෙනත් නොයෙක් නිදසුන්වල දීත්, ඒ ඒ ආකල්ප මතු වීමට සුදුසු සමකාලීන හේතු තිබිණැයි තර්ක කළ හැකි ය. එහෙත් ඇතැම් අයගේ ආකල්ප වල ඇති සැර ගතිය නිසාත්, ඒ පරිසරයේ ම ඇති දැඩි වූ ඇතැම් අයට ඒ ආකල්ප ඇති නොවන නිසාත්, මීට වඩා ගැඹුරු වූ අන්‍ය හේතුවක් ද ඇතැයි සලකන්නට සිදු වේ.

පුද්ගලයකුගේ ප්‍රධාන ජීවිත ආකල්ප යටි සිතෙන් මතු වේ ය යන්නෙහි දී මානසික වෛද්‍ය විද්‍යාඥයෝ ඒකමතික වෙති. පුනර්ජන්මවාදයෙන් කෙරෙන්නේ, අතීත ජීවිත අද්දැකීම්වල ක්‍රියාකාරීත්වයත් ඇතුළත් වන සේ යටි සිතේ පැතිරීම ප්‍රමාණය විශාල කිරීම පමණෙකි. කායික රෝගවල දී මෙන් මෙහි දී ද නිදානය සොයා ගැනීමට වහල් වන වඩා දික් වූ සීමාවෙක් අමුතුවෙන් එකතුව ඇත.

ආකල්ප මෙන් ම මිනිසුන්ගේ ඇති රුචි අරුචිකම් හා ඇලීම් ද මනුෂ්‍ය චරිතයේ වැදගත් අංගය ආත්මසංරක්ෂණය[1] ප්‍රජනනය[2] හා ආධිපත්‍යය[3] යන මේවා පිළිබඳ මූලික සහජාශය[4], අපගේ ජීවිත වල වඩා මතු පිටින් ඇති ඇලීම් සමග කිට්ටුවෙන් පටලැවී ඇත. මූලික අවශ්‍යතා සියලු මිනිසුනට පොදු නමුත් මේ ආවේගයන් නන් වැදෑරුම් මිනිසුන් කෙරෙහි ඇලීම් හා උද්යෝග වශයෙන් ප්‍රකාශයට පත්වන ක්‍රමයෙහි විශාල විවිධත්වයෙක් ඇත.

නිදසුනක් වශයෙන් දරුවන් පස් දෙනකුන් ඇති එක පවුලක් ගනිමු. එක් දරුවකු සමනලයන් කෙරෙහි විශේෂ ඇල්මක් දක්වනු ඇත. තවෙකකු සංගීතය කෙරෙහි ද තෙවැන්නා ගණිත ශාස්ත්‍රය කෙරෙහි ද සතර වැන්නා චිත්‍ර කර්මය කෙරෙහි ද පස් වැන්නා දඟකාරකම් කෙරෙහි ද ඇලුම් දක්වනු ඇත. දක්ෂතාවේ

1. Self-preservation
2. Reproduction
3. Mastery
4. Instincts

හා ආකල්පයේ මේ විවිධත්වය සඳහා සාමාන්‍යයෙන් දෙනු ලබන මනෝවිද්‍යාත්මක විවරණය නම්, එක් එක් පුද්ගලයාගේ නිර්මිතිය ප්‍රධාන වශයෙන් ඔහුගේ ප්‍රවේණ්‍යාණුවල[1] පාරම්පරික දායාදයෙන් නිශ්චිත වේ ය යනුයි. ඔහුගේ පවුල් පරිසරයේ අද්දැකීම් හා තත්ත්වයන් පිළිබඳ මනෝවිග්‍රාහික[2] සාධක ද[3] දෙවැනි තැනට එය කෙරෙහි බලපායි. එක්තරා දුරක් යන තුරු මේ විවරණය බෙහෙවින් යුක්ති යුක්ත ය. එහෙත් අතීත ජන්ම ඇතුළු කරගත් පරීක්ෂණ ක්ෂේත්‍රයක් ඇත්තකුට මෙය කිසි සේත් ප්‍රමාණවත් නො වේ. කේසි කියැවීම් වලින් දක්ෂතා හා ඇලීම් පිහිටුවනු ලබන්නේ මුතුන් මිත්තන්ගේ පාරම්පර්යය කෙරෙහි නොව ආත්මයාගේ පාරම්පර්යය කෙරෙහි ය. නිදසුනක් වශයෙන්, අප විසින් ගන්නා ලද පස් දෙනාගේ පවුලෙහි වර්තමාන නැමීමට පදනම් වූ අතීත ජන්ම හේතු තිබිය යුතු ය.

අතීත ජන්මයන්හි දී හටගත් ඇලීම් පිළිබඳ දැක්වෙන නිදසුන් කේසි ලිපි ගොනුවල එයි. එක්තරා නිව්යෝක් දන්ත වෛද්‍යවරයකු උපන්නේත් වැඩුණේත් අගනුවර ම ය. ඔහු දැනට සාර්ථකව වෘත්තිය කර ගෙන යන්නේත් එහි ම ය. ඔහුගේ පවුලේ සාමාජිකයෝ පරම්පරා ගණනක් ම නාගරිකයෝ වූහ. ඔහු වෘත්තියෙන් ප්‍රීතිමත් ව නගර ජීවිතයෙහි සෝත්සුක ව වසන නමුදු ඔහුට වරින් වර තුවක්කුවක් බිලිපිත්තක් ගෙන ගං හෝ කෙත් වතු බහුල පිටිසරට ගොස් වන මැද තනි ව කූඩාරම් බැඳ නතර වීමට තද ආශාවෙක් ඇති වෙයි. ස්වභාව ධර්මය කෙරෙහිත්, එළිමහන් ජීවිතය කෙරෙහිත්, ඇති මේ තද උනන්දුව, අස්වාභාවික නොවන නමුත් ඔහුගේ නාගරික ගතිය සමඟ එය ගළපාලීම දුෂ්කරය. එහෙත් පුනර්ජන්ම වාදය පිළිගත හොත්,

1. ප්‍රවේණි + අණු = genes
2. Psychoanalytic Factors
3. Heredity

එය පහසුවෙන් තේරුම් ගත හැකි වෙයි. ඔහු ගැන කරන ලද කේසි කියැවීමට අනුව හේ පූර්වජන්මයේ දී ඩෙන්මාර්ක වැසියෙකි. ඔහු ඇමරිකාවට ආවේ ඕලන්දකාරයන් එරට පදිංචියට ආ මුල් කාලයේ ය. නව ජර්සියේ[1] ඔහු වාසය කළේ ගං හෝ පොකුණු හා මඩ වගුරු ආදියෙන් යුක්ත ප්‍රදේශයක ය. සතුනට උගුල් අටවන්නෙක් වූ හේ ලොම් වෙළඳාම් කෙළේ ය. වර්තමාන ජීවිතයේ ප්‍රධාන ජීවිත කාර්යය සඳහා ගං හෝවලට හා කැලෑවලට ඇති වූ ආශාව යටපත් කර ගත යුතු විය. එහෙත් එය ඔහු තුළ නො නැසී පැවැතුණේ ය.

බොහෝ දෙනා ඇතැම් විශේෂ භූමි ප්‍රදේශවලට තද ඇල්මක් දක්වති. කේසි කියැවීම්වලට අනුව බොහෝ විට එබඳු ඇලීම් ඇති වන්නේ පූර්ව ජන්මයන්හි දී ඒ ප්‍රදේශයන්හි සිදු වූ ප්‍රීතිමත් වාසයන් නිසා ය. නිදසුනෙක් මෙසේ ය. නැගෙනහිර වෙරළේ සිටි එක්තරා ව්‍යාපාරිකාවකට එක්සත් ජනපදවල නිරිත දිග කොටසට යෑමට අවුරුදු ගණනාවක් තිස්සේ ම තද ආශාවෙක් පැවැතිණි. අන්තිමේ දී ඕ එය ඉටුකර ගත්තා ය. දැන් ඈ වාසය කරන්නේ නව මෙක්සිකෝවේ ය. ඕ එහි හෝටල් ව්‍යාපාරිකාවකි. කියැවීමට අනුව ඈට රටේ මේ ප්‍රදේශය පිළිබඳ පූර්ව අද්දැකීම් දෙකක් ලැබී ඇත. අතරතුර ඉකුත් වූ ශත වර්ෂ කීපය තුළ ම මේ ආශාව දිගට පැවැතී තිබේ.

පිළිවෙළින් දකුණු මුහුදු දිවයින්වලට[2] නව ඕර්ලියන් දිවයින්වල[3] ඉන්දියාවට හා චීනයට විශේෂ ඇල්මක් තුබූ පුද්ගලයන් සතර දෙනකුට ඔවුන් ඒ ඒ රටවලට ආශා කරන්නේ පූර්ව ජන්මවල දී ඇති වූ අද්දැකීම් නිසා යයි කියා තිබේ.

ඇතැම් කලා හා වෘත්ති පිළිබඳ ඇලීම් ද, මෙ අයුරින් ම අතීත ආත්මභාවලට ගෙන ගොස් තිබේ. ග්‍රීක නෘත්‍යය හා නාට්‍යය පිළිබඳ ව එක් ස්ත්‍රියකට තුබූ බලවත් ඇලීම ඇති වූයේ

1. New Jersey 2. South Sea Islands 3. New Orleans

ඒ කලා දියුණු ව පැවැති සමයෙක ග්‍රීසියේ දී ලැබූ ආත්මභාවයෙකිනි. පරසිත් දැනීම පිළිබඳ ව එක් ළමයකුගේ තුබූ තද ඇලීමේ පදනම වැටුණේ, පූර්වජන්මයෙක දී අත්ලන්තිසයෙහි මනෝවිද්‍යාව හා චිත්ත සංක්‍රමණය[1] පිළිබඳ ආචාර්යවරයකු වශයෙන් ක්‍රියා කළ අවස්ථාවෙක දී ය. අහස් ගමන් පිළිබඳ පිස්සුවක් තරමට බලගතු වූ ඇලීමක් තුබූ රූමත් දූරියකගේ ඒ උනන්දුවට පදනම වැටුණේ ද ගුවන් නියමුවෙකු හා සංක්‍රමණ උපදේශකයකු වශයෙන් ලැබූ අත්ලන්තියානු අද්දැකීමෙකිනි. කොර වූ දරුවනට උපකාර කිරීමට ආශා කළ එක් ස්ත්‍රියකගේ ඒ උනන්දුව ඇති වූයේ පලස්තිනියානු ආත්ම භාවයෙක දී ය. එකල යේසුතුමාගේ ඉගැන්වීම් අනුගමනය කළ ඕ කොරුනට හා රෝගීනට උපකාර කිරීමට පටන් ගත්තාය. ටෙක්නෝ ක්‍රැසි ව්‍යාපාරයෙහි[2] අවුරුදු ගණනාවක් වැඩ කළ ගවේෂක ඉංජිනේරුවෙක්, පූර්වජන්මයෙක දී විද්‍යානුකූල රාෂ්ට්‍ර පාලනයෙහි නියුක්ත වූ අත්ලන්තියානුවෙක් විය.

අතීත ජීවිතවලින් එන මේ ඇලීම්, ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ ජීවිතවල විශේෂයෙන් පැහැදිලි ව දක්නට ලැබෙන බව පෙනේ. අපට මෙහි දී පදනම් කර ගැනීම සඳහා එබඳු පුද්ගලයන් පිළිබඳව කරන ලද කේසිගේ කියැවීම් නැත. අප ඒ ගැන යමක් කියන්නේ දැන ගන්නට ලැබී ඇති ජීවිත කථා සිද්ධීන් කේසිගේ කියැවීම්වලට අනුව තේරුම් කිරීමෙනි.

නිදසුනක් වශයෙන් හයින්රිශ් ශ්ලීමාන්[3] නම් වූ ජර්මන් පුරාවිද්‍යාඥයා ගැන සලකන්න. වැළැලුණු ට්‍රෝයි නගරයේ නෂ්ටාවශිෂ්ට සොයා ගෙන, මහා හෝමරික වීර කාව්‍යයට

1 Thought - transmission (= බාහිර උපායක් නැතිව සිතෙකින් සිතකට අදහස් යැවීම.)

2. කර්මාන්තාදිය ශිල්ප විද්‍යාඥයන් විසින් පාලනය කළ යුතුය යන අදහස දරූ ව්‍යාපාරයෙක්.

3. Heinrich Schliemann

ඓතිහාසික පදනමක් සපයා දුන්නේ ඔහු ය. හේ උතුරු ජර්මානු ගමෙක දුප්පත් කුලගුරකුගේ[1] පුතෙකි. කුඩා කාලයේ සිට ම ඉලියඩ් කථාවෙන් වශීකෘත ව සිටි හේ ග්‍රීක භාෂාව ඉගෙනීමට ආශා කෙළේ ය.

ශ්ලිමාන් මේ ජීවිතයේ මුල් අවුරුදු තිස්පහ ඇතුළත, තමාට පසු කාලයේ දී තම පුරා විද්‍යාත්මක වූ බලාපොරොත්තුව ඉටු කර ගැනීමට වහල් වූ භාග්‍යය ගොඩනගා ගත්තේ ය. අසාමාන්‍ය භාෂාවේදියකු වූ හේ ග්‍රීකයන්ගේ භාෂාව කෙරෙහි පමණක් නොව හැම දෙයක් කෙරෙහි ම විශේෂ ඇල්මක් දැක්වී ය. පසු කාලයෙක දී හේ සල්ලාපයේ දී පවා හෝමරික ආමන්ත්‍රණ පද යොදන්නට පුරුදු ව සිටියේ ය. ඔහු තම පුතු බෞතීස්ම කිරීම සඳහා ග්‍රීක පූජකවරයකුට දීමට පෙර හෝමර්ගේ පොත් කොපියක් ඔහුගේ හිසට ඉහළින් අල්ලා සිටි බවත් හෝමරික ගීත ගායනය කළ බවත් ඔහු පිළිබඳ ජීවිත කථාවෙක සඳහන් වෙයි. මේ ඔහුගේ තුබූ පමණ ඉක්මවූ විශේෂ උනන්දු සිය ගණනින් එකෙක් පමණි. මෙබඳු පමණ ඉක්මවූ උනන්දුවක් තේරුම් ගත හැකි වන්නේ, එය තමා සුඛිත ව සිටි යුගයක් සිහිපත් කොට, ඒ පරිසරයෙහි ම නැවත ජීවත් වීමට යත්න දරන, ආත්මයෙක ගෙදර යෑමේ ආශාවක් වශයෙන් දකින කෙනකුට ය.

මේ වර්ගයේ කොතෙකුත් නිදසුන් ජීවිත කථාවලින් ලබා ගත හැකි ය. ලැෆ්කාඩියෝ හේර්න්[2] නම් ලේඛකයා පිළිබඳ සිද්ධිය ද තවත් සිත් අලවන නිදසුනෙකි. අයිරිශ් පියකුගේ හා ග්‍රීක මවකගේ පුතකු වශයෙන් අයෝනියානු දිවයිනෙක උපන් හේර්න්, ග්‍රීසියෙන් එංගලන්තයටත්, අමෙරිකාවටත්, බටහිර ප්‍රංශ ඉන්දියානු දූපත්වලටත් ගියේ ය. ඔහුට අන්තිමේ දී තම ආධ්‍යාත්මික නිවාසය සොයා ගත හැකි වූයේ ජපානයේ දී ය. මෙහි දී ඔහු ජපන් ස්ත්‍රියක ආවාහ කොට ගෙන ජපන් නමකුත්

1. Pastor

2. Lafcadio Hearn

භාවිත කරමින් ජපන් පාසලෙක ගුරුවරයෙක් විය. ජපන් මතය හසු කර ගැනීමට ඔහුගේ තුබූ විස්මය ජනක අන්තර්ඥානයත්, ජපන් සාහිත්‍යය අපර දිගටත් අපරදිග සාහිත්‍යය ජපානයටත් තේරුම් කරදීමට ඔහුගේ තුබූ විශේෂ ශක්තියත් පූර්ව ජපන් ජන්මයෙක ප්‍රරෝහයක් ලෙස සැලකුවහොත් එතරම් විශේෂ ලෙස නො පෙනෙනවා ඇත. ඔහුට එය නැවත පණ නො ගන්වා නො සිටිය හැකි විය.

ටී. ඊ. ලෝරන්ස් අරාබින් ගැන විස්තර දැක්වීමටත් අරාබියකු ලෙස ජීවත් වීමටත්, පුදුම ශක්තියක් තුබූ මිනිසකු පිළිබඳ නිදසුනෙකි. එක් ජීවිත කථාකාරයකු විසින් කියා ඇති පරිදි, ඔහුගේ ඒ ශක්තිය රුධිරගත වූවෙකි. ඔහු කිසි දිනෙක තම ඉංග්‍රීසි මාතෘ භූමියෙහි දී හෝ තම පවුලෙහි දී හෝ ප්‍රීතියෙන් නො සිටියේ ය. කුරුස යුද්ධ ගැනත් මධ්‍යකාලීන මාලිගා හා බළකොටු ගැනත්, උගන්නට නො ලැබුණා නම්, පාසල ඔහුට වධයෙකි. ඇතැම් විට ඔහු පූර්ව ජන්මයෙක දී මධ්‍යකාලීන අරාබියුද්ධෝපාය දක්ෂයකු ව සිට තම යටි සිතින් සිතා ගත් ජීවිතාර්ථය ඉටු වන්නට කලින් මිය යන්නට ඇත. අරාබි යුද්ධ නායකයකු ලෙස ලෝරන්ස් ලැබූ විස්මය ජනක සාර්ථකත්වය තේරුම් ගත යුත්තේ ඒ මධ්‍යකාලීන පූර්ව නිර්හීත ක්‍රියාවේ පාරප්‍රාප්තියක් ලෙස විය හැකි ය.

මෙවැනි විදේශීය ඇලීම් දක්නට ලැබෙන්නේ මහා පුරුෂයන් හා මහා පුරුෂ සමානයන් සම්බන්ධයෙන් පමණක් නො වේ. අපේ සාමාන්‍ය අසල්වාසීන් තුළ ද ඇලීම් දක්නට ලැබේ.

ඇලීම් හා ආකල්ප වැනි වූ ගතිගුණ චරිත විග්‍රහයෙක ඇති වැදගත් අංගයන් හා ඒවායේ අතීත සම්භවය පිළිබඳ සිත් ඇද ගන්නා නිදර්ශන රාශියෙක් කේසි ලිපි ගොනුවලින් අපට ලැබේ. කිසියම් මැදි බටහිර ධන කුවේරයකුගේ බිරිය, ආඥාදායක

ස්වරූපයක් ඇති උඩඟු තැනැත්තියක් වූවා ය. ඈ ආදි ඕහායෝවේ පාඨශාලාචාර්යවරියක වශයෙන් සිටි බවත්, පලස්තීනයෙහි හා භාරතයෙහි ලැබූ ජන්මයන්හි දී අධිකාරියකු ගේ තත්ත්වය ඉසුලූ බවත්, හෙළි කළ ජීවිත කියැවීම වර්තමාන නැමීම ඒ පූර්ව ජීවිතවලට සම්බන්ධ කෙළේ ය.

ළදරු කල සිට ම අතිශයින් තාර්කික වූ මනසක් තුබූ ගැටවරයෙක් තියුණු විචාර ශක්තියක් දක්විය. ඔහුට ඒ ශක්තිය ඇති වූයේ මහා ඇල්ෆ්‍රඩ් රජු විසින් ජූරියේ විනිශ්චය ආරම්භ කළ කාලයේ නීතිඥයකු වශයෙන් සිටිය දී හා තවත් ජන්මයෙක දී පර්සියාවේ විනිශ්චයකාරයකු වශයෙන් සිටිය දී ය.

විරාගී නැමීම් තුබූ එක්තරා ස්ත්‍රියක් දහනව වන සිය වසේ මුල් භාගයේ දී ලැබූ කියැවීම් අනුව ඇය මීට පූර්ව ජීවිතයෙහි දී ආගමික අරණ්‍ය සේනාසනයෙක නායිකාවක් වූවා ය. තම ප්‍රසිද්ධ පවුලට අපකීර්තියක් ගෙන දෙන තරමට බීමට ඇබ්බැහි වූ එක් ධනවත් තරුණයකු මේ දුර්වලතාවට පදනම දමා ගත්තේ රන් සොයා යන කාලයේ දී දුරාචාරවලට වැටීමෙකිනි.

මීට සමාන සිය ගණනක් නිදසුන් කේසි ලිපි ගොනුවලින් සොයා ගත හැකි ය. පුද්ගල අසමතා මනෝවිද්‍යාව[1] ගැනත් එහි හදාරනු ලබන ප්‍රශ්න ගැනත් දන්නා ඕනෑම කෙනකුට, මේ කරුණු සත්‍ය නම්, මෙයින් ලැබෙන අසමතා තුළින් මනෝවිද්‍යාවට අලුත් ගැඹුරක් හා පළල් බවක් ලැබෙන බව පිළිගැනීමට සිදු වෙයි.

කරුණේ ගැටලුව මෙයයි. නවීන මනෝවිද්‍යාව, මනුෂ්‍යයන් අතරත ඇති වෙනස්කම්, පළමු වැනි ව මා පියන්ගේ ප්‍රවේණ්‍යණු වලින් [2] ද දෙවැනි ව පරිසරගත බලපෑම්වලින් ද

1. Psychology of Individual Differences
2. The genes of the parents (ප්‍රවේණි + අණු)

නිශ්චය වෙතැයි පිළිගනී. එහෙත් පුනර්ජන්මවාදයට අනුව පාරම්පර්යයත්, පරිසරයත් යන දෙක ම අතීත කර්මවල ප්‍රතිඵලය. එමෙන් ම ඊට අනුව ආත්මයේ හැම ගුණයක් ම මාපියන්ගෙන් සංක්‍රමණ වූවක් වෙනවාට වැඩියෙන් තමා විසින් ම රැස් කරන ලද්දෙක් වේ.

පාරම්පර්යවාදයෙහි සාමාන්‍යයෙන් නො පිළිගන්නා ලද වරදෙක් ඇත. මේ වාදයෙන් ජීව විද්‍යාත්මක ධර්මතාවෙකින් මානසික ධර්මතාවක් නිපදවිය හැකි යයි පිළිගනු ලැබේ. අයින්ස්ටයින්ගේ අව්‍යාජ නිර්භීතත්වය ("ඔබ සාපේක්ෂතාව අනාවරණය කර ගත්තේ කෙසේ ද?" "පිළිගත් සිද්ධාන්තයකට අභියෝග කිරීමෙනි!") සිහිපත් කොට පාරම්පර්ය වාදයට පදනම් වූ ඒ මූලික පිළිගැනීමට අභියෝග කළ යුතු ය. සිත කය දෙකෙහි සම්බන්ධතාව පිළිබඳව මිනිසාගේ දැනීම තව ම ළපටි අවස්ථාවෙක පවතින බව පිළිගත යුතු ය. එහෙත් මානසික ධර්මතාවෙක නිපැදීම සඳහා පූර්ව වූ මානසික ධර්මතාවක් හේතු වෙතැයි පිළිගැනීම මනෝවිද්‍යාත්මක වශයෙන් වඩා යුක්ති යුක්ත වන බව පෙනේ. "වර්තමාන ඔබ මුළුමනින් ම ඔබ මුලින් සිතා ඇති දෙයෙහි ඵලයෙකැ"යි බුදුහු වදාළහ. ඉතා උසස් වූ ද බෙහෙවින් මනෝවිද්‍යාත්මක වූ ද ආගමක් වන බුදු සමයෙහි පුනර්භවවාදය, ප්‍රධාන ඉගැන්වීමෙකි. මිනිසාගේ ගුණ, අතීත ජීවිතයන්හි දී සිදු වූ ඔහුගේ සිතීම්වල හා කැරුම්වල ප්‍රතිඵලයක් බව බුදුරජාණන් වහන්සේ ඉගැන්වූහ. හුදෙක් යාන්ත්‍රික වූ දෘෂ්ටියෙකින් බලන කල, නැවත නැවත කරන ලද පුද්ගල උත්සාහයට පමණක් පුද්ගල සමර්ථතාව විවරණය කළ හැකි යයි තර්ක කිරීම යුක්ති යුක්ත බව පෙනේ. එසේ නම් වර්තමානයේ මනුෂ්‍ය දක්ෂතාවල වෙනස්කම්, අතීත මනුෂ්‍ය උත්සාහයේ වෙනස්කම් නිසා ඇති වේ යයි තර්ක කළ යුතු වේ.


පෙරදිග චින්තනය තද ආශාවෙකින් හදාරන, හින්දු බයිබලය වන භගවත් - ගීතාව භක්තියෙන් කියවන රැල්ෆ් වෝල්ඩෝ එමර්සන් [1] මේ සංකල්පය හොඳින් තේරුම් ගෙන සිටියේ ය. ඔහු ලියා ඇති බොහෝ දේවලින් ඉඟියෙන් ඇඟවෙන මේ සංකල්පය, අද්දැකීම පිළිබඳව ඔහු කර ඇති නිබන්ධනයෙන් විශේෂයෙන් පැහැදිලි වේ. නිබන්ධනය ආරම්භ වන්නේ මෙසේය.

"අප සිටින්නේ කොහේ ද ? කෙළවරක් නො පෙනෙන ශ්‍රේණියෙක මැදයි. ඊට කෙළවරක් ඇතැයි ද අපි නො සිතමු.

පිබිදි අපට, අප පඩි පෙළෙක සිටින බව දැන ගන්නට ලැබේ. අපට පහළ අප නැග ඇතැයි පෙනෙන පඩි ඇත. මේවා අපට නො පෙනෙන මානයේ ඉහළට යයි. එහෙත් පැරණි විශ්වාසවලට අනුව, අප ඇතුළු වන දොරටුව ළඟ සිට, කේලාම් කීමෙන් අප වළක්වනු සඳහා, අපට පාතාල ගංගා ජලය දෙන අධිවත්ථ දේවතාවා සැරට බඳුන පිළියෙළ කළා ය.[2] දැන් අපට මේ මද්දහනේ දීත්, නිදිමත පළවා හැරිය නො හැකි ය."

එමර්සන් විසින් යොදා ඇති "ශ්‍රේණිය" යන වචනය සියලු ජීවිතයන්හි ඇති පරිණාමී ස්වභාවයට ඉඟි කරන්නෙකි. ඔහුගේ පඩි පෙළේ උපමාවෙන් ජීවිතය ඉදිරියට යන කල මනුෂ්‍ය සමර්ථතා, දියුණුවට යන්නේ කෙසේ ද යන්න ඉතා විසිතුරු අයුරෙකින් දක්වෙයි. ගතිගුණවලත් සමර්ථතාවලත් වැඩීම පඩි පෙළක් බඳු අවිච්ඡින්න වූවක් බව කේසි කියැවීම්වලට අනුව පෙනේ. මේ නිසා ඊට අවිච්ඡින්නතා මූල ධර්මය යයි නම් කරමු. මෙය පහත එන අයුරින් රූප සටහනකින් දක්විය හැකි ය.


1. Ralph Waldo Emerson
2. පැරණි ග්‍රීක කථාවකට අනුව හේඩිස් (Hades) නම් වූ පාතාල ලෝකයෙහි ලදී (Lethe) නම් ගඟෙක් ඇත. මළවුන්ගේ ආත්ම මේ ගඟෙහි ජලය පානය කළ යුතු විය. මේ නිසා අතීතය සම්පූර්ණයෙන් ම අමතක වී යයි.




ඉහත දැක්වූ සටහනින් පුද්ගලයකු (අවංකකම, ධෛර්යය, පරාර්ථකාමය වැනි) ගුණයක් හෝ (සංගීත කෞශල්‍යය, චිත්‍ර කලා ශක්තිය, ගණිත ප්‍රතිවේධය වැනි) සමර්ථතාවක් හෝ ලබා ගනිමින් ක්‍රමයෙන් දියුණු වන ආකාරය දැක්වේ. නිදසුනක් වශයෙන් මෙහි දක්වන ලද පුද්ගලයාගේ සංගීත සමර්ථතා දියුණුව ගැන සලකා බැලුව හොත් 1 වැනි ජීවිතයේ දී ඔහු භාවිත කරන්නට ඇත්තේ ප්‍රාථමික සංගීතෝපකරණයක් සමහර විට බට නළාවක් විය හැකි ය. 2, 3, හා 4 වන ජීවිතවල දී ඔහු සංගීත සමර්ථතාවට අවශ්‍ය යයි සලකනු ලබන ලයමානය[1] රිද්මය, ස්වර මාධූර්යය ස්මරණය[2] ආදී වූ අංගයන්ගෙන් ක්‍රමයෙන් සංවර්ධනය වන සංස්කෘති යුගවලට අයත් නවීන් සංගීත භාණ්ඩ භාවිත කරන්නට ඇත. තිස්පස් වැනි ජන්මයෙහි ඔහු උපදින්නේ විස්මය ජනක සංගීත සමර්ථතාවෙකින් යුතුව ය.

පුද්ගල අසමතා මනෝවිද්‍යාවට, මේ සංකල්පයෙන් දෙනු ලබන නව ගැඹුර, පහත දැක්වෙන සටහනින් තව දුරටත් පැහැදිලි වෙයි. මෙහි ජෝන් හා පීටර් යන දෙදෙනා හතළිස් වැනි ජන්මය තෙක් සංගීත සමර්ථතාව සම්බන්ධයෙන් සසඳනු ලැබේ.

1. Pitch 2. Melodic memory




පීටර් නමැති පුද්ගලයා අතීත ජන්ම බොහෝ ගණනක් සංගීතයට කැප කොට ඇති බව සටහනින් පෙනේ. ජෝන් එයට එතරම් සැලැකිල්ලක් දක්වා නැත. සංගීත සමර්ථතාව පිළිබඳ අපේ අත්තනෝමතික පරිමාණයට අනුව 60 අතිවිශිෂ්ටයාගේ තත්ත්වය ලෙස ගෙන තිබේ. දැන් පීටර් උපතින් ම සංගීතය පිළිබඳ අති විශිෂ්ටයෙකි. ජෝන් සුළු ශක්තියක් ඇත්තෙකි. ඕනෑ ම මනුෂ්‍ය ශක්තියක් පිළිබඳ ව මෙබඳු සටහන් ඇඳිය හැකි ය. මෙයින් පුද්ගල අසමතා පිළිබඳ විද්‍යාවකට පදනම දමනු ලැබේ. උප්පත්තියේ දී ම මනුෂ්‍ය දක්ෂතාවන්ගේ ඇති වෙනස්කම්වල හේතුව මෙයින් පැහැදිලි වෙයි.[1]

කර්මවාදය පිළිගන්නා වූ බොහෝ දෙනා එය දඬුවම් විඳීමට හා දුක් විඳීමට පමණක් සම්බන්ධ කොට සිතන්නට පුරුදු වී සිටීම අභාග්‍යයෙකි. කර්ම යන වචනයේ හුදු වාච්‍යාර්ථය හොඳ නරක යන දෙකට ම අයත් කිරීම යනු බව මතක තබා ගත යුතු ය. ව්‍යක්ත වූ විශ්වයෙහි ඇති හැම දෙයකට ම ප්‍රතිපක්ෂතාවක් හෙවත් සත් පක්ෂයක් හා අසත් පක්ෂයක් ඇත. කර්මය ද මින් පිට නො යයි. හැම ක්‍රියාවක් ම යහපත් හෝ අයහපත් ද ආත්මාර්ථකාමී හෝ පරාර්ථකාමී ද විය හැකි බැව් පැහැදිලි ය. චරිතයක් හොඳ නම් එය දිගට යෑමෙන් වළක්වන්න දෙයෙක් නැත. මෙය දිගට ම වර්ධනය වන්නට බලයි. මේ

1. "කම්මං සත්තේ විභජති යදිදං හීනප්පණීතතාය."

නිසා කලින් යෝජනා කළ පරිදි ඊට කර්මයේ අවිච්ඡින්නතා මූල ධර්ම යයි නම් කළ හැකි ය.[1] ඉදින් චරිතය අතිශයින් දුෂ්ට හෝ අපවිත්‍ර හෝ වේ නම් එය සකස් කර ගත යුතු ය. මෙය ක්‍රියා ප්‍රතික්‍රියා නියාමයෙන් ඉදිරියට යයි. මෙය කර්මයේ විපාකදායක මූලධර්මය යයි නම් කරමු.

කර්මයේ දුඃඛදායක තෝලන (සමබර කරන) ශක්තියේ මාර්ගයෙන් විපාක දායක මූල ධර්මය, අප ආත්ම පාරිශුද්ධියේ පටු මඟට [2] නැවත ගෙන එයි. එහෙත් අපි අවිච්ඡින්නතා මූල ධර්මයෙන් ඒ මඟ දිගේ ම බාධා රහිත ව නිසල ව ඉදිරියට යමු. අපි අපේ ආත්මය සඳහා වැඩි වැඩියෙන් උසස් වූ මන්දිර තනා ගනිමු. අවසානයේ දී අපි මෝක්ෂය ලබා ගනිමු.

1. කර්මය සඳහා යෙදෙන වචනයක් වන සංස්කාර ශබ්දයෙන් මේ අදහස දෙනැයි සිතිය හැකි ය. (ඇම්. හිරියන්න The Essentials of Indian Philosophy 49 පිට) වරක් කළ දෙය නැවත සිදු වන්නට බලයි. අවිච්ඡින්නතා මූල ධර්මය යයි නම් කරන ලද්දේ මේ ගතියයි. කළ හොඳට ශුභ ඵල ද නරකට අනිෂ්ට ඵල ද ලැබේ. විපාක දායක මූල ධර්මය යයි කීවේ මෙයට ය.

2. මෙය අන්තවලට නො ගිය මධ්‍යම ප්‍රතිපදාව ය.

# 10

# මනුෂ්‍ය චරිත වර්ග

"ලෝකයේ මනුෂ්‍ය වර්ග දෙකක් ඇත. මින් එක් වර්ගයෙක් මනුෂ්‍ය ප්‍රජාව දෙකකට බෙදයි. අනෙක් වර්ගය එසේ නො බෙදයි." මෙසේ කියන රොබර්ට් බෙන්චලේ තම විස්මය ජනක හාස්‍ය කථා කෞශල්‍යයෙන් කරන ලද්දේ අනෙක් බොහෝ වර්ගීකරණ තරමට ම ගැළපෙන වර්ගීකරණයක් ඉදිරිපත් කිරීම ය.

මෙහි දී හේ මැතෙක සිටි මනෝවිද්‍යාඥයන් අතර, මනුෂ්‍ය චරිත පිළිබඳ ව පැවැති මූලික මතභේදයකට ඇඟිලි ගැසීමක්ද කරයි. ලෝකයේ සියලු මිනිසුන්, මනුෂ්‍ය වර්ග කීපයකට බෙදන්නා වූ ද එසේ නො බෙදෙන්නා වූ ද මනෝවිද්‍යාඥයෝ සිටිති. මෙයින් ප්‍රථම කොටස මනුෂ්‍ය චරිත පිළිබඳ ව "වර්ගවාදය"[1] අනුගමනය කරති. දෙවැනි කොටස "ගුණවාදය"[2] අනුගමනය කරති. මේ වාද දෙක ම මනුෂ්‍යයන්ගේ ඇති වෙනස්කම් විග්‍රහ කිරීමට යත්න දරයි.

අන්‍යයන් පිළිබඳ ව අපට ලැබෙන දෛනික අත්දැකීම්වල දී අපි සියලු දෙනා ම අප විසින් ම තෝරා ගන්නා ලද සාර

1. Type theory 2. Trait theory

ධර්ම පද්ධතිවලට අනුව මනුෂ්‍යයන් වර්ග කීපයකට බෙදා ගනිමු. සමාජ ප්‍රියයෝ ද, සුවචයෝ ද, මිත්‍රභාෂීහු ද, දුර්වචයෝ ද, ආත්මාර්ථකාමීහු ද, ආත්ම කේන්ද්‍රිකයෝ ද අපට හමු වෙති. මනුෂ්‍යයන් තමන් ම මූලික කණ්ඩායම්වලට වෙන් වෙතැයි ද බොහෝ මනෝවිද්‍යාඥයන් විසින් නිගමනය කර ඇත. තමන් පිළිගත් ඒ වර්ග සඳහා විද්‍යානුකූල වූ පදනමක් පිහිටුවා ගැනීමට ඔවුන් යත්න දැරීම ස්වාභාවික ය. මේ දෘෂ්ටිය නිසා බොහෝ වර්ගවාද පහළව ඇත. යුං,[1] ස්ප්‍රැන්ගර්,[2] ක්‍රෙට්ශ්මර්[3], රොසනොෆ්[4] යන මොවුන්ගේ වර්ගවාද ප්‍රධාන වෙයි. මේ හැම වාදයක් ම සැලකිය යුතු විද්‍යා ගෞරවයකට සුදුසු ය.

නැණවත් විනිශ්චයකාරයකු මෙන් පුනර්ජන්මවාදය, චරිත පිළිබඳ ගුණවාදය, වර්ගවාදය යන දෙකට ම රුකුල් දෙයි. එසේ ම ඒ දෙකේ ම ඇති අඩු පාඩුකම් ද පෙන්වා දෙයි. කේසි කියැවීම්වල ආලෝකයෙන් අප එක් වර්ගවාදයක් සැලැකිල්ලට ගතහොත් මෙය සිදු වන්නේ කෙසේ දැයි අපට දැක ගත හැකි වෙයි.

සමහර විට සාමාන්‍ය මහජනයා අතර අතිප්‍රසිද්ධ විද්‍යානුකූල වර්ගවාදය, කාල් යුං විසින් ඇති කරන ලද වර්ගවාදය විය හැකි ය. එය අන්තර්නත බහිර්නත වර්ගවාදය[5] යන නමින් හැඳින්වෙයි. මේ සංකල්පය පිළිබඳ යුංගේ මූල සංස්කරණයට අනුව, මනුෂ්‍ය චරිත අතර මූලික වෙනස ඇත්තේ ඔවුන් සැලකිලිමත් වන්නේ අභ්‍යන්තර සත්‍යයන් කෙරෙහි ද නැති නම් බාහිර සත්‍යයන් කෙරෙහි ද යන්නෙහි ය. ඔහු තම කාර්යය සඳහා තෝරා ගත් වචනයන්ගේ මූල ලතින් රූපයෙන් මේ බව දැක්ක හැකි ය. "vert" යන්නේ නැමුණු යන අදහස ද

1. Jung
2. Spranger
3. Kretschmer
4. Rosanoff
5. Introversion - Extraversion Typology

'intro' යන්නේ ඇතුළට යන අදහස ද 'extra' යන්නේ පිටතට යන අදහස ද ඇත. එහෙත් පුනර්ජන්ම වාදීන්ගේ මතයෙන් යුං හෝ ඔහුට පසුව පැමිණි මනෝවිද්‍යාඥයන් හෝ එක් පුද්ගලයකුට ඇතුළට නැමීමේ ස්වභාවයකුත් තවත් පුද්ගලයකුට පිටට නැමීමේ ස්වභාවයකුත් ඇති වූයේ කවර හෙයින් දැයි සතුටුදායක ආකාරයෙකින්, අන්තිම වශයෙන් විවරණය කර නැත. යුං විසිනුත් තවත් බොහෝ දෙනකුන් විසිනුත් මේ මූලික ආත්ම ස්වභාවවලට ජීව විද්‍යාත්මක හේතු ඉදිරිපත් කොට තිබේ. අන් තැන දී මෙන් මෙහි දී ද පුනර්ජන්මවාදී මතය නම් පූර්ව චරිතය ප්‍රධාන හේතුව වන අතර ජීව විද්‍යාත්මක හේතු ද්විතීයික වන බවයි.

අතීත ජන්මයෙක අද්දැකීමක්, ඇතුළට නැමීමේ පුරුදු බවක් ඇති කරන්නේ කෙසේ ද යන්න කේසි ලිපි ගොනුවල ඇති බොහෝ නිදසුන්වලින් පැහැදිලි කෙරෙයි. එබඳු නිදසුන් පරීක්ෂා කිරීමේ දී, ඇතැම් මිනිස් ගති ගුණ අන්‍ය ජන්මයකට ගෙන යාමෙහි ලා, අවිච්ඡින්නතා මූල ධර්මය ක්‍රියාත්මක වන බව පැහැදිලි ව දක්නට ලැබේ.

සංගීතය පිළිබඳ තරමෙක දක්ෂතාවක් තුබූ වයස විසි එකෙක විද්‍යාලයීය ශිෂ්‍යාවකගේ නිදසුනෙන් මෙය හොඳින් පැහැදිලි වේ. ඕ සිත් ඇදගන්නාසුලු වූ නමුදු අතිශයින් ලජ්ජා වන බියගුලු තැනැත්තියක් වූවා ය. මිත්‍රයන් සාදා ගැනීම ඇට දුෂ්කර කාර්යයෙක් විය. විද්‍යාලයේ සමාජයකට ඇතුළත් නො කර ගැනීම, ඇගේ සිත තවන සිද්ධියෙක් විය. මේ තරුණියගේ ජීවිතයේ මුල් කාලයේ තොරතුරු දැන ගන්නට නැත. ඈ අන්තර්නත වර්ගයට අයත් තැනැත්තියක කිරීමේ හේතු ඇගේ පවුල් පරිසරයෙහි තිබෙන්නට ඇත. (අන්තර්නත වර්ගයට ඕවර්ස්ට්‍රීට් කියන්නේ සංකුචිත වර්ගය[1] කියා ය.)

1. Contractive type. සංකුචිත යන්නේ අදහස හැකුළුණු යනු ය. අන්තර්ගත යන්නේ අදහස ඇතුළට නැමුණු යනු ය.

ඒ කෙසේ වෙතත්, මැගේ ජීවිත කියැවීමට අනුව, මේ ග්‍රහිය ඇති වූයේ අතීත ජන්මයෙක දීය. ඕ අතිදක්ෂ සුරූපී ප්‍රියශීලී ප්‍රංශ වනිතාවක ව සිටියා ය. එහෙත් ඇගේ සැමියා බ්‍රවුනිංගේ "My Last Duchess" නම් ග්‍රන්ථයේ එන ආදිපාදයා මෙන් ඇගේ කරුණාව හැම දෙනාට ම විහිදෙනවා දකින්නට අකැමැති විය. මේ නිසා හේ ඇගේ හැම ආවේගයක් ම නිර්දය ලෙස මර්දනය කෙළේ ය. ඇතැම් විට හෙතෙම ඇට කසයෙන් තැළුවේය. මෙයින් ඕ බයින් තමාට ම හැකුළුණා ය. වරදවා තේරුම් ගනු ලැබීමෙන් දඬුවම් ලැබීමේත් බිය වර්තමානය තෙක් ඇගේ යටි සිතේ පැවතුණේ ය.

පහත දැක්වෙන නිදසුනෙහි ද පෞද්ගලික හා ඓතිහාසික පරිසරය විශාල වශයෙන් වෙනස් නමුත් ඒ වර්ගයේ ම හැකිළීම් සැලැස්මෙක් දක්නට ලැබේ. කියැවීම් ලබා ගන්නා විට ඒ තරුණයාගේ වයස විසි අටෙකි. හේ ඉගෙනීමෙහි, උත්සාහවත් වූවෙක් ද ඇතුළට නැමුණෙක් ද විය. කේසිට අනුව, හේ අතීත ජන්මයෙහි දී සාලෙම්හි මන්තර ගුරුකම් පිළිබඳ නඩු විභාගයක දී හිංසා ලැබූවෙකි. මේ අද්දැකීමෙන් ඔහුගේ වර්තමාන චිත්ත ගතිය කෙරෙහි ද්විප්‍රකාර බල පෑමෙක් ඇති විය. පළමු වැනි ව එයින් සියලු ම මර්දන වර්ග ගැන ඔහුගේ ද්වේෂයෙක් ඉතිරි විය. දෙවැනි ව ඔහුට ඒ නිසා ඉගෙනීමටත් ඒ ඉගෙනීම තමාටම තබා ගැනීමටත් තද ආශාවෙක් ඇති විය.

සාලෙම්හි මන්තර ගුරුකම් පරීක්ෂණ පිළිබඳ ව සාමාන්‍යයෙන් ඉතිහාසඥයන් විසින් කරනු ලබන ව්‍යාඛ්‍යානයට වඩා ටිකක් වෙනස් වූ ව්‍යාඛ්‍යානයක්, කේසි කියැවීම්වලින් කරනු ලබන බව, මෙහි දී සැලකිය යුතු ය. ඒ කාලයේ නියම භූත විද්‍යා වසංගතයක් පැවැති බවත්, පුද්ගලයන් කීප දෙනකුට භූතාවේශයෙන් තොරතුරු ලැබීමේ සත්‍ය අද්දැකීම් තුබූ බවත් කියැවීම්වලින් හෙළි කරන ලදී. මෙය එකල සම්මත වූ ආගමික

මතයට විරුද්ධ වූවෙකි. මේ තරුණයා පිළිබඳ සිද්ධියේ දී ඔහුගේ නියම අද්දැකීම කිමෙක් දැයි කියැවීමෙන් නිශ්චිත කොට නො දැක්වෙයි. එහෙත් ලිපි ගොනුවල ඇති සාලෙම් යුගයට අයත් අන්‍ය සිද්ධි අනුව නිශ්චය කරන විට, මෙසේ නිගමනය කළ හැකි ය. ඔහු විසින් දක්නා ලද, නැති නම් ඔහුගේ ම වූ, පුදුම ආධ්‍යාත්මික අද්දැකීමක් කියන්නට යන විට, නැති නම් මහජන පිස්සුවෙන් වරදකරුවකු වශයෙන් ගන්නා ලද්දකු රකින්නට යන විට ඔහු අල්ලා ගෙන දරුණු වධයකට පාත්‍ර කරන්නට ඇත. අකාරුණික සේ සලකන ලද බල්ලෙක් බළලෙක් පවා මනුෂ්‍ය වර්ගයා අවිශ්වාස කරන්නට උගනී. ඒ නිසා මේ මිනිසාගේ යටි සිතේ පතුලෙහි මිනිසුනට බය වීමටත් මිනිසුන්ගේ සම්බන්ධය නො සොයා තමා දන්නා දෙය සඟවා ගනිමින් පසු බැසීමටත් සහජ ගතියක් පැවතීම ස්වාභාවික ය.

ඉහත සඳහන් කළ නිදසුනට සමාන, සාලෙම්හි සිදු වූ අද්දැකීම ගැන කරුණු දැක්වෙන, නිදසුන් රාශියෙක් කේසි ලිපි ගොනුවල වාර්තා වී ඇත. මේ නිදසුන්වල දී ද ඒ සමාන වූ ම හැකිළීම් ගතියක්, ප්‍රතිඵල වශයෙන් ඇති වී තිබේ. තවත් නිදසුන්වලින් ආත්ම සංකෝචනයට (හැකිළීමට) ඇති තවත් හේතු ඉදිරිපත් කර ඇත. අදහස් ප්‍රකාශ කිරීමේ අඩුකම පැහැදිලි විශේෂ ලක්ෂණ වශයෙන් තුබූ එක්තරා වෛද්‍යවරයකු මේ ගතිය ලැබුවේ පූර්ව ජන්මයෙක දී ක්වේකරයකු[1] වශයෙන් මෞන ව්‍රතය පුහුණු කිරීමේ දී ය.

නිව්යෝක්හි සිටි එක් වෙළඳ කළමනාකරුවෙක් සංගම් ප්‍රියතාවෙන් බෙහෙවින් හීන විය. පූර්ව ජන්මයෙක දේශ

1. ක්වේකරයෝ (Quakers) නම් මිත්‍රයන්ගේ සංගමය (Society of friends) නමින් හැඳින්වුණු ක්‍රිස්තියානි සංගමයේ සාමාජිකයෝ ය. මේ සංගමය පිහිටු වන ලද්දේ 1641-50 අතර දී ජෝර්ජ් ෆොක්ස් විසිනි. වාම ඇඳුමට හා කථාවට ප්‍රිය කළ ඔව්හු යුද්ධයට සම්පූර්ණයෙන් ම විරුද්ධ වූහ. රැස්වීම්වල දී පවා කථා කළ යුතු ම යයි තදින් හැඟෙන තාක් නිශ්ශබ්ද වූහ.

ගවේෂකයකු වූ ඔහු දකුණු අප්‍රිකාවෙහි තමාගෙන් පමණක් සැදුණු හුදෙකලා ජීවිතයක් ගත කොට තිබුණේ ය. එක් උසස් පාඨශාලා ශිෂ්‍යාවකට තද හීන මානයෙක් (තමා පහත් ය යන හැඟීමෙක්) විය. ඈ මේ බයාදු ගතියට පදනම දමා ගත්තේ අමෙරිකානු ඉන්දියානු දූරියක වශයෙන්, සුදු පදිංචිකරුවනට වඩා තමා අසරණ ලෙසින් පහත් ය යන හැඟීමෙනි. ඔහායෝවේ වෛද්‍යවරයෙක් වෛද්‍ය වෘත්තියෙහි සමර්ථ නමුදු ආත්ම විශ්වාසයෙන් හීන විය. හේ නිතර ම පැත්තකට වී සිටීමට කැමැති විය. මේ නැම්ම ඇති වූයේ ආදි ජෝර්ජියාවේ දී ලැබූ යටත් විදේශීය අද්දැකීමෙක දී ය. එහි දී හේ මහජන යහපත උදෙසා ආත්මාර්ථයෙන් තොර ව ක්‍රියා කෙළේ ය. අන්‍යයන් විසින් ඔහුගේ සේවය අයුක්ති සහගත ලෙස අවඥාවෙන් යුතු ව සුළු කොට දක්වන ලදි. කරුණු තේරුම් ගත් ඔහුට සියල්ල තිත්ත විය. තමාත් මනුෂ්‍ය වර්ගයාත් සැක කරන්නට පටන් ගත් හේ තමාට ම හැකිළී ගියේ ය.

මෙසේ කේසි ලිපි ගොනුවල ඇති ඉහත සඳහන් කළ නිදසුන් වල හා තවත් බොහෝ නිදසුන්වලත් සාක්කිය අනුව බලන විට ඇතුළට නැමීම, ආත්මය හැකිළීමට හේතු වූ අද්දැකීමෙකින් පටන් ගෙන ස්වාභාවික අවිච්ඡින්නතාවෙකින් එක් ජීවිතයෙකින් තවත් ජීවිතයකට යන බව පෙනේ.

පිටතට නැම්මේ දී ද අවිච්ඡින්නතා මූල ධර්මය මෙබඳුම ක්‍රමයෙකින් ක්‍රියාත්මක වෙයි. එක් ස්ත්‍රියක පිළිබඳ පැහැදිලි නිදසුනෙක් ඇත. වයස තිස් පහකට වැඩි ඕ දික්කසාද කරනු ලැබූ තැනැත්තියකි. එහෙත් ඇගේ කිසි ම පසු බැසීමෙක් නැත. දූත් ඕ තුන්වැනි වරටත් විවාහ වීමට සූදානම් ය. කේසිට අනුව ඇගේ මේ ප්‍රාණවත් සමාජ ප්‍රගල්භතාවට [1] අත්තිවාරම දැමුණේ අතීත ජන්ම දෙකෙක දිය. මින් එකෙක් ඇමෙරිකාව

1. ප්‍රගල්භතාව නම් හුරු බුහුටි කම ය.

සම්පූර්ණයෙන් ජනාවාස නොවූ කාලයෙහි නෘත්‍ය ශාලා ක්‍රීඩිකාවක වශයෙනි. අනෙක ප්‍රංශ රජ මාලිගයෙහි xiv වැනි ලුවි රජුගේ මෙහෙසියක වශයෙනි. දෙවන අද්දැකීමෙන්, සුහද සබඳතා ඇති කර ගැනීමේ හා සිත් ඇද ගැනීමේ දක්ෂතාත් කේසිගේ වචනවලින් කියත හොත්, "රජුගේ සිට කුස්සි අම්මා තෙක් වූ අවට සිටි හැම දෙන ම ඇඟිල්ලේ නැටැවීමට" ඇති ශක්තියක් ආවේ ය. නෘත්‍ය ශාලා ක්‍රීඩිකාවක වශයෙන්, ඕ මේ දක්ෂතා ප්‍රයෝජනයට ගනිමින් භාග්‍යයේ විපර්යාසයෙකින් හා හදවතේ වෙනසෙකින් තම සමාජයෙහි සිටි පරිචාරිකා සුරඳූතිකාවක්[1] බවට පත් වන තුරු ඒ දක්ෂතා තවත් දියුණු කළා ය.

නිව්යෝර්ක් විනෝද ක්‍රීඩක විජ්ජාකාරයාගේ නිදසුන ද තවත් සිත් ගන්නාසුලු එකෙකි. කවට කමට දක්ෂ, සිත් ගන්නා පෙනුමක් ඇති, හේ පහසුවෙන් මිත්‍රයන් සාදා ගනී. කේසිගේ කියැවීමෙන්, මේ ආශා කටයුතු තරම් වූ පිටතට නැමුණ ගති, අතීත අද්දැකීම් දෙකකට පවරා දෙනු ලැබේ. ප්‍රථමය සිදු වූයේ මොහක් නිම්නයේ[2] ආදි වැසියකු වශයෙන් සිටිය දිය. එහි දී හේ ඒ ප්‍රදේශයේ තුබූ විවිධ ජනාවාස එක්සත් කිරීමට යත්න දැරීය. "මේ ආත්මය වැඩි කල් ජීවත් නො වූ නමුත් ඒ ආත්ම භාවයේ දීත් මීට පූර්ව ජන්මයේ දීත් ඇති කර ගත් දක්ෂතාවලින් වර්තමානයේ දී මිනිසුන් ඇද ගැනීමේ හා පාලනය කිරීමේ ශක්තිය ඔහුට ලැබුණේ ය." ඔහුගේ නායකත්ව ලක්ෂණ වැඩි හරියකුත් සිත් අලවන ගතියත් ලැබුණේ, ආදි ඇමෙරිකාවේ ආධ්‍යාත්මික සටන්වලිනි. කෙළිකවටකම් කිරීමේ දක්ෂතාවෙන් හා ඥානයෙන් වැඩි හරියක් ලැබුණේ එංගලන්තයේ viii වැනි හෙන්රි රජුගේ මාලිගයේ රාජ සභා කවටයකු සේ සිටි පූර්ව ජීවිතයෙනි. ඔහු දේශපාලනයෙහි ක්‍රියාකාරී වූ බවත් රටේ ශුභ සිද්ධිය නංවාලීමට නියම උනන්දුවක් දක් වූ බවත්, රාජ මාලිගයේ

1. Ministering angel
2. Mohawk Valley

දේශපාලන ප්‍රයෝජනය තකා තම දක්ෂතාව දියුණු කළ බවත් පෙනී යයි.

කොටින් කියනවා නම් කේසි ලිපි ගොනුවල ඇති බහිර්නතිය [1] පිළිබඳ හැම නිදසුනෙක් ම පූර්ව ජන්මයන්හි දී සාමාජික වශයෙන් ඉදිරිපත් වී කරන ලද ව්‍යාපාරයෙක ප්‍රතිඵල බව පෙනේ.

ජීවිත ගණනාවක් ඉක්මීමේ දී අන්තර්නතයන් බහිර්නතයන් වන සැටිත්, බහිර්නතයන් අන්තර්නතයන් වන සැටිත් විග්‍රහ කිරීම සිත් අලවන කාර්යයෙකි. නිෂ්පත්තියට අනුව, අන්තර්නති හා බහිර්නති යන වචන, අවධානයේ ඇතුළට නැමීම හා පිටතට නැමීම අදහස් කරන බව මතක තබා ගත යුතු ය. මේ වචනවලින් ම මානසික ගමනෙක පැත්ත දක්වනු ලැබේ. මීට අනුව ඇතුළු පැත්තට වේවා, පිට පැත්තට වේවා, සිදු වන මානසික චලනය, අනෙක් ඕනෑ ම චලනයක් මෙන් තදින් නතර නො කළ හොත්, තම මාර්ගයෙහි ඒ අතට දිගට ම යන බව පෙනේ.

ආත්මයක්, අන්තර්නත යයි හෝ බහිර්නත යයි හෝ නො කිව හැකි, නිරෝගී සන්සුන් කමෙකින් යුතුව ජීවිත ගණනාවක් පසු කර ඇත. මෙසේ යන විට 19 වැනි ආත්ම භාවයේ දී යයි කියමු - ආත්මය තමා දෙසට හරවන කිසියම් සිද්ධියක් වූවා යයි සිතමු. සමහර විට ඛොර කකුලක් හෝ දුර්වල ශරීර තත්ත්වයක් හෝ නිසා ඔහුට තම සාමාජිකයන් සේ ස්වස්ථ, නිදහස්, බහිර්නතියෙකින් යුතු ව වාසය කිරීමට නො හැකි වෙයි.

පළමුවෙන් ඇරැඹුණු මේ අන්තර්නතිය (සමහර විට අපහසුවක් වන නමුත්) ස්වස්ථ වූ එකෙකි. එය, මුල දී වන්දි ගෙවීමේ උපාය මාර්ගයක් ලෙස පෙනුණත්, මිනිසකුගේ විග්‍රහ

1. පිටතට නැමීම.

කිරීමේ ශක්තිය සාරධර්ම පිළිබඳ හැඟීමත් අභෞතික සත්‍යයන් පිළිබඳ හැඳිනීමත් දියුණු කරන නිසා, එහි එක්තරා හොඳ පැත්තෙක් ද ඇත. එහෙත් චලනයේ අවස්ථිතිය [1] ඒ පුද්ගලයා දිගට ම අන්තර්නතියට ම යවයි. තමා ගැන ම පමණක් සිතීම ක්‍රමයෙන් දියුණු වී, එක් ටැම් මාලිගයක් තනා ගෙන අන්‍ය ලෝකය අනවශ්‍ය යයි ද නො අගී යයි ද සිතන තත්ත්වයෙක් උදා වෙයි. වෙන්කම පිළිබඳ හැඟීමත් ශ්‍රෙයස් මානයත් නිසා, හෙතෙම වැඩි වැඩියෙන් තම සාමාජිකයන්ගෙන් වෙන් වෙයි. මේ චාරිත්‍රාකල්පයෙන්, හේ නිෂ්ක්‍රියයෙක් ද සමාජ ද්වේෂිතයෙක් ද වෙයි.

මේ නැමීම් වැඩි වෙමින් 20 - 21 ජීවිතවලටත් ඉදිරියට යයි. අන්තිමේ දී මේ රෝගී අන්තර්නතියත්, ඔහුගේ සාමාජිකයන් කෙරෙහි චාරිත්‍ර වාරිත්‍ර දෙපක්ෂයෙන් ම සිදු වන පාප කර්මත් නිසා, කිසියම් මාර්ගයෙක කඩා වැටීමෙක් සිදු වෙයි. මේ දැරිය නො හැකි තත්ත්වය, නැතහොත් හිරවීම, ආත්මය බිය කර අනෙක් අතට පන්නා දමයි. මෙසේ ආත්මය තම අවධානයේ පැත්ත වෙනස් කිරීමට තීන්දු කර ගනී. අසම්පූර්ණ සුපුරුදු උපමාවෙක් මෙසේ ය. යමකුගේ පා නිය පොත්තෙක් මස තුළට ලියලන්නට වෙයි. මුලදී හේ, ඒ ගැන නො සලකා ඊට ලියලන්නට ඉඩ දෙයි. අන්තිමේ දී වේදනාව බලගතු වූ විට හේ කරපාද වෛද්‍යවරයකු [2] වෙත ගොස් එය ඉවත් කර ගනී.

22 වැනි ජීවිතයේ දී ලැබූ බංකොලොත්තුවෙන්, ආත්මය වඩා සමාජ ප්‍රිය වන්නටත් බහිර්නත වන්නටත් මහා යත්නයක් දරයි. 23 වැනි ජීවිතයේ දී මේ ආවේගය පූර්ව ජීවිතයේ දී ලැබූ ශක්තියත් සමහර විට අතරතුර වූ වෙනත් ලෝකයෙක වූ ජීවිතයෙක දී [3] ලත් ශක්තියත් ඇති ව ක්‍රියාත්මක වෙයි. මෙසේ

1. the inertia of motion (අවස්ථිතිය නම් වෙනසක් නැතිව දිගට ම පැවැත්මයි.)
2. Chiropodist
3. මේ අන්තර්භවයෙකි. 168 වැනි පිටේ 1 වැනි අධෝලිපිය බලන්න.

24 - 25 වැනි ජීවිතවල වර්ධනය වෙමින් යන පුද්ගලයා අන්තිමේ දී 26 වැනි ජීවිතයේ දී පූර්ණ බහිර්නතයකු[1] බවට පත් වෙයි.

එහෙත් නැවත ඇති වන්නේ තවත් තීරණාත්මක යුගයෙකි. ඔහුට නම් සාමාජික දායාද, ආත්ම ප්‍රීණනයට හා ආත්ම බල වර්ධනයට නො යොදා භාග්‍ය සම්පන්න ලෙස, සමාජයට අවශ්‍ය ලෙස, සකස් වී බහිර්නතයකු ලෙස දිගට ම සිටිය හැකි ද ? පමණ ඉක්මවා ඇතුළට නැමීම නිසා තනි වූ ආත්මය තමා උසස් කොට දක්වීමට නැමෙයි. එසේ ම පමණ ඉක්මවා පිටතට නැමීම නිසා, සමාජයෙහි නියම අභිවෘද්ධියට සියුම් ලෙස හානි පැමිණේ. මෙසේ ඒ පුද්ගලයා 26 වැනි ආත්ම භාවයේ දී උඩඟු කාමුකයකු වනු ඇත. ඔහුගේ තෘප්තිකර සාමාජික සමර්ථනාවෙන් හා ආත්ම විශ්වාසයෙන් ඇති වූ, ආත්මාර්ථකාමී ක්‍රියා අපට දක්නට ලැබෙනු ඇත.

ආත්මාර්ථකාමය ක්‍රියාත්මක වූ විට විපාක දෙන පාප කර්ම සිදු වේ. මෙසේ හේ, 27 වැනි නැති නම් 28 වැනි ආත්ම භාවයේ ද, ඉතා ශක්තිමත් පුද්ගලයකු වන නමුත්, මුල් ජීවිත පරිසරයේ බලගතු සිද්ධියෙකින් ඇතුළට නැමුණු, ස්නායු රෝගවලට බර වූ නැනැත්තෙක් වෙයි. මෙසේ සමාජය ගැන සිතන්නටත් ආධ්‍යාත්මික පදනම් මත පිහිටා ක්‍රියා කරන්නටත් පටන් ගනී. පුද්ගලයකු වශයෙන් පවතින්නට නම්, එසේ කිරීම අවශ්‍ය බව ඔහුට වැටැහෙයි.

නැවත සමබරකම සඳහා සටනෙක් ඇති වෙයි. මෙසේ අපට හෙගල්ගේ ප්‍රසිද්ධ ස්ථාපනය[2] ප්‍රතිස්ථාපනය[3] හා සංස්ථාපනය[4] යන තුන ඓතිහාසික සිද්ධීන්ගේ ඇති කාල්පනික චලන සැලැස්මක් පමණක් නො වන බව, පෙනෙන්නට වෙයි. එයින් ආත්ම අභිවෘද්ධියට යන ගමන් සැලැස්ම ද දක්වනු

1. පිටතට නැමුණකු 2. thesis 3. antithesis

4. synthesis (මේ තුන මෙහිදී විස්තර කළ නො හැකි තරමේ ගැඹුරු දාර්ශනික කල්පනා ය.)

ලැබේ. මෙසේ අන්තර්නතිය හා බහිර්නතිය යන නම්වලින් හැඳින්වෙන චෛතසිකාකල්පය පිළිබඳ බිම්, සත්‍ය වශයෙන් ආත්මයේ තත්ත්ව ලෙස ඇති බව පෙනේ. මෙවා සොයා ගැනීමෙන් යුංගේ හා ඕවර්ස්ට්‍රීට්ගේ වැටැහීමේ නුවණ හෙළි වෙයි. මේවා ආත්මයේ ඇති ප්‍රතිවිරුද්ධ වූ ආකල්ප ය. ඒවා පවතින්නේ සියලු ම මිනිසුන්ගේ නම් දැමිය හැකි මේසයක් මත ඇති ලියුම්රාක්ක මෙන් නො ව, කිසියම් අවස්ථාවෙක සියලු ම සංචාරකයනට නවාතැන් ගත හැකි සංචාරක කදවුරු හෝටල් මෙනි.

අන්තර්නතිය හා බහිර්නතිය, ස්ත්‍රී පුරුෂ ප්‍රතිවිරෝධතා බඳු ප්‍රතිවිරෝධතා වන බව පෙනේ. ආත්මය ඇතැම් අවස්ථාවල පුරුෂ ශරීරයෙක ද ඇතැම් අවස්ථාවල ස්ත්‍රී ශරීරයෙක ද නිවාස ග්‍රහණය කරයි. ද්විලිංගික වීමට ආත්මය විසින් ඒ දෙකෙහි ම ඇති හොඳ උගත යුතු ය. මෙසේ ම ආත්මය (පිළිවෙළින් වූ ජීවිතවල දී නැතහොත් ජීවිත චක්‍රවල දී) වරෙක බෙහෙවින් අන්තර්නත ද වරෙක බහිර්නත ද වෙයි. එහෙත් ආත්මයේ ඉලක්කය මේ නත (නැම්ම) දෙකේ ම ශක්තිය ලබා දනට ම නැමීමයි. මේ ක්‍රියා මාර්ගය ඔර්ලෝසු බට්ටකු සේ දෙපැත්තට වැනෙමින් යන බව පෙනේ. අන්තිමේ දී පවිත්‍ර ව ඇතුළත බලන පවිත්‍ර ව පිටත නික්මෙන නිශ්චල ආකල්පයෙක් උදා වෙයි.[1] මෙය පවිත්‍ර ව ඇතුළු කර ගැනීමෙන් පවිත්‍ර ව පිට කිරීමෙන් ආකල්පයෙකි. මේ අවස්ථාවේ දී ඒ පුද්ගලයාට අන්තර්නත බහිර්නත යන විශේෂණ යෙදීම ඕක් ගසකට ඒවා යෙදීමට වැඩියෙන් යෝග්‍ය නොවේ.

මෙහි දක්වන ලද මූල ධර්මයන් තහවුරු කරන සාක්කි සපයන, සාර්ථක වුත් අසාර්ථක වුත් සාමාජික සකස්වීම පිළිබඳ බොහෝ නිදසුන් කේසි ලිපි ගොනුවල ඇත. එබඳු නිදසුනෙක්,

1. මෙවිට නියම මධ්‍යම ප්‍රතිපදාවට පැමිණ ඇතැයි කිව හැකි ය.

බෙහෙවින් කථා කරන, ආක්‍රමණශීලී බහිර්නත ස්වභාවයක් ඇති, ස්ත්‍රියක පිළිබඳ ව ය. ඇ මුල දී බලාපොරොත්තු වූයේ නිළියක වන්නට ය. එහෙත් පවුලේ කරදර නිසාත්, මිටි, මහත ශරීරය නිසාත්, ඇට තම අදහස ඉටු කර ගැනීමට නො හැකි විය. ඒ නිසා ඕ ව්‍යාපාර ලෝකයට ඇතුළු වූවා ය. ඇගේ ජීවිත කියැවීමට අනුව ඕ ඇමෙරිකානු විප්ලව කාලයෙහි විනෝද ක්‍රීඩිකාවක් වූවා ය. ඇට සමාජ තත්ත්වයක් හා සුඛෝපභෝගී ජීවිතයක් ගත කිරීමට තිබිණි. එහෙත් ඇ ඒවා ලබා තිබුණේ තම ප්‍රතිපත්ති පාවා දීමෙනි. අන්‍ය පුද්ගලයන් කෙරෙහි බල පෑමට හැකි බවත් සාකච්ඡාවේ හා නාට්‍යයේ දක්ෂතාත් ලැබුණේ, ඒ ආත්ම භාවයෙනි. එහෙත් කියැවීමට අනුව ඇය පූර්ව ජන්මයේ දී ඒ ශක්ති "ආධ්‍යාත්මික ප්‍රතිවේධයෙකින් [1] තොරව" භාවිත කළ නිසා දැන් ප්‍රාර්ථනා භංගයට පත්ව සිටී.

මේ ආත්මය දැන් සිටින්නේ, ඉහත සඳහන් කළ තීරණාත්මක අවස්ථාවේ ය. ඇගේ ශරීරයේ ආකෘතියත්, පවුලේ තත්ත්වයත්, දර්ශනීය වෘත්තීය මාර්ගයෙකින් ඇගේ නාට්‍ය සමර්ථතාවලට ප්‍රකාශ වන්නට ඉඩ දුන්නේ නැත. ඇගේ සාකච්ඡා ශක්තියට එතරම් බාධා වූ බවෙක් නො පෙනේ. එහෙත් කියැවීමෙන්, ඇගේ ප්‍රකාශන ශක්තිය, ආධ්‍යාත්මික ප්‍රතිවේධයෙන් තොර ව නො යොදන්නට ඇට පැහැදිලි ව අවවාද කර තිබේ. මෙයින් අදහස් කර ඇත්තේ එසේ නො කළ හොත් වැඩි නරකක් සිදු වන බව ය.

මෙබඳු නිදසුන්වලින් පෙන්වන්නේ ආධ්‍යාත්මික හා වෘත්තීය ප්‍රශ්න තදින් එකට බැඳී ඇති බවයි. ඇතැම් විට මේ නිදසුනෙහි දී මෙන්, ශක්තියක් තිබිය දීත් වෘත්තියෙක් වැළැදී යයි. මෙසේ වන්නේ ඒ වෘත්තිය ලබා ගත්තා නම්, සකස් කර ගැනීමට ඉඩ නොලැබෙන ආධ්‍යාත්මික දුර්වලතාවක් සකස්

---

1. spiritual insight (ප්‍රතිවේධය නම් විනිවිද දක්නා නුවණයි.)

කර ගැනීමට ඉඩ සපයා දෙනු සඳහා ය. අවුරුදු තිස් දෙකේ වයසේ දී මේ ස්ත්‍රියට කථාන්තර කියන්නියක හෝ ළදරුවන්ගේ නැතහොත් හිර කරනු ලැබූවන්ගේ සහචාරිකාවක හෝ වන්නට උපදෙස් දෙන ලදී. කෙසේ හෝ ඇගේ සමර්ථතා ආත්මාර්ථකාමී නො වූ ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා භාවිත කළ යුතු විය.

අතීතයෙහි වූ බහිර්නත ශක්ති භාවිතය නිසා වර්තමානයෙහි මානසික ප්‍රතිකාර අවශ්‍ය වූ චිත්‍රයක් දක්වන නවත් නිදසුනෙක් හතලිස් නව හැවිරිදි ස්ත්‍රියක පිළිබඳ ව ඇත. ඇය කොළොම්බියා දිස්ත්‍රික්කයේ වොෂින්ටන් නගරයෙහි පෞද්ගලික ලේඛිකාවක් වූවා ය. ඇගේ ලියුම්වලින් හැම සමාජයක් ම ඇ හොඳින් පිළිගන්නේ නැත යන හැඟීමක් ඇ තුළ වූ බව පෙනී යයි. සමහර විට මෙය ඇති වන්නට ඇත්තේ කුඩා කාලයේ දී ඇගේ සහෝදර සහෝදරියන් ඇ තම සමාගමයෙන් බැහැර කළ නිසා විය හැකි ය.

ඇ මෙසේ ලියා ඇත. "මා වැඩුණේ භය සංකීර්ණයෙකින්[1] යුතු ව ය. එය හැම විට ම මා පසු පස ආවේ ය. පිරිසෙක සිටින හැම විට ම මට හැඟී ගියේ, මා අනවශ්‍ය කෙනකු ලෙස ය. එබඳු තැනෙක දී කළ යුතු, කිව යුතු දෙයක් මට වැටැහුණේ නැත. යම් යම් කරුණුවලට සම්බන්ධ වීමට අවශ්‍ය වූ නමුත් එය කරන්නේ කෙසේ දැයි මට වැටැහුණේ නැත. මා කෙරෙහි නො කැමැත්තක් ඇති වේය යන බය නිසා නිතර සමාජය පුද්ගලයකුගෙන් බලාපොරොත්තු වනවාට වඩා වැඩි කොටසක් කළ යුතු යයි මට සිතුණේ ය. මේ නිසා මම, කාට හෝ කුමක් හෝ කිරීමට මගේ පහසුවත් සෞඛ්‍යයත් කැප කරමි. මා අවශ්‍ය වූ කෙනකු වීම මට අවශ්‍ය විය." තම ප්‍රේම සම්බන්ධතා තුනක් ද කැඩී ගිය බව ඕ කියයි. මෙයින් දෙකෙක දී ඇගේ පෙම්වතා ඇට ආලය කරන බව සහතික කොට කියා සිටි නමුත් ඇ අත හැර අන් තැනැත්තියක හා අවාහ වී ඇත.

1. a fear complex

පූර්වයෙහි ඇ ඔහායෝවේ ආදි පදිංචි කාරියක වූ බව ජීවිත කියැවීමෙන් හෙළි කරන ලදි. ඇ අන් අයට කාරුණික ව සැලැකුවේ ආත්මාර්ථය සඳහා පමණි. "මේ ආත්මය තමා ලත් දෙයින් තෘප්තිමත් වූ නමුත් බොහෝ දෙනකුන්ගේ බලාපොරොත්තු කඩ කළා. අද ඇට කරදර පැමිණෙන්නේ එදා ඇගෙන් කරදර ලැබූ අයගෙන් ම ය. අන්‍යයන් තම නැඟීමේ පඩි වශයෙන් පාවිච්චි කිරීම ඔබ විසින් ම විඳිය යුතු කර්මයෙහි ඔබ වළලා ගැනීමෙකි."

විශ්වය අවංක ය. එය හරියට ම කිරා බලා දී ඇති දෙය ආපසු දෙයි. පැහැදිලි කැටපතක් මෙන් මේ ස්ත්‍රියගේ වර්තමාන ජීවිත පරිසරය ඇ අන්‍යයන්ගේ ජීවිතවල ඇති කොට තුබූ ජීවිත පරිසරය ම නිවැරැදිව පිළිබිඹු කෙළේ ය. ඇත්ත වශයෙන් ඇගේ පූර්ව ජන්මයේ දී ඇට අන්‍යයන්ගේ සමාගමය අවශ්‍ය නො විය. එය අවශ්‍ය වූයේ ඇගේ ප්‍රයෝජනය සඳහා පමණි. ඇගේ වර්තමාන ජීවිතයේ දී පවුලේ ඇගේ තත්ත්වය කෙබඳු ද යත් ඇට ඇගේ සමාගමය අනවශ්‍ය යි හැඟිණි. මෙයින් සිදු වූයේ තමා අනාරක්ෂිත යන හැඟීමත් අන්තර්නතියකුත් ඇති වීම ය. මෙය මුළු ජීවිතය පුරාම පැවැතුණේ ය. සුරූපී වූ ඇට මිනිසුන් කිප දෙනකුන් ඇද ගැනීමට තරම් සමාජ දක්ෂතා තිබිණි. ඔවුන් ඇට තවත් ආලය කරතැයි යන හැඟීම ඇති කළ නමුත් ඒ සියල්ලෙහි දී ම ඕ රැවැටුණා ය.

ඇගේ ම පිළිගැනීම අනුව තමා අන්‍යයනට අනවශ්‍ය ය යන හැඟීමක් ඇගේ අන්තර්නතිය පිළිබඳ හැඟීමත් නිසා ඕ අන්‍යයනට උදව් කිරීමට උත්සාහ ගත්තා ය. ඇ එසේ කෙළේ අන්‍යයනට තමා රුචි වීමටත් ඔවුනට තමා ඕනෑ කරවීමටත් ය. මේ ක්‍රමයෙන් කර්ම විපාකයේ ඇති හිතවත් ප්‍රතිකාරාර්ථය ඉටු විය. අතීතයේ ආත්මාර්ථකාමී ව වංක ව අයථා ප්‍රයෝජනයට යොදන ලද සමාජ දක්ෂතාව වර්තමානයෙහි දී තමා සමාජයට

එපා වීමට හේතු විය. මෙයින් ඇයට මිදෙන හැක්කේ අවංක පරාර්ථකාමයෙන් පමණි.

පුද්ගලයන් තුළ ඇති වන බලාපොරොත්තු සුන්වීමේ අද්දැකීම ඉතා සුලබ දෙයෙකි. මෙය අනිවාර්යයෙන් ම මානසික මට්ටමෙහි සිදු වන බූමරංග කර්ම විපාකයක් බව පෙනේ. පහත දැක්වෙන්නේ ඒ පිළිබඳ ව කියැවීම්වල ඇති හොඳ ම සාරාංශයයි, අවධාරණයෙන් කී දේ කළු අකුරින් ඇත.

"මේ ආත්මයේ බොහෝ බලාපොරොත්තු අන්‍යයන් නිසා සුන් වී තිබේ. මේ සනාතන වූ ප්‍රථම නීතිය දැන ගන්න. වපුළ බීජයේ ඵල යම් දවසෙක නෙළා ගත යුතු ය. ඔබ අන්‍යයන්ගේ බලාපොරොත්තු සුන් කළා. දැන් ඔබගේ ම බලාපොරොත්තු සුන්වීම් වලින් ඔබ ඉවැසීම, උගත යුතු ය. සියලු ගුණයන්ගෙන් අග්‍රගණ්‍ය වූ ඒ ඉවැසීම, ඔබ අඩුවෙන් ම තේරුම් ගෙන ඇති ගුණ ධර්මයයි.[1]"

අන්‍යයන්ගේ හැඟීම් ගැන නොසැලකීම බහිර්නතයාගේ ස්වභාවයෙකි. පසු ව තමා ම අන්තර්නත ව සාමාජික අදක්ෂතාවෙන් යුතු ව අන්‍යයන්ගේ අකරුණාවට ගොදුරු වීමට වඩා මේ සඳහා ඇති හොඳ ප්‍රතිකාරයෙක් නැත.

මෙවායින් හා තවත් මෙබඳු නිදසුන්වලින් ආත්මයෙහි ඇති වූ නැම්මක්, අභ්‍යන්තර දූෂණය නිසා ප්‍රතිකාරක බාධාවක් ඇති වන තාක් චලනයේ අවස්ථියෙන්[2] මෙන් දිගට ම යන්නේය යන මතය තහවුරු කෙරෙයි. ඒ බාධාවෙන් පසු ව අනෙක් අතට හැරී සම්පූර්ණ ප්‍රතිපක්ෂ තත්ත්වය ළඟා වන තාක් ගමන් කරයි. නිශ්චලත්වයක් ළඟා වන තාක් මේ දෙ පැත්තට යෑම ඔරලෝසු බට්ටා පැද්දෙන්නා සේ දිගට යයි, බහිර්නත හා

1. ඛන්ති පරමං තපෝ (ඉවැසීම ලොකු ම තපසයි.)

2. Inertia of Motion (බාහිර බලපෑමක් ඇති නොවුව හොත් ආරම්භ වූ චලනය දිගට ම එසේ ම පවතී. අවස්ථිතිය නම් ඒ පැවැත්මයි.

අන්තර්ගත තත්ත්ව අතර ඇති සංක්‍රමණය, සෞඛ්‍යයේ හා භාග්‍යයේ මාරුවීම්වලට සම්පූර්ණයෙන් ම සමාන ය.

මෙහි දී අප විසින් කියැවීම් පරීක්ෂා කොට ඇත්තේ දැනට ඉදිරිපත් ව ඇති චරිත වර්ගවාදවලින් එකක් සම්බන්ධයෙන් පමණි. එනම් යුංගේ චරිත වර්ගය සම්බන්ධයෙනි. එහෙත් දැනට සකස් කර ඇති සියලු ම මනුෂ්‍ය වර්ග පිළිබඳ ඉගැන්වීම් සම්බන්ධයෙන් ද මේ නිගමනය ම ලබා ගත හැකි ය. මේ වර්ගවාද මිනිසුන්ගේ සාර ධර්ම පදනම් කොට ඔවුන් පිළිබඳ ව ස්ප්‍රැන්ගර් කර ඇති වර්ග කිරීම බඳු වූ මානසික වර්ග කිරීම් වුවත් ක්‍රෙට්ශ්මේර්ගේ වර්ග කිරීම බඳු වූ ශාරීරික වර්ග කිරීම් වුවත් ඒ හැම එකක් ම මනසේ හා ආත්මයේ යට ඇති ගුණවත් බාහිර ප්‍රකට වීම පිළිබඳ කරුණු දක්වයි. මේ ගුණ, පරිණාම මාර්ගයෙකින් ජීවිත කාලයට වෙනස් වෙයි. වර්ග කිරීම්වල සත්‍යතාව පිළිබඳ විද්‍යාව විසින් කරනු ලබන අවසාන නිගමනය කුමක් වුවත් ඒවා විශ්වාස කරන්නවුන් සඳහා කේසි කියැවීම්වලින් අඩු ගණනේ එක් කරුණක් ඔප්පු කර දෙන බව නම් දක්නට ලැබේ. එය නම් දැනට ඇති චරිත වර්ගවාදවලින් ආත්මය සඳහට ම අවසාන වශයෙන් හංවඩු නො ගසන බව ය. පහසුව තකා කිසියම් පුද්ගලයකු කිසියම් වර්ගයකට අයත් යයි කිව හැකි ය. එහෙත් ඒ වර්ගය කුමක් වුවත් එය චින්තාකල්පයේ තාවකාලික තහවුරු වීමෙක් පමණි. නිත්‍ය පුද්ගල ඒකත්වයේ අභිවෘද්ධිය සඳහා තාවකාලික අවස්ථාවෙක් පමණි.

## 11

# මානසික කර්ම විපාක නිදර්ශන

දුර්ගුණ ගණයට අයත් පාපයක් වන මානය, කොරවීමේ ස්වරූපයෙන්, පැහැදිලි කායික විපාක ගෙන දෙන සැටි අපි දැනටම දැක ඇත්තෙමු. දුර්ගුණ පාපවල විපාක වශයෙන් බරපතල මානසික ප්‍රශ්න ඇති වන බව දක්වන නිදසුන් බොහෝ ගණනෙක්ද කේසි ලිපි ගොනුවල ඇත. මේවා අතර හරියට හැඩ ගැසීමට නො හැකි වීම පිළිබඳ කැපී පෙනෙන නිදසුන් දෙකක් ඇත. මේ විපාකයේ පාප කර්මය වී ඇත්තේ අසහනයයි.

ප්‍රථම නිදර්ශනය **xiv** ලුවී රජුගේ කාලයේ ප්‍රංශ මඩමෙක සිටි තවුසියක පිළිබඳ ව ය. තද අකාරුණික තැනැත්තියක වූ මිනිස් දුර්වලකම් නො ඉවසුවා ය. ඇගේ ධර්ම ග්‍රන්ථ ඥානය අකුරට සීමා වූවෙකි. මේ නිසා ඕ නීතියේ අර්ථය නො ව අකුර කඩ කළ අයට අවඥා කළා ය.

ඇගේ අසහන කර්මයේ ප්‍රථම විපාකය මේ ආත්මයේ දී පහළ වූයේ ග්‍රන්ථිගත ආබාධයක් ලෙස ය. එය තුරුණු වියෙහිත් දිගට ම පැවතුණේ ය. අධික ව ඔසප් ලේ ගැලීමේ ආබාධය නිසා ඇයට දිනපතා පාසැල් යෑමට නො හැකි විය. සෑම සති හතරකට ම සති දෙකක් ඇට ඇඳට සීමා වී සිටීමට සිදු විය.

එයින් ලැප්ජාවට පත් වූ ඕ තනි වූවා ය. මේ නිසා ඇයට ඇගේ වයසේ අය ආශ්‍රය කරන්නට ලැබුණේ නැත. මෙය ඇගේ හැම අංගයක් කෙරෙහි ම බල පෑවේ ය.

අන්තිමේ දී ආබාධය නැති විය. සුරූපී ව වැඩුණු ඕ වෘත්තියෙන් නිව්යෝර්ක්හි ආදර්ශිකාවක් [1] වූවාය. ඈ විවාහ වූ නමුත් විවාහ ජීවිතය අභාග්‍ය සම්පන්න විය. අඹුසැමි දෙදෙනාට ගැළපෙන ගුණ තිබුණේ ස්වල්පයෙකි. සැමියා ආදර රහිත අකාරුණිකයෙකි. ඕ ආදරය බලාපොරොත්තු වූවා ය. දෙවන ලෝක යුද්ධයේ දී සැමියා පිටරට ගියේ ය. දන් උදා වූයේ තද තනිකම් යුගයෙකි. වේදනාව දරා ගත නොහැකි නිසා ඕ සෞඛ්‍ය මධ්‍යස්ථානයක් තිබූ නගරයකට ගියා ය. බීමට පටන් ගත් ඕ චරිතයද නරක් කර ගත්තා ය. තව මත් ඇට පීඩා කළ සමාජ තහංචිවලින් මිදීමට ඇති එක ම මාර්ගය මත්පැන් වීදුරුවක් දෙකක් ගැනීම බව ඕ සොයා ගත්තා ය.

පටන් ගත් පසු, ඇයට එය නතර කර ගත නොහැකි විය. ඇගේ මධු පාන විනෝද වඩ වඩාත් දික් විය. ඇතැම් විට ඕ සති තුනක් දිවා රාත්‍රි දෙක්හි දිගට ම බීවා ය. මේ අතර ඕ ඇගේ සිතට වැටුණු ඕනෑ ම සොල්දාදුවකු, නැවියකු හෝ අහස් නැවියකු සමඟ නිදි වැදුණාය. බීගත් විට ඇට කිසිම ලැජ්ජාවක් නැත. ඕ කිසි ම ගණනක් නැති ව තද නො කළ ඇතුළු ගෙයි ඇඳුමින් යුතු ව පස්සා මිදුලට කුණු බාල්දිය ගෙන ගියා ය. නො වළක්වන ලද ඇතැම් අවස්ථාවල වාසය කළ ගෙදර සාලයට ඈ සම්පූර්ණයෙන් නග්නව ගියේ ප්‍රීතියෙනි.

අන්තිමේ දී මත්පැන් අධික වීම නිසා ඇගේ සෞඛ්‍ය පිරිහී ගියේ ය. ඇගේ අත් වෙව්ලන්නට වී සැමියා එවන චෙක් පත්වලට අත්සන් තබන්නට පවා නොහැකි විය. එක් සිහි ඇති

1. ආදර්ශිකාවක් නම් වෙළඳුන්ගේ වස්ත්‍රාභරණාදියෙහි හැඩරුව දක්වීම සඳහා යොදා ගනු ලබන ස්ත්‍රියකි.

අවස්ථාවෙක දී ඕ, හමුදා කඳවුරු කීපයකට හා නාවුක ස්ථාන කීපයකට අතර පිහිටි මධ්‍යස්ථානයක් වන සුව නගරය අතහැර උපන් නගරයට යෑමට තීරණය කළා ය. ඇගේ මෑත ම ලියුම්වලින් ඇය වගකිව යුතු ලේඛිකා තනතුරක් දරන බව පෙනී යයි. වෙනත් තැන්වලින් තව මත් ඇය තරමක් මත්පැන් පානය කරන බව පෙනී යයි. ඕ සැමියාගෙන් ද දික්කසාද වූවා ය.

ඇගේ පහත වැටීමට මූලික හේතුව මතු වූයේ පෞද්ගලික දුෂ්කරතාවෙකින් බව පෙනේ. ඊට හේතුව වූයේ ග්‍රන්ථිගත ආබාධයෙකි. (ග්‍රන්ථි, කර්ම විපාකයන්ගේ ප්‍රකාශනයට කේන්ද්‍රස්ථාන වන බව කේසි නිතර පෙන්වා දෙයි.) මේ අයථා ක්‍රියාකාරිත්වය අන්‍යයන් හෙළා දැකීමේ ඍජු විපාකයෙකි. එය ඇගේ ආත්මයේ තුබූ පරිත්‍යාග රහිත බවෙකි. අන්‍යයන් කෙරෙහි ඇති බව දුටු විට නිර්දය ව හෙළා දැකීමේ දුර්ගුණය ඇගේ ම දුර්ගුණයක් වී තිබේ. මෙසේ ඇයට, වැරදීමේ ආභ්‍යන්තරික අවශ්‍යතාවත්, වැරදි කරන පුද්ගලයන් පාපයට පොළඹවන තෘෂ්ණාවත්, ඉන්ද්‍රිය සන්තර්පණයෙන් සැනැසීමක් සෙවීමට මිනිසුන් පොළඹවන දුබල කම හා තනි කමත්, තේරුම් ගැනීමට ඉඩ සලස්සා දී ඇත. උපහාස කරන්නන් තුළ මෙන් හෙළා දකින්නන් තුළ ද ඔවුන් හෙළා දුටු තත්ත්වය ඇති විය යුතු ය.

මානයෙන් පූර්ව විනිශ්චයෙන්[1] සිත් ගන්නාසුලු චිත්‍රයක් දක්වන පූර්ව ජීවිතයේ දී ඕ ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ දී පලස්තීනයේ ජන්මය ලබා සිටියා ය. මෙහි දී ඕ යුදෙව් පූජකයකුගේ බිරිය වූවා ය. ආගමික මණ්ඩලයන්හි මහත් කැළැඹීමක් ඇති කළා වූ ද චාරිත්‍ර අනුගමනය නො කළා වූ ද ඒ තරුණියාගේ ව්‍යාපාර නො ඉවසූ ඕ, ඒවාට අවඥා කළා ය. ඈ එසේ කෙළේ ඇගේ සමාජ තත්ත්වය නිසා ය.

1. Prejudice (පූර්ව විනිශ්චය නම සාක්ෂි විමසීමක් නැති ව පෙරාතු ව ම කෙරෙන තීරණයයි.)

සෙයාමානයෙන් ඇ ලබා ගත් ප්‍රීතිය කාලය නිසා වියැළුණේවත් චාරිත්‍ර නිසා පිලුණු වූයේ වත් නැති බව පෙනේ. නැවත ඇ මැසෙචුසෙට්ස්හි [1] සාලෙම්හි උපන්නා ය. ඇ අන්‍යයන් අත හැරීමටත් ඔවුනට අවඥා කිරීමටත් යුහුසුලු වූවා ය. ඇ වඩාත් අකාරුණික වූවා සේ ය. මෙහි දී කේසි කියමන් උදුරා දක්වමු. "මෙවර මේ තැනැත්තී පුද්ගලයාගේ පුනර්ජන්මය ගැන ඒන්තු යන සාක්කි තුබූ අයට අකාරුණිකව ඔවුන්ගෙන් ප්‍රශ්න කරමින් ඔවුන් අවඥාවට පාත්‍ර කළා ය....මෝ තොමෝ බොහෝ දුෂ්කරතා ද ඇති කළා ය. ඇතැමුන් දියේ ගිල්වනු ලබන කල බලා සිට කැමැත්ත දුන්නා ය. සමහරුනට කසයෙන් තළන විට සාක්කි දී එය අනුමත කළා ය. ඒ නිසා දැන් මේ ආත්මය, සිතට බාධා ඇති වන කාලයෙකින් බැඳී සිටී. ක්ෂීර ශිරාවලත්, පළමු වන හා දෙවන ගෙළ ඇටවලත්, ඉදිමීම් ඇත. මේ ඉදිමීමට හේතු වී ඇත්තේ අනුවේදක පද්ධතිය හා මස්තිෂ්ක - කශේරු පද්ධතිය [2] අතර වූ හන්දියෙහි තද වීමෙකි. මේ නිසා කායික ප්‍රතික්‍රියා ඇති වන කාලපරිච්ඡේද ඇති වේ."

මෙහි දී කියැවීමෙන් සඳහන් කරනු ලබන "කායික ප්‍රතික්‍රියාව" ස්නායු භංගයෙකි.[3] මේ ජීවිතයේ දී ඒ ස්ත්‍රියට මෙය විඳින්නට සිදු වූයේ, වයස තිස් නවයේ දී ය. ඉන් පසුව අවුරුදු දාහතරක්, කලින් කල මානසික අවනතියක් ඇති විය. ඕ අවිවාහක ය. ඇගේ ලාලිත්‍ය යුක්ත නිව්යෝක් නිවාසය නිසාත් ඇට රැකියාවක් නො තුබූ නිසාත් ස්වාධීන වූ ධනෝපායන මාර්ගයක් ඇ සතුව තුබූ බව සිතන්නට ඉඩ ඇත. මේ තැනැත්තියට වෛද්‍ය ශාස්ත්‍රීය නැතහොත් මනෝ වෛද්‍ය ශාස්ත්‍රීය [4] රෝග ලක්ෂණ රාශියක් තුබූ බව පැහැදිලි ය. වැඩක් නැතුව සිටීම මානසික අවනතියේ [5] වැදගත් සාධකයක් වන්නට ඇත. එහෙත් ඉහත දී පෙන්වා දුන් අයුරු, එබඳු සාධක,

1. Massachusetts
2. Cerebro-Spinal System
3. A Nervous Break down
4. Psychiatric
5. පහත වැටීම.

පෙනෙන ආසන්න සාධක මිස නියම සාධක නොවේ. මේ ස්ත්‍රියගේ ස්වභාවයෙහි හරය වශයෙන්, මනුෂ්‍යයන් නො ඉවසීමත් ඔවුන්ගේ රුචිකම් හා දුක් ගැන එකසේ අකාරුණිකව උපේක්ෂක වීමත් තිබිණි. පූර්ව ජන්මයන්හි දී ඇය විසින් ප්‍රකාශ කරන ලද අසහනය නිසා, අන් බොහෝ අයගේ බලාපොරොත්තු බිඳී ගියේ ය. දැන් ඇයට ම බලාපොරොත්තු සුන්වීමේ දුක විඳින්නට වීම යුක්ති සහගත ය.

මේ ස්ත්‍රියගේ පලස්තීන අසහනයේ කර්ම විපාක සාලෙම් ජන්මයේ දී විඳින්නට නො ලැබුණේ කවර හෙයින් දැයි ඇසිය හැකි ය. මේ ප්‍රශ්නයට දිය හැකි උත්තර දෙකක් ඇත. පළමුවැනිව ඇගේ සාලෙම් ජන්මයෙහි මේ අසහනය දුරු කිරීමට වඩා අන්‍ය වූ අර්ථයක් තිබෙන්නට ඇත. මේ නිසා පලස්තීනයේ දී ආරම්භ වූ නැමීම මේ තැනැත්තී වෙනත් ජීවිත කාර්යයෙක යෙදී සිටිය දී නිදහසේ වැඩුණේය. දෙවැනි ව ඇගේ පලස්තීන යුගයේ අසහන ආකල්පය, තවත් මනුෂ්‍යයකුට තදින් රිදවන අසහන ක්‍රියාවක් ලෙසින් ප්‍රකාශයට පත් වන්නට තරම් ප්‍රකට නො වන්නට ඇත. ඇතැම් විට මේ අසහනය ආරම්භ අවස්ථාවේ තිබුණු නිසා, බලගතු විපාක දෙන කර්මයක් නිපැදවීමට තරම් ප්‍රබල නො වූවා විය හැකි ය. ජීවිතයේ එවැනි හැම මොහොතෙක් ම පරීක්ෂණයෙකි. සාලෙම්හි දී ඈට ලැබුණේ ඉවසන්නට හෝ නො ඉවසන්නට හෝ හැකි තත්ත්වයෙකි. ඕ පරීක්ෂණයෙන් අසමර්ථ වූවා ය. මෙසේ ඈ කර ගත්තේ, පලස්තීනයේ දී ඇති වූ අසහනය නැති කර ගන්නවා වෙනුවට එය වැඩි කර ගැනීමය. වර්තමානයේ කර්ම ඵලවල හේතුව හරියට ම ඇති කර ගන්නට ඇත්තේ සාලෙම්හි දී විය හැකි ය.

විවේචනයට ඇති නැඹුරුකමත් අසහන පවුලට ම අයත් දුර්ගුණයෙකි. ඕනෑවට වඩා විවේචක වීමේ කර්මඵල පිළිබඳ සිත් ගන්නාසුලු නිදසුනෙක් පහත දැක්වෙයි. එය අවුරුදු විසි

හතක් වයසැති තරුණයකු පිළිබඳ කථාවෙකි. හේ යුද හමුදාවේ පළමුවැනි පන්තියේ ලෙෆ්ටිනන්ට් කෙනෙකි. පුද්ගල අඩුපාඩුකම් පිළිබඳ තියුණු හැඟීමෙකින් හේ පෙළුණේ ය. අපට ඔහුගේ දුෂ්කරතා පිළිබඳව ඔහුගේ බාල කාලයේ තුබූ පැහැදිලි හේතුව සොයා ගැනීමට ක්‍රමයෙක් නැත. ඇතැම් විට ඔහුගේ මාපියන් අවිචාරවත් විවේචකයන් වීමට ඉඩ ඇත. ඇතැම් විට ඔහුගේ ශාරීරික පෙනීම නිසා ඔහු තම පාඨශාලා සහකාරයන්ගේ උපහාසයට ඉලක්ක වූවා විය හැකි ය. මෙසේ වන්නට ඇතැයි අප අනුමාන කරන්නේ ඔහුගේ පාප කර්මයේ ස්වභාවයෙනි. කියැවීම මෙසේ ය; "කෙනකු වපුළ ලෙසින් පල නෙළා ගත යුතු ය. ඔබ අනුන් විවේචනය කර ඇති නිසා ඔබත් විවේචනය විය යුතු බව දැන ගන්න."

මේ තරුණයා අතීත ජීවිතයේ දී සාහිත්‍ය විවේචකයකු බව ඊළඟට හෙළි කර ඇත. ඔහුගේ සිරිත වූයේ තමාට අප්‍රිය හැම දෙයක් ගැන ම නිර්දය ලෙස විවේචනය කිරීම ය. අතීතයෙහි අන්‍යයන් තුළ තමා ගැන සැක ඇති කළ නිසා දැන් ඔහු විසිනුත් තමා පිළිබඳ සැකයේ වේදනාව විඳීම බලාපොරොත්තු විය යුත්තෙකි. අතිශයින් විචිත්‍ර වූ කර්ම නියාමයේ තවත් සූක්ෂ්ම අංශයක් අපට මෙහි දී දක්නට ලැබේ. ඒ හා පටැලැවී ඇති සදාචාර මතයන් සලකා බැලීමට තරම් වැදගත් අංශයෙකි, මේ.

වෘත්තියක් වශයෙන් විවේචනය කරන අය ලෝකයේ සිටින්නේ ඉතා ටික දෙනෙකි. එහෙත් වෘත්තියක් වශයෙන් නැතිව විවේචනය කරන අය අද මිහිපිට දෙසිය කෝටි පනස් ලක්ෂණයක් පමණ ඇත.[1] ජීවන වෘත්තියක් වශයෙන් නැති ව, පළමුවෙන් කථා කරන්නට උගත් තැන් සිට, මරණයෙන් දිවි අඟුලු වැටෙන තාක්, මහත් උනන්දුවෙකින් මෙතරම් මිනිසුන්

1. මේ කියමන 1950 දී කියන ලද්දකි.

සංඛ්‍යාවක් නිරත වන වෙනත් කාර්යයක් නැතුවාට සැක නැත. එය රටේ මුදලින් වියදම් වන ව්‍යාපාරයෙක් නොවේ. එය කැමටත් වැඩියෙන් සුලබ දෙයෙකි. ගෙය ඇතුළත දීත් ගෙන් පිටත දීත් යෙදිය හැකි විනෝද ව්‍යාපාරයෙකි. එය මුළු අවුරුද්ද පුරා ම එහි නිරත වීමට දිව දෙකකට වඩා වැඩි උපකරණයක් අනවශ්‍යය. දෙතුන් දෙනකුට එක තැනකට එකතු වන්න දෙන්න, එහි විවේචනයක් ඇති වනු ඇත.

කෙසේ හෝ මුදල්වලින් වියදමක් නො යන නමුදු, කිසියම් දවසෙක ඉතා ඉහළ මානසික මිලක් ගෙවිය යුතු විනෝද ක්‍රීඩාවෙකි, විවේචනය. "තොරතුරු මූලාශ්‍රයය" මේ එඩ්ගා කේසි තම ශක්තියට දුන් නමය - දිගු කලක් පැතුරුණු හේතු ඵල දැකීමේ පර්වතස්ථ ධීර දෘෂ්ටියෙන්[1] බලා පැහැදිලි ලෙස මේ ගණයට අයත් වැරැදි කළ පුද්ගලයන්ට නිතර අවවාද කර ඇත. මතු දැක්වෙන්නේ එබඳු සිය ගණින් නිදසුන් අතර ඇති එක් පැහැදිලි නිදසුනෙකි. "මේ ආත්මය දැඩි වූ අවස්ථාවල දී තදින් අන්‍යයන් විවේචනය කරන ගතියෙන් යුක්ත බව අපට පෙනෙනවා. මෙය ප්‍රමාණවත් කර ගත යුත්තෙකි. ඒ ඇයි ? තමා අන්‍යයන් ගැන කියන දේ කිසියම් රූපයෙකින් තමාගේ ම දෙයක් වන හෙයිනි."

මෙහි දී අපට හමුවන්නේ, ක්‍රිස්තියානි බයිබලයේ ඇති සැඟැවුණු අරුත් ඇති කියමන් එක් වර ම සිහිපත් කරවන, ආචාරාත්මක හේතුවල ඵල වශයෙන් යම් යම් අවස්ථා එළැඹීම පිළිබඳ පැහැදිලි ප්‍රකාශනයෙකි. යේසුතුමාණෝ මෙසේ කීහ.

"මිනිසා නිකම් කථා කරන හැම වචනයක්ම විනිශ්චය දිනයේ දී ගණින් වැටෙන බව මා ඔබට කියනවා. ඒ ඇයි ? ඔබ රැකෙන්නේත් වැරැදිකරු වන්නේත් වචනය නිසා ය."

---

1. "පබ්බතට්ඨෝව භුම්මට්ඨෙ ධීරෝ බාලේ අවෙක්ඛති" (පර්වතයෙක සිටි තැනැත්තා බිම සිටියවුන් දක්නාක් මෙන් ප්‍රාඥයා බාලයන් දකී.)

ඉහත සඳහන් කරන ලද විනිශ්චය දිනය කර්ම විපාක විඳීමට සිදුවන දිනය යයි ගැනීම අයුතු වන බවක් නොපෙනෙයි. නැවත,

"මිනිසුන් අපවිත්‍ර වන්නේ ඔහුගේ මුව තුළට යන දෙයින් නොව ඔහුගේ මුවින් පිට වන දෙයිනි."

තවද, "ඔබ විනිශ්චය නොවන්නට නම් විනිශ්චය නො කරන්න. ඔබ කරන විනිශ්චය ඔබ කරා එයි."

අප දුටු කර්ම විපාකවල ආලෝකයෙන් එක් වරම මේ උද්ධෘතවලට ලැබෙන්නේ, තේරුම් ගත හැකි ප්‍රබල නිශ්චිත අර්ථයෙකි. එහි ප්‍රායෝගික ශක්තිය කිසි සේත් වරද්දා ගත නො හැකි ය.

අනෙක් හැම තැනෙක දී මෙන් මෙහි දීත් කර්ම විපාකයේ ප්‍රේරක ශක්තිය චේතනාව බව සැලැකිය යුතු ය. තරුණ ලෝප්ටිහන්ට විපාක දුන්නේ ඔහුගේ පූර්ව ජන්මයේ සාහිත්‍ය විවේචක වෘත්තිය ම නොවේ. ඔහුගේ තුබූ ආකල්පයත්, ඔහුගේ වෘත්තිය නුනුවණින් භාවිත කිරීමෙන් අන්‍යයන් තුළ සැක ඉපැදවීමත් නිසා ඔහුට විපාක විඳින්නට සිදු විය. ක්‍රිස්තියානීනට උපහාස කළ රෝමන් සොල්දාදුවාගේ තත්ත්වය ද (5 පරිච්ඡේදය) මෙබඳු ම බව දක්නට ලැබිණි. ඒ කර්මය හට ගත්තේ රෝමන් මුර භටයකු සේ යුතුකම ඉටු කිරීම නිසා නොවේ. තම ශක්තිය ඉදිරියෙහි අසරණව සිටි අය ගැන සිනාසීම නිසා ය. හැම අවස්ථාවෙක දී මෙන් මෙහි දීත් ගණනට වැටෙන්නේ අර්ථය මිස ව්‍යාඛ්‍යානය නොවේ. ද්‍රව්‍යය මිස රූපය නොවේ. චේතනාව මිස ක්‍රියාව නොවේ.

ගතිගුණ පිළිබඳ කොටසෙහි දී අතීත ආඥාදායක අද්දැකීම් වලින් බලකාමී නැම්ම් ඇති වන්නේ කෙසේ දැයි පෙන්වා දෙන ලදී. නායකත්වය උසස් කොට සැලැකිය යුතු ගුණයෙකි. එහෙත් එය බොහෝ විට කෲර පාලකත්වයට නරක් වී යෙයි. මනුෂ්‍ය

ඉතිහාසයේ දී කීප වරක් ම, නිලයේ ශක්තිය, අහංකාරයට හා ප්‍රතිපත්ති රහිත ආත්ම ප්‍රීණනයට හේතු වී තිබේ. බලය නොමනාව භාවිත කිරීමේ හා එහි විපාක ලැබීමේ දුක් මුසු නිදසුන් කීපයෙක් කේසි ලිපි ගොනුවල ඇත.

සාලෙම්හි මන්තර ගුරුකම් පිළිබඳ නඩු විභාගවල දී බලයේ සිටි පුද්ගලයකු පිළිබඳ සිද්ධිය නිදසුනක් වශයෙන් ගත හැකි ය. මන්තරකාරියන් ලෙස සැක කරන ලද ස්ත්‍රීන් වධයට පත් කිරීම පිළිබඳව හේ බොහෝ දුරට වගකිව යුතු විය. කෙසේ හෝ මහජන සදාචාරය හා ක්‍රිස්තියානි ලබ්ධිය ආරක්ෂා කිරීම සඳහා, යක්ෂ ධර්මයේ ප්‍රචාරය වළක්වා ලන්නට ඉටා ගත් මේ සදාචාරී පියුරිටානුවාට[1] තම නිල තත්ත්වයෙන් පෞද්ගලික ප්‍රයෝජන ගත හැකි බව පෙනී ගියේ ය. හේ තම කාමුක තෘෂ්ණාවන් තෘප්තිමත් කර ගැනීම සඳහා හිර කළ අය යොදා ගත්තේ ය.

මේ පියුරිටානු කුහකයා තම මෑතෙක ම වූ ජන්මයේ දී එකොළොස් හැවිරිදි කොලුවකු ලෙස, ලිපි ගොනුවල දක්නට ලැබේ. සැමියා විසින් අත් හරිනා ලද ස්ත්‍රියකගේ පුතකු ලෙස ඔහු උපන්නේ තම කර්ම විපාකානුරූප පරිසරයෙක ය. හේ අපස්මාර රෝගියෙකි. කියැවීම ලබන අවස්ථාවේ දී ඔහුගේ වම් අංශය පණ නැත. ඔහුට කථා කිරීමට ද බැරි විය. ඔහුට තම ඇඳුම් ඇඳීම හෝ ගැලැවීම කළ නො හැකි විය. ශාරීරික අවශ්‍යතා පවා තනිව කර ගැනීමට හේ අසමර්ථ විය. ඔහුගේ උරහිස් වකුටු විය. විනාඩි විස්සෙන් තිහෙන් සෑදෙන, දින කීපයෙක් පැවැති වෙව්ලීමෙකින් පසුව ඔහුට ඔළුව කෙළින් කර ගැනීමට හෝ ඉඳ ගැනීමට හෝ නොහැකි විය.

කේසිට අනුව බොහෝ විට අපස්මාරය පමණ ඉක්ම වූ

1. 104 පිටේ, 2 අධෝ ලිපිය බලන්න.

කාමුක ක්‍රියාවල විපාකයෙකි.* කෙසේ හෝ මේ නිදසුනෙන් දී බලය නොමනාව යෙදීම මේ තත්ත්වයෙහි ලා වැදගත් අංශයෙක් විය. මව්ගේ දුප්පත්කම හා පහත් සමාජ තත්ත්වය, ඔහුගේ පූර්ව ජීවිතයේ ආර්ථික ආරක්ෂිතත්වය පිළිබඳ උචිත පරිවර්තනයක් බව පෙනේ. අපස්මාරය පමණ ඉක්මවූ කාම සේවනයේ ප්‍රතිඵලයෙකි. අධික කාම සේවනය නිල බලය නොමනාව යෙද වූ එක් ක්‍රමයෙකි.

පහත එන සිද්ධිය රෝමයේ ක්‍රිස්තියානීන් වධයට පැමිණ වූ කාලයට දිවෙන, බලය නොමනාව යෙදවීමේ නිදසුනෙකි. රෝමුස් සොල්දාදුවෙකි. ඔහුගේ උසස් තත්ත්වය නිසා ඔහුට සාමාන්‍ය රෝමන් සොල්දාදුවකු වශයෙන් ලබා ගත හැකි පඩියට වැඩි සෑහෙන මුදලක් සොයා ගත හැකි විය. ඔහු මුදල් ලබා ගත් ක්‍රමය බලයෙන් ගැනීම ද බය කර ගැනීම ද, නැතහොත් ආදි කාලීන සුංකම් මුදල් ක්‍රමයක් ද කියා කියැවීම්වලින් පැහැදිලි කර නැත. කෙසේ හෝ එබඳු ප්‍රතිපත්ති රහිත ක්‍රියා මාර්ගයක් නිසා ඔහුට ආර්ථික වශයෙන් ලාබ ලැබීමට හැකි විය. එහෙත් කියැවීමෙන් දක්වූ අයුරු ඔහු ආධ්‍යාත්මික වශයෙන් "පිරිහී ගෙන, පිරිහී ගෙන ගියේ ය. සෙනසුරාගේ බලපෑම ආවේ මෙයිනි."

මේ අන්තිම විස්තරය වැදගත් වන්නේ එයින් මිනිසාගේ පවට පිළියම් පිණිස ඇති වූ දුක් විඳීම සෙනසුරු ග්‍රහයා අසල වූ ග්‍රහ ලෝක ජන්මයෙක දී ආරම්භ වූ බව දක්වෙන හෙයිනි.

* අපස්මාරයේ කර්ම හේතුව වශයෙන් චිත්ත ශක්ති නොමනාව භාවිත කිරීම ද දක්වා ඇත. දෙකෙහි දී ම සම්බන්ධ වී ඇති කර්මයේ නියම මූල ධර්මය නො පැහැදිලි ය. ඇතැම් විට ආබාධයේ යෝග්‍යත්වය මනුෂ්‍ය ශරීරයේ ගුප්ත නිර්මිතියෙහි රැඳී ඇතුවා විය හැකි ය. හින්දු මනෝවිද්‍යාවේ එන චක්‍ර සත තේරුම් ගත් විට මෙය වඩා හොඳින් තේරුම් යන්නට ඉඩ තිබේ. මේ චක්‍ර 'ජීවිත කේන්ද්‍ර' යයි නම් කළ මේ කියැවීම් ඒවාට ඉමහත් වැදගත්කමක් පවරා දෙයි. කැරකෙන ශක්ති සුළි වන ඒවා භෞතික කායය හා ආත්මය සම්බන්ධ වන ලක්ෂ්‍ය බව පෙනේ. (මේ චක්‍ර ගැන විස්තරයක් පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ගේ ථෙරවාද බෞද්ධ දර්ශනයේ අටවැනි පරිච්ඡේදයෙහි එයි.)

මෙය එක්තරා අපාය වර්ගයක් බව පෙනේ. මෙයින් පොළොවේ සිදුවන ජන්ම හා ජ්‍යෝතිශ්ශාස්ත්‍රය අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව පිළිබඳ කේසී මතය ද දක්වෙයි. ඔහු ජ්‍යෝතිශ්ශාස්ත්‍රය යන වචනය යෙදූවේ ඉතා පරිස්සමිනි. ග්‍රහලෝක බලපෑම් පිළිබඳ අපේ දැනුම තවම අසම්පූර්ණ බව ඔහු නැවත නැවතත් තදින් කියා ඇත.[1]

රෝමුස්ගේ වර්තමාන ජීවිත පරිසරය ජ්‍යෝතිශ්ශාස්ත්‍රය අනුගමනය කරන ඕනෑ ම කෙනකුට ශනිගේ බලපෑමක් ඇතැයි සිතෙන තරමට දුක් සහිත ය. ඔහුගේ වැඩිහිටි ජීවිතය දිගට ම දුප්පත්කම, ධන හානිය, නිවසක් නැතිකම හා බඩගින්න, පියවරක් පාසා ම ඔහු ලුහුබැඳ ඇත. වෘත්තියෙන් සත්නාලියකු වූ ඔහුට තම බිරියත් දරුවන් පස් දෙනාත් නඩත්තු කර ගැනීමට තරම් මුදලක් සොයා ගත නොහැකි විය. ලන්ඩන් නුවර මුඩුක්කුවල ඔහුට යන්තම් දිවි ගැට ගසා ගත හැකි වූයේ ඔහුගේ ඇමෙරිකානු ඥාතීන්ගේ ත්‍යාගශීලීත්වයෙනි.

මෙහි දීත් බලය නො මනාව යෙදීමේ පාපයට, එය සිදු කළ ක්ෂේත්‍රයේ දී ම ප්‍රතිකාර ලැබී ඇති බව පෙනේ. වරක් ඔහු අන්‍යයන් තුළ ඇති කළ අසහීනකම් දැන් ඔහු කෙරෙහි එසේ ම ඇත.

බලය නො මනාව යෙදවීමේ තවත් සැලැකිය යුතු නිදසුනෙක් නම් එක් ස්ත්‍රියක පිළිබඳ කථාවෙකි. ඕ ප්‍රංශ විප්ලව කාලයේ මධ්‍යම පන්තියට අයත් ව සිටියා ය. ඕ තම ජාති හිතෛෂීන් රදළයන්ට විරුද්ධව විප්ලවයට පෙළඹුවා ය. මෙයිනුත් ඇගේ අවංක විඥානවාදයෙනුත් කරුණකට කැපවීමෙනුත් ඕ මහා ආධ්‍යාත්මික දියුණුවක් ලැබුවා ය. එහෙත්

1. මෙහි එන අදහස පරිවර්තකට හොඳින් පැහැදිලි නැත. ශනි ඒරාෂ්ටකයක් ගැන කියැවෙන බව පෙනේ.

20 වැනි පරිච්ඡේදයේ එන ජ්‍යොතිශ්ශාස්ත්‍රය පිළිබඳ අධෝ ලිපිය ද බලන්න.

වාසි ලැබුණායින් පසු, විප්ලවයෙන් පසු ව, ඇයට බලගතු තැනක් ලැබුණු විට, ඕ ආඥාදායක වී තමා විසින් බලයෙන් පහ කරන ලද අයටත් වැඩියෙන් නරක ලෙස ඒ බලය පාවිච්චි කළා ය. කියැවීම මෙසේ ය: "ඒ නිසා මේ ආත්මයට මුළු වර්තමාන ජීවිතයේ දී ම අනුන්ගෙන් අණ ලැබීමට සිදු වී ඇත. එසේ ම තම අවශ්‍යතා බොහොමයක් යටපත් කර ගන්නට සිදු වී ඇත."

දැන් මේ ස්ත්‍රිය සිටින්නේ ඉතා දුෂ්කර පරිසරයෙක ය. කියැවීම් ලබා ගන්නා විට ඇගේ වයස අවුරුදු හතළිහෙකි. ඒ වන විට අවුරුදු දහයක් වැන්දඹුව සිටි ඇයට කුඩා දූරියක් සිටියා ය. තමාගේත් දූරියගේත් නඩත්තුව සඳහා ඈට මහත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු විය. ටික කලක් ඕ ආණ්ඩුවේ ඩබ්ලිව්. පී. ඒ. ව්‍යාපාරයෙක වැඩ කළා ය. ඒ හොඳ ම අවස්ථාවේ දී පවා ඇගේ තත්ත්වය අවදානම් විය. ඇගේ තනිකම නිසාත්, විනෝදයට අවස්ථාවක් නැතිකම නිසාත්, ප්‍රාර්ථනා බිඳී ගියාක් මෙන් ඈට දැනිණි. ඈ වැටී සිටි හිර ගෙයක් බඳු තත්ත්වය අහඹුවෙක ප්‍රතිඵලයෙක් නොවේ. එය ඈ විසින් බලය නො මනාව යෙදීමෙන් අන්‍යයන් කෙරෙහි බලයෙන් ඇති කරන ලද බන්ධනවල නිවැරදි ප්‍රතිබිම්බයෙකි. මතු පිටින් පෙනෙන්නේ ඈ නිර්දය ආර්ථික ක්‍රමයකට, නැති නම් දෛවයේ අසාධාරණ බෙදා දීමකට ගොදුරු වූ බව ය. එහෙත් කර්මයේ ශක්තිය අනුව බලන විට ඈ ගොදුරු කරන ලද්දේ තමා විසින් ම බව පෙනී යයි.

මෙබඳු නිදසුන්වලින්, අනෙක් මිනිසුන්ගේ දුෂ්කරතා විග්‍රහ කිරීමේ දීත්, පෙනෙන ඵලයෙන් විය හැකි හේතුවට කරන තර්කණයේ දීත්, ප්‍රයෝජනවත් වන අනුමාන සලකුණෙක් ලැබෙයි. අවුරුදු දෙදහසකට පෙර ග්‍රීසියේ සිටි අයිස්කිලුස් [1] "චරිතය ඉරණමය" යි කීවේ ය. ඔහු කියා ඇත්තේ එහි අනෙක්

1. Aeschylus

පැත්තත් සත්‍ය වූ කියමනෙකි. එසේ කියන්නේ ඉහත සලකා බලන ලද නිදසුන් පරීක්ෂා කරන විට අද ඉරණම ඊයේ චරිතය හෙළි කරන බව පෙනී යන නිසා ය.

පුනර්ජන්මය පිළිබඳව කල්පනාකාරීව පරීක්ෂා කරන්නාට ඇති වන වැදගත් ප්‍රශ්නයෙක් ඇත. දුප්පත්කම හා පහත් තත්ත්වය බලය නොමනාව යෙදීම නිසා ඇති වූ, අවශ්‍ය අධ්‍යාපනයක් දීම සඳහා එන, කර්ම විපාක නම්, සමාජ තත්ත්වය උසස් කිරීම සඳහා වෙහෙස ගන්නේ කුමකට ද යනු ය, ඒ ප්‍රශ්නය. නිදසුනක් වශයෙන් ඉහත සඳහන් සත්හාලියාට අපගේ ආර්ථික ක්‍රමයට වඩා අඩුවෙන් අකාරුණික වූ ආර්ථික ක්‍රමයෙක දී හොඳ සැලකිල්ලක් දැක්වුණා නම් කර්මයේ බලාපොරොත්තුව බිඳී යන්නේ නැති ද ?

මතු පරිච්ඡේදයෙක දී මේ ප්‍රශ්නය ගැන වඩා පූර්ණ ව විමසා බලනු ලැබේ. එහෙත් මේ අවස්ථාවේ දී, පුනර්ජන්මවාදය පිළිගැනීම, මනුෂ්‍ය සමාජය පිළිබඳ නිරුත්සුක ආකල්පයට සම නොවන බව තදින් කියා සිටිය යුතු ය. භයානක අගහිඟයේ පාඩම ඉගෙන ගත යුතු ආත්මයෝ [1], තමන් විසින් විඳිය යුතු දිළිඳුකමට ඉඩ දෙන සමාජ අසාධාරණයෙක් ඇති කාලයෙක හා ස්ථානයෙක උපදිති. එසේ වුවත් අනෙක් අයගේ තත්ත්වය හොඳ කිරීමට වැඩ නොකරන අය, ඒ එක්කම චාරිත්‍රයෙන් [2] පාපයක් සිදු කර ගනිති. දැන දැන අන්‍යයන්ගෙන් සූරා ගෙන ජීවත් වන්නෝ වාරිත්‍රයෙන් පාපයක් [3] සිදු කර ගනිති. තම සහෝදරයාට කළ පව්කම් දෙක ම කිසියම් දිනෙක විපාක දිය යුතු ය.

නිවැරදිව තේරුම් ගන්නා ලද පුනර්ජන්මවාදය කෲර පාලකයනට හෝ තම සහෝදර මනුෂ්‍යයන් රවටන්නවුනට

1. කාල විපත්ති හා දේශ විපත්ති.

2. චාරිත්‍ර පාපය නම් කළ යුතු දෙය නොකර සිටීමෙන් සිදුවන පාපයයි.

3. වාරිත්‍ර පාපය නම් නො කළ යුතු දෙය කිරීමෙන් සිදුවන පාපයයි.

හෝ ක්ෂේම භූමියක් සපයා දෙන්නේ නැත. පුනර්ජන්මවාදය, පුද්ගල ආත්මය පිළිබඳ වත් ආත්මය විසින් පාරිශුද්ධිය ලබා ගන්නා නියම ධර්ම හා ක්‍රම පිළිබඳ වත් කරුණු දක්වන්නක් නිසා එය පළමු කොට ම මනෝවිද්‍යාත්මක වූවෙකි. එහෙත් එය පැතිරී ගොස් සාමාජික ද වේ. එසේ වන්නේ පුද්ගල පරිණාමය ක්‍රමානුකූල කරන්නා වූ කර්ම නියාමය දිය කර හරින එක ම ධර්මයත් ඒ නියාමෙහි අන්තිම අර්ථයත් මෛත්‍රිය ම වන නිසා ය. මෛත්‍රිය සත්ත්වයන් අරමුණු කොට ඇති නිසා සාමාජික වූවෙකි.

මිනිසුන්ගේ සංවිධානවලින් විශ්ව නියාමය යටපත් වී නොයන බව පුනර්ජන්මවාදයෙන් ස්ථිරව කියැවෙයි. විපාකදායක මූල ධර්මය, ජලය මෙන් හැම විට ම තම නියම මට්ටම සොයා ගනී. ඒ ඒ කැලයට අයත් සමාජ ගොඩනැගිල්ල වෙනස් විය හැකි ය. එහෙත් එය තම පරිසරය ලෙස තෝරා ගත් ආත්මවලට, තම අභ්‍යන්තර දෝෂය සකස් කර ගැනීමට අවශ්‍ය වූ උපාය ඒ ගොඩනැගිල්ල තුළ ස්ථිරව පවතින බව පෙනේ.

# 12

# මානසික විකෘතීන්ගේ අතීත ජන්ම සම්භවය

ෆ්‍රොයිඩ්ගේ නමත් "යටි සිත" යන වචනයත් අද ඉතා ප්‍රසිද්ධ ය. එහෙත් බොහෝ දෙනා ෆ්‍රොයිඩ් යටි සිත සොයා ගත්තේ සම්මෝහ නිද්‍රාව [1] පිළිබඳ කළ පරීක්ෂණවලින් බව දන්නේ නැත. සම්මෝහ නිද්‍රාවට පත් කරනු ලැබූ ආතුරයනට ඔවුන්ගේ සසංඥ තත්ත්වයේ දී සම්පූර්ණයෙන් ම අමතකව තිබූ බාල කාලයේ පටන් වූ, සිද්ධි සිහිපත් කළ හැකි වී තිබේ. ෆ්‍රොයිඩ්ට යටි සිතක් පිළිගන්නට සිදු වූයේ වෙනත් ක්‍රමයෙකින් ලබා ගත නොහැකි මේ තොරතුරු ඉතිරි වී තිබීම විවරණය කරනු සඳහා ය. බොහෝ රෝගීන් පිළිබඳව සම්මෝහ නිද්‍රාව අනාප්ති කර බව ඔප්පු වී ගිය නිසා, පසු කාලයෙක දී, පිළියම් කිරීමේ උපායක් වශයෙන් සම්මෝහ නිද්‍රාව ප්‍රයෝජනයට නො ගෙන අත්හළ ෆ්‍රොයිඩ් යටි සිතේ පතුල සෙවීමට වෙනත් ක්‍රම දියුණු කෙළේ ය. එහෙත් සම්මෝහ නිද්‍රාව, මනෝවිග්‍රහයේ මව වශයෙන් සැලැකිය යුතු ය.

1. සම්මෝහ නිද්‍රාව නම් තමාගේ ම හෝ අනිකකුගේ හෝ යෝජනාවෙකින් ඇති වන කෘත්‍රිම නින්දෙකි. මෙය ස්වාපනය, වශීකරණය ආදී නම්වලින් ද හැඳින්වෙයි. මෙය එක්තරා විදියෙක සමවතෙකි.

පුනර්ජන්මවාදී මනෝවිද්‍යාවෙහි දී ද සම්මෝහ නිද්‍රාවට එබඳු ම කෘත්‍යයක් තිබිය හැකි ය. සම්මෝහ නිද්‍රාවට පත් වූ පුද්ගලයාට අන්‍ය පුද්ගලයන්ගේ අතීත ජීවිත ඉතිහාස, සොයා ගත හැකි බව කේසිගේ දිවැසින් දක්වන බව පෙනේ. සමහර විට මීටත් වඩා වැදගත් විය හැකි බව පෙනෙන්නේ, සම්මෝහ නිද්‍රාවෙන් හෝ චින්තන ධ්‍යානය වැනි උපායෙකින් හෝ තමාගේම අතීත ජීවිතවල නැවත ජීවත් විය හැකි බවයි. සම්මෝහ නිද්‍රාවේ දී වයසින් ආපසු යෑම [1] පිළිබඳ පරීක්ෂණවලින්, උපතේ පටන් ජීවිතයේ පසු වූ හැම සිද්ධියක් පිළිබඳව ම, විස්තරාත්මක වූ ද, අනුක්‍රමික වූ ද, මතකයක් සිතේ කිසියම් තට්ටුවෙක තැන්පත්ව ඇති බව, ඔප්පු වී තිබේ. නිදසුනක් ගනිමු. වයස අවුරුදු දහයකට ආපසු ගිය සම්මෝහ නිද්‍රෝපගත පුද්ගලයකුට ඔහුගේ නම ලියන්නට කී විට, ලියන්නේ ඔහු වයස දහයේ දී ලියූ ආකාරයට ය. වයස හයට තවත් ආපසු ගිය විට ලියන්නේ, තවත් ළාබාල අකුරුවලිනි. වයස තුනට ආපසු ගිය හොත්, තම පැන්සලෙන් තේරුමක් නැති ඉරි අඳිනවාට වැඩි දෙයක් කරන්නට හේ අසමර්ථ වෙයි. මේ වයසින් ආපසු යෑමේ පරීක්ෂණ, විශ්වවිද්‍යාලය පන්තිවල දී සුලබව කරනු ලැබේ. මේවා මේ විෂය හදාරන අයට හුරු පුරුදු දේවල් ය.

ඩී. රෝශා [2] නම් ප්‍රංශ විද්‍යාඥයාගේ කාර්යය ප්‍රසිද්ධියෙන් අඩු ය. හේ දහනව වැනි සියවසේ අපරභාගයේ දී, එම ආපසු යෑමේ උපායෙන් ම අතීත ජන්ම අද්දැකීම් පිළිබඳ සිහිවීම් පුබුදු කර ගැනීමට තමා සමත් බව කියා සිටියේ ය. 'Les Vies Successives' (අනුක්‍රමික ජීවිත) නම් ඔහුගේ පොතට විද්‍යානුකූල පිළිගැනීමෙක් ලැබී නැත. සමහර විට කිසියම් දිනෙක ඔහු පුනර්ජන්ම මනෝවිද්‍යා ක්ෂේත්‍රයෙහි පුරෝගාමියකු ලෙස ප්‍රසිද්ධියේ පිළිගැනෙනවා ඇත. වඩාත් මෑතෙක දී පෙන්සිල්වේනියාවේ ශේරන්හි ජේ. ආර්. මාටින් එබඳුම හැදෑරීම්

1. Age-Regression 2. De Rochas

කොට 'Researches in Reincarnation and Beyond' (පුනර්ජන්මය හා ඔබ්බ පිළිබඳ පරීක්ෂණ) නම් සම්භාවනීය ග්‍රන්ථයක් ප්‍රසිද්ධ කොට තිබේ. මේ ක්‍රමයට උපක්‍රමවලින් පෙර ආත්ම භාවයන් සිහි කිරීම, දැනට ස්වභාව ධර්මයේ අභිප්‍රායට විරුද්ධ බව පෙනේ. එසේ නැති නම් අප සියලු දෙනාට ම අපේ අතීත, නිකම් ම සිහිපත් විය යුතු ය. කෙසේ හෝ විද්‍යාවේ ප්‍රයෝජනය තකා කරන ලද මෙබඳු ප්‍රයත්න, සිත් අලවනසුලු ද අගනේ ද වේ. මේවා වැඩිකල් යන්නට පෙර, පුනර්ජන්මයේ සත්‍යතාව ඔප්පු කිරීමට අවසාන පරීක්ෂණාගාරික සාක්ෂ්‍ය සපයනු ඇත.

කේසිගේ සම්මෝහ නිද්‍රා දිවැසින් පරීක්ෂා කරන ලද, මානසික විකෘති පිළිබඳ නිදසුන් දෙස බලන විට, ඒවායින් ස්මරණයේ හා යටි සිතේ ස්වභාවය හෙළිවන බවත්, වර්තමාන මනෝවිග්‍රහයෙන් පිළිගෙන ඇතිවාට වැඩියෙන් යටි සිත ගැඹුරු බවත්, දක්නට ලැබෙයි. මේ සිද්ධි හැම එකක් ම ඔප්පු කරන සාක්කි නැත. ඒ කියන්නේ, කේසි අතීතය පිළිබඳව කී දෙය ඍජුව හෝ වක්‍රව සත්‍ය යයි ඔප්පු කරන සාක්කි හැම විට ම ඒ සිද්ධිවලින් නොසැපයෙන බවයි. එහෙත් ඇතැම් සිද්ධි පිළිබඳව, අඩු ගණනේ එක්තරා ප්‍රමාණයෙක සාක්කි ඇත. සාක්කි නැති සිද්ධි ද, එක් පැටලිලි සහිත සම්පූර්ණ චිත්‍රයෙක තවත් කැබලි ලෙස පළුණක් සැලකිය හැකි ය. මේ සමස්තයේ යුක්ති සහගත භාවය පිළිගත් කල්හි, විස්තරයන්ගේ ඇදහිය යුතු බව ඉබේට ම ඇති වෙයි.

මානසික ජීවිතයේ ඇති විකෘතීන් අතර එක් කුතුහල් දනවනසුලු නිදසුනෙක් නම් භීතිකා රෝගයයි. භීතිකාවක් යන්නෙන් මනෝ විග්‍රාහකයන් විසින් සාමාන්‍යයෙන් අදහස් කෙරෙන්නේ, වෛරයකට හෝ යටපත් කරන ලද ආක්‍රමණයකට හෝ, තද අපරාධ සංඥාවකට හෝ හේතු විය හැකි සංකීර්ණ වූ අවස්ථාවෙක දී හටගත් පමණ ඉක්ම වූ භයෙකි. මේ යටගිය

හැඟීම, පසුව අධික වූ ද පෙනෙන තරමින් අයුක්ති සහගත වූ ද, භයක් ලෙස එළියට එයි. මෙහි දී පැවැතිය හැකි භය ජනක අරමුණු අතිශයින් විවිධ ය. වැසුණු තැන්, උස් තැන්, බළල්ලු, හෙණ හෝ වෙනත් නොයෙක් දේ බියේ අරමුණු විය හැකි ය. තෝරා ගනු ලබන අරමුණෙහි, මූලික තියුණු අද්දැකීමට ඍජු හෝ වක්‍ර සම්බන්ධයෙක් ඇත. කෙසේ හෝ අඩු ගණනේ ඇතැම් සිද්ධිවල දී මේ තද අහේතුක බියේ උපත ඒ හා ඍජුව සම්බන්ධ වූ කිසියම් අතීත ජීවිත අද්දැකීමෙක තිබිය හැකි බව කේසි කියැවීම්වලින් පෙන්වනු ලැබේ.

ළදරු කාලයේ දී පවා, වැසුණු තැන්වලට බිය වූ ස්ත්‍රියකගේ සිද්ධිය සිත් ගන්නා නිදසුනෙකි. නෘත්‍ය ශාලාවල දී ඕ දොරටුව ළඟ අසුනෙක හිඳ ගන්නට ඕනෑ යයි බල කර සිටියා ය. ඇ ගිය බසය තදින් පිරී ගිය හොත් ඕ එයින් බැස අනෙකක් එන තුරු බලා සිටියා ය. පිටිසර පළාත්වලට ගිය අවස්ථාවල දී ගල් ගෙවලට, ගුහාවලට හෝ කුඩා වැසුණු ස්ථානවලට ඇතුළු වීමට ඕ බිය වූවා ය. ඇට හෝ ඇගේ පවුලේ අනෙකකුට හෝ, මේ විශේෂ ස්වභාවය තේරුම් ගත නො හැකි විය. ඒ කාටවත්, එබඳු බියක් ඇති කළ හැකි, ළමා වියට අයත් අස්වාභාවික අද්දැකීමක් සිහිපත් කළ නො හැකි වූ හෙයිනි. කේසි කියැවීමට අනුව විවරණය මෙයයි. ඇගේ අතීත ජීවිතයේ දී ගුහාවෙක වහලක් ඇ මත කඩා වැටී ඕ හුස්ම හිර වී මළා ය. මේ භයානක මරණය පිළිබඳ මතක ඇගේ යටි සිතේ තවමත් පවතී.

තවත් ස්ත්‍රියකට භීතිකා දෙකක් තිබුණේ ය. ඕ ආයුධවලටත් ලොම් සහිත සතුනටත් බිය වූවා ය. විශේෂයෙන්ම ලොම් සහිත ගෘහවාසී හුරතල් සතුනට බිය වූවා ය. තමා සමීපයෙහි කැපෙන ආයුධ දුටු විටත් ඕ බියෙන් නො සන්සුන් වූවා ය. මීට හේතුව වශයෙන් ජීවිත කියැවීමෙන් කියන ලද්දේ

පර්සියානු ජන්මයෙක දී ඈ කඩුවෙකින් කැපුම් ලැබ මිය ගිය බව ය.

පවුලේ හැම දෙනාට ම හුරතල් සතුන් සිටි විශාල පවුලෙක ඉපදී සිටි නිසා සතුනට ඇති ඇගේ බිය, වර්තමාන ජීවිතය පදනම් කර ගෙන තේරුම් ගත නො හැකි ය. විශේෂයෙන් ම ඇගේ සහෝදරයා සතුනට ප්‍රිය කෙළේ ය. එහෙත් අනෙකකු සර්පයකු දුටු විට බිය වන තරමට, ඕ බළලකු හෝ බල්ලකු ගෙදර දී දුටු විට බිය වූවා ය. තව ද ඈට කිසි දිනෙක වත් ලොම් කබායක් හෝ ලොම් වාටි දැමූ කබායක් හෝ අඳින්නට නො හැකි විය. සමහර විට මානසික වෛද්‍ය විද්‍යාඥයන් ඇගේ බිය, පවුලේ සාමාජිකයනට ඇගේ තුබූ සම්බන්ධතා මාර්ගයෙන් සොයනවා ඇත. නිදසුනක් වශයෙන් සතුනට විශේෂයෙන් ප්‍රිය කළ සහෝදරයා පිළිබඳ ඊර්ෂ්‍යාව සොයා ගෙන ඒ බිය වෛරයේ ප්‍රකාශනයෙකැයි විවරණය කරනු ඇත. කෙසේ හෝ කියැවීම්, ඇගේ මේ පුදුම බිය අත්ලාන්තියානු ජන්මයකට සම්බන්ධ කළේ ය. එහි දී ඈ පිළිකුල් කටයුතු සතුන් සම්බන්ධ කිසියම් අද්දැකීමක් ලබා ඇත.

කියැවීමෙන් තවත් බොහෝ භීතිකා, මේ අයුරින් අතීත ජන්මයක් පදනම් කර ගෙන තෝරා දී තිබේ. අඳුරට තුබූ භීතිකාවක්, ඒ ආත්මය xiv ලුවී රජුගේ කාලයේ ප්‍රංශයේ අඳුරු හිර ගෙයෙක දේශපාලන සිරකරුවකු වශයෙන් ලැබූ අද්දැකීමකට සම්බන්ධ කර ඇත. මුවහත් ආයුධවලට තිබූ බියෙක හේතුව ලෙස ප්‍රංශයේ වධකාගාරයෙක දී ලැබූ අද්දැකීමක් දක්වා තිබේ. මේ ආත්මය එහි දී විවිධ වධකායුධවලින් කැපුම් ලබා ඇත. එක් පුද්ගලයකුට ලෝකය විනාශ වෙතැයි තද බියෙක් පැවැත්තේය. මේ බිය අත්ලන්තිසය දියේ ගිලුණු එක් අවස්ථාවෙක දී ඒ පුද්ගලයා ලැබූ පෙරුවියානු අද්දැකීමකට සම්බන්ධ ය. විවේකී ව පාඩම් කිරීමට කඳු ගැටයකට නැග

ධූවිය දී ගිලීම සිදු විය. තමා අවට හැම පැත්තෙන් ම ජලය නැඟ ගෙන එනු හේ දුටුවේ ය. වල් සතුන්ට තුබූ තද බියෙක හේතුව වශයෙන් රෝමයේ දී ලැබූ අද්දැකීමක් දක්වා තිබේ. මෙහි දී මේ ස්ත්‍රියගේ ස්වාමිපුරුෂයා රංග භූමියෙහි වල් සතුන් සමග සටනට දමා තිබේ. ජලයට බිය වූ තෙවැන්නකුට රෝමන් අධිරාජ්‍යය පැතුරුණු කාලයේ දී කුණාටුවෙක දී නැව් බිඳීමකට අසු වූ බව කියා ඇත.

මේ සිද්ධි සාමාන්‍ය මනෝවිද්‍යාවේ දෘෂ්ටියෙන් විවේචනාත්මකව පිරික්සන විට ඒ හැම එකෙක දී ම භීතිකාව ප්‍රමාණවත්ව විවරණය කළ හැකි වර්තමාන ජීවිත තත්ත්වයක් නොතිබුණා දැයි අපට විමතියෙක් ඇති වේ. යටපත් කරන ලද කිසියම් භාවික [1] කැළැඹීමක් තිබිය හැකි බව පිළිගත්තත් භීතිකාවේ සත්‍ය පදනම වූ පූර්වතර ස්මරණයක් තිබිය නො හැකි යයි එයින් කියැවෙන්නේ නැත. නිදසුනක් වශයෙන් වැසුණු තැන්වලට බිය වූ ස්ත්‍රිය වයස අවුරුදු හතරේ දී අඳුරු කාමරයෙක වසා දමනු ලැබ ඒ සිද්ධිය අමතකව තිබෙන්නට පුළුවන. අසංයුක්ත සංසටනයේ දී [2] හෝ සම්මෝහ නිද්‍රාවේ දී හෝ සිද්ධිය මතු වන්නට ඉඩ තිබේ. මානසික වෛද්‍ය විද්‍යාඥයා ඒ තොරතුරු පදනම් කර ගෙන විසඳා ගෙන ගොස් ස්නායු අක්‍රමිකතාව ඇති කළ හැකි භාවික ප්‍රශ්න පිළිබඳ අවබෝධයක් ලබනවා ඇත.

මේ අවස්ථාවල දී එක්තරා වැදගත් කරුණක් අමතක කරනු ලැබේ. එනම් බොහෝ දෙනකුට වෙනත් සමහරුන් තුළ භීතිකා ඇති කිරීමට සමත් වන අද්දැකීම් ලැබී තිබිය දීත් එබඳු භීතිකා ඇති නොවීමයි. මිනිස් හැඟීම් සම්බන්ධයෙන් අපට ගණිත ශාස්ත්‍රයේ දී මෙන් නිවැරැදි සමීකරණ බලාපොරොත්තු විය නොහැකි නමුදු ඇතැමුනට පමණක් එබඳු භීතිකා ඇති

1. භය ක්‍රෝධාදි හැඟීම් පිළිබඳ වූ
2. Free Association (- නිදහසේ අදහස් ගලා එන්නට ඉඩ දීම.)

වන්නේ ඇයි දැයි ඇසිය යුතුය. මේ විශේෂ පුද්ගලයා පමණක් ඊට යටත් වන්නේ ඇයි ? ආවරණ භීතිකාවේ හේතුව වශයෙන් නිතර දැක්වෙන භාවික වූ අද්දැකීම් ඇති වූ සියලු දෙනාට ම ඒ භීතිකා ඇතිවනවා නම් ඒ අය කොතරම් බහුල වනවා ද යතහොත් දුරකථන කාමරත් නිදන කාමරත්, කාමර එකක් ඇති නිවාසත්, සිත්කලු සමාජ ශාලා සමහරකුත් මහජන සෞඛ්‍යයට හා හොඳ සිහියට ඇති අන්තරාය යයි සලකා වසා දමන්නට සිදු වේ.

මේ ප්‍රශ්නයට කේසි කියැවීම්වලින් දක්වා ඇති උත්තරය මෙයයි. භාවික අවස්ථාවෙක දී එක් ළදරුවෙක් අනෙකකුට වඩා නොසන්සුන්කමට පත් වේ නම්, එසේ වන්නේ අතීත අද්දැකීමක් නිසා විය යුතු ය. වර්තමාන ජීවිත තත්ත්වය ක්‍රියා කරන්නේ වැළැලී තුබූ දුක් වේදනාවන් මතු කිරීමේ අවස්ථාවක් වශයෙන් පමණි.

මෙසේ පුනර්ජන්මවාදයට අනුව යටි සිත බොරු පතුලක් ඇති පෙට්ටියක් මෙන් සාමාන්‍යයෙන් පෙනෙනවාට ගැඹුරුය. ඇතැම් මනෝවිග්‍රහකයනට - විශේෂයෙන් ම කාල් යුංට වෙනත් ක්‍රමයෙකින් තෝරා දිය නො හැකි මානසික ජීවිතයේ සිද්ධි තෝරා දීම සඳහා සිතේ වඩා ගැඹුරු වූ මට්ටම් ඇතැයි පිළිගත යුතු බව හැඟී ගොස් ඇත. මෙසේ ඔවුන්, සියලු මිනිසුන්ට ප්‍රයෝජනයට ගත හැකි ජාතියේ අද්දැකීම්වල ස්මෘති සාගරයක් ඇත්තේ ය යන පිළිගැනීම පිට සාමූහික යටි සිත[1] ජාතික යටි සිත[2] නැත හොත් ජාතික ස්මෘතිය[3] ගැන කියා ඇත. එබඳු විශාල ස්මරණයෙක් නැත්තේ යයි ස්ථිරව කිව නොහැකි නමුදු මේ මතය පෞද්ගලික වූ ස්මරණය, අතීත ජීවිතය දිගේ යටි සිතේ ඇත ආපස්සට දිවෙතැයි යන මතය තරම් පිළිගැනීම

1. Collective Unconscious මෙය ආලය විඥානය වැන්නෙකි.
2. Race Unconscious
3. Racial Memory

පහසු නැත. ධාන්‍යාගාරයෙක ධාන්‍ය තැන්පත්ව ඇත්තා සේ ස්මරණය තැන්පත්ව ඇතැයි ද ජාතියේ සියල්ලන් විසින් එය ඇද ගෙන ප්‍රයෝජනයට ගනිතැයි ද යන මතය සම්භාව්‍ය වේ නම් ස්මරණය පෞද්ගලිකය යන මතය ද ඒ තරමට වත් සම්භාව්‍ය ය. එබඳු තැන්පත් වූ අද්දැකීම් භාණ්ඩාගාරයක් ඇත්නම් එය වචනයේ නියම අර්ථයෙන් ස්මරණයක් වන බව නො පෙනේ. ඊට දැනීම් මාර්ගයෙක් යයි කීම වඩා ගැළපෙයි.

කේසි කියැවීම්වලින් ඉදිරිපත් වන මතයට අනුව පුද්ගලයකුට ඇත අතීතයෙන් මතු වන අසංඥ ස්මරණය ඇත. එහෙත් ඒවා මතු වන්නේ ජාතික ස්මරණයේ කිසියම් කල්පිත විලෙකින් හෝ කලකට පෙර මළ මුතුන්මිත්තකුගෙන් හෝ නොව ඔහුගේ ම අතීත අද්දැකීමෙනි. ඔහුගේ සියලු අසංඥ භයත් ද්වේෂත් ආශා හා ආවේගත් ඔහු විසින් ඔහුට ම පවරා දෙන ලද දායාදයි. මිනිසකු විසින් ඔහුගේ අද, හෙටට පවරා දෙන්නා සේ ඒවා පවරා දෙනු ලැබේ. ඔහු අතීත ජන්ම කීපයෙක දී වනචාරියකුව සිටීම නිසා ඔහු තුළ අත් නොහැරුණු වනචාරී ආවේග කීපයක් තිබීම ස්වාභාවික ය. වරක් ඔහු වනයේ භයවලින් හා මිනිසුන්ගේ කෲරකම්වලින් තර්ජනය ලැබුවේ ය. මේ නිසා තවමත් ඔහුට පදනම් රහිත ආගන්තුක වූ බිය තිබීම ස්වාභාවිකය. දැනට ඔහු ආශ්‍රය කරන පුද්ගලයන්ගෙන් බොහෝ දෙනකුට අතීත ජීවිතයේ මෛත්‍රී කිරීමට හෝ ද්වේෂ කිරීමට හොඳ හේතු යුක්ති තිබිණි. වර්තමානයෙහි ඒ පුද්ගලයන් කෙරෙහි ම අහේතුක ලෙස පෙනෙන මෛත්‍රිය හෝ ද්වේෂය ඇති වීම ස්වාභාවික ය.

භීතිකා ලෙසින් හැර වෙනත් ක්‍රමවලින් ද යටි සිතේ කුඹු ළේවල් අස්වාභාවික ලෙසින් මතු වන බව පැහැදිලි ය. සිද්ධි කීපයෙක දී ම නැවත නැවත පෙනෙන සිහින කේසි විසින් අතීත ජන්ම අද්දැකීම් පදනම් කොට ගෙන තෝරා දී ඇත. පහත දැක්වෙන ප්‍රශ්නය ඇසූ ස්ත්‍රිය මේ පිළිබඳ සිත් ගන්නා

නිදසුන්වලින් එකෙකි. "මා ඉතා කුඩා කාලයේ දී බොහෝ වාර ගණනක විනාශකාරී කළු වලාකුළකුත් ඇතිව ලෝකය විනාශ වන්නට යනවා හීනෙන් දැක්කේ කවර හෙයින් ද ?" මේ හීනය අත්ලන්තියානු අද්දැකීමෙකින් ඇති වූ බව උත්තරයෙන් දැක්විණි. එකල ඕ පූජකවරියක් ද වෛද්‍යවරියක් ද වූවා ය. ඈ අත්ලන්තිසයේ එක් භයානක විනාශයක් දැක තිබිණි. මේ සංස්කාරය (වාසනාව) නැවත නැවත සීනෙන් මතු වන තරමට ඇගේ ස්මරණයෙහි තදින් කා වැදී තිබුණේ ය.

සතර හැවිරිදි දැරියක පිළිබඳ තවත් හොඳ නිදසුනෙක් ඇත. දිනපතා ම වාගේ කඳුළු හලා ගෙන මහත් දුකෙකින් මෙන් පිබිදී ඕ තම මව බියට පත් කළා ය. ශාරීරික වශයෙන් ඕ හොඳ සනීපයෙකින් සිටියා ය. මේ නොසතුටුන් තත්ත්වය තෝරා දෙන ලෙස මව කේසිට ලීවා ය. කියැවීමට අනුව මේ දැරිය දෙවන ලෝක යුද්ධ කාලයෙහි ප්‍රංශයේ දී භයානක මරණයකට මුහුණ දුන්නා ය. පුනර්ජන්ම ග්‍රහණයට උත්සුක වූ නමුත් ඈ තම ඇමෙරිකානු මා පියන් වෙත ආවේ නව මාසයකට පසුව ය. ජීවිත අතර වූ එතරම් කෙටි කාලයෙක දී බෝම්බ දැමීම හා ගිනි ගැනීම් පිළිබඳ භයානක ස්මරණ නැති වී ගියේ නැත. ඒ භය දැරියගේ විඥානයෙහි නිදි මට්ටමේ දී මතු විය.

මේ දැන් කියන ලද සිදුවීම වැනි සිදුවීම් නිසා ස්මරණයේ මුළු ප්‍රශ්නය ම පරීක්ෂණයට පාත්‍ර කළ යුතු බව අනිවාර්යයෙන්ම පැහැදිලි වෙයි. පුනර්ජන්මවාදයට විරුද්ධව බොහෝ දෙනකුන් විසින් ඉදිරිපත් කරනු ලබන පළමු වැනි විරෝධය නම් අපට අපේ අතීත සිහිපත් කළ නොහැකි වීමයි. සත්තෙකින් ම මෙය කුහුල් දනවන තත්ත්වයෙකි. අපට කුඩා කාලයෙන් සිහිපත් කළ හැක්කේ අල්පයකි. ඉතා කුඩා කාලයේ කිසිවක් සිහි කළ නොහැකි ය. මේ ගැන සිතන විට එය එතරම් පුදුමයෙක් නොවේ. සසංඥ ස්මරණය ඉතා තුනී දෙයෙකි. ගංගා ප්‍රවාහයක් සේ

සිදුවීම් අපෙන් ගලා යයි. "මට යමක් මතක නැහැ" යි කීම එය සිදු වූයේ නැතැයි ඔප්පු කිරීමෙක් නොවේ. අප අපේ මිත්‍රයකුගෙන්, හරියට ම 1939 යේ අප්‍රියෙල් 5 වැනි දා උදේ 10.26 ට ඔබ කරමින් සිටියේ කුමක් දැයි ඇසුවොත් ඔහුට හරියටම අවංකව උත්තර දිය නොහැකි බවට අප සතු මුළු වස්තුව ම ඔට්ටුවට තැබිය හැකිය. ඔහුගේ ජීවිතයේ මේ විශේෂ වේලාව මතක් කරන්නට බැරි වීම නිසා ඔහු ඒ මොහොතේ ජීවත් නො වූ බව කිසි සේත් ඔප්පු නොවේ.

ඒ නිසා පුනර්ජන්මවාදයට ඇති මේ විරෝධයට පහසුවෙන් උත්තර දිය හැකි ය. පළමුවැනිව අමතක වීම් හා මතක යටපත් වීම ඉතා ස්වාභාවික සාමාන්‍ය මනුෂ්‍ය ධර්මතාවක් නිසාත් දෙවැනි ව සාරය ඉතිරි වී විස්තර නැති වී යෑම මතකයේ ස්වභාවයක් නිසාත් ඒ විරෝධයට උත්තර දිය හැකි ය. නිදසුනක් ගනිමු. ඕනෑ ම වැඩිහිටියකු 7 × 7 = 49 බවත් 12 × 12 = 144 බවත් ඔබට කියනු ඇත. ඔහුට තුන් වන හෝ හතර වන පන්තියේ දී මේ ගණන් සාදමින් ගෙවූ හැම දුක්බර පැයක් ම මතක් කළ නො හැකි ය. එහෙත් අවධානය යෙදීමට නැවත නැවත කරන ලද උත්සාහවල ප්‍රයෝජනවත් ඉතිරිය ලෙස ගණන් සෑදීමේ හැකියාවත් ඒ ඥානයත් ඔහුගේ මනසේ නතර වී ඇත.

ගින්නට හා බල්ලනට ඇති බය, නැටීමට ඇති හැකියාව, නැති නම් ඕනෑ ම දෙයක් කිරීමට ඇති දක්ෂකම යන මේ හැම දෙයක් ම එබඳු ය. ඇවිදීමේ ශක්තිය ලබා ගැනීම සඳහා කරන ලද මහා උත්සාහ ලක්ෂයෙකින් එකකුට වත් හරියට සිහිපත් කළ නො හැකි නමුත් ඇවිදීමට පුළුවන්කමින් එබඳු කාලයක් තුබූ බව පැහැදිලිව ම ඔප්පු වෙයි.

මේ නිසා විස්තර අමතක වීමෙන්, හරය මතක තිබීම අවලංගු නොවන බව පෙනේ. මතක අඩුකමේ විරෝධය නංවන අයට පුනර්ජන්මවාදීන් විසින් දෙනු ලබන උත්තරය නම්

මිනිසාගේ හෘදය සාක්ෂ්‍යයත් (සදාචාර ප්‍රතිවේධයේ මට්ටම) ඔහුගේ බුද්ධියේ හා හැකියාවේ මට්ටමත් ඔහුගේ අතීත ජීවිත අත්දැකීම්වල මුළු සාරය ම වන බව ය. ඒවායේ විස්තර මඟ හැරී තිබෙන්නට පුළුවන.

පුනර්ජන්මවාදයට විරුද්ධ වන්නන් විසින් නංවා ඇති වඩා සියුම් වූ දෙවන විරෝධය නම් එක් පුද්ගලයකු කරන ලද කර්ම වලට වෙනත් පුද්ගලයකු වගකිව යුතු යයි සැලකීම ආචාර ධර්මයට අනුකූල නොවේ ය යනු ය. වරදකරුවකුට ලැබෙන දඬුවමෙහි නියම අර්ථයක් තිබීමට නම් ඔහු තුළ තම අපරාධය ගැන මතකයක් තිබිය යුතු යයි ඔව්හු කියති. මේ විරෝධයට පුනර්ජන්මවාදීන් විසින් දෙනු ලබන පිළිතුර ඔවුන් විසින් පිළිගනු ලබන නිත්‍ය ඒකත්වයට පුද්ගලයාගේ ඇති සම්බන්ධතාව මත රැඳී ඇත.

නිත්‍ය ඒකත්වය වේදිකාවෙන් පිටත සිටින නළුවකු මෙන් තම මුළු අතීතය ම සිහි කිරීමට සමත් ය. එහෙත් ඒ ඒකත්වය රඟපාන නළුවකු සේ පුද්ගලයකු බවට පත් වූ කල්හි ස්වභාව ධර්මයේ ආරක්ෂක උපායෙකින් කලින් උගත් දෙයෙහි සාරය හැර අන් දේවල් මතක් කිරීමෙන් වළක්වනු ලබයි. එක් අර්ථයෙකින් එය තමා රඟ දක්වා ඇති නාට්‍යයෙක ඕනෑ ම දර්ශනයක් ගෙදර දී සිහිපත් කළ හැකි ශේක්ෂ්පියරිය නළුවකුට සමාන ය. එහෙත් ඒ නළුවා හැම්ලට් වශයෙන් රඟ දක්වන විට ශෛලොක්ගේ කොටස ඔහුගේ සිහින් සම්පූර්ණයෙන් අමතක වෙයි.

මෙසේ උත්තර ආත්මයෙහි හෙවත් නිත්‍ය ඒකත්වයෙහි, පුද්ගලයකු වශයෙන් ක්‍රියා කිරීමේ දී එයට සිදු වී ඇති හැම දෙයක ම ස්මරණ රැඳී ඇත. එහෙත් ඒවා (අනන්තර මරණයෙන් පසු අවස්ථාවල දී පමා) කුඩා ආත්මය සතුව නොපවතී. සාමාන්‍ය මාර්ගයෙන් ඉවත්ව ඒකත්ව ප්‍රවාහයේ ස්මරණයෙන් ඇද ගත

හොත් කුඩා ආත්මයට ඒ ස්මරණ භාවිත කළ හැකි ය. මෙය කරනු ලබන්නේ 'අසංඥයේ' මාර්ගයෙන් ද නැතහොත් 'අධි සංඥයේ' මාර්ගයෙන්ද යනු එතරම් වැදගත් නොවේ. එහෙත් අනාගත පර්යේෂණ මඟින් මේ නම් දෙකින් නියෝජනය කරනු ලබන මනසේ ක්ෂේත්‍ර වඩා පැහැදිලිව දක්වීමට හැකි වනවා ඇත. කරුණ නම් එබඳු ස්මරණ සාගරයක් පැවැතීම හා යොදන ලද්දා වූ ද අහඹු වූ ද විවිධ ක්‍රම වලින් එයින් තොරතුරු ඇද ගත හැකි වීමත් ය. එහි නම කිමෙක්ද එය ඇත්තේ කොහේ ද යනු අවශ්‍ය නොවේ. පුනර්ජන්මවාදීහු අඩු තරමින් මෙපමණක් කියති.

පුද්ගලයකු විසින් තව දුරටත් ඔහුට ස්මරණය කළ නො හැකි, ඔහුගේ අතීතයෙහි කරන ලද දෙයකට විපාක විඳීමට සිදුවීම ආචාර ධර්ම වශයෙන් අයහපත් ය යන මතය අහේතුකය. අවසාන විග්‍රහයේ දී එය ළදරු කාලයේ දී ඇති වූ අසංඥ ගැටීම්වලට වැඩිහිටියකුට විපාක විඳීමට සිදුවීම ආචාර ධර්ම විරෝධීය යන මතයට වඩා රැකිය හැකි මතයක් නො වන බව පෙනේ. වෙනස් වෙමින් ගලා යන ක්‍රියාමාර්ග[1] ඒවාට ම අයත් නියාම අනුගමනය කරයි. අප විසින් කළ යුත්තේ කලින් සිතා ගත් අදහස් නමැති ප්‍රොක්‍රැස්ටියානු ඇඳට[2] ස්වභාව ධර්මය ගළපා ගැනීමට යෑම නොව ආචාර ධර්ම පිළිබඳ අපගේ මත යථාභූත වූ (පරම ධාර්මික වූ) ස්වභාව ධර්මයට ගළපා ගැනීමට ඉගෙනීම ය.

අපගේ අතීතය අපෙන් සඟවා වර්තමානය අයත් කුඩා කොටස පමණක් අපට බලන්නට සලස්සන අමතක වීමේ තිර වනාහි අවශ්‍ය වූ ආරක්ෂක තිර ය. මුල දී මෙය අනුචිත විකාර

1. Dynamic processes
2. (ප්‍රොක්‍රැස්ටියානු ඇඳ නම් දිග මදි අය ඇද බඳින් දිග වැඩි අය කපා දමන කල්පිත ඇඳෙකි.)

උපායක් ලෙස පෙනෙනු ඇත. එය පැනමා ඇළ හරහා අත්ලාන්තික් සාගරයෙන් ශාන්තිකර සාගරයට නැව් යන්නට ඉඩ සලසන දොරටු ක්‍රමයට සමාන කළ හැකි බව පෙනේ. කරුණු නොදත් මිනිසාට මේ දොර කොටු සම්පූර්ණයෙන් ම අස්වාභාවික, නුහුරු කරදර සහිත, ක්‍රමයක් ලෙස පෙනෙනවා ඇත. එහෙත් මේ ක්‍රමය යෙදූ ඉන්ජිනේරුවනට විසඳීමට තිබුණේ දුෂ්කර ඉන්ජිනේරු ප්‍රශ්නයෙකි. එනම් වෙනස් වූ උස මට්ටම ඇති විශාල ජල මාර්ගයක් ඔස්සේ එක් මට්ටමෙකින් තවත් මට්ටමකට නැව් ගෙන යෑම ය. ඔවුන් යෙදූ උපක්‍රමය ඉතා හොඳින් ඒ අර්ථය ඉටු කර ලයි.

විඥ්ඥාණය පිළිබඳ තත්ත්වය ද මෙබඳු ය. පැනමා ඇළේ වතුර මෙන් විඥ්ඥාණය ද දිග ප්‍රවාහයෙකින් ගලා යයි. එහෙත් පුද්ගලයා නමැති නෞකාවේ ගමන පහසු කිරීමට මාර්ගයේ එක් කොටසක් තවත් කොටසකින් වෙන් කිරීමට දොරටු පහත හෙළා ජල මට්ටම වෙනස් කිරීම උපකාර වෙයි. ස්මරණ ප්‍රශ්නය මත පුනර්ජන්මවාදයට විරුද්ධ වන අයට පුනර්ජන්මවාදියා දෙන උත්තරය මෙයයි.

භීතිකාවල හා නිතර දකින සිහිනවල නිදසුන්වලට අතිරේකව සිත් ගන්නාසුලු වෙනත් මානසික විපර්යාස ගණනාවෙක් කේසි ලිපි ගොනුවල ඇත. නිදසුනක් වශයෙන් අවස්ථා කීපයෙක දීම මායා පෙනීම් අතීත ජන්ම පිළිබඳ අස්වාභාවික ස්මරණ නිසා යයි කියා තිබේ. එක් නිදසුනෙක දී කියැවීම්, ශරීරයේ අභ්‍යන්තර කේන්ද්‍රයන් වන චක්‍රයන්ගෙන් එකක් ප්‍රමාද දෝෂයෙන් විවෘත වීම නිසා කුණ්ඩලිනී ශක්තිය ගලා යෑමෙන් මායා දර්ශන ඇති වන බව කියා තිබේ. (කේසි මෙහි දී යොදා ඇත්තේ හින්දු මනෝවිද්‍යාවේ වචනය. චක්‍ර නම් වැඩියෙන් අභෞතික වූ අංශය භෞතික ශරීරයේ මාර්ගයෙන් ප්‍රකාශයට පත් වීමට ඉවහල් වෙතැයි සිතිය හැකි

'රෞද්‍ර' නැත හොත් ශක්ති පුළි සනෙකි. කුණ්ඩලිනී යන්නෙන් අදහස් කෙරෙන්නේ ලිංගික ශක්තිය සමග කිට්ටුවෙන් ද නිෂ්පාදන ශක්තිය සමග සාමාන්‍යයෙන් ද සම්බන්ධ වී ඇති කොඳු ඇටයේ මුල පිහිටා ඇතැයි සිතිය හැකි ශක්තියෙකි.)[1]

නිදසුන් රාශියෙක දී බරපතල මානසික රෝගවල හේතුව වශයෙන් හුදු කායික හේතු දක්වා ඇත. හුදු කායික උපායවලින් පුදුම පිළියම් ද කර තිබේ. මෙබඳු එක් නිදසුනක් ගැන 2 වන පරිච්ඡේදයේ දී සඳහන් කර ඇත. තද වූ දතක් ගැළවීමෙන් පසු සිහිය හොඳ වූ ළදැරියගේ නිදසුනයි ඒ. මුරණ්ඩු වී, රළු වී, අනුක්‍රමයෙන් භයානක වූ තැපැල් සේවකයාගේ නිදසුන ද සිත් කාවදින එකෙකි. ඔහුගේ ගෙදර අය පරීක්ෂණයක් සඳහා රෝහලකට යෑමට ඔහු පොළඹවා ගත්තෝ ය. වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ඔහුගේ රෝගය උන්මාදවේගයෙකැ [2] යි කියා ඇත. හේ මානසික රෝහලකට ඇතුළු කරන ලදී. ඔහුගේ භාර්යාව කේඩි කියැවීමක් ඉල්ලා සිටියා ය. අවුරුදු බොහෝ ගණනකට පෙර අයිස් මත වැටීමෙකින් අනුත්‍රිකාස්ථි [3] ප්‍රදේශයෙහි කොඳු නාරටියේ විකෘතයෙකින් මුළු ස්නායු පද්ධතිය කෙරෙහි ම බලපෑමක් ඇති වී තිබේ යයි කියැවීමෙන් පවසන ලදී. විද්‍යුත් චිකිත්සන සංස්කරණයක් ද නියම කරන ලදී. මේ ප්‍රතිකාර කරවා ගැනීමට පවුලේ අයට හැකි විය. සති හයෙකින් මිනිසා සාමාන්‍ය තත්ත්වයට පත්ව ඇතැයි කියා රෝහලින් මුදා හරින ලදී. එහි දී කර්ම හේතුවක් දක්වා නැත. අයිස් මත වැටීම කර්ම ඵලයක් විය හැකි නමුත් ඒ බව සඳහන් කොට නැත. කෙසේ වුවත් හුදු කායික ප්‍රතිකාරයෙකින් සුවය ලැබිණි.

ඒ කෙසේ වෙතත් නිදසුන් කීපයෙක දී ම මානසික රෝගය භූතාවේශ නිසා යයි කියා තිබේ. ඈත කාලයෙක සිට ඇතැම් මානසික විකෘති භූතාවේශ නිසා ඇති වන බව පිළිගෙන තිබේ.

---

1. 206 පිට බලන්න
2. manic - depressive psychosis
3. කොඳු ඇට කෙළවර ඇටය.

ක්‍රිස්තියානි බයිබලය හදාරන්නවුනට ක්‍රිස්තුස්වහන්සේ උම්මත්තයකු ගේ ශරීරයෙන් භූතයන් පලවා හැරි බව කියා ඇති වග සිහිපත් වනු ඇත. කතෝලික පූජකවරුන් විසින් භූතයන් පලවා හැරීමේ චාරිත්‍රවිධි නව ම පවත්වන බව කතෝලිකයන් පෙන්වනවා ඇත.

මේ මුළු අදහස ම නවීන මානසික වෛද්‍ය විද්‍යාඥයන්ගේ මතවලට විරුද්ධ ය. ඔවුන් හිතන්නේ ම එය කාලයට නොගැළපෙන මිථ්‍යා ලබ්ධියක් කියා ය. කෙසේ හෝ මරණයෙන් පසු ආත්මය පවතී යයි පිළිගත හොත් නරක ගති ඇති එබඳු ආත්ම ද්වේෂයෙන් යුක්තව ආවේශ වීමට නැති නම් වෙනත් ක්‍රමයෙකින් මිනිසුන්ගේ ශරීර කෙරෙහි හෝ මනස කෙරෙහි බලපාන්නට උත්සාහ නො ගන්නවා යයි සිතීමේ යුක්තියෙක් නැත.

කේසි ලිපි ගොනුවල පෙනෙන භූතාවේග රෝග කීපයේ දී කිසියම් වර්ගයෙක විද්‍යුත් චිකිත්සනත් ("බාහිර බලවලට තද ස්පන්දන දරිය නොහැකි ය") යාච්ඤාව හා ධ්‍යානයත් නියම කොට තිබේ. එක් නිදසුනෙක දී ස්ත්‍රී ආතුරයා නියමයන් හොඳින් පිළිපැද තමාට කරදරකාරී ව පැවැති කොඳුරන හඬින් මාස කීපයෙක දී තමා මුදා ගත්තා ය. තවත් නිදසුනෙක දී ආතුරයා කියැවීමේ නියම පිළිපැද්දේ ආහාරය සම්බන්ධයෙන් පමණි. එයින් සුවයක් ද සිදු නොවී ය. අඩු ගණනේ මුල් නිදසුනේ දී කර්ම හේතුවක් ක්‍රියාත්මක වූ බව පෙනේ. මේ ආත්මය පූර්ව ජන්මයෙක දී අන්‍යයන් පාලනය කිරීමට ගුඪ උපක්‍රම යොදා තිබේ.

ඇතැම් විට මේ සියලු නිදසුන්වලින් ශෝචනීය වූ මානසික විකෘතීන් පිළිබඳව දැනීමේ නව සීමාවන් දක්වනවා විය හැකි ය. සාමාන්‍යයෙන් කේසි කියැවීම්වලින් මානසික වෛද්‍ය විද්‍යාවට හා මනෝවිග්‍රහයට ඇති විශාල ම අර්ථ සිද්ධිය නම් යටි සිතේ

ශුබාවන් පළල් කිරීම ය. මෙහි කියා ඇති මානසික විකෘති පිළිබඳ නිදසුන් කීපයේ දී යටි සිතේ නරක පැත්ත පමණක් දක්වා ඇති බව පැහැදිලි ය. යටි සිත නරක පැත්ත පමණක් ඇති අඳුරු කාමරයක් පමණක් නො වන බව නිතර සිහියේ තබා ගත යුතු ය. එය ස්මෘති සාගරයකි. හොඳ නරක දෙකෙන්ම පිරි මහා සාගරයෙකි. සත්තෙකිත් ම කේසි කියැවීම්වලින් එය නම් කෙරෙන්නේ "ආත්ම චිත්තයේ ස්මරණය" කියා ය. මෙහි ආත්ම චිත්ත යනු මිස කායචිත්ත යනු යොදා නැති බව සැලකිය යුතු ය. මේ මතකයෙහි භය ජනක සාධක ඇති බව නිසැක නමුත් හිතකාරී ප්‍රයෝජනවත් සාධක ද එහි ඇත. නිදසුනක් වශයෙන් කෙනකුට තම යටි සිතින් අන් සියලු යටි සිත් සමග අදහස් හුවමාරු කර ගත හැකි ය. මෙසේ පඤ්චේන්ද්‍රිය මාර්ගයෙන් ලබා ගත නොහැකි දැනීමක් අපට එයින් ලබා ගත හැකි ය.

කවදා හෝ පුනර්ජන්මවාදයට විද්‍යානුකූල පිළිගැනීමක් ලැබෙනවා නම් මනෝවිද්‍යාඥයන් විසින් මුලින් ම කළ යුතු කාර්යයක් වන්නේ යටි සිත පිළිබඳ මුළු අදහස ම පැහැදිලි ලෙස පළ කොට උඩු සිතට යටි සිතේ නරක පැත්ත පමණක් නොව හොඳ පැත්තත් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි සුදුසු උපාය මාර්ග සකස් කිරීම ය.

13

# විවාහය හා ස්ත්‍රී දෛවය

මනුෂ්‍ය සම්බන්ධතාවන්ගෙන් ඉතාමත් ආසන්න වූ ද ඉතාමත් දුෂ්කර වූ ද සම්බන්ධතාව විවාහයයි. හොඳ වූ විට ඉතාමත් භාග්‍ය සම්පන්න ද නරක් වූ විට කිව නොහැකි තරම් පීඩාකර ද වන විවාහයෙන් මනුෂ්‍ය සුඛයේ හා බන්ධනයේ අන්ත සීමා දක්වෙයි. මේ සීමා දෙක අතර නොයෙක් ප්‍රමාණවල සැප දුක් හා බාධක ඇත.

නීතියේ දෘෂ්ටියෙන් බලනවිට විවාහය කොන්ත්‍රාත්තුවෙකි, සිවිල් සංවිධානයෙකි. මානසික වෛද්‍ය විද්‍යාවේ දෘෂ්ටියෙන් එය ලිංගික හා භාවික[1] ආවේගයන්ගේ රඟමඬලෙකි. පල්ලිය සලකන්නේ එය ශුද්ධ ආගමික චාරිත්‍රයක් ලෙස ය. මනෝවිද්‍යාවට එය පෙනෙන්නේ, හැසිරීමේ හා සකස් වීමේ ප්‍රශ්නයක් ලෙස ය. ඇනුම්පදකාරයෙක් විවාහය මෝඩයන් අසුවන උගුලක් ලෙසින් දකී.

---

1. රාග ද්වේෂාදි හැඟීම් පිළිබඳ

පුනර්ජන්මවාදයෙන් සපයනු ලබන වඩා පුළුල් වූ දෘෂ්ටියට අනුව මේ හැම හැඳින්වීමක් ම හරි නමුත් අසම්පූර්ණ ය. ලින්ක් නම් මනෝවිද්‍යාඥයා විවාහය හඳුන්වා දුන්නේ "අසම්පූර්ණ පුද්ගලයන් දෙදෙනකු විසින් භාග්‍යය සඳහා කරනු ලබන සටනෙක දී තම ශක්තීන් එක් තැන් කිරීමට ගන්නා පියවරකි" කියා ය. 'භාග්‍යය සඳහා වූ සටන' යන්නෙන් ආත්ම පාරිශුද්ධිය සඳහා වූ සටනෙක් අදහස් කෙරේ නම් (මෙයින් තොරව නියම භාග්‍යයක් තිබිය නො හැකි ය.) මේ හඳුන්වා දීම පුරාතනයන්ගේ ප්‍රඥාවට බොහෝ දුරට ළඟා වෙයි. මේ පළල් කරන ලද දෘෂ්ටියට අනුව සකස් කරන ලද, විවාහය පිළිබඳ හැඳින්වීම මෙබඳු විය යුතු ය. විවාහය නම් අසම්පූර්ණ පුද්ගලයන් දෙදෙනකුට තමන්ගේ කර්ම ණය ගෙවා ගැනීමටත් ඔවුනොවුනට උපකාර කිරීමටත් ආත්මයේ නව ගුණ ඇති කර ගැනීමටත් ආධ්‍යාත්මික අවබෝධය හා ශක්තිය දියුණු කර ගැනීමටත් ලැබී ඇති අවස්ථාවෙකි.

කිසිම ප්‍රධාන මනුෂ්‍ය සම්බන්ධතාවක් අහඹුවෙක ප්‍රතිඵලයෙක් නො වේ ය යනු කේසි කියැවීම් නිතර කියා සිටී. විවාහය වැඩි ම ප්‍රමාණයෙකින් මේ කරුණ පැහැදිලි කරන නිදසුනක් බව පෙනේ. කිසි ම විවාහයෙක් අලුතින් ම පටන් ගැන්මෙක් නො වේ. එය බොහෝ කාලයකට පෙර ඇරඹුණු දිග කථාන්තරයෙක අතුරු කථාවෙකි. දෙපක්ෂය කිසියම් චක්‍රයෙකින් තවත් ජීවිතවල දීත් ඔවුනොවුනට සම්බන්ධ වී ඇති බව කියැවීම්වලින් දක්වනු ලැබේ. වර්තමාන විවාහ සම්බන්ධතා අතීතයට සම්බන්ධ වූ ඵල වශයෙන් දක්වන කියැවීම්වල විශේෂ නාට්‍ය ස්වරූපී ආකර්ෂණයෙක් ඇත.

කේසි කියැවීම්වලින් විවාහය ස්වාභාවික මනුෂ්‍ය තත්ත්වය ලෙස දකිනු ලැබේ.

"ඔව් මේ ආත්මය විවාහ වෙන එක හොඳයි. මෙය මිහිපිට ජීවත් වන ආත්මයකට ඇති ස්වාභාවික ජීවිතයයි."

ප්‍ර: "මේ කාලයේ දී විවාහ වීම හොඳ ද ?"

උ: "හරි පුද්ගලයා සොයා ගත හැකි නම් ඕනෑ ම කාලයක් ඊට හොඳයි. මෙය රැඳී ඇත්තේ බලාපොරොත්තුවේ බන්ධනය මත ය."

ගෘහය වනාහි අප සියලු දෙනා ම ළඟා වීමට උත්සාහ කරන අවසාන එක් තැන්කමේ පිළිබිඹුවෙකි.

"ගෘහ ජීවිතය ඔබේ වෘත්තිය කර ගන්න. මිහිපිට ජීවත් වන ආත්මයකට ගෙන ගිය හැකි ශ්‍රේෂ්ඨ ම වෘත්තිය මෙයයි. ටික දෙනකුට පමණක් ගෙදරකුත් වෘත්තියකුත් යන දෙක ම ලැබී ඇත. එහෙත් ශ්‍රේෂ්ඨ ම වෘත්තිය ගෙදරයි. එය මඟ හරින අයට ඊට බොහෝ දුර උත්තර දෙන්නට සිදු වෙනවා. එසේ කියන්නේ ගෙදර හැම ආත්මයක් විසින් ම ක්‍රමයෙන් ලබා ගන්නට බලාපොරොත්තු වන 'ස්වර්ග ගෘහයෙහි' ආසන්න සලකුණ නිසා ය. ඒ නිසා ඔබේ ගෙදර දිව්‍ය ලෝකයෙහි සෙවණැල්ලක් කර ගන්න."

"මැවුම්කරුට මිනිසාගේ ඇති සම්බන්ධතාවට ඉතාමත් ආසන්න වූ මිහිපිට ඇති සැලැස්ම ඇත්තේ පරමාර්ථවලින් එකඟ වූ සමගියක් ඇති ගෙදර ය. ගෘහ ජීවිතය ආදර්ශවත් කාරණයක් සඳහා එකඟ වූ පුද්ගලයනට හැමදා නව පරමාර්ථයන් තනා දෙයි."

මේවා අලුත් අදහස් නො වේ. එහෙත් කියැවීම්වල දෘෂ්ටිය ක්‍රියාවට නැගිය හැකි විස්තර සම්බන්ධයෙන් ද ස්ත්‍රියගේ තත්ත්වය හා ස්ථානය සම්බන්ධයෙන් ද නවීන නිදහස් මත දරයි.

ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ සමභාවයත් තමා පිළිබඳ තීරණ ගැනීමට ස්ත්‍රියගේ ඇති සම්පූර්ණ අයිතියත් කථාවක් නැති ව පිළිගෙන තිබීම සිත් ගන්නාසුලු ය. මේ කරුණු මේ වචනවලින්ම

ක්‍රියැවීම්වල කොතැනෙක දී වත් කියැවී නැත. එහෙත් හැම තැනින් ම එය හැඟී යයි. තෝරා ගත යුත්තේ විවාහය ද නැතහොත් වෘත්තිය ද යන ප්‍රශ්නය සම්බන්ධ වී ඇති ඇතැම් ක්‍රියැවීම්වල දී මේ මූලික මතය පැහැදිලි වන බව දක්නට ලැබේ. ස්ත්‍රියගේ දෛවය, ගෘහය හා දරුවන් මිස අන් කිසිවක් නො වේ ය යන ආඥාදායී ඒකාධිපති මතය ක්ෂේසිගේ දිවැසින් පිළිගෙන නැති බව පැහැදිලි ය.

එක ම ප්‍රතිකාර ක්‍රමයක් නො යොදන කායික කියැවීම්වල දී මෙන් විවාහය සම්බන්ධයෙන් ද එක ම ක්‍රියා මාර්ගයක් සර්ව සාධාරණ ව නො යෙදිය හැකි ය. මේ හැම තැනෙක දී ම මූලික වන මනෝවිද්‍යාත්මක හා ආධ්‍යාත්මික මූල ධර්ම එක ම ය. එහෙත් එක් එක් අවස්ථාවේ දී ඒවා ක්‍රියාවට පරිවර්තනය කිරීම වෙනස් විය හැකි ය. සමහර ස්ත්‍රීන්ට විවාහ වන්නට යයි කියා තිබේ. සමහරුනට වෘත්තියෙක යෙදෙන්නට යයි තරයේ කියා ඇත. සමහරුනට කියා ඇත්තේ පළමුව වෘත්තියෙක යෙදී පසුව විවාහ වන්නට ය. සමහරුනට දෙක ම එකවර කරන්නට කියා තිබේ. තවත් සමහර අයට ස්වාමිවරුන් දෙදෙනකුට එකවර සේවය කළ නොහැකි නිසා කැමැති එකක් තෝරා ගන්නට කියා තිබේ.

ලජ්ජා සහිත, බයාදු, අවාසනාවත් දහඅට හැවිරිදි තරුණියක් ඇගේ අනාගතයෙන් කුමක් කළ යුතු දැයි සිතා බැලුවා ය. ඈ ලබා ගත් ජීවිත කියැවීමෙන් විවාහයක් ගැන සිතන්නට කලින් ළදරුවනට උපකාර කිරීමට ඉඩ ඇති කිසියම් කාර්යයෙක නිරත විය යුතු යයි අවධාරණයෙන් කියන ලදී. " මේ ආත්මය විවාහයෙන් තමා හොඳ කර ගන්නට බලාපොරොත්තු වෙනවා නම් පළමු ව ළදරුවන්ගේ යහපතට යමක් නො කොට එසේ කළහොත් ශෝචනීය ලෙස බලාපොරොත්තු කඩ වනවා ඇත." ඊළඟට කියැවීම ඒ කාර්යය

නිශ්චිත කොට දක්වමින් දහතුනෙහෙන් ඉහළ වියසෙන් පහළ ගැහැනු ළමයින් පිළිබඳව වෙසෙසීම සුදුසු බව දක්වී ය. කණ්ඩායම්වලට උපදෙස් දීම වැනි කාර්යයෙක් සුදුසු මාර්ගය වනු ඇත.

පළපුරුදු කම් ඇති මනෝවිද්‍යාඥයකු, හුදෙක් මනෝවිද්‍යාත්මක වූ දෘෂ්ටියෙකින් පවා මේ අවවාදයේ යහපත් කම පිළිගන්නවා ඇත. බාල අය සමගත් තමාට අද්දැකීමෙන් අඩු අය සමගත් කටයුතු කිරීම හා ඉගැන්වීම පුද්ගලයකු පිටතට නැමුණෙකු කිරීමට ඇති ඉතා හොඳ මගෙකි. වෙනත් ක්‍රමයකින් කිසි දිනෙක මතු නො වන ආත්ම විශ්වාසයෙක් අන්‍යයන්ගේ නායකත්වය දැරීමේ අවශ්‍යතාව නිසා ඇති වෙයි. හුදෙකලා වූ අන්තර්නතයකු බලාපොරොත්තු සුන් කර ගෙන නුසුදුසු සහකාරයකු තෝරා ගත හොත් විවාහය මහත් විපතක් වීමට ඉඩ තිබේ. තෝරා ගත් සහකාරයා යෝග්‍ය පුරුෂයකු වුවත් හවුල් කාරයන් දෙදෙනාගෙන් කෙනකු සකස් වීමේ ප්‍රශ්නවලට හා විවාහයේ දුෂ්කරතාවලට මුහුණ දීමට තරම් ප්‍රමාණවත් ව, හොඳින් පදම් වී නැති හැම විට ම ජීවිතය අසාර්ථක වීමට ඉඩ ඇත. මේ නිසා මෙහි දී විවාහයට පෙර සමාජ සේවා අධ්‍යයනය හෝ වෘත්තියෙක යෙදීම උචිත මාර්ගය ලෙස දැක තිබේ.

තවත් නිදසුනෙක දී දක්ෂතා ඇති තරුණියකට වෘත්තියත් විවාහ ජීවිතයත් එකට කරන්නට නියම කරන ලදී. එහෙත් හරියට ම හරි සහකාරයා සොයා ගන්නා තාක් විවාහ නොවන්නට අවවාද කොට ඇත. ඕ අතිශ ජන්ම විශේෂඥතා ගණනාවක් නිසා නොයෙක් දේවලට දක්ෂව සිටියා ය. කැටයම්කාරියක වශයෙන් ද වියන්නියක වශයෙන් ද ඕ දක්ෂ වූවා ය. එපමණක් නොව ගුරුවරියක හා ගායිකාවක ලෙසත් අංගචලනාචාර්යවරියක ලෙසත් ඕ දක්ෂ ය. එබඳු දායාදයන් තුබූ ඕ මේ ජීවිතයේ දී ආධ්‍යාත්මිකාර්ථයෙන් නායිකාවක ද

ආචාර්යවරියක ද වීමට භාග්‍ය සම්පන්න වූවා ය. මේ බව දැක් වූ කියැවීම තවදුරටත් මෙසේ ද කියයි. "මෙහි දී ගෘහයත් වෘත්තියත් යන දෙක එකට සම්බන්ධ කළ යුතු බව අපට පේනවා. එහෙත් එය ඇ විසින් තෝරා ගනු ලබන ස්වාමිපුරුෂයාගේ තත්ත්වය මත රැඳී ඇත. සම්පූර්ණයෙන් ඇගේම අභිවෘද්ධියට උදවු කරන එකඟ වූ තැනැත්තකු නොලැබුණහොත් බෙහෙවින් දියුණු වූ මේ තැනැත්තියගේ අභ්‍යන්තර ආත්මයෙහි හානි කර කැළැල් ඉතිරි කරන අන්දමේ ගැටීම් හා බලාපොරොත්තු කඩවීම් ඇති විය හැකි ය."

දක්ෂ රූමත් නිළියක පිළිබඳ සිද්ධිය මේ නිදසුනට සම්පූර්ණයෙන් ම වෙනස් ය. ප්‍රේම සම්බන්ධයක් ඇති කර ගත් ඕ තම වෘත්තියත් විවාහ ජීවිතයත් එකට කළ හැකි දැයි සිතා බැලුවාය. කියැවීමෙන් ලැබුණේ නොහැකි ය යන නිශ්චිත පිළිතුරයි. "විවාහය නැතහොත් රංගපීඨය යන දෙකෙන් එකක් සාර්ථකව කිරීමේ සුදුසුකම් මේ ආත්මයට තිබේ. දෙක ම සාර්ථක කර ගැනීම ඇට කළ නොහැකි ය. එකක් නිශ්චය කර ගැනීම ඇටම බාර ය."

මේ කියැවීම් හොඳින් පරීක්ෂා කර බලන විට මේ නියමයන් කර ඇත්තේ ආධ්‍යාත්මික අභිවෘද්ධියට කිමෙක් හේතු වේ ද යන්න පදනම් කර ගෙන බව පැහැදිලි ය. ස්ත්‍රියක්, කීර්තිය, මුදල්, වස්ත්‍රාභරණ, ආධිපත්‍යය, තත්වය හා ආත්මෝත්කර්ෂණය යන ආත්මාර්ථකාමී හේතු නිසා වෘත්තියක් සොයනවා නම් 'කොරතුරු මූලාශ්‍රය'[1] ඒ බව දැන ගෙන ඇය ගෘහ පාලනයට යොමු කෙළේ ය.

මේ අවවාදය දී ඇත්තේ ගෘහ ජීවිතයේ හෝ ගෘහ ජීවිතය තුළ ස්ත්‍රියගේ ස්ථානයේ හෝ ශුද්ධත්වය පිළිබඳ භාවපරවශ වූ හෝ පරම්පරාගත වූ හෝ මතවල එල්බ ගෙන නොවේ. එය

1. මේ කේසි තම ශක්තියට දුන් නම ය.

කර ඇත්තේ චේතනාව හා පරමාර්ථය ඕනෑ ම ක්‍රියා මාර්ගයක් විනිශ්චය කිරීමට ඇති හොඳ ම මිනුම් දණ්ඩය යන විශ්වාසය පදනම් කොට ගෙන ය. හැම විට ම ආත්මාර්ථකාමී වූ ක්‍රියා මාර්ගය පරාර්ථකාමී වූ ක්‍රියා මාර්ගයට වඩා පහත් ය. ගෘහ ජීවිතයේ හා විවාහයේ ඇති වගකීම් ඒවායේ ස්වභාවය නිසා ම සමහර වෘත්තිවල ඇති ආත්මාර්ථකාමී ලාභවලට වඩා පරාර්ථකාමයට හේතු වේ.

මේ නිසා වෙනත් මාර්ගවලට දක්ෂකම් ඇත්තා වූ ද බොහෝ ස්ත්‍රීනට ගෘහ පාලනය හා දරුවන් ඇති දැඩි කිරීම නියම කොට තිබේ. එසේ කර ඇත්තේ ඔවුනට අවශ්‍ය වූ විශේෂ ආධ්‍යාත්මික ගුණ ඇති කර ගැනීම සඳහා ඇති හොඳ ම ශික්ෂණයක් වෘත්තියක් අනුගමනය කිරීමට හේතු වන සසංඥ වූත් අසංඥ වූත් ආත්මාර්ථකාමයට ඇති හොඳ ම බාධකයත් එය නිසා ය. අනෙක් අතට ශක්ති ඇති වෙනත් ස්ත්‍රීන් මනුෂ්‍ය වර්ගයාට සේවයක් සඳහාම ඔවුන්ගේ ශක්තිය අවංකව යොදන්නට ආශා කරනවා විය හැකි ය. එබඳු ස්ත්‍රියකට ගෘහයත් ස්වාමිපුරුෂයාත් පවුලත් ඇගේ ශක්තීන්ගේ පූර්ණ ප්‍රකාශනයට ඇති බාධක විය හැකි ය. මෙබඳු ස්ත්‍රියකට පසු වී විවාහ වන්නට හෝ මානසික වශයෙන් ශක්තිමත් නම්, ගෘහ ජීවිතය හා වෘත්තිය යන දෙකෙහි ම යෙදෙන්නට හෝ අනුබල දෙන ලදී. විවාහක අවිවාහක යන තත්ත්ව දෙකෙහි ම පරමාර්ථය ආධ්‍යාත්මික දියුණුව ය. ස්ත්‍රීහුත් පුරුෂයෝත් සමාන වූ ආත්ම නිසා ඒ ආධ්‍යාත්මික දියුණුවේ අර්ථය ඉතා හොඳින් ඉටු වන ඕනෑ ම තත්ත්වයකට සුදුසුකම් ඇත්තෝ ය.

තමා පිළිබඳ තීරණ ගැනීමට ඇති අයිතිවාසිකම සමාජ අයිතිවාසිකමක් ලෙස පමණක් නොව ලෝක අයිතිවාසිකමක් ලෙසද කේසි දක තිබේ. දාර්ශනික වචනවලින් එය චේතනා

ස්වතන්ත්‍රතාව'[1] යයි ප්‍රසිද්ධ ය. ශත වර්ෂ ගණනාවක් තිස්සේ ම ඒ ගැන බොහෝ කටුක තර්ක ඉදිරිපත් කොට තිබේ.

පුනර්ජන්මවාදයේ ඇති ඉතා වැදගත් ලක්ෂණයක් නම් නියතිවාදයට විරුද්ධව ස්වතන්ත්‍ර චේතනාවාදය පිළිගැනීමයි. කර්මය හා පුනර්ජන්මය පිළිගන්නා වූ මිනිසුන් විසින් නිතර කරනු ලබන වරදක් නම් මුළු ජීවිතය ම පූර්ව නියතියෙකින් නිශ්චිතව ඇතැයි පිළිගැනීම ය. එබඳු විශ්වාසයෙක ඇති ප්‍රතිඵල මනෝ විද්‍යාත්මක වශයෙන් ප්‍රාණහාරකය; ආධ්‍යාත්මික වශයෙන් ආචාර විරෝධීය.[2] බොහෝ දුරට කර්මයේ නියතවාදී ව්‍යාඛ්‍යානය පිළිගෙන ඇති හින්දුවාගේ උදාසීනත්වය හා නිෂ්ක්‍රියත්වය එබඳු මතයෙක ඇති අනතුර පැහැදිලි කරයි.

හැම කිඹිසීමෙක් ම, හැම මදුරුවන් කෑමෙක් ම හැම රාත්‍රි භෝජනයෙක් ම යුග ගණනකට ඉහත සිට කර්මයෙන් හෝ ලෝක නියමයෙකින් හෝ නියතව නැතැයි තේරුම් ගත යුතු ය. අපගේ ජීවිතවල විස්තර වැඩි හරියක් ම අපගේ වර්තමාන චේතනාවට හා චින්තනයට සම්පූර්ණයෙන් ම යටත් ය. සත්තෙකින් ම අපේ ජීවිත වල ඇති හැම සිද්ධියක් ම විවාහය වැනි ප්‍රධාන සිද්ධියක් වේවයි, අයිස්ක්‍රීම්, සෝඩා බෝතලයක් මිල දී ගැනීම වැනි සුළු සිද්ධියක් වේවයි අවසාන විග්‍රහයේ දී ස්වයංනිශ්චිතය.[3] දුන් අපට ඇති බාධක අපේ අතීතයේ ආත්ම විනිශ්චයවල වැරදීම්වල ප්‍රතිඵලය. අපට ඒවා බාහිර බලපෑම් ලෙස පෙනෙන්නේ අප විසින් අපේ ම අතීත කර්ම අමතක කොට ඇති නිසාත් අපගේ වර්තමාන තත්වයන් සමග ඒවායේ ඇති ආසන්න සම්බන්ධය දැක ගැනීමට බැරි තරම් අපගේ

1. Freedom of Will

2. බුදුසමය ද මේ කියමන අනුමත කරයි. පුබ්බෙකත හේතුවාද, ඉස්සර නිම්මාණ හේතුවාද හා අහේතුවාද යන තුනෙන් ම නැගෙන නියතිවාදය අකිරිය වාදයට වැටෙන බව බුදුහු වදාරති.

3. Self-Determined තමා විසින්ම තීරණය කරන ලද්දේ වේ.

පෙනීමේ සීමාව කුඩා වීම නිසාත් ය. මෙසේ පුනර්ජන්ම මතය මනාව තේරුම් ගැනීමෙන් ස්වතන්ත්‍ර චේතනාව හා නියතිවාදය අතර පෙර සිට පැවත එන උභතෝකෝටික ප්‍රශ්නය විසැඳී යයි. මනුෂ්‍යයාට දම්වැලකින් බැඳ ඇති බල්ලකු සේ ස්වතන්ත්‍ර චේතනාවෙක් ඇත. ඒ කියන්නේ බල්ලාට දම්වැලේ දිග ප්‍රමාණය ඇතුළත ඌට ඕනෑ දෙයක් කරන්නට සම්පූර්ණ නිදහසෙක් ඇත. කර්මය විසින් එක් එක් මිනිසාගේ දම්වැල නිශ්චය කරනු ලැබේ. එහි දිග ප්‍රමාණය තුළ හේ නිදහසේ ය.

විවාහය පිළිබඳ කියැවීම් විශේෂයෙන් ම කවුරුන් සමග විවාහ විය යුතු දැ යි ප්‍රශ්න කළ විට ලැබුණු කියැවීම් පරීක්‍ෂා කරන විට ස්වතන්ත්‍ර චේතනාව පිළිබඳ මේ ප්‍රශ්නය අපගේ අවධානයට බලවත්ව එයි. විවාහ බන්ධනවල කර්ම විපාක ස්වභාවයෙක් ඇතැයි කියැවීම්වලින් නැවත නැවතත් පෙන්වා දී ඇත. ඒ කියන්නේ මෙයයි. විවාහයක හවුල්කාරයෝ අමතකව ගිය පැරණි දූත ඇඳුනුම්කාරයෝ ය. දැන් ඔවුහු, ඔවුනොවුන්ට ඇති කර්ම විපාක ණයක් විසඳා ගනු සඳහා එක් වී සිටිති. මෙසේ අපට, "මට කොහේ දී හෝ ඔබ හමු වී නැද්ද" යි මිනිසුන් කියන විට ඔවුන් නිකම ම ප්‍රිය කථා සල්ලාපයක් සඳහා ප්‍රියශීලී ආරම්භයක් කරනවා පමණෙක් දැයි සිතා බැලීමට සිදුවෙයි. ඔවුහු විය හැකි ලෝක සිද්ධියක් ම කියති.

කෙසේ හෝ මිනිසාට අන් හැම තැනෙක දී මෙන් විවාහ සම්බන්ධතාවල දී ද ස්වතන්ත්‍ර චේතනාවන් තෝරා ගැනීමේ ශක්තියත් ඇති බව පැහැදිලි ය. පුද්ගලයන් අතර කර්ම සම්බන්ධයක් පවත්නා අවස්ථාවේ පවා ඒ කර්ම සම්බන්ධය, ඔවුන් අතර ප්‍රබල ආකර්ෂණයක් ලෙස ප්‍රකට වන කල්හි පවා, හැම විට ම විවාහ වීම හොඳ හෝ අවශ්‍ය හෝ නොවන බව ද පැහැදිලි ය. මේ කර ණ පැහැදිලි කිරීමට කෙටි ප්‍රශ්නෝත්තර නිදසුන් දෙකක් ගනිමු.

ප්‍ර : "මා දැන් මට ආලය කරන තරුණයා සමග විවාහ විය යුතු ද ?"

උ : "මෙ ආශ්‍රයෙහි කර්ම විපාක බලපෑමෙක් ඇත. එහෙත් ඔහු හා විවාහ වීම ඉතා හොඳ වන්නේ නැත."

ප්‍ර : "එෆ්. එස්. සමග විවාහ වීම අපගේ අන්‍යෝන්‍ය අභිවෘද්ධියට හේතු වේ ද ?"

උ : එසේ කර ගත හැකි ය. එහෙත් අපට පේන හැටියට, වඩා හොඳ ඔවුනොවුන්ගේ දියුණුවක් ඇති කර ගත හැකි වෙනත් අය ඇත. මේ අනෙක් අය විශේෂයෙන්ම ඊජිප්තු යුගයේ සම්බන්ධකම් ඇති අයයි. එහෙත් තෝරා ගැනීම කළ යුත්තේ ඔබ විසිනි. එෆ්. එස්. සමග විඳිය යුතු කිසියම් කර්ම විපාකයෙක් ඔබට ඇත. එහෙත් අඹු සැමියන් වශයෙන් එය විඳීම දුෂ්කර ය."

කර්ම සම්බන්ධයක් ඇති අවස්ථාවල දී පවා විවාහයේ අයෝග්‍යත්වය ක්‍රම කීපයෙකින් ම තෝරා දිය හැකි ය. පළමු කොට, ඒ පුද්ගලයන්ට මේ අවස්ථාවේ උගත යුතු වූ, විවාහ සම්බන්ධතා ප්‍රශ්නයට වඩා වැදගත් වූ වෙනත් පාඩම් තිබිය හැකි ය. තවත් විය හැක්කෙක් නම් මේ පුද්ගලයන් දෙදෙනා ම හෝ එක්කෙනකු ආධ්‍යාත්මික වශයෙන් නොපැසී සිටීමයි. ඒ කියන්නේ තවම ඔවුන් ප්‍රශ්නයට මුහුණ දීමට සූදානම් නැතුවා විය හැකි ය. තවත් විය හැක්කක් නම් අරමුණු කරන ලද විවාහය පූර්ව කර්මයට නොගැළපෙන තරමට උග්‍ර වූ විපාක ඇත්තක් වීමයි. හෙවත් දඬුවම අපරාධයට වඩා බරපතල වීමයි. අවසාන වශයෙන්, ඇතැම් විට මේ ආත්ම භාවයේ දී ඉගෙනීමට ඇති ආධ්‍යාත්මික පාඩම විවාහ වී ඉගෙන ගන්නවාට වඩා හොඳින් වෙන්ව සිට උගත හැකි වීමට ඉඩ ඇත.

•

හැම නිදසුනෙක දී ම විවාහය හොඳ හෝ නරක වන්නේ කවර හෙයින් දැ යි නිශ්චය කොට දැක්වීමෙක් කියැවීම්වල නැත. විවාහය සුදුසු යයි සලකන ලද අවස්ථාවල දී පවා විවාහ විය යුතුද නැද්ද යන්න නිශ්චය කිරීම සම්පූර්ණයෙන් ම ඒ පුද්ගලයන්ට පවරා ඇත. හොඳ ම මාර්ග දේශකත්ව භාවිතය අනුගමනය කරන කියැවීම්, උපදෙස් ලබන්නාට සම්පූර්ණ විනිශ්චයක් කර දෙන්නේ ඉතා කලාතුරෙකිනි.

පහත එන නිදසුනෙහි ද මේ මූලික ආකල්පය පැහැදිලිව දක්නට ලැබේ. මෙහි දී තරුණ තරුණියන් දෙදෙනෙක් ඔවුන් විවාහ විය යුතු දැයි අසති. ඔවුන් දෙදෙනා එකට අත්දැකීම් දෙකක් ලබා ඇති බව කියා ඇත. එකෙක් පර්සියාවේ දී ය. අනෙකා ඊජිප්තුවේ දී ය. ඔවුන්ගේ ප්‍රබල අන්‍යෝන්‍ය ආකර්ෂණයට හේතු වූයේ මෙයයි. ඔවුන්ගේ විවාහය ගැන නිශ්චිත යමක් කියා නැත. කියා ඇත්තේ මෙපමණයි: "පරමාර්ථවල හා බලාපොරොත්තුවල ගැළැපීමෙක් තිබේ නම් මෙය හොඳ ලස්සන අත්දැකීමක් කර ගත හැකි ය."

ප්‍රශ්න කාලයේ දී තරුණිය මෙසේ ඇසුවා ය. "අප දෙදෙනා ඔවුනොවුන් සමග විවාහ වී සැපවත් වෙන තරමට, නැතහොත් ඊටත් වැඩියෙන් සැපවත් විය හැකි සේ විවාහ විය හැකි වෙනත් අය සිටිනවා ද ?" ලැබුණු උත්තරය මෙසේ ය: "ඔව්, ඔබ තෝරා ගන්නවා නම් අපට එබඳු විසි පහක් තිහක් පමණ නම් කළ හැකි ය. විවාහයේ තත්ත්වය ඔබ විසින් ඇති කර ගනු ලබන්නෙකි. ඔබ දැන් විඳ ගන්නට සතුටු නම් මෙහි දී විඳ ගත යුතු අත්දැකීමෙක් ඇත. ඔබ එය කවදා හෝ විඳ ගත යුතු නිසා ඔබට අවශ්‍ය නම් දැනුත් එය කර ගත හැකියි........."

නිදසුන් කීපයෙක දී කියැවීම, දෙකින් එකක් සම්පූර්ණයෙන් නිශ්චය කරයි. මේ එබන්දෙකි.

ප්‍ර: "දූනට මා බහ දී සිටින මිනිසා සමග විවාහ වීම සුදුසු ද?"

උ : "නෑ."

කෙසේ හෝ නිදසුන් වැඩි ගණනක දී තෝරා ගැනීමේ අයිතිය හා වගකීම් සම්පූර්ණයෙන් ම ඒ ඒ පුද්ගලයන් සතු බව අවධාරණයෙන් දක්වා ඇත. එහෙත් ඒ එක්ක ම තෝරා ගැනීමට වහල් කර ගත යුතු මිනුම් දණ්ඩ සාමාන්‍යයෙන් නිගමනය කරනු ලැබේ. "ආර්. ඩබ්ලිව්. මගේ යෝග්‍ය සහකාරිය ද ?" යනු ඇසූ මිනිසකුට මෙසේ කියා ඇත. "තෝරා ගැනීම ඔබ සතු මිස අප සතු නොවේ. මානසික හා කායික ඇද ගැනීමක් පමණක් නොව ආධ්‍යාත්මික[1] ඇද ගැනීමෙකුත් ඔබ අතර තිබේ ද ? ආත්මයට ආත්මයත් පරමාර්ථයට පරමාර්ථයත් ගැළපේ ද ? ඔබටත් ඒ ආදර්ශම තිබේ ද ? ඔබට ඒවා ම නැති නම් පරිස්සම් වන්න."

පහත එන නිදසුනෙහි දී කියැවීම මේ කරුණ පිළිබඳව වඩාත් පැහැදිලි ය. එක් ස්ත්‍රියක මිනිසුන් සතර දෙනකුගෙන් කවරකු සමග විවාහ විය යුතු දැයි ඇසුවා ය. උත්තරය මෙසේ ය:

"මෙය ඔබ තෝරා ගන්නා ආදර්ශවත් ජීවිතය මත රැඳී ඇත. මේ මිනිසුන් හතර දෙනා ම සමහරුන් උදවුකාරයන් වශයෙන් ද සමහරුන් බාධාකාරයන් වශයෙන් ද - අතීතයේ දී ඔබ ආශ්‍රය කර තිබේ. මේ පුද්ගලයාගෙන් ඉවත් විය යුතු ය. නැතහොත් මේ පුද්ගලයා සමග එක් විය යුතු යයි කීමෙන් කෙරෙන්නේ ඔබත් ඔවුනුත් වැරැදි තැනෙක තැබීම ය."

1. ඇතැමුනට මානසික හා ආධ්‍යාත්මික යන දෙක අතර වෙනසක් නැතැයි සිතෙනු ඇත. ආධ්‍යාත්මික යන්න වඩා ගැඹුරට ගිය සද්ගුණවලට සම්බන්ධ ය.

"සේවයට කැප වූ ජීවිතයකට, හිතකර වන ලෙසින් තෝරා ගැනීම ඔබ විසින් කළ යුතු ය. හැම මිනිසකුට ම ස්වතන්ත්‍ර චේතනාවක් ඇති බව දැන ගන්න."

මෙබඳු ඡේදවලින් විවාහ සහකාරයකු හෝ සහකාරියක තෝරා ගැනීමට ඉවහල් වන තෝරා ගැනීමේ මූල ධර්මය මතු කර ගත හැකි ය. විවාහ බන්ධන වැඩි ගණනකට හේතු වන්නේ නොඉවසිය හැකි කායික ආකර්ෂණයෙක් යයි කීම බොහෝ දුරට ආරක්ෂා සහිත බව පෙනේ. කේසි කියැවීම්වල මතයට අනුව පුද්ගලයකු කායික වශයෙන් පමණක් නොව මානසික වශයෙන් හා ආධ්‍යාත්මික වශයෙන් ද හොඳින් ගැළපිය යුතු ය. සාර්ථක වූ විවාහ ජීවිතය ත්‍රියා පදයක් මත මෙන් මේ සමපාද පදනම මත පිහිටිය යුතු ය. එකක් හෝ අඩු වූවහොත් එහි ප්‍රතිඵලයක් වශයෙන් විවාහය කොර වෙයි. මේ ක්ෂේත්‍ර තුනෙහි දී ම එක් පුද්ගලයකුගේ ප්‍රාර්ථනීය ආදර්ශ අඩු ගණනේ තරමක් වත් අනෙක් පුද්ගලයාගේ ප්‍රාර්ථනීය ආදර්ශවලට සමාන විය යුතු ය. නැතහොත් අනතුර හා විපත එතරම් ඈත් නො වේ. තෝරා ගැනීමෙහි දී සලකා බැලිය යුතු මේ වැදගත් කරුණුවල අඩුපාඩුකම් සහිත ව වැඩි දුර නො සිතා විවාහයකට ඇතුළු වීම කරදර කැඳවා ගැනීමෙකි.

විසභාග ලිංගයේ කෙනකු පිළිබඳ ව බලවත් ආකර්ෂණයක් දැනෙන්නට වූ විට ඔබ ඔබේ ආරක්ෂකයා විය යුතු ය. ලිංගික ආශාවක් සාර්ථක විවාහ ජීවිතයක් ලෙසින් දියුණුවීම කැමැති වීමට සෑහෙන තරමට පූර්ව චින්තනයෙක් ඔබට තිබේ නම්. පුපුරන කර්ම විපාකයක් මතු කර නො ගන්නා සිතෙක් ද තිබේනවා නම්, ඔබ ඔබේ ආරක්ෂකයා විය යුතු ය.

**14**

# හුදෙකලා වූවෝ

පුනර්ජන්මවාදයේ දීර්ඝකාලීන දෘෂ්ටියෙන් විවාහය පිළිබඳ ව කරනු ලබන හැම විමසීමෙක දී ම ඇතැම් ස්ත්‍රී පුරුෂයනට විවාහ වන්නට නොලැබෙන්නේ කවර හෙයින් ද යන ප්‍රශ්නය අනිවාර්යයෙන් ම මතු වෙයි. සෑහෙන රූප ශෝභාවක් ඇති නමුත්, මානසික වශයෙන් සාමාන්‍ය නමුත්, ඇතැම් පුද්ගලයන්ට කිසි දිනකවත් විවාහ වීමට අවස්ථාවෙක් නොලැබේ. කේසි කියැවීම්වල මේ පිළිබඳ කර්ම විපාක විවරණයෙක් ඇද්දැයි කාට වුවත් සිතෙනු ඇත.

ප්‍රංශ ජනයන් අතර විවාහ ජීවිතය පිළිබඳ කදිම ප්‍රස්තාව පිරුළෙක් ඇත: "විවාහය වටලන ලද බළකොටුවක් වැන්න: පිටත සිටින්නවුනට එය ඇතුළට යෑමට අවශ්‍ය ය. ඇතුළත සිටින්නවුනට එයින් පිට වීමට අවශ්‍ය ය." මෙය උපහාසාත්මක ලෙස පෙනුණත් මේ කියමනෙහි විශාල සත්‍යයෙක් තිබේ. විවාහය ඉතා විශාල මනුෂ්‍ය සංඛ්‍යාවකට බරපතල මානසික

දුඃඛයක් ගෙන දී තිබේ. එනිසා ඔවුනට අනෙක් අය විවාහ ජීවිතය ප්‍රාර්ථනීය දෙයක් ලෙස සැලකීමත් සිතේ සැනසුමට එහි ඇති අනේක තර්ජන නොසලකා විවාහයේ ඇති භාග්‍යයේ පොරොන්දු පමණක් දකින්නට වීමත් අතිශයින් විස්මය ජනකය. විවාහයේ ඊට ම අයත් මහත් දුෂ්කරතා ඇත්තේ ය යන සාමාන්‍ය ඥානයක් ඇතත් විවාහ නො වූ අයට තමාගෙන් කිසියම් වටිනා දෙයක් වංචා කොට ගෙන ඇත්තේ ය යන හැඟීමෙක් ප්‍රාර්ථනා භග්නත්වය හා අසාර්ථකත්වය පිළිබඳ හැඟීමෙක් තිබේ.

සත්තෙකින් ම මේ තත්ත්වයෙහි ඇති ලිංගික අංශය වැදගත් එකෙකි. ශිෂ්ට රටවල අවිවාහක ස්ත්‍රීන්ගේ ප්‍රාර්ථනා භග්නත්වය පුරුෂයන්ගේ ප්‍රාර්ථනා භග්නත්වයට වැඩියෙන් ශෝචනීය ය. මේ ස්ත්‍රීන් සාමාන්‍යයෙන් ලිංගික සන්තර්පණය සම්බන්ධයෙන් හාමතේ සිටිතැයි කිව හැකි ය. ප්‍රාථමික සමාජයන්හි තත්ත්වය මෙය නොවේ. එහෙත් බටහිර සමාජයේ වර්තමාන ආකෘතියෙහි දී තනිකඩ ජීවිතයෙන් දැක්වෙන්නේ ප්‍රාර්ථනා භග්න තත්ත්වයෙකි. එහි එක්තරා ප්‍රමාණයක හීනත්වයෙක් ද ඇත. අවිවාහක ස්ත්‍රීන් පිළිබඳව මෙය විශේෂයෙන් ම එසේ ය. පහත එන නිදසුන් සියල්ල ස්ත්‍රීන් පිළිබඳව ය. මෙසේ වීමට හේතුව මේ කරුණු ගැන පුරුෂයනට වඩා ස්ත්‍රීන් කේඩිශගෙන් කරුණු අසා තිබීමයි. ඒ නිසා ඔවුන්ගේ සිද්ධි වඩා ප්‍රකට ය.

"එකලාව" යන වචනයෙහි කිසියම් පාළු බවෙක්, කිව නොහැකි තරම් කනගාටුදායක ගතියෙක් ඇත. සමහර විට පෙම්වතුන්ගේ භාෂාවේ ඇති "අන්තිම වතාවට" යන්න ඉතාමත් කනගාටුදායක වාක්‍යාංශය වන්නා සේ තමා සම්බන්ධයෙන් කියන්නට ඇති වාක්‍යවලින් "මම තනි වී සිටිමි" යන්න ඉතාමත් කනගාටුදායක වාක්‍යය විය හැකි ය.

ආධ්‍යාත්මික ප්‍රබෝධයෙකින් තොරව ඇති වන, ආලයෙන්

පසුව එන වෙන්වීම, නැතහොත් ආලයක් කිසි දිනෙකවත් නොදත් එකලා බව, සියලුම මනුෂ්‍ය තත්ත්වයන් අතර ඇති ඉතාමත් නිසරු වූ ද ඉතාමත් කඩාකප්පල්කාරී වූ ද තත්ත්වයයි.

පහත විස්තර වන සිද්ධිය අයත් ස්ත්‍රියගේ ප්‍රධාන ජීවිත ප්‍රශ්නය නම් නිතර දැනුණු එකලා බවයි. ඕ නිව්යෝක් නගරයේ සිටි සමාජ ලේකම්වරියකි. නෝර්වීජියන් ස්ත්‍රියක වූ ඕ හොඳින් පිහිටි අඟ පසඟ ඇති සෑහෙන කායික ආකර්ෂණයෙකින් යුතු තැනැත්තියක් වූවා ය. කේසිගෙන් පළමු වන කියැවීම ලබා ගන්නා විට ඇගේ වයස අවුරුදු හතළිස් හතෙකි. ඒ වන විට ඕ දෙවරක් විවාහ වී සිටියා ය. විවාහයෙන් ටික කලකට පසුව පළමු සැමියා මළේ ය. ඕ නැවත වරක් විවාහ වූවා ය. මෙවර සැමියා ඇට වඩා වයසින් බෙහෙවින් වැඩිය. විවාහය කොතරම් අභාග්‍යසම්පන්න වී ද යත් ඕ ඉතා ඉක්මනින්ම දික්කසාද වූවාය. ඇයට දරුවන් නැත. ඇගේ පවුලේ හැම දෙනෙක් ම මිය ගියහ. හුදු වචනාර්ථයෙන් ම ඇට කිසිවකු සිටියේ නැත. සමාජ ලේකම්වරියක වශයෙන් තුබූ තත්ත්වය නිසා ඇට මිනිසුන් ආශ්‍රය කරන්නට ලැබිණි. එහෙත් ඒ ආශ්‍රය මතු පිටට සීමා වූවෙකි. මේ නිසා ඈ නැවත වරක් විවාහ වන්නට සිතූ නමුත් කෙසේ හෝ ඊට අවස්ථාවක් නොලැබිණි. ඕ තනි වූවා ය.

කියැවීමක් සඳහා ඈ විසින් කරන ලද ඉල්ලීමෙහි ඇතුළත් ප්‍රශ්නවලින් ඇගේ තනිකමත් වල්මත් ගතියත් හෙළි වෙයි. "මා නිතර ම මෙතරම් තනි වී සිටින්නේ ඇයි ?" යනු ඈ අසා තිබිණි. "මට විවාහ සහකාරයකු නොලැබී යෑමට කිසියම් විශේෂ හේතුවක් තිබෙනවා ද ? මා එතරම් නොගැළපෙන්නියක වන්නේ ඇයි ?" සත්තෙකින් ම ඇගේ තනිකමට හේතුවක් තුබූ බව කියැවීමෙන් හෙළි කරන ලදී. ජීවිත දෙකකට පෙර නෝර්වේ රටේ දී ශෝචනීය වැරැදි පියවරෙකින් ඕ ඇගේ වර්තමාන මානසික තත්ත්වය ආරම්භ කළා ය. ඈ කළ වරද නම් සියදිවි නසා ගැනීමයි.

එකල ඕ කුඩා දරුවන් දෙදෙනකුගෙ මවක් වූවා ය. හෙළි නොකොට ඇති කිසියම් කරුණක් නිසා ඇගෙ සැමියා ඒ සමාජයෙහි අපකීර්තියට පත් විය. දෙවන දරුවාගේ උපතින් පසුව බලාපොරොත්තු සුන් කර ගත් ඕ ළඟ තුබූ කලපුවට පැන සිය දිවි නසා ගත්තා ය. "මෙසේ වරෙක දැරිය නොහැකි තරම් බරපතල වන කාන්සියෙන් හා තනිකමින් යුත් අවස්ථා එහි විපාක ලෙසින් වර්තමානයෙහි මතුවනු පෙනේ."

මේ නිදසුනෙහි කර්ම විපාක සැලැස්ම ඉතා පැහැදිලිව දක්නට ලැබේ. අපහාසය ලැබුණු අවස්ථාවේ දී ඕ තම සැමියාට හා දරුවන්ට අවශ්‍යව තුබූ ප්‍රේමයට හා සැලකිල්ලට ඔවුන් අහිමි කොට තම ප්‍රාණය ගෙන ගියා ය. ඇගේ තුබූ ගෘහබන්ධනවල අගය සැලකීමේ අඩුකම හා අන්‍යයන් පිළිබඳ ගෞරවයේ හා වගකීම් හැඟීමේ අඩුකම ඈ දැනට වැටී සිටින තත්ත්වය ඇති කෙළේ ය. යමකු යම් යම් දේවල අගය වටහා ගන්නේ ඒවායේ නැතිකමින් පමණි.

මෙය සිතුවිලි දනවන තත්ත්වයෙකි. මෙයින් බරපතල පාපයෙක් යයි සිතා කතෝලික පල්ලිය විසින් සිය දිවි නසා ගැනීම තහනම් කිරීමේ සුදුසුකම පමණක් නොව, හැම ක්‍රියාවකටම, හැම උපේක්ෂකත්වයකටම, හැම නොසලකා හැරීමකටම, ජීවිත සංඛ්‍යාත දායාදයට කරනු ලබන හැම හෙළා දැකීමකට එයින් ගනු ලබන හැම අයථා ප්‍රයෝජනයකටම, අන්තිමේ දී අප වගකිව යුතු ය යන සත්‍යය ද පැහැදිලි කරනු ලැබේ.

හුදෙකලාවේ දෙවැනි නිදසුනින් දැක්වෙන්නේ ද ඒ මූලික සැලැස්මම ය. එහෙත් සැලකිය යුතු පමණකට එහි විස්තර වෙනස්ය. එය ඉංග්‍රීසි පරපුරෙකින් පැවැත එන බාලාංශ ගුරුවරියක පිළිබඳ කථාවෙකි. නිතර විවාහ වීමට ආශාවෙන් සිටි ඕ, මැදිවියේ සිටි මාපියන්ගේ එකම දූවය. ඉතා බාල වියෙක

සූවි මේ දැරිය තනි කර දමා දෙමහල්ලෝ මෙලොව හළහ. වයස් ගත නැන්දම්මලා දෙදෙනකුන් විසින් මේ දැරිය ඉතා සන්සුන් සම්ප්‍රදාය ගරුක ආකාරයෙකින් ඇති දැඩි කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇගේ වයසේ සිටි අයට ගැළපෙන සේ වෙනස්වීම ඇයට මහත් දුෂ්කරතාවෙක් විය. මුළු ජීවිත කාලය තුළ දී ම තමා අන්‍යයන්ගෙන් වෙන් කරන ලදැයි සිතුණු ඇට තනිකම තදින් දැනී ගියේ ය. ඕ පැහැදිලි ලෙස ම ඇතුළට නැමුණු ගති දියුණු කරගෙන සිටියා ය.

ඇගේ ජීවිතයෙහි එක් ප්‍රේම සම්බන්ධයෙක් විය. එහෙත් ඒ ඇඳිම හුදෙක් කායික වූවෙකි. මානසික වශයෙන් එකට වාසය නොකළ හැකි බව වැඩි වැඩියෙන් පැහැදිලි වූ කල එය අත හැරී ගියේ ය. එතැන් පටන් ඇයට ඇගේ ජීවිතය බිඳුණු ප්‍රාර්ථනා ඇත්තක් ලෙස ද හිස් වූවක් ලෙස ද වැටහෙන්නට විය. ඕ තම කාර්යයෙන් රස විඳී. වෘත්තියෙන් ද සාර්ථක වූ ඕ කාර්යක්‍ෂමය, සමර්ථය, බුද්ධිමත්ය. එසේ වුවත් වරින් වර, අවුත් සති කිපයක් පැවැති ක්‍රමයෙන් බැස යන මානසික වැටීමෙක් ඈ වට කොට ගනී. මේ කලකිරීමට පත් අවස්ථාවල දී ඕ බොහෝ විට සිය දිවි නසා ගැනීමට සිතුවා ය. හොඳ ගති ගුණ ඇති සිත් ගන්නා වූ ඈ එතරම් තද කලකිරීමකට පත් වේ යයි කෙනකුට කවදාවත් සිතා ගන්නට බැරිය.

ඈ ලබාගත් කියැවීමට අනුව ඇගේ ඉතිහාසයෙහි සිදු වූ ප්‍රධාන සිද්ධිය නම් ජීවිත හතරකට පෙර පර්සියානු යුගයේ දී බෙඩුවින් ගෝත්‍රිකයන් විසින් ඇගේ රට කොල්ල කෑ අවස්ථාවෙක සිදු කර ගත් සිය දිවි හානියකි. එකල ඕ එහි පාලකයාගේ දුවකි. ඕ ද ඒ කොල්ලයේ දී අරාබි නායකයකු විසින් සතුරු - ඇප වශයෙන් අල්ලා ගන්නා ලද්දීය; පසුව දෙවන බාරකාරයාට පවරනු ලැබුවා ය. ඔහුට දාව ඇට දැරියක් උපනි. මේ දැරියගේ උපතින් වැඩි කල් නොයවා ඕ සිය දිවි

නසා ගත්තා ය. දූරිය ඒ රණකාමී මනුෂ්‍යයන්ගේ කරුණාවට ඇරුණාය. ඈ ජීවත් වූයේ ඔවුන් සමග ය. පසුව පරිව්‍රාජකයකු විසින් ඉතා කෙට්ටු තත්ත්වයක සිටි ඈ ගෙන සුවපත් කරන තාක් ඇගේ කල දසාව ඉතා නරක් විය.

මට සිය දිවි නසා ගත්තේ අනෙකකුගේ කැමැත්තට යටත් විමට නොකැමැති වූ නිසා පමණක් බව කියැවීමෙන් දක්වනු ලැබේ. "මේ ආත්මය මේ අත්දැකීම නිසා තමා ම තෘප්තිමත් කිරීම සඳහා පමණක් දිවි නැති කර ගැනීමේ පහත් තත්ත්වයට වැටුණා. එය කෙළේ ආත්මාරක්ෂාව සඳහා හෝ රට නැති නම ප්‍රතිපත්තියක් රැකීම සඳහා හෝ නොවේ." කියැවීමෙන් වෙනත් විස්තර බලන විට ඈ මාන්නක්කාර මුරණ්ඩු හිතුවක්කාරියක බවත් ආත්මාවමානය විඳීමට නොකැමැති ව ජීවිතය විනාශ කර ගත් බවත් පෙනී යයි.

ගොරෝසු ලෙස පෙනෙන ඇගේ ආචාර විචාර පුරුෂයකුගේ තරමට ස්වාධීනය. ඇගේ මේ මානසික ගතිය ගැන සලකා බලන විට වර්තමානයේ දී පුරුෂයන් ඇගෙන් ඈත් කරන්නේ පර්සියානු ජීවිතයේ දී කරන ලද පාපය බව පෙනේ. සමහර විට දැන් ඈ කෙරෙන් මිනිසුන් බය කොට පලවා හරින්නේ ඇගේ නැම්මේ අඩු ගතියත් තම විනිශ්චය අත් හැරීමට ඇති නොකැමැතිකමත් විය හැකි ය.

පුදුමයකට මෙන් ඕ මේ ජීවිතයේ දී නිතරම දරුවකු ලබා ගැනීමට ආශා කළා ය. ඇගේ ආරක්ෂක මහලු නැන්දණි කෙනකුන් විසින් මතු කරන ලද දුෂ්කරතා නිසා නොවේ නම් ඈ බොහෝ කලකට පෙර දී ම ගැනු දරුවකු හදා ගන්නට ගන්නවා ඇත. ඈට ලැබී ඇති නවත් පුදුම කර්ම දායාදයෙක් නම් නිතර සිය දිවි නසා ගන්නට සිතීමයි. කියැවීමෙන් ඇගේ තත්ත්වය පිළිබඳ සෑහෙන විවරණයක් ලැබිණි. ඉන් පසු ඇය සිය දිවි නසා ගන්නට සිතන්නේ නැත. එසේ නොසිතන්නේ

දුන් මුහුණ නොදෙන ප්‍රශ්නයට පසුව මුහුණ දෙන්නට වන බව දන්නා වූ ඇය සිය දිවි නසා ගැනීම ගැළවීමේ මාර්ගයක් ලෙස නොසලකන නිසා ය.

කෙසේ හෝ ඇ ලබා ගත් තවත් කියවීමෙක දී පසු වී නමුත් මේ ජන්මයේ දී ම ඇට විවාහයක් බලාපොරොත්තු විය හැකි බව කියන ලදී. මේ අතරතුර ඇගේ සම්බන්ධයට පත් හැම දෙනකුට ම හැම අයුරෙකින් ම ඇ උපකාර කළ යුතු විය. මේ අභිමතාර්ථය කොතෙක් ඉක්මනින් ලබා ගත හැකි දැයි ඇ ඇසූ විට ලැබුණු පිළිතුර නම් "ඔබ ඔබේ හොඳකම ඔප්පු කළ කල්හි එය සිදුවනු ඇත." යනු ය. කීප පොළක දී ම මේ ජන්මය ඇට ලැබී ඇති පරීක්ෂණ යුගයක් බව පැහැදිලිව තේරුම් කර දී ඇත. "මගේ ජීවිතයේ ඉකුත් වූ අවුරුදු පහ මිනිසුන්ගේ ආශ්‍රයෙන් සම්පූර්ණයෙන් ම වෙන් වූයේ ඇයි දැ" යි ඇසූ විට ලැබුණු පිළිතුර "ඔබේ මේ ජන්මයේ මූලික පරමාර්ථයේ පරීක්ෂණ යුගය එයයි" යනු ය.

දරුවකු අත හැර සිය දිවි නසා ගැනීමේ පාපයෙන් හුදෙකලා වීමෙන් හා සැමියකු නැතිවීමෙන් විපාක විඳින්නට සිදු වූ නිදසුන් දෙකක් මෙහි ඇත. ලිපි ගොනුවල තුන්වන නිදසුනක් ද තිබේ. මෙය ටෙක්සාස්හි සංගීත ආචාර්යවරියක පිළිබඳ සිද්ධියෙකි. ඒ හේතු නිසා ම ඇටත් සමාන ම තත්ත්වයක් ලැබී ඇත. ප්‍රංශ රාජ මාලිගයේ සාමාජිකාවකව සිටිය දී ඕ දිවි තොර කර ගත්තා ය.

නිදසුන් තුනක් පමණක් පදනම් කර ගෙන සිය දිවි නසා ගැනීමේ කර්ම විපාක පිළිබඳව සාමාන්‍ය නියාම සාදා ගැනීමට අපට අයිතියක් නැති බව සත්‍ය ය. සිය දිවි නසා ගැනීමේ සාමාන්‍ය කර්ම විපාකය ජීවිතාශාව අතිශයින් ම බලවත් ව තිබිය දී මැරෙන්නට සිදු වීම ය යනු මැන්ලි හෝල්ගේ *(Manly Hall; Reincarnation; The Cycle of Necessity)* මතයයි. මේ මතය

සනාථ කිරීමට නිදසුනක් අපට කේසි ලිපි ගොනුවලින් නොලැබේ. එහෙත් එය යුක්ති සහගත මතයෙකි. (අතීතයෙහි සිය දිවි නසා ගැනීම් සිදු වී ඇති නමුත් වර්තමානයෙහි කිසි ම කර්ම විපාකයක් පැහැදිලිව දක්නට නැති වෙනත් නිදසුන් කීපයක් ම කේසි ලිපි ගොනුවල ඇත. ඇතැම් විට මේ කර්මවල විපාක අනාගත ජීවිතවල දී ප්‍රකට වෙනවා ඇත.)

කෙසේ හෝ වර්තමානයේ දී තනි වීමත් විවාහ වීමට බැරි වීමත් විවිධ හේතූන් නිසා ඇති විය හැකි ය. නිදසුනක් වශයෙන් සම්පූර්ණයෙන් වෙනස් වූ කර්ම හේතුවෙක් පහත එන සිද්ධියෙන් පැහැදිලි කෙරෙයි.

මේ නිදසුන පිරික්සීමේ දී ඔස්කා වයිල්ඩ්ගේ පහත එන කෙටි කියමන සිහියට නැගේ. "ජීවිතයේ ඇත්තේ දුඃඛිත සිද්ධි දෙකෙකි. එකක් නම් ඔබට අවශ්‍ය දේ නොලැබීමයි. අනෙක නම් අවශ්‍ය දේ ලැබීමයි." මේ පුදුම පරස්පර විරෝධිත්වයෙහි හේතුව ඇත්තේ මිනිසාගේ දුප්පත් විනිශ්චයෙහි ය. මීට හින්දූන් කියන්නේ අවිද්‍යාව කියා ය. ඇතැම් සුරංගනා කථාවල දී මිනිසකුට වර තුනක් දෙනු ලැබේ. බොහෝ විට මේවායින් දැක්වෙන්නේ ඔහු මෝඩ ප්‍රාර්ථනා කරන බව ය. මේ ප්‍රාර්ථනා ලබා ගත්තායින් පසුව ඔහු විසින් ඒවායේ ප්‍රතිඵලවලට අනුව පැවැතිය යුතු වෙයි. මෙබඳු කථාවලින් කරුණු දෙකක් හොඳින් හඟවනු ලැබේ. පළමුවැන්න බොහෝ මිනිසුන් සත්‍ය වශයෙන් ම ජීවිතයේ දී තමාට අවශ්‍ය දේ හරි හැටි නොදන්නා බවයි. දෙවැන්න මිනිසාගේ දුක්වලින් වැඩි හරියක් ඔහු විසින් ම කරනු ලබන මෝඩ තෝරා ගැනීම්වලින් මතු වන බවයි. මේ තෝරා ගැනීම, වැරදි විනිශ්චය නිසා ද සීමා සහිත නැතහොත් භෞතික දෘෂ්ටිය නිසා ද වරදවා ගත් ආත්මාර්ථකාමීත්වය නිසා ද නැතහොත් දූරදර්ශී නොවූ ආත්ම ලාභය නිසා ද ඇති වේ.

පහත එන සිද්ධිය අත්ලාන්තිස යුගය තරම් අතීතයෙක දී

කරන ලද තීරණයක් පිළිබඳ නිදසුනෙකි. එහි ප්‍රතිඵලය මේ දක්වා ද විඳිනු ලැබේ. මේ සිද්ධිය හතළිස් හැවිරිදි ස්ත්‍රියක පිළිබඳ වූවෙකි. ඕ මිටි තරබාරු ස්ත්‍රියකි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ව්‍යායාම අඩුකම හා වැරදි ඉරියවු ය. ඇගේ මුහුණේ ආකාරය අතිශයින් ම අහිංසක ය. ඇගේ කේශ කලාපය හැම දා අලුත් ය. ඈ ඇන්දේ නිශ්චිත ලෙස ම නො ගැහැනු ඇඳුමෙකි. ඈ සියලු ම ඇඳුම් තෝරා ගත්තේ ඇගේ පෙනීම ලස්සන කරන අදහසකින් නොව ප්‍රයෝජනය හා වියදම පදනම් කර ගෙන ය. ලස්සන කරන්නකුගේ ද රූපය සකසන්නකුගේ හා වස්ත්‍රෝපදේශකයකුගේ ද වහල ඇට ලැබුණා නම් ඈ ලස්සන වැඩිහිටි ස්ත්‍රියක බවට හැරෙනු ඇත. ඇගේ මුහුණේ ලස්සන ක්‍රමික ය, හොඳ ය, ඈ ඉදිරිපත් වන ගතියත් සිත් අලවන ආචාරත් දියුණු කර ගෙන තිබිණි. මීට ප්‍රධාන හේතුව ඇගේ ආගමික විශ්වාසයයි.

අට වන පන්තියට පමණක් උගත් ඈ යැපුණේ කර්මාන්ත ශාලාදියෙහි අත් වැඩවල හා යාන්ත්‍රික වැඩවලත් යෙදීමෙනි. අගය මනින මනෝවිද්‍යාත්මක පරීක්ෂණයෙක දී (The Allport - Vernon Scale, Based On The Spranger Value Types - ස්ප්‍රැන්ගර්ගේ අගය වර්ග පහ පදනම් කර ගත් ඕල්පෝර්ට් වෙර්නන් තුලාව) ආගමික හා සාමාජික සාර ධර්ම පිළිබඳව ඕ වැඩි ම ලකුණු ප්‍රමාණය ලැබුවා ය. ආගමික පොත් කියැවීම හා කිසියම් වර්ගයෙක සමාජ සේවයෙක යෙදීම ඇගේ ජීවිතයේ ප්‍රධාන ඇලීම් වූ නිසා එය බලාපොරොත්තු විය යුත්තෙකි. එසේ වුවත් ඈ ගෙවන්නේ හුදෙකලා තනි ජීවිතයෙකි. ඇගේ ආගමික ආකල්පය පවුලේ අන් කෙනකුට නැත. ඇගේ ජීවිතයේ ප්‍රේම සම්බන්ධතා බෙහෙවින් අඩු ය.

මනෝවිද්‍යාඥයකුගේ දෘෂ්ටියෙන් බලන විට මේ ස්ත්‍රිය 'පුල්ලිංගික විරෝධය'[1] යයි නම් කරනු ලබන ආකල්පය පිළිබඳ

1. Masculine Protest.

පැහැදිලි නිදසුනෙකි. 'පුල්ලිංගික විරෝධය' නම් ස්ත්‍රියකගේ වැඩ කටයුතු පිළිගැනීමට ස්ත්‍රියකට ඇති වන නො කැමැත්තයි. ස්ත්‍රීන්ගේ ස්වතන්ත්‍ර භාවය ආරක්ෂා කරනු සඳහා යුද වැදීමට තරම් මෝ ස්ත්‍රී ස්වතන්ත්‍රවාදී ය. ඇගේ නො ගැහැනු ආකල්පයේ දී මෙ විරෝධය හොඳින් පැහැදිලි වෙයි. පියුරිටානු තරමට ආත්ම ලංකාරණ ප්‍රතික්ෂේප කිරීමෙහි දී හා පුරුෂයන් ඇද ගැනීමට කරන යත්න ප්‍රතික්ෂේප කිරීමෙහි දී ද එය ප්‍රකට වෙයි. මෙ ආකල්පයේ දී ප්‍රයෝජනයට ගනු ලබන මනෝවිද්‍යාත්මක උපාය සිත් ගන්නා සුලු ය. සම්මත මනෝවිද්‍යාවෙන් එය හොඳින් විවරණය කරනු ලැබේ. එහෙත් ඒ විවරණය අසම්පූර්ණ බව පෙනේ. පළමු කොට ම අපි පුල්ලිංගික විරෝධයක් ඇති වන පරිදි ඈ 'සකස් කළ' ඒ කායික හා මානසික 'දායාදයන්, පරිසරයත්' ඇති ව ඈ ඉපැදුණේ කවර හෙයින් දැයි අසමු. ඇගේ අතීත ජීවිත ඉතිහාසය ඊට පිළිතුරු සපයයි.

අතීත ප්‍රථම[1] ජීවිතයේ දී ඕ බැප්ටිස්ට් ජෝන්ගේ ළඟ ඥාතිවරියකි. ඒ නිසා ඈ වැඩුණේ තද ආගමික උනන්දුවෙක් ඇති පරිසරයෙක ය. ඇගේ වර්තමාන ආගමික නැමීමට හේතු වූයේ එයයි. ඊට ප්‍රථම පූර්වතර පලස්තීන යුගයෙක දී ඕ පුරුෂයෙකි. මෙ පුරුෂයා ලීයෙන් ද ලෝහයෙන් ද වැඩ කරන්නෙක් විය. වර්තමානයෙහි ඇගේ යාන්ත්‍රික හා ප්‍රායෝගික ආකල්පයට හේතු වූයේ මෙය විය හැකි ය. ඊට පෙර ඕ අත්ලාන්තියයෙහි උසස් පන්තියේ ස්ත්‍රියකි. අභාග්‍යසම්පන්න ප්‍රේම සම්බන්ධයෙකින් ඇයට තද චිත්ත වේදනාවෙක් හා වල්මත් වීමෙක් ඇති විය. එහි ප්‍රතිඵල වශයෙන් "මෙ ආත්මය ලෞකික වින්දනවල දී බලාපොරොත්තු කඩකරන, හෘදය වේදනා ඇති කරන අයට ප්‍රේම නො කරන්නට අධිෂ්ඨාන කර

1. මෙතැනින් ද අන්තරා භවයක් පිළිගත් බව පෙනී යයි. 168 පිට. 1. අ. ලි බලන්න.

ගන්නා ය. ආලයේ උගුල්වලින් හා අනතුරුවලින් මිදීමට නිශ්චය කර ගැනීමේ ආරම්භක අවස්ථාව අපට මෙහි දී හමු වේ.

මෙසේ ඇගේ වර්තමාන හුදෙකලා අවිවාහක තත්ත්වය විපාකාර්ථයෙන් වූ කර්ම ඵලයෙක් නොවේ. ඉහත කියන ලද සිය දිවි නසා ගැනීම් සිද්ධිවල දී අපට දක්නට ලැබුණු ක්‍රියාව හා ප්‍රතික්‍රියාව මෙහි දී දක්නට නොලැබේ. මෙහි දී අපට දක්නට ලැබෙන්නේ ප්‍රාර්ථනා ශක්තිය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන අවිච්ඡින්නතා මූල ධර්මයයි. ඕ වරක් නිශ්චයක් ඇති කරගෙන ඇගේ සහජීවින් පිළිබඳවත් ඔවුන් සමග වූ සම්බන්ධතා පිළිබඳවත් ආකල්පයක් තනා ගත්තා ය. නියම අන්ලන්තියානු පමණ ඉක්මවීමෙන් පුතුව නැවත කිසි දිනෙක අන්‍ය පුද්ගලයන් හා සමග විශේෂයෙන් ම විසභාග ලිංගිකයන් සමග ආදර බන්ධනවලට නො පැටලීමට අධිෂ්ඨාන කර ගත්තා ය. මේ නිශ්චය කර ගත්තේ ආධ්‍යාත්මික වූ හෝ මෛත්‍රී සහගත වූ හෝ අභිනිෂ්ක්‍රමණයෙකින් නො වේ. එය කැරුණේ ආදරයෙන් පසු ව අවමන් නො විඳීමට ඇති ආත්මාර්ථකාමී තෘෂ්ණාවෙනි. අතර කාලයේ දී ඇගේ අකල්පය වෙනස් කිරීමට කරුණක් ඕ කිසි දිනෙක නො දුටුවා ය. ඒ නිසා දැන් ඈ තම තීරණයේ මානසික වූ ද තර්කානුකූල වූ ද සියලු ප්‍රතිඵලවලට අනුව වාසය කළ යුතු ය. ඒ පිළිබඳව ඇගේ සිතත් චේතනාවත් වෙනස් කර ගන්නා තුරු ඒ ප්‍රතිඵල විඳිය යුතු ය.

ඇට මේ ජීවිතයේ දී විවාහ විය හැකි ද නැද්ද යන්න කියැවීමෙන් නිශ්චය කොට නො දැක්වෙයි. එහෙත් ඈ අඩු ගණනේ අන්‍යයන් කෙරෙහි ආදරයත් උනන්දුවත් දියුණු වන පැත්තට ක්‍රියා කර ගෙන යයි. ආදරය නැති කමින් ඈ එහි අගය ඉගෙන ගෙන ඇත. ඇගේ තනිකමින් ඇය තමාගේ ආලය ඉවතලීමේ පාපය පල දෙන සැටි දැක ගත්තා ය.

දෙවන සිද්ධිය සමලිංගික සේවිනී යයි බෙහෙවින් සැක

කරන ලද ස්ත්‍රියක සම්බන්ධ වූවෙකි. කේසි කියැවීම්වල කිසි දිනෙක පැහැදිලි ව කියැවී නැති නමුත් සමහර අවස්ථාවල දී සමලිංගික සේවනය ආසන්න ලිංග මාරුවක් නිසා වන බව සිතන්නට කරුණු තිබේ. පූර්ව ජන්මයෙකින් යටපත් නො කළ හැකි තරමට ප්‍රබල වූ විසභාග ලිංගික ගුණයන්ගේ පැමිණීමෙකින් එය වන බව පෙනේ.

එංගලන්තයේ උපන් මේ ස්ත්‍රිය බාල වයසේ දී ම ඇමෙරිකාවට ආවා ය. කියැවීම ලබා ගන්නා කාලයේ දී ම ඕ එක්සත් ජනපදවල විශාල නගරයෙක තම වෘත්තිය කරමින් සිටියාය. පෙනුමෙන් හා ආකාරයෙන් ඕ බෙහෙවින් පුරුෂ ගතිකය. ඇගේ හඬ පුරුෂයකුගේ මෙන් ගැඹුරු ය. ඈ අඳින්නේ සන්නාලියකු විසින් සාදන ලද පිරිමිනට ගැළැපෙන ඇඳුම් ය. පිරිමින්ගේ අභිනය හා ඉරියව් භාවිත කරන ඕ කොණ්ඩය හොඳටම කොට කර කපයි. ඈ සමලිංගික සේවිනිය යන ඇගේ යෙහෙළියන් අතර පවත්නා සැකය, මේ ලක්ෂණ දැකීමත් අවුරුදු බොහෝ ගණනක් තිස්සේ ඈ, පෙනීමෙන් හා ආකාරයෙන් බෙහෙවින් ම ස්ත්‍රී ගතික වූ ස්ත්‍රියක සමග එකට ජීවත් වීමත් පදනම් කොට ඇති වූවෙකි. ඔව්හු වෙන් නො කළ හැකි සහකාරියෝ වූහ. ඔවුන්ගේ වැඩ පිළිවෙළෙහි සමලිංගික සම්බන්ධයෙක හැම ලකුණෙක් ම විය.

ඇගේ වර්තමාන ගතිගුණ සම්බන්ධයෙන් මේ ජීවිතයට පූර්ව වූ ජීවිත දෙකෙක් බෙහෙවින් වැදගත් වෙයි. අතීත දෙවන ජීවිතයේ දී ම කුරුස යුද්ධ කාලයෙහි[1] එංගලන්තයේ ඉපිද සිටියා ය. ඕ ද ඔවුන්ගේ සැමියන් විසින් අතහැර යන ලද ස්ත්‍රීන් දහස් ගණනින් එකියක් වූවා ය. ඔවුනට ඔවුන් සඳහා ම සටන් කිරීමට සිදු විය. මේ නියම කුරුස යුද්ධ අද්දැකීම බොහෝ පුද්ගලයන් කෙරෙහි මානසික සලකුණු ඉතිරි කොට තිබේ.

1. 169 පිට බලන්න.

ඔවුන්ගේ අත් හැර දැමීමට හා තනි කමට සමහර ස්ත්‍රීන් ප්‍රතික්‍රියා කෙළේ එක් ආකාරයකට ය. තවත් සමහරුන් තවත් ආකාරයකට ය.

මෙ ස්ත්‍රිය මේ කාරණයෙහි දී සාමාන්‍යයෙන් ස්ත්‍රී වර්ගයා කෙරෙහි නැති වේගයෙකින් හා නායකත්වයෙකින් ප්‍රතික්‍රියා කළා ය. ඇට බොහෝ දුෂ්කරතාවලට මුහුණ පාන්නට සිදු වූ බව පෙනේ. ඒ තත්ත්වයේ සිටි අන්‍ය ස්ත්‍රීන්ගේ දුඃඛිත භාවය තේරුම් ගත් ඕ ඉදිරිපත් වී ස්ත්‍රීන්ගේ අන්‍යෝන්‍ය ආරක්ෂාව සඳහා ඔවුන් කිසියම් සාමූහික ව්‍යාපාරයකට සංවිධානය කළාය. "එතැන් සිට මේ නැනැත්තියගේ පුරුෂයන් කෙරෙහි විශේෂයෙන්ම අස්ථාවර ව්‍යාපාරවල නිරත වූවන් කෙරෙහි විශ්වාසය අඩු විය. කෝන්තර මතක තබා ගැනීමටත් සැක කිරීමටත් අනුන්ගේ වැඩ ගැන ප්‍රශ්න කිරීමටත් නැඹුරු වීම ඇති වූයේ මේ ආත්මභාවයෙනි."

ආක්‍රමණශීලී වූ ඇතැම් පුරුෂ ගතික ගුණ ඇගේ ආත්මයෙහි පහළ වූයේ මේ ආත්මයේ දී ය. ඒ ගුණවල මුල් හට ගැනීම (අඩු ගණනේ මේ වතාවට) මෙය යයි අපට පිළිගත හැකි ය. එසේ කියන්නේ ඊට කලින් ජන්මයෙහි පලස්තීනයේ ස්ත්‍රියක ව සිටි මැගේ පුරුෂ ගතික නැඹුරුකම් ඇති බවක් කියැවීමෙහි සඳහන් නොවන හෙයිනි. කුරුස යුද්ධ යුගයේ අවසානයේ දී මේ පුරුෂ ගති කොතරම් ප්‍රකාශයට පත්වූවා ද යතහොත් ඕ ඊළඟ ආත්මභාවයේ දී පුරුෂයකුව උපන්නා ය. නැවත වරක් එංගලන්තයෙහි උපන් ඕ ජෝන් ස්මිත්ගේ පැමිණීමෙන් ටික කලකට පසුව හාඩිකාසල් සමග ඇමෙරිකාවට පැමිණි නිර්භීත මිනිසුන්ගෙන් එකෙක් වූවා ය. එකල ඇගේ නම ජේම්ස් බුහනනය. මංකොල්ලකාරයකු ද නාස්තික දෘෂ්ටිකයකු ද වූ ඕ නැගෙනහිර වෙරළට ආසන්න රාජ්‍යවල හැම තැන ම ඇවිද්දා ය. පසුව ඕ තවත් වික්‍රමකාරීන් සමඟ රට

මැදට ගියා ය. දූත් අපට ඕ පුරුෂ ගතික ආත්මයක් වී ගැහැනු සිරුරෙක සිටිනු දක්නට ලැබේ. ඒ සිරුරත් බොහෝ දුරට පුරුෂ ශරීරයක් බඳු ය. ඈ ඇත්ත වශයෙන් ම සම ලිංගික සේවිනී නම් (මේ කරුණ ගැන නිශ්චිත තොරතුරු නැත.) සිද්ධියේ සිත් ගන්නාකම ද්විගුණ වේ. ඈ එසේ නො වූවත් මේ තත්ත්වයෙහි විශාල මනෝවිද්‍යාත්මක වටිනා කමෙක් ඇත. එසේ කියන්නේ එයින් අප, අතිශයින් වැදගත් වූ ප්‍රතිපක්ෂතා* මූල ධර්මය ඉදිරියට පමුණුවන හෙයිනි.

පුද්ගලයකුගේ ආත්මයෙහි ප්‍රබල ව ඇත්තේ ස්ත්‍රී ගති පුරුෂ ගති යන මෙයින් එකක් නමුත් "හැම පුද්ගලයෙක් ම ස්ත්‍රියක් ද පුරුෂයෙක් ද වේ." යන සත්‍ය වූ මතය ගැන යුං නම් මනෝවිද්‍යාඥයා සවිස්තර ව කරුණු දක්වා ඇත. පුද්ගලයකුගේ ශරීරයෙහි තම ලිංගයේ ඉන්ද්‍රිය මෙන් ම ප්‍රතිපක්ෂ ලිංගයේ අසම්පූර්ණ ඉන්ද්‍රියය ද අඩංගුව ඇත්තා සේ මනුෂ්‍ය ආත්මයෙහි ද ප්‍රතිපක්ෂ ලිංගයට අයත් යයි කිව යුතු වූ, තාවකාලික ව යටපත් කරන ලද, නොදියුණු ශක්ති ඇත්තේ ය. අවුරුදු ගණනක් කරන ලද චිකිත්සාගාරික නිරීක්ෂණවලින් යුං විසින් සොයා ගන්නා ලද මේ මනෝවිද්‍යාත්මක සත්‍යය මනුෂ්‍යාගේ සම්භවය හා සංවර්ධනය පිළිබඳ කේසි කියැවීම් හා හොඳින් ගැළපෙයි.

කේසි මතය කෙටියෙන් මෙසේ යඃ සියලු මනුෂ්‍යාත්ම මැවී ඇත්තේ ලිංග රහිත ව දිව්‍යමයව ය.[1] එහෙත් ප්‍රතිපක්ෂතාවේ නැතහොත් ලිංගයේ මූල ධර්මය විශ්වයේ නිර්මිතියට ම අයත් මූල ධර්මයන්ගෙන් එකෙකි. ද්‍රව්‍යයත් සමග ආත්ම පැටැලී

* කේසි කියැවීම්, කොතනැක දී වත් 'Polarity' (ප්‍රතිපක්ෂතාව) යන වචනය යොදන්නේ හෝ ඒ මූල ධර්මය පිළිබඳ පැහැදිලි ප්‍රකාශයක් කරන්නේ හෝ නැත. එය කේසි කියැවීම්වල එන කරුණුවල ව්‍යාඛ්‍යානයක් ලෙස මේ ලේඛිකාව විසින් ඉදිරි පත් කරනු ලබන්නකි. එය ඒ කියැවීම්වල ඇති කරුණු සමගත් පුරාතන ග්‍රීකයන් දන සිව් සිද්ධි හා මූල ධර්ම සමගත් ගැළපේ.)

1. මේ මතය අග්ගඤ්ඤ සූත්‍රයෙහි එන මතය සමග ද ගැළපේ.

හුයේ විවිධ ප්‍රතිපක්‍ෂතා නියාම ධර්මවලිනි. පළමු කොට ඔව්හු ලිංග දෙක ම ඇති උභතෝබ්‍යඤ්ජනකයෝ වූහ; ඉන් පසු ද්විලිංගික වූහ. අත්ලන්තියානු ඉතිහාසයේ මුල් ශත වර්ෂවල ලිංගික ශක්තිය වරදවා භාවිත කිරීමෙන් ඇති වූ විකාර රූප පිළිබඳ පුදුම නිදසුන් ඇත. දැන් පවත්නා ද්විලිංගික තත්ත්වය අපගේ සංවර්ධනය තුළ ඇති එක් අවස්ථාවෙක් පමණි. සමහර විට මෙය ආධ්‍යාත්මික මට්ටමෙක වූ උභතෝබ්‍යඤ්ජනකත්වයට නැඹුරු වෙනවා විය හැකි ය.

ස්ත්‍රී පුරුෂ යන විපක්‍ෂතා දෙකෙහි එක එකක් පාසා ඊට අයත් විශේෂ ගුණ ඇත. අඩු ගණනේ අපේ සංස්කෘති යුගයේ දී විශේෂ පුරුෂ ගති හා විශේෂ ස්ත්‍රී ගති පහත එන අයුරින් වෙන් කොට දැක්විය හැකි ය. ශක්තිය හා ආක්‍රමණශීලීත්වය, නිශ්චිතත්වය, ආධිපත්‍යය හා තර්කශත්වය යන මේවා පුරුෂ ගුණ ය. යටහත්කම නිෂ්ක්‍රියත්වය, ශාන්ත භාවය හා කරුණාව යන මේවා ස්ත්‍රී ගුණ ය.

කිසියම් ආත්මයක් එක ම සංස්කෘතික යුගයෙක දී ස්ත්‍රී ශරීරයෙක හෝ පුරුෂ ශරීරයෙක දිගට ම ඉපැදීම නිසා මේ එක් ගුණ සමුදායයක් පමණ ඉක්මවා දියුණු වීමෙන් ඒක පාක්‍ෂික වීමේ අනතුරට පාත්‍ර වූවා යයි සිතමු. මෙය ඒ පුද්ගලයාට ද ලෝකයේ සෙස්සනට ද නියම අනතුරෙකි. අපට ඒ සම්බන්ධව ඉතා හොඳ නිදසුනෙක් නට්සීන්ගේ දර්ශනයෙහි හා චරිතයෙහි දක්නට ලැබේ. නට්සීන් විසින් ආදර්ශයට ගනු ලබන උත්තර මනුෂ්‍යයා උත්තර පුරුෂයකු මිස උත්තර මනුෂ්‍යයෙක් නොවේ. නට්සීන්ගේ ආදර්ශය, ශක්තිය, බලය, ආක්‍රමණශීලීත්වය, ආධිපත්‍යය, පෞරුෂය හා ආත්මාර්ථකාමය යන පුරුෂ පාක්‍ෂික ගුණ උසස් කොට දක්වයි. මේ ගුණ අවශ්‍ය ය. ඒවාට තැනෙක් ද ඇත. මේවා ප්‍රේමයේ හා ආත්ම පරිත්‍යාගයේ ස්ත්‍රී ගුණවලින් මෘදු නොකළ හොත් ක්‍රෑරත්වයට, තෘෂ්ණාවට හා උමතු

අහංකාරයට හැරෙයි. දැනට ම ලෝකය මෙ ආදර්ශයෙහි දරුණු විපාක දැක තිබේ.

හුදෙකලා වූ පුරුෂත්වය අසම්පූර්ණ ය. වැඩි අවධාරණයෙන් එය නරකට හැරේ. ඒ නිසා එහි අඩුව ස්ත්‍රී පාක්ෂික ගුණයන්ගෙන් පිරවිය යුතු ය. ප්‍රතිපාක්ෂිකයන්ගෙ සංයෝගයක් වූ විවාහයෙන් මෙ ඌනපූරණය එක්තරා ප්‍රමාණයකට සිදු වේ. විවාහයේ එක් එක් හවුල්කාරයා අනෙකා විසින් එක්තරා ප්‍රමාණයකට සැර බාල කොට මෘදු කරනු ලබයි. එහෙත් මෙ සංස්කරණය එපමණෙකින් ම සම්පූර්ණ නොවේ. වැඩි වශයෙන් පුරුෂ වූ ආත්මයක් එක් ජීවිත කාලයෙක දී ඔහුගේ සහකාරිය විසින් ස්ත්‍රී ගුණ පක්ෂයට නැඹුරු කරන්නේ සුළු ප්‍රමාණයෙකිනි. මෙසේ ම ස්ත්‍රියක වෙනස් වන්නේ ද සුළු ප්‍රමාණයෙකිනි. අනුක්‍රමයෙන් ස්ත්‍රී පුරුෂ ශරීරවලට මාරුවෙමින් කෙරෙන ජන්ම ග්‍රහණයෙන් අපට අවශ්‍ය වන, පරස්පර වශයෙන් නිවැරැදි කර දෙන, අද්දැකීම් ලැබෙයි. මෙසේ නැවත වරක් පුනර්ජන්මවාදය මනෝවිද්‍යාවට අවශ්‍ය නව මානය සපයන බව දක්නට ලැබේ. ආත්මයේ පූර්ණත්වය ලබා ගත හැක්කේ නැවත නැවත සිදු වන පුනර්ජන්මවලින් පමණි. අධිපති බවත් යටහත් කමත් යන දෙක, බලයේ පූර්ණ සමවෘත්තියක් බවට හරවා ගත හැක්කේ මෙ ක්‍රමයෙන් පමණි. ඊශ්වරේච්ඡාවට කීකරු වන[1] උත්සාහවත් ආත්මයක් ඇති වන්නේ ඒ මාර්ගයෙනි.

අප විසින් මොහොතකට පෙර සලකා බලන ලද්දේ ශාරීරික ලිංගය පිළිවෙළින් මාරු කිරීමෙන් ආත්මය සකස් කර ගැනීමට කරන ලද යත්නයක් පිළිබඳ සිත් ගන්නා නිදසුනෙකි. මේ ආත්මය පළමුව ස්ත්‍රියක වශයෙන් ද ඊට පසුව පුරුෂයකු වශයෙන් ද ජන්ම දෙකෙකින් නිශ්චිත පුරුෂ ගුණ දියුණු කර ගෙන තිබේ. ඈ එසේ කර ගෙන ඇත්තේ ශාන්ත භාවය,

1. මෙ තැනට බෞද්ධයන් විසින් "ධර්මය අනුව යන" යනු යොදාගත හැකි ය.

සුන්දරත්වය, සමාව, සහනය හා ඉවැසීම පරදුවට තබා ය. නැවත වරක් පුරුෂ ශරීරයෙක ඉපැදීමෙන් සිදු විය හැක්කේ දැනටමත් පමණ ඉක්මවා ඇති නැම්මක් තවත් වැඩි වීම ය. එනරම අධිකව දියුණු කරන ලද පුරුෂ ගතින් ඇතිව ස්ත්‍රී ශරීරයෙක ඉපැදීම මනෝවිද්‍යාත්මක ප්‍රතිකාරයෙකි. ඇගේ සැකැස්මේ ඇති නොසමබර බව, ඇතුළත හා පිටත අතරත් ගුණය හා ශරීරය අතරත් වූ වෙනසින් හා සමාජය විසින් ඇගෙන් බලාපොරොත්තු වූ කායික කාර්යයෙන් ද වඩාත් පැහැදිලි වෙයි. ඇගේ ස්ත්‍රී ගුණ අඩුකම මේ ක්‍රමයෙන් ප්‍රකට වී කරදරයක් වන්නට ඇත. ඇතුළත වෙසෙන ආත්මයාගේ අවධානය පිළියම් පිණිස වූ සමබරතාවෙක අවශ්‍යතාවට යොමු විය යුතු ව තිබිණි. ඒ නිසා සම ලිංගික සේවී වීමට තමාට ඉඩ දෙන පුරුෂ ගතික ස්ත්‍රීනුත් ස්ත්‍රී ගතික පුරුෂයනුත් කලින් තුබූ තත්ත්වය කරා ආපසු යෑමෙන් තමාට පුරුදු පහසු මාර්ගයක් ගන්නා බව පෙනේ. ඇතැම් විට ඔවුන් ඔවුන්ගේ ශරීර ඔවුනට උගන්වන්නට තතනන සමබර කිරීමේ පාඩම ඉගෙනීම ප්‍රතික්ෂේප කරනවා විය හැකි ය.

මෑත අතීතයේ දී පුරුෂයන් ලෙස ඉපිද සිටීමෙන් ඇති වූ පුරුෂ ගතිවලින් යුක්ත ස්ත්‍රීන් පිළිබඳ තවත් බොහෝ නිදසුන් කේයි ලිපි ගොනුවල ඇත. ආසන්න වූ පුරුෂ ජන්මයක් නිසා ඇති වූ පුරුෂ ගති තිබීමෙන් විවාහය ඒකාන්තයෙන් ම වළකින්නේ නැති නමුත් එයින් විවාහය බොහෝ දුෂ්කර වන බව පෙනේ. එයින් බොහෝ විට දරුවන් ඇති කිරීමේ ශක්තිය නැති වන බව පෙනේ. ගැබ් ගැනීම දුෂ්කර වූ ද කොහෙත් ම නො හැකි වූ ද බොහෝ ස්ත්‍රීනට එහි හේතුව ළඟ දී සිදු වූ ලිංග මාරුවීම බව කියා ඇත.

කෙසේ හෝ එකලා බවේ කර්ම හේතු කීපයක් ඇති බව පෙනේ. සිය දිවි නසාගැනීම, ආලය නොකිරීමට නිශ්චය කර

ගැනීම, අන්‍ය ලිංගික ජන්මයෙකින් පැමිණි විසභාග ලිංගික ගති දියුණු වීම යන මේ කවරක් වුව ද එකලා බවට හේතු විය හැකි ය. හේතුව කුමක් වුව ද අනෙක් ඕනෑ ම තත්වයක් මෙන් මෙය ද අභ්‍යන්තර ගුණ වගාවට හා ආත්ම ප්‍රතිසංස්කරණයට ලැබී ඇති අවස්ථාවක් බව පිළිගත යුතු ය. විවිධ වික්‍රමයන්ගෙන් පසු ව කැන්ඩිඩ්' "අපි අපේ ගෙවත්ත වගා කරමු" යයි කීවේ ය. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම තමන් එකලා බවේ නිසරු කුඩුවට අසු වී ඇතැයි හැඟී ගිය විට මේ ප්‍රඥාව තමන් සඳහා ම යොදා ගත හැකි ය.

සහකාරත්වය ලැබීමට නම් ඊට සුදුසු විය යුතු ය. මිත්‍රයන් ලැබීමට නම් අප ළඟ මිතුරුදම් තිබිය යුතු ය. ආලය ලැබීමට නම් අප ආලය පිදිය යුතු ය. එකලා වූවනට තමන් කැමැති වන දෙය සඳහා යෝග්‍ය වීමට අවශ්‍ය වූ ගුණ දහම් තමන් තුළ වගා කිරීමෙන් ආලයේ පාරප්‍රාප්තිය ඉක්මනින් ළඟා කර ගත හැකි ය.

1. Candide

# 15

## විවාහයේ ඇතැම් ගැටලු

සහකාරයා හෝ සහකාරිය තෝරා ගැනීමෙන් ඒ දෙපක්ෂය ම නිශ්චිත වූ කර්ම විපාක සම්බන්ධතාවකට හෙවත් ආධ්‍යාත්මික වශයෙන් නිශ්චිත වූ පරස්පර කාරිත්වයකට ඇතුළු වූවාහු වෙති. විවාහය පිළිබඳ ව ඇති කේන්ද්‍ර කියැවීම් ගැඹුරට පරීක්ෂා කිරීමෙන් අතීතය හා අනාගතය යන දෙක ම සම්බන්ධයෙන් අඹුවක හෝ සැමියකු තෝරා ගැනීමේ ඇති වැදගත්කම පිළිබඳ ව සාමාන්‍ය නිගමන කොටසක් ඇති කර ගත හැකි ය. නාට්‍ය උපමාවෙක වචනවලින් කියත හොත් අපට මේ තත්ත්වය පහත එන ලෙස ප්‍රකාශ කළ හැකි ය.

විවාහ වීමට තීන්දු කර ගැනීමෙන් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් තමන් නොදැනුවත්ව ම තමන් සමග පෙර වරක් හෝ වැඩි වාර ගණනක් එකට අද්දැකීම් ලැබූ කිසියම් නළුවකු හෝ නිළියක සමග නැවත වරක් වේදිකාවේ පෙනී සිටීමට එකඟ වෙයි. මෙසේ ඔව්හු තම වර්තමාන ජීවිත නාට්‍යය සඳහා කිසියම් විශේෂ වේදිකා පරිසරයක් මතු කර ගනිති. මේ වේදිකා පරිසරය සත්‍ය වශයෙන් ම පිළිවෙළින් වූ කොටස් දෙකෙකින් හෝ තුනෙකින් යුක්ත විය හැකි ය. ඇතින් ම එහා ම වූ පසුබිමෙහි

තියුණු සියුම් උපකරණවලින් දිලිසෙන අත්ලන්තිසයේ පරීක්ෂණාගාරයක් තිබිය හැකි ය. ඊළඟට ඊට මොබින් ඉදිරියට වන සේ ග්‍රීසියේ කඳු මුදුනක් යට තනන ලද එළු පල්ලකුගේ පැලෙකි. අන්තිමට ඉදිරි බිමෙහි කිට්ටුවෙන් ම ඇත්තේ දාසය වැනි ලුවීගේ යුගයේ වූ සිත්කලු විසිත්ත කාමරයෙකි.

දැන් ඔව්හු ප්‍රංශයේ ශෝභාවත්, අතිපණ්ඩිත රාජ සභාවේ දී ඔවුන් විසින් නිරූපණය කරන ලද නාට්‍යයේ සූත්‍රත් අතට ගනිති. තරඟය, කුමන්ත්‍රණය, පවා දීම හා ද්‍රෝහීවීම, දූතට ඉකුත් වූ අංකවල සිද්ධීන්ගේ උත්ක්‍රමයයි.[1] ප්‍රංශයේ දී සිදු වන යටපත් කළ නොහැකි ද්වේෂයෙක් හා මිනී මැරීමෙක් එහි උච්චාවස්ථාව [2] ලෙස ඇත. එසේ නැති නම් ඉකුත් කාලවල දී සිද්ධිවල දරුණුකම ක්‍රමයෙන් අඩු විය හැකි ය. අහංකාරය, ආත්මාර්ථකාමය, උපහාසය, උදාසීනත්වය ආදී දරුණුකමින් අඩු මානසික ක්‍රෑරතා ගැටීමේ තැනෙක ම ස්වරූප විය හැකි ය.

එහෙත් නාට්‍යයේ පූර්ව සිද්ධිය කුමක් වුවත් මේ නව රඟපෑමේ ප්‍රධාන නළුවන් දෙදෙනාට ඕනෑ ම අවස්ථාවෙක දී කථා වස්තුවේ ඉදිරි ගමන වෙනස් කළ හැකි සේ වේදිකාව සකස් වී ඇත. එහෙත් බස ලියැවී නැත. දෙල්ලාර්තේ [3] නම් ප්‍රසිද්ධ ඉතාලි සුඛාන්ත නාට්‍යයේ පසුබිම හා සාමාන්‍ය කෙටි දළ සටහන සමාගමයෙන් කල් තියා නියම කරන ලදී. එහෙත් නළුවෝ තම බස අවස්ථාවට අනුව යොදා ගෙන අවස්ථා හා තීරණ ඇති කර ගනිමින් ඉදිරියට යති. මේ නව නාට්‍යයේ ද නළුවනට නිදහසේ ගලා ගෙන යන කථා වස්තු මාර්ගය ඕනෑම අවස්ථාවෙක වෙනස් කිරීමට නිදහස තිබේ. එයින් ඔවුනට පූර්ව අංකයන්හි තුබූ දුර්වලතා නැති කර ගත හැකි ය.

නැතිනම්, නාට්‍යෝපමාවෙන් ඉවතට යමු. අන් හැම දෙයක්

1. Crescendo 2. Climax 3. Dell' Arte

පිළිබඳව මෙන් ම විවාහ සහකාරයා පිළිබඳවත් හැම පුද්ගලයකුට ම චේතනාවේ හා තෝරා ගැනීමේ නිදහස තිබේ. එහෙත් තෝරා ගැනීමේ ක්‍රියාව බසයකට නැගීමේ ක්‍රියාව මෙනි. බසයට ගොඩ වූ පසු මගියා එක්තරා මාර්ගයකට ද එක් සාමාන්‍ය දිශාවකට ද සීමා වේ. වෙනත් බසයකට නැග ගත්තේ නම් මාර්ගයත් යන අතත් මීට වෙනස් වනු ඇත. බසයේ ඇතුළත පරිසරය ද මගියාගේ රුචියට නො ගැළපෙනවා විය හැකි ය. රියැදුරා ගොරෝසු අප්‍රසන්නයකු විය හැකි ය. බසයේ ඇති වාතාවරණයෙහි හුස්ම ගැනීම් දුෂ්කර විය හැකි ය. ජනෙල් හුළං නො එන සේ වසා තිබෙනු ඇත. අසුනේ හවුල්කරු විරුද්ධ විය යුතු තරම් වාචාලයකු වනු නො බැරි ය. කලින් නො දුටු කරුණු රාශියක් නිසා අනෙක් මඟ තෝරා ගත්තා නම් මීට වඩා හොඳ වන්නට ඉඩ තිබිණි. එහෙත් මුළු ගමන දිගට ම රැක ගත යුතු ආකල්පයත් සාමාන්‍ය හැසිරීමත් තීන්දු කර ගත යුත්තේ මේ මගියා විසින් ම ය. පරිසරය කුමක් වුවත් පුද්ගලයකුගේ ආකල්පයට හා හැසිරීමට අන්තිමේ දී වගකිව යුත්තේ ඔහු විසින් ම ය.

කේසි කියැවීම්වල, කර්ම විපාක වශයෙන් විවරණය කරන ලද විවාහය පිළිබඳ නිශ්චිත නිදර්ශන ගණනාවෙක් ඇත.

දැන් සලකා බලනු ලබන පුදුම නිදසුනේ දෛවය තරම් ග්‍රීක නෙමිසීස් [1] අකාරුණික වී නැත; භයානක විනිශ්චයෙහි දී ග්‍රීක ශෝකාන්ත නාට්‍යයෙක් මෙතරම් බිහිසුණු වී නැත. මේ සිද්ධිය සම්බන්ධ ස්ත්‍රිය විවාපත් වූයේ වයස විසි තුනෙක අතිශයින් රූමත් තරුණියක වශයෙනි. පියකරු දුඹුරු ඇස්, මනහර කළු දුඹුරු කෙස්, නළල් තල මත සෙලවෙන කියඹු වැල, සුන්දර රූපය යන මේ සියල්ල එකතුව ඇට නිළියකගේ පෙනුම දෙන්නට රහසින් කුමන්ත්‍රණය කළාක් බඳු ය. කේසි -

1. නෙමිසිස් නම් ග්‍රීකයන්ගේ පළිගැනීමේ දෙවියා ය.

කියැවීම ලබා ගත් හතළිස් එක්වැනි වියෙහි දිත් දුටුවන්ගේ හිස් නැවත හරවා බලවන තරමට මෝහන සෞන්දර්යයක් ඇට තිබිණි. විලාසිතාවලට ප්‍රිය කළ ධනවත් මිතුරියන් ඇගේ ජීවිතයේ අභ්‍යන්තර කථාව දැන ගත්තා නම් සත්තෙකින් ම පුදුම වනු ඇත.

අතිශයින් සමෘද්ධිමත් වූ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයකු සමග විවාපත් වූ තැන් සිට ඉකුත් වූ දහ අට අවුරුදු කාලය තුළ ඇය ගෙන ගියේ අතිශයින් දුෂ්කර වූ හැඟීම්වලින් පුණු විසුණු වූ අද්දැකීම් ඇති ජීවිතයෙකි. ඇගේ සැමියා ලිංගික සම්බන්ධතාව සඳහා සම්පූර්ණයෙන් ම අසමර්ථ ය. ලිංගික කාර්යයෙහි අවශ්‍යකමක් නැති, එයින් ප්‍රීතියක් නො ලබන ස්ත්‍රියකට නම් එබඳු සැමියකු ලැබීම එතරම් ශෝක ජනක නො වනු ඇත. එහෙත් ප්‍රේමයට කැමැති අතිශයින් කාමුක තැනැත්තියකට එය මහා ශෝකාකරයෙකි. විවාහය අවලංගු කළා නම්, නැතහොත් දික්කසාද වූවා නම්, දුෂ්කරත්වය තිකම් ම කෙළවර වනු ඇත. එහෙත් මේ ස්ත්‍රියට ඒ එක් පියවරක් වත් ගත නො හැකි විය. ඕ තම සැමියාට ආලය කළා ය. ඔහුට රිදවීම ඇට නො දැරිය හැකි ය.

මුල් අවුරුදු කිහිපය තුළ දී බලාපොරොත්තු සුන්කර ගෙන අන් මිනිසුන් සමඟ සම්බන්ධතා කීපයක් ඇති කර ගත් කාලයෙක් තිබිණි. ඈ ඊට සම්බන්ධ වූයේ කයේ හා හැඟීම්වල උවමනාව නිසා මිස තම සැමියාට භක්තියක් නො තුබූ නිසා නො වේ. එහෙත් ඕ ධර්ම ග්‍රන්ථ හැදෑරීමෙන් හා භාවනා පුහුණු කිරීමෙන් ඒ ආවේගය ද ක්‍රමයෙන් යටපත් කර ගත්තා ය. මේ පුදුම රාමුවේ දහ අට අවුරුද්දක් ජීවිතය ගමන් කළ පසු ය අවදානම ළං වූයේ. ඇගේ පෙර පෙම්වතෙක් නැවත වරක් ඇට හමුවිය. ඕ කේසිට මෙසේ ලියයි: අප හමු වූ මොහොතේ දී ම ඒ ගිනි දැල්ල පූර්ණ ශක්තියෙන් යුතු ව ඔහු කරා ආවේ ය.

මම ද නෙපුල් දුන්නෙමි. මම අප ගළවා ගැනීමට උත්සාහ ගතිමි. එහෙත් ධර්මය හැදෑරීමට පෙර මෙන් දූන් මගේ සෞඛ්‍යය පුරිහී ගෙන යයි.....ඔහු විවාහ නොවී සිටියා නම් ඔහු හා විනෝද වීමට මා පසු බසින්නේ නැත. ඔබට සිතා ගත හැකි කරුණු කීපයක් නිසා මා මගේ සැමියා අත හරින්නට කැමැති නැත. මගේ සැමියා දූන් ලස්සන චරිතයක් ඇත්තෙකි......

"මේ මිනිහාට මගේ ඇති ආශාව ආලය නිසා නො වන්නට ඉඩ තිබේ. එය මගේ ජීවිතයේ විශේෂ පරිසරය නිසා ඇති වූවක් විය හැකි ය. කෙසේ හෝ ඔහු ද කදිම පුද්ගලයෙකි. ඔහු මට බාල කාලයේ සිට ආලය කළ නමුත් මා එය දූන සිටියේ නැත. (එය මට කීවේ ඔහුගේ මව ය.) අඹුවක නඩත්තු කිරීමට සමත් වන තාක් ඔහු මට එය නො කීවේ ය. ඔහු පමා වූවා වැඩි ය. මට එය දූන ගන්නට ලැබුණේ මගේ සැමියාට බහ දුන් බව දූන්වීමට මා ගෙදර පැමිණි විට ය. දිගින් දිගට ම කරුමයකට මෙන් මට සිදු වූ දේවල් නිසා අපේ ජීවිත තුන ම හිර වී තිබෙන බව පෙනේ.

වරින් වර මම ඔහු කිට්ටුවෙන් ආශ්‍රය කෙළෙමි. එසේ කිරීමට එක් හේතුවෙක් නම් ඔහු විනාශ වන්නට යෑම ය. එයින් ඔහුගේ ආශාවේ රෝගය සුව වේ යයි මම සිතමි. එය යටි සිත පිළිබඳ මනෝවිද්‍යාත්මක වූ විරේචනයක් විය හැකි ය. ඔහුගේ ප්‍රියාව කළඹන්නට මා නොකැමැති වූ නිසා මම එය අත් හළෙමි. මම ඈ දනිමි. මට ඕ ප්‍රිය ය. ඈ කළඹන්නට මට අනවශ්‍ය ය. සමාජය ඊට විරුද්ධ ය. ඈය එය දූන ගතහොත් ඇගේ දෘෂ්ටියෙන් එය වරදක් වනු ඇත. මට කාටවත් රිදවන්නට උවමනා නැත. ඔහුට විහිළු කිරීමෙන් නැති නම් දිගට ම සති ගණනක් කරදර කිරීමෙන් ඈ තමාට අවශ්‍ය හැම දෙයක් ම ඔහුගෙන් ලබා ගනී. එහෙත් මා සිතන්නේ ඔහු ඈට කැමැතිය කියා ය. ප්‍රසිද්ධියේ ඔහු හෙළා දූකීමට ඈ පසු බසින්නේ නැති නමුත් ඇගේත් හොඳ ගුණ කීපයෙක් තිබේ. ඈයට දරුවන් නො ලැබේ. මා

ඔබෙන් කායික උපකාරයක් ඉල්ලන බව මගේ සැමියා දනී, එහෙත් මේ තත්ත්වය නොදනී."

දැන් මෙහි ඇත්තේ ස්ත්‍රියගේ ජීවිත ගැටලුව පිළිබඳ ව ඇගේ ම ප්‍රකාශන යයි.* ඒ ඇති සැටියෙන් ම ගත්තත් එය බෙහෙවින් ම නාට්‍ය ස්වරූපී ය. ඇගේ ගැටලුවේ අතීත හේතු දක්වන ජීවිත කියැවීම ඇති කර වන්නේ ගෞරව සම්ප්‍රයුක්ත භයෙකි. වරදට වැටුණු දෙහදක් විඳින දඬුවමේ සුදුසුකම විසිතුරු ය.

දැන් අප ජීවිත දෙකකට පූර්වයෙන් කුරුස යුද්ධ කාලයේ වූ ප්‍රංශයට යා යුතු ය. මෙහි දී බිරියගේ නම සුසේන් මර්සේලියෝ ය. මෙවර ද ඈ විවාහ වී ඇත්තේ ඇගේ වත්මන් සැමියා සමගය. මස්ය මර්සේලියෝ ද කුරුස යුද්ධ කෙරෙහි ඇදී ගිය සිත් ඇති වික්‍රමකාමී පුරුෂයන්ගෙන් එකෙකි. ආගමික උද්‍යෝගයෙන් යුක්ත අන් බොහෝ දෙනාගේ මෙන් ඔහුගේ ද පෞද්ගලික ජීවිතය පැවැතුණේ ඔහුගේ ආගමික ප්‍රතිඥාවන්ගෙන් හා ප්‍රතිපත්තිවලින් සම්පූර්ණයෙන් වෙන් කරන ලද කාමරයෙක ය, ඔහුට ඉතාමත් වැදගත් වූයේ ගැළවුම්කාරයාණන්ගේ මිනිවළ මිථ්‍යාලබ්ධිකයන්ගේ අයිතියෙන් මුදවා ගැනීමයි. ඒ ගැළවුම්කාරයාණන් විසින්

* මේ ලිපියෙන් පාඨකයාට වැරදි හැඟීමක් ඇති වන්නට ඉඩ තිබේ. කේසිගේ ජීවිත කියැවීම ලබා ගත් මිනිසුන් තම ජීවිත තත්ත්වය පිළිබඳ සම්පූර්ණ විස්තර කේසිට දෙන්නට ඇතැයි ද කේසිට තිබුණේ තම නින්දෙහි දී මේ කරුණු තවත් විස්තර කිරීම යයි ද සිතන්නට ඉඩ ඇත. මෙහි සඳහන් කරන ලද ස්ත්‍රිය වැනි බෙහෙවින් පීඩාවට පත් කීප දෙනකුත් මතු සඳහන් වන එක් ආතුරයකුත් කියැවීම් ලබා ගැනීමට පෙර තමන්ගේ ජීවිත විපත් ගැන දිගට ලියූහ. එහෙත් මේවා විශේෂ සිද්ධි මිස සාමාන්‍ය තත්ත්වය නො වේ. කියැවීමක් ඉල්ලන අය විසින් දිය යුතු වූයේ තම නම, උපන් දිනය හා තැන පමණි. කියැවීම් ඉල්ලූ වැඩි දෙනෙක් ඉල්ලුම් පතුයේ හිස් තැන්වල ඉහත දක් වූ කරුණු සඳහන් කළාට වැඩි දෙයක් නො කළාහ. නැතහොත් ටිකක් පමණක් දුන්හ. ඔවුන්ගේ තත්ත්වයෙහි ස්වභාවය ගැන ඔවුන් සඳහන් කළා නම් නිතර ම එය කෙළේ ඉතා ලුහුඬිනි.

උගන්වන ලද ප්‍රධාන ම ධර්මය වූ මෛත්‍රිය සිය බිරිය කෙරෙහි යොමු කරවන්නට කවදා වත් ඔහුට සිතුණු බවක් නො පෙනේ.

මෙසේ ඔහු මිථ්‍යාලබ්ධිකයන්ගෙන් ක්‍රිස්තියානි රාජ්‍යය බේරා ගැනීමට තම බිරිය අත් හැර යන විට තමාගේ අනභිමුඛයෙහි ආරක්‍ෂා විය යුතු වූ තවත් දෙයක් ඔහුට තිබුණේය. එනම්, තම බිරියගේ පතිව්‍රතයයි. මහා වීර පරිත්‍යාගයක් කිරීමට තමා පෙළැඹ වූ ආගමික උනන්දුව එම පරිත්‍යාගය සඳහා තම බිරිය නො පොළඹවනු ඇතැයි ද සැනැසීම සඳහා ක්‍රිස්තියානිය වැළඳ ගනු වෙනුවට ඈ ඉතිරි ව සිටි ක්‍රිස්තියානි පිරිමින් වැළඳ ගනු ඇතැයි ද සැක සිතු හේ එබඳු සහනයක් ලබා නො දෙනු සඳහා හොඳින් වග බලා ගත්තේ ය.

දක්‍ෂතාවෙන් නිමවන ලද පතිව්‍රතා පටිය නම් වූ උපකරණයෙක් ඇත. මෙය දොළොස් වැනි ශත වර්ෂයේ අපරභාගය තරම් ඈතෙක දී යුරෝපයේ ප්‍රසිද්ධ ව පැවැති එකෙකි. 1934 තරම් මෑතෙක දී ප්‍රංශයේත් 1931 දී නිව්යෝක් නගරයේත් භාවිත වූවෙකි. මේ අවස්ථාවේ දී මෙය බලයෙන් යෙදවීම නඩු දෙකෙක ප්‍රධාන කරුණක් වී තිබේ. එය ලෝහයෙන් හා සමින් හෝ ලෝහයෙන් හා විල්ලුදයෙන් හෝ සකස් කරන ලද උපකරණයෙකි. ඊට ඉබ්බෙක් හා යතුරෙක් ඇත. එය යතුරු හිමියා නැති තැනෙක දී ස්ත්‍රියට මෛථුන්දම් නො සෙවිය හැකි සේ ඇගේ සිරුරට මනා ව ගැළැපෙන්නට පරිස්සමින් තනන ලද උපකරණයෙකි. මස්ය මර්සේලියෝ මහතා තම නෝනා තමාට භක්තිමත් ව සිටින්නට සහතික වශයෙන් සලස්වා ගත්තේ මේ උපකරණයෙනි.

කියැවීමේ නියම වචන මෙසේ යː "මේ ආත්මය තම සහකාරයා විසින් සැක කරන ලද අයගෙන් එකියකි. අන්‍යයෙන් සමග විනෝද වීම වැළැක්වීම සඳහා බාධකයක් පැළැඳීමට බල කරන ලද්දී ය." "බල කරන ලද්දී" යන්න යෙදීමෙන් මර්සේලියෝ

නොහා මේ අදහසට මුල දීත් එකඟ නොවූ බව අපට පෙනී යයි. ඊළඟ වාක්‍ය වලින්, පසු ව ඇ ඊට තදින් විරුද්ධ වූ බව දක්නට ලැබේ. "නිදහස් වන්නට නිශ්චය කර ගන්නා ය. කිසියම් අවස්ථාවෙක දී යම් තැනෙක දී පළි ගන්නට.... පතිව්‍රතා තත්ත්වයෙක සිටින්නට බල කරන ලද මේ තැනැත්තිට බොහෝ අහිතකාරී තීරණ ඇති කර ගැනීමට සිදු විය. එය දැන් මේ තැනැත්තියගේ වර්තමාන අද්දැකීම් කොටසක් වී තිබේ. මෙය විපාක විඳීමෙකි."

දැන් අපි මෙහි ගැබ් ව ඇති විපාක දායක යුක්තිය විග්‍රහ කර බලමු. තම භාර්යාව සංවර කිරීමට යාන්ත්‍රික උපක්‍රම යෙදූ මිනිසාට ලැබුණු විපාකය නම් ලිංගික කාර්යයට කායික වශයෙන් අසමර්ථ වීම ය. ඔහුට මීට වඩා සුදුසු වෙනත් දඬුවමෙක් නැත. මේ ක්‍රෑරත්වයට පාත්‍ර වූ ස්ත්‍රිය කාම ප්‍රාර්ථනා භග්න වූ ජීවිතයකට දෙවරක් කැපවීම අයුක්ති සහගත යැයි බැලූ බැල්මට පෙනෙනු ඇත. එහෙත් එය අයුක්ති සහගත බව පෙනෙන්නේ මතුපිටින් පමණි. ඒ ඇයි ? පාපය බාහිර ක්‍රියාවෙන් පමණක් සිදු වන්නෙක් නොවේ. චේතනා, ප්‍රාර්ථනා, චිත්ත තත්ත්ව හා ආත්මභාවයේ ආකල්ප යන මේවායින් ද පව් සිදු වේ. මේ ස්ත්‍රිය අයුක්ති සහගත ව වළක්වන ලද්දී ය. ඇ කෙරෙහි කරන ලද අවිශ්වාසයටත් ඒ අවිශ්වාසය ප්‍රකාශ වූ තිරිසන් ආකාරයටත් ඇගේ ප්‍රතික්‍රියාව වෛරය හා ද්වේෂ යයි (අප දන්නා තරමින්) ඒ ද්වේෂය හෝ පළිගැනීමේ ආශාව ප්‍රකට ක්‍රියාවෙකින් එළියට ආවේ නැත. එසේ වූවත් පළිගැනීමේ අධිෂ්ඨානය නම් පැවතිණි.

ආත්මය විසින් කරන ලද ඕනෑම අධිෂ්ඨානයක් ශත වර්ෂ ගණනාවක් පවතින හැටි අපි ඉහත දී වරක් දිටිමු.[1] පළිගන්නට මේ ආත්මය විසින් කර ලද අධිෂ්ඨානයට නැඟි වශයෙන් එසේ කිරීමට සම්පූර්ණ ඉඩ ප්‍රස්තාව ලැබුණේ ය. මේ වතාවේ ඕ

1. 248 වැනි පිටේ සඳහන් සිද්ධිය.

සුන්දරත්වයෙන් ඉතා උසස් ය. කමනීයත්වයෙන් කෙළ පැමිණ ඇත. ඇට විවාහ වන්නට ලැබුණේ පූර්ව ජීවිතයෙක දී වරද කළ මිනිසා සමඟ ය. ඊර්ෂ්‍යාවෙන් ඔහු උමතු කරවන්නටත් ඔහුගේ මිතුරන් ඉදිරියේ ඔහු ලජ්ජාවට පත් කරවන්නටත් දික්කසාදයෙන් ඔහු පොඩි පට්ටම් කරන්නටත් දැන් ඇට සම්පූර්ණයෙන් ම ඉඩ ලැබී තිබේ. තවත් ඇට බලාපොරොත්තු විය හැක්කේ කිමෙක් ද ? සම්පූර්ණයෙන් ජයග්‍රාහි ව පළිගැනීමට මීට වඩා හොඳ පරිසරයක් තිබිය හැකි ද ? කෝපාවිෂ්ට ව බද්ධ වෛරයෙකින් යුතු ව මේ ස්ත්‍රිය විසින් කරන ලද නපුරු ප්‍රාර්ථනාවට මේ අවස්ථාවේ දී සම්පූර්ණයෙන් ඉඩකඩ ලැබී ඇත.

එසේ වුවත් මේ අතරතුරේ දී ඈ ආධ්‍යාත්මික වශයෙන් වැඩී ඇත. තව දුරටත් ඇට කාටවත් අකරුණාවන්ත වන තරමට තමා පහත හෙළා ගත නො හැකි ය. මැගේ ලිපිවලින් මැගේ මෘදු හදවත දිගට ම හෙළි කෙරෙයි. පෙරළා පැමිණි මැගේ පෙම්වතා සමඟ සම්බන්ධයක් ඇති කර ගන්නට ඉඩ තිබිණි. මෙ සම්බන්ධය මැගේ සැමියාගෙන් සඟවා ගන්නට ද ඉඩ තිබිණි. එහෙත් මැයට තම පෙම්වතාගේ බිරියට රිදවීම දැරිය නොහැක්කෙකි. ඇයට එය පහසුවෙන් අසුවන්නට ද ඉඩ තිබේ. මෝ සංවර වූවා ය. මැගේ කායික හා මානසික සෞඛ්‍යයට කිසියම් ආකාරයෙක ලිංගික ප්‍රකාශයෙක් අවශ්‍ය විය. එහෙත් මෝ තම සැමියාට ආලය කළා ය. මේ නිසා මෝ ඔහු දික්කසාද නො කළා ය. තම කායික ආශාත් සෞන්දර්යයත් තාරුණ්‍යයත් තම පතිභක්තියට පූජා කළා ය.

කියැවිමේ එන ගැඹුරු රහස් අරුතක් ඇති "ඈට ඇය හමුවෙයි." යන කියමනෙන් අදහස් කෙරෙන්නේ ඇගේ පැරැණි අධිෂ්ඨානය ඇගේ ජීවිත තත්ත්වයෙහි සඵල වී ඇති බවයි. ඈ තමාට හමු වූ ආත්මය නිදහස් කොට ඇත. ම් ශත

වර්ෂ හයකට ඉහත දී තමා සඳහා ම සකස් කොට ගත් පරීක්ෂණයෙන් සමත් වූවා ය. "පළිය ගැනීම මගේ ය: මම එය ගෙවමැ යි ස්වාමීන් වහන්සේ කී ය." "වරද කෙරෙන නිසා එය විය යුතු ය. යමකුගෙන් වරද පැමිණේ නම් ඔහුට දුක් ඇති වේවා." මේ බයිබලයේ කියමන් දෙකෙන් ම වරදකරුවකුට දඬුවම් කිරීම පිළිබඳ ව කර්ම නියාමය කෙරෙහි විශ්වාසය තැබිය හැකි බව ප්‍රකාශ වෙයි. අප විසින් ම පළි ගැනීමේ චේතනාවෙන් යුක්ත ව දඬුවම් දීම නො කළ යුත්තෙකි. පළිගන්නා බවට දිවිරීම ද නො සුදුසු ය. (අපරාධකාරයන්ගෙන් සමාජය ආරක්ෂා කර ගැනීමට සමාජයට අයිතියක් නැත යනු මෙහි අදහස නො වේ.) මහජන නීතියකට විරුද්ධ ව වරදක් කරන්නකු වැඩි ම දෙනකුගේ වැඩිම හොඳ සඳහා වරදකරුවකු කිරීම සමාජ සම්මත වූ නීතිවලට අනුවර්තනය වීමෙකි. එය කෙරෙන්නේ පළිගැනීමේ හැඟීමෙකින් නො වේ. ඇතැම් විටෙක ඉටුකර ගැනීමට නො හැකි වුව ද සමාජය සමාජ නීති ක්‍රියාවට නැගීමේ දී බලාපොරොත්තු වන්නේ අගති රහිත ව පෞද්ගලික කල්පනාවලින් තොරව යුක්තිය ඉටු කර දීම ය. මෙසේ මිනිසුන් අතර පවත්නා ධර්මාධිකරණය මිනිසුන් කෙරෙහි ක්‍රියාත්මක වන කර්ම නියාමය ම යයි කිව හැකි ය.)

පතිව්‍රතා පට්ය බලයෙන් යෙදීම නිසා ඇති වූ විවාහ පිළිබඳ ශෝකාන්ත කථාවෙක තවත් නිදසුනෙක් කේසි ලිපි ගොනුවල ඇත. පට්ය භාවිත වූයේ වර්තමාන අඹු සැමියන්ගේම කුරුස යුද්ධ කාලයෙහි වූ අතීත උත්පත්තියක දී ය. මේ නිදසුනෙහි දී කර්ම විපාකය තරමක් වෙනස් ය. භාර්යාවගේ විස්තරයට අනුව ඇගේ සැමියා, තේරුම් ගන්නා ගතියෙන් යුතු බෙහෙවින් ඉවැසිලිමත් ශාන්ත පුද්ගලයෙකි. එහෙත් විවාහ ජීවිතයෙන් අවුරුදු අටකට පසුවත් තිස්හැවිරිදි භාර්යාව ලිංගික සම්බන්ධතාවට පුදුම බයෙකින් සිටියා ය. මෙයින් ඉතා දුෂ්කර අවස්ථාවක් ඇති වන බව තේරුම් ගත හැකි ය. ඉතාලි සංගීත

නාට්‍යකරුවකු වූ පුරුෂ මිත්‍රයකු කෙරෙහි භාර්යාව තදින් ම ඇදී යෑම නිසා මෙය තවත් පැටලැවිලි සහිත විය.

කියැවීමෙහි දී ලිංගික දුෂ්කරතාව කුරුස යුද්ධ කාලීන ජන්මයේ දී සැමියා විසින් තම බිරිය පතිව්‍රතා පටියෙන් සංවර කිරීම නිසා ඇති වූවක් බව කියා දෙන ලදී. සැමියා ලිංගික වශයෙන් තමාට භය වන බිරියක ලබා ගෙන තම කර්මයෙහි ඵල නෙළා ගන්නා ආකාරය හොඳින් පැහැදිලි ය. භාර්යාවගේ අස්වාභාවික භය නිසා ඇති වී තිබෙන විකාරවලින් ඇයට පෙළෙන්නට සිදු වී තිබෙන්නේ ද කර්ම විපාක වශයෙනි. කුරුස යුද්ධ කාලීන සැමියාට ඇගේ තිබූ ප්‍රතික්‍රියාව ද්වේෂයයි. ද්වේෂය කර්ම බන්ධන තනයි. කියැවීමේ වචන මෙසේ යː "සැඟවුණු ද්වේෂයෙන් මතු වන සැක හා බිය දූන් තිබේ. එකල ඇති කරන ලද තත්ත්වයට දූන් මුහුණ දිය යුත්තේ අවබෝධයෙනි. ඔබට සමාව ඕනෑ නම් ඔබ ද සමාව දිය යුතුයි."

සංගීත නාට්‍ය ගායකයාට ඇති වූ ඇල්ම වෙනත් ජීවිත දකීමෙකින් ඇති වූවෙකැයි කියා තිබේ. ඔහු ඉන්ද්‍රවීනයේ දී ඇගේ පෙම්වතා විය. "මේ අවස්ථාවේ දී මා ක්‍රියා කරන්නේ කෙසේ ද ?" යන ඇගේ ප්‍රශ්නයට කියැවීමෙන් ලැබුණේ " ප්‍රාර්ථනීය ආදර්ශය වශයෙන් ඔබ තෝරා ගන්නා දෙයට අනුව ඊට මුහුණ දෙන්න." යන පිළිතුර ය.

කර්ම හේතුව සම්පූර්ණයෙන් වෙනස් වූ තවත් නිදසුනෙකද මේ භය දක්නට ලැබේ. විඳින්නට සිදු වී තිබෙන පෞද්ගලික දුඛ පක්ෂයෙන් බලන විට මේ කථාන්තරය අතිශයින් ශෝචනීයය. එහෙත් මානසික, වෛද්‍ය, ශාස්ත්‍රීය විග්‍රහ පක්ෂයෙන් බලන විට මේ නිදසුනෙන් කර්මය, පාරම්පර්යය හා පරිසරය යන මේවා අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව හැදෑරීමට අගනා තොරතුරු ලැබේ. 1926 දී මේ ස්ත්‍රිය මෙසේ ලියයි.

"මා ඉන්නේ උන්මාදයටත් සිය දිවි නසා ගැනීමටත් ආසන්නයේ ය. මේ මිහිපිට ජීවත් වන ඉතාමත් කාලකණ්ණි මෝඩ පෙරේති මා ය. දරුවන් සය දෙනකුගේ උපතේ දී පණ පිටින් මළ මගේ අම්මා මගේ ජීවිතය මුළුල්ලේ ම මට ගැබ් ගැනීම ගැන බොහෝ දේවල් කිව්වා. ඒ නිසා මීට දහඅට අවුරුද්දකට පෙර මා විවාපත් වන අවස්ථාවේ දී මා සිටියේ ගැබ් ගැනීම ගැන ලොකු බියෙකිනි. ඒ බය කොතරම් ද යතහොත් දැන් මා සිටින්නේ මගේ ආදරණීය මිහිරි සැමියාගෙන් ඈත් ව ය. මා එසේ කරන්නේ ඔහු මා ළඟ හෝ මට පේන තෙක් මානයේ හෝ සිටීම මට දරා ගත නොහැකි නිසා ය. මා යාච්ඤා කළා, මනෝවිද්‍යාවෙන් මානසික වෛද්‍යවිද්‍යාවෙන්, ක්‍රිස්තියානි විද්‍යාවෙන්"[1] හා "සාමග්‍රියෙන්"[2] පිහිට සෙව්වා. එහෙත් ඒ එකෙකින්වත් කිසි ම ඵලයක් ලැබුණේ නැහැ. මට කිසියම් බලාපොරොත්තුවක් ඇති කර ගත හැකි යයි ඔබ සිතනවා ද ? මට දරුවන් ඕනෑ කළා. මා මගේ සැමියාට ආලය කළා. එහෙත් ලිංගික සමාගමයට මා බය වුණා. දැන් තත්ත්වය පෙරදීටත් වඩා භයානක ය. දැන් මා සිය දිවි නසා ගැනීමට සූදානම් බව කිව යුතුයි. මේ සතියේ මා ඊට වැඩ පිළිවෙළ යොදාගෙන තිබුණා. එවිට ය මට ඔබේ කාර්යය ගැන දැන ගන්නට ලැබුණේ."

මේ ස්ත්‍රියගේ ශෝචනීය තත්ත්වය විවරණය කිරීමේ දී කියැවීම ජීවිත දෙකක් ආපස්සට යයි. සියල්ලට පළමු ව ඈ ප්‍රංශ රාජ සභාවේ සිටි හිස් අහංකාර, ආත්මාර්ථකාමි භෞතිකවාදී, සැප සොයන ස්ත්‍රියක ව සිටි බව එයින් දක්වන ලදී. ඇගේ ජීවිතය ප්‍රීතිමත් එකෙක් විය. එහෙත් ඊළඟ ආත්මයේ විපත්තියට බීජ වපුළේ එහි දී ය. මේ දෙවන ජන්මයේ දී ඈ ඇමෙරිකාවේ මුල් පදිංචිකාරියකි. දරුවන් සය දෙනකුගේ, මවක වූ ඕ ඒ සය දෙනා ම පිච්චී මැරෙනවා දැක තිබුණා ය. "ඒ ජීවිතයේ ඉතිරි

1. Christian Science 2. Unity

කාලය මේ තැනැත්තිය ගෙවූයේ මහත් බියෙකිනි. ඈත් දරුවනුත් ආරක්ෂා නොකළාට ඕ ලෝක ධර්මතාවට ද්වේෂ කළා ය. ඒ කෙරෙහි විශ්වාසයක් නො තැබුවාය. මේ තැනැත්තිය මේ ජන්මයේ දී ගැබ් ගැනීමට බිය වන්නේත් ඒ බයේ සියලු ප්‍රතිඵල ඇති වී තිබෙන්නේත් අර කී සිද්ධිය නිසා ය." (ඈ ඇගේ වර්තමාන මව කරා ඔවුන්ගේ භය නමැති පොදු හැඟීමේ ස්පන්දනයෙන් ඇඳුණු බව පෙනේ. මව විසින් ගැබ් ගැනීමේ භයානක කම් නිතර කීමෙන් සිදුවූයේ කල් තියාම දූරියගේ යටි සිතේ පැවැති බය පණ ගැන්වීම පමණි.

යටත් විජිත කාලයේ සිදු වූ විපත තේරුම් ගත හැකි ය. කෙසේ ද ? මිනිසා ආධ්‍යාත්මික දේවලට හැරෙන්නේ භෞතික ස්ථිරතාවන්ගේ විනාශයෙන් පමණක් බව අපි දනිමු. එහෙත් ඈ එක් කර්ම විපාක මාලාවකට මුහුණ දීමේ දී මෝඩකමින් තවත් කර්මයක් සිදු කර ගෙන තිබේ. දරුවන් සය දෙනකු නැති වීම ආත්මාර්ථකාමී ස්ත්‍රියකට පවා වේදනාවක් බව සත්‍යය. එහෙත්, ඈ පරීක්ෂණයෙන් අසමර්ථ වූවා ය. ඇගේ තත්ත්වයට ඇති කර ගත හැකි ප්‍රතික්‍රියා දෙකෙකි. මෛත්‍රියෙන් නිශ්ශබ්ද වීම හා විරෝධයෙන් බිය වීම ය. මෙවායින් ඈ තෝරා ගත්තේ දෙවැන්නයි. මේ විපත පිළිබඳ ව කළ හැකි ව්‍යාඛ්‍යාන මෙවාය. "මේ විපත්තිය අචින්ත්‍ය නමුදු යුක්ති ගරුක වූ දෙවියන් වහන්සේගේ ඉච්ඡාවය" නැතහොත් "මේ විපත්තිය ක්‍රෑර වූ දෙවියන් වහන්සේ කෙනකුගේ අයුක්තියෙකි." නැතහොත් " දෙවියකු නැති විශ්වයෙක තේරුමක් නැති ක්‍රීඩාවෙකි." මෙවායින් ඈ තෝරා ගත්තේ අන්තිම ව්‍යාඛ්‍යාන යයි.

මෙසේ මේ ස්ත්‍රිය විසින් තව දුරටත් උගත යුතු වූ එක් ප්‍රධාන පාඩමෙක් විය. ඒ පාඩම මෙය මිස අනිකෙක් නො වේ. "පූර්ණ මෛත්‍රියෙන් බිය පලවා හරිනු ලැබේ." ජීවිතය පිළිබඳව ඇගේ තිබූ භෞතිකවාදී ආත්මාර්ථකාමී හැඟීමෙන් ඈ ඉවත්

විය යුතු ව තිබිණි. භෞතික භය භේරව නො දැනී යන්නට තම් ඇගේ සැමියාට හා ඈ මව වශයෙන් තෝරා ගන්නට සිටි නූපන් ආත්මයකට මහා මෛත්‍රියක් කරන්නටත් ඈ තුළ වූ දිව්‍යමය නිර්මාපක මූලධර්මයට මහා මෛත්‍රියක් හා ගෞරවයක් කරන්නටත් ඈ විසින් උගත යුතු ව තිබිණි.

අභාග්‍යයකට මෙන් නවීන මනෝවිද්‍යාව අවශ්‍ය තරමට මෛත්‍රියේ බලය පිළිගෙන නැත. විග්‍රාහකයන් බොහෝ දෙනකුට අනුව මෛත්‍රිය ලිබිඩෝ නම් වූ කාමශක්තියේ ප්‍රකාශයක් පමණි. වොට්සන්·විසින් කරන ලද කිරි දරුවන් අතැරීමේ හා අතගෑමේ මා හැඟි පරීක්ෂණවලින් පසුව මනෝවිද්‍යාඥයෝ එය පිළිගත හැකි මනුෂ්‍ය, චිත්ත, වේග තුනෙන් එකක් ලෙස පිළිගනිති. එහෙත් මෛත්‍රිය විශ්වයේ ඇති භාවාත්මක ශක්තියක් ලෙස, දිව්‍යමය ප්‍රභවයේ අවශ්‍ය අංගයක් ලෙස, ඒ නිසා ම අප ද ඇතුළත් වූ ඒ ප්‍රභවයේ සියලු කොටස්වල ගුණයක් ලෙස, සියලු ම මිනිස් නරක කම්වලට ඇති රාජකීය ප්‍රතිකාරයක් ලෙස, තව ම නිල වශයෙන් පිළිගෙන නැත. ඊට හේතුව මනෝවිද්‍යාඥයන්ගේ ඒ වචනය භාවිතයට ඇති ලජ්ජාව විය හැකි ය. මනෝවිද්‍යාඥයන්ගේ මේ කුලැටි කමට හේතුව අපට තේරුම් ගත හැකි ය. "සේවය" යන වචනය කෙලෙසී ඇති තරමට එය ද කෙලෙසී යනු ඇත. සේවය යන වචනය නියම අරුතක් නැති ව බොරු උසස් බවක් ඇඟවීමටත් වෙළඳ ලාභ ලැබීමටත් වංකව යෙදී ඇති හෙයින් කෙලෙසී තිබේ. එසේ යෙදෙන්නට ගියහොත් මෛත්‍රිය යන වචනයට ද එබඳු ධ්වනිතාර්ථයක් එකතු වනු ඇත.

ලිංගික සකස්වීමේ හා මනෝවිග්‍රාහක ප්‍රතිකාරයේ දෘෂ්ටියෙන් වැදගත් වූ තවත් නිදසුනෙක් ඇත. එය එක ම වෘත්තියෙහි යෙදුණු අඹුසැමියන් දෙදෙනකු පිළිබඳව ය. කියැවීම ලබා ගන්නා අවස්ථාව වන විට මේ දෙදෙනා ම අවුරුදු දෙකෙක

සිට මනෝ විග්‍රාහක ප්‍රතිකාර ලබමින් සිටියහ. සැමියා පැහැදිලි අන්තර්නතයෙකි.[1] බිරිය තෙවරක් ස්නායු භංගත්වයෙන්[2] ප්‍රත්පල වූවා ය. අවසන් රෝගයෙන් සුවයක් නො ලැබෙතැයි සිතන ලදී. කියැවීම ලබන විට ඇගේ වයස පනස් එකෙකි. සැමියාගේ වයස පනස් හතරෙකි. ඔවුන්ගේ එක ම දරුවා බාල කාලයේ දී ම මිය ගොස් සිටියේ ය.

දෙදෙනා අතර වූ විවාහ නොගැළපීම විශාල ය. ඔවුනට පිළියම් කරමින් සිටි මනෝවිග්‍රාහකයා කේසිගේ කාර්යය ගැන අසා ඔවුන් දෙදෙනා ගැන ම කියැවීමක් ඉල්ලා ලිපියක් ලීවේය. ඔහු ඉල්ලා සිටියේ මානසික ආධ්‍යාත්මික[3] විග්‍රහයක් මිස ජීවිත කියැවීමක් නො වේ. මේ නිසා භාර්යාව පිළිබඳ කියැවීමේ දී දක්නට ලැබුණු එක් අතිශයින් අර්ථවත් වූ සුළු විස්තරයක් හැරුණු විට එකකුගේ වත් අතීත ජීවිත තොරතුරු අපට ලැබී නැත.

භාර්යාවගේ කියැවීමේ දී අසන ලද "මේ තැනැත්තී සාමාන්‍ය අයට වඩා වැඩියෙන් ජීවිතය බරපතල ලෙස ගත්තේ ඇයි ද?" යන ප්‍රශ්නයට "වෙනත් ආත්මභාවවල දී එය වඩා බරපතල ලෙස ගත් නිසා ය" යන පිළිතුර ලැබිණි. ඊළඟ ප්‍රශ්නය "මේ තැනැත්තියගේ හීනමාන සංකීර්ණය[4] ඇති වූයේ කෙසේද?" යනු ය. උත්තර මෙසේ ය: "මිනිසුන් කෙරෙහි වූ බියෙන් හා අරුචියෙන් ය. ඔබට බ්‍රහ්මචර්යා ශික්ෂා පද සමාදන් වී ආරක්ෂා කොට නැවත එක් වරට ම අනෙක් අතට හැරී පහසුවෙන් තෘප්තිමත් කළ නො හැකි කෙනකුගේ ආශා තෘප්තිමත් කළ නො හැකි ය."

භාර්යාවට සතුටුදායක ලිංගික සකස්වීමක් ඇති කර ගත නො හැකි වූයේ මන්ද යන්න පිළිබඳ ව අපට මෙහි ඉතා

---

1. ඇතුළට නැමුණු තැනැත්තෙක්
2. Nervous Breakown.
3. Mental - spiritual
4. Inferiority Complex

වැදගත් වූ සලකුණක් ඇත. පූර්ව ජීවිතයෙක දී ඇය තවුසියක වී සිටියා වන්නට හොඳට ම ඉඩ තිබේ. දිගු කලක තිස්සේ ප්‍රතිපත්ති හේතුවෙන් ලිංගික ස්වභාවය සිතා මතා සංවර කර ගෙන සිටි කෙනකුට විවාහ වූ අවස්ථාවෙක දී පවා ලිංගික ප්‍රකාශනයෙන් එක් වර ම ස්වාභාවික වීම දුෂ්කර වන බව තේරුම් ගත හැකි ය. එක් ජීවිත කාලයක් තුළ දී මෙය සිදුවීම මනෝවිද්‍යාත්මක වශයෙන් ඇදහිය හැකි ය. ජීවිත කාල දෙකක් තුළ දී ද එය එසේ ම ඇදහිය හැකි ය.

නීරසික හැම ගැහැනියක් ම පූර්ව ජීවිතයෙක බ්‍රහ්මචාරිව සිටියා යයි නිගමනය කිරීම අන්තගාමී වීමක් බව පැහැදිලි ය. ගැහැනුන් තුළ වූ නීරසිකත්වයට ඉන්ද්‍රිය ගත වූ හා අතීන්ද්‍රිය ගත වූද කර්ම විපාකමය වූ හා එසේ නො වූ ද නොයෙක් හේතු ඇති බව නිසැක ය. එහෙත් ඇතැම් අවස්ථාවල ගැහැනියකගේ ප්‍රතික්‍රියා රහිත වීමේ හේතුව මෙබඳු කරුණක් විය හැකි ය.

මේ නිදසුනෙහි සැමියාගේ ස්නායු ව්‍යාකුලත්වයේ විවරණයක් ලෙස මනෝවිග්‍රාහකයා ඔඩිපස් සංකීර්ණය[1] ගැන සිතා තුබූ බව සැලකුව මනා ය. කියැවීම පැහැදිලි වචනවලින් එය එසේ නො වන බව ඔහුට කියා තිබේ.

ප්‍ර: "මනෝවිග්‍රහාත්මක වශයෙන් කියත හොත් මේ පුද්ගලයාගේ භාවික තත්ත්වයේ ආයුෂ කොපමණද?"

උ: "මාස දෙකෙක් පමණි.

ප්‍ර: "මේ පුද්ගලයාගේ මානසික තත්ත්වයෙහි ඔඩිපස් සංකීර්ණයෙක් තිබේ ද ?"

උ: "දැනට දී ඇති දේ කියවන්න. ඔබ සොයන්නේ භෞතික විවරණය පමණි."

1. Oedipus complex පියා කෙරෙහි වූ ද්වේෂයෙන් ද මව කෙරෙහි වූ තෘෂ්ණාවෙන් ද මිශ්‍ර වූ හැඟීමෙකි.

ප්‍ර: මේ පුද්ගලයාට විවාහයෙන් සැපතක් නොලැබීමට හේතු මොනවා ද ?"

උ: "ඔහු සොයන්නේ තමාගේ තෘප්තිමත් වීම පමණි."

මෙසේ මූලික දුෂ්කරතාව වී ඇත්තේ ආත්මාර්ථ කාමීත්වයයි. සත්තෙකින් ම කේස් කියැවීම්වල ඇති විවාහ නො ගැළපීම් පිළිබඳ සියලු දුඃඛිත සිද්ධිවල මූලික දුෂ්කරතාව වී ඇත්තේ ආසන්න වූ හෝ දුරස්ථ වූ හෝ ආත්මාර්ථකාමය බව පැහැදිලි ය. මෙය හැඟවීම් අතින් ඉතා වැදගත් වූ කරුණෙකි. ආත්මාර්ථකාමය යන වචනය නවීන මනසට අති සරල වූ වචනයක් ලෙස පෙනෙනු සහතික ය. ආත්මාර්ථකාමය යන වචනයට විද්‍යාගාරපරීක්ෂිත වූ විද්‍යානුකූල තත්ත්වයක් ලැබෙන තාක් "සෙවුස් සංකීර්ණය" නැතහොත් SSQ (Self - Satisfaction Quantum = ආත්ම තෘප්ති ප්‍රමාණය) යනු බඳු ප්‍රකාශයක් තනා ගන්නට සිදු වේ.

කෙසේ හෝ කියැවීම්, මෙතරම් සරල වූ හැම දෙනාට ම තේරෙන (සමහර විට හැම තැන් දී ම අදාළ වන නිසා විය හැකිය.) වචනයක් යොදා තිබීම උද්යෝගයට හේතුවෙකි. "ආත්මාර්ථකාමය මූලික පාපයයි." යනු කේස් කියැවීම්වල නිතර එන කියමනෙකි. මේ සරල කියමනෙක පටන් ගෙන මනෝවිද්‍යාත්මක පාරිභාෂික ශබ්ද හා විස්තර නමැති කඳු කපා ගෙන කෙනකුට ඉතා පැහැදිලි මනුෂ්‍ය සාරධර්ම පද්ධතියකුත් ඉතා පැහැදිලි චිකිත්සක දර්ශනයකුත් ඇති ව පිට විය හැකි ය.

"මෛත්‍රියට අත් පත් කර ගැනීමෙක් අනවශ්‍ය ය. එය හුදු මානසික ගුණයෙකැ"[1] යි එක් කේස් කියැවීමෙක් ආප්තෝපදේශ ස්වරූපයෙන් කියයි.

1. Love does not possess ! Love *is*.

සාමාන්‍යයෙන් විවාහය ඇරඹෙන්නේ අත් පත් කර ගැනීමක් ලෙසින් වූ මෛත්‍රියේ මිරිඟුවෙනි. විවාහයේ සැප දුක් හා කම්කටොළු පවතින්නේ හුදු මානසික ගුණයක් ලෙසින් වූ මෛත්‍රියේ ස්වභාවය අපට ඉගැන්වීමට ය.

" සබ්බ දානං ධම්ම දානං ජිනාති "

සියලුම දානයන් අතරින් ධර්ම දානය උතුම්ම දානයයි.

කරුණාකර හැකිතරම් මෙම පිටපත බෙදාහරින්න.

# 16

# මිථ්‍යාචාරය හා දික්කසාදය

ඒක භාර්යා සේවනය සාමාන්‍ය රීතිය වී ඇති හැම රටෙකම මිථ්‍යාචාරය, බොහෝ දුරට පැතිරී ඇති, විවාහ ජීවිත ප්‍රශ්නයක් වී තිබේ. එය බහුල වීමට ඇති මූලික හේතුව ජීව විද්‍යාත්මක වූවක් බව පෙනේ. පහත එන නිර්නාමික පද්‍යයෙන් එය මැනැවින් කැටි කොට ඇත.

*Higamus, pigamus,*
*Men are polygamous;*
*Hogamus, pogamous,*
*Women monogamous,*

(=මිනිස්සු බහු භාර්යා සේවීහු ය, ස්ත්‍රීහු ඒක පුරුෂ සේවීහුය.)

ජීවවිද්‍යාත්මක සාධකවලට අතිරේක ව විවාහයට පත් අයගේ මිථ්‍යාචාරයට හේතු වන මනෝවිද්‍යාත්මක වූ ද සාමාජික වූ ද තවත් හේතු තිබේ. පුනර්ජන්මවාදය පිළිගත හොත් මිථ්‍යාචාරයට කර්ම විපාකමය හේතූන් තිබේ දැයි පරීක්ෂා කර බැලීම සිත් ගන්නා සුලු කරුණෙක් වෙයි, කේසි ලිපි ගොනුවල

කර්මය ප්‍රධාන හේතුව වූ කැපී පෙනෙන නිදසුන් තුනෙක් ඇත.

ප්‍රථමය දරුවන් දෙදෙනකු සිටි මවක පිළිබඳ නිදසුනෙකි. ඇගේ සැමියා අවුරුදු අටක් පමණ කාලයක් තිස්සේ අන්‍ය ස්ත්‍රියක සමග ප්‍රේම සම්බන්ධයක් ඇති කර ගෙන සිටියේ ය. භාර්යාව මේ බව දැන සිටියේ ඒ කාලයේ අවසාන අවුරුදු දෙක තුළ ය. ඕ තමාට මේ දුක් සහගත අද්දැකීම් විඳින්නට වූයේ කවර හෙයින් දැයි විචාළා ය. ලැබුණු උත්තරය මෙයයි. "මීට ප්‍රථම ජන්මයේ දී ඔබේ ම තිබුණු මිථ්‍යාචාරය නිසා ය."

දෙවැන්න පූර්ව ජන්මයෙක ප්‍රංශ රජ මාලිගයේ සිටි ලජ්ජා රහිත ලෙස මිථ්‍යාචාරයෙහි යෙදුණු ස්ත්‍රියක පිළිබඳ කථාවෙකි. ඇට දැන් තම සැමියා සම්බන්ධයෙන් මුහුණ පාන්නට සිදු වී ඇත්තේ ද එබඳු ම තත්ත්වයකට ය. ඔහු ඇගේ පූර්ව ජන්මයෙහි සිටි ප්‍රධාන සොර සැමියා ය.

තෙවැනි සිද්ධියට සම්බන්ධ ස්ත්‍රියගේ සැමියා විවාපත් මුල් අවුරුද්දේ දී ම අධික මද්‍යපානයට ඇබ්බැහි වී එකකට පසුව එකක් වශයෙන් ප්‍රේම සම්බන්ධතා කීපයක් ඇති කර ගත්තේ ය. අවස්ථා කීපයෙක දී ම ඔහු කොතරම් දුරට ගියා ද යතහොත් තවත් ස්ත්‍රියක ගෙදරට ම ගෙනාවේ ය. මේ මුළු කාලය තුළ ම තම සැමියාට භක්තිමත් ව සිටි ඕ අන්‍ය ස්ත්‍රීන් සමග ඔහු නොසිටි අවස්ථාවල දී ඔහු සමග එකට ජීවත් වූවා ය. ඇට ලැබුණු දායාදය නම් සමාජ රෝගය වැළැඳීමයි. කියැවීමෙන් මේ ස්ත්‍රියගේ ශෝචනීය තත්ත්වයේ කර්ම හේතුව මීට පෙර ආත්මයට දමා ඇත. ඒ ජන්මයේ දී ඕ කොමොඩෝර් පෙරි යටතේ සේවය කළ සේලරුවකුගේ හා ජපන් තරුණියකගේ අවජාත දුව ය. සමහර විට ඇට තමා සමාජයෙන් ඉවත ලන ලද්දියක ලෙස වැටැහුණේ තම අවජාතකය නිසා විය හැකි ය. මේ නිසා තුරුණු වියට පත් ඕ මුළුමනින් ම කාමසුඛල්ලිකානු

යෝගයට කැප වූවා ය. මෙසේ ඕ තමා සමග ආශ්‍රයට පත් බොහෝ මිනිසුනට වසංගත ආකරයෙක් වූවා ය. "එහි ප්‍රතිඵල වර්තමානයේ දීත් ලැබෙන තරමට එහි බලපෑම් ඉතා දිගට විහිදෙන්නෙක් විය" යනු කියැවීමයි.

කොටින් කියතොත් මෙබඳු නිදසුන්වලින් ඇතැම් විට සහකාරයාගේ මිථ්‍යාචාරය සිදු වන්නේ කර්ම හේතුවල ප්‍රතිඵල වශයෙන් බව පෙනේ. මේ නිදසුන් පදනම් කර ගෙන හැම මිථ්‍යාචාර සිද්ධියක් ම සිදු වන්නේ කර්ම හේතුවෙන් යයි නිගමනය කළ නොහැකි බව සත්‍යය. මේරිට ජෝන්ගේ භක්තියක් නැතිකම ඈ පුරාතන රෝමයේ දී ක්ලෝඩිවුස්ට භක්තියක් නැතු ව සිටීමේ ඵලයක් වශයෙන් ඈ ඊට සුදුසු නිසා විය හැකි ය. අනෙක් අතට ඇගේ වර්තමානයේ අඩුපාඩුකම් ද, සැමියාගේ සල්ලාලකම්වලට හේතු වන්නට පුළුවන. මිථ්‍යාචාරය වර්තමාන පෙළැඹීමකට ඇති වූ වර්තමාන ප්‍රතික්‍රියාවකට වැඩි දෙයක් නො වන්නට ද ඉඩ තිබේ. එවිට මෙය හනික විපාක දුන් කර්මයක් වෙයි. අතීතය පිළිබඳ අභිඥා ඥානයෙක් නැති කල එකකුගේ මිථ්‍යාචාරයක් තවත් එකකුගේ කර්ම විපාකයෙක් දැයි නිශ්චය කිරීමට ඇති මිනුම් දණ්ඩ නම් ප්‍රමාණවත් වූ වර්තමාන පෙළැඹීමෙක් ඇද්ද නැද්දැයි සොයා බැලීම විය හැකිය.

යමකු අතීතයෙහි අන්‍යයනට තදින් භක්ති රහිතව සිටියා නම් කර්ම නියාමයට අනුව අන්‍යයන් ඔහුට භක්ති රහිත වීම යුක්ති සහගත ය. පක්ෂපාතිත්වය හා සැලකිලිමත් වීම චරිතයේ කොටසක් වන්නේ ද එසේ වූ විට ය. කියැවීම්වලින් දික්කසාදයට විරුද්ධ ව නිතර උපදෙස් දෙන්නේ මේ අධ්‍යාපනික අවශ්‍යතාව නිසා ය. දුෂ්කර විවාහයෙකින් ආධ්‍යාත්මික පාඩමක් ඉගෙන ගන්නට තිබේ නම් කවදා හෝ ඊට මුහුණ දීමට ආධ්‍යාත්මික ශක්තියක් ලබා ගත යුතු නිසා එයින් පැන දිවීමෙන් අර්ථ සිද්ධියක් ඉටු නොවේ.

කෙසේ හෝ කියැවීම්වලින් මොන ම අන්දමෙකින් වත් දික්කසාද වීම තහනම් කරන්නේ නැත. නිදසුන් රාශියෙක දී ම එය අනුමත කොට ඇත. එබඳු ක්‍රියාවෙක හරි වැරැද්ද නිශ්චය කිරීමට ඇති මිනුම ද්විප්‍රකාර වන බව පෙනේ. දරුවන් පිළිබඳ යුතුකම් හා ඔවුනොවුනට ඇති යුතුකම් යනුවෙනි. දික්කසාද වීමට පැහැදිලි ලෙස ම උපදෙස් දී ඇත්තේ දරුවන් නැති අවස්ථාවල දී ය. නැතහොත් දරුවන් ඇති නම් දික්කසාදයෙන් ඔවුනට අර්ථ සිද්ධියක් වන අවස්ථාවල දී ය; නැතහොත් විවාහය පිළිබඳ කර්ම විපාක පාඩම් ඉගෙන ගෙන ඇති අවස්ථාවල දීය; ඒත් නැතහොත් හවුල්කාරයන්ගෙන් එකකු අනිකාත් පහතට ඇද ගෙන යන තරමට නරක ලෙසින් තත්ත්වයට මුහුණ දී ඇති අවස්ථාවල දී ය.

හොඳ ම නිදසුන නිව් ජේර්සියේ හතළිස් නව හැවිරිදි ස්ත්‍රියක පිළිබඳ සිද්ධියයි. ඇයට දරුවෝ නො සිටියහ. ඇගේ විවාහ ජීවිතය නො ගැළපෙන්නෙක් විය. ඇයට ඇගේ සැමියා අත්හැර ගුරුවරියක වශයෙන් ඇගේ තුබූ විශේෂ ශක්ති දියුණු කර ගන්නට කියා ඇත. පහත එන්නේ ඒ කියැවීමයි:

"ඔව්, මේ ආත්මය විවාහ වූ එක හොඳයි. මෙලොව සිටින කෙනකුගේ ස්වාභාවික ජීවිතය එයයි. පුද්ගලයකු මෙලොව ඉපැදී ඇති කාර්යයට බාධා වන සම්බන්ධයක් ඇති බව පැහැදිලි නම්, එසේ ම එය සකස් කර ගත නො හැකි නම්, ඒ සම්බන්ධය අත්හැරීම වඩා සුදුසු ය.

ඔබ මෙලොව උපන්නේ යම් කාර්යයක් සඳහා නම් ඒ කාර්යය සම්පූර්ණ කරන්නට තදින් සිතේ තබා ගන්න. ඔබ පටන් ගත්තේ පමා වෙලා ය. එහෙත් තව ම ඔබට බාලිකා අධ්‍යාපනයේ කටයුතු මහත් රාශියක් කළ හැකි ව තිබේ....."

තම සැමියාට වඩා අවුරුදු විස්සෙකින් වැඩි මහලු ස්ත්‍රියක පිළිබඳ සිද්ධිය මීට හාත්පසින් ම වෙනස් වූ නිදසුනෙකි. අගුණාම්

දෙදෙනා අතර තද නො ගැළපීමෙක් විය. සැමියා තදින් බිවේය. අඹුවට හා ඇගේ පුතාට බණින ඔහුගේ හැසිරීමේ කිසි ම තර්කානුකූලකමෙක් නැත. මේ තත්ත්වය පිළිබඳ කර්ම ඵල විවරණයක් කර නැත. එහෙත් දික්කසාද වීමට උපදෙස් නො දෙන ලදී. කියැවීම මෙසේ යඃ

"ඔබ අතර බලාපොරොත්තු කඩවීම් හා මතභේද ඇති වී තිබේ. පසු බසින්නට එපා, ඔබේ ආකල්පය ආලයෙන් යුක්ත උපේක්ෂාවක් කර ගන්න. නින්දා අපහාස ගණනකට ගන්න එපා. සත්තෙකින් ම ඔබ වපුළ අන්දමින් පලා නෙළා ගන්නට සිදු වී ඇති බව මතක තබා ගන්න. ඔහු සමග ඔබේත් ඔබ සමග ඔහුගේත් ඇති සම්බන්ධතාව පිළිබඳ මෙය සත්‍ය බව මතක තබා ගන්න. මොනවා වුණත් යම් ලෙසකින් ඔහු ඔබට ක්‍රියා කරනවාට සතුටු නම් ඔබත් ඔහුට එසේ ක්‍රියා කරන්න."

මේ නිදසුනෙහි දී කිසියම් කර්ම විපාක පාඩමක් උගන්නට ඇති බව නැති නම් කිසියම් කර්ම විපාක යුතු කමක් ඉටු කරන්නට ඇති බව පිළිගත හැකි ය.

එක් එක් සිද්ධියේ හොඳ නරක පිළිබඳ වත් අතීත ජීවිත පිළිබඳවත් අභිඥා ඥානයක් නැති කල්හි විවාහ බන්ධනයන්ගෙන් යුක්ති සහගත ව ඉවත් විය හැකි අවස්ථාව නිශ්චය කර ගැනීම දුෂ්කර බව පිළිගත යුතු ය. විවාහය බිඳ ලිය නො හැකි බන්ධනයක් ය යන කතෝලික මතයට පක්ෂ ව එක් ප්‍රබල තර්කයෙක් තිබේ. එසේ නමාගේ නිදහසට සුළු කරුණක් ඇති කල්හි, මුළා වූ මිනිසුන් විවාහ බන්ධනයෙන් නිදහස් වීමට පෙලඹෙන අතර කතෝලික මතයෙන් ඔවුන් ඒ බන්ධනයට තදින් බැඳ තබනවා ය යන්න ය.

කේසී කියැවීම්වල දික්කසාදය අනුමත කිරීම් ඉතා සුලබය. ඒ නිසා දික්කසාදය සම්පූර්ණයෙන් ම තහනම් කිරීමට ඒවායින් අනුමතයක් නො ලැබේතැයි කිව හැකි ය. එහෙත් දික්කසාද

විය යුතු ද නැද්දැයි විනිශ්චය කර ගැනීම සඳහා අපට දී ඇති මිනුම් දඬු නම් ඉතා ඉහළ ය. එමෙන් ම ඒවා දාර්ශනික වශයෙන්ද යහපත් පදනම් මත පිහිටා ඇත. ඒ මිනුම් දඬු කොතරම් දුරට හොඳ ද යනහොත් ඒවායේ ඵලය දික්කසාද වැඩි කිරීමට නොව අඩු කිරීමට හේතු වන බව නිසැක ය.

පුනර්ජන්ම වාදයට අනුව විවාහය බොහෝ දෙනකුන් සිතන තරමේ ශුද්ධ වූ සංවිධානයෙක් නොවේ. විවාහය බිඳ ලිය නො හැක්කෙකැයි සමාජය සිතනවා නම් හොඳයි. එසේ නො සිතනවා නම් ඒත් හොඳයි. ඒ කොයි ක්‍රමයෙකින් වත් ලෝක නියාමය බිඳෙන්නේ නැත. මිනිසකුට එක් ජන්මයෙක දී කිසියම් යුතුකමක් ඉටු කර ගන්නට බැරි වුණා නම් ඔහුට අනිවාර්යයෙන් ම අනෙක් ජන්මයෙක දී එය ඉටු කරන්නට සිදු වේ. මිනිසා විසින් තනා ගනු ලබන බාහිර ආකෘති ඔහු ජන්රම් නම් ක්‍රීඩාවට පනවා ගන්නා නීති තරමට ම හිතුවක්කාර ද නො වැදගත් ද වෙයි. අන්තිමට කවර ක්‍රීඩාවකට වුවත් සාදා ගන්නේ කවර නීති ද යන්න එතරම් වැදගත් නො වේ. කවර හෙයින් ද ? ක්‍රීඩාවෙහි ඊට ම අයත් වටිනාකම ඇත්තේ ඒ හැම ආකෘතියෙකින් හා සම්මතයෙකින් ම ප්‍රකාශ වන දක්ෂ භාවයෙහි හා අවංක භාවයෙහි වටිනාකම නිසා ය.

අනෙක් අතට විවාහය බොහෝ දෙනකුන් සිතනවාට වඩා බරපතල ය. අවුරුද්දක් පාසා ම දහස් ගණන් මිනිසුන් විසින් නො සලකා හරිනු ලබන යුතුකම් නිකම් ම අර්ථ රහිත සමාජ සම්මත නො වේ. සමාජයේ සහයෝගී ස්වභාවය තුළ ඒ යුතුකම්වලට කිසියම් බන්ධන ශක්තියෙක් තිබේ. අප එක් එක්කෙනා ඒ සමාජයේ එක් ජීව සෛලයෙකි. සමබර බව ඇති කරන ලෝක නියාමයෙක් හැම කල්හි ක්‍රියාත්මක ව පවතී. අප ප්‍රකට කරන ආත්මාර්ථකාමය කුමක් වුවත් එය දිය කර හැරීමට විවාහය තරම් හොඳ යකෝවෙක් නැත. ඒ නිසා අප අපගේ මහා

ආත්මයේ ඉපැදීම සඳහා කුඩා ආත්මය පරීක්ෂණයකට පාත්‍ර ව ඇති බව අවබෝධ කොට ගෙන පරිත්‍යාග චේතනාවෙකින් යුක්ත ව විවාහයේ දුෂ්කරතා හා ප්‍රාර්ථනා බිඳියෑම පිළිගන්නට උගත යුතු ය.

අපේ විවාහ සහකාරයා හෝ සහකාරිය අප වෙත ආවේ ඇදියෑමේ පැරණි බැඳීම් නිසා යයි දැන ගෙන, අතිශයින් නීරස තත්ත්වවලට පවා අපට මග පෙන්නුවේ අහඹුවක් නොව අපගේ උත්තර ආත්මයේ අර්ථකාරී චේතනාව යයි සිතා ගෙන, නො ගැළැපීම් තුළ සිටිමින් ම පරෝපකාරී වීමෙන් අභිවෘද්ධියට ඉඩ සලසා ගත හැකි බව අදහා ගෙන, දික්කසාදය අප සතු දෙයෙක නැති වීම යයි අවබෝධ කර ගනිමු. අනෙක් අතට කිසි ම සංවිධානයෙකින් මනුෂ්‍යයන් අහිතකර දූගඳ හමන විකෘත සම්බන්ධතාවලට වහලුන් නො කළ යුතු බව තේරුම් ගෙන, සකස් කළ නො හැකි ආත්මාර්ථකාමී ඌරන් ඉදිරියෙහි පරාර්ථකාමී ආලය නමැති මුතු ඇටය වීසි නො කළ යුතු බව වටහා ගෙන, දික්කසාද වීම අනෙක් ඕනෑ ම නීත්‍යානුකූල කොන්ත්‍රාත්තුවක් අවලංගු කිරීම තරමට ම යහපත් වූ බුද්ධිමත් වූ ද ශිෂ්ට වූ ද ක්‍රියා මාර්ගයක් බව අවබෝධ කර ගත යුතු ය.

නැවත අප මධ්‍යම ප්‍රතිපදාවට, සමතාවට, ස්වර්ණමය මධ්‍ය මාර්ගයට පැමිණෙමු. මේ ගුණ ධර්ම ආධ්‍යාත්මික පූර්ණතාව සොයන පුද්ගලයන් විසින් පමණක් සෙවිය යුතු ඒවා නොවේ. ඒවා පුද්ගලයනට ආත්ම ප්‍රකාශනය සඳහා උපකාර වන මාර්ග තැනීමට යත්න දරන සමාජය විසින් ද සෙවිය යුතු ගුණ ධර්ම ය.

# 17

# මාපියෝ සහ දරුවෝ

ශීත වර්ෂ බොහෝ ගණනාවක් තිස්සේ පවුල බොහෝ රාජ්‍යයනට සමාන ව පැවැති තිබේ. සාමාන්‍යයෙන් එහි රජා පියා ය. ඇතැම් ශිෂ්ටාචාරයන්හි මව ද ප්‍රධාන වී තිබේ. කෙසේ හෝ සම්පූර්ණ අධිපති බව මව හෝ පියා සතු වූ රාජ්‍යයක් බඳු පවුල් තව ම පවතී. සත්‍ය වශයෙන් ම ඒවා බහුල ය. භෞතිකවාදී දෘෂ්ටියෙන් දරුවන් මාපියන්ගේ දේපොළ ලෙස සැලකිය හැකි බව සත්‍යය. ඔවුන් ඇති කරන ලද්දේ මවගේ පරිත්‍යාගයෙන් හා ශ්‍රමයෙනි. ඔවුන් නඩත්තු වන්නේ පියාගේ ශ්‍රමයෙන් හා පරිත්‍යාගයෙනි. කායික වශයෙන් මාපියෝ වැඩියෙන් ශක්තිමත්ය; වැඩිහිටි ය. දරුවන්ට වඩා ප්‍රබල වූ මාපියන් විසින් දරුවන් පාලනය කිරීම ඔවුන්ගේ අයිතිවාසිකමෙකි.

එහෙත් ආධ්‍යාත්මික සත්‍යයට අනුව නම් මාපියන්ගේ දරුවන්ට වැඩි පරම වූ උසස් බවෙක් නැත. සියලු ජීව සත්ත්වයෝ මහා ආධ්‍යාත්මික සමාජයෙක සමාන සාමාජිකයෝ ය. ආධ්‍යාත්මික වශයෙන් දරුවන් මා පියනට අයත් නැත. මාපියන් දරුවන් නිපදවන්නේ ද නැත. මාපියන් කරන්නේ දරුවන් මතු කිරීම පමණි. මාපියන්ගේ සිරුරු ඇතුළත සිද්ධ වන නො

පෙනෙන ක්‍රියා මාර්ගයක් නිසා ඔව්හු මොහොතකට එකට එක් වෙති. එහි දී ඇති වන එබඳු ම නො පෙනෙන ක්‍රියා මාර්ගයෙකින් ශරීරයෙක් සකස් වීම හා උපත සිදු වේ.

මේ ශරීරය අප සේ ම ආධ්‍යාත්මික වූ වෙනත් සත්ත්වයකුගේ නිවාස ස්ථානය වෙයි. කාලයක් ඒ සත්ත්වයා කථා නැති ව අසරණව සිටී. අපට හැඟී යන වගකීමත් ඔහු කෙරෙහි අප දක්වන සැලැකිල්ලත් වටිනා අද්දැකීම් ය. ඒවා පරිත්‍යාගයට හා මෛත්‍රියට හේතු වේ. එයින් ඉතා ගැඹුරු මෘදුතාවෙක් හා ආදරයෙක් ඇති වේ. මෙය කිසියම් ස්වරූපයෙක අයිති කර ගැනීමක් බවට ද යටත් කර ගැනීමක් බවට ද දියුණු නො වන තෙක් තිබිය යුත්තෙක් ම ය.

ඛාලීල් ගිබ්‍රාන් මේ කරුණු "අනාගත වක්තෘවෙහි"[1] මෙසේ හොඳින් කියා ඇත:

"ඔබේ දරුවෝ ඔබේ දරුවෝ නො වෙති.

ඔව්හු ජීවිතාශාවේ ම දූ පුත්තු ය.

ඔව්හු ඔබේ මාර්ගයෙන් එනවා මිස ඔබෙන් නො එති.

ඔවුන් ඔබ සමඟ සිටියාට ඔබට අයිති නැත.

ඔබ ඔබේ දරුවන් නමැති ජීවත් වන ඊ පිට වන දුනුය.

දුනුවායාගේ අතෙහි දී ඔබේ නැමීම[2] ප්‍රීතිය සඳහා වේවා!

එසේ කියන්නේ උන්වහන්සේ නික්ම යන ඊයට මෙන් ම නතර ව තිබෙන දුන්නට ද ආලය කරන නිසා ය."

දෙමාපියන් විසින් තම දරුවන් කෙරෙහි, ඔවුන් යටපත් කරන සෙයමානයක් හෝ ඊර්ෂ්‍යාවෙන් යුක්ත හීනමානයක් හෝ ඇති කර නො ගත යුතු ය. ඔවුන් විසින් තම බාරයේ

1. The Prophet
2. මෙහි දී නැමීම යයි ගත යුත්තේ ඊ පිට වීමට හේතු වන ක්‍රියාවයි.

සිටින දරුවන් කෙරෙහි ඇති කර ගත යුතු යෝග්‍ය ආකල්පය වන පවිත්‍ර මෛත්‍රිය පිළිබඳ සමතාව ඇති කර ගත හැක්කේ සියලු මනුෂ්‍යයන් හෙවත් සියලු ආත්මයන් මවන ලද්දේ සමානවය යන ප්‍රධාන ආධ්‍යාත්මික සත්‍යය පිළිගැනීමෙන් පමණි. කේසි කියැවීම්වලට ප්‍රිය වී ඇති වචනයක් භාවිත කරත හොත් මාපියවරු ජීවිතය ගලා යන "ඇළ පාරවල් ය." ආත්මවලට සිරුරු ඇතිව ඉපැදීමට ඉඩ කඩ සැලැසෙන්නේ මාපියන්ගේ මාර්ගයෙනි. ඒ නිසා මිනිසුනට විවාහ සම්බන්ධතාවට ඇතුළු වීමට අනුශාසනා කරන්නේ තමන් කරන්නට යන දේ පිළිබඳ ශුද්ධත්වයේ සංඥාවෙකින් යුතුව ය. මෙහි දී ගෙන ඇති දෘෂ්ටිය පැහැදිලි ලෙස ම ලිංගික ය. ඒ කියන්නේ කේසිගේ මතය, හුදු ලිංගික ක්‍රියාව දිව්‍යමය වූ ශුද්ධ දෙයෙක් ය යන හින්දු මතය හා සම වන බව ය.

අභාග්‍යකට මෙන් පැරණි කාලයේ ක්‍රිස්තියානි ධර්මය ලිංගික ක්‍රියාව අවශ්‍යයෙන් ම පාප සහගත වූ මානසික රෝගයෙක් යයි සලකා තිබේ. උත්පත්ති - කථාවේ එන සංකේතයක් ශෝචනීය ලෙසින් වරදවා තේරුම් කිරීමෙන් මුළු මනුෂ්‍ය වර්ගයා ම ආදම්ගේ හා ඒවාගේ "මූල පාපයෙන් පැවැතෙතැයි සලකනු ලැබේ. විවාහෝත්සවයයෙන් ලිංගික සම්බන්ධතා නීත්‍යානුකූල කෙරෙතත් දරුවන් පාපයෙහි ම උපදිතැයි සලකා තිබේ. දෙවියන් වහන්සේ විසින් දෙන ලද මනුෂ්‍ය ශරීරයේ ස්වාභාවික කාර්යයන් පිළිබඳ විකෘති මත නිසා ඉතා ඈතට යන මානසික ප්‍රතිඵල ඇති වේ. ඒ නිසා හැඟීම් යටපත් කිරීම් ද අපරාධ සංඥා ද ඉතා යට බැසගත්, බරපතල වූ, ශක්ති නාශක වූ, ගැටීම් ද ඇති වේ. කෙසේ හෝ ගත යුතු වූ අනෙක් මාර්ගය නිදහස් ආලය නැතහොත් සංවර රහිත ව ලිංගිකාශාව ප්‍රකාශයට පත් කිරීම නො වේ. කළ යුත්තේ ලිංගයේ ජනක ශක්තිය දිව්‍යමය වර ප්‍රසාදයෙකැයි පූර්ණාවබෝධයක් ලබා ගැනීම ය. "පවිත්‍ර ශරීරයකට ආලය කිරීම ආත්මයෙක

ලෞකික ජීවිතයේ දී ඇති වන ඉතාමත් ශුද්ධ වූ අද්දැකීම ය" යි එක් කියැවීමෙක් කියයි.

බොහෝ කියැවීම්වල දී අවධාරණය කෙරෙන මේ මතය ස්ත්‍රියක විසින් දරුවන් ලබා ගත හැකි දැයි අසන අවස්ථාවල දී විශේෂයෙන් දක්නට ලැබේ. එබඳු අවස්ථාවල දී බොහෝ විට ඉල්ලා ඇත්තේ කායික කියැවීමෙකි. ස්ත්‍රියට දැන ගැනීමට අවශ්‍ය වූයේ දරු උපතක් සඳහා කවර සකස් වීමෙක් අවශ්‍ය ද යනු ය. දීර්ඝ විස්තර සහිත කායික උපදෙස් දී තිබේ. ප්‍රසූතිය පහසු කිරීම සඳහා ගර්භණී කාලය මුළුල්ලේ ම අස්ථි චිකිත්සනය[1] නියම කිරීම හැරුණු විට කිසි ම අස්වාභාවික දෙයෙක් කියැවීම්වල දක්නට නො ලැබෙයි. නියම කරන ලද ආහාර, අභ්‍යාස හා පුද්ගල සැලකිල්ල ඕනෑ ම සමර්ථ වෛද්‍යවරයකු විසින් නියම කරන සාමාන්‍ය ස්වභාවයේ ඒවා ය. එහෙත් සාමාන්‍ය වෛද්‍යවරයකුට නැති වැඩි වාසියෙක් කේසිට තිබිණි. ඔහුට එක් එක් ශරීරයේ විශේෂ අවශ්‍යතා පිළිබඳ අභිඥා ඥානයෙක් විය.

කෙසේ හෝ කියැවීම්වලින් මානසික හා ආධ්‍යාත්මික සකස්වීම කෙරෙහි තබන ලද අවධාරණය මීටත් වැඩි තරම් ය. එසේ කරන ලද්දේ මාපියන්ගේ ආකල්පය සමාන මනස් ඇති ආත්මයන්ගේ ඇද ගැනීමට හේතු වන නිසා ය.

මනසේ හා ආත්මයේ සකස් වීම ජනක ස්වභාවයෙන් යුක්ත බවත් හුදු ශාරීරික සකස් වීමට වැඩියෙන් නැති නම් ඒ තරමට වත් අවශ්‍ය බවත් තේරුම් ගත යුතු ය.

තමාට තවමත් දරුවකු බලාපොරොත්තු විය හැකි දැයි ඇසූ තිස් හය හැවිරිදි ස්ත්‍රියකට කේසි මෙසේ කීවේ ය.

---

1. වචනයේ අදහස ඇට වෙදකම යනු ය. අප රට ඇති ගස් වෙදකම මීට බොහෝ දුරට සමාන ය. ඇට ඇදීම නියම තැනට ගැනීම ආදිය මීට අයත් ය.

"කායික වශයෙන් ද මානසික වශයෙන් ද ආධ්‍යාත්මික වශයෙන් ද ඔබ වඩා යෝග්‍ය ඇළ පාරක් බවට පත් කර ගන්න. මිනිසුන් වැඩියෙන් හිතන්නේ පිළිසිඳ ගැන්ම හුදු කායික සිද්ධියක් ලෙස ය.

හන්නා[1] තමා සකස් කර ගත් සැටි ගැනත් මේරි ගැනත් සිහි කරන්න. වාර්තා ගත බොහෝ නිදසුන් ඇත. කිසි ම තොරතුරක් දැන ගන්නට නැති නිදසුන් ද බොහෝ ය. එහෙත් ඒ හැම තැනෙක දී ම දීර්ඝ වූ සකස් වීමෙක් තිබී ඇත."

තවත් කියැවීමෙක් මෙසේ යː

"මැවුම්කාරයාණන් වහන්සේ විසින් මනුෂ්‍යයාට සංවාසයේ මාර්ගයෙන් තමන් වහන්සේගේ හුරු බුහුටි කෘතිය දැක ගැනීමට අවස්ථාවක් සලසා දී තිබේ. මේ අවස්ථාව සලසා ගැනීමේ දී ඔබත් ඔබගේ සහකාරයාත් ඇති කර ගන්නා වූ ආකල්පය ගැන විමසිලිමත් වන්න. එසේ කියන්නේ උපත ලබන ආත්මයාගේ තත්ත්වය එක්තරා ප්‍රමාණයකට මාපියන්ගේ ආකල්පය මත රැඳී ඇති හෙයිනි."

දරු - මාපිය - සම්බන්ධතාව, මොන ම ක්‍රමයෙකින් වත් අහඹු සම්බන්ධතාවක් ලෙස නො සැලකිය හැකි බව ද මේ කියැවීම් වලින් පැහැදිලි වෙයි. හැම විට ම වාගේ මාපියන්ගෙන් කෙනකු සමග දරුවාගේ පූර්ව ජීවිත සම්බන්ධතා තිබී ඇත. එබඳු පූර්ව ජීවිත සම්බන්ධතාවක් නො පැවැති නිදසුන් ස්වල්පයෙහි දී පවුල් තත්ත්වය දරුවාගේ මානසික අවශ්‍යතාවලට පරිසරයෙක් වී තිබේ. ඇතැම් දරුවනට මාපියන්ගෙන් එකකු සමග පමණක් පූර්ව කර්ම සම්බන්ධතාවක් තුබූ බව පෙනේ. එබඳු නිදසුන්වල දී දරුවා හා පළමු වරට සම්බන්ධ තැනැත්තා අතර පැහැදිලි උපේක්ෂකත්වයෙක් දක්නට ලැබෙයි. මාපියන්

1. Hannah

හා දරුවන් අතර තිබිය හැකි සම්බන්ධතා පැහැදිලි කිරීමට ඉතා හොඳ නිදසුන් කිපයෙක් පහත දක්නට ලැබේ.

බෙහෙවින් ඔවුනොවුනට ආදරය කළ මවක් හා පුතෙක් පෙර ද එසේ වී සිටියහ. එබඳු ම ආසන්න සම්බන්ධතාවක් පැවැති පියෙක් හා පුතෙක් පූර්ව ජන්මයෙක දී සහෝදරයෝ වූහ. එකට ජීවත් වීම දුෂ්කර වූ මවක හා දුවක අතර කිසි ම පූර්ව සම්බන්ධයෙක් නො තිබුණේ ය. එක් මවක් හා දුවක් ඔවුනොවුනට බෙහෙවින් උපේක්ෂක වූයේ පූර්වයේ දී බරපතළ නො ගැළපීමෙකින් යුත් සහෝදරියන් වී සිටි නිසා ය. ("එකල ඔබ දඬර කළහ. එය තව ම සකස් කර ගෙන නැත.") එක් පියෙක් හා දුවක් පූර්වයෙහි අඹු සැමියෝ ය. ඔවුනොවුන් අතර තද විරුද්ධතාවක් පැවැති මවක් හා දුවක් පූර්ව ජන්මයෙක දී එකම ස්ථානය සඳහාත් එක ම සැමියා සඳහාත් තරග කළ අය වූහ. මව යටත් කර ගැනීමට එක් පුතකු යත්න දැරුවේ පූර්ව ජන්මයෙක දී ඈ ඔහුගේ දුව වී සිටි නිසා ය.

දරුවකු මාපියන් වෙත ඇදී යෑමේ දී විවිධ මූල ධර්ම ක්‍රියාත්මක වන බව මේ නිදසුන්වලින් පැහැදිලි වෙයි. කෙසේ හෝ දක්ෂ ලෙස මෙහෙයවනු ලබන රූකඩ නැටුමෙක නූල් අපට නො පෙනෙන්නා සේ මේ මූල ධර්මයන් බොහෝ දුරට අපෙන් සැඟවී ඇත. කේසිගේ පිළිතුරුවලින් බොහෝ දේ යෝජනා කෙරෙන නමුදු හරියට ම ක්‍රමානුකූල වූ නියාමයක් සාදා ගැනීමට තරම් ඒ තොරතුරු, විස්තරවලින් යුක්ත නොවේ.

සමානයන් සමානයනට ඇදෙන තරමට ම පෙර විරුද්ධකාරයන් හා විරුද්ධ මානසික ගති ඇත්තන් ද විවිධ කර්ම හේතු නිසා බොහෝ විට එකට ඇදෙන බව පෙනේ. කියැවීම ලබා ගන්නා විට පස් හැවිරිදි එක් දරුවකු පිළිබඳ සිද්ධිය වෙනස් වූ මානසික ගතිගුණ ඇත්තන් පිළිබඳ සැලැකිය

පුහු නිදසුනෙකි. ඔහු තමාට වැරදී තිබෙන විටත් තම වරද පිළිගැනීමට අකැමැති උපේක්ෂක ආත්මාර්ථකාමියකු ලෙස හඳුන්වා ඇත. අපෞද්ගලිකත්ව ය නිසා ද හුදු බුද්ධි ගෝචර සාර ධර්මවලට කැපවීම නිසා ද ඔහුගේ ආකල්පය අවශ්‍යයෙන්ම පරීක්ෂක විද්‍යාඥයකුගේ ආකල්පයයි. පූර්ව ජන්මයේදී ඔහු වාෂ්ප බලය පිළිබඳ කටයුතු වලට කැප වී සිටියේ ය. ඊට පූර්වයෙන් ඔහු කෙළේ වෙඩි බෙහෙත් වැනි රසායනික ද්‍රව්‍ය අතපත ගෑමය. ඉන් පෙර ඔහු යාන්ත්‍ර විද්‍යාවෙහි[1] නියැලියෙකි. ඊටත් පෙර අන්ලන්තිසයේ සිටි විදුලි ඉන්ජිනේරුවෙකි.

ආත්මභාව සතරක් ම හුදු විද්‍යාවට කැප වී සිටීමෙන් ස්ප්‍රැංගර් අදහස් කළ 'සාර ධර්මයන්ගේ' නො නැසී පැවැතීම පිළිබඳ පැහැදිලි නිදසුනෙක් අපට ඉහත සඳහන් කළ පුද්ගලයාගෙන් ලැබේ. මොහු විද්‍යාප්‍රිය වර්ගයට අයත් බව හොඳට ම පැහැදිලි ය. එහෙත් ඔහු මෛත්‍රිය, සෞන්දර්යය හා ජීවිතයේ සමගි ගුණදම් කැප කොට විද්‍යා සාරධර්ම පැත්තට වැඩියෙන් බර වී ඇත. ඒ සාරධර්මවල ද විද්‍යා සාරධර්මවල තරම් ම අගයෙක් ඇත. ඉගත සඳහන් කළ පුද්ගලයා අන්‍යයන් කෙරෙහි දක්වන ආකල්පය අරතියෙකි, නීරස උපේක්ෂාවෙකි. ඔහුට මේ ජීවිතයේ දී විදුලි හා ඉංජිනේරු ශිල්පයටත් ගණිත ශාස්ත්‍රයටත් සම්බන්ධ වන ඕනෑ ම දෙයක් පිළිබඳ උසස් ම සාර්ථකත්වයක් ලැබෙනු ඇතැයි වැඩි දුරටත් කියා තිබේ. ඔහු පිළිබඳ කී කරුණු හැම අතෙකින් ම සත්‍ය බව ඔප්පු වී තිබේ. ඔහු අද සාර්ථක විදුලි ඉංජිනේරුවෙකි. ඔහුගේ චරිත ලක්ෂණ ඔහුගේ ම පසු බිමට අනුව අනුමාන කළ හැකි ඒවා ය. එහෙත් ඔහුගේ පවුල් පරිසරය නිසා සුළු සුළු වෙනස්කම් ඇති වී තිබෙන බව පෙනේ.

සමානයනට සමානයන් ඇඳෙනවා නම් කාට වුවත් සිතෙන්නේ ඔහු විද්‍යාවට බර වූ පරිසරයෙක ඉපැදිය යුතු ය

1. Mechanics

තියා ය. ඔහුගේ පියා ඉන්ජිනේරුවකුත් මව ගණිත ගුරුවරියකත් විය යුතු නේද ? එහෙත් ඔහු උපන්නේ ක්‍රියාවට නැගීමට දුෂ්කර වූ අදහස් ඇති විඥානවාදීන්ගේ පවුලෙක ය. පැහැදිලි ලෙස ම ඔහුගේ පියා අයත් වන්නේ සාමාජික හා ආගමික සාරධර්ම ගරු කරන වර්ගයට ය. මව අන්තර්නත නමුදු ඕ ද ඇගේ උද්‍යෝගවත් සැමියාගේ සමාජ සේවා කටයුතුවලට ඇද ගන්නා ලද්දී ය. ළමයාගේ වැඩිමහල් සහෝදරයා ද විඥානවාදියෙකි. ඔහුගේ ප්‍රධාන ජීවිත කාර්යය වූයේ පරෝපකාරයයි.

නිශ්චය කර ගත හැකි තරමින් නම්, මේ ළමයා මේ පවුලේ ඉපැදීම වචනයේ නියම අර්ථයෙන් කර්ම විපාකයෙකැයි කිව නො හැකි ය. ඒ එක්ක ම වරද හරි ගැස්සීමේ නියාමයක් ද මෙහි දී ක්‍රියාත්මක වූ බව පෙනේ. මොහුගේ අහිතකර වූ පමණ ඉක්ම වූ අංශයක් නිවැරැදි කළ යුතු ව තිබිණි. ආත්මය තම ආකල්පයේ අඩුපාඩුකම් දැන ගෙන මානව දයාවට බර සාරධර්මයන් ඇතුළත් කර ගන්නා ලෙසින්, තම ආකල්පය පළල් කිරීමට ඉවහල් වන පරිසරයක් තෝරා ගත්තා සේ පෙනේ.

අන්‍යයනට උපකාර කිරීම ජීවිතයේ ප්‍රධාන කාර්යය කර ගත් මනුෂ්‍යයන් සමග නිත්‍ය සම්බන්ධයකට මේ දරුවා තල්ලු කර දමා ඇත. ඇති සැටිය පිළිබඳ ව මුළුමනින් ම යොමු වූ ඔහුගේ හැඟීමෙන් පවුලේ අනෙක් අය ද සංවර වූහ. අනෙක් අතට ඔවුන්ගේ ආකල්පය ඔහුගේ සාරධර්මවලින් පිටස්තර තවත් සාරධර්ම ඇති බව ඔහු දිනපතා මතක් කර දුන්නේ ය. මේ අද්දැකීමෙන් ඔහුගේ ජීවිතයේ ප්‍රධාන සාරධර්මයෙහි හෙවත් නුදු විද්‍යාව පසු පස යෑමෙහි සම්පූර්ණ වෙනසක් ඇති නොවූ නමුදු එය ඔහුගේ චරිතය කෙරෙහි එක්තරා ප්‍රමාණයකට බලපා තිබේ. එයින් ඔහුගේ ආත්මාර්ථකාමී ගතිය අඩු වී සමාජ ප්‍රියතාව වැඩි වී තිබේ. මෙසේ අඩු ගණනේ අර්ධයෙකින් වත් ඔහුගේ මාපියන් තෝරා ගැනීමේ ප්‍රතිකාරක අර්ථය ඉටු වන බව පෙනේ.

උපදින සත්ත්වයාට මාපියන් තෝරා ගැනීම සම්බන්ධයෙන් එක්තරා ප්‍රමාණයක නිදහසක් ඇත්තේ ය. යන්ත්‍ර, කේසි තොරතුරු වලින් බොහෝ දුරට ඔප්පු වෙයි.[1] අඩුවෙන් දියුණු වූ ආත්මවලට තෝරා ගැනීමේ ශක්තිය අඩු බව පෙන්වීමට සාක්ෂි තිබේ. එහෙත් සාමාන්‍යයෙන් ගත් කල මාපියන් තෝරා ගැනීම ආත්මයේ වරප්‍රසාදයක් බව පෙනේ. නූපන් ආත්මයක් සිතා මතා ම මුඩුක්කු පරිසරයක්, දූෂිත මාපියන්, විකලාංග ඇති ශරීරයක් නැතහොත් කවර හෝ අන්‍ය අහිතකර පරිසරයක් තෝරා ගත යුත්තේ කවර හෙයින් දැයි තේරුම් ගැනීම දුෂ්කර ය. බැලූ බැල්මට එබඳු තෝරා ගැනීමකට සිත නො නැමෙතියි පෙනී යයි. එහෙත් වඩා ගැඹුරට විග්‍රහ කළ විට එහි නියම මානසික පරස්පර විරෝධයක් නැති බව පෙනේ.

මේ තත්වය, තමන් ඕනෑවට වැඩියෙන් මහත් වන බව හදිසියේ ම තේරුම් ගන්නා වූ මිනිසකුගේ තත්ත්වයට සමානය. ඔහුගේ රක්ෂණ සමාගමෙන් කරනු ලබන ඇතැම් සීමා කිරීම හෝ කාන්තාවක විසින් ප්‍රතික්ෂේප කිරීමක් හෝ පෙර ඇඳි ඇඳුම් ඇඳීමට අමාරු වීම හෝ නිසා ඔහුට එක්වර ම තමාගේ මහත ගැන හැඟීමක් ඇති වෙයි. හේ බර අඩු කර ගැනීමට උපදෙස් දෙන සුදුසු මධ්‍යස්ථානයක් තෝරා ගෙන හමුවීම් වේලාවක් නියම කොට ගෙන එහි ලියා පදිංචි වී බර අඩු කරන පිළියම් මාර්ගයක් අනුගමනය කරයි. හය මාසයකට පසුව හේ කෙටි වූ බඳ පටියෙකින් යුතුව වඩා සුඛිත හෘදය ක්‍රියාකාරීත්වයක් ඇති ව තම අර්ථය ඉටු කර ගෙන පිට වෙයි. බොහෝ දුරට මෙබඳු ම දෙයක් කිරීමට හැකි තත්ත්වයෙකින් ආත්මයන් පවතින බව පෙනේ. හිතා මතා අප්‍රිය තත්ත්වයක් පිළිගැනීමට තීන්දු කිරීම මිනිසුන් නො කරන දෙයෙක් නොවේ. මනුෂ්‍යයෝ බොහෝ විට බලාපොරොත්තුවක් ඉටු කර ගැනීමට උපායක් වශයෙන් අප්‍රසන්න සේ පෙනෙන දෙයක් තෝරා ගනිති.

1. මෙය තරමක් දුරට බුදු සමයෙන් ද අනුමත වන මතයෙකි.

පූර්වමයකට මෙන් ළදරු මරණ සම්බන්ධයෙන් මේ තෝරා ගැනීමේ නිදහසෙහි කිසියම් සම්බන්ධයක් තිබෙන බව පෙනේ. කියැවීම්වලට අනුව මාපියන් තෝරා ගැනීම නිසා ආත්මයට මෙලොව ලබා ගන්නට සිදුවන තත්ත්වය පිළිබඳ සාමාන්‍ය ක්‍රමයෙක පූර්ව ඥානයක් උත්පත්තියේ දී තිබේ. එසේ වුවත් මනුෂ්‍ය චේතනාව ස්වතන්ත්‍ර නිසා සියලු අනාගත සිද්ධි දක ගත නො හැකි ය. මේ නිසා මාපියන් තෝරා ගෙන ඉපදුණාට පසුව, ආත්මයට තම මාපියන් උත්පත්තියට පෙර පොරොන්දු වන්නා සේ පෙනුණු කරුණුවලට අනුව ජීවත් නො වන බව දැන ගන්නට ලැබෙනු ඇත. එවිට වෙනස් වූ පරිසරය නිසා ඉපැදීමේ අර්ථය බිඳී ගිය බව දැන ආත්මය පසු බසී.

මේ කරුණට අදාළ, තරුණ ස්ත්‍රියක පිළිබඳ සිද්ධියෙක් ඇත. පූර්ව ජන්මයේ දී ඈ බාල වියෙහි දී මිය ගිය බව කියා තිබේ. ඈ ඒ මාපියන් ළඟ ඉපැදුණේ ප්‍රධාන වශයෙන් ම මවට තුබූ ඇල්මක් නිසා ය. කෙසේ හෝ උපතින් වැඩිකල් යන්නට පෙර පියා බොන්නටත් නො සැලැකිලිමත් වන්නටත් බණින්නටත් පටන් ගත්තේ ය. බලාපොරොත්තු සුන්කර ගත් ළදැරිය ජීවත් නො වන්නට තීරණය කර ගත්තා ය. බාල කාලයේ නිතර වැළැඳෙන රෝගයෙකින් ටික දිනක් පෙළුණු ඕ ආ තැනට පෙරළා ගියා ය.

මෙබඳු පසු බැසීම් සුලබ සිදුවීම් බව කියැවීම්වලින් පැහැදිලි ව දක්වේ. මෙය විශ්වාස කළ හැකි නම් අඩු ගණනේ සමහර නිදසුන්වල දී ළදරුවන්ගේ මරණ සිත් නො ගන්නා ප්‍රථම අංකය බැලීමෙන් පසු ව බුද්ධිමත් ප්‍රේක්ෂකයකු විසින් රඟහල හැර යෑමට සමාන කළ හැකි ය. ඉහත සඳහන් නිදසුනේ දී මෙන් ඇතැම් නිදසුන්වල දී එයින් හෙළි වන්නේ උපදින ආත්මයාගේ වැරැදි විනිශ්චයයි.

ඇතැම් අවස්ථාවල දී ඉතා බාල දරුවකුගේ මරණය,

මාපියන් විසින් අවශ්‍යයෙන් ලැබිය යුතු දුක් සහගත අද්දැකීමෙකැයි විවරණය කළ හැකි ය. පරිත්‍යාගශීලී ගතියෙකින් දරුවා සුළු කාලයකට මෙලොවට ආවේ මාපියන් විසින් විඳිය යුතු වූ ඖෂධයක් වැනි දුක් වේදනාව ඔවුනට ලබා දීම සඳහා විය හැකි ය. පසුගිය ශත වර්ෂයට අයත් අප්‍රසිද්ධ නවකථාවෙක තේමාව වශයෙන් යොදා ඇත්තේ මේ වර්ගයේ ආත්ම පරිත්‍යාගයෙකි. මේ කථාවට අනුව එක් දූරියකට භෞතිකවාදී වූ මානාධික පියෙක් සිටියි. හේ තම වස්තුව ගැනත් දරුවන්ගේ ලස්සන ගැනත් ආඩම්බර වෙයි. පියාට ආදරය ඇති නමුත් ඔහුගේ සාරධර්ම ආධ්‍යාත්මික කරන්නට දූරියට කළ හැකි කිසිවෙක් නොවීය. අනතුරෙකින් මිය යන ඕ නොබෝ කලෙකින් තොර දූරියක ලෙසින් ඒ මාපියන් කරා ම එයි. ඈ සිතා මතා ම මේ ශරීරය හා අද්දැකීම් ලැබුවේ පියා කෙරෙහි වූ මෛත්‍රිය නිසා ය. ඔහුගේ ආත්ම පාරිශුද්ධිය ඇති කරන චේතනාවක් ඔහුට ඇති කිරීමට ඈයට උවමනා විය. මෙය ප්‍රබන්ධයක් බව සත්‍යය. එහෙත් මෙයින් අභිවෘද්ධිය සඳහා දුකක් විඳිය යුතු පුද්ගලයන් දෙදෙනකුට තෙවැන්නකු විසින් මෛත්‍රියෙන් අධ්‍යාපනික සේවයක් කිරීමට සිතා ගත් විට සිදු විය හැකි දෙයෙක් අඟවනු ලැබේ. ඇතැම් විට එබඳු දේ සිදු වන බව කේසි කියැවීම්වලින් දක්වෙයි.

කේසි කියැවීම්වල කීප වතාවක් ම පැහැදිලි ලෙස ම කියා ඇති තවත් සිතා ගන්නා කරුණෙක් නම් ගැබ් ගැනීමත් ආත්මයේ ඇතුළු වීමත් එකට ම සිදු නොවන බවයි. ගර්භණී මවුවරුනට තමාගේ සිතුවිලි ගැන පරෙස්සම් වන්නට මේ කියැවීම්වලින් නිතර කියනු ලැබේ. එසේ කියා ඇත්තේ එක්තරා ප්‍රමාණයකට ඒ සිතුවිලිවලින් පිළිසිඳ ගන්නා ආත්ම වර්ගය නිශ්චිත වන නිසා ය. පහත එන උද්ධෘතයෙන් ඒ මතය පැහැදිලි වෙයි.

ප්‍ර: "ඉදිරියට එන මාසවල දී මා කොයි විදියේ මානසික ආකල්පයක් ඇති කර ගත යුතු ද ?"

උ: "එය රැඳී ඇත්තේ ඔබ බලාපොරොත්තු වන දරුවාගේ වර්ගය මත ය. ඔබ සංගීතය ප්‍රිය කලාකාමී දරුවකු කැමැති වනවා නම් සංගීතය හා චිත්‍ර කලාව ගැනත් සෞන්දර්ය ගැනත් සිතන්න. ඔබ ඔහු වැඩියෙන් යාන්ත්‍රික වනවාට කැමැති ද ? එසේ නම් යාන්ත්‍ර විද්‍යාව ගැන සිතමින් එබඳු දේ අතපත ගාන්න. මෙහි ප්‍රතිඵල නැතැයි නොසිතන්න. හැම මවක විසින් ම දත යුතු යමෙක් එහි ඇත. ගර්භණිය කාලයෙහි ඇති වන මානසික ආකල්පය ගැබට ඇතුළු වන ආත්මයෙහි ස්වභාවයට බෙහෙවින් සම්බන්ධය." [1]

නවද උපතට ටිකකට පෙරත් ටිකකට පසුවත් උපතේ දීත් ආත්මය ශරීරයට ඇතුළු වීමට සමත් බව කේසි කියැවීම්වලින් පෙනී යයි. ළදරුවාගේ උපත සිදු වී පැය විසිහතරක් පමණ කාලයක් යන තුරු ශරීරයට ආත්මය ඇතුළු නොවී තිබිය හැකිය. ඇතැම් අවස්ථාවල අවසාන මොහොතේ දී පවා ඇතුළු වන්නට තිබෙන ආත්මය වෙනස් වේ. බැලූ බැල්මට ශරීරයට පණ දෙන ආත්මයෙකින් තොර ව ශරීරයට පැවැතිය හැකිය යන මතය මූලික පුනර්ජන්මවාදී මතය සමග ගැටෙන බව පෙනී යනු ඇත. එසේ වුවත් අවශ්‍ය නො ගැළපීමෙක් එහි නැත. පරම විඥානවාදීන් [2] විසින් ශරීරයට ආත්මයේ 'වාහනය' යි කියනු ලැබේ. වාහනය යන වචනයෙන් යෝජනා කෙරෙන උපමාවක් ගනිමු. රියැදුරකු නැති නමුත් සැර වැටී [3] දුවන මෝටරයෙකින් සුතු අංග සම්පූර්ණ වූ මෝටෝරිය කඳෙක් තිබිය හැකි ය. එමෙන් ම ශරීරය ද අංග සම්පූර්ණ ව ක්‍රියාත්මක ඉන්ද්‍රිය

1. ගබ්භ පරිහාර දීමේ සිරිත මේ නිසා විය හැකි ය.
2. Theosophists
3. මෙහි දී සැරවැටීම සිදු වූයේ නිෂ්පාදකයන් නිසා යයි සිතීමට සිදු වේ.

පද්ධතියෙකින් යුතුව, එයට පණ දෙන පදිංචි කාරයාගෙන් තොර ව පැවැතිය හැකි ය.

සාදෘශ්‍යයෙන් තර්ක කිරීම හැම විට ම වලංගු වූ හෝ තීරණාත්මක වූ හෝ ක්‍රියා මාර්ගයෙක් නොවේ. මෙබඳු ප්‍රකාශන කේසි කියැවීම්වල නිතර නිතර එනු දක්නට ලැබෙන නිසාත් විද්‍යානුකූල නිශ්චිතත්වයෙකින් යුතු ව ජීවිතයේ නො පැහැදිලි ක්‍රියා මාර්ග විවරණය කළ හැකි තරමට ප්‍රමාණවත් වූ ඥානයක් අපට නැති නිසාත් අපට මේ අන්දමට සාදෘශ්‍යය වහල් කොට කල්පනා කිරීමට සිදු වී තිබේ. කිසියම් කෙනෙක් වරක් කේසිගෙන් මේ අනිවාර්ය ප්‍රශ්නය විචාළහ. "ආත්මය ඇතුළු වන තාක් භෞතික ශරීරයේ ජීවිතය රැඳී තිබෙන්නේ කිමෙකින්ද?" ලැබී ඇති උත්තරය නො පැහැදිලි යයි නොව ගුඪ යයි කිව යුතු ය. "ජීවයෙනි, ද්‍රව්‍යයේ ජීවයේ ප්‍රභවය දෙවියන් වහන්සේ ය."

මේ කරුණ ගැනත් තවත් බොහෝ කරුණු ගැනත් තවත් අභිඥා පරීක්‍ෂණ කළ යුතුව තිබේ. බාල කාලය ගැනත් දරු මාපිය සම්බන්ධතා හා උපත ගැනත් ලැබී ඇති කේසි තොරතුරුවලින් ඇති වන මත අනුගමනය කරමින් එබඳු පරීක්‍ෂණ භාවිතයට ගත් විට අපට අලුත් සුප්‍රජනක විද්‍යාවකුත්[1] කුමාර මනෝවිද්‍යාවකුත් ජාති සංවර්ධනයකුත් ඇති කර ගත හැකි ය. උත්පත්තිය පෙනෙන තරමට අහඹු සිද්ධියෙක් නොවේ. බාල කාලයත් ජීවිතයේ ම කොටසෙකි. අනෙක් බොහෝ තැන්වල දී මෙන් මෙහි දීත් පරීක්‍ෂණ ක්ෂේත්‍රය පළල් කරන නිසා කේසි කියැවීම් සිත් අලවනසුලු වෙයි.

1. Science of eugenics හොඳ දරුවන් උපදවා ගැනීම පිළිබඳ විද්‍යාවයි.

# 18

# කර්ම විපාක වශයෙන් ඇති වන පවුල් අවුල්

අඩුපාඩුකම් සහිත දරුවකු ලොවට බිහි කිරීමෙන් ඇති වන ශෝකය මාපිය දෙපක්ෂයටම විඳින්නට සිදුවන නන් වැදෑරුම් දුක් වේදනා අතර එකෙකි. භෞතික වශයෙන් සලකන විට මේ නිසා වැඩි වියදමක් දරන්නටත් වැඩි සැලකිල්ලක් යොදන්නටත් සිදුවන බව පෙනේ. සාමාජික වශයෙන් සලකන විට, එය වචනයෙන් නො පවසන ලද අපවාදයෙකි. ආධ්‍යාත්මික වශයෙන් එයින් දෙවියන් වහන්සේ මිනිසාට සලකන ආකාරය ගැන විමසීමට අවස්ථාවෙක් සැලැසේ. එය දරුවාගේ අනාගත අභිවෘද්ධිය පිළිබඳ බලාපොරොත්තුව සැක සහිත කිරීමට හේතුවෙක් ද වේ.

එබඳු මාපියනට පුනර්ජන්මවාදයෙන් මහත් ධෛර්යයක් හා සංරක්ෂණියෙක් ද සැපයෙයි. පළමු කොට ම මේ මූල ධර්මයෙන් ඕනෑ ම විකෘතියක් කර්ම හේතුවෙන් විය හැකි බව පැහැදිලි වෙයි. උපතේ දී සිදු වූ තුවාලවීම් සමහරෙක් කර්ම හේතුවෙන් නොවූ බව කියන නිදසුන් කීපයෙක් කේසි ලිපි

ගොනුවල තිබේ. (මේ කරුණු පිළිබඳ නව දුර විමසීමෙක් කර්මය පිළිබඳ පරිච්ඡේදයෙහි දක්නට ලැබේ.) එහෙත් සාමාන්‍යයෙන් ගත් කල ජන්ම විකෘතිවලින් දක්වෙන්නේ අතීත ජීවිතවල කරන ලද පාප කර්මයෙකි. දෙවැනි ව මාපියන් හා විපතට පත් දරුවා අතර වූ සම්බන්ධතා, හැම විට ම වාගේ කර්ම විපාකයෙක් බව පෙනී යයි. තද මෝඩකමින් ද බැරිකමින්ද මොළයේ වතුර තිබීමෙන් ද තවත් නොයෙක් ශෝචනීය රෝගවලින් ද පෙළෙන දරුවන් පිළිබඳ ව කරන ලද කැපවීම් වල දී මෙ කියමන නිතර නිතර හමු වේ. "දරු මාපිය යන දෙපක්ෂයටම මෙය කර්ම විපාකයෙකි."

මේ වර්ගයේ කර්ම විපාක පිළිබඳ ඉතා හොඳ නිදසුනෙක් දොළොස් හැවිරිදි යුදෙව් දැරියක පිළිබඳ සිද්ධියෙහි දක්නට ලැබේ. ඉතා කුඩා අවදියේ සිට, ඕ අපස්මාරයෙන් පෙළුණාය. වැළැඳෙන අවස්ථාවේ දී කරදරයක් පමණක් නොව මෙයින් ඉතා බරපතළ චරිත හානියෙක් ද ඇති විය. කියැවීමට අනුව දැරිය, මව හා පියා යන තුන් දෙනාගෙන් යුතු මේ පවුල ඇමෙරිකාවේ විප්ලව කාලයේ දී ද මෙසේ එකතුව සිටියේ ය. ජනපද වාසීනට නොව එංගලන්තයට පක්ෂපාත වීම ආර්ථික වශයෙන් වැඩියෙන් ලාභ බව, දෙමාපියෝ තේරුම් ගත්හ. එහෙයින් ඔව්හු කිරීටයට ප්‍රයෝජනවත් වන තොරතුරු රැස් කරන්නට පටන් ගත්හ. රූමත් දියණිය දක්ෂ සාහසික තැනැත්තියක් වූවා ය. එක්ව තුබූ ඒ දක්‍ෂතා, මාපියන්ගේ කාර්යයට බොහෝ ප්‍රයෝජනවත් විය. මාපියෝ ඇ සංවර කරනු වෙනුවට ඇගේ සහජ දක්ෂතා දේශපාලන කටයුතුවලට ප්‍රයෝජනවත් වන සේ මිනිසුන් පෙළැඹවීමට යෙදීම සඳහා ඈ නමා ගත්හ.

මේ සිත් ගන්නාසුලු න්‍යායයේ අන්තයේ කිමෙක් වී දැයි කියැවීම්වලින් හෙළි නො කෙරෙන නමුදු වර්තමාන ජීවිතයේ

දී ඇති වූ එකී ප්‍රතිඵල නම් දක්වනු ලැබේ. එයින් අපට දෙවියන් වහන්සේගේ මෝල් අඹරන්නේ සෙමින් නමුත් හොඳට ම කුඩු වන්නට අඹරන බව සිතන්නට සිදු වේ. ළඳුරිය පිළිබඳව ජීවිත කියැවීම මෙබඳු ය.

"මේ තැනැත්තියගේ මාපියනට ඈ පිළිබඳව ලැබී ඇති ඉඩ ප්‍රස්තාව ද ඇයට ඔවුන්ගෙන් ඉටු විය යුතු යුතුකම් ද සොයා ගැනීමට ඔවුන්ගේ ජීවිත කියැවීම්වලින් ලබා ගත් අතීත තොරතුරු සසඳා බැලිය යුතු ය.

මේ තැනැත්තියගේ වර්තමාන දුෂ්කරතා දක්නා හැම දෙනා ම හැම ආත්මයකට ම එය ම හමුවන බව තේරුම් ගත යුතු ය. දෙවියන් වහන්සේ රැවැටී නැත. හැම ආත්මයකට ම තමා විසින් වපුළ දෙය නෙළා ගන්නට සිදු වේ.

අතීතයේ දී කරන ලද තමා උසස් කිරීම හා පිනවීම් දැන් මහා දුඃඛ විපාකයක් විඳින්නා වූ කෙනකුගේ ශාරීරික තත්ත්වයෙකින් එළියට එයි...."

දැන් මේ ලෝකයට මේ ආත්මයේ ඇතුළු වීම පිළිබඳව වග කිව යුතු අය ම එකල ඇයට සුදුසු ආත්ම දමනයක් ඇති කර ගැනීමට නොහැකි වීම පිළිබඳව බොහෝ දුරට වගකිව යුතු වූහ. සත්තෙකින් ම ඔව්හු වැඩි ආර්ථික ප්‍රයෝජන සඳහා ඈ යොදා ගත්හ. එහි ප්‍රතිඵල වශයෙන් දැන් ඒ අය විසිනුත් විඳිය යුතු විපාක රාශියක් පැමිණ තිබේ."

කොටින් කියතොත් දුව දැන් ඇගේ කායික ආබාධයෙන් පූර්වයෙහි වග විභාගයක් නැති ව කරන ලද අධික කාමසේවනයෙහි විපාක විඳී. ඇගේ පූර්ව අසංවරයට වග කිව යුතු මාපියනට දැන් ඇය රැක බලා ගන්නට වීම යුක්ති සහගතමය.

නිව්යෝක් නගරයෙහි අන්ධව උපන් ළඳුරියක පිළිබඳ

නවත් සිත් ගන්නා නිදසුනෙක් ඇත. ජයාරූපවලට අනුව නිශ්චය කරනහොත් ඕ පියකරු ය. ඇට අල්පමාත්‍ර පෙනීමෙක් තිබිණි. එහෙත් වස්තූන්ගේ හැඩය වෙන් කොට හඳුනා ගත නොහැකි විය. ඇගේ මව ඉල්ලා සිටියේ කායික කියැවීමෙකි. දූරිය පිළිබඳ ජීවිත කියැවීමක් ලබා ගෙන නැති නිසා ඇගේ ආබාධයේ කර්ම හේතුව අපට දැන ගත නොහැකි ය. කෙසේ හෝ මව තමා පිළිබඳ ජීවිත කියැවීමක් ලබා ගත්තා ය. දූරියට ඇගෙන් ඉටු විය යුතු යුතුකමේ යුක්තිය මෙහි දී පහදා දී තිබේ.

අතීත ජන්මයේ දී මව ගුරුවරියක ව සිටි බව පෙනේ. කියැවීම මෙසේ ය; "මේ තැනැත්තිය මවකට කරදරයක් ඇති වූ අවස්ථාවෙකින් ප්‍රයෝජන ගත්තා ය. මෝ බොහෝ මිනිසුන්ගේ හදවත් හා සිත් තුළ උසස් තැනකට නැග සිටියා ය. මිනිසුන් දකින්නේ බාහිර පෙනුම පමණයි. දෙවියන් වහන්සේ හදවත් දකින සේක. මේ වර්තමාන විපතෙහි දී ඔබටත් ඔබේ සැමියාටත් තමාගේ ම ආත්ම හමු වී තිබේ. එසේ වූයේ වරක් නුඹලා දෙවියන් වහන්සේ ගේ නියමයට ඉහළින් ආත්මාර්ථය තබා ගත් නිසායි."

මේ නාට්‍ය ස්වරූප කුමන්ත්‍රණයේ නියම ස්වභාවය කිමෙක් දැයි අනුමාන කරනවාට වැඩි දෙයෙක් අපට කළ නොහැකි ය. මීට පියාත් පටලැවී සිටි බව පෙනේ. නිශ්චය වශයෙන් අපට දක්නට ලැබෙන්නේ ගුරුවරිය මවකගේ හිතේ සැනසුම කැප කොට ඇය තමාගේ ආත්මාර්ථය සඳහා යොදාගත් බව ය. මෙහි පැහැදිලි දෛව ප්‍රවාහ දෙකක් ඇති බව පෙනේ. අයුතු ප්‍රයෝජනයට යොදා ගනු ලැබූ ස්ත්‍රියට ද අන්ධ වීමෙන් විඳිය යුතු කර්මයක් තිබෙන්නට ඇත. එය කෙරෙන්නට ඇත්තේ පූර්ව ආත්මයෙක දී විය යුතු ය. එහි විපාක විඳීමට වර්තමාන ජීවිතය තෝරා ගෙන ඇත. ඉපැදීමේ මාර්ගය වශයෙන් වර්තමාන මව තෝරා ගන්නා ලද්දේ මවගේ ම කර්මයට විපාක විඳීමට ඉඩ සලසා දීමට ය.

තුන් වන නිදසුන තද මෝඩකමක් පිළිබඳ එකෙකි. මෙහි දි ද ලැබී ඇත්තේ තොරතුරු ස්වල්පයෙකි. එහෙත් වර්තමානයෙහි අඩුපාඩුකම් සහිත දරුවකු මේ මව වෙත ඇදී ඊමේ කර්ම හේතුව පලස්තීනයේ වූ පූර්ව ජන්මයෙක දී මව විසින් පීඩිතයනට කවටකම් කිරීම බව පෙනේ.

තවත් නිදසුනෙක් දියහිස[1] නමින් හැඳින්වෙන දුර්ලභ රෝගය ඇතිව අඩු වයසින් උපන් දැරියක පිළිබඳව ය. ඇගේ උපතින් ස්වල්ප දිනකට පසු ව මව කලුරිය කළාය. තරුණ වැන්දඹු පියා දැරිය කතෝලික ගෙයෙක නතර කෙළේ ය. දැරියට සතර හැවිරිදි වූ කල හේ ඈ ගැන කායික කියැවීමක් ඉල්ලා සිටියේ ය. ඔහු ලියා ඇත්තේ මෙසේ ය;

"බුද්ධිමත් වූ මේ දැරියට හැම දෙයක් ම තේරෙයි. මිනිසුන්ගේ නම් දන්නා වූ ඈට තරමක් හොඳට සාකච්ඡාවක් කර ගෙන යත හැකි ය. ඇගේ ඔළුවේ බර නිසා ඈට ඇවිද්ද නොහැකිය. ඇගේ හිස පරෙස්සමින් දරා සිටිය යුතුව ඇත."

දැරිය ගැන ජීවිත කියැවීමක් ලබා ගෙන නැති නිසා ඇගේ ආබාධයේ කර්ම හේතුවේ ස්වභාවය ගැන යමක් කියා නැත. එසේ වුවත් තමා ගැන ජීවිත කියැවීමක් ලබා ගත් පියා දැරියට ඔහුගේ තුබූ පූර්ව සම්බන්ධය ගැන ඇසුවේ ය. පැහැදිලි කෙටි පිළිතුර මෙසේ ය; "මීට පෙර අද්දැකීමේ දී ඔබට උපකාර කළ හැකි ව තිබුණා. එහෙත් ඔබ එය කෙළේ නැත. දැන් උදවු කළොත් හොඳා" අභාග්‍යයකට මෙන් ඔහුගේ චාරිත්‍ර පාපයේ[2] ස්වභාවය දැන ගැනීමට තරම් කියැවීමේ තොරතුරු නැත. ඩියර්බෝර්න් වරායෙහි වෙළෙන්දකු ව සිටි හේ "මානසික[3] වශයෙන් හා ආර්ථික වශයෙන් ද දියුණු විය. ආධ්‍යාත්මික

1. Water head
2. චාරිත්‍ර පාපය නම් කළ යුතු දෙය නො කිරීමේ පාපයයි.
3. මානසික දියුණුව වශයෙන් බුද්ධියේ දියුණුව ගත හැකි ය. ආධ්‍යාත්මික පිරිහීම නම් සද්ගුණවලින් පිරිහීම ය.

වශයෙන් පිරිහුණේ ය." අප ඔහුගේ අන්තිම ජීවිතය ගැන දන්නේ මෙපමණ ය.

මේ කරුණ සම්බන්ධයෙන් එක් අනුමානයෙක් බලගතුව නැගී සිටී. එනම් මිනිස් දුකට උපේක්ෂක වීම නිසා, දෛවය ඒ දුක ගෙනවුත් අපගේ ම දොරකඩ තබන්නේ ය යනු ය. මිනිසකු අනිකකුට ක්රෑර ක්‍රියාවක් කිරීමට තරම් නපුරු නොවී සිටිනු ඇත. එහෙත් හේ දන්තේ[1] විසින් අපායට කැප කරනු ලබන පුද්ගලයන් මෙන් චාරිත්‍ර වශයෙන් නරක නො වන්නා සේ ම චාරිත්‍ර වශයෙන් හොඳ ද නොවේ. අන්‍යයන් දුක් විඳිනා කල්හි උපේක්ෂක වීම, අනාගත ශාරීරික විකෘති ඇති වීමට තරම් ප්‍රබල පාපයක් නො වන්නට පුළුවන. එහෙත් ඔහු කෙසේ හෝ අනුකම්පක විය යුතු ය. කෙසේ හෝ ඔහු මිහිපිට ඇති දුඃඛිතයන් උදෙසා වෙහෙසීමට උගත යුතු ය. ඔහු කාරුණිකයකු කිරීම සඳහා ඔහුට ම ආබාධය ඇති වීම සුදුසු නැති නිසා ඔහු පීඩිත දරුවකුගේ පියකු වීමට වඩා හොඳ උපාය මාර්ගයක් තිබේ ද ? තම දරුවන්ගේ ම අසරණ අදක්ෂ භාවය දැකීමේ මාර්ගයෙන් ඔහුට පීඩා විඳින දරුවන්ගේ මාපියන් විඳින දුකත් මිනිස් දුකේ අර්ථයත් තේරුම් ගන්නට ඉඩ සලස්සා දී ඇත.

චාරිත්‍ර ශීල වශයෙන් වූ පරිත්‍යාගය ඉගෙනීමට ඉතා හොඳ අවස්ථා දෙකක් පිට පිට සලස්සා දී තිබිය දීත් තව ම ඔහු උපේක්ෂක ව ම සිටී නම්, ඔහුගේ ශරීරය තුළ ම පීඩා ඇති වන තරමට චාරිත්‍ර පාපය බලගතු වනු ඇත. මෙසේ ඔහු ඊළඟ ආත්මභාවයේ දී කිසියම් ක්‍රමයෙකින් පීඩිත ව උපදිනු ඇත. කියවීම්වල කොතනෙක දී වත් එබඳු සිද්ධි පරිපාටියක් ගැන පැහැදිලි ව කියැවී නැත. එහෙත් මෙහි දීත් තවත් බොහෝ නිදසුන්වල දීත් එබඳු තද ඇඟැවීමක් කැර ඇත.

ඉහත දැක්වූ නිදසුන් බඳු නිදසුන්වලින් මාපියන් හා දරුවන්

---

1. 122 පිට බලන්න.

අතර කර්ම ණයක් තිබිය හැකි ආකාරය දක්වේ. එක ම පවුලේ දරුවන් දෙදෙනකුන් අතරතර ද කර්ම සම්බන්ධතා තිබිය හැකි ය. කේසි ලිපි ගොනුවල ඇති සහෝදරියන් දෙදෙනකු අතර වූ විරෝධය පිළිබඳ පුදුම නිදසුනින් මෙය ඉතා හොඳින් පැහැදිලි වෙයි.

මෙ කරුණට සම්බන්ධ දූරියන් දෙදෙනාගෙ සම්බන්ධතාව, කුඩා කල පටන් ම ඊර්ෂ්‍යාවෙන් සැකයෙන් හා ද්වේෂයෙන් යුක්ත වූවෙක් විය. සුළු කරුණෙකින් පවා ඔවුන් අතර කෝලාහල ඇවිලී ගියේ ය. දරුවන් පස් දෙනකු සිටි මේ පවුලෙහි අනෙක් සහෝදර සහෝදරියන් අතර එබඳු විරුද්ධවාදිතා පැවතුණේ නැත. ඇතැම් විට, ෆ්‍රොයිඩියානු දෘෂ්ටියෙන් සහෝදරියන් අතර වූ විරුද්ධවාදීත්වය, පියා අත්පත් කර ගැනීම සඳහා වූ කිසියම් බාලක ඊර්ෂ්‍යාවක් පදනම් කර ගෙන විවරණය කෙරෙනු ඇත. සත්‍ය වශයෙන් ම කේසිගේ අභිඥා ඥානයට අනුව ස්ත්‍රීන් දෙදෙනාගෙන් එකකු තුළ ලිංගික වූ ඊර්ෂ්‍යාවෙක් තිබුණේ ය. එහෙත් එය ඇති වූයේ වර්තමාන පියා නිසා නොව වැඩිමහල් දූරියගේ පෙර ජන්මයේ ස්වාමි පුරුෂයා නිසා ය.

මෙ පැටලිලි සහිත සම්බන්ධතාවට අයත් පුද්ගලයන් තිදෙනා පැහැදිලිව තබා ගනු සඳහා වර්තමාන ජන්මයේ දී ඔවුන්ගේ නම් සඳහන් කිරීම පහසුය. බාල සොහොයුරිය ලවු නම්, වැඩිමහල් සොහොයුරිය ඇලිස් ය. ලවුගේ සැමියා ටොම් ය. ලවු තම සැමියාටත් සහෝදරියටත් තුබූ පූර්ව සම්බන්ධතාව පිළිබඳ විවරණයක් ඇසූ විට (ඒ කාලයේ දී ඇයට මේ දෙදෙනා සම්බන්ධයෙන් ම දුෂ්කරතා තිබිණි.) පහත එන කුඩා කථාන්තරය කියන ලදී.

යටත් විජිත යුගයේ අපර භාගයේ දී වර්ජිනියාවේ සිටි මේ තිදෙනා ඔවුනොවුන් හොඳින් දැන සිටියහ. එකල ටොම්,

ඇලිස්ගේ සැමියා ය. ලවු ඒ සමාජයේ සිටි මාතා පුර දූතිකාවක බඳු තැනැත්තියකි. ටොම්ගේ බිරිය විශේෂ වශයෙන් දක්වා නැති කිසියම් සිද්ධියක් නිසා ටොම්ගෙන් වෙන් ව සිටිය දී ලවු ටොම්ට සාත්තු කොට ඔහු සුවපත් කළා ය. ලවුගේ චේතනා පරිත්‍යාගශීලී සහෝදරියකගේ පවිත්‍ර චේතනා ම ය. එහෙත් ඇගේ කරුණාව නිසා ටොම් හා ඇය අතර ඔවුනොවුන්ගේ අගය තේරුම් ගැනීමේ සුහද සම්බන්ධතාවෙක් ඇති විය. මෙය දැන ගත් ඇලිස් ඊට තදින් විරුද්ධ වූවාය. ප්‍රතිජ්ඣා රහිත වූ විරෝධයත් ඊර්ෂ්‍යාවත් ඉක්මනින් ම ද්වේෂයක් බවට පරිවර්තනය විය. හාරාගෙන යන මේ මනෝභාව කෝප වූ ස්ත්‍රියගේ ආත්මයේ යටට කොතරම් තදින් කාවැදී ගියා ද යතහොත් ශත වර්ෂ ගණනෙකින් පසු වත් ඒවා පැවැතිණි.

තර්කානුකූල ව සලකන විට මේ ජන්මයේ දී ඇලිස්ට තම බාල සහෝදරියට ද්වේෂ කරන්නටවත් ඈ බය වද්දන්නට වත් හේතුවෙක් නො තිබිණි. එහෙත් ඇගේ යටි සිතේ පතුලෙහි ද්වේෂයේ සැලැස්ම තැන්පත්ව තිබිණි. ලවුගේ යටි සිතෙහි ද ආරක්ෂා වීමේ හා පළි ගැනීමේ සියලු උපක්‍රම පිබිදුණේ ය. ඔව්හු නො සිතා ම වාගේ අතීතයේ තුබූ හැඟීම් පිළිබඳ නාට්‍ය නැවත රඟ දක්වන්නට වූහ. මේ ස්ත්‍රීන් දෙදෙනා අසංඝඩ ව යුද වැදුණේ වරක් ඔවුනට යුද වැදීමට පැහැදිලි හේතුවක් තුබූ නිසා ය.

එක ම මාපියන් ඇති දරුවන් අතර වූ කර්ම විපාක ස්වභාවයක් ඇති සම්බන්ධතා පිළිබඳ දෙවන නිදසුනෙක් ඉංග්‍රීසි මාපියන්ගෙන් නිපන් දරුවන් දෙදෙනකුන් පිළිබඳ ව ඇත. දෙවන ලෝක යුද්ධ සමයේ දී ඔවුන් රැක බලා ගත්තේ අමෙරිකානු ස්ත්‍රියකි. එකල ඕ නව එංගලන්ත රාජ්‍යයෙක තුබූ තමාගේ දියුණු වන පාසැල අධ්‍යක්ෂණය කරමින් සිටියා ය. දරුදැරියන් බාර ගන්නා විට දරුවාගේ වයස අවුරුදු දහයෙකි. දැරියගේ වයස අවුරුදු පහකි. ශාස්ත්‍රීය පක්ෂයෙන් ද මුළු ජීවිත

කාලයක් තිස්සේ දරුවනට ඉගැන්වීමෙන් ලැබූ ප්‍රායෝගික වූ අද්දැකීම් පක්ෂයෙන් ද යන දෙකින් ම මනෝවිද්‍යාව පිළිබඳ ව හොඳ හුරුවක් ඇති ව සිටි බාරකාරිය මේ සහෝදර සහෝදරියන් දෙදෙනා අතර තිබුණු කැපී පෙනෙන විරෝධය ගැන සැලකිලිමත් වූවා ය. ප්‍රධාන ආක්‍රමණිකයා ලෙස පෙනුණේ සහෝදරයා ය. එක් ලිපියෙක ඈ මෙසේ ලියා ඇත. "හේ අතිශයින් ම දීප්තිමත් ය. එහෙත් පොර කුකුළකු සේ නට්සි ක්‍රම යොදන හෙතෙම බෙහෙවින් ම අනුකම්පනීය ය" ඕ දරුවන් දෙදෙනා ගැන ම ජීවිත කියැවීමක් ඉල්ලා සිටියා ය.

මේ කියැවීමෙන් තදින් සිත් ගන්නා සිද්ධියෙක් අනාවරණය විය. මේ දරුවන් දෙදෙනා පුරාතනයේ භයානක ලෙස පවුල් සටනක් ගෙන ගිය ස්කොට්ලන්ත වංශ දෙකෙක සාමාජිකයෝ වූහ. මෙහි දී ද මේ වෛරය චිත්ත සන්තානය යටින් ප්‍රවාහයක් සේ ශත වර්ෂ කීපයක් තිස්සේ පැවැති දස හැවිරිදි දරුවකු හා පස් හැවිරිදි දූරියක අතර විරුද්ධවාදීත්වයක් මතු කරන තරම් ප්‍රබල ව නැඟී සිට ඇත.

මේ නිදසුන් දෙක කරුණු කීපයක් ඉටු කර ලීමට ප්‍රමාණවත් ය. මේවායින් මෙහි ගැබ් වී ඇති මූල ධර්ම පැහැදිලි කෙරෙයි. තමන් අතර හා තම දරුවන් අතර වූ විවරණය කළ නො හැකි වූ වෛරයන් නිසා පීඩා විඳින්නට සිදු වී ඇති පුද්ගලයනට හා තමන් වෙත පැමිණෙන ආතුරයන්ගේ එබඳු ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සිදු වන මනෝවිග්‍රාහකයනට ද ඉදිරිපත් ව ඇති දුෂ්කරතාවට සුදුසු හේතුවක් යෝජනා කිරීමට මේ නිදසුන් දෙක ප්‍රමාණවත් ය.

දැන් ඇති වන කෝපවීම් පමණක් පදනම් කර ගෙන සාමාජිකයන් අතර වෛර ඇති වීමට සෑහෙන හේතු ඕනෑ ම පවුලෙක ඇත. සාමාන්‍යයෙන් උපේක්ෂකත්වයට හා සුළු සුළු අරුචිකම්වලට පමණක් හේතු වන එබඳු නො ගැළපීම් නිසා

ඇති වන හැඟීම් ඇතැම් අවස්ථාවල දී පමණක් නොදැරිය හැකි තරමට ද කිට්ටු පවුල් ජීවිතය නමැති කෝව පුපුරුවා ලන තරමට ද බලගතු වෙයි.

පුනර්ජන්මවාදය විවේචනය කරන්නා (හොඳ ම විවරණය සරලතම නියාමය යන)[1] "අරපරෙස්සම් නියාමය" අනුගමනය කරමින් පවුල්වල හට ගන්නා වූ විරුද්ධවාදිකම්, මෙලොව ඇති වන සිදුවීම්වලින් ම විවරණය කළ හැකි නිසා, පුනර්ජන්මවාදයක් ඇද ගැනීම අනවශ්‍ය යයි කියනු ඇත. අරපරෙස්සම් නියාමය පිළිබඳ ව කෙරෙන සාමාන්‍ය හැඳින්වීම කෙරෙහි විශ්වාසය බිඳී ගොස් නො තිබුණා නම් පුනර්ජන්මවාදීන් බොහෝ දෙනකු මේ විරෝධයට සම්පූර්ණයෙන් ම එකඟ වනු ඇත. විශ්වය පිළිබඳ මිනිසුන්ගේ පරිකල්පනා බුද්ධිමත් ලෙස සංවර කිරීමෙන් මේ අරපරෙස්සම් නියාමය ප්‍රයෝජනවත් සේවයක් කර ඇති බව නියැක ය. යමක් විවරණ සඳහා අනවශ්‍ය වැල්වටාරම් ඇද නො ගත යුතු යයි මේ නියාමයෙන් කියැවෙයි. එහෙත් පුනර්ජන්මවාදය පසෙක තිබිය දී විද්‍යාවේ සොයා ගැනීම් නිසා ඇති වූ විශ්වය පිළිබඳ පෘථුල දෘෂ්ටියෙන් පමණක් බැලුවත් සරලතම විවරණය නිවැරැදි විය යුතු ය යන පිළිගැනීම මත දිලිසෙන සෝදිසි එළියක් වැටෙන බව පෙනෙයි. අරපරෙස්සම් නියාමය, විශ්වයේ ක්‍රියාකාරිත්වයන්ගේ සරලකම පිළිබඳ නිවැරැදි නියාමයක් නොව මිනිසාගේ සිතේ සරලකම හෙළි කරන නියාමයක් බව ඒ එළියෙන් පෙන්වනු ලැබේ. අද සරල යයි සිතනු ලබන දෙය අසම්පූර්ණ කැබැල්ලක් පමණක් බව අලුත් සිද්ධීන්ගේ එළියෙන් ඔප්පු වනවා ඇත.

පුනර්ජන්මවාදයේ සාමාන්‍ය යුක්ති සහගත භාවය පිළිගත හොත් විවාදයට පාත්‍ර විය හැකි විස්තර නිකම් ම සුදුසු තැන්වලට වැටෙනු ඇත. මනුෂ්‍ය ප්‍රාණීන් අතර වූ මිනෑ ම

1. Law of Parsimony යමක් විවරණය කිරීමේ දී වහල් කොට ගනු ලබන සාධක ගණන හැකි තරම් අඩු විය යුතු යනු මෙයින් අදහස් කෙරේ.

විරුද්ධවාදීත්වයක් සඳහා තත්කාලීන හේතු සොයා ගත හැකි යයි පිළිගත හැකි නමුත් ඒ එක්කම ඒ විරුද්ධවාදීත්වයට පදනම වැටුණේ ශත වර්ෂ ගණනාවකට පෙර දී යයි ද සිතිය හැකි ය.

සත්තෙකින් ම කිසියම් විරුද්ධවාදීත්වයෙක අතීත ජීවිත හේතුව සොයා ගැනීමෙන් එය දිය වී නො යන බව මතක තබා ගත යුතු ය. ද්වේෂයේ විය ගසේ බැඳී සිටින හවුල්කාරයන් දෙදෙනා ජීවිතයෙන් ජීවිතයට එසේ ම බැඳී සිටීමට අකැමැති නම්, ද්වේෂය වෙනුවට මෛත්‍රියත්, වෛරය වෙනුවට කරුණාවත් යෙදීමට සිතා මතා ඉවැසිලිමත් ව උත්සාහ ගත යුතු ය.[1]

මේ අවවාදය එක ම පවුලේ සාමාජිකයන් අතර වූ විරුද්ධවාදීකම් පිළිබඳ ව පමණක් නොව කොතැනෙක හෝ සිටින පුද්ගලයන් සමඟ අපේ ඇති විරුද්ධවාදීකම් පිළිබඳව ද වලංගු වෙයි. අන්තිම විග්‍රහයේ දී පවුල සම්බන්ධයෙන් අපට අද්දකින්නට ලැබෙන, නිතර සිදු වන කාර්ය මාරුව නිසා අවසාන සත්‍යයේ දී අප එක් තනි පවුලෙක සාමාජිකයන් නො වන බව පෙනී යා යුතු ය. අප සාමාජිකයන් වන්නේ මනුෂ්‍ය වර්ගයා[2] නමැති එක් මහ පවුලෙක ය. අප ජීවත් විය යුත්තේ නිතර මේ සත්‍යය සිහියේ තබා ගෙන ය.

---

1. නහි වේරේන වේරානි - සම්මන්තීධ කුදාචනං
   අවේරේන ච සම්මන්ති - ඒස ධම්මෝ සනන්තනෝ
2. කේසි මිනිසුන් සතුන් විත් සතුන් මිනිසුන් වීත් උපදනා බවක් දක නැත. ඔහුගේ මතය එසේ නුපදනා බව ය. මේ පොතේ කතුවරිය ද ඒ මතය ම දරයි. සමහර විට කේසිගේ අභිඥා ඥානයට එය අසු නොවූවා විය හැකි ය. අප අතර පවත්නා බෞද්ධ මතයට අනුව නම් සත්තු මිනිසුන් වීත් උපදිති. මේ මතය අටුවාවල පමණක් නොව පෙළ පොත්වල ද තිබේ. තථාගතයන් වහන්සේගේ කම්ම විභංග ඥානය මෙන් ම චුතූපපාත ඥානය ද සෙසු මහණ බමුණන්ගේ ඒ ඥානයට වඩා ගැඹුරු ය. බෞද්ධ මතයට අනුව නම් මෙහි දී යෙදිය යුතු වන්නේ "මනුෂ්‍ය වර්ගයා" යනු නො ව "සත්ව වර්ගයා" යනු ය.

# 19

# වෘත්තීය දක්ෂතාවේ අතීත ජන්ම සම්භවය

අමරණීයත්වය :- අනාගතයේ දී ආත්මයේ අනන්ත පැවැත්ම ය.

**(The Funk and Wagnalls New Standard Encyclopedia)**

**සා**මාන්‍යයෙන් ක්‍රිස්තියානි දේව ධර්මයෙහි අමරණීයත්වය ගැන ඉගැන්වෙන්නේ එක් පැත්තකට - අනාගතයට පමණක් පැතිර ඇත්තක් ලෙස ය. චාතුර්මාණික භෞතික විද්‍යාවෙන්[1] ලැබෙන අකාලිකත්වය[2] පිළිබඳ නව සංකල්පයන්ගේ එළියෙන් බලන විට ඒ මතය හැම අයුරින් ම අසම්පූර්ණ බව පෙනී යයි. විද්‍යානුකූල කල්පනා පසෙක තබා හුදු ආගමික ශ්‍රද්ධාවේ දෘෂ්ටියෙන් පමණක් සලකා බැලුවත් ආත්මය අවශ්‍යයෙන් ම අකාලික විය යුතු බවත් එනිසා ම එය අමරණීය නම්, අජාත විය යුතු බවත් පෙනී යා යුතු ය. එය

---

1. Fourth - dimensional physics පරිවර්තකයන්ගේ දැනීමට අනුව චාතුර්මාණික - භෞතික විද්‍යාව නම් දිග, පළල හා උස පමණක් නොව කාලයත් සම්බන්ධ කරගත් භෞතික විද්‍යාව ය. නිව්ටන්ගේ භෞතික විද්‍යාව ත්‍රෛමාණික භෞතික විද්‍යාවෙකි. භෞතික විද්‍යාව චතුර්මාණික කරන ලද්දේ අයින්ස්ටයින් විසිනි. මෙයින් දික් - කාල දෙක එකට බැඳී ඇති බව කියැවෙයි. නිර්වාණය වැනි පරමාර්ථ ධර්මයන් අවකාශ හා කාල යන දෙකින් ම මුක්ත විය හැකි ය. මෙහි සඳහන් අකාලිකත්වය එවැන්නක් විය හැකි ය.
2. Timelessenss

අනාගතයේ දී නිත්‍ය ව පවතින්නට නම්, අතීතයේ දී ද නිත්‍ය ව පැවැති තිබිය යුතු ය. එවිට අප "උපත" "ජීවිතය" හා මරණය යන වචනවලින් සීමා කොට දක්වන ජීව විද්‍යාත්මක කථාන්තරය හුදු පෙනීමෙක් පමණි. එය භෞතික නො වූ නිත්‍ය ආත්මයේ මැවීමෙකැයි කිව යුතු ය.

අතීත ජන්ම පිළිබඳ මේ මතය නවීන ක්‍රිස්තියානි දේව ධර්මය විසින් බොහෝ දුරට ඉවත දමා ඇති නමුදු පැරැණි ඥානවාදී ක්‍රිස්තියානිය[1] විසින් පිළිගන්නා ලද්දෙකි. නූතන කවියන් කීප දෙනකුන් විසින් ම මේ අදහස පවසා තිබේ. ඔවුන්ගෙන් කෙනකු වන වර්ඩ්ස්වර්ත්ගේ *"Intimations of Immortality"* නම් පද්‍ය පන්තියෙන් එය නිතර උද්ධරණය කොට දක්වනු ලැබේ. "අපගේ උපත නිදා ගැනීමෙක් හා අමතක වීමෙක් පමණෙක් ය." යන වර්ඩ්ස්වර්ත්ගේ හැඟීම සනාතන ප්‍රඥාලෝකයෙන් බලන විට පදනමක් ඇත්තක් බව පෙනී යයි. අප සමග උදාවන ආත්ම කිසියම් තැනෙක දී අස්තයට ගොස් ඇතින් අප කරා පැමිණෙතැ යි යන ඔහුගේ මතය ආත්ම අතීත ජන්ම විශ්වාස කරන්නා වූ සිය ගණනක් විසින් නිතර උද්ධාරණය කරනු ලැබේ. එහෙත් ඔහු *"trailing clouds of glory do we come"* (= අපි කීර්තිමහිමයේ ඇදෙන වලාකුළු සේ එමු.) යනුවෙන් කියන විට පුනර්ජන්මවාදියා, වර්ඩ්ස්වර්ත් අතිශයෝක්තිය මඳක් අඩු කොට ස්වභාවෝක්තියට බරව කීවා නම් හොඳ යයි සිතයි. අන්තිම අර්ථයෙකින් ගත් කල ආත්මය මුල දී දිව්‍යත්වයෙන් පැමිණි බවත්, එනිසා ම අමතක ලෙසෙකින් නමුත් ඒ ප්‍රාථමික ශුද්ධත්වයෙන් හා භාස්වරත්වයෙන් යුතු බවත් සත්‍යයෙ.[2] සත්තෙකින් ම උත්තරාත්මයේ අතීන්ද්‍රිය පක්ෂයෙහි

1. Gnostic Christianity

2. මෙහිදී "පභස්සරමිදං භික්ඛවේ චිත්තං තඤ්ච ඛෝ ආගන්තුකේහි උපක්කිලෙසේහි උපක්කිලිට්ඨං" යනු ද සිහි කිරීම මැනවි. "වාරිජොව ථලේ ඛිත්තෝ" යනාදි ධම්ම පද ගාථා ගැන ද සිතිය යුතු ය. ජල නමැති ගෘහයෙන් උඩට ගෙන ගොඩ දමන ලද මාළුවකු මෙන් මේ සිත මාරයාගේ විෂයය ඉක්මවන්නට දඟලන බව එයින් කියැවේ.

දිව්‍යමය කිරණයක් හා සෞන්දර්යයක් තිබිය හැකි ය. එහෙත් කරුණට අදාළ මනෝවිද්‍යාත්මක සිද්ධි නම් සරලය, සාමාන්‍යයෙන් දිරි ගන්වනසුලු ය. ඒවායින් අපට පෙනෙන්නේ අප කීර්ති මහිමයෙන් ඇදෙන වලාකුළු සේ එන බව නො ව පුළුවන්කම් හා බැරිකම් ද ගුණ හා දෝෂ ද ප්‍රබලතා හා දුර්වලතාද පිළිබඳ ව රැස් කර ගත් මහා සංස්කාර භාරයක් ඇද ගෙන එන බව ය.

වැඩියෙන් වෘත්තීය උපදේශකත්වයට ඇරුණු ජීවිත කියැවීම් වලින් තරම් කිරුම් බර හරි හැටි දක්වෙන අන් තැනෙක් නැත. ආකල්ප, අභිරුචි හා චරිත ගුණ අතීතයෙන් පැමිණීමේ දී අවිච්ඡින්නතා මූල ධර්මය කෙසේ ක්‍රියාත්මක වේ දැයි අපට කියැවීම් වලින් දැනට ම දක්නට ලැබී ඇත. මනුෂ්‍ය දක්ෂතා පිළිබඳ වත් ඒ මූල ධර්මය ම ක්‍රියාත්මක වන බවත් මනුෂ්‍යයන්ගේ වෘත්තීය ජීවිතයේ දී එය වැදගත් සාධකයක් වන බවත් දක්නට ලැබේ.

කියැවීම්වලින් ලැබෙන මේ පිළිබඳ හොඳ නිදසුනෙක් නිව්යෝර්ක් නගරයෙහි සිටි විලාසිතා සෞන්දර්ය විශේෂඥ චරියකගේ[1] අතීත ජන්මවලින් දැක ගත හැකි ය. සිත් බඳනා සුරූපී ස්ත්‍රියක් වූ ඕ රූපාලංකරණයට ද කේශ ලීලා රචනාවටද චරිත සංවර්ධනයට ද කැප වූ සුඛෝපභෝගී ලීලාගාරයක් පවත්වා ගෙන ගියා ය. කියැවීමේ දී අතීත ජන්ම තුනක් දී ඇත. වර්තමානයේ ඇති වෘත්තීය නම්‍යතාවට කෙළින් ම සම්බන්ධ බව පෙනෙන්නේ මෙයින් දෙකෙක් පමණි. පළමු වැන්න **XV** වැනි ලුවී රජු කාලයේ ප්‍රංශ රාජ මාලිගයෙහි ය. එහි දී ඕ රාජ සභාව කෙරෙහිත් පාලකයා කෙරෙහිත් විශාල බලයක් පෑවා ය. ඕ රාජ දූත තන්ත්‍රයත් විලාසිතා කලාවත් හැසිරීම් හා ඉරියවු පිළිබඳ ආචාරවිධිත් පුද්ගලාලංකරණයත් උගත්තා ය.

1. Fashionable beauty specialist

ඊට පූර්ව ජන්මයෙහි රෝමයේ ඉපැදී සිටි ඕ පළමුවෙන් ක්‍රිස්තියානිය වැළඳ ගත් රදළයන් කීප දෙනාගෙන් එකියක් වූවා ය. ඊට පෙර ක්‍රි. පූ. 1300 දී පමණ ඕ ඊජිප්තුවේ ඉසිද දේවායතන සේවාවේ යෙදී සිටියා ය. මෙහි දී ඕ නෘත්‍යයෙන් ද සංගීතයෙන් ද කලාවෙන් ද සුරූපී ශරීරයක් තනා ගැනීමටත් බෙත්වතුර ආලේපන හා ශරීරාලංකාරක චූර්ණාදිය සෑදීමටත් උගත්තා ය.

ප්‍රංශ මාලිගයේ අද්දැකීම්වලින්, ඒ නිදසුනෙහි දක්නට ලැබෙන ප්‍රතිඵලයට සමාන ප්‍රතිඵල ලැබී තිබෙන බව කියැවීම්වලින් නිතර හෙළි වෙයි. මෙයින් කියැවෙන්නේ සාමාන්‍යයෙන් ඒවා ලෝක ව්‍යවහාරික වූ ද පණ්ඩිත ගෝචර වූද ආකල්පයකට හා සමාජ ජීවිතයේ සියුම් ආචාර සමාචාර දක්ෂතාවලට ද හිතකර වී ඇති බව ය. මේ ස්ත්‍රියගේ ඊජිප්තුවේ දේවායතනවල අද්දැකීම් පිළිබඳ කිසියම් විවරණයක් කළ යුතුව ඇත. මේ විශේෂ ඊජිප්තියානු යුගයේ දී ප්‍රධාන දේවායතන වර්ග දෙකක් තිබුණු බව පෙනී යයි. එකකට සෞන්දර්ය දේවායතනය[1] කියා ද අනෙකට යාග දේවායතනය[2] කියා ද කියනු ලැබේ. ඒවා පිළිබඳ විස්තර නොයෙක් කියැවීම්වල විසිරී පවතී. අපට මේ වර්ණනාවලින් ඒවා කවරාකාර දැයි තරමක් සවිස්තර මතයෙක් ඇති කර ගත හැකි ය.

සෞන්දර්ය දේවායතනය පාසැලෙක නැතහොත් විශ්ව විද්‍යාලයෙක ස්වභාවය ඇත්තෙකි. එහෙත් මේ දේවායතන වර්ගය බුද්ධි වර්ධනය පමණක් නොව සමස්ත මනුෂ්‍ය චරිතයම වර්ධනය කිරීම පරමාර්ථ කොට ගෙන ඇති හෙයින් අද ඇති බොහෝ විශ්ව විද්‍යාලවලින් වෙනස් වේ. එහි සියලු කලාත් විද්‍යාත් යොදා ඇත්තේ ශිෂ්‍යයන්ගේ ආත්මයත් ශරීරයත් අලංකාර කරනු සඳහා ය. මෙසේ ඒ ශිෂ්‍යයෝ තම රටෙහිත් අන් රටවලත්

1. The Temple of Beautiful

2. The Temple of Sacrifice

ක්‍රියාකාරී බලපෑමක් කළ හැකි අය වන සේ තනන ලදහ. ඊට දේවායතනයෙකැයි කියා තිබීමෙන් එහි ආගමික නැතහොත් ආධ්‍යාත්මික වාතාවරණයක් තුබූ බව පැහැදිලි වෙයි. මනුෂ්‍යයාගේ අන්තඃකරණ සතට නැතහොත් චක්‍ර සතට[1] අනුරූප වන සේ ශික්ෂණ මධ්‍යස්ථාන සතක් එහි තිබීමෙන් ඒ අධ්‍යාපන ක්‍රමයත් ගොඩනැගිලි ක්‍රමයත් ගැඹුරු යෝගී ඥානයක් පදනම් කොට ගෙන තුබූ බව පෙනී යයි.

ආධ්‍යාත්මික පදනමක් මත පිහිටා වෘත්තිය පිළිබඳ උපදෙස් දීම ද සෞන්දර්ය දේවායතනයේ බොහෝ කාර්යන්ගෙන් එකෙකි. දැන් කලාවේ හෝ ආගමේ මාර්ගයෙන් වෘත්ති පිළිබඳ උපදෙස් දීමෙහි දී චරිත සංවර්ධනයෙහි ද පුද්ගලයන්ගේ ඉන්ද්‍රිය සමත්ව ප්‍රතිපාදනයෙහි ද ඇලී සිටින බොහෝ දෙනා එහි ගුරුවරුන් වශයෙන් හෝ ශිෂ්‍යයන් වශයෙන් හෝ, ක්‍රියා කර ඇත. බොරිස් බොගොස් ලොව්ක්සිගේ *The Ideal School* නම් අධ්‍යාපනය පිළිබඳ මාහැඟි ග්‍රන්ථයෙහි එන විශේෂ සංකල්පයට කරුණු කීපයෙකින් ම සැලකිය යුතු සමානත්වයක් මේ පැරැණි ඊජිප්තියානු "ප්‍රඥා පාඨශාලාවෙහි" ඇත.

යාග දේවායතනය වැඩියෙන් සමාන වන්නේ ආරෝග්‍ය ශාලාවකට ය. මෙහි (පෙනෙන අයුරින් අත්ලන්තියානුවන්ගෙන් උගත්) විද්‍යුත් උපක්‍රම, ශල්‍ය කර්ම සඳහා භාවිත කරන ලදී. බොහෝ රෝග සුව කිරීමටත් ශාරීරික විකෘති අඩු කිරීමටත් විද්‍යුත් සංඛ්‍යාත[2] භාවිත කොට ඇත. එහි ඉලක්කය වූයේ ශාරීරික දියුණුවේ පරතෙරට යෑමත් ජාතියේ සංවර්ධනයත් ය. මෙහි දීත් දේවායතනය යන නමින් ආධ්‍යාත්මික වාතාවරණයකට ඉඟියෙක් කෙරෙයි.

සාර්ථක අස්ථි චිකිත්සක වෛද්‍යවරයකුගේ[3] අතීත ජන්ම

1. 207 පිට බලන්න
2. Electrical frequencies
3. ඇට පිළිබඳ වෙදකුගේ (ගස් වෙදකුගේ)

වෘත්ති ගැන සලකා බලන විට, අපට පහත දැක්වෙන ඉතිහාසය දැන ගන්නට ලැබේ. මොහුගේ අතීත ජීවිත සතරක් දී තිබේ. මෙයින් තුනෙක දී ම වෘත්තිය ගංගාවට අතු ගංගා වැටී ඇත. මීට පෙර හේ ආදී ඇමෙරිකාවේ වෛද්‍යවරයෙක් විය. හෙතෙම මේ ආශ්‍රයෙන් ස්වාභාවික ප්‍රතිකාර ගැනත් පැළෑටි බෙහෙත් ගැනත් ඇල්මක් ඇති කර ගත්තේ ය. (පූර්ව ජන්මයෙහි දී ඇමෙරිකානු ඉන්දියානුවන් කිට්ටුවෙන් ආශ්‍රය කළ අයත් තමන් ම ඇමෙරිකානු ඉන්දියානුවන් ව සිටි අයත් ස්වභාව ධර්මයට හා වන ජීවිතයට ප්‍රිය කරන බවත් හස්ත කර්මාන්තවලට ඇලුම් දක්වන බවත්, ජීවත් වීම හා වෙදකම ස්වාභාවික ලෙසින් කිරීමට නැඹුරු වන බවත්, කියැවීම්වලින් නිතර හෙළි කෙරේ.) ආදිකාලීන ක්‍රිස්තියානි යුගයේ දී සිදු වූ දෙවන පූර්ව ජන්මයේ දී හේ ස්නානස්ථාන හා සම්බාහනස්ථාන[1] පිළිබඳ පරීක්ෂකයෙකි. තුන්වන අතීත ජන්මයේ දී පර්සියාවේ ඉපිද සිටි ඔහුගේ වෘත්තිය නිශ්චිත නැත. ක්‍රි. පූ. 1300 දී ඊජිප්තුවෙහි සිදු වූ සතර වන ජන්මයෙහි දී හේ එම්බාම්කාරයෙක්[2] විය. මේ අද්දැකීමෙන් ඔහුට මනුෂ්‍ය ශරීරයේ ඇතුළත තැනී ඇති අයුර පිළිබඳ වත් නත් වැදෑරුම් පැළෑටිවලින්, කුළුබඩුවලින් හා වෙනත් ද්‍රව්‍ය සංයෝගවලින් මිනිස් මසෙහි ඇති කළ හැකි වෙනස්කම් පිළිබඳවත් අවබෝධයක් ලැබුණේ ය.

හොලිවුඩ් කලාකරුවකුත් චලචිත්‍ර වර්ණෝපදේශකයකුත් වූ මිනිසකු පිළිබඳ වෙනත් නිදසුනෙක දී ඒ මිනිසා ජන්ම තුනෙක දී කලාත්මක වෘත්ති අනුගමනය කළ බව කියා තිබේ. ඔහුගේ ජීවිත සතරෙක් ම දී ඇත. මීට පළමු ව හේ ප්‍රථම මන්දිර ගොඩනැඟුණු සමයේ අපරභාගයේ දී යටත් විදේශීය ඇමෙරිකාවේ ගෙවල් ඇතුළත අලංකාර කරන්නෙක් ව සිටියේය. ඊට පෙර හේ රුසියාවේ කොසැක් ජාතික යුද්ධ නිලධාරියෙකි.

1. සිරුර "මසාජ්" කරන තැන්.

2. Embalmer

තුන්වන ජන්මයේ දී ඉන්දු චීනයේ රජ බිසවගේ විලාසිතා සම්පාදකයා ය. සිව් වැන්නේ දී ඊජිප්තුවේ සෞන්දර්ය දේවායතනයේ ඇතුළත අලංකාරකරුවෙකි. කොසැක් ජාතික ජන්මය ගැන කියන විට ඔහුගේ උද්‍යෝගයත් අප්‍රමාදත්වයත් සුළු දේ දැකීමත් ඒ ජන්මයෙන් පැමිණියේ යයි සිතෙයි. එකල හෙතෙම හොඳට ඇඳීමටත් තමන් ගැන අන්‍යයනට හැඟීමක් ඇති කිරීමටත් ආශා කෙළේ ය. මෙසේ වැඩට පණ හා තෙද කවන ඔහුගේ ගුණ, වෘත්තිය වශයෙන් කලාව සමඟ කිසි ම සම්බන්ධයක් නැති ආත්ම භාවයෙක දී හට ගෙන තිබේ. ඔහුගේ දක්ෂතාවේ වැඩියෙන් කාර්මික වූ අංග පහළ වූයේ විශේෂයෙන් කලාවට කැප වූ ජීවිත කාල තුනෙකිනි.

මෙසේ ම නිව්යෝර්ක් හි සිටි ගීත රචකයකු හා සංවිධායකයකු වූ මිනිසකු එකට සම්බන්ධ වූ විවිධ අත් දැකීම්වලින් යුත් පූර්ව නිව්යෝර්ක් හි ගුරුවරයෙකි. සංගීත පාඨශාලාවල දෛනික පාඨමාලාවලට පළමුවෙන් ඇතුළු කිරීම පිළිබඳ ව හේ වගකිව යුත්තෙක් විය. දෙවැනි ව සංගීතෝපකරණ තැනූ ජර්මන් ලී කැටයම්කරුවෙකි. තුන්වැනිව වැල්දියාවේ නෙබුචැඩ්නෙසාර් රජුගේ කවටයෙකි. ඊට පෙර අත්ලන්තියානුවෙක් වූ හේ ඊජිප්තුවට ගොස් එහි දේවායතන පූජාවේ සංගීතයෙහි ව්‍යාපෘත විය. සංගීතෝපකරණයන්ගේ ද්වනියේ පූර්ණත්වය, ආකෘතිය හා නිමහම සමඟ ඔහුගේ ඇති වර්තමාන සම්බන්ධය ලී කැටයම්කරුවකු වශයෙන් ලත් අද්දැකීමෙන් ඇති වූ බව පෙනේ. ඔහුගේ කවටකම් පිළිබඳ ඥානයත් බුද්ධික්ෂණිකත්වයත් රාජ විදූෂක[1] අද්දැකීමෙන් ඇති විය. ඔහුගේ නියම සංගීත දක්ෂතාව පහළ වූයේ සංගීතඥයකු වශයෙන් ලැබූ අද්දැකීම් දෙකෙකිනි.

ඇතැම් විට මිනිසකුගේ විනෝද ක්‍රියාව පූර්ව ජන්මයකට

1. රාජ් විදූෂකයා නම් රජ ගෙදර කවටයා ය.

සම්බන්ධ බව දක්නට ලැබේ. නිදසුන් වශයෙන් කුඩා කල සිට ම සියලු ක්‍රීඩා වර්ගවලටත් විශේෂයෙන් බේස්බෝල් ක්‍රීඩාවටත් ආශාවක් දක්වූ බැංකු සභාපතිවරයකුගේ සිද්ධිය ගත හැකි ය. ඔහු අයත් වූ බැප්ටිස්ට් පල්ලියේ දේවගැති තැන ඉරිදා බෝල සෙල්ලම් කරනවාට තදින් විරුද්ධ වූ නිසා මේ බැංකුකරු වහා ම පල්ලියෙන් ඉල්ලා අස් විය. මෙය අටවැනි හෙන්රි රජුගෙත් පෙරත් පසුවත් දක්නට ලැබෙන ආගමික අවංක භාවය පිළිබඳ පැහැදිලි නිදසුන් වලින් එකෙකි.

බැංකු ව්‍යාපාරය ඔහුගේ වෘත්තියත් සමෘද්ධියේ හේතුවත් විය. කෙසේ වෙතත් ඔහුගේ ඉතිරි කාලය යොදනු ලැබුවේ බේස්බෝල් සමාජයක් පැවැත්වීම සඳහා ය. එතැන් සිට මේ සමාජය විශාල සමාගම්වල පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් වී ඇත. ඔහුගේ අතීත අද්දැකීම් සලකා බැලීම ද සිත් ගන්නාසුලු ය. මීට පෙර ඔහු බඩු ආනයනයෙහි හා අපනයනයෙහි යෙදුණු ආදි පදිංචිකරුවෙකි. ඊට පෙර ජන්මයෙහි රඟමඬලේ රාජ්‍ය ක්‍රීඩා සංවිධානය කළ රෝමානුවෙකි. තුන්වෙනිව හේ පර්සියාවේ සංචාරක ගෝත්‍ර නායකයෙකි. හෙතම මුදල් මාරු කරන ස්ථාන කීපයක් පිහිටෙව්වේ ය. සතර වැනි ව හේ ඊජිප්තුවේ භාණ්ඩාගාරිකයෙක් විය. මේ ජීවිතවලින් තුනක් ම ඔහුගේ වර්තමාන බැංකු ව්‍යාපාරය කෙරෙහි කෙළින් ම බල පා ඇති බව පැහැදිලි ය. රෝමානු රඟ මඬලවල සංවිධායකයකු වශයෙන් වූ දෙවන පූර්ව ජන්මයෙන්, බැංකු සභාපතිවරයකු වශයෙන් සිටීමට ඔහුට උපකාර වූ සංවිධායක ශක්තියත් එළිමහන් තරඟ ක්‍රීඩාවලට ඔහු පෙළැඹ වූ උනන්දුවත් ලැබුණු බව නිසැක ය. ඔහුගේ ජීවිත පරිසරය නිසා ඔහුට මෙහි යෙදීමට හැකි වූයේ විනෝද ක්‍රීඩාවක් වශයෙන් පමණි.

නාවික හමුදාවේ ආහාර පරීක්ෂකයකු පිළිබඳ තවත් සිද්ධියක් සම්බන්ධ කියැවීමෙන් විවරණය වන්නේ ඒ මිනිසාගේ ආහාර මිල දී ගැනීමේ හා පරීක්ෂා කිරීමේ වෘත්තියට වැඩියෙන්

ඔහුගේ විනෝද ක්‍රීඩාවයි. මොහුගේ මුළු ජීවිත කාලය තුළ ම මැණික් ගල් පිළිබඳ තද උනන්දුවෙක් විය. මැණික් හුවමාරුවක් ආරම්භ කළ හේ නිතර, ගල් කපන්නන් හා එකතු කරන්නන් සමඟ ළඟින් ආශ්‍රය කෙළේ ය. නාවික හමුදාවෙන් විශ්‍රාම ලැබූ තැන් සිට ඔහු තම මුළු කාලය ම යෙදුවේ මැණික් ව්‍යාපාරයටය. කේසි කියැවීමෙන් ලැබුණු පුදුම ධෛර්යයෙන් හෙතෙම තව තවත් ඊට පෙළැඹුණේ ය. ඔහුගේ අතීත ජීවිත දී ඇත්තේ මෙසේය. මීට පෙර හේ ඔහායෝවේ ඉන්දියානුවන් සමග සුළු ආභරණ හා මත්පැන් වෙළඳාම් කෙළේ ය. ඉනුත් ඔබ්බෙහි පර්සියාවේ වෙළෙන්දකු වූ හේ තවලමෙකින් සංචාරය කරමින් ඊජිප්තුවේ ලිනන් ද පර්සියාවේ මුතු ද ඉන්දු-චීනයේ ඔපල් (වෛවර්ණ මැණික්) ගිනිගල් හා ලැපිස් ලැසුලි[1] ද ගෝල්ඩ් හි නගරවල දියමන්ති හා රතුකැට ද වෙළඳාම් කෙළේ ය. තුන්වැනි ව හේ හිටයිට් ගෝත්‍රිකයකු ලෙස ශුද්ධ භූමියේ පූජකවරුන්ගේ ඇඳුම්වල යොදන ලද මැණික් ගල් සම්පාදනය කළේ ය.

මේ නිදසුනෙහි විශේෂ සැලකිල්ලට සුදුසු කරුණු දෙකෙක් ඇත. පළමු වැනි ව කියැවීම්වලින් අතීත ජීවිත තෝරා ගැනීමේ දී වහල් කොට ගන්නා මූල ධර්මය මෙයින් හොඳින් පැහැදිලි වෙයි. ආතුරයාට ප්‍රයෝජනවත් වීම මිනුම් දණ්ඩ කොට ගෙන ජීවිත තෝරා ගෙන ඇත. කියැවීම ලබා ගන්නා කාලයේ දී විශ්‍රාම ගැනීමේ වයසට ආසන්නව සිටි මේ මිනිසාට නාවික හමුදාවේ කාර්යයට ඔහු පිළියෙළ කළ අතීත ජීවිත විස්තර නො කියන ලදී. ඔහුගේ විනෝද ක්‍රීඩාවට සම්බන්ධ ජීවිත විස්තර දී ඇත්තේ තව ම ඔහුට මැණික් සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් දේ කළ හැකි ව තුබූ හෙයිනි.

ඉතා ඈත අතීතයෙක සිට ඔහුට මැණික් සුපුරුදු නමුත් ඔහු ඒවායේ නියම වටිනාකම තව ම තේරුම් ගෙන නැතැයි

1. Lapis Lazuli ලංකාවේ හමු නො වන මැණික් වර්ගයෙකි. සිංහල නමක් නැතැයි අසන්නට ලැබේ. මෙය බහුල වශයෙන් ලැබෙන්නේ ඇෆ්ගනිස්ථානයේ ය. ඉඳුනිල වැන්නෙකි.

කියා තිබේ. ඔහු ඒවා අලංකාර වස්තු ලෙසත් එකතු කිරීමට හා වෙළඳාමට වටිනා දේ ලෙසත් පූජකයන්ගේ ඇඳුම් සඳහා සපයන අවස්ථාවේ දී ආගමික සංකේත ලෙසත් දුටුවා මිස ඒවායේ නියම වැදගත්කම දුටුවේ නැත. මෙයින් අපි කියැවීම්වල ඇති දෙවන සැලකිය යුතු කරුණකට ගෙන යනු ලබමු. එනම් මැණික්වල ඇති ස්පන්දනය නිසා ඒවාට ප්‍රතිකාරක හා ප්‍රබෝධ ශක්ති ඇති බව ය.

මේ මිනිසා කියැවීම ලබා ඇත්තේ 1944 දී ය. මීට පෙර දින දරන බොහෝ අවස්ථාවල දී ඇතැම් ගල් වර්ග, මැණික් හා ලෝහ, පැළැඳ ගන්නට යයි නියම කළ නිදසුන් කේසි ලිපි ගොනුවල ඇත. ඒවා නියම කොට ඇත්තේ ඒවායේ ඇති ස්පන්දක බලපෑම නිසා ය. ඒ එකෙක දී වත් නියම කළ ගල, කැලැන්ඩර් මාසයේ පාරම්පරික උත්පත්ති ගලට[1] අනුරූප වී නැත. යෝග්‍යතාවේ නියම මූල ධර්මය සොයා ගත නොහැකිය. එහෙත් එක් එක් ගලෙහිත් එක් එක් මූල ද්‍රව්‍යයෙහිත් ඊට ම අයත් පරමාණු ශක්තියක් ඇත්තේ ය. යන විවරණය නොයෙක් වර දී තිබේ. ශරීරයේ ඇති මූල ද්‍රව්‍ය ද පරමාණු ස්වරූපය කවර පුද්ගලයකුට කවර ගලෙක් ගැළපේ ද යන්න අභිඥා ඥානයෙන් හෝ නව ම ඒ සඳහා නිෂ්පාදනය කර නැති උපකරණවල මාර්ගයෙන් හෝ දත යුතු ය.

කෙසේ හෝ පුද්ගලයකුට මේ විෂය හදාරන්නට උපදෙස් දෙන ලද එක ම නිදසුන මෙයයි. අවුරුදු දහසකට පෙර පුදුම ලෙසින් විකාරයක් තරමට හාස්‍ය ජනක ලෙසින් පෙනුණු නමුත් පරමාණු ශක්තිය පිළිබඳ ව අද අපට ඇති දැනුමට අනුව බලන විට මේ අදහස සත්‍ය විය හැකි බව පෙනී යයි. ගල්වල ඇති

1. The traditional birthstone of the calendar month බටහිර පැවැති පැරැණි විශ්වාසයකට අනුව එක් එක් මාසයෙහි උපන් අයට ශුභ වූ මැණිකෙක් ඇත. මෙහි සඳහන් වන්නේ ඒ ගැන ය. නවීන රත්නවේදීහු බටහිර පැවැති ක්‍රමය අශාස්ත්‍රීය බව කියති.

පරමාණු ශක්තිය පිළිබඳ ව කේසි කියැවීම්වලින් මෙසේ කියා ඇත්තේ පරමාණු ශක්තිය පිළිබඳ ව විද්‍යානුකූල සොයා ගැනීම කරන්නට විසි අවුරුද්දකට කලින් බව සඳහන් කළ යුතු ය. ඉහත කී පුද්ගලයා, එතැන් සිට, මේ කරුණ ගැන විශේෂයෙන් උනන්දු වී කියැවීමෙන් කෙටියෙන් විස්තර කරන ලද පරීක්ෂණ මාර්ගය කෙරෙහි තම මුළු උත්සාහය ම යොදා තිබේ.

අතීත ජීවිත අද්දැකීම් පදනම් කොට ගෙන දෙන ලද වෘත්තීය පිළිබඳ උපදෙස්වල දී කියැවීම්වලින් නියම කරන ලද දුර්ලභ ගණයේ තවත් අමුතු වෘත්ති කීපයෙක් ද ඇත. ඉන් එකෙක්, කියැවීම්වලින් "ජීවිත මුද්‍රා" යයි නම් කරනු ලැබූ උපකරණයට සම්බන්ධ ය. අනෙක විද්‍යුත් චිකිත්සාවට සම්බන්ධය. මේ දෙක ම අත්ලන්තිසයේ හා ඊජිප්තුවේ පැරණි කලාවේ හා විද්‍යාවේ නැවත නැඟී සිටීම ලෙස විස්තර කොට තිබේ.

ඊජිප්තුවේ සෞන්දර්ය දේවායතනයේ සිටි පූජකවරයෝත් පූජකවරියෝත් අභිඥානයේ මාර්ගයෙන් හෝ නවීන මනෝවිද්‍යාවේ විග්‍රහවලට සමාන කළ හැකි විග්‍රහවල මාර්ගයෙන් හෝ එක් එක් ශිෂ්‍යයාගේ කර්ම විපාක ගැටලුවලට හා කර්ම දායාදවලට අනුව ඔහුට කවර ජීවිත කාර්යයෙක් සුදුසු දැයි නිශ්චය කිරීමට සමත් වූහ. මෙය පදනම් කර ගෙන ශිෂ්‍යයා විසින් කරන ලද වෘත්තිය තෝරා ගැනීමෙන් ඔහු ලබන ශික්ෂණ මාර්ගය නිශ්චය විය. (මේ පාඨමාලාවලට ශරීර සංවර්ධනය, සෞඛ්‍යය හා ආධ්‍යාත්මික දියුණුව යන කරුණුවලට හිතකර වූ ආහාර විද්‍යාවත්, කායික වගාවත්, වස්ත්‍ර පිළිබඳ කලාව හා විද්‍යාවත්, ඉගැන්වීමත්, රෝග සුව කිරීමත්, ආධ්‍යාත්මික උපදෙස් දීමත්, සංගීතයත්, චිත්‍ර කලාවත්, වාක්චාතුර්ය ශික්ෂාවත්, කලා ශිල්පත්, සංගීතය හා ගන්ධ භාවිතය[1] ඇතුළත් වූ භාවනාවත්

1. භාවනාවේ දී සුවඳ දුම් ආදිය යොදා ගන්නට ඇත. අද පවා ජප කිරීම්වල දී මෙය දක්නට ලැබේ.

අයත් ය.)

විශේෂඥතාව ලබා ගැනීමට සුදුසු විෂය ගැන අවසාන විනිශ්චය කර ගන්නා අවස්ථාවේ දී ඒ කලාව පිළිබඳ ශික්ෂණයක් ඇති පුද්ගලයකු විසින් ශිෂ්‍යයාට "ජීවින මුද්‍රාවක්" සාදා දෙන ලදී. මෙය ඔහුට ඔහුගේ ජීවත්වීමේ අර්ථය සිහිපත් කර දීමට ඉවහල් වන ඒ පුද්ගලයාගේ අතීත ජීවිතවල සංවර්ධන සැලැස්ම නියෝජනය කරන සංකේතාත්මක රූපයෙකි. මේ ජීවිත මුද්‍රාව නැතහොත් පෙත්ත සමාන කොටස් තුනකට හෝ හතරකට බෙදා ඇති චක්‍රයෙකි. මේ එක් එක් කොටසෙක එක්කෝ අතීත ජන්මයෙක දී ඒ ශිෂ්‍යයා ලබාගත් උනන්දුවක්, දක්ෂතාවක් නැතහොත් ආත්ම ශක්තියක් දක්වන සංකේතයෙක් හෝ රූපයෙක් ඇතුළත් විය. නැතිනම් එයින් නව ම ඒ පුද්ගලයා විසින් ලබාගත යුතු ව ඇති ආත්ම ශක්තියක් හෝ දක්ෂතාවක් නියෝජනය කෙරෙයි. මේ මුද්‍රා ගැන සිතීම නිසා ඒ ඒ පුද්ගලයාගේ ඇතුළු ආත්මයෙහි සැඟැවී ඇති ශක්ති පිබිදෙයි. විශ්වයේ නිර්මාපක ශක්තියට තමාගේ ඇති සම්බන්ධතාව තේරුම් ගැනීමට ද එය වහල් වේ. විසි වැනි සියවසේ අන්තිමට කිසියම් කාලයෙක දී ඉජිප්තුවේ වාර්තා ශාලාව සොයා ගෙන විවෘත කළ විට මේ පොත්වලින් සමහරක් මතු වනු ඇතැයි කේසි කියා තිබේ.

එක් තරුණ ස්ත්‍රියකට ඈ ඉජිප්තුවේ සෞන්දර්ය දේවායතනයේ කාර්ය තුනෙක යෙදී සිටි බව කියා තිබේ. භාවනාව සඳහාත් රෝග සුවපත් කිරීම සඳහාත් ශාරීරික ස්පන්දනය වැඩි කිරීමට යොදන ලද සංගීතය සැපයීමෙහි දී, ශරීරාලංකාරය වැඩි කරන ආහාර වර්ග යෙදීමෙහි ද දූත් විස්තර කළ ජීවිත මුද්‍රා සැකැසීමෙහි ද ඕ යෙදී සිටියා ය. ඇයට සිරුර පුෂ්ටිමත් කරන්නියක[1] වශයෙන් හෝ සංගීතඥවරියක වශයෙන්

1. Nutritionist

හෝ මේ ජන්මයෙහි වෘත්තීය සාර්ථකත්වයක් ලබා ගත හැකි බව කියන ලදී. ආත්මයෙක ඉතිහාසය බලා ඒ ආත්මයේ ජීවිත පරමාර්ථ සංකේතාත්මක සැලැස්මෙක මාර්ගයෙන් දක්වීමට ඇට ඊජිප්තුවේ දී ඉවහල් වූ උත්තර විඥ්ඥාණයෙන් දනුත් භාවනා බලයෙන් තොරතුරු ඇද ගැනීමට හැකි බව තවදුරටත් කියා තිබේ. මේ තරුණිය ලැබුණු යෝජනා දෙක ම ක්‍රියාවට නගා තිබේ. ඇ සාර්ථක ලෙස සංගීතය තම වෘත්තිය කර ගෙන ඇත. ජීවිත මුද්‍රාවට අවශ්‍ය අංග ඉවකර ගැනීමට තිබිය යුතු ශක්තිය ද ඇ භාවනා බලයෙන් වගා කර ගෙන ඇත. දැනට ඇ මේ ශක්තිය භාවිත කරන්නේ වාණිජ ස්වරූපයෙකින් නො වේ.

ඇතැම් අයට රසායන විද්‍යාව, ජල චිකිත්සාව නැතහොත් සංගීතය යන මෙයින් එකක් සමග විද්‍යුත් චිකිත්සාව හදාළ යුතු යයි කර ඇති නියමයන්හි තුන්වන වර්ගයේ අමුතු වෘත්තියක් දක්නට ඇත. විද්‍යුත් චිකිත්සාව දැනට ම අප සභ්‍යත්වයෙහි හොඳින් පැළපදියන් වී ඇති බව සත්‍ය ය. එහෙත් මිනිසුන් කීප දෙනකුට ම ඔවුන්ගේ අත්ලන්තියානු නැතහොත් ඊජිප්තියානු අද්දැකීම් පදනම් කර ගෙන වෘත්තියක් වශයෙන් විද්‍යුත් චිකිත්සාව නියම කොට ඇති නිසා එහි ඇති වැදගත්කම අමුතු එළියෙකින් දක්නට ලැබේ.

ක්‍රි.පූ. 10,000 දී අත්ලන්තිසයේ මහා විපත් තුනින් අන්තිමට සිදු වූ විපත්ති කාලයේ දී, අත්ලන්තියානුවෝ බොහෝ දෙනෙක් ආරක්ෂාව පතා ඊජිප්තුවට ගියහ. ඔව්හු ඔවුන්ගේ දියුණු වූ විද්‍යා හා කලා පිළිබඳ ඥානය ද එහි ගෙන ගියහ. විවිධ හේතූන් නිසා ඔවුනට ඔවුන්ගේ මහා බල සභ්‍යත්වය නැවත ඇති කර ගැනීමට නො හැකි වූ නමුත් ඔවුන්ගේ විද්‍යාවේ ශේෂයෙක් ඊජිප්තියානු සංස්කෘතිය සමඟ මිශ්‍ර විය. කිසියම් ස්වරූපයෙක විද්‍යුත් චිකිත්සාවක් වෘත්තියක් ලෙස නියම කර ඇති හැම නිදසුනෙක ම සිත් අදනා පොදු ලක්ෂණයෙක් ඇත. ඒවායින් පැරැණියන්

අතර අති ප්‍රසිද්ධ වූ නමුත් නවීන සභ්‍යත්වයට හොඳට ම අලුත් වූ කාර්ය ක්ෂේත්‍රයෙක් යෝජනා කරනු ලැබේ. මේ විද්‍යාවේ ඥානය ඉතිහාසයෙන් නැති වී ගොස් ඇති නමුත් ඒ කාලයේ ඉපැදී සිට ඒ ගැන ව්‍යාප්ත වූ මිනිසුන්ගේ යටි සිතෙහි නිදි ගෙන පවතී.

අහස් ගමන, ඉලෙක්ට්‍රෝනික විද්‍යාව, ටෙලිවිෂනය, සම්මෝහ නිද්‍රාව, පරචිත්ත ඥානය, පරමාණු ශක්තිය යනාදිය කෙරෙහි තද ආශාවක් දක්නට ලැබුණු බොහෝ අවස්ථාවල දී ඊට හේතුව, ඒ පුද්ගලයා අත්ලන්තිසයේ ඒ වෘත්තියේ යෙදී සිටීම බව දක්නට ලැබී ඇත. කිසියම් වෘත්තියක් කෙරෙහි තද උනන්දුවක් හෝ උසස් සාර්ථකත්වයක් හෝ දක්නට ලැබෙන හැම නිදසුනෙක දී ම කිසියම් පූර්ව ජන්මයෙක දී හෝ වැඩි ගණනෙක දී යෙදී සිටි බව කියැවීම් වලින් දක්නට ලැබේ යයි සාමාන්‍ය නීතියක් සාදා ගත හැකි වී තිබේ.

"ඊට ආසන්න" යයි විශේෂ කොට කීම අවශ්‍ය වූයේ ඒ වෘත්තියේ ම පූර්වයෙන් ලැබූ අත්දැකීමක් දක්නට නැති නිදසුන් කීපයක ම වර්තමානයේ සැලකිය යුතු සාර්ථකත්වයක් දක්නට ලැබෙන නිසා ය. නිදසුන් වශයෙන් එක් සාර්ථක ලේඛිකාවක් ගත හැකි ය. ඇගේ ලිපි ඇමෙරිකාවේ ඉතා ජනප්‍රිය ආදර්ශවත් වනිතා සඟරාවල පළවෙයි. ඇගේ පූර්ව ජන්ම සතරෙක් දී ඇත. මෙයින් ලේඛනයට සම්බන්ධ වන්නේ එකෙක් පමණි. එය ද වෘත්ති ස්වරූපයෙන් නොවේ. ඒවා මෙසේ ය. මුල් එක ආදි ඇමෙරිකාවේ නිළියක හා සංචාරක ප්‍රදර්ශිකාවක[1] වශයෙනි. දෙවැන්න ඇන්ටියෝච්හි සිදුවීම් අන්‍ය ක්‍රිස්තියානිකාරයන්ට වාර්තා කළ ක්‍රිස්තියානිකාරියක වශයෙනි. තෙවැන්න පලස්තීනයේ ගෘහපතිනි මවක ලෙස ය. සිව්වැන්න සෞන්දර්ය දේවායතනයේ ගුරුවරියක හා "ගෝබිලන්තයට" ගිය දූතිකාවක වශයෙනි.

1. Barnstormer

මේ වනිතාවගේ ලේඛන ශෛලිය සරල ය, ඍජු ය, ප්‍රාණවත් ය. කථාන්තර කියවන්නියක හා සිත් ගන්නා වාර්තාකාරියක වශයෙන් ඇගේ ඇති සමර්ථකම, කියැවීමෙන් පවරා දෙන්නේ සංචාරක ප්‍රදර්ශිකාවක වශයෙන් ලැබූ අද්දැකීම්වලට ය. මාතෘදාරක සම්බන්ධතා පිළිබඳ ගැඹුරු දැනීම පලස්තීන ජන්මයකට පැවරෙයි. ඇගේ අන්තර්ඥාන ශක්ති ඊජිප්තියානු ආත්ම භාවයට නෑකම් කියයි. ඇන්ටියෝචිහි වූ ඇගේ වාර්තා කටයුතු පිළිබඳ නියම ස්වභාවය පැහැදිලි කර නැත. ඇතැම් විට එය ලියුම් ලිවීමට සම්බන්ධ දෙයක් විය හැකි ය. ඇගේ කථාන්තර කීමේ චාම්කම, සමහර විට ඒ අද්දැකීමෙන් ඇති වූවා විය හැකි ය. එහෙත් ඒ ගැන කිසියම් අටුවා කිරීමෙක් කියැවීම්වල නැත.

කියැවීම්වල සියලු පූර්ව ජීවිත දී නැති බව අපි සත්‍ය වශයෙන් ම දනිමු. ඒ නිසා ඒ ස්ත්‍රිය වෘත්තියෙන් ලේඛිකාවක ව සිටියා දැයි නො කිව හැකි ය. කෙසේ හෝ දී ඇති ජන්ම සතරට අනුව නිශ්චය කරන හොත් ඇගේ විවිධ ලේඛන සමර්ථතා, වෙනස් වූ වෘත්ති සතරෙකින් ලැබී ඇතැයි ද ඇ ඒවා එක ම ලේඛන වෘත්තියකට ඒකාබද්ධ කළ පළමු වැනි අවස්ථාව මෙය යයි ද කිව හැකි ය.

තවත් බොහෝ නිදසුන්වලින් වෘත්තියක් වෙනස් කිරීම කිසිසේත් සාර්ථකත්වයට බාධාවක් නොවන බව නිශ්චය කළ හැකි ය. ඒ නව උනන්දුවට අදාළ හොඳ අතීත පදනමක් තිබේ නම්, එසේ වෘත්තිය වෙනස් කිරීම සාර්ථකත්වයට බාධාවෙක් නොවේ. නිදසුනෙක් ගනිමු. වයස අවුරුදු තිස් එකෙක විවාහක මිනිසෙක් වෛද්‍ය විද්‍යාව හැදෑරීමට තීන්දු කර ගත්තේ ය. ඔහුගේ පියා වෛද්‍යවරයකු නිසා කුඩා කාලයේ දී ඔහුට ඒ සඳහා උනන්දුවත් ඉඩකඩත් ඇති විය හැකි ව තුබූ නමුත් ඔහු කුඩා කාලයේ දී වෛද්‍ය විද්‍යාව හදාරා නැත. ඒ කවර හෙයින් දැයි ඔහුගේ ලිපියෙන් පැහැදිලි නො වේ.

කේසිගෙන් කියැවීමක් ලබා ගත් ඔහුට මෙතරම් ප්‍රමාද වී වෛද්‍ය විද්‍යාව හැදෑරීමට තීන්දු කිරීම නුවණට හුරු ද, එයින් සාර්ථකත්වයක් ලැබිය හැකි ද කියා දැන ගැනීමට විශේෂයෙන් අවශ්‍ය විය. කියැවීමෙන් ඔහුට ලැබුණේ මහත් ධෛර්යයෙකි. වෛද්‍යවරයකු වීමේ විනිශ්චය පහළ වූයේ ඇමෙරිකානු විප්ලව කාලයේ දී බව පෙන්වා දෙන ලදී. එකල හේ හමුදාවේ පණිවිඩ කාරයෙකි. එහෙත් පෙනෙන අන්දමට, ඔහුගේ අනුකම්පක ස්වභාවයත් උපදෙස් දීමේ දක්ෂතාත් නිසා ඔහුගේ උසස් නිලධාරියා ඔහුට මිනිසුන් අතර ධෛර්යය නංවාලීමේ වැඩ කටයුතු කොටසක් බාර කර තිබේ. වෛද්‍යවරයකු වීමේ ආශාව පහළ වූයේ මේ කාලයේ ය. ඔහුට දක්නට ලැබුණු පීඩා පිළිබඳ ව ඔහු අනුකම්පාවෙන් පිරී ගිය බව පෙනේ. පීඩා නැති කිරීමට තමාට දැනීමක් තිබුණා නම් හොඳ යයි හේ සිතුවේ ය.

ඔහු වර්තමානයෙහි තම පියා ලෙසින්, වෛද්‍යවරයකු තෝරා ගත්තේ වෛද්‍ය වෘත්තියට බැසීම පහසු කර ගැනීමට බව දැන ගන්නට ලැබීම සිත් ගන්නාසුලු ය. එහෙත් වෛද්‍ය විද්‍යාව හැදෑරීමට පමා කළ කාරණය පැහැදිලි නැත. ඇතැම් විට කල්තියා විවාහ වීම එහි හේතුව වන්නට ඇත. කිසියම් පූර්ව ජන්ම සම්බන්ධයක් නිසා තද කර්ම ශක්තියෙකින් ඒ තරුණියට ඇදී ගිය ඔහු අනෙක් ජීවිත කාර්ය අමතක කොට ඈ හා ආවාහ වන්නට ඇත. මේ තත්ත්වයට තවත් හේතු තිබෙන්නට පුළුවන. මෙහි ඇති වැදගත් කරුණ නම් ඔහු පළමු වරට බසින්නට අදහස් කළ වෘත්තියේ සාර්ථකත්වය කියැවීමෙන් සහතික කිරීමයි. කෙටියෙන් කියත හොත්, අතීත ජන්මවල දී වෘත්තීය දක්ෂතා හට ගැනීම් පරීක්‍ෂා කොට බැලීමේ දී අද ඇති ඒ සමර්ථතා, අතීත ජන්ම එකෙක දී හෝ වැඩිගණනෙක දී ඒ වෘත්තියේ ම හෝ ඊට සම්බන්ධ වෘත්තිවල හෝ යෙදීම පදනම් කොට ගෙන ඇති බව පෙනේ. උනන්දුවෙන් අනුගමනය කරන විනෝද ක්‍රීඩාවෙකින් බොහෝ විට අතීත ජන්මයෙක දී කරන

ලද වෘත්තියෙක් දක්වනු ලැබේ. අලුත් යයි පෙනෙන බොහෝ වෘත්ති සත්‍ය වශයෙන් ම පැරණි අත්ලාන්තියානු හා ඉජිප්තියානු විද්‍යා කලාවන්ගේ නැවත මතු වීම ය. ඇතැම් අය තම ආත්ම ඉතිහාසයෙහි පළමු වරට ඇතැම් නව වෘත්ති අනුගමනය කිරීමට උත්සාහ කරන බව පෙනේ. අතීතයෙහි ඒ පිළිබඳ උනන්දුවක් දියුණු කර තිබේ නම්, දැනට ම ඊට සම්බන්ධ දක්ෂතාත් වගා කොට තිබේ නම්, සාර්ථකත්වයට සම්පූර්ණයෙන් ම ඉඩ ඇත.

## 20

# වෘත්ති තෝරා ගැනීම පිළිබඳ දර්ශනය

**කේ**සි ලිපි ගොනුවල ඇති වෘත්ති ඉතිහාසවලින් කල්පනාකාරී පරීක්ෂකයාගේ මනසෙහි නොයෙක් ප්‍රශ්න මතු කරනු ලැබේ. පළමු කොට ම වෘත්තියෙක මූලාරම්භය පිළිබඳ ගැටලුව මතු වෙයි. මේ ගැටලුව දෙවියන් වහන්සේගෙන් ආත්මයේ පළමු පහළ වීම නෙක් ආපසු යන බොහෝ පුනර්ජන්මවාදීනට කරදරකාරී වූවෙකි. පළමුවෙන් ම එක් ආත්මයක් එක් වෘත්තියක් දෙසටත් තවත් ආත්මයක් වෙනත් වෘත්තියක් දෙසටත් යොමු වන්නේ කවර හෙයින් ද ? මිනිසුන්ගේ ආත්ම මුල දී සමාන ව දිව්‍යත්වයෙන් පහළ වූවා නම් එකකු ගොවිතැන දෙසටත් තවකකු වෙළඳාම දෙසටත් තෙවැන්නකු රෙදි විවීමටත් සතර වැන්නකු සංගීතයටත් පස් වැන්නකු ගණිතයටත් නැමෙන්නේ කවර හෙයින් ද ? මිනිසුන් විසින් තෝරා ගනු ලබන ව්‍යාපාරයන්ගේ විවිධත්වයට හේතු වන කිසියම් සියුම් පෞද්ගලිකත්ව අංශුවෙක් තිබේ ද ? එසේ තිබේ නම් ඒ පෞද්ගලිකත්වය නිශ්චය වන්නේ කිමෙකින් ද ?

කේසි ලිපිගොනුවලින් මෙම ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් නො සැපයෙන නමුදු ඉබේට ම මතු වන වෙනත් ප්‍රශ්නයක් පිළිබඳව තෘප්තිදායක තොරතුරු රැසෙක් අපට ඒවායින් ලැබෙයි. ඒ ප්‍රශ්නය නම් පසු කාලයෙක දී ආත්මයකට වෘත්තියක් මාරු කරන්නට සිදු වන්නේ කවර හේතුවකින් ද යනු ය. එබඳු බොහෝ මාරු කිරීම් පිළිබඳ නිදසුන් කේසි ලිපි ගොනුවල ඇත. අදාළ කරුණු පරීක්ෂා කර බැලීමේ දී ඒ මාරුවීම, ප්‍රාර්ථනාව හා කර්ම නියාමය යන මූලික සාධක දෙකින් එකෙකින් විවරණය කළ හැකි බව පෙනී යයි.

ඉහත දෙන ලද නිදසුන් කීපයෙක ම ප්‍රාර්ථනාව, කර්මය තරමට ම ප්‍රබල වූ ශක්තියක් වී ඇති බව දක්නට ලැබිණි. කිසියම් දක්ෂතාවයක් හෝ ගුණයක් ඇති පුද්ගලයකු ආශ්‍රය කිරීම නිසා මිනිසකුට කිසියම් අලුත් දක්ෂතාවක් හෝ ගුණයක් පිළිබඳ ආශාවක් ඇති වන්නට පුළුවන. කේසි - කියැවීම්වලට අනුව ඉගැන්වීමෙනුත් රෝගීන්ට හා පීඩිතයනට උපකාර කිරීමෙනුත් යේසුතුමා කළ මෙහෙය දුටු බොහෝ දෙනකුට බෝවීමෙකින් මෙන් එසේ කිරීමට තද ආශාවක් ඇති වී තිබේ. මේ ප්‍රාර්ථනාව නිසා අනුක්‍රමයෙන් වූ ජීවිත කාල කීපයක් තිස්සේ ම ඒ පුද්ගලයන් ඉගැන්වීමේ හා සුවපත් කිරීමේ දක්ෂතා ලබා ගැනීමට යොමු වී තිබේ. ඇතැම් විට පණ ගන්වන පුද්ගලයකුගේ බලපෑමක් නැතිව ද මුල දී මේ ප්‍රාර්ථනාව ඇති වීමට ඉඩ තිබේ. පුද්ගලයකුට තමාට නැති සමර්ථතා අවශ්‍ය වන අවස්ථාවෙක දී ඇති වන තමාගේ අසරණකම පිළිබඳ කරදරකාරී හැඟීමක් නිසා ද එබඳු ප්‍රාර්ථනා ඇති වේ. කෙසේ මතු වුණත් ප්‍රාර්ථනාව ආත්මයේ මාර්ගය නිශ්චය කරන ප්‍රබල සාධකයක් වන බව පෙනේ. එය ක්‍රමයෙන් ප්‍රබල වෙමින් වැඩි වැඩියෙන් නිශ්චිත රූපයක් හා දිගාවක් ගන්නට වෙයි. අවසානයේ දී සුදුසු මාපියන් හා පරිසරයක් තෝරා ගෙන ආත්මය තම ස්වභාවයේ නව අංගයන් සම්පූර්ණ කර ගැනීමට පටන් ගනී.

ඇතුළට නැමුණකු සම්පූර්ණයෙන් පිටතට නැමුණකු වීම සඳහා ජීවිත කාල කීපයක් ගත විය හැකි බව අපි දුටිමු. එමෙන් ප්‍රාර්ථනා බලයෙන් එක් වෘත්තිය දක්ෂතාවෙක සිට තවත් වෘත්තිය දක්ෂතාවයකට සම්පූර්ණයෙන් මාරු වන්නට ජීවිත කාල කීපයක් ගත වන්නට පුළුවන. මේ අනුමානය සත්‍ය නම් එය, තමන් තම වෘත්තියෙහි මධ්‍යම ප්‍රමාණ දක්ෂතාවෙකින් යුතු යයි සිතෙන බොහෝ දෙනකුට ධෛර්යයට හේතු වනු ඇත. ඇතැම් විට අන්‍යයන්ගේ අතිශ්‍රේෂ්ඨත්වය සමග සසඳන විට පෙනෙන තමන්ගේ මධ්‍යම ප්‍රමාණත්වයට හේතුව, ඒ තමාගේ ප්‍රයත්නය නුපුරුදු වූ විෂයයෙක කරන ලද පළමුවැනි නැති නම් දෙවැනි ප්‍රයත්නය වීම ය.

ප්‍රාර්ථනාව හැරුණු විට කර්මය ද වෘත්තිය වෙනස් කිරීමෙහි ලා ප්‍රධාන සාධකයක් බව පෙනේ. කායික වශයෙන් කොරකු බවට පත් කරන කර්මයෙක පැසීම දියුණුවට බාධාවක් වන බව පැහැදිලි ය. ජන්ම කීපයෙක දීම නැට්ටුවකු වශයෙන් වූ චරිතයක්, කොර වීම නිසා වෙනස් කර ගන්නට සිදු වේ. එක් වෘත්තියෙක ප්‍රකාශනයට බාධා කරන එබඳු ආබාධයක් නිසා වෙනත් එකකට මාරුවීම අවශ්‍ය වෙයි. බොහෝ විට මෙය සිදු වන්නේ දීර්ඝ කාලයක් තිස්සේ වැළැලී තිබූ ශක්තියක් මතු කරමිනි.

පස්වන පරිච්ඡේදයෙහි විස්තර කරන ලද තුනට්යේ කාශයෙන් කොර වූ දැරියගේ කථාව එබඳු එක් නිදසුනෙකි. ඕ රෝගයෙන් පසු ව දීර්ඝ කාලයක් තිස්සේ, සමාජයට ප්‍රයෝජනවත් වීමට කවර වෘත්තියක් අනුගමනය කළ යුතු දැයි සිතමින් සිටියාය. ඈට වීණා වාදනය උගන්නට කියා තිබේ. අතීත ඊජිප්තියානු ජන්මයෙක දී ඈ තත් ඇති උපකරණ පිළිබඳ විශේෂඥත්වයක් ලබා සිටි හෙයින් ඒ පිළිබඳ සහජ දක්ෂතාවෙක් ඇතැයි ද කියන ලදී. උපදේශය අනුගමනය කළ ඈට ඒ පිළිබඳ හොඳ

දක්ෂතාවක් ඇති බව වැටැහී ගියේ ය. එහෙත් ඊට පෙර ඒ අදහස කවදා වත් ඇට ඇති වී නො තිබිණි. එතැන් සිට ඇය ඇගේ සහෝදරියන් සමග සංගීත ප්‍රදර්ශන ගණනාවක් ම පවත්වා ඇත. ඈ එයින් කීර්තියක් ලබා නැති නමුත් සැපවත් ව උනන්දුවෙන් යෙදෙන හැකි වෘත්තියක් සොයා ගෙන ඇත. ඈ ආසන්න පූර්ව ජීවිත ගත කොට ඇත්තේ වෙනත් වෘත්ති වලය. මෙසේ මෙහි දී කායික කර්ම විපාකයෙකින් එක් වෘත්තියක් වෙනස් වී වෙනත් එකක් ආරම්භ වී ඇති බව පැහැදිලි ය.

පැන නගින තවත් ප්‍රශ්නයෙක් ඇත. ආත්මයෙක (මේ ග්‍රහ මණ්ඩලය සම්බන්ධ ව) පූර්ණ පරිණාමය සඳහා වෘත්ති කීයෙක අත්දැකීම් ලැබිය යුතු ද ? හොඳ දියුණුවක් ලබා ගැනීමට හැම ආත්මයක් ම විෂය ගණනාවෙක කටයුතු කර තිබිය යුතු බව පැහැදිලි ය. යන්ත්‍ර විද්‍යාව, වෛද්‍ය ශාස්ත්‍රය හා සමාජ විද්‍යාව යනාදිය කෙරෙහි කිසිම දැනීමක් නැති ව කලා පිළිබඳ පරතෙරට පැමිණීමෙකින් පමණක් ආත්මයකට මේ සෞර්ය ග්‍රහ මණ්ඩලයෙන් උපාධියක් ලබා ගත හැකි බවෙක් කිසිසේත් නො පෙනේ. ලෝක පාලක මණ්ඩලයට මේ හැම විෂයෙකින්ම සම්මාන සාමාර්ථ්‍යය අවශ්‍ය වන බව පෙනේ. මෙතරම් විශාල ශිෂ්‍ය සමූහයකට අවශ්‍ය පාඨ මාලා, කවර පාඨමාලා පරිපාටියෙකින් සකස් කර දෙනු ලැබේ ද යනු වෙනත් ප්‍රශ්නයෙකි.

මූලික සැලැස්ම කුමක් වුවත් අඩු තරමින් මෙපමණෙක් පැහැදිලි බව පෙනේ. බොහෝ අවස්ථාවල දී වෘත්තිය පිළිබඳව, පැන නගින ප්‍රශ්න හා ආධ්‍යාත්මික ප්‍රශ්න අතර ආසන්න සම්බන්ධයෙක් ඇත. මෙයින් කියැවෙන්නේ බොහෝ අවස්ථාවලදී වෘත්තිය දුෂ්කරතාව සකස් කර ගත යුතු ව ඇති චරිත දෝෂයකට අනුකූල වන බවයි. හතළිස් අට හැවිරිදි අවිවාහකයකු පිළිබඳ නිදසුන මේ කාරණයට අදාළ ය. පුද්ගල

දුෂ්කරතා කොටසක් නිසා, වතු ඒජන්ත කෙනකු වශයෙන් වූ තමාගේ වෘත්තිය එන්න එන්න ම නීරස වන බව ඔහුට දැනී ගියේ ය. වෘත්තියේ කවර වෙනසක් කළ යුතු දැයි දැන ගැනීම සඳහා ඔහු කේසිගෙන් කියැවීමක් ලබා ගත්තේ ය. එහි දී ඔහු පූර්ව ජන්මයේ දී තද ආඥාදායක ගුරුවරයකු ව සිටි බව කියන ලදී. ඒ ජන්මයේ තිබුණු ගොරෝසු තද ගතිය මේ ජන්මයට අවුත් සාමාජික වෙනස්කම් ඇති කර ගැනීමට අපහසු වීමේ පදනම වී තිබේ. වර්තමාන වෘත්තිය අපහසු එකක් වුවත් එහි ම රැඳී සිටින්නට යයි ඔහුට උපදෙස් දී ඇත. "මේ වෘත්තිය හැම විට ම ලෙහෙසි නැතත් ඔබට මෙහි දී අවශ්‍ය වූ පාඩමක් ඉගෙන ගන්නට ලැබේ."

කියවන විට ටොල්ස්ටෝයිගේ කියමනක් සිහියට නංවන නිදසුන් රාශියෙක් කේසි ලිපි ගොනුවල ඇත. ජීවිතයෙක වටාපිටාව බොහෝ දුරට ගොඩනැගිල්ලෙක පලංචියට සමාන යයි ටොල්ස්ටෝයි කියා ඇත. මේ ලෑලි තට්ටුවේ ඇති එක ම ප්‍රයෝජනය ඇතුළතින් ගොඩනැගීමේ කාර්යය කර ගෙන යෑමට ඉවහල් වන බාහිර සැකිල්ලක් වීමයි. මේ බාහිර අච්චුවට ම අයත් වූ අවසාන වැදගත් කමෙක් හෝ ස්ථිරත්වයෙක් හෝ නැත. ගොඩනැගිල්ල නිමා වූ වහා ම පලංචිය ගලවනු ලැබේ.[1] මේ එළියෙන් වෘත්ති තේරුම් ගැනීමට ඉඩ තිබේ. වෘත්තිය මිනිසාගේ ආධ්‍යාත්මික සංවර්ධනයේ එක් අංශයක් හැඩ ගස්වන අච්චුව ලෙස සැලකිය හැකි ය.

අනෙක් අතට, වෘත්තිය, කිසියම් ගුණ ධර්මයෙක සංවර්ධනයට අනුකූල නොවී සිටින අවස්ථා ද ඇත. ඇතැම් විට වෘත්ති, ආත්මය විසින් තම ආධිපත්‍යය යටතට ගත යුතු ම වූ භෞතික ක්ෂේත්‍ර ලෙස ද සිටී. මේ එක් එක් ව්‍යාපාර

1. "කුල්ලූපමං වෝ භික්ඛවේ ධම්මං දේසෙස්සාමි, නිත්ථරණත්ථාය, නෝ ගහණත්ථාය" ධර්මය ද සසරින් එතර වීමට මිස අල්ලා ගැනීමට නො වේ.

ක්ෂේත්‍රයෙක දී මිනිසා භෞතික ලෝකයේ එක් කොටසක් තේරුම් ගන්නටත් තමා යටතට ගන්නටත් උගනී. සම කේන්ද්‍රික මණ්ඩල සමූහයෙකින් එක් මණ්ඩලයෙක දී ජීවිතයේ මූලධර්ම ප්‍රකාශයට පත් වන සැටි තේරුම් ගැනීමටත් ඒවා සමග කටයුතු කිරීමටත් උගනී. ඇතැම් විට වෛද්‍ය විද්‍යාව, සංගීතය, කෘෂිකර්මය හෝ කලාව පිළිබඳ වූ මේ ආධිපත්‍ය අවසානයේ දී දෙවියන් වහන්සේ සමග සම මැවුම්කරුවකු වීම සඳහා අවශ්‍ය විය හැකි ය. උන්වහන්සේ සමවෘත්තිකයඃ ශුද්ධ යඃ බලධාරී ආත්මය යඃ අහිංසක යඃ භාස්වර යඃ මෛත්‍රී සහගත යඃ ප්‍රකාශනයේ නිර්මාපක කේන්ද්‍රය යඃ තමන් වහන්සේ විසින් ම ආකෘතීත්, ජීවිතත්, ලෝකත් මැවීමට සමර්ථ ය.

විශ්වය පිළිබඳ පෘථුල දර්ශනයෙකින් සිත් කිති කැවෙයි. එහෙත් දෛනික ජීවිතයේ පැහැදිලි අවදානම්වලට හැරෙන විට අපට පහත දැක්වෙන ප්‍රායෝගික ප්‍රශ්නයට මුහුණ දීමට සිදු වේ. තම වෘත්තීය අතීතය නො දන්නා වූ ද ජීවිතයේ ප්‍රධාන ආධ්‍යාත්මික පාඩම පිළිබඳ අභිඥා ඥානයක් නැත්තා වූ ද අය නැණවත් ලෙස වෘත්තියක් තෝරා ගන්නේ කෙසේ ද ? වෘත්තීන් පිළිබඳ උනන්දුවක් තුබූ එක් පුද්ගලයෙක් වරක් කේසිගෙන් මේ විෂය පිළිබඳ පරීක්ෂණ කියැවීමක් ඉල්ලා සිටියේ ය. අතීත ජන්ම නිශ්චිත ව දැන ගන්නට නැති පුද්ගලයනට වෘත්තීය උපදේශ දීම සඳහා ඔවුන්ගේ අතීත ජීවිත වේගයන් නිවැරැදි ව සොයා ගැනීමට ඉවහල් වන මනෝවිද්‍යාත්මක පරීක්ෂණයක් සාදා ගත හැකි ද යන ප්‍රශ්නය අසන ලදී. උත්තරයෙන් දැක්වුණේ ජ්‍යෝතිශ්ශාස්ත්‍රීය සටහනක්, බොහෝ අවස්ථාවල දී උපකාර විය හැකි බව ය. එහෙත් අද භාවිත වන ජ්‍යෝතිශ්ශාස්ත්‍රය මේ ශාස්ත්‍රයේ දී සැලකිල්ලට ගත යුතු වූ පූර්ව ජන්මවලට අයත් වන මේ පොළෝ තලයෙහි සිදු වූ පූර්ව ජන්මයන් ගණනට

ගන්නේ නැති නිසා[1] ලබා ගත හැකි තොරතුරු සම්පූර්ණයෙන් විශ්වාස කළ නො හැකි ය. කියැවීම මෙසේ ය; "බොහෝ මිනිසුන් සම්බන්ධයෙන් ඔවුන්ගේ යෝග්‍ය වෘත්තිය, මේ පොළෝතලයෙහි සිදු වූ ජන්මයන්හි දී වූ ජ්‍යොතිශ්ශාස්ත්‍රීය වේගයන්ගෙන් ඔවුන් විසින් කරන ලද දේ මත රැඳී ඇත. ඇතැම් විට එය කේන්ද්‍රය සමග ගැළපෙයි; ඇතැම් විට අර්ධ වශයෙන් ගැළපෙයි; ඇතැම් අවස්ථාවල දී සම්පූර්ණයෙන් ඊට පටහැණි ය. එසේ වන්නේ මේ පොළෝ තලයෙහි දී සිදු කරන ලද කර්ම නිසා ය."

බෙහෙවින් සිත් ගන්නා තොරතුරෙකි මේ. මෙය බරපතළ ලෙස ගණන් ගත හොත් ජ්‍යොතිශ්ශාස්ත්‍රයේ නව ම සොයාගෙන නැති අංග පිළිබඳ සඵල පරීක්ෂණයකට හේතු විය හැකි ය. එහෙත් මේ අංග සලකුණු කර ගන්නා තෙක් මූලික ගැටලුව නො විසඳී සිටී. පුද්ගලයන්ගේ අතීත ජන්ම දත ගැනීමට අභිඥා ඥානයක් නැත්නම් අපට ඔවුන්ගේ සැගවී ඇති දක්ෂතාවලට අනුව ඔවුනට උචිත වෘත්ති තෝරා දීමට පුළුවන් ක්‍රමයක් නැත.

වෘත්ති තෝරා ගැනීම පිළිබඳ වල්මත්වීම් අතිශයින් ම සුලබ ය. කෙසේ හෝ මේ අවිනිශ්චිතත්වයෙහි ද අධ්‍යාපනික වූ පරමාර්ථයක් තිබෙනවා විය හැකි ය. ජීවිතයේ හා කාර්යවල අර්ථය හොඳින් පරීක්ෂා කිරීම සඳහාත් අනායෙන් සම්බන්ධයෙන් තමාගෙන් ඉටුවිය යුතු අර්ථය පිළිබඳ වඩා ආධ්‍යාත්මික වූ අවබෝධයක් ලබා ගැනීම සඳහාත් ඒ වල්මත් වීම අවශ්‍ය බව

1. මෙ පරිවර්තකයානට ජ්‍යොතිශ්ශාස්ත්‍රය ගැන දැනීමක් නැත. එහෙත් මෙහි දී වැටහෙන පරිදි විවරණයක් කිරීම සුදුසු යයි සිතේ. කේන්ද්‍රගත ග්‍රහයන්ගේ පිහිටීමෙන් දක්වනු ලබන්නේ ඒ ග්‍රහයාගේ නමින් හැඳින්වෙන භූමියෙක සිදු වූ පූර්ව ජන්මවල දී සිදු කරන ලද කර්ම මේ ආත්ම භාවයේ දී පල දෙන අයුරු ය. රාහු කේතු දෙදෙනාගේ පිහිටීමෙන් දැක්වෙනවා ඇත්තේ පෙර මේ පොළෝතලයෙහි සිදු කරන ලද කර්ම මේ ආත්මයේ දී විපාක දෙන අයුරු විය යුතු ය. බටහිර ජ්‍යොතිශ්ශාස්ත්‍රය රාහු කේතු දෙදෙනා ගණනට නොගනී. එහෙයින් ඒ ජ්‍යොතිශ්ශාස්ත්‍රයට කලින් පොළෝතලයෙහි දී සිදු කරන ලද කර්ම මේ ජීවිතයට බලපාන අයුරු නොපෙනෙයි.

පෙනේ. ඇතැම් පුද්ගලයන් කල්තියා ම ප්‍රකාශයට පත් විය යුතු තරමට පැහැදිලි වෘත්තීය අර්ථයක් ඇති ව මෙලොවට එන අතර තවත් සමහර අය මාරුවීම් අවස්ථාවෙක සිටිනවා විය හැකි ය. මේ අවස්ථාවේ දී අවශ්‍ය වන්නේ අදහස් සකස් කර ගැනීමයි. ඒ නිසා ඒ පුද්ගලයන්, සැකයෙන් හා මුළාවෙන් යුතු කාල පරිච්ඡේදයක් ඉක්මවිය යුතු ය. පැහැදිලිකම හා ශක්තිය ලබා ගැනීමට පෙර හැම විට ම මේ කාල පරිච්ඡේද පසු කළ යුතු ව ඇත. මේ පිළිබඳ කේසි කියැවීම් පැහැදිලි නැති නමුත් ඇති හැම සාක්කියකට ම අනුව බලන විට වෘත්තීන් සම්බන්ධයෙන් ඇති වන වල්මත්වීම පිළිබඳ මේ විවරණය හොඳට ම පිළිගත හැකි බව පෙනේ.

කෙසේ හෝ කේසි කියැවීම්වලින් ලබා ගත හැකි තොරතුරුවල එක් පැත්තෙකින් ස්ථිර වටිනාකමෙක් ඇත. එයින් මනෝවිද්‍යාත්මක පරීක්ෂණ සඳහා අලුත් දිශාත් වෘත්තීය ප්‍රශ්නයට ළඟා වීමට සුදුසු අලුත් ආකල්පත් යෝජනා කරනු ලැබේ. කවුරුදෝ කෙනෙක් අයිරිශ් ජාතිකයකුගෙන් වයලින් වාදනය කරන්නට දන්නවා දැයි ඇසූහ. "මා දන්නේ නෑ. මා කිසි දිනෙක වත් එය කරන්නට උත්සාහ කර නෑ." යනු ඔහුගේ පිළිතුර විය. මේ හදිසි පිළිතුර පෙනෙන තරමට හාස්‍යජනක නො වේ. මේ පිළිතුර දෙන ලද්දේ නුගත් ශුද්ධ බුද්ධියෙනි. එහෙත් කේසි කියැවීම් හදාරන විට, අසංඥ ප්‍රඥාවේ පෙරා ගත් සාරය එහි අඩංගු බව පෙනී යයි. එසේ කියන්නේ කිසි ම මිනිසකු තම යටි සිතේ භාණ්ඩාගාරයෙහි සැඟවී තිබෙන්නේ කවර ශක්ති දැයි නො දන්නා නිසා ය.

රටේ හැම තැන ම ඇති බැංකුවල, ඉතිරි කිරීමේ ගිණුම් අයිතිකරුවන් විසින්, අමතක කරනු ලද ඩොලර් කෝටි ගණනක් තිබීම පුදුම සිද්ධියෙකි. මේ ගිණුම්, කිසියම් කාලපරිච්ඡේදයක් නිෂ්ක්‍රීය ව තිබුණායින් පසු ව බැංකු නිලධාරීහු, තැන්පත්

කරුවන්ගේ අවසාන ලිපිනවල මාර්ගයෙන් ඔවුන් සොයා ගැනීමට උත්සාහ ගනිති. මේ උත්සාහය ව්‍යර්ථ වුවහොත් බැංකුවට සිදු වන්නේ තැන්පත් කිරීමේ ප්‍රමාණය උදාසීන ලෙජරයෙක[1] තිබීමටය. විශේෂයෙන් ම නරක ප්‍රසිද්ධියක් ඇති වීමට තරම් මුදල් පිළිබඳ උනන්දුවෙකින් යුතු මිනිසුන් ඇති ජාතියෙක මෙබඳු සිද්ධියක් තිබීම පුදුම විය යුතු තරම් දෙයෙකි. එහෙත් එය සත්‍ය සිද්ධියෙකි. මේ උදාසීන ගිණුම්වලින් දක්වෙන්නේ මිනිසකුගේ ජීවිත තත්ත්වයට සම කළ හැකි තත්ත්වයක් බව පෙනේ.

කිසියම් ශක්තියක් හෝ දක්ෂතාවක් ස්මරණයේ අසංඥ කාමරවල බොහෝ කාලයක් අමතකව මෙන් තිබුණු බව පෙනෙන නිදසුන් රාශියෙක් කේසි ලිපි ගොනුවල ඇත. ඒ ශක්තිය කෙරෙහි පුද්ගලයාගේ අවධානය යොමු කර වන්නට කියැවීම වහල් වී තිබේ. එය පුබුදු කිරීමට පුද්ගලයා විසින් ගන්නා ලද උත්සාහය පුදුම විය යුතු තරම් නිදසුන් ගණනෙකදී නියම වෘත්තීය දක්ෂතාවක් ඇති කිරීමට සමර්ථ වී තිබේ. මෙසේ පහසුවෙන් වෘත්තියකට බසින්නට පුළුවන් වීම ඒ වෘත්ති පිළිබඳ අතීත පළපුරුද්දක් තුබූ බව ඔප්පු කරන සාධකයෙකි. අපේ යටි සිතෙහි ඉතිරි වූ ශක්තියෙක් ඇත්තේ යයි දැන ගත් විට අපට ඇති වන හැඟීම අප කුඩා කල සිටි නගරයෙහි අමතක වී ගිය ඉතිරි කිරීම් ගිණුමෙක් ඇතැයි දැන ගත් විට ඇති වන හැඟීමට සමාන ය. සාමාන්‍ය ක්‍රමයෙකින් නමුදු මෙය ප්‍රයෝජනවත් අදහසෙකි. කෙසේ හෝ වෘත්තියක් තෝරා ගැනීම ප්‍රයෝජනවත් වීමට නම් ඒ තොරතුරු බොහෝ දුර නිශ්චිත විය යුතු ය. කේසිගේ අභිඥා ඥානය වැනි ඥානයෙකින් අපට ප්‍රයෝජන ගත හැකි නම් අපි භාග්‍ය සම්පන්න වෙමු. එසේ නැති නම් කවර ක්ෂේත්‍රයන්හි අපගේ පූර්ව සමර්ථතා තැන්පත්ව ඇද්දැයි සොයා ගැනීමට යෝජනාවේ, සම්මෝහනිද්‍රාවේ නැතහොත්

1. A dormant ledger.

භාවනාවේ මාර්ගයෙන් මනසේ වඩා ගැඹුරින් ඇති තට්ටුවලින් අපට තොරතුරු ඇද ගත හැකි විය යුතු ය.

දැන ගන්නට ලැබී නැති ශක්තීන් සොයා දැනගැනීමට ඇති තවත් ක්‍රමයෙක් නම් විනෝද ක්‍රියා අනුගමනයයි. බොහෝ විට තද උනන්දුවක් ඇති වන්නේ අතීත ජීවිතයෙක ව්‍යාපාරයක් නිසා ය. ස්පාඤ්ඤ දේවලට තද ආශාවක් තිබීමෙන් ස්පාඤ්ඤයේ සිදු වූ පූර්ව ජන්මයෙක් ඇඟවෙයි. චීනයේ සිදු වූ පූර්ව ජන්මයක් නිසා චීන දේවලට තදින් ආශා කරනවා විය හැකි ය. ස්පාඤ්ඤ භාෂාව හදාරන පන්තියෙක මාර්ගයෙන් හෝ චීනය පිළිබඳ කථා මාලාවෙක් මාර්ගයෙන් හෝ එබඳු උනන්දු වගා කිරීමෙන් අසංගද ස්මරණය කැළැඹී ඒ ජන්මවලදී ලබාගත් ශක්ති පුබුදු විය හැකි ය. ඒ නිසා අපට ඒ පූර්ව ජන්මයෙහි අප හා සම්බන්ධකම් තුබූ මිනිසුන් ආශ්‍රය කරන්නටද ලැබේ. ඒ අයගේත් අපේත් පූර්ව ජන්මයෙහි පැමිණි පොදු උනන්දු තිබිය හැකි ය. වැඩිපුර අපේ ජීවිත මාර්ග වෙනස් වන්නේ මිනිසුන් නිසා ය. අප සමඟ පැරැණි කර්ම සම්බන්ධතා ඇති මිනිසුන් ආශ්‍රය කරන්නට ලැබීමෙන් එසේ නූණා නම් සම්පූර්ණයෙන්ම අපෙන් වැසී තිබිය හැකි ව්‍යාපාර ක්ෂේත්‍ර විවෘත වීමෙන් අපේ ජීවිත සම්පූර්ණයෙන් වෙනස් වී යයි.

වෘත්තියක් තෝරා ගැනීම පිළිබඳ මුළාව දක්ෂතා අඩුකම නිසා පමණක් නො ව වැඩිකම නිසා ද ඇති වේ. ඇතැම් පුද්ගලයන් නොයෙක් ජන්මවල දී නොයෙක් ව්‍යාපාරවල තදින් යෙදීම නිසා කොතෙක් විවිධ දක්ෂතා ඇති කරගෙන තිබේ ද යතහොත් ඔවුන් ඒ එක එකට ඉරී ගොස් ඇති සේ ය. බොහෝ තරුණ තරුණියෝ ඔවුනට කොතෙක් විවිධ දක්ෂතා තිබුණත් කීන්දුවක් හා ඉලක්කයක් නැති කමින් දුක් විඳිති.

වෘත්තියක් තෝරා ගැනීමේදී පළමු වැනි තර්කානුකූල පියවර වන්නේ තමාගේ ශක්ති ටිකක් වුවත්, ඒවායේ ලැයිස්තුවක්

ගැනීම ය. ඊළඟට ප්‍රබල ම ඒවායින් එකක් තෝරාගත යුතු ය. මිනිස් දස්කම් මැනීමට නිවැරදි මැනීම් ක්‍රම සොයා ගෙන ඇත. මනෝ විද්‍යාඥයන්ගේ බුද්ධිමත් උත්තරයත් මෙයයි. කේසි කියැවීම් එබඳු කරුණුවල දී ගණිත ශාස්ත්‍රීය නිශ්චිතත්වයෙකින් තොර කියන නමුදු වෘත්ති පිළිබඳ මනෝවිද්‍යාඥයන්ගේ මතය පිළිගනී. පුද්ගලයාගේ කැපී පෙනෙන සමර්ථකම් කේසි කියැවීම්වලින් පැහැදිලි ව දක්වනු ලැබේ.

කෙසේ හෝ වෘත්තිය පිළිබඳ නිශ්චිතත්වයක් නැති කල්හිද විශේෂ අවවාදයක් අවශ්‍ය බව පෙනී ගිය අවස්ථාවල දී ද කරන ලද කියැවීම්වලින් වෘත්ති තෝරා ගැනීමේ දර්ශන පැහැදිලි වෙයි. අදහස් තුනක් නිතර නිතර කියැවෙන නිසා ඒවා මේ දර්ශනයේ සාරය වශයෙන් සැලැකිය හැකි ය. පළමුවැනි අදහස මෙයයි. "ඔබේ ප්‍රාර්ථනීය ආදර්ශය හෙවත් අභ්‍යන්තර ජීවිතයේ ඉලක්කය නිශ්චය කර ගෙන එය ඉටු කර ගන්නට උත්සාහ කරන්න."

ප්‍රාර්ථනීය වූ ආදර්ශ පැහැදිලි කර ගැනීම, සකස් වීම පිළිබඳ මුළු කේසි දර්ශනයේ ම ඇති වැදගත් අංගයෙකි. වෘත්ති පිළිබඳ මාර්ග දේශකයා තමා ම නම් එය විශේෂයෙන් ම වැදගත් වෙයි. ප්‍රාර්ථනීය වූ ආදර්ශ පිළිබඳ ව පැහැදිලි අදහස් ඇති කර ගත යුතු යැයි කියැවීම්වලින් අවධාරණය කරනු ලැබේ. සිතීමට උපකාරයක් වශයෙන් කඩදාසි කැබැල්ලක් ගෙන කායික, මානසික හා ආධ්‍යාත්මික යන ශීර්ෂ තුන ලියා ඒ තීරු යටින් ඒ ඒ කොටසට අයත් තමාගේ උසස් ම ඉලක්කය ලියන්නට යයි නිතර නිතර යෝජනා කර ඇත.

කරුණට අදාළ උද්ධෘත කිපයෙක් මෙහි ඇත:

"ඔබත් ඔබේ ප්‍රාර්ථනීය වූ ආදර්ශත් විග්‍රහ කරන විට සිතීම හිතෙන් ම කර ගෙන යන්නෙන් නැති ව කඩදාසියෙක

ලියන්න. 'කායික' යනු ලියා ඉරක් ඇඳ 'මානසික' යනු ලියා ඉරක් ඇඳ 'ආධ්‍යාත්මික' යනු ලියන්න. ආධ්‍යාත්මික යන්නෙන් පටන් ගෙන (සිතෙහි ඇති හැම දෙයක් ම පළමු වෙන් ආධ්‍යාත්මික සංකල්පයෙන් පැමිණිය යුතු හෙයිනි.) එක එක යටින් ප්‍රාර්ථනීය වූ ආදර්ශය පිළිබඳ ඔබගේ සංකල්පය ලියන්න. ආධ්‍යාත්මික යන්න යටින් ඔබට ඔබේ ආධ්‍යාත්මික වූ ආදර්ශය පෙන්නුම් කරන යේසුස්, බුදුහු, විඥ්ඥාණය, භෞතිකය, හා දෙවියන් වහන්සේ යන කොයි වචනය වුවත් ලියන්න.

ඊළඟට ඔබ සම්බන්ධයෙන් හෝ ඔබේ ගෘහය, මිත්‍රයන්, අසල් වැසියන්, සතුරන්, දේපොළ හා තත්ත්වයන් සම්බන්ධයෙන් හෝ ඔබේ ආධ්‍යාත්මික සංකල්පයෙන් ඇති වන ඔබේ ප්‍රාර්ථනීය වූ මානසික ආකල්පය, මානසික ශීර්ෂය යටින් ලියන්න.

ඊළඟට ඔබේ භෞතික ආදර්ශය කිමෙක් ද?.....මේ ක්‍රමයට පුද්ගලයෙක් තමා විග්‍රහ කරයි. ඊළඟට ඔබ ලබා ඇති දැනීම ප්‍රයෝජනයට ගන්න බලන්න.

මුලට ම කළ යුතු ව ඇත්තේ ඔබේ ප්‍රාර්ථනීය වූ ආදර්ශ නිශ්චය කර ලියා ගැනීමයි. ඊළඟට ඔබේ ම පින්තූරය අඳින්න. ඔබ හොඳ ඉන්ජිනේරුවෙකි. ඔබට අන් දේවල පින්තූර හොඳට ඇන්ද හැකි ය. කවදා හෝ ඔබ ඔබේ ම පින්තූරය අඳින්නට උත්සාහ ගෙන තිබේ ද ? ඔබ කෙබඳු වන්නට කැමැති ද යන්නෙන් නැත හොත් යම් බඳු යයි අන්‍යයන් හිතනවාට කැමැති දෙයින් කෙතෙක් දුරට ඔබ හරියට ම මැනෙනවා ද ? ඔබේ මානසික ආදර්ශය කිමෙක් ද ? භෞතික මට්ටමෙහි දී මනස ගොඩනැගිලිකරු බව මතක තබා ගන්න."

කොටින් කියත හොත් අපගේ ප්‍රාර්ථනීය වූ පරමාර්ථ විවිධ විය හැකි නමුත් නියම ආත්ම සමාධිය හා ආත්ම මාර්ගදේශකත්වය ලබා ගත හැක්කේ පරමාර්ථයන් පිළිබඳ පැහැදිලි අදහස් ඇති කර ගැනීමෙන් බව කියැවීමෙන් පිළිගනු

ලැබේ. මේ සංකල්පනා ක්ෂේත්‍රයෙන් අපේ වෘත්ති තේරීම් මතු විය යුතු ය.

වෘත්ති තේරීම පිළිබඳ කේසිගේ දර්ශනයේ ඇති දෙවන අදහස මෙයයි; අන්‍යයනට සේවය කිරීමට උත්සාහ කරන්න. අන්තිමට වෘත්තියක් තෝරා ගන්නා විට හැම දෙනකුගේ ම මාර්ගදේශක මූල ධර්මය විය යුත්තේ මා ඉනා හොඳින් මනුෂ්‍ය වර්ගයාට සේවය කරන්නේ කෙසේ ද යනු ය. අවසාන වශයෙන් අප දෙස ම අප බැලිය යුත්තේ ශරීරයේ සෙසල දෙස බලන්නාක් මෙනි. අප විසින් සිතිය යුත්තේ කලහකාරී රාජ්‍යයක් ගැන නො ව සහයෝගී සමස්ත මනුෂ්‍ය ප්‍රජාව ගැන ය. "අන්‍යයනට සේවය කිරීම දෙවියන් වහන්සේට කරන උසස් ම සේවයයි." යනු කියැවීම් වලින් නිතර නිතර එන කියමනෙකි. "ඔබ අතර සිටින ශ්‍රේෂ්ඨ ම පුද්ගලයා සියලු දෙනාගේ ම සේවකයාය." යනු තවත් එබඳු කියමනෙකි.

අපගේ සියලු තාවකාලික අර්ථයන්ගේ පරමාර්ථය විය යුත්තේ මෙය යයි කියැවීම්වලින් සලකනු ලැබේ. මේ බව පහත එන කියමනින් පැහැදිලි ව දක්නට ලැබේ.

"ප්‍රාර්ථනීය ආදර්ශ ඇත්තේ එකෙකි. එය නම් (බොහෝ නම් වලින් කථා කරනු ලබන) විශ්වයේ නිර්මාපක ශක්තිය, ඔබේ ප්‍රාර්ථනීය ආදර්ශය කර ගැනීමයි.[1] ඔබගේ ශරීරයත් මනසත් ආත්මයත් ඒ ශක්තියටත් සහෝදර මනුෂ්‍යයනටත් සේවය කිරීම සඳහා ක්‍රියාකාරී ශක්තියක් කර ගැනීමයි."

මේ මතයෙහි අවශ්‍යයෙන් ම ගැබ් වී ඇති අදහසෙක් නම් ආර්ථික සුරක්ෂිතත්වය, කීර්තිය හා ලෞකික සාර්ථකත්වය යන මේවා සේවා පරමාර්ථයට දෙවැනි විය යුතු බව ය. ඒවා ගොනා පසු පස යන රියසක මෙන් මේ අර්ථය පසු පස යා යුතුය. බොහෝ දක්කම් තුබූ දහතුන් හැවිරිදි ළමයෙක් ඒවායින්

1. බෞද්ධයන් කියන්නේ එය අනුපාද පරිනිබ්බානය වන බවයි.

එකක් තෝරා ගැනීමට අවශ්‍ය වී "මගේ වැඩිහිටි ජීවිතයේ දී ආර්ථික වශයෙන් විශාල ම සාර්ථකත්වය ලබා ගැනීම සඳහා මාගේ දස්කම්වලින් කුමක් අනුගමනය කළ යුතු ද" යි ඇසුවේය. ඔහුට මෙසේ කියන ලදී. "ආර්ථික අංශය අමතක කරන්න. ලෝකය ජීවත් වීම සඳහා වඩා සුදුසු බිමක් කිරීමට ඔබට කළ හැකි ලොකු ම සේවය ගැන සලකන්න. කවදාවත් ශ්‍රමය හුදු ආර්ථික කරුණු නිසා වියදම් කරන්න නම් එපා. මුදල් ලාබ ලැබිය යුත්තේ මිනිසකුගේ ශක්තිය මනුෂ්‍ය ප්‍රජාවට උපකාර වීම සඳහා යොදන විට එහි ප්‍රතිඵල වශයෙනි."

"මට ආර්ථික වශයෙන් සාර්ථක විය හැක්කේ කවර අංශයෙකින් ද" යි තවත් පුද්ගලයකු අසා ඇත. ඔහුට ලැබුණු උත්තරය මෙයයි: "ආර්ථික අංශය ඉවත දමන්න. ධන සම්පත්තිය, අන්‍යයනට මාර්ගය පෙන්වන ලෙසින් ජීවත් වීමට ඇති අවංක ආශාවේ ඵලය කර ගන්න. අභිවෘද්ධිය දෙන්නේ දෙවියන් වහන්සේ ය." වාණිජ භාණ්ඩ ආනයනය හා අපනයනය කරන්නකුට මෙසේ කියා ඇත: "මෙය ඔබේ ආප්ත වාක්‍යය වේවා! මගේ පියවර මා ආශ්‍රය කරන අයට ඉණිමං වේවා ! මම ඔවුන් මගේ පඩිගල් ලෙස නො යොදම්වා! මනුෂ්‍ය ප්‍රජාවට සේවය කරම්වා ! කීර්තියත් භාග්‍යයත් (මේ දෙකම ප්‍රතිඵල වශයෙන් එනු සහතික ය.) මනාව ගත කළ ජීවිතයෙකත් කරන ලද සේවයෙකත් ප්‍රතිඵල වේවා ! ඒ දෙක අන්‍යයන් පඩිගල් වශයෙන් යෙදීමෙන් නො ලැබේවා!"

මෙහි දී සර් ක්‍රිස්ටෝෆර් රෙන් නම් වූ මහා නිර්මාණ ශිල්පියා පිළිබඳව කියා ඇති කථාන්තරය සිහිපත් වේ. වරක් ඔහු ලන්ඩනයේ නව මහා දේවායතනය තනන බිම පසු කර ගෙන ගියේ ය. එහි සැලැස්ම ඇඳ තිබුණේ ඔහු විසිනි. කම්කරුවන් විසින් තමන් කර ගෙන යන කාර්යය ගැන සැලැකූ ආකාරය පුදුම සහිත ය. කම්කරුවන් කීප දෙනකු කරා වාරයෙන්

වාරයට ගිය ඔහු එක ම ප්‍රශ්නය ඇසුවේ ය. "ඔබ කුමක් කරනවාද?" යනු ඒ ප්‍රශ්නයයි. පළමු වැන්නා උඩ බලා "මා ගඩොල් තබනවා" යයි කීවේ ය. දෙවැන්නා "මා මුදල් හම්බ කරනවා" යයි කීවේ ය. "මා මහා දේවායතනයක් තැනීමට උදවු කරනවා" යනු තෙවැන්නාගේ පිළිතුර විය. කේසිගේ කියැවීම වෘත්තියක් තෝරා ගන්නට යත්න දරන අය ගෙන යන්නට උත්සාහ කරන්නේ මේ තෙවැනි මිනිසාගේ ආකල්පය දෙසට ය. ඔහුගේ සිතේ තිබුණේ සියලු මිනිසුන් සඳහා වූ යහපතේ හා සෞන්දර්යයේ ඉලක්කය මිස භෞතික කාර්යය හෝ ඉක්මනින් ලැබෙන කුලිය හෝ නො වේ.

වෘත්ති තෝරා ගැනීම පිළිබඳ කේසිගේ දර්ශනයේ ඇති තවත් මූලික අදහසෙකි මේ: "අතේ ඇති දෙය පාවිච්චි කරන්න. දැන් සිටින තැනින් පටන් ගන්න." මෙය විස්තර කිරීම අනවශ්‍ය තරම් පැහැදිලි අවවාදයෙකි. එහෙත් අනෙක් බොහෝ පැහැදිලි සත්‍ය මෙන් මෙය ද නැවත නැවතත් මතක් කර දිය යුතුව ඇත. මෙසේ වන්නේ සංකීර්ණ වූ ද ඈත ඇත්තා වූ ද සිද්ධි වඩා ඇලුම් කටයුතු වන විට වඩා සරල වූ ළඟ ඇති සිද්ධි ගැන නො සලකා සිටීම මිනිස් ගතියක් වන නිසා ය.

මනුෂ්‍ය ප්‍රජාවට සේවය කිරීමේ අදහස සිතේ වැටුණු බොහෝ මිනිසුන් නො පැහැදිලි විඥානවාදී මීදුමෙකින් හෝ සැකයෙන් මුසු උත්සාහයේ අසහනයෙන් හෝ වෙළී යති. ඇතැම් විට ඔවුනට ජීවිත කාර්යය පිළිබඳ අලුත් පෙනීමක් ඇති වන්නේ තමන් මුදවා ගැනීමට ඉඩක් නො දෙන ලෞකික කාර්යයකට මැදි වී සිටිය දී ය. පවුලට ඇති වගකීම නිසා හෝ ආර්ථික බාධක නිසා හෝ අලුතින් සිතා ගත් දූත මෙහෙවරට අවශ්‍ය පුහුණුව ලබා ගන්නට ඔවුනට නොහැකි වනු ඇත. "කාට වුවත් පාවිච්චි කළ හැක්කේ තමා අත ඇති දේ ය." යන සත්‍යය මතක් කර දිය යුතු යයි කේසි සිතුවේ මේ වර්ගයේ පුද්ගලයනටය.

සැනසුම් දහයෙක ගමන අරඹන්නේ එක් පියවරෙකිනි. ඒ පියවර ගත යුතු ව ඇත්තේ දැන් සිටින තැන සිටය.

පහත එන පැහැදිලි උද්ධෘතය මෙතැනට යෝග්‍ය ය. "මගේ ජීවිත කාර්යය කිමෙක් ද" යි හතළිස් නව හැවිරිදි ස්ත්‍රියක් ඇසුවා ය. "දුර්වලයන් දිරි ගැන්වීම, අධෛර්යයට පත් වූවනට ශක්තිය හා ධෛර්ය දීම." යනු ඇට ලැබුණු පිළිතුරයි. "මා එය කරන්නේ කෙසේ ද ?" යනු ඇගේ ඊළඟ ප්‍රශ්නයයි. "අද ඔබේ අතට අසු වන දෙයක් කරන්න." යනු පිළිතුරයි. "මා කළ යුතුව ඇතැයි ඔබට පෙනෙන්නේ කිමෙක් ද, මට නියමිත කාර්යය කොතැනින් ක්‍රියාත්මක කළ යුතු ද ?" කියා ඕ දිගට ම ඇසුවාය. "අද කරන්නට තිබෙන දෙය කිමෙක් ද ? ඔබ සිටින තැන සිට ගෙන කරන්න තිබෙන දෙය කරන්න. උන් වහන්සේට ඔබේ මඟ පෙන්වන්න ඉඩ දෙන්න. උන්වහන්සේගේ අතට පත්වන්න. ඔබ මාර්ගය වන්න. ඔබ වැඩ කරන්නට හෝ වෙහෙස වන්නට හෝ සේවය කරන්නට හෝ සේවය ලබන්නට හෝ කැමැති තැන උන් වහන්සේට කියන්න එපා. මෙසේ කියන්න. 'ස්වාමීනි, මා ඔබ වහන්සේගේ ය. ඔබ හොඳ යයි සිතන ලෙසට මා පාවිච්චි කරන්න.' යනු ඇයට ලැබුණු අවවාදයයි.

තවත් ස්ත්‍රියකට ද මේ ප්‍රශ්නය ම තිබුණේ ය. හැට එක් හැවිරිදි වූ ඕ උතුරු යුරෝපීය රටෙක හිටපු නියෝජිතයකුගේ බිරියයි. ඕ පෙරදිග නොයෙක් තැන්වල දිගු කාලයක් සැරි සැරූ තැනැත්තියකි. කලාව හා ආගම පිළිබඳ ඇගේ උගත්කම විශාල ය. "කරුණාකර මිනිස් ප්‍රජාවට ඉතා හොඳින් සේවය කළ හැකි ආකාරය මට විස්තර කරන්න." යයි ඕ ඉල්ලා සිටියාය. ඇට දුන් උත්තරය ද සාර වශයෙන් එය ම ය. "දිනෙන් දින ඔබට විවෘත වන මාර්ගවලින් සේවය කරන්න. නිතර ම විශාල දෙයක් කරන්නේ මහත් ක්‍රියාවක් කිරීමට සැලසුම් අඳින පුද්ගලයන් නො වේ. මහත් සේවයක් සිදු වන්නේ එදිනෙදා ඉඩකඩ ලැබෙන හැටියට ක්‍රියා කරන මිනිසා ගෙනි. මෙසේ

අවස්ථා ප්‍රයෝජනයට ගත යුතු ය. එවිට වඩා හොඳ මාර්ග විවෘත වෙයි. අප අනුනට උපකාර පිණිස යොදන දෙය ඉබේටම වැඩි වෙයි." තවත් කෙනකුට මෙසේ කියා ඇත. "ඔබ ඉන්නා තැනින් පටන් ගන්න. සිටිනා තැන සිට කැමැති තත්වයකට පත් වන්න. එවිට ඔබට ඔබේ වටිනාකම ඔප්පු කළ හැකි වෙයි. එවිට උන්වහන්සේ වඩා හොඳ මාර්ග විවෘත කරනවා ඇත."

මිනිස් ප්‍රජාවට විශාල සේවයක් කළ යුතු යයි හදිසියේ තීරණය කර ගන්නා මිනිසුනට පමණක් නොව ඕනෑ ම වර්ගයෙක ලොකු දෙයක් කිරීමට ආශා කරන කාහට වුව ද ප්‍රයෝජන ගත හැකි දර්ශනයෙක් ඇත. එය ක්‍රියාවේ යෙදෙන අරපරෙස්සමේ දර්ශනය යයි හඳුන්වා දිය හැකි ය. තමා අත ඇති දෙයින් ලොකු ම ප්‍රයෝජනය ගන්නා වූ හැම දක්ෂ ගැහැනියක ම ක්‍රියා කරන්නේ මේ දර්ශනයට අනුව ය. තමා අත ඇති දෙය පාවිච්චි කිරීමටත් සිටිනා තැනින් පටන් ගැනීමටත් කියැවීම්වලින් නිතර දෙන උපදේශය මිනිස් ගති දෙකකට විරුද්ධ ව යයි. ඒ දෙක නම් ළඟ නො දැකීමේ අකර්මණ්‍යතාව හා ඈත දැකීමේ අකර්මණ්‍යතාවයි.

කලාවෙහි, විද්‍යාවෙහි නැතහොත් දේශපාලනයෙහි තමා විසින් ලැබිය යුතු පාර ප්‍රාප්තිය කිමෙක් දැයි දන්නා බොහෝ මිනිස්සු වරදවා ගත් භෞතිකවාදී පිස්සුවක් නිසා අධෛර්යවත්ව නිෂ්ක්‍රිය වෙති. ඔවුනගේ ඉලක්කය ලබා ගත නො හැකි ලෙස පෙනෙයි. ජීවිතයේ හා උත්සාහයේ අවිච්ඡින්නත්වය ගැන දැනීමක් ඔවුනට නැත. ඒ නිසා කාලය වැදගත් නො වන බවත් බොහෝ විට එක් ජීවිතයෙක දී ආරම්භ කරන ලද දෙයෙහි ඵල ඇති වන්නේ ඊළඟ ජන්මයෙහි දී බවත් ඔව්හු නො දනිති. කාලයේ මායාකාරී සීමා කිරීම නිසා ඔවුනට මේ ජන්මයේ දී මහා සංගීතඥයන් වීමට නො හැකි වනු ඇත. එහෙත් ඔවුන් ඔවුන්ගේ සංගීතය සම්පූර්ණයෙන් අත් හරින තරමට කල්පනාවට චේතනාව මරන්නට ඉඩ දුනහොත් එතන ම නතර වී ඒ කොටස

ප්ලග ආත්මයේ දී කිරීමට ඉතිරි වෙයි. එහෙත් ඔවුන් "අත ඇති දෙය පාවිච්චි කරන්න. ඉන්නා තැනින් පටන් ගන්න." යන උපදේශයෙහි කැටි වී ඇති දීර්ඝ කාලීන ප්‍රඥාව ක්‍රියාවට නැගුවා නම් ඔවුන්ගේ මලානික ගතිය නැති වී ගොස් ශක්තිය නියම මාර්ගයෙහි යෙදිය හැකි වනු ඇත.

අනෙක් අතට වෙනත් බොහෝ දෙනා පුනර්ජන්ම වාදයෙන් තමනට විවෘත ව ඇති බව පෙනෙන අති විශාල පථයෙන් බුද්ධිය කලඹා ගන්නා නමුත් ඒ මානසික උනන්දුව ක්‍රියාවට නො නඟති. පරමවිඥානවාදීන් හා මානවඥානවාදීන්[1] බොහෝ දෙනකුන් ආධ්‍යාත්මික පරිණාමයෙහි දී ක්‍රියාත්මක වන ලෝක නියාම හැදෑරීමෙහි කොතරම් ගිලී යා ද යතහොත් ඒ දැනීමෙන් පමණක් තම අභිවෘද්ධිය ඉබේ ම සිදු නොවන බව අමතක කර ඇත. ඔව්හු කවර දිනෙකවත් ගමන ආරම්භ නො කෙරෙන තරමට මාර්ග සිතියමක් හැදෑරීමෙහි නියැලි මිනිසුන් වැන්නෝ ය. හුදු චින්තනය ඔවුන්ගේ ජීව රුධිරයට කොතරම් තදින් ඇතුළු වී තිබේ ද යතහොත් චරිතය වෙනස් කර ගත යුතු අවස්ථාවක් හෝ මනුෂ්‍ය වර්ගයාට ප්‍රයෝජනවත් සේවයක් සිදු කළ යුතු අවස්ථාවක් හෝ පැමිණි විට ඔව්හු නිකම් බලා සිටිති. එයින් ඔවුන්ගේ බුද්ධි රහිත බව ප්‍රකට වේ. පරමවිඥානවාදීන් හා මානවඥානවාදීන් පමණක් මේ දුර්වලතාවට වරදකරුවන් නො වන බව සත්‍ය ය. හැම්ලට්ට පෙර දී පවා නිෂ්ක්‍රියත්වය දාර්ශනිකයන්ගේ ඇති ප්‍රසිද්ධ මහා පාපය වී තිබේ.

මේ ප්‍රතිපත්ති තුන වෘත්ති තෝරා ගැනීම පිළිබඳ කේසිගේ දර්ශනයේ සාරය බව පෙනේ. මේ ප්‍රතිපත්ති තුනෙහි දී, කේසි කියැවීම්වල ඇති, මනුෂ්‍යයාගේ දෛවය විශ්වයට සම්බන්ධ කොට දක්නා ගතිය, හොඳ හැටි ලෝක ව්‍යවහාර මතයෙන් සමබර වී ඇති බව දක්නට ලැබේ. පුනර්ජන්මය ගැන දැන ගැනීම නිසා කෙනකුගේ මානසික සමබර බව අඩු නො විය

1. Anthroposophists

යුතු ය. පුනර්ජන්මවාදය ගැන දන්නා නැනැත්තාගේ සියලු තීරණ සදාචාරාත්මක වූ ද මුළු විශ්වයට ම සම්බන්ධ වූ ද සැලැස්මකට අනුව කෙරෙන නිසා බුද්ධිමත් තීරණ වීමට හොඳටම ඉඩ තිබේ. පුනර්ජන්මවාදය ගැනත් එයින් ඇති වන සීමා පළල් වීම ගැනත් පළමුවෙන් දැන ගන්නට ලැබීමෙන් ඇති වන ඉදිමීම නිසා සමහරු ලෝක ව්‍යවහාර මතය නමැති බර සමකරණය නැති ව ඉගිලෙන්නට දඟලති. වෘත්ති තෝරා ගැනීම පිළිබඳ කේසීගේ දර්ශනය හැදෑරීමෙන් මේ කරුණු පිළිබඳ මිථ්‍යා ඥානය නිවැරැදි විය යුතු ය. එසේ ම එයින් මනුෂ්‍ය දෛවය පිළිබඳ ව කෙනකුගේ ඇති අදහස කොතරම් පළල් වුවත් ආත්ම විශුද්ධිය හෙමින් දිනපතා අඟලින් අඟලට කර ගත යුතු ක්‍රියා මාර්ගයක් බව දක්වනු ලැබේ.

තවද, පුද්ගලයකුගේ වටාපිටාවේ ඇති කරුණු මොනවා වුවත් ඒවා ඔහුගේ ආධ්‍යාත්මික දියුණුවට සම්පූර්ණයෙන් ම සරිලන සේ ලැබී ඇති බව කේසී කියැවීම්වලින් නිතර සිහිපත් කර දෙනු ලැබේ. තමාගේ ජීවිතයේ නියම වෘත්තියට බාධක ලෙස පෙනුණත් ඒවා බාධක වශයෙන් නො ව පඩිගල් ලෙස සැලැකිය යුතු ය. බාහිර පරිසරය වෙනස් කිරීමට ඇති එක ම ක්‍රමය නම් පරිසරයේ ඇති විරුද්ධ කරුණු පිළිබඳ ව ඉවසිලිමත්ව තමාගේ ආත්මය වෙනස් කර ගැනීමයි. එයින් ඔහු වඩා යෝග්‍ය පරිසරයකට සුදුසු වෙයි.

එක් කියැවීමෙක් මෙසේ ය:

"මෙය දැන ගන්න. ඔබ කවර තත්ත්වයකට වැටුණත් ඒ වැටෙන්නේ ඔබේ සංවර්ධනයට අවශ්‍ය නිසා ය.[1] පුද්ගලයකු දිනෙන් දිනට ඇතිවන සම්බන්ධකම්වල දී වචනයත් ක්‍රියාවත් යෙදිය යුතු ය. එසේ කළ යුත්තේ ඒ කායික, වාචසික කර්මයන් නිසා ආත්ම සංවර්ධනය සිදුවේ ය යන අවබෝධයෙන් යුතුවය.

1. සියල්ල සිදු වන්නේ යහපතට යයි කියමනෙක් ඇත.

ගොඩනැගිල්ල ටිකින් ටික ගඩොලින් ගඩොල ගොඩ නැගෙන්නෙකි. වචනවලින් ද දිනෙන් දිනට කරනු ලබන සුළු කර්මවලින් ද පුද්ගලයා තම දෑකීම ප්‍රකාශනයට පත් කරයි. මෙසේ කරන ඔහු ගමන් කරන්නේ තම ඥානයේත් සැඟවී ඇති ශක්තිවලත් නියම ජීවිත පරමාර්ථයේත් පූර්ණ ප්‍රකාශනය දෙසට ය. සේවය කරා නො නැවත ගමන් කිරීමෙන් පුද්ගලයකු තමා සකස් කර ගත් විට වෙනසට අවශ්‍ය වූ පරිසරය ලැබෙනු ඇත. එවිට ඔහුට ඊළඟ පියවර, ඊළඟ අවස්ථාව දක්නට ලැබෙනු ඇත.

ඒ නිසා ටිකෙන් ටික ඉරෙන් ඉර අත ඇති දෙයින් ගොඩ නගන්න. ඉක්මන් වන්නට එපා. වැඩි උනන්දුවක් ඇති කර ගන්න එපා.[1] මුළු ගොඩනැගිල්ල ම උන් වහන්සේගේ නො වේ ද ?....."

1. "ඉක්මන් කොටයි." "හොඳ ම සැරේ හීන්සැරේ."

# 21

# මනුෂ්‍ය දක්ෂතා පිළිබඳ තොරතුරුවල ගැබ් ව ඇති කරුණු

මනුෂ්‍ය දක්ෂතා පිළිබඳවත් ජීවිතයෙන් ජීවිතයට සිදුවන ඒවායේ අවිච්ඡින්න සංවර්ධනය පිළිබඳවත් කේසිගෙන් ලැබී ඇති තොරතුරුවල, ප්‍රයෝජනයට ගත හැකි සෑහෙන වටිනාකමෙක් ඇත. උත්සාහයක් තිබෙනවා නම් දියුණු කර ගත හැකි, සීමාවක් නැති දස්කම් හැම දෙනාට ම ඇත්තේ ය යන හැඟීම ඒ කියැවීම් වලින් අපට ලැබේ. මේ එබඳු එක් ප්‍රයෝජනයෙකි. නොයෙක් ප්‍රමාණවලින් ප්‍රයෝජනයට ගත හැකි වූ බැංකු ගිණුම් බඳු වූ නිදි ගෙන ඇති දස්කම් ගැන දැනට ම අප විසින් කියා ඇත. හැම පුද්ගලයකුම ප්‍රයෝජනයට ගන්නා වූ සම්පත් ප්‍රමාණය සම්පූර්ණයෙන් ම රැඳී ඇත්තේ ඔහු විසින් ජීවිත බැංකුවෙහි කලින් තැන්පත් කොට ඇති උත්සාහ ප්‍රමාණය මත ය. මේ ක්‍රමය අතීත අනාගත යන දෙක පිළිබඳව ම ක්‍රියාත්මක වන බව පැහැදිලි ය. අතීතය පිළිබඳව වර්තමානයෙහි දී නිවැරැදිව ගණන් ගැනීම අපට සහතිකවා සේ ම වර්තමානය

පිළිබඳව අනාගතයෙහි ද නිවැරදිව ගණන් ගැනීම ද සහතිකය. දක්ෂතාවක් ලබා ගැනීම සඳහා අප යොදන කාලය, ශක්තිය, කල්පනාව හා අවධානය අනාගතයේ දී අපට ලැබිය යුතු ලෙසින් අපේ ගණන් පොතෙහි සටහන් වනු ඇත.

තමාගේ ලාබාල ප්‍රාර්ථනාව සම්පූර්ණයෙන් ඉටු කර ගත නොහැකි බව ස්ථිරව දන දනත් ඒ ප්‍රාර්ථනා පසු පස ලුහුබඳනා චින්තාපරවශ දහස් ගණන් අප්‍රසිද්ධ මනුෂ්‍යයෝ ලොව පුරා සිටිති. පෙනෙන සැටියෙන් ඔවුන් ගැන සලකා බලන විට ඔවුන්ගේ නිරර්ථක ප්‍රයත්නය අතිශයින් ශෝචනීය ය. කර්ම විපාක පිළිබඳ අවිච්ඡින්නතා මූල ධර්මයේ එළියෙන් බලන විට එහි එතරම් ශෝචනීය තත්ත්වයෙක් නැත.

මල් වවන්නට ආශාවෙන් උත්සාහ කරන මිනිසකුට ඩේලියා තැඟි හෝ උද්‍යාන පාලන ශාස්ත්‍රීය සංගරාවලින් මහා ප්‍රසිද්ධියක් හෝ නොලැබෙන්නට පුළුවන. එහෙත් දැන් ඔහු උද්භිදවිද්‍යාව හා උද්‍යාන පාලන විද්‍යාව පිළිබඳ ඥානයේ මුල්ගල තබයි. එයින් ඔහු කිසියම් අනාගත ජීවිතයෙක දී පැළෑටි පිළිබඳ ඒ කාලයේ සිටින විශේෂඥයා වනු ඇත. මැදිවියේ ස්ත්‍රියක විසින් චිත්‍ර ඇඳීමට කරන උත්සාහයන් නියතයෙන් හේතු වන්නේ පවුලේ අයගේ හා මිත්‍රයන්ගේ උපහාසයට පමණක් නොවේ. එයින් ඕ කිසියම් අනාගත යුගයෙක පියකරු ම දේවස්ථානය චිත්‍රයට නැඟීමේ සමර්ථතාවේ පදනම ද දමා ගනී. බොහෝ කාලයකට පෙර මැලැවී මැරී ගිය, සංගීත සන්දර්ශන පිළිබඳ බලාපොරොත්තු ඇති ව අවුරුදු පතා ම අඳුරේ පියානෝ පාඩම් උගන්වන සංගීත ගුරුවරිය ගමන් කරන්නේ ලෝක කීර්තිය හා ප්‍රශංසාව දෙසට ය. කාලමානයේ ආඝාතයෙන්[1] ඇගේ යටි සිතෙහි නිශ්චිත රිද්ම සංඥාවෙක් ඇති වෙයි. හැම සංගීත ශික්ෂණයෙකින් ම ඇගේ අනාගත සමර්ථ භාවය වැඩි කරගනු

1. The beat of the metronome

ලැබේ. ජීවිත දෙක තුනෙකින් පසු ව, සමහර විට ඈ ඒ කාලයේ සිටින විශේෂඥයා වනු ඇත.

කොටින් කියත හොත් පුනර්ජන්මවාදයට අනුව කවරදාවත් මොන ම උත්සාහයක්වත් විනාශ වන්නේ නැත. කර්ම නියාමය දුශ්චරිත සම්බන්ධයෙන් අපක්ෂපාතීව නිශ්චිත දුඃඛ විපාක දෙන්නා සේ ම, සුචරිත සම්බන්ධයෙන් ද, නිශ්චිත සුඛ විපාක දෙයි. මේ වැදගත් කරුණ හොඳින් තේරුම් ගත් විට බලාපොරොත්තු සුන් කර ගැනීමට ඉඩෙක් නැති වෙයි. අපි හැම මොහොතක ම අපේ අනාගතය තනමින් ද ඒ අනාගතයේ කොන්දේසි සකස් කරමින් ද සිටිමු. අප දැන් කරන්නේ පින් ද පව් ද යන්න මත ඒ අනාගතයේ හොඳ හෝ නරක් වීම රැඳී ඇත.[1]

මේ මතයෙන් මතුවන තවත් වැදගත් අදහස් කීපයෙක් ඇත. පළමු කොට ම මහලු කාලය නමින් හැඳින්වෙන ජීවිතයේ අවසාන භාගය විශ්‍රාමයෙන්, නිෂ්ක්‍රියත්වයෙන්, නිෂ්ඵලය යන සාමාන්‍ය හැඟීමෙන්, ගත කළ යුතු කාලපරිච්ඡේදයක් නොවන බව එයින් නිගමනය වෙයි. අප සාමාන්‍යයෙන් සිතා සිටින මහලු වයස මිථ්‍යාදෘෂ්ටියෙකි. කේසි කියැවීම්වලට අනුව ක්‍රි. පූ. 10000 දී ඊජිප්තු වැසියන් විසින් බලාපොරොත්තු වූ ආයුකාලය අවුරුදු සීයකට බෙහෙවින් වැඩි ය. සුදුසු ආහාර හා සුදුසු සිතුවිලි පිළිබඳ පුරුද්දෙන් ජරාදුර්වල වීම බෙහෙවින් පමා කර ගත හැකි ය. මේ අතිශයෝක්තියක් ලෙසින් පෙනෙන වාර්තාව තහවුරු කිරීමේ සාක්ෂි නවීන විද්‍යාවෙන් එකතු වෙමින් පවතී. සෞඛ්‍යය, ශක්තිය හා දීර්ඝ ජීවිතය යන මේවා කෙරෙහි ආහාරයේ ඇති පුදුම බලපෑම් දැනටමත් අපගේ පරීක්ෂණාගාරය මගින් සොයා ගෙන යනු ලැබේ. ජරාවේ ලක්ෂණ පහළ වීම එක්තරා ප්‍රමාණයකට කෑමේ, ජීවත් වීමේ හා සිතීමේ වැරදි

1. "උදබින්දු නිපාතේන උදකුම්භෝපි පූරති" ආදී ධම්මපද ගාථා මෙහි දී සිහිවේ.

පුරුදු නිසාත් එක්තරා ප්‍රමාණයකට නිරර්ථකත්වය පිළිබඳ බලාපොරොත්තුව නිසාත් ඇති වන්නක් බව පෙන්වා දිය හැකිවනු ඇත.

මෙ වැඩෙක් නැත යන හැඟීම ඇති වන්නේ ජීවිතය පිළිබඳ හරස් දැක්ම යයි නම් කළ හැකි දෘෂ්ටිය නිසා ය. හරස් දැක්ම නම් තමා, කාලයෙන් හා දේශයෙන් හරස් මට්ටමෙක ඇති අන්‍යයන් සමඟ සංසන්දනය කිරීමයි. එහෙත් පුනර්ජන්මවාදයට අනුව ජීවිතය පිළිබඳ එක ම නිවැරදි දෘෂ්ටිය නම් සිරස් දැක්ම ය. සිරස් දැක්ම නම් අද සිටින අප අතීත අප සමගත් අනාගත අප සමගත් සසඳා දැක්මයි. අප අපට වඩා බාලයන් සමග සංසන්දනය කිරීම අනවශ්‍ය ය. නින්දනීය ය. එසේ කියන්නේ සත්‍ය වශයෙන් අප හැම දෙනකුන් ම අන්‍යයන් පසු කිරීමට නොව අපේ නොදියුණු වර්තමාන තත්ත්වයන් පසු කිරීමට යත්න දරන හෙයිනි. අපේ ප්‍රගතිය බලාගත හැකි වන්නේ අපේ ම අතීතය ද පරම නිෂ්යාව කරා යෑමට ඇති දුර ද සලකා බැලීමෙනි.

මෙය මෙසේ යයි සම්පූර්ණයෙන් දැන ගැනීම නිසා අපේ ජීවිත තත්ත්වයට වඩා වෙනස් වුව ද වාසි සහිත වූ ද ජීවිත තත්ත්වයන්හි සිටින අය කෙරෙහි ඇති වන ඊර්ෂ්‍යාවෙන් අපි ඉබේට ම නිදහස් වෙමු. තරගය භෞතිකවාදීන්ගේ මිරිඟුවෙක් පමණී. ආධ්‍යාත්මික සත්‍යයට අනුව අප අපේ ම කුඩා ආත්මය සමග මිය වෙන කිසිවකු සමග තරඟ කරන්නේ නැත.

අනාගතයේ දී ඇති විය හැකි සමාජ සංවිධානය කෙබඳු දැයි අපට කල් තියා දැන ගත නොහැකි නමුත් මහලු වියෙහි දී මුදල් ඉපැයීමේ වෘත්තියෙන් විශ්‍රාම ගැනීමේ චාරිත්‍රය තව කාලයක් තිස්සේ පවතිනු ඇත. අඩු ගණනේ තරුණකම රඳවා ගැනීම පිළිබඳ ව අපේ ඥානය තව බොහෝ දුර දියුණු වන තාක් එය පවතිනු ඇත. සමාජ සංවිධානය කුමක් වුවත් වයසට

යන කවර පුද්ගලයකු වුව ද තමා කපුරු බෝල හා ඉකුත් ගීත සෘතුවේ පොරෝණාත් සමග අල්මාරියට දමනු ලැබේ යයි නො සිතිය යුතු ය. ඔහු විසින් කළ යුතුව ඇත්තේ, නිශ්ශබ්දව, තම කාලය, නව ශක්ති හා සමර්ථතා වගා කර ගැනීමටත් තමාගේ පවුලේ වගකීමේ බලපෑම් නිසා හෝ වෘත්තියේ යුතුකම් නිසා හෝ කලින් කවදාවත් උගන්නට නොලැබුණු අලුත් දේවල් ඉගෙනීමටත් කැප කිරීම ය. මෙය කළ යුතු වන්නේ අනාගත ජන්මයන්හි ආත්ම ධනය සඳහා අත්තිවාරමක් දමනු ලැබේ ය යන ස්ථිර විශ්වාසයෙකින් යුතුව ය. පෘථිවියෙහි නොව ස්වර්ගයෙහි නිදන් තැන්පත් කරන්නට[1] යයි යේසුතුමා කළ අවවාදයට දිය හැකි විවරණවලින් එකෙක් මෙයයි. මෙහි ස්වර්ගය යන්නෙන් මුක්ත චිත්තයත් නිධානය යන්නෙන් මනසේ හා ආත්මයේ ශක්තියත් අදහස් කළා විය හැකි ය.

කියැවීම්වල දෘෂ්ටිය මෙය බව හොඳින් පැහැදිලි ය. මැණික් ගල්වල ඇති රෝග සුව කරන ගුණ හොඳින් හදාරන්නට යයි කියන ලද හැට හැවිරිදි මිනිසා පිළිබඳ නිදසුන් අප දැනට ම දැක ඇත.[2] ලිපි ගොනුවල මෙබඳු නිදසුන් රාශියක් තිබේ. විශ්‍රාම ගැනීමේ වයසට ළංවන පොලිස් නිලධාරියකුට රහස් පරීක්ෂකයකු වශයෙන් ප්‍රයෝජනවත් වීම සලකා ගෙන රසායන විද්‍යාව හදාරන්නට යයි කියා තිබේ. තරුණ අයට ජීවිතයේ තම ස්ථානය සොයා ගැනීම සඳහා උපකාර කරන්නට යයි හැටතුන් හැවිරිදි මැහැල්ලකට කියා තිබේ. එබඳු තවත් ස්ත්‍රියකට දැනට ම අවුරුදු කීපයක් කර ගෙන ගිය මල් ව්‍යාපාරය වඩාත් දියුණුවට කරගෙන යන්නට පමණක් නොව තම ලේඛන ශක්තිය දියුණු කර ගන්නට ද කියන ලදී. මෙය ඇයට කිසිම දිනෙකවත් ඇති ව තිබූ අදහසෙක් නොවේ.

---

1. "එසෝ නිධි සුනිහිතෝ - අජෙය්‍යෝ අනුගාමිකෝ"
2. 317 පිට

ජීවිතයේ අවසාන මොහොත දක්වා ම හොඳ වැඩ කිරීම අපේ යුතුකම බව කියැවීම්වලින් නිතර පැහැදිලිව ම දැක්වෙයි. ඉතා හොඳ උද්ධෘත කීපයෙක් පහත පළ වේ.

"හැම දෙයෙකදී ම මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන්න. කොයි එකේ දී වත් අන්තයට යන්න එපා. ඔබේ මේ ජීවිත කාලය අවුරුදු අනූ අටක් වන්නට ඉඩ තිබෙනවා. ඊට සුදුස්සකුව ජීවත් වුණොත් එපමණ කල් ජීවත් විය හැකි ය. එහෙත් ඔබට අනුනට දෙන්නට පුළුවන් මොනවා ද ? දෙන්න යම් දෙයක් ඔබ සතු ව නැති නම් අන්‍යයන්ගේ මාර්ගයෙහි සිටීමට ඔබට ඇති අයිතිය කිමෙක් ද ? දෙන්නට දෙයක් තියා ගෙන ඉන්න. එවිට ඔබට සුදුසු කාලය ජීවත් විය හැකි වනු ඇත."

ප්‍ර : මට මහලු වයසට ඉතා හොඳින් සකස් විය හැක්කේ කෙසේ ද ?

උ : "වර්තමානයට සකස් වීමෙනි. මහලු වයසට ඔබ මුහු කරන්නට පමණක් ඉඩ දෙන්න. හැම විට ම ඕනෑ ම කෙනෙක් හදවත හා කාර්යය තරමට ම තරුණයි. තරුණව ඉන්නට නම් මිහිරි ව ඉන්න, මිතුරුව ඉන්න, මෛත්‍රියෙන් ඉන්න."

ප්‍ර : වයසට යෑමේත් තනි වීමේත් බය මට යටපත් කර ගත හැක්කේ කෙසේ ද ?

උ : "ඉදිරිපත් වී අනෙකකුට යමක් කිරීමෙන්, තනි ව ම වැඩපළ කර ගත නො හැකි අයට උපකාර කිරීමෙන්, සම්පූර්ණයෙන් ම තමා අමතක කොට අන්‍යයන් සුඛිත කිරීමෙන්, අනෙකකුට උපකාර කිරීමෙන්, ඔබට ඔබේ බියෙන් නිදහස් විය හැකි ය."

ප්‍ර : "ඔබ යෝජනා කරන විනෝද ක්‍රියාව කිමෙක් ද ?"

උ: "අනෙකකුට උපකාර කිරීමේ විනෝද ක්‍රියාව, එළිමහනේ මල් අත පත ගෑම ද ඔබට හොඳ විනෝද ක්‍රියාවෙකි. එහෙත් හැමදාම තමාට ම වැඩපළ කර ගත නොහැකි කාට හරි උපකාරයක් කරන්නට සලසා ගන්න. තනි වී සිටින කෙනකු සමග කථා කර කර සිටියත්, එවැන්නකු ආශ්‍රය කළත් ඒත් ඇති. එයින් ඔබට ලොකු ම ආත්මෝපකාරයක් සිදු වනු ඇත."

ජීවිතය අවිච්ඡින්නය යනු ආත්මය අමරණීයය යන මතයෙන් ද පිළිගනු ලබන්නෙකි. එහෙත් එහි දී එය ඉතා නොපැහැදිලි කාල්පනික ස්වරූපයක් ගනී. පුනර්ජන්මවාදය නිසා ඒ අවිච්ඡින්නත්වය මනුෂ්‍ය දක්ෂතා හා උත්සාහ සම්බන්ධයෙන් මනෝ විද්‍යාත්මක වශයෙන් අර්ථවත් වෙයි.

තමා විසින් ඇති කර ගනු ලබන දක්ෂතා ජීවිතයෙන් ජීවිතයට යන්නේය යන සත්‍යයෙන් මතු වන දෙවන වැදගත් අදහස නම් ඊර්ෂ්‍යාව අනවශ්‍ය හැඟීමෙක් ය යනුයි. ඊර්ෂ්‍යාව අවිද්‍යාව යයි අවබෝධ කර ගන්නා වූ අවස්ථාවෙක් හැම පුද්ගලයාගේ ම අධ්‍යයනයෙහි ඇති වේ යයි එමර්සන් කියා ඇත. ඔහුගේ ඒ සත්‍ය කියමනෙහි ඇති මහා ශක්තිය අවබෝධ කර ගත හැක්කේ පුනර්ජන්මය පිළිබඳ ඥානයෙන් පමණි. ඊර්ෂ්‍යාව ඇති වන්නේ මිනිසා කර ඇති දෙය මිනිසාට කළ හැකි ය යන සත්‍යය නොදන්නා අයට පමණි. අන්‍යයන් අත්පත් කර ගෙන ඇති සෞන්දර්යයත්, ශක්තියත්, ප්‍රේමයත්, කීර්තිය හා ධනයත් යන සියල්ල ම ඒවා ලබා ගැනීමට සුදුසු උත්සාහය කළ වහා ම මටත් ලබා ගත හැකි ය.

සභ්‍යත්වයේ හා ආත්මාවබෝධයේ අප දැනට ලබා ඇති මට්ටමේ දී අනෙක් හැඟීම් කාර්යක්ෂම නොවූ අවස්ථාවල දී ඊර්ෂ්‍යාව ක්‍රියාරම්භයට හේතු වී ඇත. එසේ වුවත් ඊර්ෂ්‍යාව කුඩුකේඩුකමට ද්වේෂයට, අවඥාවට, අපහාසයට, විරෝධයට

හා ඒවාට සම්බන්ධ අනෙක් දුර්ගුණවලට හේතු වන විට නම්, ඉතා නරක ය. අන් සියල්ලට ම වැඩියෙන් ඊර්ෂ්‍යාව යොමු වන්නේ පුද්ගලයකුගේ ඇති බොහෝ දේ පිළිබඳ දක්ෂතාවටය. විෂය එකකට වැඩි ගණනෙක දී තම දක්ෂතාව ඔප්පු කරන්න උත්සාහ දරා ඒ හැම එකෙක දී ම තම සාර්ථකත්වය ලබා ගත් මිනිසා හෝ ස්ත්‍රිය එක් දෙයෙක පමණක් සාර්ථකත්වය ලබා ගන්නා මිනිසාට හෝ ස්ත්‍රියට වැඩියෙන් වැල්පොලි ක්‍රමයෙන් ඊර්ෂ්‍යාවට ලක් වෙයි. ඔහු ඔහුගේ විචිත්‍ර දක්ෂතාවලින් අන්‍යයන්ගේ ප්‍රශංසාව පතයි. එක්තරා ප්‍රමාණයකට එය ලබයි. අඩු ගණනේ ඔහුට වචනයෙන් පැසැසුම් ලැබෙයි. එහෙත් බොහෝ දෙනකුන්ගේ ඇතුළ හදෙහි ඔහු ගැන ඇති වන්නේ විරෝධය හා වෛරයයි. එසේ වන්නේ ඔහු වටිනාකමට සෙසු මිනිසුන්ගේ ඇති අයිතිවාසිකමට (ඔවුන්ගේ සිතීමට අනුව) ඔවුන් අහිමි කරන නිසා ය.

ඒ කෙසේ වෙතත් සියලු දස්කම් අප හැම දෙනාට ම ලබා ගත හැකි බව දැන ගන්නට ලැබුණු විට මිනිසුන් අතර ඊර්ෂ්‍යාව අඩු වී නොයෙක් දේ පිළිබඳ සුදුසුකම් වැඩි වෙයි. විශ්වයේ ඇති ආධ්‍යාත්මික ගුණ සංවිධානය ඇතැම් ආර්ථික සංවිධාන වලට වඩා වෙනස් ය. ආධ්‍යාත්මික ගුණවලින් පොහොසත් වීම සඳහා දුප්පත් බොහෝ දෙනකුන් කැප කිරීම අවශ්‍ය නො වේ. එසේ ම මිනිසුන් ආත්මාර්ථකාමී නොවී ශුද්ධ චින්තනයෙන් ප්‍රයෝජනයට ගන්නවා නම්, ලොව ඇති හැම සම්පත්තියක් ම හැම දෙනකුන්ට ම අත්පත් කර ගත හැකි ය.

තව ද, වෘත්තිය සංවර්ධනය පිළිබඳ සත්‍ය ඥානය, මිනිසුන් වෙන් කරන ඊර්ෂ්‍යා හැඟීම් අඩු කිරීම පමණක් නොව, අනුන් අගය කිරීමේ සමගි හැඟීම් වැඩි කිරීමට ද හේතු වේ. මේ ජන්මයේ දී අප ඕනෑවට වැඩියෙන් අන් දේවල් ගැන යෙදී සිටින නිසා අපට ප්‍රකාශයට පත් කර ගත නො හැකි වූ අපගේ

ආත්මයේ අංශ ම අන්‍යයන් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබීම සත්‍ය වශයෙන් ම අගය කළ යුත්තෙකි. නිදසුනක් ගනිමු. ස්වධර්ම හෙවත් ස්වකීය යුතුකම නිසා ගෘහ කාර්යයට සීමා වී ඇති ස්ත්‍රිය ඇගේ අභ්‍යන්තර ආත්මයෙන් නිළියක වන්නට ආශා කරනවා විය හැකි ය. සිනමාවෙක් බැලේ නෘත්‍යයක් දකින විට ද හොඳට රඟන නළුවන්ගේ පින්තූරයක් පුවත් පතෙක දකින විට ද, ඇතැම් විට ඕ, තමා පිසීමට හා දූවිලි පිස දැමීමට සීමා කරන දෛවයට තදින් ම විරුද්ධ වනවා ඇත. එහෙත් ඇ කාලයකට පසුව තමාටත් එසේ ම නටන්නට ලැබෙනවා යයි සිහියට ගනිතොත් ඇගේ ඊර්ෂ්‍යාවේ වේදනාව දියැ වී යනු ඇත. ඒ නළුවන් තමාගේ මහා ආත්මය වීම ගැන ඔවුන් කෙරෙහි ඇට ඇති විය යුත්තේ මහා කෘතඥතාවෙකි. "තත් ත්වමසි" ("ඒ ඔබ වෙති") යන්න නොයෙක් අතට යෙදිය හැකි ගැඹුරු හින්දු පාඨයෙකි. ඒ පාඨයෙහි ළඟ ම ඇති එක් අර්ථයෙක් නම්, අප විවිධ මිනිස් සමත්කම් දෙස බැලීමෙන් කරන්නේ අපගේ ම ආත්මයේ ඇති ශක්ති ප්‍රකාශනයන් දෙස බැලීම පමණි යනුයි.

ජීවිතයෙන් ජීවිතයට යන වෘත්තීය දක්ෂතා පිළිබඳ මූල ධර්මයෙන් මතු වන තුන්වන වැදගත් අදහස නම් ප්‍රාර්ථනා බිඳියෑමේ හැඟීම එක්තරා ප්‍රමාණයකට අනවශ්‍යය යනුයි. ආත්මය භෞතික ලෝකයට සීමා වී පවත්නා තාක් ප්‍රාර්ථනා බිඳී යෑම පිළිබඳ එක්තරා හැඟීමක් පවතිනු නියත ය. දිව්‍යත්වයෙන් කැබැල්ලක් ඩේසි මලෙක ආකෘතියෙහි නිවැසි ව පවත්නා තාක් එය ඩේලියා මලක් නො ව ඩේසි මලක් ම විය යුතුය. ලිලි මලක් රෝස මලෙක ශෝභා සම්පන්න වර්ණය දෙස ආශාවෙන් බලනු ඇත. රෝස මලක් ලිලි මලේ වරුණය පිළිබඳ ගී ගැයුම්වලට ආශා කරනු ඇත. තමාගේ වර්ගයෙහි පරිසමාප්තිය ලබා ඇති මේ එක එකකට සිදු වී ඇත්තේ තම වර්ගයේ සීමාව පිළිගැනීමට ය.

එහෙත් කවි කල්පනාවල දී හැර, මල් තමාට ලැබී ඇති තත්ත්වයෙන් අන්‍ය තත්ත්වයකට පත් වීමට ආශා කොට මැලැවෙන්නේ වත් මැරෙන්නේ වත් නැත. මනුෂ්‍යයන් ද එයින් මිය යන්නේ නැත. එහෙත් ඔව්හු එයින් දුක් විඳිති. ප්‍රාර්ථනා බිඳී යෑම තදින් දැනී ගිය විට ඔවුන්ගේ මානසික හැඟීම් ද මොළොක් නම් එයින් ඔව්හු මානසික වශයෙන් ද කායික වශයෙන් ද රෝගී වෙති.

අනෙක් අතට ඊර්ෂ්‍යාවෙහි මෙන් ප්‍රාර්ථනා බිඳී යෑමෙහිද ඊට අයත් වැදගත් මානසික කාර්යයෙක් ඇත. අවශ්‍යතාව නිර්මාණයේ මව නම්, අපට එතරම් ම අයිතියක් ඇති ව ප්‍රාර්ථනා බිඳී යෑම ද නිර්මාණයේ මව යයි කිව හැකි ය. ප්‍රාර්ථනා බිඳී යෑමෙන් ගීත ලියැවී තිබේ. ඖෂධ වර්ගත් මහාද්වීපත් සොයා ගෙන තිබේ. බුල්වෙර්-ලීටන්[1] තමාගේ මනඃකල්පිත රට විස්තර කළේ සාහිත්‍යයක් නැති දේශයක් ලෙසය. සාහිත්‍යයක් නැති වූයේ කවුරුන් වත් මොන ම වර්ගයෙක් වත් ප්‍රාර්ථනා බිඳී යෑමක් නො දැන සිටි නිසා අනුන්ගේ දුක් විඳීම හෝ තෘප්තියට පත්වීම හෝ පිළිබඳ ව ලියන්නට වත් කියවන්නට වත් ආශා නො කරන නිසා ය. මෙහි දී ඔහු සඳහන් කරන්නේ සැලැකිය යුතු වූ විය හැකි දෙයක් ගැන ය. ප්‍රාර්ථනා බිඳී යෑම ද හුමාලය කෙරෙහි යොදන ලද මිරිකීම මෙන් මනුෂ්‍ය ශක්තියට විවිධ ආකෘතිවලින් ගලා යන්නට සලස්සයි. මේ එකක් වත් නිදහසේ පැවතුණා නම්, ඒ විවිධ ආකෘති ගන්නේ නැත. කොටින් ම කියත හොත් මේ ලෝකයේ ඇති අන් හැම දෙයෙක මෙන් ප්‍රාර්ථනා බිඳී යෑමෙහි ද හොඳ නරක යන දෙපැත්තක් ඇත. මිනිසාට අලුත් ගුණ ඇති කර ගැනීමටත් නව කලා ආකෘති නිර්මාණය කිරීමටත් බල කරන විට ප්‍රාර්ථනා බිඳී යෑම හොඳය. මිනිසා තුළ ජීව ශක්තිය පල් වන තරමට අභ්‍යන්තරයේ සමබර බව නැති කරන විට එය නරක ය. ජීවිතයෙන් ජීවිතයට යන

1. Bulwer Lytton

වෘත්තීය දක්ෂතාව ප්‍රාර්ථනා බිඳී යෑමේ මේ අහිතකර පක්ෂය මර්දනය කර ගැනීමට වහල් වෙයි.

තද ශීතලෙන් යුත් එක් ජනවාරි උදෑසනෙක හිමෙන් වැසුණු චෙරි ගසෙක කඳට නගින්නට පටන් ගත් ගොළුබෙල්ලකු පිළිබඳ කථාන්තරයෙක් ඇත. උං ගසේ කඳ දිගේ හෙමින් උඩට යන විට ගසේ සිදුරෙකින් මතු වී උගේ හිසේ හැපුණු කුරුමිණියෙක් මෙසේ කීවේ ය. "ආ යාළුවේ, උඹ නිකම් කාලය කා දමනවා, චෙරි ගසේ එක ගෙඩියක්වත් නැහැ." "මා ඉහළට යන විට ගෙඩි තියෙන්නට පුළුවන්" යයි කී ගොළුබෙල්ලා දිගට ම තම ගමන ගියේ ය.

වෘත්තීය දක්ෂතාවේ නො සිඳී පැවැත්ම පිළිබඳව තදින් විශ්වාස කරන මිනිසාගේ ගුණය, ගොළුබෙල්ලාගේ තුබූ ඉවැසිලිමත් නිශ්ශබ්ද, දුර පෙනෙන විශ්වාසයට සමාන ය. යෝග්‍ය මානසික ආකල්පය පිළිබඳ තවත් ඉතා හොඳ නිදසුනෙක් ශ්‍රේෂ්ඨ වයලින් වාදකයකු වූ පගනිනිගේ[1] ජීවිත කථාවෙහි දක්නට ලැබේ. අවුරුදු දෙකක් තිස්සේ ඔහු ණයකාරයකුගේ හිර ගෙයෙක සිටියේ ය. කෙසේ හෝ එහි දී ඔහුට තත් තුනෙක පැරැණි වයලිනයක් අසු විය. කාලය ගෙවා ගැනීමට ඔහුට තිබුණු එක ම මාර්ගය ඒ කැඩුණු උපකරණය නිතර භාවිත කිරීම විය. අන්තිමේ දී හිර ගෙයින් එළියට ආ ඔහු නැවතත් මහජන වේදිකාවෙහි පෙනී සිටියේ ය. හේ පෙරට වඩා හොඳට ගායනා කෙළේ ය. ඊට පෙර හෝ පසුව දක්නට නො ලැබුණු කලා නෛපුණ්‍යයෙකින් හේ තම අසන්නන් මුසපත් කෙළේය. ඔහුගේ අශ්‍රැතපූර්ව සාමර්ථ්‍යය[2] එනම් දුෂ්කර වාදනයක් මැද දී වයලීනයේ තතක් කුඩා තත් තුනෙකින් අවසන් කිරීමේ හැකියාව ඇති වූයේ බලයෙන් ඔහු හිර කොට තුබූ කාලයේ දී ය.

1. Paganini
2. ගුත්තිල ගැන අසා නො තිබුණු සේ ය.

පගනිනි හිර කිරීම නිසා ඔහුට ඇති වූයේ නියම ප්‍රාර්ථනා බිඳී යෑමෙකි. එය කෙරෙහි ඔහුගේ ඇති වූ ප්‍රතික්‍රියාව නරක එකෙක් නො ව හොඳ එකෙක් විය. ජීවිතයේ ස්වාභාවික තත්ත්වවලටත් තමා විසින් ම කර ගන්නා වූ කර්මවලට පිළියම පිණිස ඇති වන විපාකවලටත් අනුව තව බොහෝ කාලයකට මිනිසාට ප්‍රාර්ථනා බිඳී යෑම්වලට මුහුණ දීමට සිදුවෙයි. එහෙත් එයින් අප හැකිළෙන්නටවත් මොට වන්නටවත් පොඩි වන්නටවත් උවමනා නැත. ප්‍රාර්ථනා බිඳී යෑමේ බන්ධනය තුළ දී ද අපට නැටීමට උගත හැකි ය. එහි හිර ගෙය තුළ දී ද අපට ගී ගායනා කළ හැකි ය. ප්‍රාර්ථනා බිඳී යෑමෙන් ගැළැවෙන්නට බැරි තැන දී අපට ඉවැසිලිමත් ව ප්‍රීතියෙන් ද යුක්තව එය හොඳින් පිළිගන්නට උගත හැකි ය. මෙසේ අපට තව ම කාලයේ ගර්භයෙහි නිදි ගෙන ඇති සභ්‍යත්වයෙහි දී අපේ ම අනාගත ජයග්‍රහණ සඳහා බිම සකස් කර ගත හැකි වෙයි.

# 22

# චරිත - ගති - වේග

**බොහෝ** දින් ලියන ලද කථා වස්තුවෙක් මෙන් ජීවිතය ද සිත් ගන්නේ එහි ඇති ගැටීම් නිසා ය. ප්‍රාථමික මනුෂ්‍යයා ගැටුණේ අන්‍ය මනුෂ්‍යයන් සමග හා ස්වභාවධර්මයේ ශක්තීන් සමග ය. මිනිසා දියුණු වන්නට දියුණු වන්නට ඔහුගේ ගැටීම් ඇතුළතින් හට ගන්නට විය. මේ අභ්‍යන්තර සටන ඒ ඒ කාලවල දී නොයෙක් ආකාරයෙන් හඳුන්වා දී ඇත. හොඳ නරක දෙකේද, ප්‍රකෘති පුරුෂ දෙකේ ද විචාරයේ හා මනෝභාවයේ ද උඩු සිතේ හා යටි සිතේ ද විරෝධය යයි කියන්නේ මේ ගැටීමට ය.

මේ හැම විස්තරයෙක ම සත්‍යයක් ඇති නමුත් මේ එකෙකින් වත් පුනර්ජන්මවාදයෙන් තරම් සම්පූර්ණයෙන් ගැටීම් විවරණය නොවෙයි. පුනර්ජන්මවාදයට අනුව ගැටීමේ මූලික හේතුව ආත්මයෙන් සිදු වන වැරැද්දෙකි. මේ වරද සිදු වන්නේ ආත්මය රූප කායය යයි තමා වරදවා ගැනීම නිසා ය. ජීවයේ පහත් තලයෙකැයි කිව හැකි රූප කායය ආත්මයේ පරිණතිය සඳහා අවශ්‍ය නමුදු එය ආත්මය නොවේ. මේ වරදවා හඳුනා ගැනීම නිසා ආත්මාර්ථකාමී වූ ද පෞද්ගලිකත්වයට බර වූ ද ක්‍රියා ඇති වේ. මෙයින් විපාක දෙන කර්ම සිදු වේ. විපාක

දෙන කර්මය මිනිසා සිරකරුවකු කරමින් ඔහුගේ දුශ්චරිතය වාස්තවික කරයි. මිනිසාගේ මානසික සංතාපයේ ප්‍රථම, මූලික ප්‍රභවය වන්නේ මේ හිර කිරීමයි. මුලින් ම ඇති වන ගැටීම නම් තමා විසින් ම ඇති කර ගන්නා ලද සිර කාමරයේ නො පෙනෙන දොර පොලුවලට විරුද්ධ ව කරනු ලබන සටනයි.

ගැටීම් ඇතිවීමේ වෙනත් හේතු ද ඇති බව කේසි කියැවීම් වලින් පැහැදිලි ව කියනු ලැබේ. කර්මයේ විපාක දායක පක්‍ෂයද අවිච්ඡේදක පක්‍ෂය දැයි පක්‍ෂ දෙකක් ඇත. අවිච්ඡේදක පක්‍ෂය නිසා එකිනෙකට නො ගැළපෙන බොහෝ ආශා අතීතයෙන් එක්වරට ම ගෙන එනු ලැබේ. මෙයින් මිනිසාගේ අභ්‍යන්තර ලෝකයෙහි තවත් ගැටීමෙක් ඇති වෙයි.

කේසි කියැවීම්වලට අනුව මේ ආශාව, අතීත ජන්ම අද්දැකීමක් නිසා ඇති වන ආවේගයෙකි. පුද්ගලයකුට එක් ජීවිතයෙකින් සංගීතාශාවක් පැමිණෙන හැකිය. තවත් ජීවිතයෙකින් අධ්‍යාපනාශාවක් ද එනු ඇත. මේ පරස්පර විරෝධී ආවේග දෙක, වෘත්ති තෝරා ගැනීමේ දී උඩු සිතෙහි ම ගැටීමක් ඇති කරයි. ඔහු සංගීතකාරයෙක් වෙනවා ද ? නැතහොත් ගුරුවරයෙක් වෙනවා ද? කරන්නේ කුමක් ද යන ආභ්‍යන්තරික සටනින් ඔහු අවුරුදු ගණනාවක් මැඩෙනු ඇත. අන්තිමේ දී මේ සටන ආවේග දෙක ම එක් කිරීමෙකින් හෝ අලුතින් සිතා ගත් ජීවිත ඉලක්කයකට නැති නම් ආර්ථික අවශ්‍යතාවකට, ගැළපෙන ලෙසින් දෙක ම අත් හැර අමුතු එකක් පිළිගැනීමෙන් හෝ විසඳා ගනු ලැබේ.

පරස්පර විරෝධී ආශා නිසා ඇති වන සටනට වඩා දුෂ්කර වූ සටනක් ඇති වන්නේ සම්පූර්ණයෙන් මධ්‍යස්ථ කර ගත නො හැකි වූ ආශාවක් නිසා ය. නිදසුනක් ගනිමු. පීඩිත පන්තියක් කෙරෙහි හිතුවක්කාර බලපෑමක් තුබුණු පූර්වජන්ම අද්දැකීමෙකින් මිනිසකුට පමණ ඉක්මවූ බල කාමයක් ඇති

වූවා යයි සිතමු. ඊට පසු ජන්මයෙක දී මුවුක්කුවෙක කොර දරුවකු වශයෙන් ඉපැදීම නිසා කර්ම විපාක වශයෙන් අභිමානය නතර වී, ඊට විරුද්ධ වූ සහනය හා අනුකම්පාව එක්තරා ප්‍රමාණයකට ඇති විය හැකි ය. මානය අවලංගු වීම සම්පූර්ණයෙන් කැරී නැත. මේ නිසා එක ම මූලික ගුණය සම්බන්ධයෙන් උඩු සිතෙහි මතු වන පරස්පර විරෝධි වූ ආශා දෙකෙක් ඇති වෙයි. මේ නිසා අපට එක ම පුද්ගලයා කෙරෙහි නො ගැළපීමෙක් දක්නට ලැබේ. මේ ගැන ම වරින් වර අභිමානයේ හා සහනයේ ආකල්ප ලෙසින් මතු වෙයි. ඇතැම් විට ඒ පුද්ගලයාට ම තමාගේ නො ගැළපීම ගැන දැන ගන්නට ලැබෙයි. මනුෂ්‍ය වර්ගයාගේ සහෝදරත්වය පිළිබඳ අදහස් ඔහු තුළ වැඩියෙන් ක්‍රියාත්මක වුවහොත් ඔහු පැරැණි මානයේ නැඟී සිටීම යටපත් කරන්නට යත්න දරනු ඇත. කෙසේ හෝ බොහෝ දෙනකුන් තමන්ගේ ම නොගැළැපීම් ගැන දන්නේ නැත.

ආශාවන් සම්පූර්ණයෙන් මධ්‍යස්ථ නො වීම පිළිබඳ මේ සාමාන්‍ය නියාමය ඇති කර ගන්නා ලද්දේ කේසිගේ ලිපි ගොනුවල ඇති නොයෙක් නිදසුන් සියුම් ව පරීක්‍ෂා කිරීමෙනි. කැබලි වශයෙන් ඇති බොහෝ සලකුණුවලින් මේ සාමාන්‍ය නියාමයට රුකුල් ලැබේ. තමන් ලබා ගත් ජීවිත කියැවීම්වල එළියෙන් දීර්ඝ කාලයක් තිස්සේ තමන් ම පරීක්‍ෂණයට පාත්‍ර කළ බොහෝ දෙනෙක් එය ස්ථිර කරති. පහත එන්නේ මේ පිළිබඳ ඉතා හොඳ නිදසුන විය හැකි ය.

මේ මිනිසා කෙරෙහි චරිත ලක්‍ෂණ විරෝධතා දෙකෙක් දක්නට ලැබිණි. වරෙක ඔහු තනි වීමට, ඇතුළට නැමීමට, නිශ්ශබ්ද වීමට, නීරස වීමට, අසාමාජික වීමට, ඉගෙනීමෙහි ඇලීමට හා පාරලෞකික වීමට නැමුණේ ය. අන්‍ය අවස්ථාවල දී ප්‍රසන්නත්වයට, බහිර්නතියට, විස්තාරිත්වයට, ප්‍රීතිමත් වීමට හා ඉන්ද්‍රිය ප්‍රීණනයට බර විය. මේ ඔහුගේ ප්‍රථම චරිත ලක්‍ෂණ විරෝධතාවයි. කියැවීමට අනුව මේ පුදුම නො ගැළපීම ඇති

වූයේ වෙනස් වූ අත්දැකීම් ප්‍රවාහ දෙකක් නිසා ය. ඔහුගේ අසාමාජික නැමීම් ඇති වූයේ ඉංග්‍රීසි තාපසාරාමයක තවුසකු වශයෙන් වූ ජන්මයෙකිනි. ඔහුගේ ප්‍රසන්නතාව ඇති වූයේ මධ්‍යකාලීන යුගයේ දී කුරුස යුද්ධකාරයකු වශයෙන් වූ පූර්ව ජන්මයෙකිනි. මෙබඳු පුදුම චිත්ත ගති දෙකක් තිබුණ නිසා මිනිස්සු ඔහු වර්ජනය කළහ. අද ඉතා පළල් ව හොඳින් කථා කර, මහට උපේක්ෂක ව හැකිළ ගන්නා මිත්‍රයකු කෙරෙහි ඔව්හු විශ්වාසය නො තැබූහ.

දෙවන චරිත ලක්ෂණ විරෝධත්වය සම්පූර්ණයෙන් මධ්‍යස්ථ නො කරන ලද ආශාවක් නිසා ඇති වූ බව හොඳට ම පැහැදිලි ය. එක් ජන්මයෙක දී හේ ඊජිප්තුවේ පාලකයකු වී සිටියේ ය. අන්‍යයනට අවඥා කරන තරම් ශ්‍රෙයාමානයක් ඇති වූයේ ඒ අද්දැකීමෙනි. එහෙත් දෙවන ජන්මයෙක දී හේ පලස්තීනයේ ලැබූ උපතේ දී යේසුස් නම් වඩුවාගේ බලපෑමට තදින් අසු විය. මේ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයාගේ චරිත ශක්තිය කොතරම් තදින් කාවදිනා සුලු වී ද යතහොත් එයින් සමාජ සේවයට ආශාවෙකුත් මනුෂ්‍යයාගේ සහෝදරත්වය පිළිබඳ යුක්ති යුක්ත විශ්වාසයෙකුත් ඔහුට ඇති විය.

වර්තමාන ජීවිතයේ දී මේ දෙවැනි ව කී ආශාව බලගතුය. ඔහු ඔහුගේ ජීවිත කාර්යය ලෙස තෝරා ගත්තේ ආගමික හා සමාජසේවා කටයුතුවල නායකත්වය දැරීමයි. මහජනතාවට ආලෝකය ගෙන දීමට හෙතෙම වෙහෙස නො බලා කටයුතු කරයි. හේ කාරුණික උපදේශකයෙකි. ඔහුගේ උපදෙස් අතිශයින්ම සඵල වේ. එහෙත් වරින් වර ඔහුගේ ඊජිප්තියානු අද්දැකීමේ මානය අවුත් ඔහු වෙළා ගනී. ඒ ආශාව පලස්තීනියානු අද්දැකීමෙන් හා අතරතුර වූ ජීවිත අත්දැකීම්වලින් සම්පූර්ණයෙන් යටපත් වී නැත. මේ ආශාව සැඟැවී පවත්නා බව දැන ගත් හේ තම පුරුෂාර්ථය සමග එය ගැටෙන බව තේරුම් ගෙන එය යටපත් කිරීමට යත්න දරයි. මේ උත්සාහයේ දී ඔහු වැඩියෙන්

ගැළැපෙන පුද්ගලයකු වනවා මිස නො ගැළැපෙන පුද්ගලයකු වන්නේ නැත. මෙසේ ඔහුගේ තව ම එළියට නො ආ ස්වභාවයේ පෙරමුණ අලුතින් සිතා ගන්නා ලද ආත්ම පාරිශුද්ධියේ හා සේවයේ පරමාදර්ශවලට ගැළැපෙන සේ ඉදිරියට යයි.

මුල් බැස ගත් කවර ගැටීමක් සම්බන්ධයෙන් වුව ද අනුගමනය කළ යුතු වූ යෝග්‍ය ප්‍රතිපදාවෙක් ඇත. නො ගැළැපීම පිළිබඳ ඉහත සඳහන් විදියේ දැනීම ද කවර පුරුෂාර්ථයක් වඩා හොඳ ද යන විනිශ්චය ද ඒ පුරුෂාර්ථයට විරුද්ධ ආශාව යටපත් කිරීමට ගන්නා උත්සාහය ද ඒ ප්‍රතිපදාවට ඇතුළත් ය. මෙබඳු නිදසුන් පරීක්ෂා කිරීමේ දී, "පළමු කොට ඔබේ ජීවිත කාර්යය නිශ්චය කර ගන්න" යන අවවාදය නිතර නිතර කියැවීම්වලින් මෙතරම් අවධාරණය කෙරෙන්නේ කවර හෙයින් දැයි හොඳින් පැහැදිලි වේ. බැලූ බැල්මට මේ අවවාදය බුද්ධි ගෝචර වන නමුත් බාල, දක්ෂ කෙල්ලන්ගේ නො ගැඹුරු හැඟීම් හා සම තැන සිටින සුලු අවවාදයක් ලෙස පෙනෙනු ඇත. එහෙත් බුද්ධිමත් ව සියුම් ව විග්‍රහ කරන විට මේ අවවාදය, ගැළැපීම පිළිබඳ ඕනෑ ම වැඩිහිටි ප්‍රශ්නයෙක දී ද අතිශයින් වැදගත් වන බව පෙනී යයි.

ඉලක්කය සකස් කර ගත් විට අපේ චාරිකාවට උතුරු කටුවක් ලැබුණා සේ ය. අපේ යටි සිතේ පවත්නා වූ ඕනෑ ම විරුද්ධ චින්තන සුළියක් ඉක්මවා ගෙන ගළපා ගැනීමට ඇති උපකරණයෙකි. සටන ඇත්තේ ආලෝකය හා අඳුර අතර යයි ද ප්‍රකෘතිය හා පුරුෂය අතර යයි ද හොඳ හා නරක අතර යයි ද සිතිය හැකි ය. වෙනත් අලුත් විදියෙකින් කියත හොත් ගැටීම ඇත්තේ ප්‍රබුද්ධ වූ උඩුසිත හා යටි සිතේ යට තැන්පත් ව ඇති තව ම එළියට නො ආ ශක්තීන් ද අතර ය. මේ ශක්ති වනාහි අතීතයෙහි අවිද්‍යාවෙන් යුතු ව සිතීමෙන් හා කිරීමෙන් රැස්කර ගන්නා ලද සංස්කාරය.

පුද්ගලයා විසින් අන්තර්ඥානයෙන් සිත් ගන්නා ලද ප්‍රාර්ථනීය ආදර්ශය, ඔහුගේ ජීවිත කාර්යයට අභිසංඥ ජීවිතාර්ථය යයි නම් කරමු. සසංඥව සකස් කර ගන්නා ලද ජීවිතාර්ථය හැම විට ම පරිණාමක සේවයක් සිදු කරයි. එහෙත් එය ඇතැම් විටෙක උත්පත්තියට පූර්වයෙන් ආත්මය විසින් තෝරා ගන්නා ලද අභිසංඥ ජීවිතාර්ථයට ළංවනවා මිස, එය ම නො වේ. අපි මේ සාමාන්‍ය නියාමය, ජෝර්ජ් එලියට් නිදසුනට ගෙන පැහැදිලි කරමු. ඕ පරස්පර විරෝධී ආවේගයන් පිළිබඳ හොඳ නිදසුනෙකි. සමනුවේදී නිරීක්ෂකයන් බොහෝ දෙනකුන් විසින්, මේ ශ්‍රේෂ්ඨ ඉංග්‍රීසි ලේඛිකාව කෙරෙහි, මුල් බැස ගත් පරස්පර විරෝධිතා කිපයක් ඇති බව දක තිබේ. පහත එන්නේ වෙනස් වූ ජීවිත කථා දෙකකින් ගන්නා ලද උද්ධෘතය.

"ජෝර්ජ් එලියට් අඩක් පියුරිටානු ය, අඩක් අන්‍ය ලබ්ධික ය. මේ දෙපැත්ත ඇ කෙරෙහි කිසි දිනෙක වත් හොඳින් මිශ්‍ර නො වූ නිසා ඕ නිතර ම දුකටත් දොම්නසටත්, ඛේදයටත් පාත්‍ර වූවා ය. ජෝර්ජ් මෙරිඩිත් වරක් ඇ ගැන මෙසේ කියා ඇත: "ජෝර්ජ් එලියට්ට තිබුණේ සප්ෆොගේ[1] හදවත ය. එහෙත් දිග නැහැයෙන් හා ඇපොකැලිප්තික අශ්වයාගේ බඳු වූ බොල්ලෑ දත්වලින් හා යුතු මුහුණ ඇගේ තිරිසන් ගතිය විදහා පෑවේ ය."*

"දුර්වල ලෙසින් පෙනෙන ස්ත්‍රියක වූ ජෝර්ජ් එලියට් ගින්නට පුටුව ළං කොට ගෙන හිඳින්නට පුරුදු ව සිටියා ය. ඇගේ විලාසිතාවල හා ආචාරවල ඇති සිත් ගන්නා වනිතා ලක්ෂණ, ඈ හඳුනා ගැනීමේ වරප්‍රසාදය ලත් හැම දෙනකු තුළම කා වැදී ගියේ ය. ඇගේ හාසයත් ස්මිතයත් පියකරු ය.

1. පැරණි ග්‍රීක කිවිඳියකි.

* Studies in the Mental Development of George Eliot, by Minory Toyoda, Tokyo, Kenyusha 1931.

ඇගේ හඬ සිහින් යඃ පැහැදිලි ය. ඕ ගතියෙන් අතිශයින් ම අනුකම්පක ය....."

ජෝර්ජ් එලියට් පිළිබඳ ඩී. ඇල්බර්ට්ගේ[1] සිතුවම හැරුණු විට බර්ටන්ගේ[2] හා ලොරන්ස්ගේ චිත්‍ර දෙකෙක් ඇත. ලෝරන්ස්ගේ[3] චිත්‍රය ඇඳ ඇත්තේ *"Adam Bede"* පළ කළාත් සමග ය. මේ ප්‍රතිරූපය විවේචනය කළ එක් විචක්ෂණ මනුෂ්‍ය ස්වභාව නිරීක්ෂකයෙක් එයින් ඇගේ පරීක්ෂක චක්ෂුසෙහි අපරිමිත වූ ගැඹුර හෝ ඇතැම් විට දක්නට ලැබෙන නීරස සූක්ෂ්ම අසංඥ ක්‍රෑරත්වයේ ප්‍රකාශනය හෝ නො දක්වෙතැයි කියා ඇත."*

මේ කියමන් පුනර්ජන්මවාදයට අනුව පිරික්සිය යුතු මතයක් බවට පත් කළ හැකි ය. ඇගේ අර්ධ පියුරිටානු හා අර්ධ අන්‍යලබ්ධික ආශාවලින් ඇගේ පූර්වජන්ම දෙකෙක් දැක්වෙයි. එයින් අන්‍ය ලබ්ධික ජන්මය පැරණි ඇතීනියානු දේශපාලකයකුගේ කලාකාමී කාමුක භාර්යාවක ලෙසින් වන්නට ඇත. අනෙක් ජන්මයේ දී ඈ ඇතැම් විට මධ්‍ය කාලීන තාපසාරාමයක තවුසකු ලෙසින් ගත කරන්නට ඇත. ජෝර්ජ් එලියට්ගේ මේ ආත්මභාවයේ දී අන්‍යලබ්ධික නැම්මට ඇගේ මුහුණ හා රූපය නිසා ප්‍රකාශනයට පත් වන්නට ඉඩ නො ලැබුණි. මීට අතිරේක ව තුබූ වික්ටෝරියානු යුගයේ පූජකයකුගේ දුවක වීමේ පරිසර ගත බලපෑම නිසා ද තාපස අද්දැකීමෙන් පැමිණි ගුණ ධර්මයට බර බව, ප්‍රධානත්වයට පත් වන්නට ඇත. මෙයින් කාමුක ආවේග ඈත් වූවා විය හැකි ය. ඇගේ ලක්ෂණවල දක්නට තුබූ ක්‍රෑර තිරිසන්කම ඇගේ අන්‍ය ලබ්ධික අද්දැකීමේ දි තම ලාවණ්‍යය නො මනාව යෙදීමේ කර්ම විපාකයක් විය හැකි ය.

1. D. Albert. 2. Burtin. 3. Lawrence.

* George Eliot, by Mathilde Blind W. H. Allen and Co. 1888.

ජෝර්ජ් එලියට්ගේ ජීවිතයෙහි ක්‍රියාත්මක ව තුබූ කරුණාව හා ශ්‍රේෂ්ඨත්වය ගැන දත් කිසිවකුට ඈ ක්‍රෑර යයි චෝදනා කළ නොහැකි ය. එහෙත් මිනිස් ස්වභාවය පිළිබඳ තියුණු නිරීක්ෂකයකු ගැන විශ්වාසය තබනවා නම් නීරස සූක්ෂ්ම අසංඥ ක්‍රෑරත්වයේ ප්‍රකාශනයක් ද වරින් වර ඈ කෙරෙහි දක්නට ලැබිණි. මෙහි යෙදී ඇති අසංඥ යන වචනය අර්ථවත්ය. එසේ කියන්නේ පුනර්ජන්ම වාදී ව්‍යාඛ්‍යානයට අනුව මේ අතිශයින් කාරුණික ශ්‍රේෂ්ඨ කාන්තාවගේ යටි සිතෙහි පූර්ව ජන්මයෙකින් පැමිණි නීරස සූක්ෂ්ම ක්‍රෑරත්ව නම්‍යතාවක් ඇති බව දක්වෙන හෙයිනි. මේ නැමීම, අනරතුර වූ අද්දැකීම්වලින් සම්පූර්ණයෙන් ම නැති නමුත් බොහෝ දුරට කරුණාව බවට හැරී තිබේ.

පුද්ගලයකු වශයෙන් ජෝර්ජ් එලියට්ගේ සසංඥ ජීවිත කාර්යය "පොත් ලිවීම" හෝ "මනුෂ්‍ය ප්‍රජාවට සේවය කිරීම" හෝ විය හැකි ය. එහෙත් උත්තර ආත්මයේ හෙවත් නිත්‍ය ඒකත්වයේ ජීවිත කාර්යය මේ එකක් වත් නො වන්නට පුළුවන. වික්ටෝරියානු පූජකවරයකුගේ නිහතමානී දුව වශයෙන් ඉපදීමේ දී ඒ උත්තරාත්මයේ තුබූ ඉලක්කය, එතෙක් පැවැති ක්‍රෑරත්වය සම්පූර්ණයෙන් කරුණාවට හරවා ගැනීම හෝ, තාපස බුද්ධිපරවශත්වය හා වඩා මානුෂික වූ සාරධර්ම සංඥාවක් සම බරට ගෙන ඒම හෝ විය හැකි ය.

මෙසේ අතිසංඥ ජීවිත පරමාර්ථය ජීවිතයෙක මූලික වූ ද පාලක වූ ද මූල ධර්මය වෙයි. සියලු බාහිර සිද්ධීන් පුද්ගලයාගේ පෙනෙන්නට ඇති ජීවිත පරමාර්ථත් තේරුම් ගත හැකි වන්නේ මෙයිනි. මේ මතය සම්පූර්ණයෙන් පිළිගත හොත් ජීවිත කථා ලිවීමේ කලාව ඉතා සියුම් ද ගැඹුරු ද වෙයි. එවිට ජීවිත කථා කාරයාගේ කාර්යය, පුද්ගලයාගේ ජීවිතයේ නිවැරදි ඉතිහාසයක් ඉදිරිපත් කිරීමටත්, ඔහුගේ පෙනෙන පුද්ගලත්වයේ ජීවමාන චිත්‍රයක් ඉදිරිපත් කිරීමටත් වඩා වැඩි දෙයක් කර ගත යුතු ය.

ඔහුගේ ප්‍රථම කාර්යය විය යුත්තේ, පුද්ගලයාගේ අතිසංඥ ජීවිත ඉලක්කය හා සසංඥ ජීවිත ඉලක්කය සොයා ගැනීමයි. ඔහුගේ දෙවන කාර්යය ආත්මය විසින් තෝරා ගන්නා ලද ඉලක්කය තෝරා ගැනීම නිසා ජීවිතය කරා ගලා ආ කර්ම ශක්තිය සොයා ගැනීමයි. විවිධ පූර්ව ජන්මයන්ගෙන් පැමිණි ආවේගයන්ගේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය හැදෑරීමෙන් වෙනත් ක්‍රමයෙකින් බලන විට අතාර්කික ලෙස පෙනෙන අංගයන් විවරණය කළ හැකි වෙයි. අභිඥා ශක්තියෙක වහලක් නැති නම්, ජීවිත කථාකාරයාට සිදු වන්නේ පාත්‍රයාගේ ජීවිත පිළිබඳ ව සොයා ගන්නට ඇති තොරතුරු පදනම් කර ගෙන අන්තර්ඥානයෙකින් මේ අංග සොයා ගැනීමට ය. ඔහුට අප විසින් ඉහත පරිකල්පන වශයෙන් දක්වන ලද්දක් බඳු වූ කර්ම නියාම පිළිබඳ ගැඹුරු අවබෝධයෙක් ද තිබිය යුතු ය.

ජීවිත කථාකාරයාත් ඔහුගේ කාර්යයත් පිළිබඳ ව ඉහත ඇති කර ගන්නා ලද නීති, මානසික වෛද්‍ය විද්‍යාඥයා පිළිබඳවත් මිනිසකු විග්‍රහ කිරීමෙහි හා ඔහුට මඟ පෙන්වීමෙහි යෙදෙන්නා වූ අන් කවරකු පිළිබඳවත් අදාළ වෙයි. කෙසේ හෝ පුනර්ජන්ම වාදීන් විසින් සිතනු ලබන අතිසංඥ ජීවිත ඉලක්කයත් සාමාන්‍යයෙන් මනෝවිග්‍රාහකයන් විසින් සිතනු ලබන, පුද්ගලයාගේ යටි සිතේ ඇති අසංඥ ජීවිත ඉලක්කයත් අතර වෙනසක් දැක්වීම අවශ්‍ය ය. මේ වෙනස පැහැදිලි කිරීමට පරිකල්පිත නිදසුනක් ගැනීම යෝග්‍ය ය.

කිසියම් ස්ත්‍රියක ස්නායු භංගත්වයක් නිසා මනෝ විග්‍රාහකයකුගේ උපදෙස් ගන්නට නිශ්චය කළා යයි සිතමු. විග්‍රහ කිරීමේ දී වෛද්‍යවරයාට මේ ස්ත්‍රිය මුළු ජීවිත කාලය තිස්සේ ම අන්‍යයන් තමා යටතට ගැනීමට ආශා කළ බව සොයා ගන්නට ලැබෙයි. මේ ස්ත්‍රිය හිතකාමී මෛත්‍රියේ වේශයෙන් තම සැමියා කෙරෙහිත් දරුවන් කීප දෙනා කෙරෙහිත් තම ආධිපත්‍යය ක්‍රියාවට නඟා ඇත. එහෙත් දූන්

ඇගේ සැමියා මළවුන් අතරය. දරුවෝ ඇට යටත් නො වෙති. ඔවුන්ගේ ස්වාධීනත්වය දැන් ඇට පෙනෙන්නේ නිරනුකම්පක අකෘතඥතාවක් ලෙස ය. දැන් ඇට දැනෙන්නේ තමා කාටත් එපා වූ තනි වූ නො සලකා හරින ලද තැනැත්තියක ලෙසය. තව දුරටත් ජීවත් විය යුතු හේතුවෙක් ඇයට නැත.

තමා අනාරක්ෂිතය යන හැඟීම නිසා අන්‍යයන් පාලනය කිරීමෙන් බලය ලබා ගත යුතු ය යන ආශාව ඇට ඉපද වූ කිසියම් ළදරු කල සිදුවීමක් විග්‍රාහකයා විසින් සොයා ගනු ලැබේ. මෙය ඇගේ මුළු ජීවිතයේ ම පැවැති අසංඥ ඉලක්කය බව හෙළි කරන මනෝවිග්‍රාහකයා අන්‍යයන් හා තම දරුවන් පාලනය කිරීමට ඇගේ ඇති උත්සාහය අතහැර, පරිත්‍යාගශීලී ක්‍රියාවලට කැප විය යුතු යයි ද තම කටයුතු නිශ්චය කර ගැනීමට ඈ අන්‍යයන්ගෙන් තමාට බලාපොරොත්තු වන නිදහස ඈ විසින් ඔවුනටත් දිය යුතු යයි ද නියම කරයි. ඇට පළමු වරට තම අසංඥ පරමාර්ථය එළිපිට දක්නට ලැබේ. වෛද්‍යවරයාගේ විග්‍රහය පිළිගත්තා වූ ඕ, ඔහුගේ නියම අනුගමනය කොට තමා ගිල ගන්නට තර්ජනය කළ ස්නායු පීඩාව යටපත් කර ගනී.

දැන් අපි මේ කරුණ ම පුනර්ජන්මවාදී මනෝවිද්‍යාවේ දෘෂ්ටියෙන් සලකා බලමු. මේ තේරුම් කිරීමේ ඇති ප්‍රධාන වෙනස නම් ළදරු කල ඇති වූ හේතුවලට වඩා ගැඹුරු හේතු මෙහි දී දක්නට ලැබීමයි. මේ ස්ත්‍රියට කිසියම් පූර්ව ජන්මයෙක දී අන්‍යයන් කෙරෙහි පෞද්ගලික බල පෑමක් කරන්නට තද ආශාවක් ඇති වන්නට ඇතැයි අපි අනුමාන කරමු. සමහර විට ඇට උසස් බල ඇති තත්ත්වයක් ලැබී තුබුණු නිසා ඈ දැනුත් පූර්ව ගතික වශයෙන් ඇගේ බලය නැවතත් පිහිටුවා ගන්නට උත්සාහ කරනවා විය හැකි ය. නැති නම්, පූර්ව ජන්මයෙක දී ලැබී තුබුණු හීන තත්ත්වයට තදින් විරුද්ධ වී අන්‍යයන් යටපත්

කිරීමෙන් තම බලය පිහිටුවා ගන්නට නිශ්චය කර ගත්තා විය හැකි ය. ඒ කොයි එක වුවත් ඈ පූර්ව ජන්මයෙන් අධිපති බව සඳහා ආශාවක් රැගෙන අවුත් ඇත. මෙය අසංඝ ආශාවෙකි. ඇතැම් විට මෙය අසංඝ ජීවිත ඉලක්කයක් වන්නට ද පුළුවන. එහෙත් මෙය පුනර්ජන්මවාදයේ දී ඉගැන්වෙන අතිසංඝ ජීවිතාර්ථය නො වේ.

මේ ස්ත්‍රිය උපදින්නට කලින් දුටු සියල්ලට උසස් වූ අතිසංඝ පුරුෂාර්ථය අන්‍ය පුද්ගලයන් තමාට අයත් වස්තු ලෙස හෝ තමාගේ ඉච්ඡාවට යටත් අය ලෙස හෝ නො සැලකීමය. නැති නම් ජීවත් වන්නට ඉඩ දෙමින් ජීවත් වීමේ පාඩම් ඉගෙනීම හෝ විය හැකි ය. ඇගේ දරුවන්ගේ කැරලි ගැසීමත් ඇගේ කුඩා ලෝකයේ තුබූ ආධිපත්‍යය පෙරළා දැමීමත් එයින් ඇති වූ ස්නායු භංගත්වයත් ආධිපත්‍යයට ඇගේ තුබූ ප්‍රබල ආශාව යටපත් කරන්නට ඇට උගන්වනු සඳහා ජීවිත සැලැස්මෙහි ඇති වූ සිද්ධීන් ය.

මෙසේ සියලු ජීවිත අද්දැකීම් උත්තරාත්මය විසින් හෙවත් නිත්‍ය ඒකත්වය විසින් උපතට පෙර දී තෝරා ගන්නා ලද ජීවිත සැලැස්මකට අනුකූල වෙතැයි කීමේ දී පුනර්ජන්මවාදී මනෝවිග්‍රහය සාමාන්‍ය මනෝවිග්‍රහයෙන් වෙනස් වෙයි. ජීවිත පරිසරයෙන් පුද්ගලයාට සලසා දී ඇති පාඩම්, කැරලි ගසන්නේ නැති ව ඉගෙන ගන්නට ඔහු සමර්ථ නම් ස්නායු භංගය අනවශ්‍ය ය. ස්නායු භංගය සිදු වන්නේ සම්පූර්ණයෙන් අසරණ වූ පුද්ගලයාගේ හිතුවක්කාරකම් නැති කර චරිතය උත්තරාත්මයේ ජීවිත සැලැස්ම සමග ගළපා ලන්නට ය.

මනෝවිග්‍රහයේ දී පිළිගනු ලබන්නා වූ අසංඝ ජීවිතාර්ථය සාමාන්‍යයෙන් ආත්මාර්ථකාමී භෞතික අර්ථයෙකි. එය අන්‍යයන්ගෙන් වෙන් වූ පුද්ගලයාගේ හෙවත් ප්‍රත්‍යාත්මයේ පරිකල්පිත ආරක්ෂාව සඳහා හෝ ආත්ම සංරක්ෂණය සඳහා

හෝ සිතා ගන්නා ලද්දෙකි. අනෙක් අතට අතිසංඥ ජීවිතාර්ථය ආත්ම ගුණ ලබා ගැනීම ගැනත් ආධ්‍යාත්මික වූ පාඩම් ඉගෙනීම ගැනත් වෙහෙසෙන නිසා අභෞතික ය; ආධ්‍යාත්මික ය. පුද්ගලයා තම ජන්මග්‍රහණයේ කාරණය වූ අභ්‍යන්තර පරමාර්ථය ගැන දනී නම්, එසේ ම සසංඥ ජීවිතාර්ථය ඒ අතිසංඥ ජීවිතාර්ථය ම වේ නම්, එවිට පුද්ගලයා ජීවිතයේ අධ්‍යාපන වූ අත්දැකීම්වලට දක්වන්නේ අඩු ආභ්‍යන්තරික විරෝධයෙකි. මේ නිසා අභිවෘද්ධිය ඉතා ඉක්මන් වෙයි.

යටි සිතේ යට නිදන්නා වූ ද ඇතැම් විට පරස්පර විරෝධී වූ ද ආවේග ඇත්තේ ය යනු පුනර්ජන්මවාදී මනෝවිද්‍යාවේ වැදගත් සිද්ධාන්තයෙකි. අප මේ ආවේග මුදා හරින්නට උගත යුතු ය. මේ මතයෙහි වැදගත් අදහස් කීපයක් ගැබ් වී ඇත. එසේ ම මෙයින් නවීන මනෝවිද්‍යාවේ අංශ කීපයක් කෙරෙහි එළියෙක් ද වැටෙයි. එයින් සිදු වන එක් සේවයෙක් නම් ද්විප්‍රකාර හා බහුප්‍රකාර පුද්ගලත්වයේ ගැටලුවට සත්‍ය විය හැකි විසඳුමක් යෝජනා කිරීමයි.

ස්ටීවන්සන්ගේ Dr. Jekyll and Mr. Hyde නම් වූ අද්භූත කථාවේ පැතිරීම නිසා සාමාන්‍ය මහජනයාට ද්විප්‍රකාර පුද්ගලත්වය ගැන දැන ගන්නට ලැබී ඇත. ද්විප්‍රකාර පුද්ගලයන් පමණක් නොව ත්‍රිප්‍රකාර හා බහුප්‍රකාර පුද්ගලයන්[1] පිළිබඳ නිදසුන් ද අවප්‍රමාණික[2] මනෝවිද්‍යා වාර්තාවල සුලබ ව ඇති බව නම් එතරම් ප්‍රසිද්ධ නැත. සිදුවන පුද්ගලත්ව මාරුවීම් ද බොහෝ විට ජෙකිල් හා හෛඩ් අතර වූ තරම මහත්

1. ද්විප්‍රකාර පුද්ගලයා නම් වරෙක එක් පුද්ගලයකු ලෙස ද තවත් වරෙක වෙනත් පුද්ගලයකු ලෙස ද හැසිරෙන එක ම පුද්ගලයාය. ත්‍රිප්‍රකාර පුද්ගලයා වරින් වර පුද්ගලයන් තිදෙනකු ලෙස ද බහුප්‍රකාර පුද්ගලයා ඊට වැඩි දෙනකුන් ලෙස ද හැසිරෙයි.

2. abnormal psychology අවප්‍රමාණික මනෝවිද්‍යාව නම් සාමාන්‍ය තත්ත්වයෙන් ඉවතට ගිය මානසික තත්ත්වයන් පරීක්ෂා කරන මනෝවිද්‍යාවයි.

වෙනසකින් යුක්ත බව ද අප්‍රකට ය. යුරෝපයේ හා ඇමෙරිකාවේ සිටින ප්‍රධාන පංතියේ මනෝ විද්‍යාඥයන් විසින් මේ ගැටලුවට සිත් යොමු කොට ඇත. එහෙත් මේ සිදුවීම් පිළිබඳ නිශ්චිත විවරණයක් මෙතෙක් ඉදිරිපත් වී නැත.

මේ අවප්‍රමාණිකත්ව වර්ගයේ නිදසුන් කේසි ලිපි ගොනුවල නැති නිසා කේසිගේ විවරණය කුමක් විය හැකි දැයි නිශ්චිත ව කිව නො හැකි ය. ඒ කෙසේ වෙතත් කේසිගෙන් ලැබී ඇති අන් තොරතුරුවල එළියෙන් බලන විට පුද්ගලත්ව මාරුව විවරණය කිරීමට ඉදිරිපත් කළ හැකි මාර්ග දෙකෙක් ඇත. වරින් වර ශරීර රහිත වූ භූතයන් ආවේශ වෙතැයි කීම එක් විවරණයෙකි. අනෙක නම් ඒ පුද්ගලයාගේ පූර්ව ජන්මයෙක ස්මරණය අස්වාභාවික ලෙසින් මතු වෙතැයි කීම ය. අප පළමු විවරණය අනුමාන කරන්නේ කේසි විසින් භූතාවේශ යයි නම් කරන ලද මානසික අවප්‍රමාණිකත්වය පිළිබඳ නිදසුන් කීපයක් ඔහුගේ ලිපි ගොනුවල ඇති නිසා ය. එහෙත් මේ නිදසුන්වල ආවේශය එක් භූතයකු විසින් ය. එය ද සම්පූර්ණ ව නො වේ. ඇතැම් අවස්ථාවල දී ආවේශය සම්පූර්ණයෙන් වීමටත්, භූතයන් කීපදෙනෙකුන් විසින් වීමටත් බැරි බව පෙන්වන සාක්කියෙක් නැත. දෙවන විවරණය එනම් නොයෙක් ජීවිතවලින් එන ස්මරණ මතු වීම එක් ජීවිතයෙකින් තවත් ජීවිතයකට අනුශයයන් පැමිණීමේ ව්‍යාප්තියක් ලෙසින් යෝජනා වන්නෙකි.

අතීත ජීවිත අනුශය පිළිබඳ මතයෙන් මතු වන දෙවන වැදගත් අදහස මනෝවිද්‍යාවෙහි දී "ගුණ විශේෂතාව"[1] යයි හැඳින්වෙන දෙයට සම්බන්ධය. මිනිස් ගතිගුණ සාමාන්‍ය වනවාට වැඩියෙන් විශේෂ වන බව මනෝවිද්‍යාඥයන් විසින් සොයා ගෙන ඇත. අවංක භාවය පරම සාමාන්‍ය ගුණයක් නො වන බවත් වෙන් වූ ගුණවල එකතුවක් බවත් සොයාගෙන

1. Specificity of traits

තිබීම නිදසුනකි. "අවංක භාවය" පිළිගත් සදාචාර සංකල්පයක් බව සහතික ය. එහෙත් එය මනුෂ්‍යයන් විසින් සත්‍ය චරිතයට නැගූ ඒකාකාර දෙයෙක් නො වේ. මුදල් පිළිබඳ අවංකකම, විභාග පිළිබඳ අවංකකම, ක්‍රීඩා පිළිබඳ අවංකකම, සාකච්ඡා පිළිබඳ අවංකකකම හා තවත් වෙන් වෙන් වූ අවංකකම් මිස කිසියම් මිනිසකු කෙරෙහි වූ පරම වූ එක් අවංකකමෙක් නැත.

අවංකතා ප්‍රතික්‍රියාවන්ගේ මේ වෙනස්වීම මනෝවිද්‍යාඥයන් විසින් විවරණය කරනු ලබන්නේ මෙසේ ය. පුද්ගලයකුට ඔහුගේ මාපියන් හා ගුරුවරුන් විසින් විශේෂ අවස්ථාවල දී ප්‍රතික්‍රියා කරන්නේ කෙසේ දැයි උගන්වනු ලැබේ. මේ අවස්ථාවල දී ඔහු ලබන තෘප්ති හා අතෘප්ති, අනාගතයේ එබඳු අවස්ථාවල දී ඔහුට ඇති වන ප්‍රතික්‍රියා නිශ්චය කරයි. මේ විචාරවත් විවරණයෙන්, අප තුළ පවත්නා වූ අපේ ගුණ පිළිබඳ නොගැළපීම තෝරා දෙනු ලැබේ.

මෙසේ වුවත් පුනර්ජන්මවාදයට අනුව, ගුණ විශේෂතාවේ එක ම හේතුව පුද්ගලයකු හැදෙන වැඩෙන වයසේ දී ඇති වූ තෘප්ති හා බලාපොරොත්තු සුන්වීම නො වේ. බොහෝ අතීත ජන්මවල දී ලැබූ අධ්‍යාපනය පරමාර්ථ කොට ගත්, අත්දැකීම් ද ඊට හේතු වේ. කෙනකු මුදල් පිළිබඳ අවංකකමේ පාඩම හොඳින් ඉගෙන ගෙන තිබෙන්නටත් මනුෂ්‍ය සම්බන්ධතා පිළිබඳ අවංකකමේ පාඩම තව ම ඉගෙන ගෙන නො තිබෙන්නටත් පුළුවන. වරක් තමාගේ මුදල් පිළිබඳ වංකකමක් අසු වී එය ප්‍රසිද්ධ වී එයින් තද ලජ්ජාවක් ඇති වූවා නම් මුදල් පිළිබඳ අවංකකම උගන්නට ඉඩ ලැබේ. එකකු මිනිස් ජීවිතය පිළිබඳ සැලකිලිමත් වීමේ පාඩම ඉගෙන තිබෙන්නටත් සත්ත්ව ජීවිතය පිළිබඳ ඒ පාඩම නො ඉගෙන තිබෙන්නටත් පුළුවන.

චරිතයේ මෙබඳු විෂමතා මුළු මනුෂ්‍ය වර්ගයාට ම පොදුය. මේවා පුනර්ජන්මවාද මනෝවිද්‍යාවේ එළියෙන් හොඳින් තේරුම්

ගත හැකි ය. නිදසුනක් ගනිමු. ඉතා අවංක, හොඳ අදහස් ඇති තරුණයකු ලෝක සාමය ගැනත් සර්ව සාධාරණ සමාජ යුක්තිය ගැනත් තදින් ම උනන්දු වනවා විය හැකි ය. කවුරුන් හෝ විවාදයෙක උග්‍ර අවස්ථාවේ දී ඔහුගේ ප්‍රකෘති ස්වභාවය ක්‍රෑර යයි කිව හොත් ඔහු කෝපයට පත්වනු ඇත. මේ චෝදනාව තදින් ම අවිශ්වාස කරන හේ චෝදකයා කෙරෙහි අතිශයින් අවඥා සහගත වෙයි. එහෙත් මාස කීපයකට පසු ව විශේෂ කරුණු කීපයක් එක්වීමෙන්, සත්‍ය වශයෙන් ම තම ස්වභාවයෙහි, තමන් කලින් නො දැන සිටි කුරිරුකමක් ඇති බවත් මේ කුරිරුකම අන්‍යයන් යටපත් කිරීමටත් ඔවුනට සුව පහසු සලසන හැම විශ්වාසයෙක් ම මර්දනය කිරීමටත් ගන්නා නිශ්චිත යත්නයෙක රූපයෙන් පෙනෙන්නට වන බවත් ඔහුට දැන ගන්නට ලැබෙයි. මේ ආත්ම ඥානයෙන් හේ බියට පත් වෙයි. සාමාන්‍යයෙන් මනුෂ්‍ය වර්ගයා කෙරෙහි වූ ඔහුගේ හිතකාමිත්වයත් සමග මේ විශේෂ මිනිසුන් කොටසක් කෙරෙහි වූ සියුම් විරෝධයත් එකට පැවතීම, ඔහුට තේරුම් ගත නො හැකි වෙයි. තම විවේචකයා විසින් කියා ඇති පරිදි තමා මූලික වශයෙන් ක්‍රෑර නො වේ ද, තමාගේ සියලු සදාචාර ව්‍යාපාර ආත්මය රවටන චෛතසික ක්‍රියා නො වේ ද කියා හේ සිතන්නට පටන් ගනී.

නිතර ම තමා ත්‍යාගශීලී යයි සිතා සිටි ධනවත් ස්ත්‍රියගේ නිදසුන ගෙන බලමු. හදිසියේ ඇගේ හෘදය සාක්ෂ්‍යය මවිතයට පත් කරවමින් තමා ත්‍යාගශීලී වන්නේ කෑම වස්ත්‍රාභරණ ආදී පුද්ගල පරිෂ්කාර පිළිබඳ ව මිස අන්‍යයන්ගේ චරිතයන් පිළිබඳ ව කරන විනිශ්චයවල දී නො වන බව ඇට පෙනී යයි.

මනෝවිද්‍යාත්මක පරිණතභාවයක් ඇති පුද්ගලයනට මෙබඳු සොයා ගැනීම් සුලබ ව කර ගන්නට ලැබෙයි. මේ සොයා ගැනීම් බෙහෙවින් පීඩාකාරී වේ. අපගේ ආත්ම විශ්වාසය

සොලවා ලන මේ සොයා ගැනීම්, අපේ අවංක කම සැකයට පාත්‍ර කොට උත්සාහය අප්‍රාණික කරන තරමට බලගතු වේ. තමා ගැන පිරික්සීමෙන් ඇති වන එබඳු චෝදනා අපගේ අභිවෘද්ධියට හේතු වන බව නිසැක ය. කෙසේ හෝ අපේ ස්වභාවයේ ඇත්තා වූ විෂමතා ඇති වී තිබෙන්නේ අපේ ආත්මයේ විවිධ වූ පෙර අද්දැකීම් නිසා ය යන ඥානයෙන් කනස්සලු ගතිය දුරු වී යයි. මේ ඥානය පිළිගන්නවා නම් මෙ අභ්‍යන්තර විෂමතා සම කිරීමේ ශක්තිය අපට ඇත්තේ ය යන ශාන්ත අවබෝධයෙන් යුක්ත ව අපට ඒවා ගැන මධ්‍යස්ථව සලකා බැලිය හැකි වේ. සත්තෙකින් ම ජීවිතයේ ඇති වේදනාකර අද්දැකීම්වල අර්ථය එබඳු සමතාවක් ඇති කිරීමයි. අන්තිම වශයෙන් සියලු ම ගුණ ධර්ම උගත යුතුව ඇත්තේ, ආත්මයේ හැම පරිසරගත ක්ෂේත්‍රයක් ම සම්බන්ධ කර ගෙන ය. එහෙත් අපට හැම දෙයක් ම එක්වර කළ නො හැකි ය. පාසැලක් සතියකට දින පහකුත් අවුරුද්දකට මාස නවයකුත් පැවැත්වෙන්නේ හේතුවක් නැතුව නොවේ. අප තුළ නිදහස් නො වී පවත්නා දේ නිදහස් කොට හැරීමට ජීවිත ගණනාවක් අවශ්‍ය වන්නේත් එපමණ ම හොඳ යුක්ති නැතිව නොවේ.

අප තුළ ඇති මේ නැමීම්වලට මනෝවිද්‍යාවේ භාෂාවෙන් *"traits"* (ගුණ) හෝ *"drives"* (ප්‍රේරණ) කියනවා ද නැති නම් කේසි කියැවීම්වල භාෂාවෙන් *"urges"* (පෙළඹීම්) කියනවා ද යනු එතරම් වැදගත් නොවේ. (urge යන වචනයෙන් එහි ඇති තල්ලු කරන ගතිය වඩා ප්‍රමාණවත් ව විස්තර වෙයි.) මේ අනුශයවල විෂමත්වයත් පරස්පර විරෝධයත් අසම්පූර්ණ මධ්‍යස්ථ භාවයත් හොඳින් තේරුම් ගත් විට ආත්මාවබෝධයත් පරාවබෝධයත් යන දෙක ම හොඳට ම සියුම් වෙයි.

අතීත ජීවිතානුශය පවතීය යන හැඟීමෙන් මතු වන තවත් අදහසෙක් ඇත. මෙය අහිංසකත්වය පිළිබඳ මායාව යයි නම්

කළ හැකි සංඥාවට සම්බන්ධ ය. ශත වර්ෂ බොහෝ ගණනාවක් මිනිසුන් අහිංසකත්වය හා මූලික පාපය[1] පිළිබඳ ගැටලුව ගැන වෙහෙසී ඇත. බොහෝ දාර්ශනිකයන්, බාලයන් සහජයෙන් ම හොඳ ද නැත හොත් නරක ද කියා ඔවුන්ගේ ස්වභාවය පිළිබඳ ව බොහෝ වෙහෙසී ඇත. ප්ලේටෝ, ළදරුවාගේ සිත අතීත ජන්ම තත්ත්වයන් පිළිබඳ ස්මරණයන්ගෙන් පිරී ඇතැයි සැලකුවේ ය. ලොක් සිතුවේ ළදරු සිත නිර්මල ඵලකයෙක්ය[2] කියා ය. මේ ඵලකය මත සංවේදනයන්[3] විසින් සංඥා[4] ඇති කරනු ලැබේ. පසුව මේ සංඥා සංකල්ප[5] බවට පත් වේ. දේව ධර්මවාදීහු සියලු ම දරුවන් ආදම්ගේ හා ඒවාගේ මූලික පාපයෙන් දූෂිත ව ඇතැයි සිතති. ඔවුන්ගේ මතයට අනුව මේ මූලික පාපය ඉවත් කළ හැක්කේ යෝග්‍ය ආගමික සංස්කාරයන්ගෙන් (සක්කරමේන්තුවලින්) පමණි.

පුනර්ජන්මවාදයට අනුව සියලු ම මිනිසුන් උපදින්නේ පාප දායාදයක් ද ඇතිව ය. එහෙත් මෙය ඔවුන්ගෙන් ම මිස ආදම්ගෙන් හා ඒවාගෙන් උපන්නේ නොවේ. පාපය ඇති වූයේ පූර්ව ආත්මභාවයන්ගේ චරිතයෙනි. එය බෞතීස්මයෙන් හෝ වෙනත් ආගමික චාරිත්‍රයෙකින් හෝ ඉවත් කළ නොහැකි ය. එබඳු චාරිත්‍ර වල සංකේතාත්මක අගයෙක් ද අර්ථයෙක් ද ඇත. එහෙත් එබඳු චාරිත්‍රවලින් අදහස් කෙරෙන ආධ්‍යාත්මික වූ සංස්කරණයෙන් තොරව ඒ චාරිත්‍ර පමණක් ඉටු කළාට එය කිසිසේත් ප්‍රමාණවත් නොවේ.

අප්‍රිකාවෙන් ගෙන එන ලද, අමානුෂික ලෙසින් සලකන ලද, නීග්‍රෝ ජාතිකයනට සේවය කිරීම සඳහා තම ජීවිතය කැප කළ දාහත්වැනි සියවසේ සිටි සාන්තුවරයකු බඳු වූ ස්පාඤ්ඤ ජාතික පීටර් ක්ලාවෙර්[6] නම් තවුසා වහලුනට ඔවුන්ගේ ම පව්

1. පළමුවෙන් සිදු කරන ලද පාපය. 2. ඇල්ලක් 3. Sensations
4. Impressions 5. Ideas (concepts) 6. Peter Claver

ගැන සිතන්නට අවවාද කළ ආකාරය ඕල්ඩස් හක්ස්ලි [1] විස්තර කරයි. එබඳු අවවාදයෙක්, කාරණයට අදාළ නොවේ යයි පෙනෙනු ඇත. එහෙත් හක්ස්ලි මෙසේ කියයි; "සමහර විට පීටර් ක්ලාවෙර් නිවැරැදි විය හැකිය....මිනිසකු වැටෙන හැම තත්ත්වයෙක දී ම නිවැරැදි කර ගත යුතු වූ චාරිත්‍ර පාපත් [2] හැකි නම් උදාසීන කර ගත යුතු වූ විපාක ඇති වාරිත්‍ර පාපත් [3] ඇත්තේ යයි අවධාරණය කිරීම නිවැරැදි ය. අතිශයින් තිරශ්චීනාකාරයෙකින් අපරාධ සිදු වී ඇති අයට පවා ඔවුන්ගේ ම අඩුපාඩුකම් මතක් කර දීම හොඳ යයි සිතීම නිවැරදිය."

හක්ස්ලි මෙහි දී සඳහන් කරන්නේ අතිශයින් වැදගත් කරුණක් ගැන ය. අහිංසකත්වයේ මායාව යයි අප නම් කෙළේ එයයි. අප අපරාධ කරනවාට වැඩියෙන් අපට අපරාධ කෙරී ඇතැයි ද අපට කරන නරකට වැඩියෙන් අපට නරක කෙරී ඇතැයි ද බොහෝ දෙනෙක් සලකති. අප සියලුදෙනා ම සිතා සිටින්නේ අප අහිංසක ය, හොඳ ය කියා ය. එක්තරා ප්‍රමාණයකට ඊට හේතු වන්නේ සත්ත්වයාගේ ස්වාභාවික වසද්වනිකත්වයයි. එහි ප්‍රධාන හේතුව අමතක වීමයි. අපේ නරක අතීතය අපෙන් වැයී ඇත්තේ ස්වභාව ධර්මයේ අරපරෙස්සමෙකිනි.

"මා නිතර ම මිනිසුනට හොඳින් ඉඳලත් ඔවුන් මට ක්‍රියා කරන හැටි බලන්න." යයි ස්ත්‍රියක පැමිණිලි කරනවා අපට අසන්නට ලැබේ. "මිනිසුන් හැම විට ම අකෘතඥ ය" යි ඕ කියයි. අපි මෙසේ පිළිතුරු දෙමු: "සත්තෙකින් ම ඔව්, ඔබ මේ ජීවිතයේ දී කාරුණික වී තිබෙනවා. එහෙත් ඔබ එසේ කාරුණික වූයේ ජීවිතයේ මුල් අවදියේ දී ඔබ අවලස්සන බව දැන ගෙන මිනිසුන්ගේ සැලකිල්ලට පාත්‍ර විය හැකි එක ම මාර්ගය කාරුණික ක්‍රියා යයි තේරුම් ගත් නිසයි. මෙය ඔබේ අලුත

1. Aldous Huxley
2. චාරිත්‍ර පාප නම් කළ යුතු දෙය නොකිරීමෙන් සිදුවන පාප යයි.
3. වාරිත්‍ර පාප නම් නො කළ යුතු දෙය කිරීමෙන් සිදුවන පාප යයි.

ඇති වූ ගුණ ධර්මයක් පමණක් බැව් තේරුම් ගත යුතු ය. ලස්සන අකාරුණික කාමුක ස්ත්‍රියක ලෙසින් වූ ඔබේ අතීත ජීවිතය දෙස බලන්න. ඔබ දැන් කරන ආකාරයෙන් මනුෂ්‍ය වර්ගයාගේ අකාරුණිකත්වය ඔප්පු වන්නේ නැත. එයින් ඔප්පු වන්නේ වරක් ඔබ අන්‍යයනට සැලකූ ආකාරය ය, ඊට සුදුසු තැනින් ම නැවත ඔබ කරා පෙරළා එන බව පමණයි. ඔබ මේ ජීවිතයේ දී මී අඹ සිටුවමින් සිටියා. දැනට නෙළා ගන්නේ තම අතීතයේ සිට වූ විසඹ ගෙඩියි. නියම කාලයේ දී දැන් සිටුවන මී අඹ නෙළා ගන්නට ලැබෙනවා ඇත. එතෙක් විසඹ ඵලදාවෙන් සතුටු ව ධෛර්යයෙන් මී අඹ සිටුවමින් කල් ගෙවන්න."

මනුෂ්‍ය ස්වභාවය පිළිබඳ ව පරීක්ෂාවෙන් බලන්නකුට එහි ඇති නොගැඹුරු තැනුත් පුද්ගලයා නොදැන සිටින්නා වූ බියකරු ගැඹුරු තැනුත් දැක ගත හැකි ය. ඇතැමුන් තුළ සැඟැවුණු ද්වේෂයකුත්, සමහරුන් තුළ කොල්ලකාරී ආධිපත්‍ය තෘෂ්ණාවකුත් අන්‍යයන් තුළ අප්‍රසන්න උදාසීනත්වයකුත් දක්ක හැකි ය. තම තාරුණ්‍යයෙන්, සෞන්දර්යයෙන්, ධනයෙන්, බුද්ධි සාමර්ථ්‍යයෙන්, ඉන්ද්‍රිය ප්‍රීණනයෙන්, ලෞකික කීර්තියෙන් නැතහොත් සම්මත ආචාරයේ පිට ඔපයෙන් මුළා වූ පුද්ගලයා තමා තුළ ඇති මේ නරක කම් ගැන නො දැන සිටී. එහෙත් තම ආධාරකය වූ ඒ බාහිර සුරක්ෂිතත්වය සැලී විනාශ වී ගිය විට ඒ පුද්ගලයාට තමා තුළ සැඟ වී තුබූ ගතිගුණ එළියට එන බවත් ඒවා එළියට ඊම සඳහා අවස්ථා මතු වන බවත් දැක ගන්නට ලැබේ.

වේදනාකර අද්දැකීමක් ඇති වූ විට මෙබඳු විපාකයකට සුදුසු වන්නට මා කිසි දෙයක් කර නැතැයි කියන්නට මිනිසා පෙළැඹෙයි. එහෙත් ඔහුගේ අහිංසකත්වය මායාවක් පමණි. ඔහුගේ තර්කය තම මාපියන් මැරීම පිළිබඳ නඩු විභාගයේ දී වරද පිළිගෙන තමා මාපියන් නැති අනාථයකු නිසා සමාව

ඉල්ලා සිටි ප්‍රංශ ජාතිකයාගේ තර්කයට වඩා බුද්ධිගෝචර නොවේ. මේ පුද්ගලයා වරද ගැන නොදන්නා නිසා ම අවංකව වරද නොපිළිගනී. එහෙත් මෙතෙමේ ද තමා අනාථයකු නිසා සමාව ඉල්ලයි. මොහුටත් මේ තත්වය උදා වූයේ මොහුගේ ම අපරාධ නිසා ය. මොහු කිසියම් අපරාධයකට නැතහොත් දුර්වලත්වයකට වරදකරු බව සහතික ය. නැති නම් මේ අභාග්‍යය මොහුට සිදු වන්නේ නැත. එසේ කියන්නේ මිනිසා තුළ සැඟවී ඇති කිසියම් වරදක් නැති නම්, ඔහුට වරදක් සිදු නොවන නිසා ය. වරදකරු කරා අභාග්‍යය පිම්මෙන් පැන ගෙන එයි.

ජීවිත විපත්ති මොනවා වුවත්, ඒ හැම එකෙක ම අධ්‍යාපනික පරමාර්ථය චරිතය වෙනස් කිරීමයි. යුද්ධය, වසංගත, ජලගැලුම් බඳු වූ පැහැදිලි බාහිර විපත්වලත්, ආතති[1] (මානසික ඇදුම් කෑම්) හා ගැටුම් බඳු වූ සියුම් අභ්‍යන්තර විපත්තිවලත් පරමාර්ථය එය ම ය. සසර සැරි සැරීම්වල දී ඇති වන මේ දුක් සැපවල ඇති අර්ථය ආත්මය පරිණත කිරීම බව මනෝවිද්‍යාව විසින් පිළිගත් විට සිදුවන්නේ මහා පියවරක් ඉදිරියට තැබීම ය.

මෙසේ ම ශ්‍රමණ බ්‍රාහ්මණාදී වූ ආගමික ගුරුවරුන් ද මනුෂ්‍ය චරිතයේ වෙනස්කම් ඇති කරන්නා වූ ආභ්‍යන්තරික වූද බාහිර වූ ද සාධකයන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාගත යුතු ය. ඒ අවබෝධය තිබේ නම් බලාපොරොත්තු සුන්කර ගත් මිනිසුන් තම. ජීවිත විපත්වල ඇති තේරුම අසන විට, ඒ ගුරුවරුනට විද්‍යානුකූල වූ පදනමෙක පිහිටා ඔවුන් සනසා ධෛර්යය දිය හැකි ය. වීජ ගණිතමය සමීකරණයෙක ඇති පැහැදිලිකම හා නිශ්චිතත්වයත්, ගිරි මුදුනෙක දී දක්නට ලැබෙන හිරු බැස්මෙක වූ විසිතුරු මහිමයත් ඇති විවරණයක් දෙමින් ඔවුනට එය කළ හැකියි.

1. Tensions

23

# කර්මයේ විවිධ අංග

පුනර්ජන්මය හා කර්මය පිළිබඳ පළමුවෙන් දැන ගත් විට මිනිසුන් විසින් සාමාන්‍යයෙන් අසනු ලබන ප්‍රශ්නයක් නම්, පාරම්පර්යය[1] ගැන කිව යුත්තේ කිමෙක් ද යනු ය. පාරම්පර්යය ගැන දැන ගන්නට ලැබී ඇති කරුණු කර්මය පිළිබඳව පිළිගෙන ඇති කරුණු සමග හැම විටෙක ම වාගේ ගැටෙනා බව බොහෝ දෙනා පිළිගෙන ඇත. වරක් කේසි මේ සම්බන්ධයෙන් අතිශයින් සිත් ගන්නා රූපකයක් භාවිත කෙළේ ය. "පාරම්පරිකව වැඩියෙන් මට ලැබී ඇත්තේ මගේ පවුලේ කොයි පැත්තෙන්ද"යි එක්තරා කෙනෙක් තමා පිළිබඳ කියැවීම අවසානයේ දී ඇසූහ. "ඔබට වැඩියෙන් ලැබී ඇත්තේ ඔබගේ පවුලෙන් නොව ඔබගෙන් ම ය. පවුල ඔබගේ ආත්මයට ගලා යෑමට ඇති නදියක් පමණි" යනු ලැබුණු පිළිතුරයි.

පාරම්පර්ය නියාමය කර්ම නියාමයට යටත්ව තම කාර්යය කරන බව නවත් උපමාවෙකින් පැහැදිලි කර දිය හැකි ය.

1. Heredity

අප්‍රිකානු වනයෙක උපන්නකු නිව්යෝර්ක් නගරයට ගෙනාවා යයි සිතමු. එහි දී ගේ පළමු වරට විශාල නාට්‍ය ශාලාවෙක දැන්වීම් පුවරුව වටේ ඇති කුඩා විදුලි බුබුළුවල සුදු එළිය එකක් අනෙක ලුහුබඳින්නාක් මෙන් දිගට යනවා දකී. එක් එක් එළිය බුබුළ ඊළඟ එළිය බුබුළට පනින්නාක් මෙන් දක්නට ලැබේ. එක් බුබුළෙකින් අනෙක් බුබුළට, ටෝච් එකෙකින් මෙන් එළිය යන්නා සේ ය. කොටින් කියතොත් එක් එක් එළියේ හේතුව ඊට පූර්වයෙන් වූ එළිය යයි සිතේ. එහෙත් මෙ නම්, ඒ සිද්ධියේ පෙනෙන හැටිය පමණි. නියම හේතුව ඇත්තේ, බලාපොරොත්තු වූ ප්‍රතිඵල අනුක්‍රමය ඇති වන සේ එක් එක් විදුලි බුබුළ පත්තු වන්නට හා නිමෙන්නට, කාල මානයකට අනුව යොදා ඇති උපක්‍රමයෙහි ය.

මේ උපමාව හරියට ම හරි නැත. කොයි ම උපමාවක්වත් හැම ආකාරයෙන් ම හරි යන්නේ නැත. එහෙත් මේ උපමාව සිද්ධියෙක නියම හේතුඵල සම්බන්ධතාව නොවන බව බැලූ බැල්මට පෙනෙන නමුත් හේතුඵල සම්බන්ධතාවක් දැක්වීමට ප්‍රමාණවත් ය. නාට්‍ය ශාලාවේ ආලෝක ප්‍රවාහය පවත්නා සේ ශාරීරික පාරම්පර්ය ප්‍රවාහය පවතී. එහෙත් වෙනත් ආකර්ෂණ නියාම ද ක්‍රියාත්මක වෙයි. ආත්මයේ අභ්‍යන්තර අවශ්‍යතාවලට ඉතා හොඳින් සරිලන සේ සුදුසු පවුලටත් සුදුසු ශාරීරික තත්වවලටත් ආත්මය නොවරදවා ම යන සේ ඒ නියාම ක්‍රියාත්මක වේ.

මෙසේ පාරම්පර්යයත්, ඒ හා බැඳී ඇති අන්‍ය කායික හේතුඵල සම්බන්ධතාත් සත්‍ය වශයෙන් ම කර්ම නියාමයේ ආකර්ෂණ බලයට යටත් ව පවතී. මේ මතයට අනුව සියලු මිනිස් ගතිගුණ පාරම්පර්යයටත් සියලු මිනිස් රෝග ආසන්න කායික හේතුවලටත් පවරා දෙන මිනිසුන් භෝජන සංග්‍රහයෙක දී තම මේසයට ගෙනෙන ආහාර සඳහා ඒවා ගෙනෙන

සේවකයනට ස්තුති කරන ආගන්තුකයාට සම කළ හැකි ය. සත්තෙකින් ම ඔහුට කෑම අල්ලන්නේ සේවකයෝ ය. එහෙත් ඔවුන් එසේ කරන්නේ තම ස්වාමියාගේ අණට අනුව ය.

කර්මය පිළිබඳ නගනු ලබන, ආචාර ධර්මයට අයත් වෙනත් ප්‍රශ්නයෙක් ඇත. 4 වැනි පරිච්ඡේදයේ දී විස්තර කරන ලද අන්ධ වයලින් වාදකයාගේ කර්ම හේතුව පර්සියාවේ වනචාරී ගෝත්‍රයෙක ඉපිද සිටිය දී රත් කළ යකඩ කූරුවලින් සතුරන්ගේ ඇස් අන්ධ කිරීම යයි කියා තිබේ. මෙහි දී ඇසිය හැකි ප්‍රශ්නය මෙයයි; මිනිසකු තම කුලයේ චාරිත්‍රයන් ඉටු කිරීම නිසා ආචාර ධර්ම වශයෙන් වගකිව යුතු වන්නේ කෙසේ ද? සාමාජික යුතුකමක් ඉටු කිරීම ගැන මිනිසකුට දඬුවම් ලැබෙන්නේ ඇයිද?

ඒ ඒ රටවල අලුගෝසුවෝ රජය විසින් යොදවා ගනු ලැබෙත්. මේ අලුගෝසුවෝ නීති පද්ධතියෙක ඇති මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කිරීම ගැන පෞද්ගලිකව වගකිව යුත්තෝ ද? ඔවුන් අනාගත ජීවිතයෙක දී ඒ ගැන කර්ම විපාක විඳිය යුතු ද ? උත්තරය "නැත" යනු නම්, ඔවුන්, තම යුද සතුරන් අන්ධ කළ පර්සියානු ගෝත්‍රිකයාගෙන් වෙනස් වන්නේ කෙසේ ද ?

මෙවා යුක්ති සහගත ප්‍රශ්නය. 11 පරිච්ඡේදයේ දී මීට අසම්පූර්ණ උත්තරයක් දෙන ලදී. කර්මය නිශ්චය කෙරෙන්නේ චේතනාවෙනැයි ද ව්‍යඤ්ජනයෙන් නොව අර්ථයෙනැයි ද එහි දී කියන ලදී.[1] තවද සාමාජික අපරාධය කියා දෙයෙක් ද ඇත. කිසියම් සමාජයක පාරම්පරික චාරිත්‍ර පාප සහගත නම් ඒ සමාජයේ සියලු ම සාමාජිකයන් ඒ වරදට හවුල්කාරයන් වන බව පෙනේ. මිනිසුන් වහලුන් වශයෙන් යෙදවීම හෝ මැරීම

1. "පාණිම්හි චෙ වණෝ නාස්ස - හරෙය්‍ය පාණිනා විසං
නාබ්බණං විසමන්වෙති - නත්ථි පාපං අකුබ්බතො"
"චේතනාහං භික්ඛවේ කම්මං වදාමි, චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා."

හෝ විකලාංග කිරීම පරම සදාචාරාර්ථයෙකින් වැරැදි නම් සනාතන ධර්මයට අනුව අනෙකකුගේ ස්වතන්ත්‍ර චේතනාවට එසේ බාධා කිරීම මහා පාපයෙකි. එබඳු සමාජයෙක සියලු සාමාජිකයෝ චාරිත්‍ර වශයෙන් හෝ වැරැදිකරුවෝ ය. සාමාජිකයන් ඒ චාරිත්‍රය පාපයක් බව දැන දැනත් වරද නැති කරන්නට උත්සාහ ගන්නේ නැති ව එය ඉවසනවා නම් අපරාධයේ බරපතලකම අනුක්‍රමයෙන් වැඩි වේ. සාමාජිකයෝ තමන්ගේ වැරැද්ද තහවුරු කර ගැනීමට උත්සාහ ගනිත් නම් එහි බරපතලකම තවත් වැඩි වේ.

ගෝත්‍රික සටනෙක දී යටත් වූ පමණෙකින් එසේ යටත් වූවන් අන්ධ කිරීම කෲර ක්‍රියාවක් බව සහතික ය. අන්ධ කිරීමේ කාර්යය සඳහා පත් කරන ලද මිනිසා ඒ වර්ගයේ කෲරකම්වලට විරුද්ධ නමුත් තම ස්වාමියාගේ සේවකයකු වශයෙන්, යුතුකම ඉටු කිරීම වශයෙන් පමණක් එය කළා නම්, කර්ම විපාකයක් ඇති නොවේ යයි සිතන්නට ඉඩ තිබේ.[1] ඉදින් ඔහු, තම අභ්‍යන්තර කැමැත්ත ද ඇති ව චාරිත්‍රයේ කෲරත්වයට සමාන කෲරත්වයක් තමා තුළත් ඇති කර ගනිමින්, එය කළා නම්, විපාක දෙන කර්මයක් සිදුකර ගනී.

මේ ප්‍රශ්නය ගැන භගවද් ගීතාවෙහි ඉතා හොඳින් කරුණු දක්වා තිබේ. භගවද් ගීතාව වනාහි කර්ම සංකල්පය කේන්ද්‍ර කර ගත් නව ආචාර ධර්මයක් තනා ගැනීමට උනන්දු වන ඕනෑ ම කෙනකුට බයක් නැතිව නියම කළ හැකි අති ශ්‍රේෂ්ඨ සූක්ෂ්ම ධර්මෝපදේශ ග්‍රන්ථයෙකි. (බටහිර පාඨකයනට සුදුසු

1. මේ නිගමනය බෞද්ධ මතයට තරමක් පටහැනි ය. බලකිරීමක් යටතේ වුව ද තමාට අවශ්‍ය වූවා නම් නො කළ හැකිව තුබූ වැරැදි වැඩක් කිරීම බෞද්ධ මතයට අනුව වැරැදි ය. එහෙත් අපරාධ චේතනාවක් නැතිව කීකරුකම නිසා අපරාධකරුට අපරාධයට ඉවහල් වන දෙයක් කර දුන්නාට පවක් සිදු නොවෙතැයි ධම්ම පදට්ඨ කථාවෙහි සඳහන් ය. (පාපවග්ග, කුක්කුට මිත්තවත්ථු) සෝවාන් වූ බිරිය තම සැමියාට කඩු දුනු ආදිය ගෙනවුත් දුන් බව මෙහි සඳහන් ය.

ඉතා හොඳ භගවද් ගීතා සංස්කරණය, ඕල්ඩස් හක්ස්ලිගේ සංඥාපනයෙන් යුක්ත, ස්වාමි ප්‍රභවා නන්දනගේ හා ක්‍රිස්ටෝෆර් ඉශර්වුඩ්ගේ පරිවර්තනය විය හැකි ය) භගවද් ගීතාවේ ප්‍රධාන පණිවුඩය මෙයයි. අනාගත කර්ම විපාක ඇති නොවීමේ රහස ඇත්තේ නිෂ්කාම කර්ම යෝගයෙහි ය. නිෂ්කාම කර්මයෝගය නම් පෞද්ගලික කල්පනාවලින් තොරව ප්‍රතිඵල ගැන බලාපොරොත්තුවක් නැතිව යුතුකම් වශයෙන් සලකා කර්ම කිරීම ය. මෛත්‍රිය පවා අපෞද්ගල, අසක්ත, අනුපදායී, විරාගී මෛත්‍රිය විය යුතු ය. නැතහොත් එයින් අනාගත කර්ම බන්ධන ඇති වෙයි.

යථෝක්ත අන්ධ මනුෂ්‍යයා පැරණි පර්සියාවේ දී අන්ධ කිරීමේ තම රාජකාරිය, සියලු ප්‍රාඥයන්ගේ ක්‍රියාවලට මුල් වන පරිත්‍යාගී චේතනාවෙන් යුක්ත ව, ක්‍රෑරත්වයට හා ආධිපත්‍යයට ඇති තෘෂ්ණාවෙන් ලැබෙන පෞද්ගලික තෘප්තියෙන් තොරව, සිදු කළා නම් එයින් කර්මයක් සිදු නොවන්නට ඉඩ තිබිණි.[1] ඔහු සත්‍ය වශයෙන් ම කර්ම විපාකය ලැබූ නිසා අපට තීරණය කළ හැක්කේ ඔහුගේ සමාජය ඔහුට කිරීමට නියම කළා වූ චාරිත්‍රයේ තිබුණු අපරාධයට සමාන අපරාධයක් ඔහු මානසික වශයෙන් ද කරගත් බවයි.

ඇතැම් දරු උපත්වල දී සිදු වූ තුවාලවලින් ඇති වූ විකෘති කොටසක් කර්ම විපාක වශයෙන් සිදු නො වූ බව කේසි කියැවීම් වලින් පැහැදිලි ව කියැවෙන බව 19 වන පරිච්ඡේදයෙහි දී සඳහන් කෙළෙමු. මෙය ඉතා සියුම්ව පරීක්ෂා කළ යුතු කරුණක් වන්නේ කර්ම සංකල්පය හොඳින් තේරුම් ගැනීමට එය අවශ්‍ය වන හෙයිනි. පුනර්ජන්මය විශ්වාස කරන සමහර අය, යමෙක් හේතුව අතීතයේ තිබිය හැක්කක් නිසා හැම හේතුවක් ම අතීතයේ තිබිය යුතු යයි සිතති. ඒ කියන්නේ වර්තමාන ජීවිතයේ ඇති

1. බෞද්ධ මතයට අනුව මෙබඳු වධයක් කළ නොහැකි ය.

හැම අභාග්‍යයක් හා රෝගයක් ම අතීත ජන්ම පාපයෙක බැහැර වීමෙකැයි ඔවුන් විශ්වාස කරන බව ය. මෙය වැරැදි විශ්වාසයෙකි. හේතුව දූර අතීතයෙහි මෙන් ම ආසන්න අතීතයෙහි ද තිබිය හැකි ය. තව ද භෞතික, භාවික,[1] මානසික හා ආචාර ධර්මමය ආදී වශයෙන් එකිනෙකට වෙනස් වූ හේතුඵල නියාම තිබේ.

සැලකිල්ලට ගත යුතු තවත් කරුණෙක් ඇත. එනම් යටත් පිරිසෙයින් කේසි කියැවීම්වලට අනුව ලෝක නිර්මාණයේ දී පවා අහඹු සිදුවීම් සිදුවිය හැකි බව ය. ඇතැම් විට උපතේ දී නැතහොත් පසු කලෙක ජීවිතයේ දී සිදුවන වණයක් හුදු අහඹු සිදුවීමෙක ඵලයක් විය හැකි ය. අහඹු සිදුවීමෙකැයි කියන්නේ ඒ පුද්ගලයා විසින් ම සිතා මතා ඇති කරන ලද හේතුවලට අවශ්‍ය සම්බන්ධයක් නැත්තේ ය යන අර්ථයෙනි.

නිදසුනක් වශයෙන් ගත හැකි දස හැවිරිදි දැරියකගේ සිද්ධියක් ඇත. ඇගේ එක් ඇසක් නො පෙනේ. උපතේ පටන්ම ඕ බිහිරිය. දැරිය පිළිබඳව ලබාගත් කායික කියැවීමේ මුල් වැකිවල මෙසේ සඳහන් වේ."

"ඔව්, අහෝ ! මොනතරම් ශෝචනීය තත්ත්වයෙක් ද ! මෙය කර්ම විපාකයෙක් නොවේ. අහඹු සිද්ධියෙකි. මේ ශරීරයේ මෙලොව අද්දැකීමේ මුල් කාලයේ දී පිරිසිදුකම ගැන හෙදියගේ තුබූ නොසැලැකිල්ල නිසා සිදු වූ දෙයෙකි.

භාවිත කළ විෂනාශක වර්ගය ඉන්ද්‍රියයනට නරක ලෙස බලපා ඉදිමීමෙක් ඇති වුණා. පසුව ඉන්ද්‍රියවල ක්‍රියාකාරීත්වය නැති වුණා."

දික් අඬුවක් භාවිත කිරීමෙන් ඇති වූ උපන් වණයෙකින් හට ගත් මානසික අස්වාභාවිකත්වයක් පිළිබඳ විවරණයෙක් පහත එයි.

1. Emotional - හැඟීම් පිළිබඳ

"ඔව්, ඔව්, අපට ශරීරය පේනවා. අපට පේන හැටියට මේ ශරීරයට හුඟාක් උදවු කරන්න තිබෙනවා. මෙය දොස්තරගේ අත් වැරැද්දක් මිස ආත්මයේ දෝෂයෙක් නොවේ. මේකට කාට හරි හුගක් ගෙවන්න සිදු වෙනවා. මේ තිබෙන හැටියට කාලයක් ඉවැසිල්ලෙන් සාත්තු කළ යුතු ව තිබෙනවා. වෙනස් පරිසරයෙක දී හැකි තරම් ඉක්මනින් එය කළ යුතුයි."

කිසියම් තුවාලයෙකින් හෝ රෝගයෙකින් හෝ පෙළෙන අය ඔවුන්ගේ රෝගය කර්ම විපාකයෙක් ද නැද්ද කියා නිතර අසා ඇත. කියැවීම්වලින් ගන්නා ලද නියම උද්ධෘත සහිත නිදසුන් කීපයක් මෙහි ඇත.

කිලිමාල රෝගිනියක් මෙසේ ඇසුවා යː "මෙය කර්ම විපාකයෙන් ද, නැතිනම් මේ ජීවිතයේ යමක් නිසා ඇති වූ දෙයක් ද?" උත්තර මෙයයිː "මෙය හුඟාක් කුළු බඩු දැමූ රස කළ කෑම අධික ව කෑමේ විපාකයෙක්."

සමාන ම ප්‍රශ්නයක් ඇසූ කනෙහි නිතර ඇසෙන ශබ්දයන්ගෙන් පෙළෙන අයකුට ලැබුණ පිළිතුර මෙසේ යː "මෙය තනිකර කායික රෝගයෙකි. කර්ම රෝගයෙක් නො වේ. හිසෙහි හා ගෙළෙහි ව්‍යායාමවලින් බර ගතිය දුරු කර ගන්න." (මෙහි සඳහන් කොට ඇත්තේ චලන තුනෙකින් යුතු සුළු ව්‍යායාමයක් ගැන ය. පෙනීම හා ඇසීම දියුණු කර ගැනීමට නිතර මේ ව්‍යායාමය නියම කොට තිබේ.)

වයස පසළොසේ දී සිදු වූ අනතුරෙකින් කකුලක් කැඩුණු පුද්ගලයෙක් මෙසේ ඇසුවේ ය. "මගේ කකුල කැඩීම කර්ම විපාකයෙක් ද ? එසේ නම් ඒ කර්මය කිමෙක් ද ?" ලැබුණු පිළිතුර මෙයයි. "මෙය ඔබගේ වඩා හොඳ හෙළි පෙහෙළිය සඳහා අවශ්‍ය වූ දෙයක්. මෙය යමෙක ගෙවීමක් වශයෙන් ඇති වූවක් නොව ඔබේ මුක්තිය සඳහා අවශ්‍ය වූ දෙයෙක්. ඔබට සත්‍යය උගන්වනු සඳහා සිදු වූ දෙයක් ය."

දකුණු අතෙහි තුවාලයක් සිදු වූ පුද්ගලයකු ඇසූ ප්‍රශ්නය මෙයයි. "මගේ දකුණු අතට සිදු වූ අනතුරට කිසියම් ආධ්‍යාත්මික හේතුවක් තිබෙනවා ද ? එසේ නැති නම් එය හුදු අහඹුවෙක් ද? උත්තරය මෙසේ ය: "එය හුදු අහඹුවෙක්. ආධ්‍යාත්මික හේතුවෙක් එහි නැත."

ක්‍රමයෙන් වැඩි වන පේශී දිරා යෑමෙන් පෙළෙන මිනිසකු ගැන ලබා ගත් කියවීමෙක් මෙසේ ය.

"බොහෝ දුරට මේ තත්ත්වය ඇති වී ඇත්තේ උපතට පෙර ය. එහෙත් එය මාපියන්ගේ පවෙකැයි හෝ මේ පුද්ගලයාගේ පවකැයි හෝ කිව නො හැකි ය. මේ අද්දැකීමෙන් මොහු විසින් උගත යුතු පාඩම ඉවැසීම හා ගැළැපීමයි.

ඒ නිසා මනස හැර අනෙක් දෙයක් භාවිතයට ගත නොහැකි ලෙසින් ශරීරය එක් තැනකට සීමා කරන මේ තත්ත්වය ගැන කලකිරෙන්න එපා. මනස ගොඩනැගිලිකරු බව මතක තබා ගන්න."

මෙබඳු සිදුවීම්වලින් ඇතැම් සිද්ධි අහඹු සිදුවීම් වන බව පැහැදිලි වෙයි. මේ සිදුවීම්වල කොතැනෙක දී වත් විපාක විඳින්නා විසින් ම හේතුඵල අනුක්‍රමය අරඹා නැති නිසා ඒ අර්ථයෙන් මේවා අහඹු සිදුවීම් ය. අහම්බෙන් විඳින්නට සිදු වන එබඳු දුක්වේදනා සාමාන්‍ය රීතිය වනවාට වැඩියෙන් නීතියෙන් බැහැර ගිය විශේෂ සිද්ධි වෙයි. ඒවායින් ආත්මයෙහි අභිවෘද්ධිය සඳහාත් නව ශක්තියක් ලබා ගැනීම සඳහාත් අවස්ථාවෙක් සැලසෙයි. සත්තෙකින් ම ඉහත සඳහන් කරන ලද සිද්ධි දෙක පිළිබඳ කියමින් යේසුතුමාගෙන් අන්ධ මිනිසා ගැන ඇසූ ශිෂ්‍යයනට එතුමා දුන් පිළිතුර සිහියට නඟයි. ජෝන්ගේ පොතෙහි 9 : 1 - 3 කොටසෙහි වාර්තා වී ඇති පදයවල අර්ථය මෙසේ යː

"මඟ යන යේසුතුමා ජාත්‍යාන්ධයකු දුටුවේ ය. එතුමාගේ ශිෂ්‍යයෝ, 'ස්වාමිනි' මේ මිනිසා අන්ධ වන්නට පව් කෙළේ ඔහු විසින් ම ද? නැතහොත් මාපියන් විසින් දැයි ප්‍රශ්න කළහ.

'මේ මිනිසා වත් ඔහුගේ මාපියන් වත් පව් කර නැත. ඔහු අන්ධ වූයේ දෙවියන් වහන්සේගේ කාර්යය ඔහු තුළින් ප්‍රකට වනු සඳහා ය. මේ යේසුතුමාගේ උත්තරයයි."

කරුණු කීපයක් නිසා ම මේ ඡේදය අතිශයින් ම සිත් අදනා සුලු ය. "මේ මිනිසා අන්ධ වන්නට පව් කළේ ඔහු විසින්ම ද? නැතහොත් ඔහුගේ මාපියන් විසින් ද ?" යන ප්‍රශ්නයෙන්ම එතුමාගේ ශිෂ්‍යයන් ආත්මයේ පෙර පැවැත්ම ගැන දැන සිටි බව දැක්වෙයි.

පුනර්ජන්මවාදයට විරුද්ධ වන්නන් විසින් ඇතැම් විට ඒ වාදයට විරුද්ධ ව ඉදිරිපත් කරනු ලබන මේ උත්තරය එක ම තේරුම් කිරීමකට ඉඩ දෙන්නෙක් නො වේ. එය ක්‍රම කීපයකටම තේරුම් කර දිය හැකි ය.

බයිබලය වනාහි මතක තබා ගන්නා ලද සිද්ධි මාලාවක් පිළිබඳ විස්තරයෙක පරිවර්තනයෙක පරිවර්තනයෙකි.* ලේඛකයන් එතරම් ගණනක් අතින් මාරුවීමේ දී බොහෝ විට අර්ථයේ විශාල වෙනස්කම් සිදු කෙරෙන්නට ඉඩ ඇත. මේ නිසා අද තිබෙන බයිබලය, ක්‍රිස්තුස් වහන්සේගේ සම්පූර්ණ නිවැරැදි මුල් ඉගැන්වීම් නියෝජනය කරනවා විය නො හැකිය. අනෙක් මොනවා නැතත් මිනිස් සාක්කිවල නිවැරැදිකම පිළිබඳව කරන ලද මනෝවිද්‍යාත්මක වූ හැදෑරීම්වලින් ම බයිබලය නියම ක්‍රිස්තු ධර්ම නියෝජනයක් නො වන බව අපට ඒත්තු යයි. මෙසේ මේ ඡේදය සිතා මතා කරන ලද නැතහොත් ඉබේ ට ම

* මේ කරුණ පිළිබඳ ඉතා හොඳ විමසීමක් අවශ්‍ය නම් 1945 මාර්තු The American Mercury හි මැක්ස් නොමැඩ් (Max Nomad) විසින් පළ කොට ඇති "The Way of the Translator" නම් ලිපිය බලන්න.

සිදු වූ වෙනස් කිරීම් නිසා මුල් අර්ථ වෙනස් වී ගිය ඡේද සිය ගණනින් එකක් වන්නට ද ඉඩ තිබේ.

කෙසේ හෝ අන්ධ මිනිසා පිළිබඳ ප්‍රශ්නයට ලැබී ඇති පිළිතුර යේසුතුමා කී දෙය පිළිබඳ නිවැරැදි පරිවර්තනයෙක් නම්, එතුමා කකුලක් කැඩීම හා වැඩී ගෙන යන පේශී දිරීම[1] පිළිබඳ නිදසුන්වල දී කේසි විසින් කියා ඇති දෙයට බොහෝ සෙයින් සමාන දෙයක් කියා ඇති බව සිතා ගත යුතු වේ.

පූර්ව පරිච්ඡේදයෙක දී අපි, තමා ම ක්රෑරත්වයේ පාප කර්මයට වරදකරුවකු නො වූ නමුත්, කර්ම විපාක වශයෙන් අස්වාභාවික දරුවකුගේ පියකු වූ මිනිසකු පිළිබඳ නිදසුනක් දුටුවෙමු. ඔහු වරදකරු වී ඇත්තේ උපේක්ෂක වීමේ චාරිත්‍ර පාපයකට ය. මෙහි දී අපි මේ චක්‍ර කර්ම විපාකය, ඔහු දුක ගැන හැඟීම් ඇත්තකු කිරීමටත්[2] දුඃඛ සත්‍යය ගැන වැඩියෙන් යෙදුණකු කිරීමටත්, ඔහු වෙත අනුක්‍රමයෙන් පැමිණිය හැකි, නිවැරැදි කිරීමේ අර්ථයෙන් යුතු, අද්දැකීම්වලින් පළමුවැන්න විය හැකි, බව කීවෙමු. මේ තේරුම් කිරීමට අනුව මේ මිනිසා තමා ම දුකට පාත්‍ර නොවී දුඃඛිත දරුවකුගේ පියකු වීමේ අද්දැකීමෙන්, අවශ්‍ය පාඩම ඉගෙන නො ගත්තා නම්, කිසියම් අනාගත ජීවිතයෙක දී ඔහුට ම දුක් විඳින්නට වනු ඇතැයි සිතිය හැකි ය. එසේ නම් මේ කායික පීඩාව ඔහු වෙත පැමිණෙන්නේ ඔහු විසින් කෙළින් ම අනෙකකුට කරන ලද පාපකර්මයක් නිසා නො ව ඔහුගේ පුද්ගලත්වයේ මැරී ඇති කොටසක් පණ ගැන්වීම, ඔහුට අවශ්‍ය වූ ඉගැන්වීමේ පරමාර්ථය ඇති අද්දැකීමක් වන හෙයිනි.

යේසුතුමාට හා එතුමාගේ ශිෂ්‍යයනට හමු වූ අන්ධ මිනිසාත් කකුලක් කැඩීමෙන් හා මාංශ පේශී මැරී යෑමෙන් පීඩා විඳි ඉහත සඳහන්[3] මිනිසුන් දෙදෙනාත් එසේ පීඩා වින්දේ එබඳු

1. 384 පිට 2. 384 පිට 3. 384 පිට

අර්ථයක් නිසා යයි සිතිය හැකි ය. කෙසේ වුවත් කිසියම් ජීවිත දුෂ්කරත්වයක්, කර්ම විපාක වශයෙන් ආවත් නැතත්. හැම විටම ආධ්‍යාත්මික සංවර්ධනයට අවස්ථාවක් වන බව මතක තබා ගත යුතු ය. කර්මය නියතියක් ලෙසින් ඒ කියන්නේ වෙනස් නොකළ හැකි අන්ධ ශක්තියක් ලෙසින් තෝරා දිය යුතු නො වේ. එය පාලක බොත්තමක තද කළ මැසිමෙක ස්වයංකාරී [1] නිශ්චිතත්වයෙකින් යුතු ව ක්‍රියා කරන්නේ නැත. කර්මය නිශ්චිත නියාමයක් බව සහතික ය. එහෙත් එහි පරමාර්ථය නම් මහා ලෝක ධර්මයට අනුකූල වනු සඳහා ආත්මයට අවස්ථාවක් සලසා දීම ය. මේ නිසා ආත්මය තම දෝෂ තේරුම් ගෙන ලෝක ධර්මයට අනුකූල වීමේ ක්‍රියා මාර්ගය තමා ම සම්පාදනව අරඹා නම් කර්ම විපාක විඳීමේ අර්ථය එයින් ම ඉටු වේ.

කර්මයේ පරමාර්ථය ආත්මය පෙළ ගැස්වීම ය. මෙහි පෙළ ගැස්වීම *(Justify)* යනු යොදා ඇත්තේ මුද්‍රණ ශිල්පීන්ගේ පෙළගැස්වීම යන අර්ථයෙනි. ඔවුහු අකුරු පේළි පෙළ ගස්වති. කර්මයේ නියම අර්ථය, අධ්‍යාපනය නැතහොත් පෙළ ගැස්වීම යනු අවබෝධ කර ගත තැනැත්තා කර්ම විපාක ද හිතුවක්කාර හෝ අනිවාර්ය නො වන බව දැන ගනී. මේ නිසා ඔහු ඒ කර්ම විපාකයේ ගැබ් ව ඇති ආධ්‍යාත්මික පාඩම් ඉගෙන ගැනීමට සම්‍යක් ව්‍යායාමයක් නො කොට නිෂ්ක්‍රියව කර්ම විපාක පිළිගන්නේ නැත.

මෙහි දී චලන නියාමවලින් බෙහෙවින් උපදෙස් ගත හැකි ය. වස්තුවක් චලනය කළ කල්හි, එය කිසියම් නිශ්චිත රේඛාවක් දිගේ ගමන් කරයි. ඒ වස්තුවේ මුල් චලනයේ පැත්තට වෙනස් වූ පැත්තකින් එය කෙරෙහි බලයක් පැවහොත් වස්තුව වෙනත් රේඛාවක් දිගේ ගමන් කරන්නට වෙයි. දැන් ගමන් කරන පැත්ත, වෙනස් වූ වේග දෙකේ ම ප්‍රතිඵලයෙකි. කිසි ම

1. Automatic

ශක්තියක් විනාශ වන්නේ නැත. කිසි ම නිගමනයක් ද බිඳෙන්නේ නැත. සිදුවන්නේ ශක්ති මාර්ගයක් යෙදීම නිසා වෙනත් ශක්ති මාර්ගයක් වෙනස් වීම පමණි. කර්මය පිළිබඳවත් මෙය මෙසේ ම ය. නව ශක්ති මාර්ගයක් ආරම්භ කිරීමෙන් පැත්ත වෙනස් කළ හැකි ය. එහි ශක්තිය අඩු කළ හැකිය. මේ නව ශක්ති මාර්ගය නම් සම්‍යක් සංකල්පය හා සම්‍යක් ව්‍යායාමයයි. මෙසේ කර්මය පිළිබඳ ව නිශ්ශබ්ද වීමේ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ම අනවශ්‍ය බව ද ආත්ම පරාජය ඇති කරවන්නක් බව ද හෙළි වෙයි.

තමා ගැන ම නම් මෙය මෙසේ බව කාට වුවත් ප්‍රකට වනු ඇත. එහෙත් මිනිසකු විසින් අන්‍යයන්ගේ කර්ම විපාක පිළිබඳ ව ගත යුතු ආකල්පය ගැන සලකන විට ආචාර ධර්මමය වූ අලුත් ගැටලුවෙක් පැන නගී. කර්ම නියාමය ක්‍රියාත්මක වන බව පිළිගැනීම නිසා අනිවාර්යයෙන් ම එක්තරා සාමාජික උභතෝකෝටිකයකට අපට මුහුණ පාන්නට සිදුවන බව 11 වන පරිච්ඡේදයේ දී පෙන්වා දී ඇත. පූර්ව ජන්මයේ දී බලය නො මනාව භාවිත කිරීම, නිදසුන් කීපයෙක දීම දුප්පත්කම් අඩු පාඩුකම් ඇති වීමට හේතු වූ බව පෙන්වා දෙන ලදි. අතිශයින් ශෝචනීය වූ පීඩාව පවා හට ගන්නේ කිසියම් අතීත පාප කර්මයක් නිසා යයි අප පිළිගන්නවා නම් පීඩිතයන් කෙරෙහි අප ගත යුතු ආකල්පය කිමෙක් ද ? අන්‍යයන්ගේ සාමාජික තත්ත්වය පිළිබඳ ව අප ඇති කර ගත යුතු ආකල්පය කිමෙක්ද?

"මිත්‍රය, ඔබ විඳින්නේ ඔබ විසින් විඳිය යුතු විපාකයෙකි. මට යුක්තියේ ක්‍රියාත්මක වීමට අත ගැසිය නොහැකි ය." මෙසේ තර්ක කොට අපේ ම වැඩ කරනවා ද ? හැම තැන ම කර්ම නියාමය ක්‍රියාත්මක වන නිසා අනුකම්පා කටයුතු දෙයක් නැති හෙයින් අනුකම්පාව කාලයට නොගැළපෙන මනෝභාවයක් බවත් දානය යල්පැන ගිය සදාචාරයක් බවත් කියා සිටිමු ද ?

මේ ප්‍රශ්නවලට සාහසික ලෙස හෝ භාවපරවශ ලෙස

හෝ පිළිතුරු දිය යුතු නොවේ. දුෂ්ට මිනීමරුවකු හය මාසයෙක හිර දඬුවමෙකින් පසුව පොරොන්දු පිට නිදහස් කළ යුතු යයි අදූරදර්ශී භාවපරවශයෙන් නිශ්චය කළ හොත් ඔහුට අවශ්‍ය පාඩමක් ඉගෙන ගන්නට නොලැබෙතැයි අපි සිතමු. අතිකාරුණික ගුරුවරයකු විසින් පාසැල දිනපතා පැය තුනකට කලින් වසා දමන්නට සිදු වුණොත් දිනකට අයත් පාසැල් වැඩ හමාර කර ගත නොහැකි බව අප දනිමු. පියකු විසින් දරුවාට දෙන යුක්ති සහගත දඬුවම් දයාබර මවක විසින් හැම විට ම ලිහිල් කරනු ලැබේ නම් දරුවාට කීකරු වීමේ පාඩම ඉගැන්විය නොහැකි බව අපි දනිමු. මෙපමණක් නොව විකෘත වීමේ හා අභාග්‍ය සම්පන්න වීමේ රූපයෙන් මිනිසකු කරා පැමිණෙන බාධක ද සත්‍ය වශයෙන් ම විශ්වයේ ඇති අධ්‍යාපනික අභිප්‍රායය නියෝජනය කරන බව ද අපි දනිමු. එසේ නම් විශ්ව නියාමයෙක ක්‍රියාත්මක වීමට අප ඇඟිලි ගසන්නට නිර්හීත වන්නේ කෙසේ ද?

කිව නොහැකි තරමේ දුප්පත්කමින් ජීවත් වන්නා වූ, භයානක රෝගයකට පාත්‍ර වූ, විකෘති වූ, අනුකම්පනීය වූ පුද්ගලයකු අපට දකින්නට ලැබුණා යයි සිතමු. ඔහු ගැන සිතන විට අපට ඉබේට ම මහත් අනුකම්පාවෙක් උපදී. එහෙත් අප කර්මවාදය පිළිගන්නවා නම්, වෙනත් ආලෝකයෙකින් ද ඒ මිනිසා දකින හැකි ය. අපි පරිකල්පනයේ මාර්ගයෙන් වර්තමානයේ තිරයෙන් ඔබ්බට පස්සට එබී බැලුවහොත් මේ වර්තමාන නළුවා වෙනස් කාලයෙක දී වෙනස් ඇඳුමෙකින් වෙනස් කොටසක් රඟපානු දැක්ක හැකි වෙයි.

කේසි ලිපි ගොනුවල ඇති නිදසුන්වලට අනුව බලන කල්හි ඇවිදීමට උත්සාහ ගන්නා විට අනුකම්පනීය ලෙස ඇඹරී යන අත් පා ඇති විකෘත වූ මේ වර්තමාන රෝගියා රුසියාවේ සාර් රජ දරුවන් දවස ශක්තිමත් ප්‍රාංශු දේහධාරී වීර්යවත්,

කෲර, කාමුක, දුෂ්ට රජ කුමරකු බව පෙනෙන්ට පුළුවන. අසීමිත ධනයකට හිමිකරුවකු වීමෙන් සුරක්ෂිතව, ඒ ධනය නිපැදවූ ගොවීන්ගේ අගහිඟකම් ගැන අකාරුණික ලෙසින් උපේක්ෂකව, තම ශරීර ශක්තිය නිසා මත් වී, තම අභිලාෂ තෘප්තිමත් කර ගැනීමෙහි දී ප්‍රතිපත්ති රහිතව, කාමුකයෙක් ව තම ප්‍රයෝජනයට ගනු ලබන ස්ත්‍රීනට සැලැකීමේ දී අමානුෂිකව, තම අප්‍රසාදයට ලක්වූවනට වධ දීමේ දී අනුකම්පා විරහිතව, කල් ගත කළ තැනැත්තෙකි මේ. අපට දක්නට ලැබෙන ඔහුගේ පූර්ව චරිතය මෙබඳු ය. ඔහුගේ වටාපිටාව ගැන බලන විට, ඔහුගේ කෲර පාලක ආශාවට අනුව සයිබීරියන් කාන්තාරයට යවන ලද වියැළී ගිය සිරුරුවලින් යුතු මිනිස්සු අපට හමු වෙති. තම වහල් ජීවිතයේ කුසගින්න ගැන කියාපාන දික් වූ මුහුණුවලින් හා ගිලුණු ඇස්වලින් යුත් දරුවෝ අපට දක්නට ලැබෙති. අපට පෙනෙන්නේ එබඳු දුෂ්ටත්වයේ සිතුවමෙකි. මේ සිතුවම අපගේ මේ වර්තමාන කෲර යුගයට පූර්ව වූ හැම කෲර යුගයෙක දීම ඕනෑ ම රටක දක්නට ලැබෙන්නෙකි. කවදා හෝ කොතැනෙක දී හෝ මේ මිනිසාගේ අපරාධවලට දඬුවම් ලැබෙතහොත් හොඳ යයි අපි ප්‍රාර්ථනා කරමු.

ඒ ප්‍රාර්ථනා ඇති කර ගත් වහා ම අපි නැවත වර්තමානයට හැරෙමු. අප කලක දී එතරම් අනුකම්පාවෙන් සැලකූ කොරා නැවත අපට දක්නට ලැබේ. තවමත් අපට ඔහු ගැන පූර්ණ අනුකම්පාවක් දැක්විය හැකි ද ? ඔහුට ගොදුරු වූවන්ගේ බිඳුණු සිරුරු සිහිපත් කරමින් ම තවදුරටත් "මම ඔබට උදවු කරන්නම්" යනු කිව හැකි ද?

මේ විශේෂ නිදර්ශනය පොදු සාමාන්‍ය නියාමයක් බවට පත් කළා යයි සිතමු. පුනර්ජන්මවාදය පිළිගතහොත් එය සාමාන්‍ය නියාමයක් බවට පත් කළ යුතුම ය. එවිට අපට මනෝවිද්‍යාත්මක වූ ද ආචාර ධර්මාත්මක වූ ද, සාමාජික වූ ද

ඉතා වැදගත් ප්‍රශ්නයක් මතු වෙයි. ජීවිතය ගෙන යෑමේ දී වහා ම අවංකව විසඳා ගත යුතු ප්‍රශ්නයෙකි මෙය. සමාජ විද්‍යාව හදාරා ඇති පාඨකයා අඩු ගණනේ එක ජාතියෙක එනම් ඉන්දියානු ජාතියේ සමාජ දර්ශනයේ දී මේ ප්‍රශ්නයට එක් පිළිතුරක් ලැබී ඇති බව සිහියට ගන්නවා ඇත. අප පුනර්ජන්මවාදය අලුතින් පිළිගත්තක් නිසා ගැටලුව අපට අලුතින් ප්‍රකටව ගියත් ශත වර්ෂ ගණනක් තිස්සේ ම භාරතය එය දැන සිටියේ ය.

භාරතයේ සාමාන්‍ය ජනයා යුක්තිය ඉටුවීමට අත නොගැසිය යුතු යයි මේ ප්‍රශ්නය නිශ්චය කර තිබේ. ඉන්දියානුවන් පීඩිතයනට දක්වන බව පෙනෙන උපේක්ෂාවටත් පශ්චමයන් වෙන් කොට සැලකීමටත් බොහෝ දුරට වගකිව යුත්තේ මෙයයි.

භාරතයේ වර්ණ භේදයට මනුගේ පැරණි නීති පදනම් වී ඇත. පැරණි නීති සම්පාදකයකු ද දාර්ශනිකයකු ද වූ මනු, ප්ලේටෝ මෙන් සමාජය අවශ්‍යයෙන් ම වෘත්තීය ශ්‍රේණි කීපයකට බෙදෙනැයි කියා ඇත. මේ ඉගැන්වීම සමාජ චාරිත්‍රයෙක් විය. චාරිත්‍රය සමාජ සංස්ථාවක් බවට ඇණ ගැසුණේ ය. සියයට අනුවක් පමණ නූගත් ජනකායක් අතර පැතිර පැවැති සම්ප්‍රදායය හා මිථ්‍යා ලබ්ධිය නිසා මේ ඇණ ගැසීම ආදානග්‍රාහී උග්‍ර ධර්මයක් බවට පත් විය.

අන්තිම පහත් පන්තියේ කාර්ය කරන අය "ස්පර්ශ නොකළ යුත්තෝ ය." හෙවත් පශ්චමයෝ ය. ඔවුන් එබඳු පහත් තත්ත්වයකට වැටුණේ පූර්වජන්මයේ තිබුණු අතිමානයේ හා දුරාචාරයේ විපාක විඳීමට යයි තර්ක කරන ලදී. මෙසේ ඇඟිලි ගැසීමෙකින් තොරව කර්මයට විපාක දීමට ඉඩ දීමේ තර්කය පහළ විය.

හින්දූන්ගේ ප්‍රථම තර්කාවයවය වන කර්මය

අනිවාර්යයෙන් ම අපට සුදුසු වර්ණයට අප පත් කරයි යනුත් දෙවන තර්කාවයවය වන (කතෝලික පල්ලිය විසින් ද අනුමත කරනු ලබන විශ්වය පිළිබඳ ගුඪ සත්‍යයක් පදනම් කර ගත්) සමාජයේ ශ්‍රේණි ක්‍රමයක් ඇත්තේ ය යනුත් පිළිගත හොත් ඔවුන්ගේ නිගමනය තර්කානුකූල බව අපට පෙනේ.

කොතරම් තර්කානුකූල වුවත් මේ නිගමනය අතිශයින් ම ශෝචනීය ය. මේ මතයට අනුව හැම මිනිසෙක් ම ලයිබ්නිට්ස්ගේ තන්මාත්‍ර[1] මෙන් ජනෙල් නැති කාමර බඳු වූ තනි වූ ඒකක බවට පත් වේ. මේ එක් එක් ඒකකයෙක් අනෙක් ඒකකයන්ගේ අභිවෘද්ධිය ගැන සම්පූර්ණයෙන්ම උපේක්ෂකව තනිව සැහීමට පත්ව අවකාශයෙහි තම කක්ෂයෙහි තමාගේ අදහස් ම අනුගමනය කරයි.

මේ උභතෝකෝටිකය ගැන සලකන විට කෙනකුට ඉබේට ම වාගේ වෝල්ට් විට්මාන්ගේ[2] "I Sit and Look Out Upon All the Sufferings of the World" (මම ඉඳ ගෙන ලෝකයේ ඇති හැම දුකක් ම බලා සිටිමි.) යන මාතෘකාව ඇති අර්ථ පූර්ණ සංක්ෂිප්ත කාව්‍යය සිහියට නැගෙනු ඇත.

"මම ඉඳගෙන, අවට ලෝකයේ ඇති සියලු දුක් පීඩා
හා ලජ්ජා නරඹමි.

මම, කරන ලද කර්මවලට පසුතැවෙන, තනිව
වේදනාවෙන් සිටින, තරුණයන්ගේ, වෙව්ලන
රහස් ඉකිබිඳීම් අසා සිටිමි.

මම, දරුවන් විසින් නොසලකා හරින ලද,
බලාපොරොත්තු සුන් කර ගත්, කෘශ වී පණ
අදිමින් දුකසේ ජීවත් වන මව දෙස බලා සිටිමි.

1. Liebnitz's monads
2. Walt Whitman

මම, සැමියා විසින් නොමනා ප්‍රයෝජන ගන්නා ලද
බිරියන් තරුණියන් නොමනා ලෙස පොළඹවා
ගත් මිනිසාත් දකිමි.

මම, ඊර්ෂ්‍යාවේ පැසැවීම් ද සඟවන්නට උත්සාහ ගෙන
ඇති, ප්‍රතිපදාන නොකළ ආලය ද යන මේ
සියලු දර්ශන මේ මිහිපිට දකිමි.

මම, යුද්ධයේ ප්‍රතිඵල වන වසංගතය හා කෲර පාලනයත්
දකිමි. ජීවිත පරිත්‍යාග කරන්නන් හා සිරකරුවන්
ද දකිමි.

මම, මුහුදේ සාගතයත් අන්‍යයන්ගේ ජීවිත බේරා ගැනීම
සඳහා මැරිය යුත්තේ කවරෙක් දැයි තීරණය
කිරීමට කුසපත් අදිනා නාවිකයන් ද බලමි.

මම, කුලීකරුවන්, දුප්පතුන්, නීග්‍රෝ ජාතිකයන් හා
උඩඟු පුද්ගලයන් විසින් එබන්දන් කෙරෙහි
කරනු ලබන මදිකම් හා හෙළා දැකීම් ද දකිමි.

මේ සියල්ලත් සීමාවක් නැති පහත්කම් හා වේදනාත්
මම ඉඳ ගෙන බලා සිටිමි.

මම අසමි, දකිමි, නිශ්ශබ්ද වෙමි."

විට්මාන් පුනර්ජන්මවාදය අදහන්නෙකි. ඔහුගේ ජීවිත කථාවෙන් ද ඔහුගේ කාව්‍යවල ඇති නො වරදිනසුලු අභ්‍යන්තර සාක්ෂ්‍යවලින් ද අපි ඒ බව දනිමු. ලෝකයේ සීමාවක් නැති දුක් වේදනා දෙස නිශ්ශබ්දව බලා සිටින ඔහුගේ ශාන්ත විරාගයෙන් දක්නට ලැබෙන්නේ හේතුවෙහි ඵලයත්, ඵලයෙහි හේතුවත් දකින පුද්ගලයාගේ නියම ප්‍රඥාව ය. මේ දර්ශනයේ ස්වාභාවික ඵලය නම් නිෂ්ක්‍රියත්වයයි. මේ නිෂ්ක්‍රියත්වය ඇති වන්නේ උදාසීනකම නිසා හෝ අලසකම නිසා හෝ නොව හේතුඵල දාමයෙහි ඇති අවශ්‍යතාව දැකීමට ඇති පුළුවන්කම නිසා ය.

විට්මාන්ගේ මේ කාව්‍යය මිනිසාට අවශ්‍ය වූ දුක ඉදිරියෙහි දී නිශ්ශබ්දව නිෂ්ක්‍රීය වීම පිළිබඳ ප්‍රඥාවේ ප්‍රකාශන පත්‍රයෙකි.

එහෙත් විට්මාන් අවුරුදු ගණනාවක් ම සිවිල් යුද්ධයේ රණ බිමෙහි සාත්තු සේවකයකු වශයෙන් සේවය කෙළේ ය. ඔහුගේ පුදුම හුදෙකලා ජීවිතය සම්පූර්ණයෙන් ම ගෙවුණේ ආත්ම පරිත්‍යාගයෙන් ය. මේ නිසා මේ කාව්‍යයෙන් ප්‍රකාශ වන්නේ ලෝකය පිළිබඳ ඔහුගේ මුළු දර්ශනය ම නොව ඉන් කොටසෙකි. එය සිතේ එක් අවස්ථාවෙකි. ගිරි මුදුන් දර්ශනයෙකි. ඇතැම් විට එය ඔහුගේ දෛනික ජීවිතයේ ඉතා ප්‍රාණවත් වූ ගීත ස්වරයට විරුද්ධව හඬ නැංවෙන මූලික ස්වරයක් විය හැකි ය. එසේ කියන්නේ ඔහුගේ ජීවිතය, දුක් විඳින ජනතාව කෙරෙහි උපේක්ෂක නොවූ හෙයිනි. මෙයට ප්‍රධාන හේතුව ඔහු තුළ තුබූ මහා කරුණාව ය.

සත්‍ය වශයෙන් ම බුද්ධියට බෙහෙවින් යුක්ති යුක්ත යයි පෙනෙන උපේක්ෂක වීමේ තර්කය ඛණ්ඩනය කරන්නේ කරුණාව ය. නිශ්චිත වශයෙන් ම ක්‍රිස්තුස් වහන්සේගේ මූලික අදහස ද මෙයයි. සුවපත් කිරීමට හා ඉගැන්වීමට කැප වූ උන්වහන්සේගේ චරිතයෙන් මිනිසාගේ පාපය කුමක් වුවත් උපකාර කිරීම සඳහා ඔහු දෙසට අත දිගු කළ යුතු ය යන උන්වහන්සේගේ විශ්වාසය පැහැදිලි වෙයි. එඩ්ගා කේසිගේ අතිසංඥ චිත්තය ක්‍රිස්තුස් වහන්සේ හා සම තත්වයෙක නොතැබිය හැකි බව සහතික ය. එහෙත් සිතින් දුක් විඳි, සිරුරින් බිඳී ගිය මිනිසුනට හතළිස් අවුරුද්දක් තිස්සේ කරන ලද මහඟු සේවයෙන් හෙළි වන්නේ එබඳු මහා කරුණාවෙකි.

මෙහි දී අපට කේසි කියැවීම්වල ඇති එක් සිත් ගන්නා පූර්ණතාවක් දැක්ක හැකි ය. එක් අතෙකින් එය ජීවිතයේ විද්‍යානුකූල ප්‍රතිෂ්ඨාව පෙරදිග මිනිසුන් විසින් පිළිගෙන ඇති කර්ම නියාමය බව පැහැදිලි වචනවලින් කියයි. අනෙක් අතට

එය ක්‍රිස්තුතුමාගේ ප්‍රධාන ඉගැන්වීම් වන මෛත්‍රියේ හා සේවයේ ආධ්‍යාත්මික වටිනාකම උසස් කොට දක්වයි.

අන්‍යයන් විසින් අතීත ජන්මයන්හි කරන ලද පාප කර්මයන් ගැන නොසලකා අප ඔවුනට උපකාර කිරීමට උත්සාහ කළ යුතු ය. අප එය කළ යුත්තේ කර්ම නියාමයේ ඉතා කුඩා අවශ්‍යතාව පවා බිඳීමට ඒ නියාමයේ අදෘෂ්ට ශක්තිය අපට ඉඩ නොදෙන බවත් අන්‍යයන්ගේ දුක්වලට උපේක්ෂක වීම අප විසින් සිදුකර ගන්නා වූ විපාක දෙන පාපයක් බවත් දැන ගෙන ය.

එක්තරා අර්ථයෙකින් බාහිර ලෝකයත් අනෙක් මිනිසුනුත් අප විසින් උගත යුතු වූ ආධ්‍යාත්මික පාඩම් ඉගැන්වීමට වහල් වන පරීක්ෂණ ක්ෂේත්‍ර ය. එසේ ම අපි ද අන්‍යයනට ගුණ ධර්ම ඉගෙනීමට ඇති පරීක්ෂණ ක්ෂේත්‍ර වෙමු. මුලින් කී කරුණ සිහියට ගැනීමෙන් අප මනුෂ්‍ය වර්ගයාට ඕනෑවට වැඩියෙන් උපකාර කළාය යන මහා මුළාව වැළැකී යයි. දෙවන කරුණ සිහියට ගැනීමෙන් අප තුළ ම නිහතමානිත්වයෙක් ද ආත්ම ගෞරවයෙක් ද ඇති වේ. අනුන්ගේ දොස් අපට වේදනා ගෙන දෙන්නා සේ ම අපේ දොස් ද ඔවුනට වේදනා ගෙන දෙයි. එහෙත් අප ඔවුන්ගේ දොස්වලින් ඉගෙන ගන්නා සේ ම ඔව්හු ද අපේ දොස්වලින් ඉගෙන ගනිති.

මේ සියුම් කරුණේ ඇති තවත් පැත්තෙක් නම් මිනිසාගේ චේතනාව ස්වතන්ත්‍රය යන සත්‍යයයි. ඉතිහාසය මුළුමනින් ම සුළු කරුණුවලින් පවා නියතිවාදී අර්ථයෙකින් පූර්වයෙන් නිශ්චිතව නැත. මේ නිසා කායික, ආර්ථික, සාමාජික, මානසික යන කවර ලෙසෙකින් හෝ පීඩා විඳින්නකුට උපකාර කිරීමට අප ගන්නා උත්සාහය මෛත්‍රී කරුණා ආදී ගුණ ධර්ම සම්පූර්ණ කර ගැනීම සඳහා අප විසින් පෞද්ගලිකව ලබා ගත යුතු වූ අත්දැකීමෙක් පමණක් නොවේ. එය ම අනෙකාගේ මානසික

ආකල්පයත් සිතත් එමගින් ම ඔහුගේ ජීවිත මාර්ගත් වෙනස් කරන කරුණක් වන්නට ද ඉඩ තිබේ.[1]

අවසාන විග්‍රහයේ දී කර්ම සියල්ල ම මනෝමය බව අවබෝධ කර ගත යුතු ය. මනසේ වැරැද්දෙකින් චරිතයේ වැරැද්දෙක් ඇති වෙයි. චරිතයේ ලොකු වෙනසක් ඇති වන්නේ මනසේ ඇතිවන ලොකු වෙනසෙකින් ම ය. මේ නිසා කේසි කියැවීම්වල ඇති ගොඩනැගිලිකරු මනසය යන කියමන හරියටම හරි ය. එසේ කියන්නේ මිනිසකු තමාගේ මනස වෙනස් කරන තාක් ඔහුට තම පාප කර්ම මුදවා හළ නොහැකි නිසා ය. විශේෂයෙන් ම ඒ සඳහා නිර්මාපක ශක්තිය පිළිබඳවත් ඊට තමාගේ ඇති සම්බන්ධතාවය පිළිබඳවත් ඇති මතය වෙනස් කරගත යුතු ය.

අකුශල විපාක පිළිබඳ නිදසුන්වල දී කේසි කියැවීම්වල නිතර එන පාඨයක් අප දැනට ම උද්ධෘත කර ඇත:- "ඔබට ඔබම හමු වෙනවා" යනු ඒ පාඨයයි. මෙය සිත් ගන්නා කියමනෙකි. එයින් කර්මයේ ඇති කැටපත් ගතිය අඟවනු ලැබේ. හැම වැදගත් අත්දැකීමෙක් ම තමාට ම තමාගේ පූර්ව ප්‍රතිබිම්බයක්, පුදුම ලෙසින් මුණ ගැසීමෙකි. වඩාත් විශේෂයෙන් කියත හොත් එයින් පහත එන අදහස යෝජනා කෙරෙයි. එය තේරුම් ගත යුත්තේ කාල්පනික වශයෙනි.

අවකාශය පිළිබඳ වක්‍රතාවාදය (විද්‍යාඥ මණ්ඩලයන්හි එහි වර්තමාන තත්ත්වය කුමක් වුවත් කම් නැත.) කර්මවාදය සමග මනු සඳහන් ක්‍රමයෙන් හරියට ම ගැළපෙයි. විශ්වය වක්‍ර ස්වරූප යයි ද එහෙයින් විශ්වයේ ඇති හැම චලනයක් ම වක්‍රාකාර වෙතැයි ද සැලැකිය හැකි නම්, අප කියන කර්ම නියාමය හැම ක්‍රියාවෙක ම ඇති වක්‍රාකාර චලනයේ අන්තිම

1. චූලවංසයෙහි එන බුද්ධදාස රජු හා කුෂ්ට රෝගියා පිළිබඳ පුවත මෙහි දී සිහිපත් කරවීම ඉතා සුදුසු ය.

ඵලය යයි කිව හැකි ය. හැම ක්‍රියාවෙක් ම ශක්තිය පාවිච්චි කිරීමෙකි. මෙසේ මනස විසින් බාහිර වස්තුවක් කෙරෙහි යොමු කරන ලද ශක්තිය එක්ස් කිරණයක් මෙන් ඒ වස්තුව පසා කර ගෙන ගොස් අන්තිමේ දී එය ආරම්භ කළ පුද්ගලයා කරා ම එයි. එය ගමන් කළාට ආපසු එන්නේ ශක්තිය අඩු වී නොවේ.

මෙසේ මිනිසකු විසින් බළලකුට කරන ලද කාරුණික ක්‍රියාව බළලා කෙරෙහි බල පා එතැනින් පිටත්ව ගොස් අවසානයේ දී නැවත ඔහු කරාම කාරුණික ක්‍රියාවක් ලෙස එයි. මෙසේ ම ජීවිතයකට කරන ලද කෲර ක්‍රියාවෙක් ද එහි අරමුණ කෙරෙහි බලපා නැවත ආරම්භකයා කරා කෲර ක්‍රියාවක් ලෙස ආපසු එයි.

මේ මතය හුදු පරිකල්පනා මාත්‍රයක් වන නමුදු පූර්ව පරිච්ඡේද වල දී අපට දක්නට ලැබුණු බොහෝ කර්ම විපාක සිද්ධි සමග එය ගළපා ලිය හැකි ය. කර්මයන්ගේ විපාක දීමේ විචිත්‍ර විවිධතා ගණනට නොගත හොත් එය ඒ සියල්ලට ම අදාළ කළ හැකි වනු ඇත. කෙසේ වුවත් මේ මතය අනුව ජීවත් වන්නට උත්සාහ ගන්නා තැනැත්තාට ටික දිනකින් සොයා ගන්නට ලැබෙන කිසියම් යෝජනා ශක්තියෙක් එහි තිබේ. අන්‍යයන් සම්බන්ධයෙන් අප කරන හැම කර්මයක් ම අප කෙරෙහි ම බලපා කෙළවර වන, වක්‍රාකාර මාර්ගයක් අනුගමනය කරතැයි සිතතොත් පුදුම තරම් ඉක්මනෙකින් අපේ ඇතැම් ආවේග ශුද්ධියටත් ඇතැම් ක්‍රියා ශ්‍රෙෂ්ඨත්වයටත් පත්වනු ඇත.

අපට ක්‍රිස්තියානියෙහිත් අන්‍ය ලෝක ආගම්වලත් දක්නට ලැබෙන සදුපදේශවලට විද්‍යානුකූල යුක්තියක් සපයා දෙන නිසා කර්මවාදය වැදගත් වෙයි. බටහිර සභ්‍යත්වයේ ආරක්ෂාව හා පැවැත්ම රැඳී ඇත්තේ මහජනයාගේ සිත් තුළ කර්මවාදය තැන්පත් කිරීමෙහි යයි කීමෙන් පාවුල් බ්‍රැටන්[1]

1. Paul Brunton

අතිශයොක්තියක් පවසන බවක් නොපෙනේ. එසේ කියන්නේ මනාව තේරුම් ගන්නා ලද කම්මස්සකතා ඥානයෙන් පරිණත ජීවිත දර්ශනයක් ලැබෙන නිසා ය. ඒ දර්ශනය මිථ්‍යාලබ්ධික නොවී ආගමික වෙයි. සම්පූර්ණයෙන් භෞතිකවාදී නොවී විද්‍යානුකූල වෙයි. කර්මවාදයෙන් මිනිසාට දැරීමටත් ඉදිරිපත් වීමටත් ධෛර්යය ලැබේ. හැම මොහොතක දී ම නව කර්ම ආරම්භ කිරීමටත් වඩා සමෘද්ධිමත් අලුත් දෛවයක් ඇති කර ගැනීමටත් තමාට ශක්තිය ඇති බව දැන දැන ම ඔහුට නිෂ්ක්‍රිය නොවී සක්‍රියව තමාගේ ම අතීත කර්මවල ප්‍රතිඵල පිළිගත හැකි වෙයි.

මිනිසා මුලින් ම මැවුයේ දෙවියන් වහන්සේ විය හැකි ය. එහෙත් එතැන් සිට මිනිසා ම තමාගේ මැවුම්කරු ය. මිනිසාගේ ක්‍රියාමාර්ග සකස් කිරීම හා තමා ම මවා ගැනීම කරනු ලබන්නේ යම් සීමාවක් තුළ නම් කර්මයෙන් දැක්වෙන්නේ ඒ සීමාව ය. සීමා කරන්නාත් හික්මවන්නාත් කර්මයයි. ගැළැවුම්කරුත් මිතුරාත් එය ම ය. මේ නිසා බෞද්ධයා, ජීවිතයේ සියලු දුක් සැපවල දී සන්සුන්ව මෙසේ කියයි; "මම දහම් සරණ යමි" ධර්මය පුද්ගල ස්වරූපයෙන් කොතෙක් ඈත් ලෙස පෙනුණත් එහි ඇති ජගත්කාරුණ්‍යය වටහා ගත් අයට මේ වචන කීපය තුළ "මම ස්වාමීන් වහන්සේ සරණ යමි" යන එබඳු ම වූ ක්‍රිස්තියානි වචනවල ඇති භාවික වූ සහනදායක වූ ද උත්කර්ෂක වූ ද ගතිය පරිපූර්ණව ඇත. එසේ කියන්නේ ධර්මය ස්වාමීන් වහන්සේ නිසාත් ස්වාමීන් වහන්සේ ධර්මය නිසාත් ය.[1]

1. වක්කලිය, යමෙක් දහම දකී ද හේ මා දකී. යමෙක් මා දකී ද හේ දහම දකී.

# 24

# ජීවිත දර්ශනයෙක්

අවුරුදු ගණනාවක් තිස්සේ කේසිගේ ගෙදරට ලියුම් බෙදූ තැපැල්කරුවන් ගෙන ආවේ උදවු ඉල්ලා කරනු ලබන ළය කම්පා කරවන ආයාචන ය. මෑත අවුරුදුවල දී ලොව හැම තැනින් ම ලියුම් ලැබිණි. දකුණු ඇමෙරිකාවේ ද කැනඩාවේ ද එංගලන්තයේ ද සිටි මිනිසුන්ගෙන් ද යුරෝපයේ යුද බිම්වල ද ඈත පැසිෆික් සාගරයේ ද ඇලස්කාවේ ද ඕස්ට්‍රේලියාවේ ද පිහිටි මුර පොළවල සිටි තරුණයන්ගෙන් ද ලියුම් ආවේ ය.

මේ ලියුම් කියවා අනුකම්පා ඇති කර නොගෙන සිටිය නොහැකි ය. ඒවායින් විස්තර වන ප්‍රශ්නවල කේන්ද්‍රය වන්නේ මිනිස් දුක ය. නිදසුන් කියවා ගෙන යන කෙනකුට එතරම් කියැවීම් දීමෙන් කේසි ම වැහැරී ගිය ආකාරය තේරුම් ගත හැකි වෙයි. දිනපතා තැපෑලෙන් ඔහුගේ ගෙදරට ගෙන එන ලද මහා දුඃඛ ප්‍රවාහය අභිමුඛයෙහි දී ඔහු ඉතිරියක් නැති ව සම්පූර්ණයෙන් ම වෙහෙසුණු බව දැන ගත් විට මානව භක්තිකයකු වශයෙන් ඔහුගේ තුබූ මහත්කම අවබෝධ වනු ඇත.

ඇතැම් පුද්ගලයෝ තම සම්මෝහය පිළිබඳ ව දිග ලියුම් ලියා එවූහ. එබඳු එක් ස්ත්‍රියක් මෙසේ ලීවා ය:

"මගේ ප්‍රේම ජීවිතය පිළිබඳව කියැවීමක් ලබා ගැනීම සුදුසු දැයි මම විමතියෙන් කල්පනා කරමි. මා බෙහෙවින් මුළාවට පත් වී ගෙන යන බව පෙනේ. මට නැවත වරක් විවාහ වන්නට අවශ්‍ය ය. මට ගෙයකුත් ඊට අවශ්‍ය අනෙක් දේත් තිබේ. එහෙත් මට වැරදි සැමියා තෝරා ගන්නට සිදු වේ ද කියා බියෙක් පවතී. මා නැවත විවාහයක් ගැන නො සිතිය යුතු ද ? කාටත් මා එපා ද ?"

ඒ ලිපි ලියූ අය නොයෙක් වයස් සීමාවලට අයත් ය. එක් පැසුණු ස්ත්‍රියක් මෙසේ ලීවා ය.

"සෞඛ්‍යයත් භාග්‍යයත් මගේ ම සිත් ගන්නා පෞද්ගලිකත්වයත් ඇති කර ගැනීම සඳහා මට මගේ සැමියාත් පරිසරයත් වෙනස් කර ගත හැක්කේ කෙසේ ද ?"

එක් උපාධිධාරී තරුණියකු මෙසේ ලියා ඇත;

"මට ක්‍රියාවට නැගිය හැකි පෞද්ගලික ජීවිත දර්ශනයක් අවශ්‍ය ය."

අකුරු දත් නොදත්, දුප්පත් පොහොසත්, උගත් නූගත් මේ සියලු දෙනා ම ඔවුන්ගේ ලිපිවලින් මනුෂ්‍ය වර්ගයාගේ ඇති මුළාවත් අවුල් ගතියත් එක සේ ප්‍රකාශ කරති. ලජ්ජාශීලි වුව ද අභාග්‍ය සම්පන්න ලෙසින් විවාහයට ඇතුළත් ව සිටිය ද මේ සියලු දෙනා ම ජීවිතයේ තම තත්ත්වය දියුණු කර ගැනීමට වෙහෙසුණහ.

එබඳු පුද්ගලයනට තමන්ගේ ගැටලු පිළිබඳ ව එඩ්ගා කේසිගේ අභිඥා ඥානයෙන් තව දුරටත් පෞද්ගලිකව උපදෙස් ලබා ගත නො හැකි ය. එහෙත් සමාන නිදසුන්වල දී කර ඇති නියමයන් හැදෑරීම අපගේ දුෂ්කරතාවනට විසඳුමක් සොයා

ගැනීමට වහල් වනු ඇත. හැම පුද්ගලයකුට ම වාගේ ඔහුගේ දුකේ හේතුව ඔහු තුළ ම සැඟැ වී ඇතැයි කියා තිබේ. කියැවීම්වලට අනුව කරදරවලට මුහුණ පෑ පුද්ගලයන් විසින් පිළිගත යුතු වූ පළමු වැනි කරුණ මෙයයි. අන්තිමට විග්‍රහ කර බැලූ විට හැම ගැටලුවක් ම ඇති කර ගෙන තිබෙන්නේ තමා විසින් ම ය. ඒ නිසා එය විසඳා ගත යුත්තේ ද තමා විසිනි.

මෙය සුළු උපදේශයක් ලෙස පෙනෙනු ඇත. එහෙත් බොහෝ විට එය පිළිගැනීම දුෂ්කර වෙයි. අපි පරීක්ෂාවක් නැති ව අපේ ස්වභාවය පිළිගන්නටත් අපේ ගති අප ආශ්වාස කරන වාතය ලෙසින් නිශ්ශබ්ද ව බාර ගන්නටත් පුරුදු ව සිටිමු. සාමාන්‍යයෙන් අප අපගේ ස්වභාවය ගැන සලකා බලන්නේ තෘප්තියෙකින් යුතු වය. අපගේ අසංගඥ වූ ඉවෙන් කෙරෙන්නේ අපගේ ම මානසික ගති ගුණ පූර්ණත්වයේ මිනුම් දඬු ලෙස යෙදීමයි.

අප අභාග්‍යවන්ත දුඃඛිත ලෙසත් පෙනෙන්නට වීම ම අප තුළ කිසියම් දෝෂයක් ඇත්තේ ය යන්නට සාක්කියක්ය යන අවබෝධය ලැබුණු විට අපි අපගේ ආත්ම තෘප්තියෙන් නැඟී සිටිමු. මේ අවබෝධය ලැබිය යුත්තක් ම බව කියැවීම්වලින් දක්වනු ලැබේ. එවිට අප බාහිර දේවලට දෝෂාරෝපණය කිරීම නතර කොට, නො සන්සුන් ව බාහිර දේවල් සකස් කිරීම අත් හිටුවා අපගේ දෝෂය ඇති තැනත් අප විසින් උගත යුතු පාඩමත් සොයා ගැනීම සඳහා අප ම පරීක්ෂා කිරීමට පටන් ගනිමු.

අපගේ දුෂ්කරතාව කුමක් වුවත් තනි ගතිය, කරදරකාරී ස්වාමි පුරුෂයෙක්, මෝඩ දරුවෙක්, හීන මානයෙක් නැති නම් සීමාසහිත පරිසරයෙක් යන මෙයින් කොයි එක වුවත් ඒ දුෂ්කරත්වය ඉක්මවා ගත හැක්කේ ආත්ම ප්‍රතිසංස්කරණයෙකින් ම බව අප විසින් තේරුම් ගත යුතු ය. අපගේ ම චරිතය සකස් කර ගත යුතු ය. අපේ ආකල්ප, දොස් සොයනසුලු හෝ හෙළා

දකිනසුලු හෝ පළි ගන්නාසුලු හෝ ආඩම්බර හෝ උදාසීන හෝ නාස්තික හෝ නො විය යුතු ය. චරිතය, ආත්මාර්ථකාමී ද අනුන් ගැන නො සලකනසුලු ද අසාමාජික ද නොවිය යුතු ය. බාහිර දුෂ්කරතා විසඳිය හැක්කේ යෝග්‍ය වූ මානසික හා ආධ්‍යාත්මික ගුණ මතු කර ගැනීමෙනි.

කෙසේ හෝ ආත්මයේ වගාව හා ප්‍රතිසංස්කරණය යන දෙක ම සිදුවිය හැක්කේ විශ්වය පිළිබඳවත් මනුෂ්‍යයාගේ එයට ඇති සම්බන්ධතාව පිළිබඳවත් ඇති කර ගන්නා ලද ක්‍රමානුකූල දර්ශනයෙකිනි. කේසිගේ හැම කියමනෙක ම එබඳු ක්‍රමානුකූල දර්ශනයෙක් ගැබ් වී ඇත. දී ඇති සිය ගණන් ජීවිත කියැවීම් දිගේ වර්ණවත් කළ නූල් සෙයින් ඒ දර්ශනය දිවෙයි. මේ නූල් ඒවා දක්නට ලැබෙන පෞද්ගලික කියැවීම් නමැති අච්චුවෙන් ඉහළට එස වූ කල පැහැදිලි සැලැස්මෙක් මතු වෙයි.

මේ සැලැස්ම ආගමික යයි කිව හැක්කේ එහි ආරම්භක ස්ථානය වශයෙන් නිර්මාපක ශක්තියෙක් නැතහොත් ඊශ්වරයෙක් ඇත්තේ යයි පිළිගන්නේ ය යන අර්ථයෙනි. එය දාර්ශනික වන්නේ, ජීවිතය, විශ්වය හා එය තුළ මිනිසාගේ දෛවය යන මේවා ගැන නිශ්චිත ක්‍රමානුකූල ආකල්පයක් සකස් කර දෙන්නේ ය යන අර්ථයෙනි. ලැබී ඇති ජීවිත පරිසරයේ දී ක්‍රියාකාරී වීමේ දී ආත්මයට මතු වන ප්‍රායෝගික ප්‍රශ්නවලට යෝග්‍ය වූ ආකල්පයක් සැපයෙන්නේ ය යන අර්ථයෙන් එය මනෝවිද්‍යාත්මක ද වේ.

දළ සටහනෙක ස්වරූපයෙන් මේ සැලැස්ම මතු දැක්වෙන අයුරු බව පෙනේ.

"දෙවියන් වහන්සේ වැඩ සිටිනා සේක"

"හැම ආත්මයෙකු ම දෙවියන් වහන්සේගේ කොටසෙකි."

("ඔබ ආත්මයෙකි: ඔබ ශරීර නිවාසී ය.")

"ජීවිතය අර්ථවත් ය."

"ජීවිතය අවිච්ඡින්න ය."

"හැම මනුෂ්‍ය ජීවිතයෙක් ම නියාමයකට අනුව ක්‍රියාත්මක වෙයි."

(කර්මය : පුනර්ජන්මය)

"මෛත්‍රියෙන් ඒ නියාමය සපිරෙයි."

"මිනිසාගේ චේතනාව ඔහුගේ දෛවය තනයි."

"මිනිසාගේ මනසට සංස්කාරක ශක්තියෙක් ඇත."

"සියලු ගැටලුවලට විසඳුම ඇත්තේ ආත්මය තුළ ය."

ඉහත සඳහන් කරුණු පිළිගෙන මනුෂ්‍යයාට මෙසේ අවවාද කරනු ලැබේ.

"පළමු කොට විශ්වයේ නිර්මාපක ශක්තිවලට නැතහොත් දෙවියන් වහන්සේට ඔබේ ඇති සම්බන්ධතාව තේරුම් ගන්න."

"ඔබේ ජීවිතාර්ථයන් ප්‍රාර්ථනීය ආදර්ශත් සකස් කර ගන්න."

"මේ ප්‍රාර්ථනීය ආදර්ශය ලබා ගැනීමට උත්සාහ ගන්න."

"ක්‍රියාශීලී වන්න."

"ඉවැසිලිමත් වන්න"

"ප්‍රමුදිත වන්න."

"ප්‍රතිඵල දෙවියන් වහන්සේට බාර දෙන්න."

"කිසි ම ප්‍රශ්නයක් මග හරින්නට උත්සාහ නො කරන්න."

"අන්‍යයන් කරා හොඳ ගලා යන ඇළ පාරක් වන්න."

දෙවියන් වහන්සේ වැඩ සිටිනා සේක.

දෙවියන් වහන්සේ මිනිස් මනසේ ළදරු පරිකල්පනයෙක්ය යනු මනෝවිග්‍රාහක මතයයි. මේ මතයට කේසී කියැවීම් කිසි ම සහනයක් නො දක්වා විරුද්ධ වෙයි. ඒවායින් දිගට ම දෙවියන් වහන්සේ ඇතැයි තරයේ කියැවේ. දෙවි කෙනකුන් ගැන කියවෙනවාට වැඩියෙන් මේ කියැවීම්වලින් දක්වෙන්නේ විශ්වයේ ඇති නිර්මාපක බලයක් නැතහොත් ශක්තියක් ගැන ය. සියල්ල සලකා බලන විට බලය නැතහොත් ශක්තිය යන වචනය අපේ යුගයේ අලුත් සිතුවිලි මඟට හොඳින් ගැළපෙන බව පෙනේ.

අප ජීවත් වන යුගයේ අවශ්‍යතාව වී ඇත්තේ වැඩි වැඩියෙන් ස්වභාව ශක්තීන් මුදවා හැරීමයි. අපි පරමාණුවේ කේන්ද්‍රයෙහි අචින්තනීය වූ ශක්තියක් සොයා ගතිමු. එතරම් මහත් කරන ලද විද්‍යානුකූල දෘෂ්ටි පථයක් ඇති ලෝකයෙක දී එක් මූල මහා ප්‍රභවයෙක විස්තරයක් වශයෙන් 'විශ්වයේ නිර්මාපක ශක්තිය' යන වචනය වැඩි පහසුවෙකින් තේරුම් ගත හැකි වනු ඇත. අවමානයෙන් අගය අඩු කරන ලද, අයථා භාවිතයෙන් කෙලෙසන ලද, දෙවියන් වහන්සේ යන සාම්ප්‍රදායික වචනයට වඩා එය අර්ථවත් වනු ඇත.

ව්‍යක්ත වූ සමස්ත විශ්වය ම, ඒ නිර්මාපක ශක්තියේ ප්‍රකාශන යයි. අප ජීවත් වන්නේත් හැසිරෙන්නේත් අපේ පැවැත්ම ඇත්තේත් ඒ විශ්වය තුළ ය. ඒ මූල ශක්තියටත් දිව්‍යත්වයටත් අපි කොටස් කාරයෝ වෙමු. එය හා අපේ ඇති ඒකත්වය අවබෝධ කර ගැනීමට අප උගත යුතු ය.

කේසී කියැවීම්වල දී මේ අදහස නොයෙක් ආකාරයෙන් ප්‍රකාශ වී තිබේ. හොඳ නිදසුන් කීපයෙක් පහත එයි:

"ජීවිතය නම් කිමෙක් ද ? භෞතික මට්ටමෙහි දී ව්‍යක්ත වූ දෙවියන් වහන්සේ ය. තවමත් අප ජීවත් වන්නේත් හැකිරෙන්නේත් අපේ පැවැත්ම ඇත්තේත් උන්වහන්සේ තුළය. ජීවිතය නම් අප විසින් 'දෙවියන් වහන්සේ' යයි නම් කරනු ලබන ඒ විශ්ව බලයේ නැතහොත් ශක්තියේ භෞතික වූ ආවිර්භාවයයි."

"ඔබ ඔබ ම විග්‍රහ කරන කල්හි මේවා වෙනස් නො වන සත්‍ය බව දැන ගන්න. දෙවියන් වහන්සේ වැඩ සිටිනා සේක. ඔබ පළමුවෙන් ම පක්ෂපාති විය යුත්තේ උන්වහන්සේට ය. ඔබ ක්‍රියා කරන්නේ ඇතුළත ඇති ඒ දිව්‍යත්වයට එකඟව ය, නැති නම් විරුද්ධව ය."

දෙවියන් වහන්සේගේ බලය විදුලි බලය වැන්නෙකි.

**හැම ආත්මයෙක් ම දෙවියන් වහන්සේගේ කොටසෙකි.**

කියැවීම්වලට අනුව අප හැම කෙනෙක් ම ආත්මයෙකි. අප ඇති කළ දිව්‍ය ශක්තියේ කොටසෙකි. දෙවියන් වහන්සේට නැතහොත් විශ්වයේ නිර්මාපක ශක්තිවලට අපේ ඇත්තේ සූර්ය කිරණයෙක සූර්යයාටත් ජල බින්දුවෙක සාගරයටත් ඇති සම්බන්ධතාවයි. අපේ ශරීරයට අපේ ඇති සම්බන්ධය මිනිසකුගේ තම ගෙදරට නැතහොත් ඇඳුමට ඇති සම්බන්ධය බඳු ය.

ආත්මයෙක් නම් ඒ දිව්‍යමය ශක්තියේ කොටසෙකි. එය ඒ ශක්තිය තරමට ම සනාතන ය. මේ නිසා ආත්මෝත්කර්ෂයෙහි යෙදෙන පුද්ගලයා එයින් තමා ම පාරගජනයකු කර ගනිතැයි ද තම සම්බන්ධතාව නැති කර ගනිතැයි ද කිව හැකි ය. කෙසේ හෝ මූල කාරණයට වඳින්නා වූ ද එය කීර්තියට පත් කරන්නා වූ ද අය මිනිසාට දී ඇති ප්‍රථම ආඥාව පිළිබඳව අප්‍රමත්තයෝය. ඒ ආඥාව මෙසේ යඃ "මා සිටිය දී ඔබට වෙනත් දෙවිවරුන්

සිටිය නොහැකි ය." මා නම් ආත්මයේ මම ය. (මා නම් සනාතන ආත්මය ය ?)

ඔබ ආත්මයක් බව දන හුදු පෘථග්ජනයකු නොවී සිටින්නට යත්න දරන්න.

"අනෙක් අය ඕනෑ විදිහකට කළා වේ, එහෙත් මමත් මගේ ගෙදර ඇත්තෝත් ජීවත් වන දෙවියන් වහන්සේට සේවය කරමු." මෙයින් ඔබේ භෞතික ගෘහය තුළ සිටින අය අදහස් කරනවා යයි තේරුම් ගන්නට එපා. ඔබේ ගෙදර නම් ඔබේ ශරීරයයි. ජීවත් වන දෙවියන් වහන්සේගේ දේවාලය එයයි. දෙවියන් වහන්සේගේ කැමැත්තට අනුව සාදන ලද මුළු ගෙයම එයයි.

## ජීවිතය අර්ථවත් ය.

පෞද්ගලිකාර්ථයෙකින් හෝ සර්ව සාධාරණාර්ථයෙකින් හෝ ජීවිතය හුදු අහඹු තත්ත්වයෙක් නොවේ. අපගේ ජීවිතයේ පරමාර්ථය සසංඥ දේව සහවාසතාවෙක දී දෙවියන් වහන්සේ හා එක්වීමයි. අපි ආරම්භයේ දී ඒ දිව්‍යත්වය සමග එක්ව වුසුමු. අවිද්‍යාවෙන් භෞතිකත්වයට ඇලීම නිසාත් වෙන්කම පිළිබඳ සංඥාව, ආඩම්බරය හා ආත්මාර්ථකාමය නිසාත් අපි එයින් වෙන් වුමු.

පුද්ගලයා උපන්නේ හුදු අහම්බයකින් නොවේ. එසේ කියන්නේ පෘථිවිය හේතුඵල සම්බන්ධ ලෝකයක් වන හෙයිනි. හේතුඵලතාව පෘථිවියෙහි ස්වාභාවික නියාමයෙකි. හැම ආත්මයක් ම මේ භෞතික තලයට ඇතුළු වන්නේ මේ සත්‍ය ඉගෙනීමට හෝ ඉගැන්වීමට ය. උගන්වනු ලබන එක් එක් ආත්මය තමා මෙලොවට ඊමේ අර්ථය පිළිබඳ වැඩි දැනීමක් ලබා ගනී.

මුල දී ඔබට දේව සභ්‍යතාව තිබුණේ ය. භෞතික තෘෂ්ණා පමණක් තෘප්තිමත් කරන දෙය තෝරා ගැනීම නිසා ඒ දේව සභ්‍යතාව නැති කර ගෙන ඇත. මෙසේ ඔබ ස්වාමීන් වහන්සේ කළාක් මෙන් නැවත නැවත ඇතුළු වෙති. ඔබ එන්නේ නියාමය සපුරා ලීමට ය. උන් වහන්සේ සමග එක්වීම සඳහා ඔබේ ආත්මය ඇති කෙළේ ඒ නියාමයයි.

හැම ආත්මයෙක ම උරුමය නිර්මාපක ශක්තීන් සමග එක්වන ගමන් ම යථාභූත ස්වභාවයෙහි රැඳීමට තමා ගැන ම දැන ගැනීමයි.

**ජීවිතය අවිච්ඡින්න ය.**

පාරප්‍රාප්ත වූ යෝග්‍ය සහකාරයන් ලෙසින් වූ අපේ දිව්‍ය ස්වභාවය පිළිබඳ පූර්ණාවබෝධයෙකින් යුතුව දෙවියන් වහන්සේ හා නැවත එක් වීම ඉක්මනින් ඉටු කර ගත හැක්කෙක් නොවේ. චිත්ත පාරිශුද්ධිය හෙමින් සිදුවන්නෙකි. එහි පාරප්‍රාප්තිය ලබා ගත හැක්කේ කල්ප ගණනාවෙකිනි. පරමාර්ථ වශයෙන් කාලයෙක් නැත. එහෙත් අපේ ත්‍රෛමාණික[1] සංඥාවට කාලයක් ඇත. අපේ සීමිත තත්ත්වයෙන් අප මත තබනු ලබන දෘෂ්ටියෙන් ජීවිතය අවිච්ඡින්න බව දැක ගත යුතු ය.

ඔබ දේවත්වයට දියුණු වනවා මිස දෙව් ලොවට යන්නේ නැත.

ජීවිතය අවිච්ඡින්න නිසා නතර වීමෙක් නැත. එක්කෝ අපි ඉදිරියට යමු. නැතිනම් පසු බසිමු. ජීවිතය අවිච්ඡින්න ය. එය වෙනස් වන්නේ විඥ්ඥාණ තත්ත්වය නිසා හෝ ප්‍රවෘත්තියේ ස්පන්දන ප්‍රමාණයේ වෙනස්වීම නිසා හෝ යම් යම් අංශයන්ගෙන් පමණි.

1. Three Dimensional

පුද්ගලයකු අද ලබා ඇති තත්ත්වය අතීත කර්මයන්ගේ ප්‍රතිඵලයෙකි. එසේ කියන්නේ ජීවිතය අවිච්ඡින්න නිසා ය. එය භෞතිකත්වයෙහි නැති නම් අනාෘ විසඳ්ඥාණටයීතියෙක පහළ වූවත් අනන්‍ය වූ එකෙක් ම ය.

මෙය හොඳින් ඉගෙන ගන්න. පළමු කොට ම ජීවිතය අවිච්ඡින්න ය. එක ම කාලය හැරුණු විට වෙනත් කාලයෙක් නැත. එකම අවකාශය හැරුණු විට වෙනත් අවකාශයෙක් නැත. විවිධ රූපයෙන් වූ මහා ශක්තිය හැරුණු විට වෙනත් ශක්තියක් නැත.

**හැම මනුෂ්‍ය ජීවිතයෙක් ම නියාමයකට අනුව ක්‍රියාත්මක වෙයි.**

ජීවිතයේ අවිච්ඡින්නත්වය යන වාක්‍යාංශයෙහි අප විසින් මහා මනුෂ්‍ය දෘෂ්ටියෙන් පුනර්ජන්මය යයි නම් කරනු ලබන අත්දැකීම් වල රිද්මයානුකූල වූ මාරුවීම ගැබ්ව ඇත. මනුෂ්‍ය ජීවිතය නැවත නැවත දේහ ගැනීමේ නියාම යටතේ ක්‍රියාත්මක වෙයි. මේ දේහ ගැනීමේ ආකාරය, නොවරදින සියුම් කර්ම නියාමවලින් පාලනය වෙයි.

මේ මිහිතලයෙහි වෙනස් නොවන ආධ්‍යාත්මික නියාම ඇති බව දැන ගන්න. මෙසේ අරඹන්න: සමානයෙන් සමානයෙක් උපදී. ඔබ වපුළ දෙය ඔබ නෙළා ගනිති. දෙවියන් වහන්සේ රවටන්නට බැරිය. ඔබ ඔබේ අසල්වැසියාට සලකන අන්දමට අනෙක් මිනිසාත් ඔබට සලකනවා ඇත.

ජීවිතයෙන් සම්පූර්ණයෙන් ජීවත් වන්නේ වත් මරණයෙන් සම්පූර්ණයෙන් මැරෙන්නේ වත් නැත. එසේ කියන්නේ සමස්තයේ නැතහොත් කේන්ද්‍රයේ දෘෂ්ටියෙන් බැලූ කල එකක් අනෙකේ උපත නිසාත් මරණයත් උපතත් යන දෙක ම සියලු විකිරණ ආරම්භ වන්නා වූ ඒ සර්ව සාධාරණ කේන්ද්‍රය දෙසට ද ඒ කේන්ද්‍රයේ සිට ද සිදුවන සංක්‍රමණයන්හි දී පුද්ගලයාට ඇතිවන අත්දැකීමක් පමණක් නිසාත් ය.

ඔබ වරක් කළ දේවල් සිහිපත් කරන්න. දැන් ඔබට ඒවා මුණ ගැසෙනවා! මෙය සිතේ ඇති ව ජීවත් වන්න. (හැම ආත්මයක් ම සැලැකිල්ලට ගත යුතුයි.) ඔබ ස්වාමීන් වහන්සේගේ නියමයෙන් කඩ කරන හැම අංශුවකට ම ඔබට ගෙවන්නට සිදු වන්නේ ය.

ජෝන්ගේ 14, 15, 16, 17 යන පරිච්ඡේද කියවන්න. "මාගේ පියාණන් වහන්සේගේ ගෘහයෙහි අනේක මන්දිර ඇත." ඔබ වැඩ කරන ගමන් ම ඒ ගැන සිතන්න. පැයක් හෝ මිනිත්තුවක් හෝ නොව දවසක් ම ඒ ගැන සිතන්න. ඔබේ පියා කවරෙක් ද ? 'මන්දිර' යන්නෙනුත් "උන් වහන්සේගේ ගෘහයෙහි බොහෝ මන්දිර ඇත්තේ ය" යන්නෙනුත් කිමෙක් අදහස් කෙරේ ද? කවර ගෘහයෙක් ද ?

ගෘහය නම් දේවාලය වන ඔබගේ ශරීරයයි. බොහෝ මන්දිර නම් ඒ ශරීරයේ ඇති බොහෝ දේවාල ය. කවර හෙයින් ද? ශරීරය වරින් වර මෙලොව ඉපැදී ඇති හෙයිනි. ඒවා ඇතැම් විට මන්දිර ය. ඇතැම් විට ගෙවල් ය. ඇතැම් විට පැල්පත් ය.

මනුෂ්‍ය ජීවිතය නියාමයක් යටතේ ක්‍රියාත්මක වන්නේ ය යන්නෙන් ගම්‍ය වන වෙනත් මතයක් ඇත. එනම් කෙබඳු වූ නමුත් ඔබගේ වර්තමාන තත්ත්වය අතීතයේ දී ඔබ විසින් ම ඇති කරන ලද හේතුවල ඵලයෙක් ය යනු ය. ඒ නිසා එය ඔබගේ අභිවෘද්ධියට අවශ්‍ය ය. මිනිසාගේ අද තත්ත්වය ඇති වූයේ ඔහුගේ අතීත තත්ත්වය නිසා ය.

ඔබ කවර මානසික, කායික හෝ භෞතික තත්ත්වයෙක සිටියත් එය ඔබ විසින් ගොඩනගා ගන්නා ලද්දෙකි. ඔබගේ ආත්මයේ හෙළිවීමට එය අවශ්‍ය ය.

කවදාවත් ඔබ ගැන කනගාටු වන්නටවත් කවරකු හෝ ඔබට වැරැදි ලෙස සලකා ඇතැයි සිතන්නටවත් එපා. ඔබ නෙළා ගන්නේ ඔබ ම වපුළ දෙයයි. ඔබ අනෙකකුට නරකට

සලකන්නේ නැති නම් කවදාවත් අනෙකකු ඔබට නරකට සලකන්නේ නැති බව මතක තබා ගන්න. සමානයෙන් සමානයක් ඇති වන නිසා එය ස්වභාවය නොවේ.

ඔබේ මේ ආත්මභාවයේ දී නිව උදාසීනත්වයේ කාලපරිච්ඡේද ඇති වන්නට ඉඩ දෙන්න එපා. නිර්මාපක මූල ධර්මයන් අදාළ කිරීමෙන් ඔබ මුහුණ දෙනවා නම් හැම දෙයක් ම ඇත්තේ ඔබේ අභිවෘද්ධියට බව දැන ගන්න.

ඔබ වැටී ඇති හැම තත්ත්වයෙක් ම ඒ අවස්ථාව ඔබට හොඳ ම එක බව දැන ගන්න. කුමක් විය හැකි ව තිබුණා දැයි ආපසු බලන්න එපා. ඔබ දැනට ඇති තැන දියුණු කර ගන්න. හොඳ අතට හරවා ගන්න බලන්න.[1]

### මෛත්‍රියෙන් ඒ නියාමය සපිරෙයි

අප මෛත්‍රියෙන් පූර්ණත්වයට පත්වන තාක් පුනර්ජන්ම නියාමය මෙන් කර්ම නියාමය ද නොවැරදී ක්‍රියාත්මක වේ. මෛත්‍රියෙන් හැම නියාමයක් ම සපිරෙයි.[2]

මට අනාගත වක්තෘත්වයේ දායාදය තිබුණත්, නොදත් භාෂා වලින් කථා කළ හැකි වුවත්, මා මගේ සිරුර දවාලන්නට ඉඩ දුන්නත්, මා තුළ මහා පුරුෂයාගේ පුත්‍රයාණන්ගේ ජීවය හෙවත් ක්‍රිස්තු සංඥාව නැති නම්, ක්‍රිස්තු ජීවය නැති නම්, මා තුච්ඡ වන නිසා ආලෝකයේ දරුවෝ පළමු කොට ම මෛත්‍රී කරති.

ඊළඟට ඔබේ ආදර්ශවත් නායකයාගේ මාර්ගය අනුගමනය කරන්න. එතුමා කීවේ මෙපමණය:

---

1. මෙහිදී 'සලාභං නාතිමඤ්ඤෙය්‍ය - නාඤ්ඤෙස්ස පිහයං චරේ" යනාදී ධර්ම පද ගාථාව සිහි කළ මනා ය.
2. කේසි බ්‍රහ්මසහව්‍යතාව මනුෂ්‍යයාගේ නිෂ්ඨාව ලෙසත් බ්‍රහ්ම විහාර ඒ සඳහා වූ මාර්ගය ලෙසත් දුටුවා සේ ය. බෞද්ධ නිෂ්ඨාව මීට වඩා ඔබ්බෙහි වූවෙකි.

"ඔබේ ස්වාමියා වූ දෙවියන් වහන්සේට ඔබේ මුළු හෘදයෙන් ම, ආත්මයෙන් ම මෛත්‍රී කරන්න. ඔබගේ අසල්වැසියනටත් ආශ්‍රිතයනටත් එපමණක් නොව ඔබේ සතුරනටත් ඔබට මෙන් ම මෛත්‍රී කරන්න." ධර්ම ස්වභාවය මෙයයි.

**මිනිසාගේ චේතනාව ඔහුගේ දෛවය තනයි.**

නියාමවලින් හා ක්‍රමානුකූලත්වයෙකින් යුක්ත මේ ලෝකයෙහි මිනිසා ස්වතන්ත්‍ර චේතනාවක් ඇති කාරකයෙකි, විශ්වයේ ඇති මහා නිර්මාපක ශක්තියට ද මෛත්‍රිය, ඥානය හා චේතනාව යන තෙවැදෑරුම් වූ එහි අංශවලට ද හේ හවුල් කාරයෙකි. මිනිසා පව් කරන්නේ නැතහොත් දෙවියන් වහන්සේගේ නොසැලෙන ඉච්ඡාවට විරුද්ධව යන්නේ ඔහුගේ චේතනාවෙනි. මිනිසාට තම ආත්මයේ දිශාව වෙනස් කොට විශ්වයේ චේතනාව සමග නැවත ගළපා ගත හැක්කේ ද තමාගේ චේතනාවෙන් ම ය.

විශ්ව නිර්මාපක ශක්තියේ චේතනාවට අනුකූල හෝ අනනුකූල හෝ විය හැකි බලය සත්ත්වයාගේ චේතනාවයි. ඒ විශ්ව ශක්තියට ප්‍රකෘතිය කීවත් දෙවියන් වහන්සේ කීවත් වෙන මොන යම් නමක් කීවත් කම් නැත. චේතනාව ඊට එක්කෝ එකඟ ය. නැති නම් විරුද්ධ ය. චේතනාව එක්කෝ ඒ තත්ත්වයටම දියුණු වෙයි. නැතිනම් එයින් ඈත් වෙයි. දෛවය නම් නිර්මාපක ශක්තින් පිළිබඳව ආත්මයක් තම චේතනාවෙන් කරන දෙයයි.

කිසි ම වේගයක් හෝ බලයක් ආත්මයේ චේතනාවට වැඩියෙන් කායික, මානසික හා ආධ්‍යාත්මික යන කවර පක්ෂයෙකින් හෝ තම විනිශ්චය ඉටු කර ගැනීමට ප්‍රබල නොවන බව පළමුවෙන් දැන ගත යුතු ය.

කවර අත්දැකීමෙක දී වුවත් ජ්‍යොතිශ්ශාස්ත්‍රීය වශයෙන්, සංඛ්‍යා ශාස්ත්‍රීය වශයෙන් හෝ සංකේතාත්මක වශයෙන් කියීම වේගයක් පුද්ගලයාගේ චේතනාව ඉක්මවා නොයන බව දත යුතුය.

නිර්මාපක වූ ශක්තිය ආත්මය තුළ ඇත. ඒ නිර්මාපක ශක්තිය බැහැරින් වූ දිව්‍යත්වය සමග සහකාරීව ජීවිත මාර්ග තෝරා ගැනීමට අප ගෙන යයි. තෝරා ගැනීම කළ ජ්‍යොතිශ්ශාස්ත්‍රීය වශයෙන් හා අන්‍ය ක්‍රමවලින් ජීවිතයේ නිශ්චාව කිමෙක් දැයි පෙනී යනු ඇත. එහෙත් හැම ආත්මයකටම තෝරා ගැනීමේ හැකියාව නමැති ජන්ම දායාදය ලැබී ඇත. ඕනෑ ම පරිසරයෙක ඕනෑම අත්දැකීමෙක දී ඒ තෝරා ගැනීම කළ හැකි ය.

## මිනිස් මනසට සංස්කාරක ශක්තියෙක් ඇත

මෙසේ මිනිසාට ලෝක නියාම රාමුව තුළ ස්වතන්ත්‍ර චේතනාවක් ඇත. මිනිසාට දඬුවම් ලැබෙන්නේ ඒ නියාම කඩනවා නම් පමණි. ඔහුගේ චේතනාව ඔහුගේ දෛවයේ ප්‍රේරක ශක්තිය මෙන් ක්‍රියා කරයි. එහෙත් ඔහුගේ මනස ක්‍රියා කරන්නේ මාර්ගෝපදේශක වූ ද සංස්කාරක වූ ද කාරකයා ලෙස ය. ආත්ම අනාවරණයට හා ආත්මාභිවෘද්ධිය පිළිබඳ ඕනෑම සැලැස්මක දී තමාගේ ප්‍රාර්ථනීය ආදර්ශයන් සකස් කර ගැනීම පළමු වන පියවර වන්නේ මේ නිසා ය. . .

නව ද මනස ගොඩනැගිලිකරු ය. මෙහි සඳහන් කෙරෙන්නේ සර්ව සාධාරණ මහා මනස ගැන ය. අපගේ එක් එක් මනසක් මේ මනසේ වෙන් වූ කැබැල්ලෙකි. කවර භවතලයෙක දී නමුදු භෞතික වස්තූන්ගේ ප්‍රභවය වූ සැලැස්ම තනන්නේ මේ මනසයි.

හැම පුද්ගලයෙක් ම කාලය හා අවකාශය මත මනස නමැති පන්හිඳ වෙහෙසා චාර්තාවක් ලියයි.

මසින් ද ජීවයෙන් ද මනස ගොඩනඟන්නාය. මෙසේ ආත්මය තමා යෙදූ අයුරින් ජීවිතයේ සැලැසුම් සකස් වේ.

සිතුවිලි ඇති දේවල් ය. මනස ද කණුවක් හෝ ගසක් තරමට ම ඇති දෙයකි.

**සියලු ගැටලුවලට විසඳුම ඇත්තේ ආත්මය තුළ ය.**

විසඳුම ඇතුළතය යන පාඨය කියැවීම්වල නිතර නිතර එන්නෙකි. මෙය අදහස් කීපයෙකින් යොදා ඇති බව පෙනේ. පළමු කොට ම කර්ම නියාමයට අනුව අපට සිදුවන හැම දෙයක් ම ආත්ම - කෘත ද ආත්මෝපචිත ද වන නිසා හැම දුෂ්කරතාවෙක ම හේතුව ඇත්තේ ආත්මය තුළ ය. බාහිර පරිසරය අප තුළ ම ඇති යම් කිසිවෙක ප්‍රතිබිම්බයෙක් පමණි. අපට සිදුවන හැම දෙයෙක දී ම අපට අපි හමු වෙමු. මේ නිසා අපේ වටාපිටාවේ දී අපට සිදුවන හැම දෙයක ම සලකුණු, සියුම් ආත්ම විග්‍රහයකින් ලබා ගත හැකි වෙයි.

දෙවැනි ව අපේ පුද්ගලත්වයේ ආරම්භයේ සිට අපට සිදු වූ හැම දෙයක ම ස්මරණය අපේ යටි සිතෙහි නතර වී ඇත. මෙසේ, භාවනා මාර්ගයෙන් බාහිර ඉන්ද්‍රියයන් නිශ්චය කොට අවධානය ඇතුළතට යොමු කිරීමෙන් ප්‍රයෝජනයට ගත හැකි වූ ඥාන භාණ්ඩාගාරයක් අප තුළ ඇත.

තුන්වැනිව අප තුළ ගැඹුරේ, දිව්‍යමය සාරය වන බබළන උත්තමාර්ථය හිර වී ඇත. විශ්වයේ නිර්මාපක ශක්තිය සමග අප එක් වන්නේ එහි මාර්ගයෙනි. මේ නිසා හැම ගැටලුවකට ම ඇති විසඳුම නම් අපේ දිව්‍යාත්මභාවයේ ඒ විකිරණශීලී ශක්තිය දෙසට ඇතුළතට ම හැරීමයි.

ඔබට ඇති වන හැම ගැටලුවකට ම විසඳුම ඔබ තුළින් ම සොයා ගත හැකි නිසා ඔබ ගැන ම ඉගෙන ගන්න. එසේ කියන්නේ කායික වූ ද මානසික වූ ද උපධීන්ගෙන් යුක්ත වූ

මනුෂ්‍ය ආත්මය සමස්ත මහා ආත්මයේ කොටසක් වන හෙයිනි, මේ නිසා සියලු විසඳුම් ඇත්තේ ඇතුළත ය.

සියලු බලා සියලු සූවපත් වීම, සියලු උදවු යන හැම දෙයක් ම ඇතුළතින් ආ යුතු බව දැන ගන්න.

පුද්ගලයාට දෙවියන් වහන්සේ ගැන දතයුතු හැම දෙයක්ම ඔබගේ විඤ්ඤාණය තුළ දැනට ම ඇත. ජාත්‍යන්තර සම්බන්ධතා පවා එහි තිබේ. ඒ හැම දෙයක්ම ඔබ විසින් දත යුතුව ඇත. භෞතික ඥාන මාර්ග යොදා ගත යුතු බව සත්‍යයෙකි. එහෙත් එය යොදාගත යුත්තේ සර්ව සාධාරණ ඥානය ගැන ශ්‍රද්ධාවක් හා භක්තියක් ඇති වය. කවර හෙයින් ද ? මහා නීති දායකයා[1] විසින් පෙන්වා ඇත්තේ මෙසේ ය. "පණිවිඩයක් ගෙන ඊම සඳහා මුහුදෙන් එන්නේ කවරෙක් දැයි නොසිතන්න. එසේ කියන්නේ එය ඔබේ ආත්මය තුළින් ම එන නිසා ය. මනසත් ආත්මයත් මුල ඕට ම ඇති නිසා ය."

කේසි - කියැවීම්වලට අනුව මේවා, මිනිසා පිළිබඳවත් විශ්වයට ඔහුගේ ඇති සම්බන්ධතාව පිළිබඳවත් ඇති මූලික සත්‍ය ය. ජීවිතයේ දෛනික ව්‍යාපාරවලින් ද මානසික ගැළැපීම පිළිබඳව සර්ව සාධාරණ ගැටලුවලින් ද කිසිසේත් ඈත් නොවූ මේ මත ක්‍රියාවට නැගිය හැකි ජීවිත දර්ශනයක් කරා නිරායාසයෙන් ම ගමන් කරයි.

පළමු කොට ම මේ අදහස් චරිතයට නගා ගැනීමට උත්සාහ කිරීමේ දී අප විසින් විශ්වයේ නිර්මාපක ශක්තියට අපේ ඇති සම්බන්ධතාව තේරුම් ගත යුතු ය. දොළ පාරකට මෙන් මිනිසාට ද තමාගේ ප්‍රභවයට වඩා ඉහළ නැගිය නොහැකිය. දැන හෝ නොදැන මිනිසා හැම විටම ක්‍රියා කරන්නේ තමාගේ ප්‍රභවය හා අනන්‍යතාව පිළිබඳ වූ පිළිගැනීම් කොටසක්

1. යුදෙව් ඉතිහාසයේ දී මෝසෙස් ද ග්‍රීක ඉතිහාසයේ දී සොලන් ද නීති දායකයා ලෙස ගැනේ. මෙහි දී මෝසෙස් විය යුතු ය.

මත ය. ඔහුගේ පිළිගැනීම් වැරැදි නම් යාන්ත්‍රික හෝ භෞතිකවාදී හෝ නාස්තිකවාදී හෝ වේ නම් ඔහුගේ ජීවිතය ගන්නේ ම වැරැදි විකෘත මාර්ග ය.

මිනිසා "දෙවියන් වහන්සේගේ පිළිරුවෙකි." යන්න නිතර වරදවා තේරුම් ගනු ලබන පාඨයෙකි. එහෙත් හේ අර්ථ කීපයකින්ම උන් වහන්සේගේ පිළිරුවෙකි. මිනිසා තම ජගදාත්ම මූලය හරි හැටි දකිනා විට, වඩා නිවැරැදි ප්‍රත්‍යගාත්ම නමැති ප්‍රතිබිම්බය වෙයි. මිනිසාගේ ප්‍රභවය පිළිබඳවත් ඊට ඔහුගේ ඇති සම්බන්ධතාව පිළිබඳවත් ඔහු ඇති කර ගන්නා අදහස අභ්‍යන්තර බාහිර වශයෙන් වූ හැම අතු බෙදීමෙක දී ම මුළු ජීවිත කෙරෙහිම බලපායි. සත්තෙකින් ම ඔහු ඔහුගේ ශරීරයටත් සහෝදර මනුෂ්‍යයන්ටත් සලකන අන්දම, කාලය ප්‍රයෝජනයට ගන්නා ආකාරය, ඔහුගේ ශක්තිය යොමු කරන දිශාව, යන මේ සියල්ලක්ම අන්තිම වශයෙන් හට ගන්නේ ඔහුගේ පරීක්ෂණයට පාත්‍ර නොකරන ලද පිළිගැනීම් වලිනි. ඔහුගේ ඒකත්වය පිළිබඳවත් පොදු මූලයට ඔහුගේ ඇති සම්බන්ධතාව පිළිබඳවත් සකස් කරගෙන ඇති මතවලිනි. භෞතික ලෝකයෙක උපදින හැම ආත්මයෙකට ම ඇති ලෝක උරුමය නම් නිර්මාපක බලවලට තමාගේ ඇති සම්බන්ධතාව පිළිබඳ අදහස අන්‍යයන්ට ඉගැන්වීමයි.

ප්‍ර : මගේ පියාට වැඩියෙන් ම උපකාර විය හැකි ක්‍රමය ගැන මට අවවාද කරන්න.

උ : කාට වුවත් උපකාර කිරීමට ඇති හොඳ ම ක්‍රමය නම් ඔබගේ ජීවිතය ඔබ සිතා සිටින දෙවියන් වහන්සේගේ පිළිරුවක් කිරීමයි. මෙයින් සේවා ජීවිතයකට, නැතහොත් ස්වර්ගයේ දී මෙන් මිහිතලයේ දී ද පියාණන් වහන්සේ උත්කෘෂ්ටත්වයට පත්වන ලෙසින් ජීවිතය යෙදවීමට ඉඩ සැලසේ.

සියල්ල මහා ඒකකය බව මතක තබා ගන්න. ඔබේ අසල්වැසියාත් මිතුරාත් සතුරාත් තේරුම් ගන්නට නම් තමා ම පරීක්‍ෂා කරන්න. එසේ කියන්නේ ඔබ ඔබේ අසල්වැසියාට, මිතුරාට හා සතුරාට කරන දෙය ඔබ ඔබේ දෙවියන් වහන්සේ ගැන සිතන දෙයට අනුව ම වන හෙයිනි.

ඔබේ ජීවිතය දිව්‍යත්වයේ ප්‍රකාශනයෙකැයි ද ඔබගේ සෞඛ්‍යය ඔබ තුළ ම වූ ඒ දිව්‍යමය බලයෙහි ඇති ඇදහීමේ හා බලාපොරොත්තුවේ ප්‍රකාශනයෙකැයි ද දැන ගෙන මේ සත්‍යවල තදින් එල්ලී සිටින්න.

පුද්ගලයකු විසින් පළමු කොට ම ලෝක ශක්තිය සමග තම ජීවයේ ඇති ඒකත්වය තේරුම් ගත යුතු ය. ඊට පසුව එසේ ම ඒ ලෝක ශක්තිය සමග සම්බන්ධකම ඇති ව පවත්නා වූ අන් සියලු ජීවීන් සමග තම ජීවයේ ඇති ඒකත්වය තේරුම් ගත යුතු ය. ඉන්පසු කායික, මානසික හා ආධ්‍යාත්මික වශයෙන් වූ තමාගේ ප්‍රාර්ථනීය ආදර්ශ සකස් කර ගෙන ඒවා ලබා ගැනීමට උත්සාහ කළ යුතු ය. ක්‍රියා කිරීම අතිශයින් ම වැදගත් ය. කටින් කීවාට, බුද්ධියෙන් දැන සිටියාට ඇති වැඩෙක් නැත. අවංක භාවයේ මිනුම් දණ්ඩ ක්‍රියාවයි. නියම අභිවෘද්ධියේ තුලාවත්, ක්‍රමයත් එයයි. ක්‍රියාවට නො නැඟු ඥානය පාපයෙකි.[1] යනු කියැවීම්වල නිතර එන මාත්‍යකාවෙකි.

ඔබේ ආදර්ශය දැන ගන්න. ක්‍රියාශීලී වන්න. වැරැදි ලෙසින් වුවත් යමක් කරන එක නිකම් සිටිනවාට වඩා හොඳයි. එක් ශක්තියක් පමණක් ලබා ගෙන එය සැඟ වූ මිනිසා ගැන මතක තබා ගන්න. ඒ ගැන ප්‍රශ්න කෙළේ ඔහුගෙනි. එය ආපසු දෙන්නට සිදු වූයේ ඔහුට ය.

කර්ම නියාම, අධ්‍යාත්ම නියාම, දණ්ඩන නියාම, සමාජ නියාම ආදී කවර නියාමයක් ගැන වුවත් දැනීම පමණක් තිබීම

1. "ඥානං භාරඃ ක්‍රියාං විනා" - "ක්‍රියාව නැති තැන දැනීම බරෙකි."

කෙනකුට ප්‍රමාණවත් නොවේ. කාරණය නම් පුද්ගලයා මේ දන්නා දෙයින් කරන්නේ කිමෙක් ද යනු ය. ඥානය හේතුඵල මඟ හැරීමට යොදනවා ද ? නැතහොත් අන්‍යයන් තම මතයට බලයෙන් අවනත කර ගැනීමට යොදනවා ද ? නැතහොත් අන්‍යයන්ට ඒ නියාම තේරුම් ගැනීම සඳහා උපකාර කිරීමට යොදවනවා ද ?

දෛවය නැතහොත් කර්මය රැඳී පවතින්නේ ආත්මය තමා දත් දෙයින් කරන දෙය මත ය.

අනෙක් හැම පුද්ගලයකුට ම මේ මහ පොළොවෙහි ඔබට තරම් ම අයිතිවාසිකම් ඇති බව දැන ගන්න. ඔවුන් ඉගෙනීම වැනි සමහර කරුණුවලින් ඔබ තරම් ඉදිරියට ගොස් නැති නමුත් එය කරුණු නොවේ. මෙය සිහියේ තබා ගන්න. පාපය නම් හුදු ඥානය හෙවත් ඵලයෙන් තොර ඥාන වෘක්ෂය සොයා යෑමයි. පුණ්‍යය වන්නේ ඔබ දත් දෙය දෙවියන් වහන්සේගේ කීර්තිය සඳහා යෙදවීමයි.

ඥානය කබායක් මෙන් ඇඳ ගන්නට බැරි ය. එය නිශ්චය කර ගත් ප්‍රාර්ථනීය ආදර්ශය දියුණු කරන්නක් විය යුතු ය.

ජීවිතය පිළිබඳ මේ මතවල අර්ථය සම්පූර්ණයෙන් වටහා ගත් තැනැත්තාට ඕනෑ ම ව්‍යාපාරයක දී මුණගැසෙන ඕනෑම අවස්ථාවෙක දී, ඉවැසිලිමත් නොවී සිටිය නොහැකි වෙයි. ඒ නිසා ඉවැසීම නිෂ්ක්‍රිය දෙයක් නොවේ. එය ක්‍රියාශීලී ය. ඉවැසීම පරීක්ෂාවෙන් බලා සිටීමෙකි. එය චාරිත්‍ර ශීලයක් වනවාට වැඩියෙන් චාරිත්‍ර ශීලයෙකි. එය එක්තරා අර්ථයෙකින් මායාකාරී සීමාවන් වන දේශකාලාදිය දන්නා වූ ආත්මයෙක ආකල්පයයි. චිත්තය දේශකාල දෙකින් නිදහස් වූ විට ඉවැසීම ප්‍රාරප්‍රාප්ත වූවා වේ.

ඉවැසීම නිෂ්ක්‍රිය හෝ අභාවාත්මක හෝ නොවේ. එය වර්ධක වූවෙකි. භාවාත්මක ක්‍රියාකාරී ශක්තියෙකි. කවුරුන්

හෝ ඔබට කම්මුල් පාරක් ගැසුවොත් පසු බසින්නට යයි උන්වහන්සේ[1] කී සේක් ද! නැත. අනෙක් කම්මුලත් හරවන්න. ඔබේ ඉවැසීමේ දී ක්‍රියාකාරී වන්න. ඔබේ සහෝදර මනුෂ්‍යයන් හා ඇති සම්බන්ධතාවන් හි දී ක්‍රියාකාරී වන්න.

දැන් මිළඟට ඔබේ මානසික ආකල්පයන්හි ජීවයේ බීජ වපුරන්නට සූදානම් වන්න. මෙයින් පළමුවැන්න ඉවසීමයි. ඉවසීමේ දී ඔබේ ආත්මය ඔබ සතු වෙයි. ඉවසීමේ දී ශරීරය දේවාලයක් පමණක් බවත් බාහිර පෙනීමක් පමණක් බවත් දැන ගන්නට පටන් ගැනේ. ඔබ නිතර වාසය කරන්නේ මනසත් ආත්මයත් සමග බව දැන ගනිති. හැම ආත්මයක් ම නිර්මාතෘවරයාට තමාගේ ඇති සම්බන්ධතාව සම්පූර්ණයෙන් දැන ගැනීම සඳහා අවශ්‍ය වූ අභිවෘද්ධි මාර්ගයෙහි ගමන් කරයි.

ප්‍රමුදිතත්වය ද තමාගේ ඒකත්වයත් නියාමයත් දන්නා තැනැත්තාගේ ලක්ෂණයක් වෙයි. "ප්‍රමුදිත වන්න" යන විධානය "හොඳ වන්න" යන නියෝගයෙන් වෙන් කළ හැක්කෙක් නොවේ.

මෙය මතක තබා ගන්න. උන්වහන්සේ මෛත්‍රියේ දෙවියන් වහන්සේ ය. උන්වහන්සේ මෛත්‍රිය ම වන හෙයිනි. උන්වහන්සේ ප්‍රමෝදයේ දෙවියන් වහන්සේ ය. තමන් වහන්සේ ප්‍රමෝදය ම වන හෙයිනි.

නිර්මාපක ශක්තිවලට වැඩියෙන් කිට්ටු වන අය සත්‍ය වශයෙන් ම ප්‍රීතියෙන් ද සුඛයෙන් ද ශාන්තියෙන් ද ඇතුළත ගැළපීමෙන් ද පිරී ගියාහු වෙති. ජීවිතය දෙවියන් වහන්සේගේ ප්‍රකට වීමෙකි. පුද්ගලයකු ගත කරන ජීවිතය ඔහු විසින් මැවුම්කරු මෙසේ විය යුතු යයි ඇති කර ගත් අදහසට අනුකූල වූවෙකි.

1. ක්‍රිස්තුස් වහන්සේ

හැම සම්ප්‍රලාප වචනයකට ම ඔබ වගකිව යුතුයි. එහෙත් ඔබ ප්‍රමුදිත නොවිය යුතු යයි මෙයින් අදහස් නො කෙරේ. හිනැහීමට හැකිකම නැති කර ගත හොත් ප්‍රමුදිත වීමට හැකිකම ද නැති කර ගන්නා වේ. ක්‍රිස්තු ජීවිතයේ මූල ධර්මය ප්‍රමෝදයයි. උන්වහන්සේ සිනාසුණු බව මතක තබා ගන්න. උන් වහන්සේ කල්වරියට යන අතරමග දී ද සිනාසුණාහ. එහෙත් උන්වහන්සේ සිනාසුණේ හැම තැන ම සිතුවම් කොට ඇති අයුරින් නම් නොවේ. වැඩියෙන් ම ඔවුන් කෝපයට පත් වූයේ උන්වහන්සේ සිනාසුණු නිසා ය.

උපහාස්‍යතාව දක ගත හැකි බව වගා කර ගන්න. හිනැහිය හැකි බව ඉතිරි කර ගන්න. ගෙත්සමේනයට යන අතර මග දී පවා ස්වාමීන් වහන්සේ ස්මිතයත් හාසයත් පෑ බව මතක තබා ගන්න.

පුද්ගලයකුගේ ක්‍රියාශීලීත්වයත් ඉවැසීමත් ප්‍රමුදිතත්වයත් සමඟ ම එක්තරා විරාග සංඥාවක් ද තිබිය යුතු ය. වැඩෙනවා දැයි බලන්නට නිතර රාබු පැළ උදුරා බලන අලුත් ගොවියකු සේ ප්‍රතිඵල ගැන ඕනෑවට වැඩියෙන් සලකන්නට එපා. පැළ සිටුවන්න, වතුර දමන්න, නියම කාලයේ දී දෙවියන් වහන්සේ ශෂ්‍ය සමෘද්ධිය ඇති කරන බව සිහියට ගන්න. හොඳ කිරීම සුන්දර නිසාත්, උචිත නිසාත්, මිහිරි නිසාත්, යුක්ත්‍යානුකූල නිසාත්, හොඳ කරනවා මිස එයින් ප්‍රතිඵලයක් බලාපොරොත්තුවෙන් හොඳ කරන්න එපා.[1]

ඔබට අනුකම්පා කරන්නට හෝ දෝෂාරෝපණය කරන්නට ඔබට ම ඉඩ දෙන්න එපා. ඔබ කරන හැම දෙයෙක දීම ඉතාමත් හොඳ දෙය සිදුවන ලෙසින් ජීවත් වන්න. ක්‍රියා කරන්න. ප්‍රතිඵල, සියලු හොඳ දෙන්නා වූ ද සද්ධර්ම පාරප්‍රාප්ත කරන්නා වූ ද උන්වහන්සේ බාරයේ තබන්න.

---

1. "දින්නං ඵලන්ථිනා දානං - වණිජ්ජංව ජිගුච්ඡියං" යනු ද සිහි කළ මනා ය.

හැමට ම වැඩියෙන් ගැටලු යයි කියන්නේ ඉඩ ප්‍රස්තාව වලට බව පිළිගන්න. කැමැති නම් ඒවාට ගැටලු යයි කියන්න. දුෂ්කර අවස්ථාවක් මඟ හැරීමේ වැඩි අර්ථයෙක් නැත. ඉක්මනින් ම හෝ පසු වී හෝ අවශ්‍ය චේතනා ශක්තිය දියුණු කර ගත යුතු ව ඇත. ඒ නිසා දැන් ම එය දියුණු කර ගැනීමට උත්සාහ කිරීම සුදුසු ය.

හැම ආත්මයකට ම තමා ම මුණ ගැසෙන බව දැන ගන්න. කිසි ම ප්‍රශ්නයෙකින් පැන දුවන්න එපා. දැන් ම ඊට මුහුණ දෙන්න.

මනාකොට තනන ලද චින්තන පද්ධති සරල කොට සැකෙවින් දක්විය හැකි ය. ඉහත දක්වන ලද පිළිගැනීම් හා ඒවායින් මතු වන සදුපදේස ද මේ නීතියට පිටුපාන්නේ නැත. ඒවායේ ශුද්ධ සාරය පැරැණි ශික්ෂාපද දෙකක් බවට පත් කළ හැකි ය. ඔබේ මුළු සිරුරෙන්, සිතින් හා ආත්මයෙන් ඔබේ ස්වාමින් වහන්සේට මෛත්‍රී කරන්න. ඔබේ අසල්වැසියාට ඔබට මෙන් ම මෛත්‍රී කරන්න.

මේ නියෝග දෙක දේවධර්ම වශයෙන් ඉතා නො වැදගත් ලෙසින් පෙනෙනු ඇත. එහෙත් සත්තෙකින් ම මේ නියෝග දෙකෙන් කේසිගේ ලෝක දර්ශනයට අනුව මිනිසාට බලපාන ලෝක ධර්මයන්ගේ සාර සංග්‍රහයෙකි. මධ්‍ය නිර්මාපක ශක්තියක් ඇති බවත් අප එය හා අනන්‍යවීමෙන්, අප තුළ සැඟැවී ඇති පූර්ණත්වය සසංඥ ව දියුණු කර ගැනීම අපේ ජීවිත පරමාර්ථය බවත් පිළිගත හොත් මේ ඥානය ඉතාමත් කෙටියෙන් ගත් කල පහත දක්වෙන ප්‍රාඥෝපදේශය වෙයි. ඒ මහා නිර්මාපක ශක්තිය සමග එක් වීමටත් ඔබගේ ප්‍රවෘත්තියේ හැම අංශයෙක දී ම එය පෙළි වීමටත් ඉඩ සැලැසෙන සේ ඒ මහා ශක්තියටත් එහි බහුවිධ වූ සෞන්දර්යයටත් එහි සර්වසාධාරණ හිතකාරී අභිප්‍රායයටත් මෛත්‍රී කරන්න.

තව දුරටත්, නිදහස් චේතනාව පිළිබඳවත් අන්‍යයන්ගේ ශුභ සිද්ධිය පිළිබඳවත් කරන හැම වැරැද්දකට ම කර්ම විපාක නියාමය අපට දඬුවම් කරනැයි පිළිගත හොත් මේ ඥානයේ සරල සංක්ෂිප්ත ප්‍රකාශනය මේ ප්‍රඥෝපදේශය වෙයි: ඔබේ අභිවෘද්ධියට ආදරය කරන්නා සේම අන්‍යයන් ගේ අභිවෘද්ධියටද ආදරය කරන්න.

මෙසේ කර්ම නියාමවලින් ද අනුක්‍රමයෙන් වූ පුනර්ජන්ම වලින් ද සිදු වන්නා වූ ආත්ම පරිණාමය උගන්වන පුරාතන ධර්මය යේසුතුමාගේ ප්‍රධාන ඉගැන්වීම් සමග ගැළපෙන බව පෙනේ.

එහෙත් සරල කිරීමේ සඵලත්වය පිළිබඳ යුගය ඉක්ම ගොස් ඇත. මිනිසා තව දුරටත් ළදරුවෙක් නොවේ. ඔහුට ශක්ති ජනක ඥානාහාරය අවශ්‍ය ය. එය නිශ්චිත වූ, විචාර යුක්ත වූ, බෝධ්‍ය වූ, ඥානයක් විය යුතු ය. කේසි කියැවීම්වලින් නැවත වරක් ස්ථිර කරන ලද්දා වූ බොහෝ දෙනා බාහිර ලෝකයේ ඇත්තාහ. කේසිගේ තොරතුරුවලින් සැපැයෙන සාක්කිවලට වඩා ප්‍රබල විද්‍යානුකූල වූ සාක්කි නැති ව ඔවුන් එය නො පිළිගන්නවා විය හැකි ය. එහෙත් ඔවුනට පුනර්ජන්මවාදය නිශ්චිත වූ ද බුද්ධි ගෝචර වූ ද තේරුම් ගත හැක්කා වූ ද මතයෙක් නො වේ යයි ද මනෝ විද්‍යාත්මක වශයෙන් ඇදහිය හැකි වූ ද ආචාර ධර්ම වශයෙන් යහපත් වූද විද්‍යාත්මක වශයෙන් සම්භාව්‍ය වූ ද අදහසෙක් නො වේ යයිද කිව නො හැකි ය.

පුනර්ජන්මවාදය පිළිගන්නා වූ පුද්ගලයාට ජීවත් වීමට අර්ථයෙක් ද සංචාරයට ධ්‍රැව තාරකාවෙක් ද තමා තමාට පාලනය කර ගත නො හැක්කා වූ අර්ථ රහිත බල සුළියෙක අතර මං වී නැති බවට සහතිකයෙක් ද එයින් සපයා දෙනු ලැබේ.

25

# නිගමනය

**මේ** ග්‍රන්ථයේ දී, අපි, ඔහායෝවේ ඩේටන්හි කුඩා හෝටල් කාමරයෙක සිදු වූ සුළු සිද්ධියේ සිට දිග දුරක් අවුත් ඇත්තෙමු. අභිඥා - සම්මෝහනිද්‍රාවෙක සිටි එඩ්ගා කේසි පුනර්ජන්මය ස්වභාව සිද්ධියෙකි යන මතය පළමුවෙන් ම හෙළි කෙළේ ඒ අවස්ථාවේ දී ය. මේ සිද්ධියත් ඊට පසුව සිදු වූ ඊට සම්බන්ධ වූ සිද්ධි රාශියත් මේ ග්‍රන්ථයෙහි දළ සටහනින් දක්වන ලද මනෝ විද්‍යාත්මක වූ ද, දාර්ශනික වූ ද ගොඩනැගිල්ලට ඇති දුර්වල පදනම බව පෙනෙනු ඇත. එහෙත් යමකු විද්‍යාවේ ඉතිහාසය දෙස බලතහොත් විප්ලවකාරී වූ මහඟු සොයා ගැනීම්, හිතන්නටවත් බැරි තැන්වලින් මතු වී ඇති බව දක්නට ලැබෙනු ඇත. ගැහෙන ගෙම්බකුගේ කකුලක් ගැල්වනික බැටරියේත් පුස් කෑ පාන් කැබෙල්ලක් අසිරිමත් පෙනිසිලින් ඖෂධයේත් සොයා ගැනීමට හොඳ මූලස්ථාන බව නො පෙනේ. එහෙත් ඒ ඒවා සොයා ගත් තැන් ය. ගැලීලියෝ බට්ටාගෙන් යුතු සියුම් ඔරලෝසුවක් තනා ගැනුමට මෙහෙයවූයේ ඉතාලි පල්ලියෙක තුඹූ එල්ලෙන ලාම්පුවෙකි. ජලවිද්‍යාවේ වැදගත් නියාමයක්

තනා ගැනීමට අවශ්‍ය ව තුබූ සංඥාව ආකිමිඩිස්ට ලැබුණේ උතුරා යන නාන බාල්දියෙකිනි.

මෙබඳු නොයෙක් නිදසුන් අපට ඉතිහාසයෙහි දක්නට ලැබේ. මේ නිසා අප විසින් පහත් තැන්වලින් සත්‍යය සොයා ගත හැකි බව පිළිගත යුතු ය. ව්‍යාකරණ නො දත් නූගත් මිනිසකු අසංඥ ව කවිච්චියක් මත වැතිරී ගෙන මනුෂ්‍ය ජීවිතය පිළිබඳ මේ විප්ලවකාරී මතයට පක්ෂ ව වැදගත් අනුමානාත්මක සාක්ෂ්‍ය ඉදිරිපත් කිරීමට සමර්ථ වූවා යයි අප පුදුම විය යුතු නොවේ.

දැන් අපි, කය පිළිබඳ ඔහුගේ අභිඥා ඥානයේ සත්‍යතාව තහවුරු කළ බිඳලිය නොහැකි සාක්කි සමූහය පසෙක තබා ජීවිත කියැවීම්වල සත්‍යතාව ඔප්පු කරන සාක්කි, සංග්‍රහ කොට දක්වමු. මේ සාක්කි ප්‍රධාන කරුණු සතක් පදනම් කොට ඇත. ඒ මෙසේ යඃ

පළමුවැන්න : දහස් ගණන් නිදසුන්වල දී සැතැපුම් සිය ගණන් ඇත සිටි, සම්පූර්ණයෙන් අමුත්තන් වූ පුද්ගලයන් පිළිබඳ චරිත විග්‍රහත් තොරතුරු විස්තරත් නිවැරැදි වී තිබේ.

දෙවැන්න : වැඩිහිටියන්ගේ පමණක් නොව නවජාත දරුවන්ගේද වෘත්තිය දක්ෂතා හා අන්‍ය ලක්ෂණ පිළිබඳ ව පළ කරන ලද අනාගත වාක්‍ය සත්‍ය වී තිබේ.

තුන්වැන්න : පිළිගත හැකි අතීත අත්දැකීම් මගින් ඒන්තු යන අයුරින් මානසික ලක්ෂණ විවරණය කොට තිබේ.

සතරවැන්න : මේ තොරතුරු අවුරුදු විසි දෙකකට වැඩි කාලයක් තිස්සේ ස්වයංසංස්ථිත[1] වී ඇත. එයින් කියැවෙන්නේ ඒවා සමග ම ගැළැපී ඇති බවයි. වෙනස් වූ කාලවල දී ගන්නා ලද වෙන් වූ සිය ගණන් කියැවීම්වල දී ඒ

1. Self consistent

තොරතුරු, ප්‍රධාන මූල ධර්මවල දී ද කුඩා විස්තරවල දීද එකිනෙක ගැළැපී තිබේ.

පස්වැන්න : අප්‍රසිද්ධ ඓතිහාසික විස්තර, වාර්තාගත ඉතිහාස ප්‍රවෘත්ති සමඟ සැසඳීමේ දී නිවැරැදි බව ඔප්පු වී තිබේ. කියැවීම්වලින් අප්‍රසිද්ධ පූර්ව පුද්ගලයන්ගේ නම් සොයාගත හැකි බව කියා ඇති ප්‍රදේශවලින්, ඒවා සොයා ගෙන තිබේ.

සයවැන්න : කියැවීම් ලබා ගෙන ඒවා අනුගමනය කළ පුද්ගලයනට බලාපොරොත්තු වූ ප්‍රතිඵල ලැබී තිබේ. ඔවුන්ගේ ජීවිත කෙරෙහි මේ කියැවීම්, උපකාරක වූ ද සංස්කාරක වූ ද බලපෑමක් කර ඇත. මෙය මානසික වශයෙන් ද වෘත්තිය වශයෙන් ද කායික වශයෙන් ද සත්‍ය ය.

සත්වැන්න : කියැවීම්වල ගැබ් වී ඇත්තා වූ ද ඒවායින් මතු කර ගත හැක්කා වූ ද දාර්ශනික වූත් මනෝවිද්‍යාත්මක වූත් මත පද්ධතිය සංසක්තය, එමෙන් ම සංස්ථිතය මානසික ජීවිතය පිළිබඳ ව දැනට දැන ගෙන ඇති සත්‍යවලට අනුකූලද වේ. ඒ මත රාශිය, මානසික ජීවිතයේ විවරණය නොවී ඇති අංශ පිළිබඳ නව විවරණයක් සොයා ගැනීම සඳහා උපකාරක ද වේ. තවද එය, ශත වර්ෂ ගණනාවෙක් භාරතයේ උගන්වා ඇති සම්භාවනීය පුරාතන දාර්ශනික මතය හා ගැළැපෙන්නක් ද වේ.

කොටින් කියත හොත් කේසි ජීවිත කියැවීම්වලටත් ඒවායින් තහවුරු වන පුනර්ජන්මවාදයටත් පක්ෂව ප්‍රබල අනුමානාත්මක සාධක හතෙක් ඇත. අනුමානාත්මක සාක්ෂ්‍ය අවශ්‍යයෙන් ම තීරණාත්මක නො වන නමුත් බොහෝ විට සත්‍ය වේ. ලෝකයේ අණ්ඩාකාරත්වය කවුරුන් වත් සත්‍ය

වශයෙන් දැක නැත. පරමාණුවේ ඇතිකම ද දැන ගෙන ඇත්තේ අනුමානයෙන් පමණි. සත්තෙකින් ම කවුරුන්වත් පරමාණුවක් දැක නැත. එහෙත් අපේ අනුමානවල ශක්තියෙන් අපි පෘථිවිය වටා යාත්‍රා කරමු. ප්‍රත්‍යක්ෂ කළ හැකි ප්‍රතිඵල ඇති පරමාණු බෝම්බයක් සාර්ථක ව තනා ගනිමු. ඒ නිසා කේසි කියැවීම්වලින් ලැබෙන අනුමාන සාක්ෂ්‍ය පදනම් කර ගෙන පුනර්ජන්මය පිළිබඳ ව විද්‍යානුකූල වූ සූක්ෂ්ම පරීක්ෂණ කළ හැකි යයි යෝජනා කිරීම මහා මෝඩකමක් නො වන බව සහතිකය.

පුනර්ජන්මවාදීනට කළ හැක්කේ මේ බලාපොරොත්තුව තබා ගැනීම ජීවිතයේ ප්‍රහේලිකාවලට පිළිගත හැකි විසඳුමක් සොයන අය පුනර්ජන්මවාදය හිතට ගෙන ටික කාලයක් ඊට අනුව ජීවත් ව ක්‍රියාකොට තමනුත් තමාගේ සහෝදර මනුෂ්‍යයනුත් සාමාන්‍යයෙන් මුළු මනුෂ්‍ය ප්‍රජාවත් සරල නමුත් විශ්ව සාධාරණ අගයක් ඇති පුනර්ජන්මවාදයේ මූල ධර්මවලට අනුව මැන බලනු ඇත. වෙළඳ දැන්වීම්කාරයන් කියන්නා සේ ඒ පරීක්ෂණ යුගයේ අවසානයේ දී ඔවුන් එයින් සම්පූර්ණයෙන් තෘප්තිමත් වී නැති නම් තමනට කිසි ම වියදමක් නැති ව, ඒ පුනර්ජන්මවාදය නමැති වෙළඳ බඩුව 'චින්තන - කවුන්ටරයට' ආපසු බාරදිය හැකි ය.

දැන්වීම්කරුවන් හා එක් වී "අත්හදා බැලීමෙන් ඔබට ජන්තු යනු ඇතැයි" හඬ නඟා කියන්නට සිතෙයි. එහෙත් කිසිම විශ්වාසයකට, එහි දාර්ශනික පදනම කොතෙක් ස්ථිර වුවත් විද්‍යානුකූල වුවත් සියලු මිනිසුන් සතුටු කළ නො හැකි ය යනු හොඳින් ඔප්පු වී ඇත. ඒ නිසා කවදා වත් පුනර්ජන්මය නොපිළිගන්නා මිනිසුන් කොටසක් ද සිටිත හැකි ය. අපේ අලුත් ගැලවුම්කාරයා වන විද්‍යාව විසින් ප්‍රකාශනයට පත් කෙරෙන තෙක් ඔවුන් එය නොපිළිගන්නවා ඇත. මේ නිසා මනෝවිද්‍යාවේත් භෞතික විද්‍යාවලත් යෙදී සිටින විද්‍යාඥයන්

විසින් කේසි කියැවීම් වලින් අනුමානාත්මක වූ ඔප්පු කිරීමක් ලබා ඇති මේ මතය කෙරෙහි අවධානය යොමු කරනවා ඇතැයි බලාපොරොත්තු විය යුතු ව තිබේ.

මෙහි දී මාර්ග කිපයක් ගත හැකි ව තිබේ. සුදුසු පරීක්‍ෂණ විධි යොදනවා නම් විද්‍යානුකූල ක්‍රමයෙන් පුනර්ජන්මය පිළිබඳ පරීක්‍ෂණාගාරික වූ ඔප්පු කිරීම් ද කළ හැකි වනු ඇත. මෙය ඉතා වැදගත් යෝජනාවෙකි. ඇති සැටියේ අලුත් තට්ටු සාරා බැලීම සඳහා සොයා ගැනීමේ නව පරීක්‍ෂණ විධි අවශ්‍යයෙන්ම භාවිත කළ යුතු ව තිබේ.

සම්මෝහ නිද්‍රාව ඉතා ම ආසන්නව ඇති, අතිශයින් සඵල වූ පරීක්‍ෂණ විධිය බව පෙනෙනු ඇත. අතීත ජීවිත ස්මරණ මතු කර ගත හැකි දැයි නිශ්චය කර ගැනීම සඳහා බොහෝ පුද්ගලයන් කෙරෙහි සම්මෝහ නිද්‍රා පරීක්‍ෂණ යෙදිය හැකි ය. එසේ මතු කර ගන්නා ලද ස්මරණ ඓතිහාසික වාර්තාවලිනුත් ඒ ආතුරයාගේ මානසික ජීවිතය හා පරිසරය පිළිබඳ ව දැන ගන්නට ලැබී ඇති සත්‍ය සිද්ධිවලිනුත් හරි බව සොයා ගත හැකි වුවහොත් ඒ සාධකය පුනර්ජන්මවාදයට පක්ෂ ව ඇති ප්‍රබල වූ අනුමානාත්මක සාක්ෂ්‍යයෙක් වෙයි.

කළ හැකි ව ඇති දෙවැනි දෙය නම් පරීක්ෂණාගාර පරීක්ෂණ හා චිකිත්සාගාර භාවිතය සමග පුහුණු කරන ලද අභිඥා සම්පන්නයන් යෙදවීමය. අභිඥා ඥානය මිනිස් මනසේ ශක්තියක් ලෙස පිළිගනු ලැබුව හොත් දැනීම ලබාගැනීමේ උපක්‍රමයක් ලෙස එයින් ගත හැකි විශාල ප්‍රයෝජන පිළිගැනීමට සිදු වේ. දැකීමේ විශේෂ ශක්ති ඇති පුද්ගලයනට මනෝවිද්‍යා පරීක්ෂකයන් හා චිකිත්සකයන් සමග සහයෝගී ව ක්‍රියා කළ හැකිය. පිළිගත හැකි අතීත ජන්ම හේතු පදනම් කර ගත් වේදකම් පිළිබඳ වාර්තා ම වැදගත් සාක්කි සම්භාරයක් වනු නිරනුමාන ය.

මෙබඳු සාක්කි, එක් වැදගත් අංශයකින් හැරුණු විට කේසි කියැවීම්වලින් ලැබෙන සාක්කිවලින් වෙනස් නො වේ. කේසි කියැවීම් ලබා ගත් පුද්ගලයන්ගේ ජීවිතවලට ඒවා පුදුම ප්‍රතිඵල සහිත ව යොදා ගෙන ඇත. ඒවායේ නිරවද්‍යතාවත් ඵලවත් භාවයත් නොයෙක් ලිඛිත සාක්ෂ්‍යවලින් සහතික කෙරෙයි. එහෙත් ඒවා යොදා ගැනීම පුහුණු වූ ගවේෂකයන්ගේ පාලනය යටතේ සිදු වී නැත. ක්‍රමානුකූල අනුගමනයක් ද කෙරී නැත. කියැවීම කරන අවස්ථාවේ දී ම කරන ලද ඊට සම්බන්ධ වූ මානසික වෛද්‍ය විද්‍යාමය වූ හෝ මනෝවිද්‍යානුකූල වූ හෝ විග්‍රහ කිරීම් නැත. කේසිගේ ශක්තිවලට සම, නැතහොත් එබඳු වූ, ශක්ති ඇති අභිඥා සම්පන්නයකු පිළිගත් මනෝවිද්‍යාඥ කාර්ය මණ්ඩලයෙක සම්පූර්ණ සහයෝගය ඇති ව වැඩ කළා නම් ලබා ගත හැකි ව තිබූ පුද්ගලාධ්‍යයන තොරතුරු රාශිය, කේසි තොරතුරුවල ඇති දුර්වලකමින් මිදුණා වූ ද කේසි කියැවීම්වල ඇති ඔප්පු කිරීම් ශක්තියෙන් යුක්ත වූ ද සාක්ෂ්‍ය සම්භාරයක් වනු ඇත.

සත්‍ය වශයෙන් ම පුනර්ජන්මය මනුෂ්‍යයා පරිණතියටත් පාරිශුද්ධියටත් පමුණුවන ජීවිත නියාමය නම්, මිනිසා පිළිබඳ සරල සත්‍යයත් ප්‍රවෘත්තියේ හා දුඃඛයේ ප්‍රහේලිකාවට ඇති සරල විසඳුමත් මෙය නම්, මිනිසා පිළිබඳ සියලු මනෝවිද්‍යාත් සියලු දේව ධර්මත් විනෝදාගාරයෙක ඇති කැටපත්වල දක්නට ලැබෙන පුදුම ලෙසට වැනෙන විකෘත රූප ලෙස පෙනෙනු ඇත. ඒ පුදුම ලෙසින් විකෘත වූ රූපවල අයිතිකාරයා ලෙසින් පුනර්ජන්මවාදය නමැති සරල සත්‍යය දක්නට ලැබෙනු ඇත.

ඉතා හොඳින්, කරුණු පැහැදිලි කර දෙන්නා වූ ද අතිශයින් ප්‍රාණදායක හා සංස්කාරක වන්නා වූ ද මේ මතය ඔප්පු කළ හැකි දැයි පරීක්ෂා කර බැලීම ගැඹුරු සිත් ඇති මිනිසුන්ගේ අවධානය යොමු විය යුතු බව සහතික ය. සත්තෙකින් ම

මිනිසාගේ ආත්මයට බොහෝ මන්දිර තිබේ නම් හැම කාලයකටම වැඩියෙන් එහි සත්‍යය සොයා ගත යුතු වූ කාලය මෙයයි. එසේ කියන්නේ ඒ ඥානයත් සමග නව ශ්‍රේෂ්ඨත්වයක් හා නව ධෛර්යයක් ලැබෙන හෙයිනි. එයත් සමග ම විශ්වය පිළිබඳ අසිරිමත් නව විචිත්‍ර දෘෂ්ටියෙක් ද මුළු මනුෂ්‍ය ජීවිතය පිළිබඳ ඉතා සියුම්, ඉතා ගැඹුරු, නව අවබෝධයක් ද විවිධාකාර දුක් දොම්නස්, කම්කටොලුවලට ඔරොත්තු දෙන නව චින්තාකල්පයෙක් ද අපට ලැබෙයි.

" සබ්බ දානං ධම්ම දානං ජිනාති "

සියලුම දානයන් අතරින් ධර්ම දානය උතුම්ම දානයයි.

කරුණාකර හැකිතරම් මෙම පිටපත බෙදාහරින්න.


**සංසාර මන්දිර** මිනිසා කායික පීඩා විඳින්නේ කවර හෙයින් ද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රබෝධකර වූ අනේක විපනන මාර්ගවලට අප ගෙන යයි. අපගේ සාමාන්‍ය පංචේන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් අපට දැකිය හැක්කේ පැටැලුම් සහිත විශාල විචිත්‍ර යවනිකාවෙක සීමා සහිත කොටස් පමණෙකි. අපට පෙනෙන මෘදු මතුපිටට යටින් අපමණ යටිපැති නූල් ද අප්‍රමාණ වූ නොපෙනෙන පැටැලිලි ද ඇත. එක ම නූලකවත් උපත යයි නම් කරනු ලබන මායාකාර සීමාවෙන පටන් ගනිතැයි හෝ මරණය යයි කියනු ලබන එතරම් ම මායාකාර සීමාවෙන් කෙළවර වේතැයි හෝ කිව නොහැකිය.

සත්‍ය වශයෙන් පුනර්ජන්මය, මනුෂ්‍යයා පරිණතියටත්, පාරිශුද්ධියටත් පමුණුවන ජීවිත නියාමය නම්.

ඉතා හොඳින් කරුණු පැහැදිලි කර දෙන්නා වූ ද අතිශයින් ප්‍රාණදායක හා සංස්කාරක වන්නා වූ ද මේ මතය ඔප්පු කළ හැකි දැයි පරීක්ෂා කර බැලීම ගැඹුරු සිත් ඇති මිනිසුන්ගේ අවධානයට යොමු විය යුතු බව සහතිකය.

සත්තෙකින් ම මිනිසාගේ ආත්මයට බොහෝ මන්දිර තිබේ නම් හැම කාලයකට ම වැඩියෙන් එහි සත්‍යය සොයා ගත යුතු කාලය මෙයයි.

- **කන්නිමහර සුමංගල හිමි**



ISBN - 955-569-185-1

BOOK CODE - 103650

900/-

රත්න පොත් ප්‍රකාශකයෝ

513, මරදාන පාර, කොළඹ 10. දුරකථනය: 2695868